# ශ්‍රී ලාංකේය විශ්‍රාම වැටුප්





කදුන ආරච්චිගේ තිලකරත්න

විශ්‍රාම වැටු[illegible]රාල්



විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුවේ ප්‍රකාශනයකි

# ශ්‍රී ලාංකේය විශ්‍රාම වැටුප්


කඳන ආරච්චිගේ තිලකරත්න
විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ ජනරාල්



විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුවේ ප්‍රකාශනයකි

2-H39510

ISBN 978 - 955 - 0777 - 02 - 0

H39510 - 5,000 (2011/12) - ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

# පෙළගැස්ම


පිටුව

i. රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යතුමාගේ පණිවිඩය xi
ii. රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු නියෝජ්‍ය අමාත්‍යතුමාගේ පණිවිඩය xiii
iii. ජනාධිපති ලේකම්තුමාගේ පණිවිඩය xv
iv. රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශයේ ලේකම්තුමාගේ පණිවිඩය xvii
v. පෙරවදන xxi

1. විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව

1.1 හැඳින්වීම 3
1.2 සංවිධානය හා ප්‍රතිව්‍යුහගතකරණය 4
1.3 විශ්‍රාම වැටුප් ප්‍රතිලාභ 8
1.3.1 විශ්‍රාම වැටුප් හිමිකම 8
1.3.2 විශ්‍රාම ගැන්වීමේ විධිවිධාන 10
1.3.2.1 විශ්‍රාම වැටුප් ප්‍රතිලාභ නිර්වචන කිහිපයක් 15
1.3.3 විමධ්‍යගත හා මධ්‍යගත විශ්‍රාම ගැන්වීම් 20
1.3.4 විශ්‍රාම වැටුප අහිමිවීම 22

2. සිවිල් විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය 23

2.1 සිවිල් විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය නෛතික පසුබිම 24
2.2 විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා සංග්‍රහය 24
2.3 වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදල් ආඥාපනත 25
2.4 රාජ්‍ය හා අධිකරණ නිලධාරීන් ( විශ්‍රාම ගැන්වීම ) ආඥාපනත 25
2.5 1947 රාජ ආඥාව 28
2.6 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව 29
2.7 1953 අංක 44 දරන පාසල් ගුරුවරුන්ගේ විශ්‍රාම වැටුප් පනත හා රෙගුලාසි 30
2.8 අමාත්‍ය මණ්ඩලය මගින් විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා සංග්‍රහයට සිදු කරන සංශෝධන හා ගැසට් නිවේදන 30
2.9 විවිධ අණපනත් හි විශ්‍රාම වැටුප් පිළිබඳ රීති 31
2.10 ආයතන සංග්‍රහය 31
11 රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් සලසනු ලැබූ විධිවිධාන 41
රජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය 49
ිකරණ තීන්දු 49
ති දෙපාර්තමේන්තුව, මානව හිමිකම් කොමිෂන් සභාව, 50
න කටයුතු පිළිබඳ පාර්ලිමේන්තු මහා කොමසාරිස්
න්) පාර්ලිමේන්තු පෙත්සම් කාරක සභා නිර්දේශ
චක්‍රලේඛ 50

## 3. විශ්‍රාමික පොදු අයිතීන් හා විශ්‍රාම වැටුප් විෂමතාවය

පිටුව


3.1 විශ්‍රාමික අයිතිවාසිකම් 51

3.2 විශ්‍රාමික පොදු අයිතිය - කොමිෂන් සභා නිර්දේශ ක්‍රියාත්මක වීම 52

3.2.1 පරිපාලන ප්‍රතිසංස්කරණ කමිටු වාර්තාව 52

3.2.2 සෙනෙවිරත්න විශ්‍රාම වැටුප් විෂමතා කමිටු නිර්දේශය 55

3.2.3 බී. සී. පෙරේරා කොමිෂන් සභා වාර්තාව 55

3.2.4 සේනාරත්න කමිටු වාර්තාව 56

3.2.5 ඒකනායක කමිටු වාර්තාව 56

3.2.6 පොදුජන එක්සත් පෙරමුණ ප්‍රතිපත්ති ප්‍රකාශනය 57

3.2.7 මහින්ද චින්තන ප්‍රතිපත්ති ප්‍රකාශය 58

3.2.8 මහින්ද චින්තන ඉදිරි දැක්ම ප්‍රතිපත්ති ප්‍රකාශය දෙවන පියවර 58

3.3 විශ්‍රාම වැටුප් විෂමතාවය ඉවත්කර ගැනීමේ අරගලය 59

3.3.1 විෂමතා ඉවත් කිරීමේ චක්‍රලේඛය යටතේ විශ්‍රාම වැටුප් සංශෝධනය කිරීමේ ක්‍රියාවලිය 61

3.4 විශ්‍රාම වැටුප් සංශෝධනයේ දී සැලකිල්ලට ගත් විශේෂ කරුණු 62

3.4.1 විශ්‍රාම වැටුප් ගෙවීමේ ගොනුව පමණක් ඇති අවස්ථාවක දී ක්‍රියා කළ ආකාරය 63

3.4.2 විශ්‍රාම වැටුප් අංක කාණ්ඩ 4 ලක්ෂය, 5 ලක්ෂය, 6 ලක්ෂය, 7 ලක්ෂය යටතේ විශ්‍රාම වැටුප් ගණන් බැලීමේ දී සම්පූර්ණ සේවා කාලය සලකා නොමැති අවස්ථාවකදී ක්‍රියා කළ යුතු ආකාරය 64

3.5 රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් ප්‍රතිලාභ වර්ධනය 66


## 4. විශ්‍රාම වැටුප් ගණන් බැලීමේ ක්‍රම විකාශනය


4.1 ආරම්භයේ සිට 1984. 12. 31 වැනි දින දක්වා පැවති ගණන් බැලීමේ ක්‍රමය 69

4.2 1985. 01. 01 සිට 1990. 08. 31 දින දක්වා පැවති ගණන් බැලීමේ ක්‍රමය 70

4.3 1990. 09. 01 දින සිට 1990. 10. 17 දින දක්වා පැවති ගණන් බැලීමේ ක්‍රමය 70

4.4 1990. 10. 18 දින සිට 1996. 12. 23 දක්වා පැවති ගණන් බැලීමේ ක්‍රමය 70

4.5 1996. 12. 24 දින සිට ක්‍රියාත්මක ගණන් බැලීමේ ක්‍රමය

4.6 1996. 12. 31 දිනට වලංගු විශ්‍රාම වැටුප් ගණන් බැලීමේ ක්‍රමය

4.7 1997. 01. 02 දින සිට 2004. 01. 01 දක්වා පැවති ගණන් බැලීමේ ක්‍රමය

4.8 2004. 01. 02 දින සිට 2004. 12. 01 දක්වා පැවති ගණන් බැලීමේ ක්‍රමය

4.9 2004. 12. 02 දින සිට 2006. 01. 01 දක්වා පැවති ගණන් බැලීමේ ක්‍රමය

4.10 2006. 01. 02 දිනට පසු ක්‍රියාත්මක ගණන් බැලීමේ ක්‍රමය

4.11 රජයේ විශ්‍රාමිකයන්ගේ ජීවන වියදම් දීමනාව

5. ශ්‍රී ලංකාව තුළ ක්‍රියාත්මක කළ විවිධ විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රම පිටුව

| | | |
|---|---|---|
| 5.1 | දායකත්ව විශ්‍රාම වැටුප් ක්‍රමය | 75 |
| 5.2 | රත් පවුම් විශ්‍රාම වැටුප් | 78 |
| 5.3 | ගුරු විශ්‍රාම වැටුප් ක්‍රමය | 79 |
| 5.4 | රාජකීය විශ්‍රාම වැටුප් | 81 |
| 5.5 | විදේශ විශ්‍රාම වැටුප් | 83 |
| 5.6 | පළාත් පාලන සේවා විශ්‍රාම වැටුප් ක්‍රමය | 90 |

6. සන්නද්ධ සේවා ( යුධ, ගුවන්, නාවුක) විශ්‍රාම වැටුප

| | | |
|---|---|---|
| 6.1 | ආරම්භය | 97 |
| 6.2 | සේවා විශ්‍රාම වැටුප | 98 |
| 6.3 | සේවා පාරිතෝෂික දීමනාව | 101 |
| 6.4 | දුබලතා විශ්‍රාම වැටුප | 102 |
| 6.5 | මරණ පාරිතෝෂිකය | 104 |
| 6.6 | විශේෂ වන්දි | 105 |
| 6.7 | වැන්දඹු /වැන්දඹු පුරුෂ හා අනාත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමය (සන්නද්ධ බලසේනා) | 106 |
| 6.8 | යැපීම් දීමනා | 109 |
| 6.9 | වැටුප් හා දීමනා අහිමි වන අවස්ථා | 113 |

7. වැන්දඹු , වැන්දඹු පුරුෂ හා අනාත්දරු විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය

| | | |
|---|---|---|
| 7.1 | හැඳින්වීම | 114 |
| 7.2 | ලියාපදිංචිය හා ඊට අදාළ සුදුසුකම් | 116 |
| 7.3 | ලියාපදිංචි වීම සඳහා ඉදිරිපත් කළ යුතු ලියවිලි | 119 |
| 7.4 | ලිපිගොනු යාවත්කාලීන කිරීම | 121 |
| 7.5 | ප්‍රතිලාභ ලබා ගැනීම සඳහා ඉල්ලුම් කිරීම | 122 |
| 7.6 | ආබාධිත විශ්‍රාම වැටුපක් සකස් කිරීමේ දී අනුගමනය කළ යුතු ක්‍රියාමාර්ග | 127 |
| 7.7 | අතුරුදහන් වූ දායකයින් සම්බන්ධව අනුගමනය කළ යුතු ක්‍රියාමාර්ග | 136 |
| 7.8 | වැන්දඹු සහ අනාත්දරු විශ්‍රාම වැටුප ගණනය කිරීම සම්බන්ධ නියමයන් | 136 |
| 7.9 | දායක මුදල් ආපසු ගෙවීමේ දී ඉදිරිපත් කළ යුතු ආකෘති පත්‍ර | 139 |
| 7.10 | වැන්දඹු/වැන්දඹු පුරුෂ හා අනාත්දරු විශ්‍රාම වැටුප් අංක නිකුත් කිරීම | 141 |
| 7.11 | සේවයේ යෙදී සිටිය දී මියයන රාජ්‍ය සේවකයන්ගේ වැන්දඹු හා අනාත්දරු විශ්‍රාම වැටුප් ගණනය කිරීම | 145 |
| 7.12 | වැන්දඹු අනාත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක මුදල් අය කිරීම හා ගිණුම්ගත කිරීම | 146 |
| 7.13 | වැන්දඹු අනාත්දරු දායක මුදල් අයකිරීම හා ආපසු ගෙවීම | 147 |
| 7.14 | පනත් සංශෝධනය | 150 |
| | 7.14.1. වැන්දඹු අනාත්දරු විශ්‍රාම වැටුප් පනත් වැඩි ප්‍රතිලාභ හිමිවන පරිදි සංශෝධනය කිරීම | 150 |
| | 7.14.2. 1953 අංක 44 දරණ පාසැල් ගුරුවරුන්ගේ විශ්‍රාම ගැන්වීමේ පනත සංශෝධනය | 150 |

පිටුව

7.14.3. 1970 අංක 18 දරන වැන්දඹු අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රම (සන්නද්ධ බල සේනා) පනත සංශෝධනය — 151

7.14.4. වැන්දඹු අනත්දරු විශ්‍රාම වැටුප් පනත් සංශෝධනය යටතෙහි රෙගුලාසි පැනවීම — 151

7.15 වැන්දඹු අනත්දරු විශ්‍රාම වැටුප් ගෙවීම ප්‍රමාද වීම — 152

7.15.1 වැන්දඹු අනත්දරු විශ්‍රාම. වැටුප් ලිපිගොනුව පිළිබඳ ගැටළුව — 152

7.15.2 නීත්‍යානුකූලව හිමිකාරත්වය /විවාහය සනාථ කිරීම ගැටලු සහගත වීම — 152

7.15.3. වැන්දඹු අනත්දරු විශ්‍රාම වැටුප් ගණන් බැලීම පිළිබඳ ගැටලුව — 153

8. රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදල

8.1 පසුබිම — 154

8.2 අරමුදලේ ව්‍යුහය — 154

8.3 අරමුදලේ කාර්යයන් — 155

8.4 සාමාජිකත්වය ලබා ගැනීමට සුදුසුකම් ලබන නිලධාරීන් — 156

8.5 සාමාජිකත්වය ලබා ගැනීමට සුදුසුකම් නොලබන නිලධාරීන් — 156

8.6 දායක මුදල් — 157

8.7 ආයෝජන — 157

8.8 ආදායම් සහ වියදම් — 158

8.9 සාමාජිකත්වය අහෝසි වීම — 159

8.10 දායක මුදල් ගෙවීම් — 159

9. ඉ - විශ්‍රාම වැටුප් ව්‍යාපෘතිය

9.1 හැඳින්වීම — 163

9.2 පද්ධති අධ්‍යයනය හා දෙපාර්තමේන්තු ක්‍රියාවලි ප්‍රතිනිර්මාණය — 164

9.3 අයදුම්පත්‍ර ලියාපදිංචි කිරීමේ ක්‍රියාවලිය — 165

9.4 දායක මුදල් එකතු කිරීම සහ කළමනාකරණය කිරීමේ ක්‍රියාවලිය — 165

9.5 සැම දෙනාටම එක වරක් කරන ප්‍රතිලාභ සැකසීමේ ක්‍රියාවලිය — 166

9.6 මාසික ගෙවීම් හා සංශෝධන සැකසීමේ ක්‍රියාවලිය — 167

9.7 විමසීම් කළමනාකරණය කිරීමේ ක්‍රියාවලිය — 168

9.8 ලේඛන කළමනාකරණය කිරීමේ ක්‍රියාවලිය — 168

9.9 ඉ - විශ්‍රාම වැටුප් පද්ධතියේ සුවිශේෂිතා — 169

9.10 ප්‍රතිලාභ — 180

9.11 තොරතුරු තාක්ෂණය යොදා ගැනීම — 180

9.12 විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තු වෙබ් අඩවිය — 181

9.13 ශ්‍රී ලංකා රාජ්‍ය ජාලය (LGN) — 182

10. ශ්‍රී ලංකාවේ සමාජ ආරක්ෂණ ප්‍රතිපත්තිය

10.1 හැඳින්වීම 183
10.2 ශ්‍රී ලංකාවේ සමාජ ආරක්ෂණය 184
10.3 කම්කරු වෙළඳපොල වැඩසටහන් 185
10.3.1 කම්කරු නීති සම්පාදනය 185
10.3.2 සේවකයන්ගේ පාරිතෝෂිකය 185
10.3.3 රැකියා වියුක්තිකයනට සේවාවන් සැපයීම - Service for the unemployment 186
10.4 සමාජ හා සෞඛ්‍ය ආරක්ෂණ වැඩසටහන් 186
10.4.1 රජයේ විශ්‍රාම වැටුප් ක්‍රමය 186
10.4.2 සේවක අර්ථසාධක අරමුදල හා සේවා නියුක්තිකයන්ගේ භාර අරමුදල 187
10.4.3 ගොවි විශ්‍රාම වැටුප් හා සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ 187
10.4.4 ධීවර කාර්මිකයන්ගේ විශ්‍රාම වැටුප හා සමාජ ආරක්ෂණ ක්‍රමය 187
10.4.5 ස්වයං රැකියාවන්හි නියුක්තිකයන් සඳහා සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ යෝජනා ක්‍රමය 188
10.5.6 අනුමත පෞද්ගලික අර්ථසාධක අරමුදල් 188
10.5 සමාජ සහයෝගිතා වැඩසටහන් 188
10.6 සමාජ ආරක්ෂණ දැල 189
10.6.1 සමෘද්ධි වැඩසටහන් 189
10.6.2 පළාත් සභා විසින් සිදු කෙරෙන සුභසාධන හා මහජන ආධාර වැඩසටහන් 190
10.6.3 යුධමය වාතාවරණය යටතෙහි අවතැන් වූ පුද්ගලයන්ට ලබාදෙන ආධාර වැඩසටහන් 191
10.6.4 වැඩිහිටි සමාජ ආරක්ෂණ වැඩසටහන් 191
10.6.5 ආබාධිත පුද්ගලයන් සඳහා සමාජ ආරක්ෂණ වැඩසටහන් 191
10.6.6 රණවිරු සේවණ 193

11. දකුණු ආසියාතික කලාපීය රටවල්හි විශ්‍රාම වැටුප් පිළිබඳ උපාය මාර්ග

11.1 හැඳින්වීම 194
11.2 දකුණු ආසියාතික රටවල ජනගහනය හා ශ්‍රම වෙළෙඳපොළ 194
11.3 දකුණු ආසියාතික රටවල සිවිල් සේවා විශ්‍රාම වැටුප් ක්‍රම 196
11.4 බංගලාදේශීය අත්දැකීම් 197
11.5 නේපාලීය අත්දැකීම් 198
11.6 ඉන්දියානු අත්දැකීම් 200
11.7 පාකිස්ථානීය අත්දැකීම් 202
11.8 ශ්‍රී ලාංකේය අත්දැකීම් 204
11.9 ආසියානු කලාපීය විශ්‍රාම වැටුප් එකමුතුවක අවශ්‍යතාවය 207
11.10 ස්ථිර විශ්‍රාම වැටුප් සහිත සේවා නියුක්තිය පිළිබඳ සමීක්ෂණය 2011 208

## 12. තිරසාර විශ්‍රාම වැටුප් ක්‍රමයක්


12.1 හැඳින්වීම 213

12.2 විශ්‍රාම ගැන්වීමේ ක්‍රියා පටිපාටිය 213

12.3 විශ්‍රාම වැටුප ආර්ථිකයට බලපෑම 214

12.4 තිරසාර විශ්‍රාම වැටුප් ක්‍රමයක් සඳහා ප්‍රතිසංස්කරණ ක්‍රියාවලිය 216

12.4.1 වැන්දඹු අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදල පිහිටුවීම 216

12.4.2 විශ්‍රාම ගැන්වීමේ අනිවාර්යය වයස් සීමාව ඉහළ දැමීම 217

12.4.3 විශ්‍රාම වැටුප් ක්‍රියාවලිය ප්‍රතිනිර්මාණය 217


12.5 සැමට විශ්‍රාම වැටුපක් 218

12.6 විශ්‍රාමික සංවිධාන 219

12.7 රාජ්‍ය සේවා විශ්‍රාමිකයන්ගේ භාර අරමුදල 220

# පූර්විකාව

පුරා වසර අටක්
විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ ජනරාල්
පදවිය හොබවමින්
ඉන් නික්ම යාමට පෙර
කළ කී දෑ මෙන් ම කළ යුතු දේ පිළිබඳව
සටහනක් තබන්නට ගත්
උත්සාහයකි මෙය..............................




**දකුණු ආසියාතික කලාපයේ**
**හොඳම රාජ්‍ය ආයතනය ලෙස**
**විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුවට හිමිවූ**

**"Future Government" Award 2011**
**සම්මානය**

# බැති සිතින්........

තම ජීවිතයෙහි වැදගත්ම කාල පරිච්ඡේදය

රටේ සංවර්ධනය හා සුබසාධනය වෙනුවෙන්

කැප කරමින්

සැඳෑ සමය ගත කරන ජ්‍යෙෂ්ඨ පුරවැසි

විශ්‍රාමික ප්‍රජාවට

ගෞරවයෙනි ____

# ශ්‍රී ලාංකේය විශ්‍රාම වැටුප්

කඳන ආරච්චිගේ තිලකරත්න
විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ ජනරාල්

© විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව

ප්‍රථම මුද්‍රණය
2012 ජනවාරි

පිට කවර නිර්මාණය
චාමින් අමාදිනී රත්නවීර

පරිගණක අක්ෂර සංයෝජනය හා පිටු සැකසුම
අනුෂ්කා චතුරාණි පෙරේරා
සජීවනී වික්‍රමාරච්චි

මුද්‍රණය
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව

ප්‍රකාශනය
විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව
කොළඹ 10.

3- H39510



## ගරු අමාත්‍යතුමාගේ පණිවිඩය

රාජ්‍ය සේවයේ දීර්ඝ කාලීන අත්දැකීම්වලින් පරිපූර්ණ වූ විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ ජනරාල්වරයා වශයෙන් වසර 8ක සේවා පළපුරුද්දෙන් ලත් අත්දැකීම් ගොනු කරමින් කේ. ඒ. තිලකරත්න මහතා විසින් සම්පාදිත මෙම කෘතිය සියලු රාජ්‍ය නිලධාරීන්ට වැදගත් වන කෘතියක් වශයෙන් හැඳින්විය හැකිය. මෙම විෂයය පිළිබඳව ලියූ සිංහල පොතපත ඉතා විරලය. එම අඩුව තිලකරත්න මහතා විසින් සම්පූර්ණ කර ඇත. විශ්‍රාම වැටුප් ක්‍රමයේ ආරම්භයේ සිට සිවිල් විශ්‍රාම වැටුප, සන්නද්ධ හමුදා විශ්‍රාම වැටුප, වැන්දඹු අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමය මෙන්ම රාජ්‍ය සේවා අර්ථ සාධක අරමුදල් කටයුතු ද මෙම විෂයට අන්තර්ගත වේ. එමෙන්ම මෑත කාලයේ හඳුන්වා දුන් ඉ-විශ්‍රාම වැටුප් ක්‍රමය ද ඉදිරියේ දී කාර්යක්ෂම වූ විශ්‍රාම වැටුප් ක්‍රමයක් සඳහා මහඟු පිටිවහලක් වනු ඇත. විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව විසින් මෑත කාලයේ දී මෙවැනි වැදගත් පොත්පත් කිහිපයක්ම ප්‍රකාශයට පත්කර ඇත. යම් රාජ්‍ය ආයතනයක් තම විෂය පථය පිළිබඳව මනා අවබෝධයකින් යුතුව කටයුතු කිරීම මෙන්ම එම විෂය කරුණු අන් අයගේ පරිශීලනය සඳහා මෙසේ ප්‍රකාශයට පත් කිරීම බෙහෙවින් අගය කළ යුත්තකි. එය රාජ්‍ය පරිපාලනයේ සැබෑ සංවර්ධනයට හේතු වනු ඇතැයි මම හුදෙක් විශ්වාස කරමි.

ඩබ්. ඩී. ජේ. සෙනෙවිරත්න
*රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍ය*



## ගරු නියෝජ්‍ය අමාත්‍යතුමාගේ පණිවිඩය

ශ්‍රී ලංකාවෙහි සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ ලබාදීමේ ප්‍රමුඛතම ආයතනය විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව වේ. 2000 වසරේ දී විශ්‍රාම වැටුප් වියදම රුපියල් බිලියන 20ක් පමණ වූ අතර වර්තමානයේ දී එය රුපියල් බිලියන 100 ඉක්මවා ඇත. විශ්‍රාම වැටුප් හිමිකම සහිත රාජ්‍ය නිලධාරීන්ගේ සංඛ්‍යාව ලක්ෂ 10ක් පමණ වන අතර මේ වන විට විශ්‍රාම වැටුප් ප්‍රතිලාභීන්ගේ සංඛ්‍යාව ලක්ෂ පහකට ආසන්න වේ. එමෙන්ම සමස්ත රාජ්‍ය සේවය, පළාත් රාජ්‍ය සේවාව, අධිකරණ නිලධාරින් මෙන්ම සන්නද්ධ හමුදා සාමාජිකයන් වෙනුවෙන් ද සේවා අවසාන ප්‍රතිලාභ ලබාදීමේ වගකීම් භාරය විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුවට පැවරී ඇත. මෙවැනි පසුබිමක් තුළ ශ්‍රී ලාංකේය විශ්‍රාම වැටුප් යන මැයෙන් මෙවැනි කෘතියක් ප්‍රකාශයට පත් කිරීමට විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ ජනරාල්වරයා ක්‍රියා කිරීම අගය කළ යුත්තකි.

**විජය දහනායක**
*රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු නියෝජ්‍ය අමාත්‍ය*



## ජනාධිපති ලේකම්තුමාගේ පණිවිඩය

මීට වසර කිහිපයකට පෙර විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව පිළිබඳ යහපත් ප්‍රතිචාරයක් මහජනතාව තුළ නොතිබිණි. ජනාධිපති කාර්යාලය වෙත එකී කාල සීමාව තුළ ලැබුණු මහජන පෙත්සම් සහ අභියාචනා තුළින් ඒ තත්ත්වය මනාව පැහැදිලි විය. දිනපතා පුවත් පත් සහ පොදු මාධ්‍ය තුළින් ද මේ හා සමාන අදහස් උද්දීපනය විය. අද මෙම තත්ත්වය සහමුලින්ම වෙනස් වී ඇත. විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව සැබෑ මහජන සේවයක් සපයන අනෙකුත් රාජ්‍ය ආයතනවලට ආදර්ශයට ගත හැකි දෙපාර්තමේන්තුවක් බවට පත් වී තිබේ. වෙනස්වීම් කළමනාකරණය සහ තොරතුරු තාක්ෂණ ක්‍රමවේදය වැළඳගත් මෙම දෙපාර්තමේන්තුව අද දකුණු ආසියාවෙහි හොඳම රාජ්‍ය ආයතනය ලෙස සම්මානයට ද පාත්‍ර වී තිබේ. පොදු ජනතාව වඩාත් හොඳ ප්‍රතිචාරයක් දක්වන දෙපාර්තමේන්තුවක් බවට ද පත් වී තිබේ. වර්තමානයේ දී එවකට පැවති අදෝනා හා ඉල්ලීම්, ප්‍රශංසා හා සුභ පැතුම් දක්වා වර්ධනය වී තිබේ. මෙම කාර්යය සඳහා නායකත්වය දුන් විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ ජනරාල් කේ.ඒ තිලකරත්න මහතා විසින් "ශ්‍රී ලාංකේය විශ්‍රාම වැටුප්" නමින් පළමු වතාවට මෙම විෂය පිළිබඳ ග්‍රන්ථයක් එළි දැක්වීමට ක්‍රියා කිරීම බෙහෙවින් අගය කළ යුතුය. එය සමස්ත රාජ්‍ය නිලධාරීන්ට මෙන්ම පොදු පාඨකයාටත් එකසේ වැදගත් වේ යැයි මම ප්‍රකාශ කරමි.

ලලිත් වීරතුංග
*ජනාධිපති ලේකම්*



## රාජ්‍ය පරිපාලන ලේකම්තුමාගේ පණිවිඩය

රාජ්‍ය සේවාව නිර්මිතව ඇත්තේ ජාතියේ උන්නතිය සඳහාය. එනම් රටක හා සියලු රට වැසියන්ට සේවය කිරීම සඳහාය. එම කාර්ය භාරය මෙහෙය වීමේ වගකීම් භාරය ද රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශයට පැවරී තිබේ. වත්මන් විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ ජනරාල් කඳන ආරච්චිගේ තිලකරත්න මහතා 1984 වර්ෂයේ ශ්‍රී ලංකා පරිපාලන සේවයට පත් වූ ඉතා දීර්ඝ කාලීන අත්දැකීම්ලත් ශ්‍රී ලංකා පරිපාලන සේවයේ විශේෂ සේවයේ නිලධාරියෙකි. මොහු මෑත කාලයේ පොත්පත් කිහිපයක්ම සම්පාදනය කරමින් රාජ්‍ය සේවයට වටිනාකමක් එක් කළේය. පසුගිය කාල පරිච්ඡේදය තුළ ශ්‍රී ලංකා විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව ශ්‍රී ලංකා රාජ්‍ය සේවයෙහි ඉතා වැදගත්ම දෙපාර්තමේන්තුවක් බවට පත් විය. ඒ නිසාම ජාත්‍යන්තර සම්මානයෙන් ද පිදුම් ලැබීය. "ශ්‍රී ලාංකේය විශ්‍රාම වැටුප්" යනුවෙන් සැකසුණු මෙම ග්‍රන්ථය මෙම විෂයය පිළිබඳව සිංහල භාෂාවෙන් පළ වූ එකම ග්‍රන්ථය වේ. මෙම විෂයය පිළිබඳව උනන්දු වන සියලු දෙනාටම ඉතා ප්‍රයෝජනවත් වන බව මගේ විශ්වාසයයි. රාජ්‍ය සේවයේ තවත් ඉදිරි ගමනකට අවකාශ ඇති තිලකරත්න මහතාගෙන් මෙවැනි ග්‍රන්ථ තවත් බිහිවනු දැකීම මගේ බලාපොරොත්තුවයි.

**පී. බී. අබේකෝන්**

*රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශ ලේකම්*



4 - H39510



දකුණු ආසියාතික කලාපයේ හොඳම රාජ්‍ය ආයතනය ලෙස

විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුවට හිමිවූ

**"Future Government" Award 2011**

සම්මානය

අතිගරු ජනාධිපති මහින්ද රාජපක්ෂ මැතිතුමා විසින්

විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ ජනරාල් කේ. ඒ. තිලකරත්න මහතාට පිළිගැන්වීම



# පෙරවදන

විශ්‍රාම වැටුප යනු ඉතා විශාල ව්‍යාපෘතියකි. මිලියනයක් පමණ වූ රාජ්‍ය සේවය ඉන් ආවරණය වේ. මධ්‍යම රජය, පළාත් රාජ්‍ය සේවාව, සන්නද්ධ හමුදා මෙන්ම අධිකරණ නිලධාරීන් ද තම සේවා කාලය අවසානයේ දී විශ්‍රාම වැටුපකට හිමිකම් කියති. තම ජීවිතය පුරාවටම විශ්‍රාම වැටුප් ප්‍රතිලාභ ලැබෙන අතර ඉන් අනතුරුව වැන්දඹුව හෝ වැන්දඹු පුරුෂයාට ද ජීවිතය පුරාවට එම ප්‍රතිලාභ හිමි වේ. වයස අවුරුදු 26 ට අඩු රැකියා විරහිත එනම් අනත්දරුවන්ට ද එකී ප්‍රතිලාභ නියතින්ම හිමි වේ. එපමණක් නොව පවුලේ ආබාධිත අනත්දරුවකු වෙතොත් ඔහු වෙනුවෙන් ද ජීවිතාන්තය දක්වා මෙම ප්‍රතිලාභ හිමි වේ. මේ නිසාම විශ්‍රාම වැටුප ඉතා විශාල වූ සමාජ සත්කාරයක් වේ. එකී කටයුතු මෙහෙය වන විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව ශ්‍රී ලංකාවේ සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ වැඩිපුරම ලබාදෙන රාජ්‍ය ආයතනය ද වේ.

2000 වසර තුළ විශ්‍රාම වැටුප් සඳහා දැරූ පිරිවැය රුපියල් බිලියන 20ක් පමණ වූ අතර වර්තමානයේ දී එය රුපියල් බිලියන 110 ඉක්මවා ඇත. රාජ්‍ය ආදායමින් සියයට දහයක් පමණ වන විශ්‍රාම වැටුප් වියදම දළ දේශීය නිෂ්පාදිතයට සියයට දෙකක දායකත්වයක් ද දරනු ලැබේ. මිලියන භාගයකට ආසන්න වන සමස්ත විශ්‍රාමිකයින් වෙනුවෙන් සෑම මාසයකම අඛණ්ඩව වැටුප් ගෙවීම ඉතා අත්‍යවශ්‍ය කාර්යයක් වී තිබේ. රාජ්‍ය විශ්‍රාම වැටුප් ක්‍රමය තුළින් ආවරණය වන එනම් යැපෙන ශ්‍රී ලාංකීක පුරවැසියන්ගේ ප්‍රමාණය මිලියන 02 ක් පමණ වෙතැයි ගණන් බලා තිබේ.

සේවා අවසන් ප්‍රතිලාභ මාසිකව ගෙවනු ලැබේ. විශ්‍රාම වැටුප, වැන්දඹු විශ්‍රාම වැටුප, වැන්දඹු පුරුෂ විශ්‍රාම වැටුප, අනත්දරු විශ්‍රාම වැටුප, ආබාධිත අනත්දරු මෙන්ම වන්දි විශ්‍රාම වැටුප ද ගෙවනු ලැබේ. එමෙන්ම යැපෙන්නන්ගේ දීමනා, පුනර්‍යාධාර දීමනා මෙන්ම ඇතැම් අවස්ථාවල තුවාල දීමනා , යහපත් සේවා දීමනා මෙන්ම දුබලතා විශ්‍රාම වැටුප ද මාසිකව හිමි ගන්වනු ලැබේ. ඇතැම් ප්‍රතිලාභ එක්වරක් පමණක් ගෙවනු ලබන පාරිතෝෂිකයන් වේ. විශ්‍රාම වැටුප් පාරිතෝෂික, මරණ පාරිතෝෂිකයන්, විශේෂ වන්දි , සේවා පාරිතෝෂික, දෛනික සේවා පාරිතෝෂික , කරුණාසහගත දීමනා ඒ අතර වැදගත් වේ. ඇතැම් ප්‍රතිලාභ දායකයාට, වැන්දඹුවට, අනත්දරුවන්ට, යැපෙන්නන්ට, උරුමක්කරුවන්ට හෝ භාරකරුවන් වෙත ගෙවන අවස්ථා ද දැකිය හැක. එමෙන්ම බාල වයස්කරුවන්ගේ නමින් ගිණුම්ගත වන විශ්‍රාම වැටුප් ප්‍රතිලාභයන්ගේ වටිනාකම ඉතා ඉහළ අගයක් ගනී.

විශ්‍රාම වැටුප් ප්‍රතිලාභ හිමි ගැන්වීමේ දී විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා සංග්‍රහය, වැන්දඹු/වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප් පනත්, සන්නද්ධ හමුදා විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා සංග්‍රහය හා එම වැන්දඹු අනත්දරු විශ්‍රාම වැටුප් පනත් බලපවත්වනු ලැබේ. විටින් විට ගරු අමාත්‍ය මණ්ඩලය විසින් සිදු කරන අනුමැතීන් පමණක් නොව ඇතැම් නීති රෙගුලාසිවල විශ්‍රාම වැටුප් පිළිබඳ වගන්තීන් ද ඊට සෘජුව

බලපානු ලැබේ. මේ සියල්ලෙහි අවසානය තෘප්තිමත් විශ්‍රාමික ප්‍රජාවක් බිහි කිරීම වේ. එම දැක්ම කරා යන ගමනේ දී ජීවන වියදම, විශ්‍රාම වැටුප් විෂමතාවය මෙන්ම සමස්ත විශ්‍රාමික ප්‍රජාවගෙන් වැඩි ප්‍රමාණයක් රුපියල් 10000කට වඩා අඩු විශ්‍රාම වැටුප ලැබීම ද බාධාකාරී සාධක වන බව අප අමතක කළ යුතු නැත.

ඉහත වාතාවරණය තුළ පුරා වසර 8කට ආසන්න කාලයක් ශ්‍රී ලංකා රාජ්‍ය සේවාවේ අද්විතීය තනතුර වූ විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ ජනරාල් තනතුර දැරීමට හැකි වීම වාසනාවකි.

2004 වසරෙහි පෙබරවාරි මස පළමු දින මා විශ්‍රාම වැටුප් නිවහනට ගොඩවැදුනේ ඉතාමත් අප්‍රසන්න හැඟීමෙනි. මිදුල මැද ගොඩ ගැසී තිබූ අපද්‍රව්‍ය කන්දරාව, අප්‍රසන්න කැන්ටිම, කැඩුණු බිඳුණු ලී බඩු හා අල්මාරි, කඩා වැටුණු සිවිලිම, දුර්වර්ණ වූ බිත්ති පමණක් නොව මලානික මුහුණු ද එම අප්‍රසන්න හැඟීම දෙගුණ තෙගුණ කළේය. එහි ප්‍රතිඵලය වූයේ දැඩි අධිෂ්ඨානයක් සිත තුළ ඇති වීමයි. මෙම දෙපාර්තමේන්තුව හැදිය යුතුය යන්න මූලික සිතුවිල්ල විය. එය ක්‍රියාවට නැගීමට හැකි විය. වසර 7ක් තුළ ඉතා අලංකාරවත් පරිසරයක් විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව තුළ නිර්මාණය විය. විශ්‍රාම වැටුප් නිලධාරීන් හා ලේඛන සහකාරවරුන් ලෙස දෙපාර්තමේන්තුගත නිලධාරීන් පිරිසක් බඳවා ගත හැකි විය. තොරතුරු තාක්ෂණය ඉහළ මට්ටමින් යොදා ගන්නා ලදී. වෙනස්වීම් කළමනාකරණ වැඩසටහන් ක්‍රියාත්මක විය. අවබෝධය, සහයෝගිතාවය හා උද්යෝගය ඊට පාදක විය. දෙපාර්තමේන්තු කාර්යයන් ක්‍රියාවලීන් 6ක් බවට පරිවර්තනය කෙරුණි. වඩා මහජන හිතකාමී රාජ්‍ය ආයතනයක් බවට මෙම දෙපාර්තමේන්තුව පත් කෙරුණි. එය ප්‍රතිලාභීන්ගේ පැසසුමට ලක් විය. එහි අවසානය වූයේ Future Government - 2011 Award සම්මානය මෙම දෙපාර්තමේන්තුවට ලබා ගැනීමට හැකි වීමයි. 1970 කෙටි දුරකථනය තුළින් විමසීම් සඳහා කඩිනමින් ප්‍රතිචාර දක්වන ලදී. විශ්‍රාමිකයින්ට නේවාසික පහසුකම් ලබාදීම, වන්දනා පහසුකම් සැපයීම දක්වා දෙපාර්කමේන්තු විෂය පථය වර්ධනය වීම ද සැලකිය යුතු කරුණු වේ.

පසුගිය වසර 7ක කාල සීමාව තුළ ඉතා ත්‍යාගශීලී විශ්‍රාම වැටුප් ප්‍රතිලාභ රජය විසින් මහජනතාවට ලබා දෙන ලදී. විශ්‍රාම වැටුප් විෂමතාවය ඉවත් කිරීම, වැන්දඹු අනත්දරු අණ පනත් සංශෝධනය, ස්වෙච්ඡා බල සේනා සඳහා වැන්දඹු අනත්දරු හිමිකම් ලබාදීම, හමුදා නිලධාරීන්ට පූර්ණ විශ්‍රාම වැටුප් හිමි ගැන්වීම, පොලිස් උප සේවා සඳහා විශ්‍රාම වැටුප් හිමිකම් වැනි සහනයන් හේතුවෙන් විශ්‍රාමික ප්‍රමාණය මෙන්ම එහි පිරිවැය ද බෙහෙවින් ඉහළ යන ලදී. එහි අවසන් ප්‍රතිඵලය වූයේ 2010 හා 2011 වසර දෙක තුළ ශ්‍රී ලංකාවේ විශ්‍රාමිකයන්ගේ ප්‍රමාණය 44000 කින් ඉහළ යාමයි. සමෘද්ධි අධිකාරී නිලධාරීන්ට විශ්‍රාම වැටුප් හිමිකම් මෙන්ම සිවිල් ආරක්ෂණ දෙපාර්තමේන්තු කාර්යය මණ්ඩලය විශ්‍රාම වැටුප් සහිත තත්ත්වයට යථා කාලයේ දී පත් කිරීම සමඟ මෙම ප්‍රමාණය තව දුරටත් සංඛ්‍යාත්මකව ඉහළ යාම පාලනය කළ නොහැකිය. රජය හඳුන්වා දුන් නමුත් ක්‍රියාත්මක කළ නොහැකි වූ පෞද්ගලික අංශයෙහි විශ්‍රාම වැටුප් ක්‍රමය වෙනුවට අර්ධ රාජ්‍ය ආයතන කාර්ය මණ්ඩලයන් ද විශ්‍රාම වැටුප් සහිත තත්ත්වයට පත් කිරීම පිළිබඳව ද අවධානය යොමු කිරීම වැඩි ඈතක නැත. 20000 ට ආසන්න වූ විදේශගත විශ්‍රාම වැටුප් පරිපාලනය මා වෙත පැවරුණු භාරදූර කාර්යයක් විය. එකී ගෙවීම් අත්හිටුවන ලද අතර නිවැරදිව හඳුනාගත් විශ්‍රාමිකයන්ට ගෙවීම් ආරම්භ කෙරුණි. එහි ප්‍රතිඵලය ලෙස ලංකා බැංකුව හා මහජන බැංකුවෙහි හඳුනා ගත් ශාඛා කාර්යාල දෙකක රුපියල් බිලියනයකට ආසන්න මුදලක් වසර 02ක් තුළ ගිණුම්ගත කිරීමට හැකි විය. එහි විශේෂත්වය නම් එම තැන්පතුවලින් සියයට 70ක් ම ඉතුරුම් වශයෙන් පැවතීමයි.

ශ්‍රී ලාංකික පුරවැසිභාවය නැති පුද්ගලයන්ට මෙම විදේශගත විශ්‍රාම වැටුප ගෙවීම පිළිබඳව ප්‍රතිපත්තිමය තීරණ ගත යුතු කාලය එළඹ ඇති බව ද අමතක නොකළ යුතුය. විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ ජනරාල් වශයෙන් ඕස්ට්‍රේලියාව, ඉන්දියාව, එක්සත් ජනපදය , එක්සත් රාජධානිය , ස්වීඩනය, චීනය වැනි රටවල්හි විශ්‍රාම වැටුප් ක්‍රමවේදයන් අධ්‍යයනය කිරීමට අවස්ථාව ලැබුණි. එවැනි රටවල්හි ඉතා හොඳ අත්දැකීම් ශ්‍රී ලංකාව තුළ ක්‍රියාත්මක කිරීමට ද හැකි විය. කෙසේ වෙතත් , ශ්‍රී ලංකාවේ විශ්‍රාම වැටුප්

පිළිබඳ සිහිනය සාක්ෂාත් කිරීමට තවත් බොහෝ දේ කළ යුතුව ඇත. රාජ්‍ය විශ්‍රාම වැටුප් ක්‍රමයෙන් මිලියන දෙකක පුරවැසියන් ආවරණය කළ හැකි වේ. ගොවි විශ්‍රාම වැටුප් ක්‍රමයෙන් මිලියනයක් ආවරණය වේ. ගොවි ජනතාවට ද, ශ්‍රී ලංකා සමාජ ආරක්ෂණ මණ්ඩලයෙහි විශ්‍රාම වැටුප් ක්‍රමයෙන් තවත් මිලියනයක විදේශගත සේවා නියුක්තිකයන්ට ද විශ්‍රාම වැටුප් ක්‍රමයක් අත්‍යවශ්‍ය වේ. ඒ අනුව ඉතිරිවන වයස්ගතවූවන් වෙනුවෙන් ද සමාජ ආරක්ෂණ වැඩපිළිවෙළවල් සැපයීම අත්‍යවශ්‍ය වන්නේය.


විශ්‍රාම වැටුප් සඳහා තොරතුරු තාක්ෂණික විසඳුම් සෙවීම සඳහා ඉ - විශ්‍රාම වැටුප් ව්‍යාපෘතිය ආරම්භ කරන ලදී. ඒ තුළින් දෙපාර්තමේන්තුව ප්‍රතිනිර්මාණය විය. සියලු විශ්‍රාමික තොරතුරු www.pensions.gov.lk අන්තර්ජාලයට ඇතුළත් කෙරුණි. එමෙන්ම ප්‍රමාදයකින් තොරව සේවා අවසාන ප්‍රතිලාභ හිමි ගැන්වීමේ යාන්ත්‍රණයක් ද නිර්මාණය විය.

මෙය අවසානය නොවේ. විශ්‍රාම වැටුප් ක්‍රමයේ තිරසාරභාවය සඳහා වැන්දඹු අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදලක් ස්ථාපිත කිරීම අත්‍යවශ්‍ය වන්නේය. වේගයෙන් වර්ධනය වන විශ්‍රාමික ප්‍රජාවන්ගේ අනාගත ආරක්ෂාව සඳහා අග්‍රහාර රක්ෂණය ඔවුන් වෙත ළඟා කර ගත යුතුව ඇත. එමෙන්ම සැබෑ විශ්‍රාමිකයන්ගේ විශ්‍රාම වැටුප් විෂමතා ගැටලුව විසඳීම අත්‍යවශ්‍ය වනු ඇත. ඒ තුළින් තෘප්තිමත් විශ්‍රාමික ප්‍රජාවක් බිහි කළ යුතුව ඇත.

**කඳන ආරච්චිගේ තිලකරත්න**
*විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ ජනරාල්*

2012-01-20
විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව
කොළඹ 10.

# විශ්‍රාම වැටුප් ධජය



# විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තු ගීතය

සිරිලක රජයේ සේවය කරනා
සැම පුරවැසි දිවි හිමි කොට රකිනා
ආයතනය සැරදේ සදා විශ්‍රාම වැටුප් ගෙවනා ....//
ලක් රජයට නිති ඇප කැප වී
උදාර සේවය කළ සැමටත්
අනාගතයේ සේවය නිම කරනා
රාජ සේවක සැම දෙනාටත්
සැඳෑ සමය සැනසුමෙන් ගෙවීමට
සාමය සම්පත සතුට ලබන්නට
අත දෙන තිර ලෙසිනේ සැමදා
ආයතනය සැරදේ සදා විශ්‍රාම වැටුප් ගෙවනා ....//

සිරිලක රජයේ ....//

ආයතනයෙ සේවය කරනා
නිල දරුවන් නිලධාරිණියන්
අනිකුත් සැම සේවක පිරිසත්
කරනා සේවය උදාර වේ
ගෙවනා ප්‍රතිලාභය මා හැඟිවේ ....//
සැමගේ හද ගිනි නිවාලමින්
ආයතනය සැරදේ සදා විශ්‍රාම වැටුප් ගෙවනා ....//

සිරිලක රජයේ ....//

සංගීතය : - අමිතා වැදිසිංහ මිය

# 1
# විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව

## 1.1 හැඳින්වීම

විශ්‍රාමික ජ්‍යෙෂ්ඨ පුරවැසියන්ගේ නිවහන හෙවත් විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව ස්ථාපිත කරන ලද්දේ 1970 වර්ෂයේදී ය. "රාජ්‍ය නිලධාරීන්ගේ විශ්‍රාම වැටුප්" පිළිබඳ කාර්යයභාරය ඊට පෙර ඉටු කරන ලද්දේ මහා භාණ්ඩාගාරය මඟිනි. එහි අතිරේක ආයතන පාලකවරයකුට විශ්‍රාම වැටුප් විෂය පිළිබඳ වගකීම පැවරී තිබුණි. 1970 වර්ෂයේදී මුදල් අමාත්‍යාංශය හා රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය, අමාත්‍යාංශ දෙකක් බවට පත්වීමේ දී ඇරඹූ පළමු දෙපාර්තමේන්තුව "විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව" විය. මෙම දෙපාර්තමේන්තුව A ශ්‍රේණියේ දෙපාර්තමේන්තුවක් ලෙස ආරම්භ කරනු ලැබුවේ පහත සඳහන් ආයතන 03 ක් ඒකාබද්ධ කිරීමෙනි.

I. මහා භාණ්ඩාගාරය යටතෙහි අතිරේක ආයතන පාලකවරයකු යටතේ පාලනය වූ විශ්‍රාම වැටුප් අංශය

II මුදල් අමාත්‍යාංශය යටතෙහි උප දෙපාර්තමේන්තුවක් වශයෙන් පැවති වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් කාර්යාලය

III 1942 ඇරඹූ හා නියෝජ්‍ය භාණ්ඩාගාර ලේකම්වරයාගේ සහභාගිත්වයෙන් ක්‍රියාත්මක වූ රාජ්‍ය සේවා අර්ථ සාධක අරමුදල

මේ අනුව රාජ්‍ය නිලධාරීන්ගේ විශ්‍රාම වැටුප් හා වැන්දඹු අනත්දරු විශ්‍රාම වැටුප් පිළිබඳ වගකීම ද එමෙන්ම විශ්‍රාම වැටුප් අහිමි රාජ්‍ය සේවකයින් සඳහා රාජ්‍ය සේවා අර්ථ සාධක අරමුදල් පවත්වා ගැනීම පිළිබඳ වගකීම ද මෙම දෙපාර්තමේන්තුවට පැවරුණි.

මුල් අවධියේ දී විශ්‍රාම වැටුප්, වැන්දඹු අනත්දරු විශ්‍රාම වැටුප් හා රාජ්‍ය සේවා අර්ථ සාධක අරමුදල මුදල් අමාත්‍යාංශයේ වගකීම යටතේ ක්‍රියාත්මක විය. මේ නිසා ඊට අදාළ සියලුම චක්‍රලේඛ මහා භාණ්ඩාගාරය විසින් නිකුත් කරන ලදී. 1970 දී රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය ස්ථාපිත වීමත් සමඟම මෙම විෂයයන් එම අමාත්‍යාංශය යටතට පත් විය. එමෙන්ම 1970 දෙසැම්බර් මස 23 වන දින විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව ස්ථාපිත විය. 1970 මැයි 05 දිනැති සංශෝධිත විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා සංග්‍රහය පාදක කොට ගෙන සියලුම චක්‍රලේඛ හා විධිවිධාන රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය විසින් නිකුත් කරන ලදී. පසු කාලීනව මෙම වගකීම් භාරය විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුවට පැවරුණි. මෙම දෙපාර්තමේන්තුව මහා භාණ්ඩාගාරයෙහි පිහිටුවා තිබූ අතර පසු කාලයේ දී එහි විවිධ අංශ කොළඹ ප්‍රධාන ස්ථාන කීපයක පවත්වා ගෙන යාමට සිදු වී තිබුණි.

ඒ අනුව කොළඹ මහ ලේකම් කාර්යාල ගොඩනැගිල්ලේ දෙවන මහලේ ප්‍රධාන කාර්යාලය හා අංශ කීපයකුත් එහි පළමුවන මහලේ එක් අංශයකුත් ගොඩනැගිල්ල අවට බිම් පෙදෙසේ වැන්දඹු අනත්දරු විශ්‍රාම වැටුප් කාර්යාලයත්, බම්බලපිටිය ගොඩනැගිල්ලක රාජ්‍ය සේවා අර්ථ සාධක අරමුදල් කාර්යාලයත්, මාලිගාවත්ත, මහ ලේකම් කාර්යාල ගොඩනැගිල්ලේ ගුරු වැන්දඹු අනත්දරු විශ්‍රාම වැටුප් කාර්යාලයත් පවත්වා ගෙන යන ලදී. දෙපාර්තමේන්තුවේ ශාඛා කාර්යාල නා නා ස්ථානවල විසිරී තිබූ නිසා එය පරිපාලන කටයුතු වලට මෙන්ම විවිධ හේතූන් නිසා දිවයිනේ නොයෙකුත් ප්‍රදේශ වලින් මෙහි පැමිණෙන විශ්‍රාමිකයින්ට හා මහජනයාටත් ඔවුන්ගේ අවශ්‍යතා ඉටු කර ගැනීමේ බාධාවක් පැවතුණි.

මේ නිසා කොළඹ පිටකොටුවේ පිහිටි ඇන්. එච්. ඇම්. කාදර් මාවතේ (කලින් රෙක්ලමේෂන් පාර) අංක 10 දරන ස්ථානයේ පිහිටි කැප්රිකෝන් ටවර් ගොඩනැගිල්ලට විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව 1986.08.16 දින ගෙන යන ලදී. ශ්‍රී ලංකා මහා බැංකුවට එල්ල වූ ත්‍රස්තවාදී ප්‍රහාරයෙන් පසුව විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව මාලිගාවත්ත මහ ලේකම් කාර්යාල ගොඩනැගිල්ලෙහි නිත්‍ය වශයෙන්ම ස්ථාපිත විය.

### දැක්ම

ආර්ථික හා සාමාජීය වශයෙන් තෘප්තිමත් විශ්‍රාමික ප්‍රජාවක් බිහි කිරීම.

### මෙහෙවර

රාජ්‍ය සේවය සඳහා උරදුන් නිලධාරීන්ගේ සේවා අවසාන ප්‍රතිලාභ සහතික කිරීම තුලින් ඔවුන්ගේ විශ්‍රාමික ජීවන තත්වය නගා සිටුවීම හා පවත්වාගෙන යාම සඳහා අවශ්‍ය සක්‍රීය දායකත්වය නිබඳව ලබා දීම සඳහා.

### පරමාර්ථ

රාජ්‍ය නිලධාරීන්ගේ විශ්‍රාම වැටුප් පිළිබඳ ප්‍රතිපත්ති සකස් කිරීම සහ ඒවා කාර්යක්ෂමව ක්‍රියාත්මක කිරීම මඟින් රාජ්‍ය සේවකයන්ට, ඔවුන්ගේ කලත්‍රයන්ට හා යැපෙන්නන්ට අනාගත ආරක්ෂාව සැලසීම මෙන්ම සුබසිද්ධිය සහතික කිරීම.

### අරමුණු හා කාර්යය භාරයන්:-


- විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා සංග්‍රහය පාදක කොට ගෙන රාජ්‍ය, පළාත් සභා, සන්නද්ධ හමුදා නිලධාරීන් සඳහා විශ්‍රාම වැටුප් ප්‍රතිපත්ති සකස් කිරීම සහ විවිධ දීමනා ගෙවීම.
- රාජ්‍ය නිලධාරීන්ගේ වැන්දඹුවන්, වැන්දඹු පුරුෂයන් හා අනත්දරුවන් සම්බන්ධයෙන් වැන්දඹු, වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමය ක්‍රියාත්මක කිරීම.
- විශ්‍රාම වැටුප් රහිත මාසික වැටුප් ලබන රාජ්‍ය සේවකයන් උදෙසා රාජ්‍ය සේවා අර්ථ සාධක අරමුදල් ක්‍රමය ක්‍රියාත්මක කිරීම.
- පළාත් පාලන සේවා නිලධාරීන්ගේ වැන්දඹුවන්, වැන්දඹු පුරුෂයන් හා අනත්දරුවන් සඳහා පළාත් පාලන සේවා වැන්දඹු, වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමය ක්‍රියාත්මක කිරීම.
- ජාතික, දිස්ත්‍රික්ක සහ ප්‍රාදේශීය මට්ටමෙන් විශ්‍රාම වැටුප් ගෙවීම, පරිපාලනය කිරීම හා සම්බන්ධීකරණය කිරීම.
- විශ්‍රාමික සංගම් ප්‍රමුඛ කොටගත් සිවිල් සමාජය සමඟ සම්බන්ධීකරණයක් පවත්වා ගැනීම.

## 1.2 සංවිධානය හා ප්‍රතිව්‍යුහගතකරණය

රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය යටතට පත් වූ විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුවෙහි ප්‍රථම අධ්‍යක්ෂවරයා වූයේ අතිරේක ආයතන පාලක වශයෙන් කටයුතු කළ ලෙනාඩ් පනම්බලම මහතාය. ආරම්භයේ දී මෙහි කාර්යය මණ්ඩලය 200 කට පමණ සීමා විය. ශ්‍රී ලංකා පරිපාලන සේවය, ශ්‍රී ලංකා ගණකාධිකාරී සේවය, ඒකාබද්ධ සේවයේ අනෙකුත් නිලධාරීන්ගෙන් කාර්යය මණ්ඩලය සමන්විත විය. මුල් කාලයේ

දී දිසාපති කාර්යාල වෙත බලතල විමධ්‍යගත කොට පැවති අතර 1993 දී මෙම විශ්‍රාම වැටුප් විෂය ප්‍රාදේශීය ලේකම් කාර්යාල දක්වා විමධ්‍යගත කෙරුණි. එමෙන්ම 1996 දී ඒ ඒ රාජ්‍ය ආයතනවලට තවදුරටත් කාර්යය භාරය විමධ්‍යගත කරන ලදී. 2005 වර්ෂයේ දී ලේඛන සහකාරවරු 141 ක්, විශ්‍රාම වැටුප් නිලධාරීන් 340 ක් දෙපාර්තමේන්තු ගත නිලධාරීන් වශයෙන් බඳවා ගනු ලැබුවේ දෙපාර්තමේන්තු කාර්යය භාරය පුළුල් වීමත් සමඟය. දෙපාර්තමේන්තුව ප්‍රතිව්‍යුහගතකරණයට ලක්වන තෙක් පහත සඳහන් අධ්‍යක්ෂවරු දෙපාර්තමේන්තු ප්‍රධානී තනතුර දරන ලදී.


01. ලෙනාඩ් පනම්බලම් මහතා
1971 - 1975




02. ශ්‍යාමන් ජයසිංහ මහතා
1976 - 1979



03. ඩොනල්ඩ් අබේසිංහ මහතා
1979 - 1986



04. එස්. සිවානන්දන් මහතා
1987 - 1989



05. ඔස්ටින් ජයවර්ධන මහතා
1990 - 1991



06. ආර්. ඩබ්. පියසේන මහතා
1991 - 1995



07. ආරිය සමරවීර මහතා
1995 - 1997



08. පී. එම්. පී. ජයවර්ධන මිය
1997 - 2001




09. එස්. ඩබ්. රාජපක්ෂ මහතා
2001 - 2002



10. වික්ටර් සමරවීර මහතා
2002 - 2004



11. කේ. ඒ. තිලකරත්න මහතා
2004 සිට 2006 දක්වා



2006 සිට අද දක්වා කේ. ඒ. තිලකරත්න මහතා විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ ජනරාල් වශයෙන් කටයුතු කරයි.

විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව තනතුරු නාම වෙනස් කිරීම යන මැයින් අමාත්‍ය මණ්ඩල පත්‍රිකා අංක 6/1521/224/048 යටතේ කළමනාකරණ සේවා අධ්‍යක්ෂ ජනරාල් විසින් සකස් කරන ලද වාර්තාවෙන් දැක්වෙන නිර්දේශයන්ට අනුව විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව ප්‍රතිව්‍යුහගත කරන ලද අතර ඒ අනුව පහත සඳහන් පරිදි තනතුරු නාම ස්ථාන ගත වී ඇත.

| තනතුර | ශ්‍රේණිය | තනතුරු ගණන |
|---|---|---|
| 01 විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ ජනරාල් | ශ්‍රී ලං.ප.සේ. I විශේෂ ශ්‍රේණිය | 01 |
| 02 විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ | ශ්‍රී ලං.ප.සේ. I ශ්‍රේණිය | 02 |
| 03 නියෝජ්‍ය විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ | ශ්‍රී ලං.ප.සේ. II ශ්‍රේණිය | 04 |
| 04 සහකාර විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ | ශ්‍රී ලං.ප.සේ. III ශ්‍රේණිය | 04 |
| 05 අධ්‍යක්ෂ (මුදල්) | ශ්‍රී ලං.ග.සේ. I ශ්‍රේණිය | 01 |
| 06 අභ්‍යන්තර විගණක | ශ්‍රී ලං.ග.සේ. I/II ශ්‍රේණිය | 01 |
| 07 ලේකම් හා ගණකාධිකාරී/ ප්‍රධාන ගණකාධිකාරී (පළාත් පාලන) | ශ්‍රී ලං.ග.සේ. II/I ශ්‍රේණිය | 05 |
| 08 ගණකාධිකාරී | ශ්‍රී ලං.ග.සේ. II/II ශ්‍රේණිය | 06 |
| 09 ජ්‍යෙෂ්ඨ පද්ධති විශ්ලේෂක | නව තොරතුරු තාක්ෂණ සේවය | 01 |
| 10 පද්ධති විශ්ලේෂක | නව තොරතුරු තාක්ෂණ සේවය | 01 |
| 11 පරිපාලන නිලධාරී | රාජ්‍ය කළමනාකරණ සේවය අධිශ්‍රේණිය | 03 |
| 12 භාෂා පරිවර්තක | භාෂා පරිවර්තක සේවය | 02 |
| 13 නීති නිලධාරී | දෙපාර්තමේන්තු ගත තනතුර | 01 |
| 14 කාර්මික නිලධාරී | ශ්‍රී ලංකා තාක්ෂණ සේවය | 01 |
| 15 විශ්‍රාම වැටුප් නිලධාරී | දෙපාර්තමේන්තු ගත තනතුර | 340 |
| 16 අයවැය සහකාර | | 01 |
| 17 රාජ්‍ය කළමනාකරණ සහකාර සේවය | ඒකාබද්ධ සේවය | 200 |
| 18 ලේඛන සහකාර | දෙපාර්තමේන්තුගත තනතුර | 141 |
| 19 කාර්යාල කාර්ය සහයක | ඒකාබද්ධ සේවය | 49 |
| 20 රියදුරු | ඒකාබද්ධ සේවය | 06 |

මීට අමතරව කාර්යාල සේවක සේවයේ අතිරේක තනතුරු 07ක් සඳහා රියදුරු සේවයෙහි අතිරේක තනතුරු 03 ක් අනුමත කර ගන්නා ලද අතර ඒ අනුව අනුමත කාර්යය මණ්ඩලය 785 කි. එමෙන්ම ශ්‍රී ලංකා ගණකාධිකාරී සේවා නව ව්‍යවස්ථාවට අනුව අධ්‍යක්ෂ (මුදල්) තනතුර ප්‍රධාන ගණකාධිකාරී ලෙස සංශෝධනය වී තිබේ. අධ්‍යක්ෂ ජනරාල්වරයාට සහාය වීම සඳහා විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ, විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ (වැ.අ.වි.වැ.) හා ප්‍රධාන තනතුරු කිහිපයක් ඇති අතර ජාතික වැටුප් හා සේවක සංඛ්‍යා කොමිෂන් සභාවේ නව නිර්නායකයන්ට අනුව පහත සඳහන් ස්ථරයන්ට අනුව සංවිධාන ව්‍යුහය යළි සැකසීම කෙරෙහි අවධානය යොමු වී තිබේ.

- අධ්‍යක්ෂ මට්ටම ( විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂවරුන්, ප්‍රධාන ගණකාධිකාරී මෙම මට්ටමට ඇතුළත් වේ. )
- මාණ්ඩලික නිලධාරී මට්ටම ( නියෝජ්‍ය අධ්‍යක්ෂ, සහකාර අධ්‍යක්ෂ, නියෝජ්‍ය ප්‍රධාන ගණකාධිකාරී, ගණකාධිකාරීවරුන් මෙන්ම වෙනත් මාණ්ඩලික නිලධාරීන් ද මෙයට ඇතුළත් වේ.)
- ද්විතියික මට්ටමේ නිලධාරී ගණය (විශ්‍රාම වැටුප් නිලධාරීන් , කළමනාකරණ සහකාරවරුන් සහ ලේඛන සහකාරවරුන් ඇතුළත් වේ. )
- ප්‍රාථමික මට්ටම ( කාර්යාල කාර්යය සහායකවරුන් හා රියදුරන් මෙන්ම වෙනත් ඒ හා සමාන්තර තනතුරු මින් අදහස් වේ.)

දෙපාර්තමේන්තුවෙහි විෂය පථය අංශ ගණනාවක් යටතේ ක්‍රියාත්මක වේ. ඒ අනුව ලියාපදිංචි, ගණන් බැලීම්, ප්‍රතිපත්ති, සන්නද්ධ හමුදා, විදේශ විශ්‍රාම වැටුප්, පාලන, ගිණුම්, වැන්දඹු අනත්දරු, රාජ්‍ය සේවා අර්ථ සාධක අරමුදල්, අභ්‍යන්තර විගණන, පළාත් පාලන හා බැංකු කටයුතු යනුවෙන් එහි විෂයන් වර්ගීකරණය වී ඇත.

### 1.3 විශ්‍රාම වැටුප් ප්‍රතිලාභ

රාජ්‍ය නිලධාරින්ට හිමි සේවා අවසාන ප්‍රතිලාභ විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා සංග්‍රහයට අනුකූල විය යුතුය. නියමිත සේවා කාලය අවසානයේ දී විශ්‍රාම පාරිතෝෂිකය හා මාසික විශ්‍රාම වැටුප ලබා ගැනීම, සේවා කාලය තුළ සිදු වන මරණයක දී යැපෙන්නන්ට මරණ පාරිතෝෂිකය ගෙවීම මෙන්ම වෙනත් විවිධ හේතූන් මත වන්දි, පාරිතෝෂික හා වෙනත් දීමනා හිමිගැන්වීම ද ඒ අතර ප්‍රධාන වේ. එමෙන්ම කලින් කලට ගරු අමාත්‍ය මණ්ඩලය විසින් ගනු ලබන තීරණ හා ඊට අනුකූලව විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා සංග්‍රහය සංශෝධනය වේ. ඒ නිසාම ඇතැම් ප්‍රතිලාභ වර්ධනය වන අවස්ථා ද විද්‍යාමාන වේ.

#### 1.3.1 විශ්‍රාම වැටුප් හිමිකම

විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා සංග්‍රහයේ දෙවන වගන්තිය ප්‍රකාරව මාසික විශ්‍රාම වැටුපකට හිමිකම් ලබන්නේ ස්ථිර විශ්‍රාම වැටුප් සහිත තනතුරක සේවය කරමින් සිටින තැනැත්තන් ය. ඒ අනුව මාසික විශ්‍රාම වැටුපක් ලැබීමට පහත සඳහන් අවශ්‍යතා සම්පූර්ණ කළ යුත්තේය.

1. **ස්ථිර විශ්‍රාම වැටුප් සහිත පත්වීමක් ලබා තිබීම.**
   පත්වීමේ ස්වභාවය අනුවම එය ස්ථිර විශ්‍රාම වැටුප් සහිත බව සඳහන් විය යුතුය. එමෙන්ම ගරු අමාත්‍ය මණ්ඩලය විසින් ස්ථිර විශ්‍රාම වැටුප් සහිත බවට ගනු ලැබූ පොදු තීරණය අනුව ද මෙම අවශ්‍යතාවය ඉටු වේ.

   උදා- පොලිස් උප සේවය ස්ථිර විශ්‍රාම වැටුප් සහිත බවට අමාත්‍ය මණ්ඩලය තීරණය කරනු ලැබීය. එවිට යම් යම් කොන්දේසි සපුරා ඇති පොලිස් උප සේවයට විශ්‍රාම වැටුප් හිමිකම් ලැබුණි.
   රජයේ ප්‍රතිපත්ති මත 2003-2007 අතර කාල සීමාව තුළ දී දායකත්ව විශ්‍රාම වැටුප් සහිත පත්වීම් ප්‍රදානය කරන ලදී. 2007 දී දායකත්ව විශ්‍රාම වැටුප් ක්‍රමය අහෝසි වීමත් සමඟ එවැනි පත්වීම් ද ස්ථිර විශ්‍රාම වැටුප් සහිත පත්වීම් සේ සලකන ලදී.

2. සේවය ස්ථිර කොට තිබීම
   පරිවාස කාලය අවසානයේ දී නියමිත පරීක්ෂණ හා සුදුසුකම් සපුරාලීමෙන් පසුව සේවය ස්ථිර කොට තිබීම වැදගත්ය.

3. අවම වශයෙන් මාස 120 ක දළ සේවා කාලයක් තිබීම
   දළ සේවා කාලය ගණන් බැලීමේ දී ආදේශක, අනියම්, දෛනික වැටුප්, විශ්‍රාම වැටුප් රහිත රාජ්‍ය රාජ්‍ය සේවා අර්ථ සාධක සහිත සේවය, ඇතැම් පුහුණු කාල සීමාවන් හා විශ්‍රාම වැටුප් සහිත සේවා කාලය ද ඊට ඇතුළත් කරනු ලැබේ.

4. විධිමත් පරිදි විශ්‍රාම ගැන්වීම
   මුලින් සඳහන් කළ අවශ්‍යතාවයන් පැවතිය ද අදාළ බලධාරියා විසින් විධිමත් පරිදි විශ්‍රාම ගැන්වීමක් ද සිදු කළ යුතුය. එය පත්වීම් හා විනය බලධාරියා විසින් සිදු කෙරේ.

   උදා-
   1. අමාත්‍යාංශ ලේකම්වරුන් , ගරු ශ්‍රේෂ්ඨාධිකරණ, අභියාචනා හා මහාධිකරණ, විනිසුරුවන් යනාදීය අතිගරු ජනාධිපතිතුමා විසින් විශ්‍රාම ගන්වනු ලැබේ.
   2. දෙපාර්තමේන්තු ප්‍රධානීන් ගරු අමාත්‍ය මණ්ඩලය විසින් විශ්‍රාම ගැන්විය යුතුය.
   3. රාජ්‍ය සේවා කොමිෂන් සභාව සියලුම මාණ්ඩලික නිලධාරීන් විශ්‍රාම ගැන්වීම අනුමත කෙරේ.

4. පොලිස් කොමිසම, අධිකරණ සේවා කොමිසම විසින් ඒ ඒ නිලධාරීන් විශ්‍රාම ගන්වනු ලැබේ.

5. ඒකාබද්ධ සේවා නිලධාරීන්ගේ විශ්‍රාම ගැන්වීමේ බලධාරියා ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල් වේ.

6. ඒ ඒ දෙපාර්තමේන්තු ගත නිලධාරීන් දෙපාර්තමේන්තු ප්‍රධානියා විසින් විශ්‍රාම ගන්වනු ලැබේ.

7. පාර්ලිමේන්තු කාර්යය මණ්ඩලය ගරු කථානායකතුමා හෝ පාර්ලිමේන්තු මහ ලේකම් විසින් විශ්‍රාම ගැන්වීම අනුමත කෙරේ.

මේ අනුව වයස අවු 55 සම්පූර්ණ වී වෛකල්පික හේතූන් මත : (ස්වකීය කැමැත්තෙන්) විශ්‍රාම ලබන තෙක් සියලු රාජ්‍ය නිලධාරීන් සේවය ඉටු කළ යුතුය. එකී වයසට පෙර විශ්‍රාම ගන්වන්නේ නම් වෛද්‍ය හේතූන් හෝ වෙනත් විශේෂිත හේතු පැවතීම අත්‍යාවශ්‍ය වේ. යම් රාජ්‍ය නිලධාරියෙකු තම සේවයෙන් ඉල්ලා අස්වීම, තනතුර හැර යාම, සේවයෙන් පහ කිරීම මත විශ්‍රාම වැටුප අහිමි කිරීමකට භාජනය වේ. එවැනි අවස්ථාවක දී විශ්‍රාම වැටුප් ලබා දීම සලකා බැලිය හැක්කේ යළි සේවයේ පිහිටුවීම හෝ සානුකම්පිත හේතුමත විශ්‍රාම ගැන්වීමට අදාළ විනය බලධාරීන් තීරණය කළ හොත් පමණි.

විශ්‍රාම වැටුප් හිමිකම සඳහා අදාළ අවම දළ සේවා කාලය ඒ ඒ නිලධාරීන් සම්බන්ධව පහත සඳහන් පරිදි වෙනස් වේ.

| | අවශ්‍ය දළ සේවා කාලය (මාස වලින් ) |
|---|---|
| • ගරු ශ්‍රේෂ්ඨාධිකරණය විනිසුරු | 36 |
| • ගරු අභියාචනාධිකරණ විනිසුරු | 36 |
| • මහාධිකරණ විනිසුරු | 84 |
| • අනෙකුත් අධිකරණ නිලධාරීන් | 84 |
| • රාජ්‍ය හා පළාත් රාජ්‍ය නිලධාරීන් | 120 |
| • පිරිවෙන් හා පෞද්ගලික පාසල්හි විශ්‍රාම වැටුප් සහිත ගුරුවරුන් (අවම වශයෙන් මාස 120 ක දායකත්වය තිබිය යුතුය. මාසික වැටුපෙන් 2% ක දායකත්වය ගුරු භවතා සැපයිය යුතුය. ) | 120 |
| • ගරු අමාත්‍යවරුන්ගේ පෞද්ගලික ලේකම්, සම්බන්ධීකරණ ලේකම්වරුන් 'ට' උපලේඛන ගත නිලධාරීන් | 60 |
| • රාජ්‍ය සේවයේ නොවන අමාත්‍යාංශ ලේකම්වරුන් | 60 |

වසර 30 ක සේවා කාලයක් සපුරා ඇති රාජ්‍ය හා පළාත් රාජ්‍ය සේවා නිලධාරීන්ට විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව විසින් තීරණය කරනු ලබන උපරිම ප්‍රතිශතය හිමි වේ. ප්‍රතිශත වගු ඒ ඒ වැටුප් පරිවර්තන අවස්ථාවේ දී තීරණය කරනු ලැබේ. ඊට අමතරව අනෙකුත් නිලධාරීන්ට හිමි ප්‍රතිශත අගය පහත සඳහන් පරිදි තීරණය කර ඇත.

- ශ්‍රේෂ්ඨාධිකරණ , අභියාචනාධිකරණ ගරු විනිසුරුවන් සියයට අනූවක අඩු නොකළ ප්‍රතිශතය
- මහාධිකරණ විනිසුරුවන් වසර 14 ක සේවා කාලයට රාජ්‍ය නිලධාරීන්ගේ වසර 30 ට හිමි උපරිම ප්‍රතිශතය හිමිවේ

- අනෙකුත් අධිකරණ නිලධාරීන් වසර 15ක සේවා කාලයට ඉහත උපරිම ප්‍රතිශතය හිමි වේ.

- රාජ්‍ය සේවයට පරිබාහිර අමාත්‍යාංශ ලේකම්වරුන් වසර 05 ක සේවා කාලයට අවසාන වැටුපෙන් සියයට 66 2/3ක් ද වසර 08 සේවා කාලයට 85% ප්‍රතිශතයක් ද හිමි වේ. විශ්‍රාම වැටුප් පාරිතෝෂිකයට හිමිකම් නැත.

- ගරු අමාත්‍යවරුන්ගේ පෞද්ගලික හා සම්බන්ධීකරණ ලේකම්වරුන් වසර 5ක සේවයට වැටුපෙන් 1/3ක් ද වසර 15 ක සේවා කාලය සඳහා 2/3ක් ද හිමි වේ.

## 1.3.2 විශ්‍රාම ගැන්වීමේ විධිවිධාන

විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා සංග්‍රහයේ 1.4.1.1 සඳහන් සිවිල් විශ්‍රාම වැටුපකට හිමිකම් ඇති නිලධාරීන්ට පහත සඳහන් හේතුන් ගෙන් එකක් මත විශ්‍රාම යා හැක.

i අනිවාර්යය විශ්‍රාම ගැන්වීම

වයස අවුරුදු 60 සම්පූර්ණ වීම මත විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා සංග්‍රහයේ 2 සහ 17 වගන්තිය ප්‍රකාරව විශ්‍රාම ගැන්විය යුතුය. අනිවාර්යය විශ්‍රාම ගන්වන අවස්ථාවක වැටුප් වර්ධක දිනය හා විශ්‍රාම ගන්නා දිනය අතර වෙනසක් පවතින බැවින් උපයා ගත් වැටුප් වර්ධක අගය ද විශ්‍රාම වැටුප් පාරිතෝෂිකය හා විශ්‍රාම වැටුප ගණනයේ දී උපයෝගි කරගත හැක.

ii වෛකල්පික විශ්‍රාම ගැන්වීම

අවුරුදු 55 සම්පූර්ණ වීම මත හෝ වයස අවුරුදු 55 සිට 60 දක්වා කාල සීමාව තුළ දී ස්වකීය කැමැත්තෙන් විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා සංග්‍රහයේ 2 සහ 17 වගන්තිය ප්‍රකාරව විශ්‍රාම ගැන්විය හැක. වයස අවුරුදු 57 දක්වා සේවා දිගුවක් නොමැතිව සේවය කළ හැකි අතර අවුරුදු 57 සිට 60 දක්වා කාල සීමාව තුළ සේවය සඳහා නිසි බලධාරියාගේ සේවා දිගුවක් අවශ්‍ය වේ.

iii වෛද්‍ය හේතුන් මත විශ්‍රාම ගැන්වීම

යම් රාජ්‍ය නිලධාරියෙකු වෛද්‍ය මණ්ඩල නිර්දේශය මත තව දුරටත් සේවය කිරීම යෝග්‍ය නොවන විට දී මෙසේ විශ්‍රාම ගැන්විය හැක. විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා සංග්‍රහයේ 2 සහ 14 වගන්තිය බලපැවැත් වේ. වෛද්‍ය හේතුන් මත විශ්‍රාම ගැන්වීමේ දී වසර 10ක සේවා කාලයක් සපුරා නොමැති විට සේවා පාරිතෝෂිකයක් පමණක් හිමි වන අතර වසර 10ක දළ සේවා කාලය ඉක්මවා ඇති විට පාරිතෝෂිකය මෙන්ම මාසික විශ්‍රාම වැටුප ද ලැබීමට හිමිකම් ඇත. විශ්‍රාම ගැන්වූ දින සිට විශ්‍රාම වැටුප් ගෙවීම ආරම්භ වේ. වෛද්‍ය හේතුන් මත විශ්‍රාම ගැන්වීමෙන් වසරකට පසුව යළි සේවය කිරීමට තරම් ශාරීරික යෝග්‍යතාවය ඇති බවට වෛද්‍ය නිර්දේශය සැලකිල්ලට ගෙන විශ්‍රාම වැටුප අත්හිටුවා යළි සේවයටද යොදාගත හැකිය.

iv තනතුර අහෝසි කිරීම මත විශ්‍රාම ගැන්වීම

විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා සංග්‍රහයේ 2 සහ 7 වගන්තිය අනුව විශ්‍රාම ගැන්විය හැක. දෙපාර්තමේන්තු වසා දැමීම, තනතුර යටපත් කිරීම, තනතුර නැතිවීම වැනි හේතු ලෙස මෙය හැඳින් වේ. දළ සේවා කාලය වසර 10 ක් සපුරා ඇතිවිට මාසික විශ්‍රාම වැටුපට හිමිකම් ඇත. වසර 10 ක සේවා කාලයක් නොමැති විට පාරිතෝෂිකයක් පමණක් හිමි ගැන් වේ. තනතුර අහෝසි වීම මත විශ්‍රාම ගැන්වීමේ දී සේවා කාලයට අතිරේකව වසර 5ක සේවා කාලයක් ද එකතු කරනු ලැබේ. දෙපාර්තමේන්තුව වසා දමා එය රාජ්‍ය සංස්ථාවක් බවට පත් කරන්නේ නම් දෙපාර්තමේන්තු

සේවා කාලය වසර 08ක් පැවතිය ද ඉතිරි වසර 02 සංස්ථා සේවා කාලය ද්විතිය කොට විශ්‍රාම වැටුප් හිමිකම ලබා ගත හැක. විශ්‍රාම වැටුප විශ්‍රාම ගැන් වූ දින සිට හිමිය.

v. අකාර්යක්ෂමතාවය මත විශ්‍රාම ගැන්වීම

විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා සංග්‍රහයේ 2 සහ 15 වගන්තිය මීට අදාළ වේ . යම් නිලධාරියෙකු තම සේවය සතුටුදායක ලෙස ඉටු නොකරන බවට බලධාරියා සෑහීමකට පත්වන විට මෙම නියමය යටතේ විශ්‍රාම ගැන්විය හැක. අදාළ විශ්‍රාම ගැන්වීම සඳහා රාජ්‍ය පරිපාලන ලේකම්ගේ අනුමැතිය ලබාගත යුතුය. එමෙන්ම විශ්‍රාම වැටුප ගෙවනු ලබන්නේ එකී ලේකම් විසින් අනුමත කරනු ලබන දින සිටය. බොහෝ විට එය වයස අවුරුදු 55 සපුරන දින වේ.

උදා

1. යම් නිලධාරියෙකු සේවයට පැමිණීම ඉතා අසතුටුදායක වන වන විට එය සැලකිල්ලට ගෙන විශ්‍රාම ගැන්වීම.
2. සේවය අතහැර යාම , ඉල්ලා අස්වීම හෝ සේවයෙන් පහකල නිලධාරියෙකු පසු කාලීනව සිදුකල අභියාචනා සැලකිල්ලට ගෙන අදාළ විනය බලධාරියා විසින් සානුකම්පිත හේතුන් මත විශ්‍රාම ගැන්වීම.
3. යම් නිලධාරියෙකුගේ සේවා තත්ත්වය පිළිබඳ විශේෂ ගැටලු පැන නැගුන විට අනිවාර්යය විශ්‍රාම ගැන්වීම.

   සේවා අකාර්යක්ෂමතාවය මත විශ්‍රාම ගැන් වූ අයකු වයස අවු 55 සපුරාලීමට ප්‍රථම මිය ගිය හොත් එසේ මියගිය දිනට විශ්‍රාම පාරිතෝෂිකයක් හෝ මරණ පාරිතෝෂිකයක් ලැබීමට හිමිකම් ඇත. එමෙන්ම මිය ගිය දින සිට වැන්දඹුව හෝ වැන්දඹු පුරුෂයා වෙත වැන්දඹු අනත්දරු විශ්‍රාම වැටුප් හිමි ගැන්විය හැකි වේ.

vi. විනය හේතුන් මත විශ්‍රාම ගැන්වීම
( විෂමාචාර ක්‍රියාවන් මත විශ්‍රාම ගැන්වීම )

විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා සංග්‍රහයේ 2 සහ 12 වගන්තිය මීට බලපානු ලැබේ. මෙහි ඇති සුවිශේෂී තත්ත්වය නම් විනය පරීක්ෂණය අවසාන වන තුරු විශ්‍රාම පාරිතෝෂිකය හෝ මාසික විශ්‍රාම වැටුප නොගෙවීමයි.

වැදගත් කරුණු

- යම් නිලධාරියෙකු විශ්‍රාම ලබන අවස්ථාවේදී විෂමාචාරයක් කර ඇති බවට විනය බලධාරියා සෑහීමකට පත් වන විට මෙම වගන්තියට ප්‍රකාරව විශ්‍රාම ගැන්විය හැක.
- අදාළ විශ්‍රාම ගැන්වීමට පෙර මූලික පරීක්ෂණයක් සිදුකර තිබීම හා ඊට අනුකූලව නිලධාරියා විෂමාචාරයක් සිදුකර තිබූ බවට ප්‍රමාණවත් හේතු සාධක තිබීම වැදගත් වේ.
- විශ්‍රාම ගැන්වීම සඳහා රාජ්‍ය පරිපාලන ලේකම්ගේ අනුමැතිය ලබා ගතයුතුය.
- කඩිනමින් විනය ක්‍රියාමාර්ග අවසන් කල යුතුය. එම අවස්ථාවේදී විනය නියෝගය සමග එය අනුමැතියට රාජ්‍ය පරිපාලන ලේකම් වෙත යොමු කල යුතුය. ඔහු විසින් දෙනු ලබන තීරණයට අනුකූලව විශ්‍රාම වැටුප් ගෙවීම සිදු කල යුතුය. විනය පරීක්ෂණ ක්‍රියාවලිය අතරතුර නිලධාරියා මියගිය හොත් විනය පරීක්ෂණය අවසාන කොට සුදුසු තීරණයක් ලබා දිය යුතුය. ඊට අනුව හිමිවිය යුතු පාරිතෝෂිකයක්, හිග විශ්‍රාම වැටුපක් හෝ ප්‍රතිලාභයක් වෙතොත් උරුමකරුවන්ට ගෙවනු ලැබේ. මියගිය දින සිට වැන්දඹු අනත්දරු විශ්‍රාම වැටුපට භාර්යාව/අනත්දරුවන් හිමිකම් ලබනු ඇත .

- රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශ ලේකම් සැහීමකට පත්වන විට විනය පරීක්ෂණය පවත්වන අතරතුර තාවකාලික විශ්‍රාම වැටුපකට හිමි ගැන්විය හැක.

vii. රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 30/88 යටතේ විශ්‍රාම ගැන්වීම

විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා සංග්‍රහයේ 2 සහ 14 වගන්තිය අදාළ වේ.

වැදගත් කරුණු

- වසර 20 ක දළ සේවා කාලයක් සපුරා තිබිය යුතුය. මෙහිදි දළ සේවා කාලය යනු මුල් පත්වීම් දින සිට විශ්‍රාම ගැන්වීම ඉල්ලා සිටින දිනය අතර වෙනස වේ.
- විශ්‍රාම ගැන්වීම ඉල්ලුම් කරන්නා "මම රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 30/88 යටතේ විශ්‍රාම ගැන්වීමට මනාපය පළ කරමි''යනුවෙන් ඉල්ලීමක් විනය බලධාරියා වෙත ආයතන ප්‍රධානීන් මගින් සිදු කළ යුතුය.
- විනය බලධාරියා සැහීමකට පත්වන විට විශ්‍රාම ගැන්වීම අනුමත කළ හැක. රජයට අය විය යුතු මුදලක් වෙතොත් එය ගෙවා නිම කිරීම , යම් ගිවිසුමකට යටත් වූවකු වන විට ඊට අනුරූපීව ගෙවිය යුතු මුදල් ගෙවා නිම කිරීම හා විනය හේතු නොමැති බවට බලධාරියා සැහීමට පත්විය යුතුය.
- විශ්‍රාම වැටුප හා පාරිතෝෂිකය හිමිවන්නේ වයස අවුරුදු 55 සම්පූර්ණ කළ පසුය. ඒ අනුව වයස සම්පූර්ණ වූ පසු ලිපිගොනුව විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කළ යුතුය.
- වයස සම්පූර්ණ වීමට පෙර මිය ගියහොත් එදිනට පාරිතෝෂිකය උරුමකරුවන්ට ගෙවනු ලැබේ. මියගිය දින සිට වැන්දඹු අනත්දරු විශ්‍රාම වැටුපකට හිමිකම් ලැබේ.

viii. විශ්‍රාම වැටුප අහුරා තබා මණ්ඩලයකට හෝ සංස්ථාවකට ගොස් එම ආයතනයෙන් විශ්‍රාම ගැන්වීම.

විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා සංග්‍රහය 2 සහ 48 ( අ) වගන්තියට අදාළ වේ. විශ්‍රාම වැටුප් හිමිකම් ලැබීමට අවශ්‍ය වන ස්ථිර විශ්‍රාම වැටුප් සහිත පත්වීමක් ලබා තිබීම , එම සේවය ස්ථිර කොට තිබීම හා අවම වශයෙන් වසර 10 ට වඩා දළ සේවා කාලයක් සපුරා ඇති නිලධාරියෙකුට තම විශ්‍රාම වැටුප අහුරා තබා ඉහත සදහන් පරිදි රාජ්‍ය සංස්ථාවකට හෝ මණ්ඩලයක සේවයට එක් විය හැක. එම ආයතනයෙන් විධිමත් පරිදි විශ්‍රාම ගැන්වූ විට පෙර රාජ්‍ය සේවයට අදාළ විශ්‍රාම වැටුප ලැබීමට හිමිකම් ඇත.

වැදගත් කරුණු

- රාජ්‍ය සංස්ථාව හෝ මණ්ඩලයෙන් ඉල්ලා අස්වීම, සේවය අතහැර යාම හා සේවයෙන් පහ කිරීම මත රාජ්‍ය සේවයට අදාළ විශ්‍රාම වැටුප ලැබීමට හිමිකම් නැත.
- රාජ්‍ය සංස්ථාවෙන් විශ්‍රාම ගැන්වූ දින සිට විශ්‍රාම වැටුප ගෙවනු ලැබේ.

උදා :-
ගුරුවරයෙකු ජාතික අධ්‍යාපන ආයතනයට ගිය විට හෝ වෛද්‍යවරයෙකු විශ්ව විද්‍යාලයට විශ්‍රාම වැටුප අහුරා ගිය විට ජාතික අධ්‍යාපන ආයතනය හෝ විශ්ව විද්‍යාලයෙන් විශ්‍රාම ගැන්වූ දින සිට විශ්‍රාම වැටුප ගෙවනු ලැබේ. ලිපිගොනුව ඉදිරිපත් කිරීම අවසන් වරට සේවය කළ රාජ්‍ය ආයතනය හෝ අදාළ සේවය අවසන් කළ රාජ්‍ය සංස්ථාව විසින් සිදුකළ යුතුය.

ix. හෙදියන් හෝ ගුරුවරියන් හෝ පොලිස් කාන්තාවන් වයස අවුරුදු 50 පැමිණි දින හෝ සේවා කාලය වසර 20 ක් සම්පූර්ණ වන දිනය හෝ යන දින දෙකෙන් පළමුව එළඹෙන දිනයේ සිට විශ්‍රාම ගැන්වීම

විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා සංග්‍රහය 2 හා14 වගන්තිය අනුව කටයුතු කළ යුතුය. ඉහත සඳහන් කළ සුවිශේෂී ගණයේ කාන්තාවන්ට පමණක් මෙම වරප්‍රසාදය හිමිය. ඒ අනුව විශ්‍රාම ගැන්වූ දින සිටම විශ්‍රාම පාරිතෝෂිකය හා මාසික විශ්‍රාම වැටුප ලබා ගැනීමට හිමිකම් ලැබේ. අධ්‍යාපන සේවයේ විවිධ සේවාවන් පවතී. එනම් අධ්‍යාපන පරිපාලන සේවය, විදුහල්පති සේවය, ගුරු අධ්‍යාපන සේවය, ගුරු සේවය ආදී වශයෙනි. මින් ගුරු සේවයේ ගුරුවරියන් හා පෞද්ගලික පාඨශාලාවන් හි විශ්‍රාම වැටුප් හිමිකම ඇති ගුරුවරියන්ට පමණක් මෙම අවස්ථාව හිමි වේ. හෙදිය පිළිබඳ අර්ථකථනයට ශ්‍රී ලංකා හෙද සේවයෙහි නිලධාරිණියන් මෙන්ම පවුල් සෞඛ්‍ය සේවිකාවන් (මුල් කාලයේ වින්නඹු මාතාවන්) ඊට ඇතුළත් වේ. එමෙන්ම පොලිස් දෙපාර්තමේන්තුවේ කවර හෝ නිලයන් දරන පොලිස් කාන්තාවන්/පොලිස් නිලධාරිණියන් හට මෑත කාලයේ දී මෙම අවස්ථාව ලබා දී තිබේ.

x. අධිකරණ නිලධාරීන් විශ්‍රාම ගැන්වීම

විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා සංග්‍රහයේ 2 සහ 25 වගන්තිය අදාළ වේ. ඒ අනුව ගරු ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරුවරයෙකු වයස අවුරුදු 65 දී ද ගරු අභියාචනාධිකරණ විනිසුරුවරයෙකු වයස අවුරුදු 63 දී ද අනිවාර්‍යයෙන් විශ්‍රාම ගැන්විය යුතුය. මහාධිකරණ විනිසුරුවරයකු වයස අවුරුදු 61 දී ද අනෙකුත් අධිකරණ නිලධාරීන් වයස අවුරුදු 60 දී ද අනිවාර්යයෙන් විශ්‍රාම ගත යුතුය.

xi. වෙනත් විශ්‍රාම ගැන්වීම්

පාර්ලිමේන්තු කාර්යය මණ්ඩලය ගරු කථානායකතුමාගේ අනුමැතිය මත වයස අවුරුදු 50 සම්පූර්ණ වීමේ දී විශ්‍රාම ගැන්වීමේ හැකියාව ඇත. එමෙන්ම රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 44/90 චක්‍රලේඛ විධිවිධාන 1990.10.18 දින සිට 1996.12.23 දින දක්වා බලපැවැත්වෙන ලදී . එම චක්‍රලේඛය යටතේ ස්ථිර විශ්‍රාම වැටුප් සහිත වසර 10ක සේවා කාලයක් සපිරූ රාජ්‍ය නිලධාරීන්ට විශ්‍රාම යාමට හැකි විය. ඔවුනට වසර 20 සම්පූර්ණ වූ දින සිට විශ්‍රාම වැටුප ලබා ගැනීමට හැකි විය. වසර 10 - 20 දක්වා සේවා කාලයක් ඇති විට අවසන් වරට ලැබූ වැටුපෙන් 80% ක විශ්‍රාම වැටුපක් හිමි විය. එමෙන්ම වසර 20- 30 අතර සේවා කාලයක් සම්පූර්ණ කරන ලද නිලධාරීන්ට වැටුපෙන් 90 % ක විශ්‍රාම වැටුපක් හිමි ගන්වනු ලැබීය.

වසර 30 ට වඩා සේවා කාලයක් පැවතියේ නම් විශ්‍රාම ලැබූ දින සිටම පාරිතෝෂිකයට අමතරව අඩු නොකල විශ්‍රාම වැටුප ලබා ගැනීමට අවස්ථාව හිමි විය. ඊට අමතරව රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 14/88 යටතේ ජාතිවාදී හේතුමත රැකියාව අහිමි කරගත් පුද්ගලයාට සහන සැලසීම ජූලි වැඩවර්ජනයට සහභාගි වූවන්ට සහන ලබා දීමට විශ්‍රාම ගැන්වීමේ විධිවිධාන සලසා ඇත.

යම් නිලධාරියෙකු විශ්‍රාම ලබා ගැනීමට පෙර මියගිය හොත් එම විශ්‍රාම ගිය නිලධාරියාගේ උරුමකරුවන්ට හිග මුදල් ගෙවිය හැකිය. එමෙන්ම විශ්‍රාමික නිලධාරීන් යළි රාජ්‍ය සේවයට එක්කල අවස්ථාද ප්‍රායෝගිකව දැකිය හැකිය. එවැනි නිලධාරියෙකු යළි වසර දෙකකට වඩා අඛණ්ඩව සේවය සපුරා ඇති විට යළිත් විශ්‍රාම වැටුප සංශෝධනය කර ගැනීමේ ප්‍රතිපාදන පවතී.

xii. " ට" උපලේඛණගත නිලධාරීන් විශ්‍රාම ගැන්වීම

විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා සංග්‍රහයේ 2 (අ) (ආ) වගන්ති ප්‍රකාරව විශ්‍රාම ගැන්විය හැක. 2011. 05. 13 දිනැති ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය ප්‍රකාරව පහත සඳහන් තනතුරු " ට" උපලේඛනයට අයත් වේ.

1. අතිගරු ජනාධිපතිතුමාගේ කාර්යය මණ්ඩලය

පෞද්ගලික ලේකම්/ ප්‍රවෘත්ති ලේකම්/ සහකාර ලේකම්, (ප්‍රවෘත්ති)/ අතිරේක පෞද්ගලික ලේකම්/ මාධ්‍ය ලේකම්/ජනාධිපති ලේකම්ගේ පෞද්ගලික සහකාර, මහජන සම්බන්ධතා නිලධාරි

2. ගරු අග්‍රාමාත්‍යතුමාගේ කාර්යය මණ්ඩලය

පෞද්ගලික ලේකම්/ සම්බන්ධීකරණ ලේකම්/මහජන සම්බන්ධතා නිලධාරි/මාධ්‍ය ලේකම්

3. ගරු කථානායකතුමාගේ කාර්යය මණ්ඩලය

පෞද්ගලික ලේකම්/ සම්බන්ධීකරණ ලේකම්/මහජන සම්බන්ධතා නිලධාරි/මාධ්‍ය ලේකම්

4. ගරු කැබිනට් අමාත්‍යවරුන්ගේ කාර්යය මණ්ඩලය

පෞද්ගලික ලේකම්/ සම්බන්ධීකරණ ලේකම්/මහජන සම්බන්ධතා නිලධාරි/මාධ්‍ය ලේකම්

5. ගරු විපක්ෂ නායකතුමාගේ කාර්යය මණ්ඩලය පෞද්ගලික ලේකම්/ සම්බන්ධීකරණ ලේකම්/ මහජන සම්බන්ධතා නිලධාරි/මාධ්‍ය ලේකම්

6. ගරු නියෝජ්‍ය අමාත්‍යවරුන්ගේ කාර්යය මණ්ඩලය පෞද්ගලික ලේකම්/ සම්බන්ධීකරණ ලේකම්/ මහජන සම්බන්ධතා නිලධාරි/මාධ්‍ය ලේකම්

7. ගරු නියෝජ්‍ය කථානායකතුමාගේ කාර්යය මණ්ඩලය පෞද්ගලික ලේකම්/ සම්බන්ධීකරණ ලේකම්/ මහජන සම්බන්ධතා නිලධාරි/මාධ්‍ය ලේකම්

8. ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමාගේ කාර්යය මණ්ඩලය පෞද්ගලික ලේකම්/ සම්බන්ධීකරණ ලේකම්/මහජන සම්බන්ධතා නිලධාරි/මාධ්‍ය ලේකම්

9. ගරු ව්‍යාපෘති අමාත්‍යවරු/දිස්ත්‍රික් අමාත්‍යවරු/ රාජ්‍ය අමාත්‍යවරුන්ගේ කාර්යය මණ්ඩලය පෞද්ගලික ලේකම් (හිටපු කාර්යය මණ්ඩලය පමණි)

10. කැබිනට් අමාත්‍යාංශයක ස්ථිර ලේකම්ගේ සම්බන්ධීකරණ ලේකම්/ පළාත් සභාවක ප්‍රධාන ලේකම්ගේ සම්බන්ධීකරණ ලේකම්/භාණ්ඩාගාර නියෝජ්‍ය ලේකම්ගේ සම්බන්ධීකරණ ලේකම් කැබිනට් අමාත්‍යාංශයන් හි ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම් (ප්‍රවෘත්ති) (දැනට මෙම තනතුර අහෝසි වී ඇත. යෙදී සිටි අයට පමණයි.)

2011 මැයි මස 13 වෙනි සිකුරාදා නිකුත් කරන ලද අංක 1706 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයට අනුව ගරු අමාත්‍යතුමාගේ සම්බන්ධීකරණ ලේකම්, මහජන සම්බන්ධතා නිලධාරි තනතුර සහ ඉහත සඳහන් සියලු මාධ්‍ය ලේකම් තනතුරු 2010/04/24 වැනි දින සිට ලේඛන ගත කරන අතර ඔවුන්ට ද මෙහි සඳහන් සියලු විධිවිධාන අදාළ වේ.

ඉහත සඳහන් තනතුරු විශ්‍රාම වැටුප් සහිත වුවත් නොවුවත් තනතුර ස්ථිර බව නොසලකා වසර 5ක සේවා කාලයක් සම්පූර්ණ කර ඇත්නම් විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා සංග්‍රහයේ 2 සහ 'අ' වගන්තිය යටතේ විශ්‍රාම වැටුපකට පමණක් හිමිකම් ඇත. මෙම නිලධාරීන්ට වසර 5ක සේවා කාලයක් සඳහා අවසන් වරට ලැබූ වැටුපෙන් 1/3 ක විශ්‍රාම වැටුපක් හිමිවන අතර වසර 15 සේවා කාලයක් සපුරා ඇත්නම් අවසන් වරට ලැබූ වැටුපෙන් 2/3 ක විශ්‍රාම වැටුපක් හිමි වේ.(පාරිතෝෂිකයක් රහිතව) මෙම "ට" උප ලේඛනයේ සඳහන් තනතුරු සඳහා විශ්‍රාම වැටුප් හිමිකම සම්බන්ධයෙන් පහත සඳහන් පරිදි කටයුතු කිරීම අදාළ වේ.

- ගරු අමාත්‍යවරුන්ගේ කාර්යය මණ්ඩලය සඳහා නව පත්වීම් ලබා දී ඇති නිලධාරීන්ගේ වැටුපෙන් රාජ්‍ය සේවා අර්ථ සාධක අරමුදල් අය කළ යුතුය. විශ්‍රාම වැටුප් හිමිකම සඳහා අවම සේවා කාලය (එනම් කවර හෝ සේවා කඩවීම් පවතින්නේ නම් ඒවා නොතකා ) වසර 5 ක් තිබිය යුතුය.
- රජයේ සේවයේ නියුක්ත ස්ථිර විශ්‍රාම වැටුප් සහිත නිලධාරීන් ගරු අමාත්‍ය මණ්ඩල කාර්යය මණ්ඩල තනතුරුවල නියුක්ත වීම සඳහා රාජ්‍ය සේවයෙන් මුදාහැර ඇත්නම් එවැනි නිලධාරියෙකුගෙන් "ට" උපලේඛනගත තනතුරට අදාළ සේවා කාලය තුළ අය කළ යුතු වන්නේ

වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් දායක මුදල් ය. මෙවැනි නිලධාරීන් වසර 5ක් සම්පූර්ණ කොට ඇති විට "ට" උපලේඛනය යටතේ විශ්‍රාම ගැන්වීම හෝ යළි පෙර රාජ්‍ය සේවා තනතුරට යා හැකි අතර වසර 5 ට අඩු සේවා කාලයක් පවතී නම් නැවත රාජ්‍ය සේවයට යා යුතුය.

- "ට" උපලේඛනය යටතේ විශ්‍රාම වැටුපක් සඳහා හිමිකම් ලබන නිලධාරීන්ගේ විශ්‍රාම වැටුප් සහිත පෙර සේවා කාලය පමණක් විශ්‍රාම වැටුප් ගණනය සඳහා අදාළ කර ගත හැක.
- රජයේ විශ්‍රාමික නිලධාරීන් ගරු අමාත්‍ය මණ්ඩල කාර්යය මණ්ඩලයේ තනතුරු දරන විට ඔවුන්ගේ වැන්දඹු අනත්දරු දායක මුදල් හෝ රාජ්‍ය සේවා අර්ථ සාධක අරමුදල් දායක මුදල් අය නොකළ යුතුය. රාජ්‍ය සේවා අර්ථ සාධක අරමුදල සම්බන්ධව අදාළ උපදෙස් විශ්‍රාම වැටුප් චක්‍රලේඛ 4/2010 ඇතුළත් වේ) විශ්‍රාම වැටුප් චක්‍රලේඛ 15/2009 යටතේ සහන මෙම නිලධාරීන්ට හිමි නොවන අතර විශ්‍රාම වැටුප සංශෝධනය කිරීමට නම් යළිත් වසර 05ක සේවා කාලයක් පසුරා තිබිය යුතුය. "ට" උපලේඛන ගත නිලධාරීන්ගේ විශ්‍රාම වැටුප සකස් කිරීමේ දී ඔහු අවසන් වශයෙන් අදාළ තනතුරේ සේවය කළ අමාත්‍යාංශයේ ලේකම් විසින් ඊට අදාළ අයදුම්පත් එවිය යුතු වේ. දෙපාර්තමේන්තුව විසින් ප්‍රදාන පත්‍රය සකසා ගෙවීම් කිරීමට ගොනුව අදාළ ප්‍රාදේශීය ලේකම් වෙත යවනු ලැබේ.

### 1.3.2.1 විශ්‍රාම වැටුප් ප්‍රතිලාභ නිර්වචන කිහිපයක්

මුලින් සඳහන් කළ විශ්‍රාම ගැන්වීම් ක්‍රියාවලියට අදාළ වැදගත් ප්‍රතිලාභ කිහිපයක් පහත සඳහන් කෙරේ.

1. විශ්‍රාම වැටුප් පාරිතෝෂිකය

   පරිවර්තික පාරිතෝෂිකය ලබාගැනීම සඳහා නිලධාරියා මනාපය ප්‍රකාශ කළහොත් අඩු නොකළ මාසික වැටුප මෙන් 24 ගුණයක ප්‍රමාණයක් පරිවර්තික පාරිතෝෂිකය ලෙස ගෙවනු ලැබේ.

2. මාසික විශ්‍රාම වැටුප

   පරිවර්තික පාරිතෝෂිකයක් ලබා ගත් විට වසර 10ක් සඳහා අඩු කළ මාසික විශ්‍රාම වැටුප ද ඉන් අනතුරුව අඩු නොකළ මාසික විශ්‍රාම වැටුප ද ගෙවනු ලැබේ.

3. සේවා පාරිතෝෂිකය

   මාස 120ක සේවා කාලයක් සම්පූර්ණ නොකොට විශ්‍රාම ලබන අවස්ථාවල නිලධාරීන්ට එකවර ගෙවනු ලබන දීමනාවකි.

4. දෛනික සේවා පාරිතෝෂිකය

   රාජ්‍ය සේවයේ දෛනික පදනම මත සේවයේ යෙදී සිට මාස 120ට නොඅඩු සේවාවක් සම්පූර්ණ කර විශ්‍රාම වැටුප් රහිතව ඉවත්ව යන සේවකයන් සඳහා සේවය කළ පූර්ව මාසයක් වෙනුවෙන් මසක වැටුපෙන් 1/12 බැගින් ගණනය කර එකවර ගෙවනු ලබන දීමනාවකි .

5. කරුණා සහගත දීමනාව

   රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් අහිමි හා දෛනික පදනම මත සේවයේ යෙදුනු සේවා කාලය මාස 60-120 ත් අතර සේවා කාලයක් සහිත අය සම්බන්ධව මෙම දීමනාව ගෙවනු ලැබේ .එහි වටිනාකම රු 3000/-කි.

එසේම අවුරුදු 10ක සේවා කාලයක් සම්පූර්ණ කර විශ්‍රාම වැටුපක් නොමැතිව සේවය හැර ගිය රාජ්‍ය සේවයේ නිලධාරීන්ට 2009/02/03 දින සිට ක්‍රියාත්මක වන පරිදි ඔවුන්ගේ ජීවිතයේ ඛේදනීයත්වය සානුකම්පිතව සලකා බලා රු.30000/- ක් ගෙවිය හැකිය. මෙය එකවරක් පමණක් ගෙවන දීමනාවකි.

6. යහපත් සේවා දීමනාව

- පොලිස් දෙපාර්තමේන්තුවෙහි නිලධාරීන්
- ත්‍රිවිධ හමුදා නිලධාරීන්

සිය සේවා කාලය තුලදී යහපත් සේවා දීමනාව ලබා ඇත්නම් නිලධාරියා විශ්‍රාම යාමෙන් පසුව ද විශ්‍රාම වැටුප සමග මෙම ප්‍රතිලාභය ගෙවනු ලබයි.

7. පුණ්‍යාධාර දීමනාව

රජයේ විශ්‍රාම වැටුපක් අහිමි ජීවත්වීමට කිසිදු ආදායමක් නැති බවට සෑහීමට පත් විය හැකි රාජ්‍ය සේවකයන් සම්බන්ධව ඔවුනට හා යැපෙන්නන්ට ප්‍රාදේශිය ලේකම්ගේ වාර්තා නිර්දේශයට යටත්ව පුණ්‍යාධාර දීමනාවක් ගෙවිය හැක.

| | | |
|---|---|---|
| එක් අයෙකුට | රු | 1000 |
| දෙදෙනෙක් සඳහා | රු | 1250 |
| උපරිමය | රු | 1500 |

8. මරණ පාරිතෝෂිකය

යම් රජයේ සේවකයකු රාජ්‍ය සේවයෙන් විශ්‍රාම යාමට පෙර කුමන හේතුවක් මත හෝ මියගිය හොත් එවැනි සේවකයෙකු මියගිය දිනය විශ්‍රාම ගිය දිනය සේ සලකා විශ්‍රාම ගිය දිනට ලබන විශ්‍රාම පාරිතෝෂිකය මියගිය අයගේ යැපෙන්නන්ට ලබා දීම මරණ පාරිතෝෂිකය වේ. මෙහිදී අඩු නොකල මාසික විශ්‍රාම වැටුප මෙන් 24 ගුණයක් හෝ වාර්ෂිකව එම සේවකයා ලබමින් සිටි වැටුප යන දෙකෙන් වැඩි අගය මරණ පාරිතෝෂිකය ලෙස ගෙවීමට විධිවිධාන සැලසී ඇත .

මරණ පාරිතෝෂිකයක් ප්‍රදානය කිරීම සඳහා සපුරාලිය යුතු කොන්දේසි

- නිලධාරියා/නිලධාරිණිය මියගිය අවස්ථාවේ දි දරමින් සිටි තනතුර ස්ථිර හා විශ්‍රාම වැටුප් සහිත වීම
- පරිවාස කාලය අවසානයේ එකී තනතුරෙහි නිලධාරියා/නිලධාරිණිය ස්ථිර කර තිබීම
- ශුද්ධ සේවා කාලය වසර 5ක් තිබීම

මරණ පාරිතෝෂිකය ගෙවනු ලබන්නේ මියගිය නිලධාරියා/නිලධාරිණියගේ යැපෙන්නන් වෙතය.
ඒ අනුව යැපෙන්නන් පහත සඳහන් පරිදි විග්‍රහ කළ හැකිය.

- මියගිය නිලධාරියා/නිලධාරිණිය විවාහක අයෙකු වන විට යැපෙන්නන් වන්නේ වැන්දඹු භාර්යාව හෝ වැන්දඹු පුරුෂයා හා රැකියා විරහිත අවිවාහක දරුවන්ය.

බෙදා වෙන් කිරීම- ගෙවිය යුතු මරණ පාරිතෝෂිකයෙන් හරි අඩක් වැන්දඹු භාර්යාවට හෝ වැන්දඹු පුරුෂයාට ද ඉතිරි අඩ දරුවන් අතර සම සමවද බෙදා ගෙවිය යුතුය. (බාලවයස්කාර දරුවන් ඇති අවස්ථාවක එම දරුවන්ගේ කොටස ජාතික ඉතිරි කිරීමේ බැංකුවේ ස්ථාවර ගිණුමක තැන්පත් කළ යුතුය)

- මියගිය නිලධාරියා/නිලධාරිණිය අවිවාහක වනවිට යැපෙන්නන් ලෙස මව සහ පියා අතර සමව මරණ පාරිතෝෂිකය බෙදා ගෙවිය යුතුය.
- මියගිය නිලධාරියා/නිලධාරිණිය අවිවාහක හා දෙමාපියන් ජීවත්ව නොමැති විට යැපෙන්නන් ලෙස අවිවාහක රැකියා විරහිත සහෝදර සහෝදරියන් අතර එය සම සමව බෙදා ගෙවිය යුතුය

යැපෙන අය පිළිබඳව යැපෙන්නන්ගේ වාර්තාවක් අදාළ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් ලබාගෙන ප්‍රදානයන් සිදු කළ යුතු අතර යැපෙන අය සම්බන්ධව නිරාකරණය කර ගත නොහැකි ගැටලු පැන නගින සෑම අවස්ථාවකදීම මරණ පාරිතෝෂික ගොනුව විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ ජනරාල් වෙත ඉදිරිපත් කොට තීරණයක් ලබා ගැනීම සිදු කළ යුතුය.

යැපෙන්නෙකු නොමැති අවස්ථාවක රජයේ අයවීම් ඇතොත් පමණක් එම අයවීම් වලට සමාන මුදලක් සඳහා මරණ පාරිතෝෂිකයක් නිකුත් කිරීමට හැකියාව පවතී.

රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 369 යටතේ මරණ පාරිතෝෂිකය ලබා ගැනීමට සපුරාලිය යුතු කොන්දේසි නොසලකා (අනියම් / ආදේශක වුව ද) මරණ පාරිතෝෂිකය ගෙවනු ලැබේ. ඊට අමතරව

- සේවයෙන් විශ්‍රාම ලබා විශ්‍රාම පාරිතෝෂිකය ලබා ගැනීමට මනාපය පළ නොකර වසරක් තුළ මියගිය විට මරණ පාරිතෝෂිකය යැපෙන්නන්ට හිමි වේ .
- රා.ප.ච.ලේ 30/88 යටතේ විශ්‍රාම ලබා වයස අවුරුදු 55 එළඹීමට පෙර මියගිය විට මරණ පාරිතෝෂිකය යැපෙන්නන්ට ගෙවිය හැක.

9. විශේෂ වන්දි

රාජකාරියේ යෙදී සිටිය දී සිදුවන හදිසි ආපදාවක් හේතුවෙන් මිය යන හෝ ආබාධිත තත්ත්වයට පත්වන රජයේ සේවකයන්ට හා එසේ මියයන සේවකයන් වෙනුවෙන් ඔවුන්ගේ යැපෙන්නන්ට (සන්නද්ධ හමුදා සේවය හැර ) වන්දි ලැබීමේ හිමිකම පවතී. විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා සංග්‍රහයේ 30, 31 වගන්තීන් ද 1993 සැප්තැම්බර් 21 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 22/93 මගින් මේ සඳහා නීතිමය පසුබිම සකස් වී ඇත

ස්ථිර විශ්‍රාම වැටුප් සහිත හෝ රහිත වුව ද මින් ප්‍රතිලාභ හිමි වේ. කෙසේ වුව ද රජයේ නිලධාරියකු ත්‍රස්තවාදී හේතු වලින් මියගිය විටක දී එම නිලධාරියාගේ යැපෙන්නන්ට රජයෙන් දෙනු ලබන වෙනත් අන්දමක වන්දි මුදලක් හා මියගිය අයට වයස අවුරුදු 55 සම්පූර්ණ වන තෙක් වැටුප ලැබීමට හිමිකම් ලබා දී තිබේ නම් ඔවුන්ට මෙම වන්දි ලබා ගැනීමට හිමිකමක් නොමැත. ( රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 21/88 යටතේ ප්‍රතිලාභ ලැබූ පිරිස මේ ගණයට අයත් වේ)

විශේෂ වන්දි ලබා දෙන අවස්ථා

1. රාජකාරි ඉටු කිරීමේ දී
2. රාජකාරි ඉටු නොකරන අවස්ථාවක දී වුව ද සාමාන්‍ය රාජකාරි විෂය සීමාව ඇතුළත යම් ක්‍රියාවක් කිරීමේ දී
3. රාජකාරි ඉටු කිරීමෙහිලා යමක් කිරීමේ ප්‍රතිඵලයක් ලෙස
4. සිය වාසස්ථානයේ සිට රාජකාරිය සඳහා වාර්තා කිරීම පිණිස හෝ රාජකාරියෙන් පසු සේවා ස්ථානයේ සිට වාසස්ථානය දක්වා යන ගමනක දී
5. සේවා ස්ථානයේ සිට රාජකාරි කටයුතුවල නිරතවීම සඳහා යන හෝ ආපසු සේවා ස්ථානයට එන ගමනක දී

කෙසේ වුව ද කිසියම් නීතියක් දෙපාර්තමේන්තු නියමයක් හෝ රෙගුලාසියක් උල්ලංඝනය වන අයුරින් ක්‍රියා කිරීම නිලධාරියාගේ නොසැලකිලිමත්භාවය යන කරුණු හේතු වූ විට වන්දි මුදලෙහි අඩු කිරීමක් සිදු කිරීමට ද ආපදාව සිදුවන විට බීමත්ව සිටියේ නම් වන්දි නොගෙවීමට ද වන්දි කමිටුවට බලය ඇත.

මරණය, ඉපැයීමේ ශක්තිය හීනවීම හෝ සදාකාලිකව පවතින ලෙස සිරුරේ වන විකෘති වීමේ ප්‍රමාණය අනුව වන්දි ගෙවීම පහත සදහන් පරිදි සිදුවේ.

- රාජකාරියේ නියුක්ත වී සිටින අවස්ථාවේ දී සිදුවන මරණයක දී හෝ පූර්ණ ආබාධිත තත්ත්වයකට පත්වන විට මාස 120ක වැටුපකට සමාන වන්දි මුදලක් හිමි වේ.
- සේවයට යමින් එමින් සිටිය දී සිදු වන අනතුරකින් මියයාම හෝ පූර්ණ දුබලතාවයකට පත්වීමේ දී මාස 60ක වැටුප හිමි වේ.

පූර්ණ ආබාධිත නොවන හෝ මිය නොයන අවස්ථාවන්හි දී වෛද්‍ය මණ්ඩල නිර්දේශය පදනම් කොට ගෙන වන්දි කමිටුව මගින් අදාළ වන්දියේ ප්‍රමාණය තීරණය කරනු ලබයි.

- සේවයට යමින් හෝ එමින් සිටින විට සදාකාලිකවම අර්ධ ආබාධිත වූයේ නම් එය උපරිම මාස 45ක වැටුපක් ද රාජකාරියේ නියුක්තව සිටියේ නම් එය උපරිම මාස 90ක වැටුපක් ද වේ.
- තාවකාලික අර්ධ ආබාධිත වූයේ නම් උපරිම මාස 10ක වැටුපක් සේවයට යන එන අතරතුර සිදු වූ අනතුරකට ගෙවන අතර එය උපරිම මාස 20ක වැටුපක් ලෙස සේවයේ යෙදී සිටිය දී සිදු වූ අනතුරක දී ගෙවනු ලැබේ .

ගෙවීම් තීරණය කරනුයේ විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ ජනරාල්, භාණ්ඩාගාරයේ මුදල් අධ්‍යක්ෂ ජනරාල්, ආයතන අධ්‍යක්ෂ ජනරාල් යන අයගෙන් යුක්ත වන්දි කමිටුවක් මගිනි. පළාත් සභාවක නිලධාරියකු සම්බන්ධයෙන් නම් ආණ්ඩුකාර ලේකම්, පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම්, නියෝජ්‍ය ලේකම් (මුදල්) යන නිලධාරීන්ගෙන් සමන්විත වේ. යම් පළාත් සභාවක වන්දි කමිටුවක් ක්‍රියාත්මක නොවන්නේ නම් එම වන්දි අයදුම්පත් රාජ්‍ය පරිපාලන විෂය භාර අමාත්‍යාංශයේ වන්දි කමිටුව වෙත ඉදිරිපත් කළ යුතු වේ.

**විශේෂ වන්දි ප්‍රදානයකදී ඉදිරිපත් කළ යුතු ලියවිලි**

1. වන්දි අයදුම් පත්‍රය
2. මූලික පරීක්ෂණ වාර්තාව
3. පශ්චාත් මරණ පරීක්ෂණ වාර්තාව
4. මරණ සහතිකය (මිය නොගියේ නම් උප්පැන්න සහතිකය)
5. යැපෙන්නන් පිළිබඳ ප්‍රාදේශීය ලේකම් වාර්තාව,
6. විවාහ සහතිකය, දරුවන්ගේ උප්පැන්න සහතිකය
7. අවිවාහක නම් උප්පැන්න සහතිකය හා මව්පියන්ගේ විවාහ සහතිකය
8. දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ සහතිකය
9. පරීක්ෂණ මණ්ඩල වාර්තාව
10. වෛද්‍ය මණ්ඩල වාර්තාව (අර්ධ දුබලතාවයකට)
11. අනෙකුත් ගෙවීම් පිළිබඳ සහතික
12. මියගිය දින තෙක් වැටුප් වර්ධක වාර්තාවන් හා චර්යා සටහන්

නිලධාරියා ආපදාව හේතුවෙන් මියගියේ නම් ඔහු/ඇය විවාහක නම් වන්දි මුදලින් අඩක් බිරිඳට/ පුරුෂයාට හා ඉතිරි අඩ රැකියා විරහිත අවිවාහක දරුවන් වෙත ගෙවනු ලබන අතර ඔහු/ඇය අවිවාහක නම් මවට සහ පියාට ගෙවනු ලැබේ.

10. වන්දි විශ්‍රාම වැටුප

රජයේ නිලධාරියෙකු තම රාජකාරිය සඳහා යන එන අතරතුර හෝ රාජකාරියේ යෙදී සිටිය දී සිදු වන අනතුරින් මියගිය විට යැපෙන්නන්ට මාසිකව ගෙවනු ලබන විශ්‍රාම වැටුපකි.

නිලධාරියා වයස අවුරුදු 55 දක්වා සේවය කළා සේ සලකා ඔහු අනතුරට පත්වන විට හිමිව තිබූ වැටුප් පරිමාණයේ වැටුප් වර්ධක පමණක් පදනම් කරගෙන අවුරුදු 55 දී ලබන වාර්ෂික වැටුපෙන් 10/60ක් හිමි වේ. ආපදාවට ලක් වන විට වයස අවුරුදු 55 ඉක්මවා සිටියේ නම් අවුරුදු 60 දක්වා සේවය කළා සේ සලකා එම අවස්ථාවේ දී හිමිව තිබූ වැටුප් පරිමාණයේ වැටුප් වර්ධක පමණක් පදනම් කරගෙන වන්දි විශ්‍රාම වැටුප් ගණනය කළ යුතු වේ. කෙසේ වෙතත් එම වැටුප් පරිමාණයේ උපරිමය නොඉක්මවිය යුතුය.

දරුවන් සිටී නම් ඔවුන්ට ඉහත 10/60 න් එක් එක් දරුවෙක් සඳහා (උපරිමය දරුවන් සංඛ්‍යාව 5කි) 1/8 බැගින් වූ මුදලක් ලබා ගත හැකිය. මියගිය නිලධාරියා අවිවාහක වූ අවස්ථාවක දී වන්දි විශ්‍රාම වැටුප ගෙවනු ලබන්නේ මවට පමණි.

**වන්දි විශ්‍රාම වැටුපක් සඳහා ඉදිරිපත් කළ යුතු ලියවිලි**
(විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා සංග්‍රහයේ 2 සහ 31 (1) වගන්තිය

1. පොදු 55 ආකෘතිය
2. උප්පැන්න සහතිකය
3. මරණ සහතිකය
4. පශ්චාත් මරණ සහතිකය
5. නිලධාරියා වයස අවු 55 දී 60 දී ලැබීමට නියමිත වාර්ෂික වැටුප ( මියගිය දිනය පදනම් කර වැටුප් වර්ධක පමණක් ඇතුළත් වැටුප් වාර්තාව )
6. පොලිස් වාර්තාව හෝ මරණ පරීක්ෂණ වාර්තාව
7. අනතුර සම්බන්ධයෙන් දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ සහතිකය
8. අනතුර සියැසින් දුටු අයගේ සාක්ෂි 2ක් පමණ
9. යැපෙන්නන් පිළිබඳ ප්‍රාදේශීය ලේකම් වාර්තාව
10. පොදු 142 වෛද්‍ය මණ්ඩල වාර්තාව (සම්පූර්ණ බෙලහීනත්වයට පත්වූයේ නම් වන්දි විශ්‍රාම වැටුප් ලබන්නාගේ ඡායාරූප 3 ක් )
11. භාණ්ඩාගාර 147 එක් ආකෘතියක් හා 148 ආකෘති 02
12. අනෙකුත් ගෙවීම් පිළිබඳ විස්තර
13. විවාහ සහතිකය හා දරුවන්ගේ උප්පැන්න සහතික
14. අවිවාහක නම් උප්පැන්න සහතිකය හා මව්පියන්ගේ විවාහ සහතිකය
15. ආදර්ශ අක්සන් පත්‍ර 02
16. දරුවන් විවාහ වී ඇති බව ප්‍රාදේශීය ලේකම් වාර්තාවේ සඳහන් වේ නම් දරුවන්ගේ විවාහ සහතිකය

වැන්දි විශ්‍රාම වැටුප් හිමිකම් ඇති අයෙකු නැවත විවාහයකට ඇතුළත් නොවී යහපත් කල් ක්‍රියාවෙන් සිටින තාක්කල් හා දරුවන්ගේ වයස සම්පූර්ණ වනතුරු (පිරිමි දරුවන්ගේ වයස අවුරුදු 18 හා ගැහැණු දරුවන්ගේ වයස අවු 21 ) වැන්දි විශ්‍රාම වැටුප ගෙවනු ලැබේ.

විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා සංග්‍රහයේ 2 (ආ) 1 (අ) (ආ) යන වගන්තිය මීට අදාළ වේ .

11. දුබලතා විශ්‍රාම වැටුප (පොලිස් නිලධාරින්)

ත්‍රස්තවාදි කටයුතු හේතුකොට ගෙන හෝ නීත්‍යානුකූල රාජකාරි ඉටු කිරීමේදී දුබලතාවයන්ට පත්වන පොලිස් නිලධාරින් වෙනුවෙන් දුබලතා විශ්‍රාම වැටුප් ගෙවීමට රජය තිරණය කොට ඇත. මෙම විශ්‍රාම වැටුප් ගෙවීමේ දී පහත සඳහන් කොන්දේසි බලපැවැත් වේ.

- දුබලතා විශ්‍රාම වැටුප් ගෙවීම ආරම්භ කළ යුත්තේ ගරු අමාත්‍ය මණ්ඩලය අනුමත කළ 2010-10-13 දින සිටය.
- දුබලතා විශ්‍රාම වැටුප් ගෙවීමේ දී වන්දි විශ්‍රාම වැටුප්, තුවාල දීමනා හා පොලිස් වන්දි හිමි නොවන අතර එවැනි ගෙවීම් 2010-10-13 දිනෙන් පසු නතර කළ යුතුය.
- දුබලතා විශ්‍රාම වැටුප් ගණනය කිරීම ඉපැයීම ශක්තිය හීනවීමේ ප්‍රතිශතය අනුව සිදු කළ යුතුය.

දුබලතා විශ්‍රාම වැටුප් ගණනය කිරීමේ දී ඉපැයීම් ශක්තිය හීනවීමේ ප්‍රතිශතය වෛද්‍ය පරීක්ෂණ මණ්ඩලය විසින් නිශ්චිතව සඳහන් කොට නොමැති අවස්ථාවන්හි දී අදාළ නිලධාරියා නැවත වෛද්‍ය පරීක්ෂණ මණ්ඩලයකට යොමු කොට එකී ප්‍රතිශතයේ ප්‍රමාණය නිශ්චිතව නිර්ණය කර ගත යුතුය. එය 20 1/2 වඩා වැඩි විය යුතුය.

පොලිස් නිලධාරින් වෙත විශ්‍රාම වැටුපක් ද ගෙවනු ලබන්නේ නම් මෙම දුබලතා විශ්‍රාම වැටුප අදාළ වැටුප් පරිවර්තනයක් සමග ගණන් බලා එම විශ්‍රාම වැටුපට එකතු කොට ගෙවිය යුතුය.

දුබලතා නිශ්චිත කාලයක් දක්වා ඇති විට එකී කාලය අවසන් වීමෙන් පසු යළි වෛද්‍ය මණ්ඩලය වෙත යොමු කිරීමට ප්‍රාදේශීය ලේකම් විසින් පියවර ගත යුතුය .

1.3.3 විමධ්‍යගත හා මධ්‍යගත විශ්‍රාම ගැන්වීම්

විමධ්‍යගත කර ඇති විශ්‍රාම ගැන්වීම්

- වෛකල්පිත විශ්‍රාම ගැන්වීම්
- අනිවාර්යය විශ්‍රාම ගැන්වීම්
- කනතුර අහෝසි වීම්
- වෛද්‍ය හේතු මත විශ්‍රාම ගැන්වීම්
- හෙදියන් /ගුරුවරුන් විශ්‍රාම ගැන්වීම්

විමධ්‍යගත නොවූ විශ්‍රාම ගැන්වීම්

- 30/88 යටතේ විශ්‍රාම ගැන්වීම්
- " ට " උපලේඛනය යටතේ විශ්‍රාම ගැන්වීම්
- විනය හේතු මත විශ්‍රාම ගැන්වීම්
- සේවා අකාර්යක්ෂමතාවය මත විශ්‍රාම ගැන්වීම්
- විශ්‍රාම වැටුප අහුරා කඹා ( රාජ්‍ය සංස්ථා වලට මුදාහල නිලධාරින් විශ්‍රාම ගැන්වීම්)
- 44/90 විශ්‍රාම ගැන්වීම්
- උරුමකරුවන්ට ගෙවීම

ඇතැම් විශ්‍රාම වැටුප් ප්‍රතිලාභ එක් වරක් පමණක් ගෙවන ප්‍රතිලාභ වේ.

එක් වරක් පමණක් හිමිවන ප්‍රතිලාභ

- විශ්‍රාම පාරිතෝෂිකය
- මරණ පාරිතෝෂිකය
- සේවා පාරිතෝෂිකය
- දෛනික සේවා පාරිතෝෂිකය
- විශේෂ වන්දි
- කරුණා සහගත දීමනාව
- පොලිස් වන්දි
- උප තැපැල් ස්ථානාධිපති පාරිතෝෂිකය ( 1978-07-25 පෙර )
- උප තැපැල් ස්ථානාධිපති පාරිතෝෂිකය ( 1978-07-25)

ඊට ඇතුළත් වේ. වඩාත් වැදගත් වන්නේ මාසිකව ගෙවනු ලබන විශ්‍රාම වැටුප් ප්‍රතිලාභයන්ය. ඒ අනුව මාසික විශ්‍රාම වැටුප්, වන්දි විශ්‍රාම වැටුප්, දුබලතා විශ්‍රාම වැටුප හා පුනඃපාධාර දීමනාව මාසිකව ගෙවනු ලබන ප්‍රතිලාභයන්ය.

මාසිකව හිමිවන ප්‍රතිලාභ

- මාසික විශ්‍රාම වැටුප
- වන්දි විශ්‍රාම වැටුප
- තුවාල දීමනා
- පුනඃපාධාර දීමනා
- යහපත් සේවා දීමනා
- වැන්දඹු විශ්‍රාම වැටුප
- වැන්දඹු පුරුෂ විශ්‍රාම වැටුප
- අනත්දරු විශ්‍රාම වැටුප
- ආබාධිත අනත්දරු විශ්‍රාම වැටුප
- හමුදා දුබලතා විශ්‍රාම වැටුප
- යැපෙන්නන්ගේ දීමනාව

විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා සංග්‍රහය 3 වන වගන්තිය අදාළ වේ. යම් රාජ්‍ය නිලධාරියෙකු අවසන් වරට ලැබූ වැටුප හා දළ සේවා කාලය පදනම් කොට විශ්‍රාම වැටුප ගණනය කරනු ලැබේ. මාස 120ක අවම දළ සේවා කාලය පැවතීම අත්‍යාවශ්‍ය වන අතර වසර 30ක සේවා කාලයක් පැවතීම උපරිම විශ්‍රාම වැටුප් ප්‍රතිශතයක් ලබා ගැනීමට හේතු වේ. සේවා කාලය යන්නට ස්ථිර විශ්‍රාම වැටුප් සහිත සේවා කාලය මෙන්ම යන්න ස්ථිර විශ්‍රාම වැටුප් සහිත සේවා කාලයට අයත් නොවන වෙනත් සේවා කාලයක් ද දළ සේවා කාලය ගණනයේ දී අදාළ කර ගත හැක. පහත සඳහන් සේවා කාලයන් දළ සේවා කාලයට ඇතුළත් වේ .

- රැකියාවට අදාළ පුහුණු කාලය
  උදා:- ග්‍රාම නිලධාරි පුහුණුව, හෙද පුහුණුව, සීමා වාසික වෛද්‍ය පුහුණුව, ගුරු පුහුණුව
- උපාධිධාරි අභ්‍යාසලාභියකුගේ රාජ්‍ය සේවයේ පුහුණු කාලය, ශිෂ්‍ය ගුරු සේවය, අභ්‍යාසලාභී ගුරු සේවය
- දෛනික හෝ මාසික වැටුප් ගෙවීමේ පදනම මත තාවකාලික හෝ අනියම් සේවා කාලය

- විශ්‍රාම වැටුප් රහිත රාජ්‍ය සේවය එනම් රාජ්‍ය සේවා අර්ථ සාධක පත්වීම් මත යොදා ගත් රාජ්‍ය සේවය

  උදා:- පොලිස් උප සේවය, සිවිල් ආරක්ෂක සේවා කාලය
- ස්ථිර විශ්‍රාම වැටුප් සහිත රාජ්‍ය සේවය
- ද්විතීය පද්ධම මත රාජ්‍ය සංස්ථා සහ මණ්ඩලවල සිදුකළ සේවය ( මෙම සේවා කාලය තුළ විශ්‍රාම වැටුප ආරක්ෂා කර ගැනීම සඳහා වැටුපෙන් සියයට 25ක දායක මුදල් ගෙවා තිබිය යුතුය)
- වෙනත් අනුමත කළ සේවාවන්

  උදා:- 1974ට පෙර ගල්ඔය සංවර්ධන මණ්ඩලය යටතේ සේවය, දෙවන ලෝක සංවර්ධන මණ්ඩලය යටතේ සේවය, දෙවන ලෝක සංග්‍රාමයට සහභාගි වූ රාජ්‍ය නිලධාරීන්ගේ සේවය, ශ්‍රී ලංකා බෞද්ධ මණ්ඩලයේ හා ශ්‍රී ලංකා සංස්කෘතික සභාවේ සේවය, ගිවිසුමකට බැඳුණු කම්කරු දෙපාර්තමේන්තුවේ උපදේශක සේවය

  විශේෂ විධිවිධාන පනත් යටතෙහි නියම කරනු ලබන රාජ්‍ය සංස්ථා, මණ්ඩල හා කොමිසම් සභා සේවා කාලය

  උදා:- වරාය අධිකාරි සේවා කාලය, ගුවන් විදුලි සංස්ථා සේවා කාලය, ටෙලිකොම් සේවා කාලය, විදුලි සංදේශ නියාමන කොමිෂන් සභා සේවා කාලය

විශ්‍රාම වැටුප් ගණන් බැලීමේ දී දළ සේවා කාලයෙන් වැටුප් රහිත නිවාඩු අඩු කරනු ලැබේ. කෙසේ වෙතත් පහත සඳහන් වැටුප් රහිත නිවාඩු අඩු කරනු නොලැබේ.

- 1970-4-1 දිනට පෙර ගුරු විශ්‍රාම වැටුප් ක්‍රමයට අදාළ වැටුප් රහිත සේවය
- උසස් අධ්‍යාපන සුදුසුකම් ලබා ගැනීම සඳහා ලබා ගත් වැටුප් රහිත හා අඩ වැටුප් සහිත සේවා කාලය
- වසර 30ට වඩා අඩු සේවා කාලයේ දී එක වසරක වැටුප් රහිත සේවා කාලය

  වසර 30ට වඩා වැඩි දළ සේවයක් ඇති විට එම වැඩි සේවා කාලයෙන් වැටුප් රහිත නිවාඩු අඩු කළ හැක.
- අනුමත ප්‍රසූත නිවාඩු
- කලත්‍රයා විදේශ සේවයේ යෙදුන විට වසර 20කට වඩා ලබා ගන්නා වැටුප් රහිත නිවාඩු

### 1.3.4 විශ්‍රාම වැටුප් අහිමි වීම

ස්ථිර විශ්‍රාම වැටුප් සහිත රාජ්‍ය නිලධාරියෙකු කවර සේවා කාලයක් යටතේ වුව ද තම සේවයෙන් ඉල්ලා අස්වීම, තනතුර අතහැර යාම හා සේවයෙන් පහ කිරීම මත විශ්‍රාම වැටුප අහිමි වේ.

එසේම විශ්‍රාම වැටුප් සඳහා සියලු සුදුසුකම් සපුරා තිබුනේ වුව ද විශ්‍රාම වැටුපක් ලබමින් සිටියේ වුව ද එවැන්නෙකු මරණ දඬුවම් හෝ බරපතල වැඩ ඇතිව කිනම් කාලයකට වුවද බන්ධනාගාර ගතකර ඇත්නම් හෝ සුලු වැඩ සහිතව දොළොස් මසකට වැඩි කාලයකට බන්ධනාගාර ගතකර ඇත්නම් ඒ අයට විශ්‍රාම වැටුප ගෙවීම නතර කරනු ලැබේ. කෙසේ වෙතත් එවැනි පුද්ගලයකු බන්ධනාගාරයෙන් නිදහස් කරනු ලැබූ විට විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ ජනරාල්/ රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශයේ ලේකම් වෙත සිදුකරන ඉල්ලීම් සලකා බැලිය හැකි වේ.

# 2
# සිවිල් විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය

වර්ෂ 1947 අංක 2 දරන ආඥා පනතේ 2 වගන්තියෙන් විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා සංග්‍රහය වර්ෂ 1901 පටන් ලංකාවේ පැන වූ නීතියේ කොටසක් බවට පත් වී තිබේ. ඒ අනුව සිවිල් විශ්‍රාම වැටුප් ක්‍රමය 20වන ශත වර්ෂය ආරම්භයේ සිට ක්‍රියාත්මක වූ බවට බොහෝ සාධක තිබේ. 1920 වසරේ දී Pensions payable out of the revenues of the colony වාර්තාවට අනුව මෙම වර්ෂයේ ශ්‍රී ලංකාවේ විශ්‍රාම වැටුප් වියදම රු.2,155,792.16කි. එම වර්ෂයේ රජයෙහි මූලික වැටුප් වියදම රු. 20,889,613.38කි. සමස්ත විශ්‍රාමිකයින්ගේ ප්‍රමාණය 1200ක් විය. මුළු විශ්‍රාම වැටුප් වියදමින් රු. 1,249,833.29ක් දේශීය වශයෙන් ගෙවනු ලැබූ අතර රු. 905, 958.87 ක් Crown Agent විසින් ගෙවනු ලැබීය. මින් පැහැදිලි වන්නේ සැලකිය යුතු විශ්‍රාමික සංඛ්‍යාවක් විදේශිකයන් වූ බවයි. සිවිල් විශ්‍රාම වැටුප් ක්‍රමයට පෙර වැන්දඹු අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදල් ආඥා පනත 1898 දී ලංකාවේ නීතිගත විය. එම පනතට අනුව ස්ථිර විශ්‍රාම වැටුප් සහිත පත්වීම් ලාභීන්ට වැන්දඹු අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදලෙහි සාමාජිකත්වය හිමි විය. මෙම පනතේ මූලාරම්භය 1870 දක්වා දිව යයි. ඒ අනුව පැහැදිලි වන්නේ එම දශකයේ මැද භාගයේ සිට විශ්‍රාම වැටුප් හිමිකම ශ්‍රී ලංකාව තුළ පැවති බවයි. ශ්‍රී ලංකාව 1815 දී ඉංග්‍රීසින්ට යටත් විය. යටත් විජිත ලේකම්වරුන් එකී යටත් විජිත පාලනය කරන ලදී. ඒ අනුව යටත් විජිතයන්හි සේවය කරන ලද රාජ්‍ය නිලධාරීන්ට වැටුප් සහ විශ්‍රාම වැටුප් ගෙවීමේ වගකීම යටත් විජිත ලේකම් වෙත පැවරී තිබුණි. වසර 48ක් ශ්‍රී ලංකාවේ සේවය කළ මේජර් ස්කිනර්ගේ වැඩි කළ විශ්‍රාම වැටුප පිළිබඳ නිවේදන පත්‍රයෙන් විශ්‍රාම වැටුප් පිළිබඳ ඉතිහාසය තවදුරටත් පැහැදිලි වේ.

*මේජර් ස්කිනර්ගේ වැඩි කළ විශ්‍රාම වැටුප පිළිබඳ නිවේදන පත්‍රය*

*( අපගේ එකගතාවය දක්වා අත්සන් කළ නිවේදන පත්‍රය )*

*බකින්හම්හි ආදිපාද නැම්පත් ගෞරවනීය, යටත් විජිතයන්හි ලේකම්තුමා වෙතටයි....ස්තුතියි වේවා !*

පහත අත්සන් කරනු ලබන ආණ්ඩුවට සම්බන්ධයක් නොමැති යටත් වැසියන්, වෙළෙන්දන්, වගා කරුවන් සහ සෙසු අය හට, මේජර් තෝමස් ස්කිනර් හට විශ්‍රාම යාමට ඉඩ දීමට බැරිය. වසර හතලිස් අටක් පමණ වූ අඛණ්ඩ සේවාවකින් පසුව ඔහුට විශේෂ සැලකුමක් ලෙසට වැඩි කළ විශ්‍රාම වැටුපක් ලබා දීමට ඔබතුමාගේ අනුග්‍රහය ලබා දීම, පවතින රෙගුලාසි අනුව ඔහුගේ සේවාවට උරුම වූවකි. මේ ආණ්ඩුවේ ඉතා වැදගත් දෙපාර්තමේන්තුවක නායකයා ලෙසට මේජර් ස්කිනර් වසර බොහෝ ගණනක් කටයුතු කළේය. ඔහුට නියමිතව තිබුණු දුෂ්කර කාර්යයන්හි හෙතෙම නොනවතිමින් මහත් ලැදියාවකින් යුතුව නිරත වූයේය. හෙතෙම මෙම සියලුම කාර්යයන් උද්යෝගිමත්ව, සාර්ථක ලෙස නිමා කරමින්, හමුවුණු සියලුම බාධක වලට මුහුණ දී නොවෙහෙසුණු ශක්තියකින් හා ආත්ම වීර්යයකින් යුතුව කටයුතු කළේය.

මේජර් ස්කිනර්ගේ දීර්ඝ එමෙන්ම උනන්දුමත් සේවාවට යටත් විජිතය වෙනුවෙන් යටත් විජිත වැසියෝ සිය කෘතඥතාවය පළ කර සිටිති. පහත අත්සන් තබන අප, ස්වදේශීය හා යුරෝපීය වැසියන් ආදී සියලුම දෙනාම මේජර් ස්කිනර්ගේ වාර්ෂික විශ්‍රාම වැටුප රත් පවුම් 1000 ක් දක්වා වැඩි කිරීමට ඔබතුමාගේ අනුග්‍රහය ලැබේවා! යි විශ්වාසය පළ කරති. විශාල විශ්‍රාම වැටුපක් ලැබීම ඔහුගේ පසු කාලීන ජීවිතය සතුටින් ගත කිරීමට උපකාරයක් වනු ඇත. දූපතේ සම්පත් වර්ධනය කිරීමට ඔහු දැරුව අප්‍රතිහත ප්‍රයත්නයට යටත් වැසියන් දක්වන පිළිගැනීමක් ලෙසට මෙවැන්නන් සාක්ෂි දරනු ඇත. මේජර් ස්කිනර්

වෙතට පිරිනැමුණු අපගේ නිහතමානී පැහැදීම, ඔබගේ කාරුණික අනුග්‍රහය ලැබීමට හේතුවේවා! යැයි අප සිතමු.

මේ වගට ඉතාමත් යටහත් සේවත පිරිසක්.... (කඳුරට හා වෙරළබඩ නිවැසියන්ට අමතරව වෙළෙන්දන්ට අමතරව කොළඹ, නුවර සහ ගාල්ල ප්‍රධාන නිවැසියන් ද මෙයට අත්සන් කර තිබුණි. )

මේජර් ස්කිනර් ශ්‍රී ලංකාවෙහි සේවය තොට මහාමාර්ග කොමසාරිස් ලෙස විශ්‍රාම ලැබූයේ 1800 වර්ෂයේ දී ය. ඔහු විසින් ලියන ලද ලිපි පදනම් කොට ඔහුගේ දියණිය විසින් රචිත Fifty Years in Ceylon ග්‍රන්ථයෙහි මෙම තොරතුරු අනාවරණය වේ ("ලංකාවේ පනස් වසරක්" පරිවර්තනය - පරාක්‍රම ඇස්. විජේවර්ධන) ඒ අනුව විශ්‍රාම වැටුප් ක්‍රමය 1800 දක්වා අතීතයේ පැවති බවට ද සාක්ෂි ඇත.

## 2.1 සිවිල් විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය නෛතික පසුබිම

"ආණ්ඩුවේ සේවකයන්ට කිසිම විශ්‍රාම වැටුපක් හෝ දීමනාවක් ඒකාන්තයෙන් හිමිකර ගැනීමට අයිතිවාසිකමක් නැත්තේය. වන්දි ගෙවීමක් නොකොට ආණ්ඩුවේ සේවකයකු සේවයෙන් පහකර දැමීමට ආණ්ඩුවට බලය ඇත්තේය" යනුවෙන් විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා සංග්‍රහය ආරම්භයේ දී ලිය වී ඇත. 1901 පටන් නීතියක් බවට පත්වූ විශ්‍රාම වැටුප්, රාජ්‍ය නිලධාරීන් විසින් ආයාසයෙන් ආරක්ෂා කර ගත යුතු වටිනා සම්පතක් බැවින් එසේ සටහන්ව ඇත. කෙසේ වෙතත් ගතවූ ශත වර්ෂයකට අධික කාලයක් තුළ ක්‍රියාත්මක වූ විශ්‍රාම වැටුප් හිමිකම අද සියලු ස්ථිර විශ්‍රාම වැටුප් සහිත පත්වීම් ලැබූ රාජ්‍ය නිලධාරීන්ගේ අයිතිවාසිකමක් බවට පත්ව ඇති බව ද සතුටින් ප්‍රකාශ කළ හැක. මෙම විශ්‍රාම වැටුප් හිමිකම රාජ්‍ය නිලධාරීන්, පළාත් රාජ්‍ය නිලධාරීන්, සන්නද්ධ හමුදා නිලධාරීන් හා අධිකරණ නිලධාරීන් යන සියලුම පාර්ශවයන්ට ප්‍රදානය කළ හැකි මහඟු සම්පතකි. විශ්‍රාම වැටුප් ආශ්‍රිත නෛතික පසුබිම විවිධ මූලාශ්‍ර වලින් සමන්විත වී ඇත.

## 2.2 විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා සංග්‍රහය

1934 පෙබරවාරි 05 දිනැති විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා සංග්‍රහය (Minutes on Pensions) මූලික නෛතික ලියවිල්ල වේ.

His Excellency the governor has been pleased to direct that the following rules "sanctioned by the Right Honorable the Secretary of state for the colonies" regulating the pensions to be granted to public servants of Ceylon, be substituted for those contained in all previous minutes on the subject of pensions and all such minutes are hereby cancelled, but such cancellation shall not affect any rights acquired under those minutes.

By His Excellency's command,

W.W. Woods,
Financial secretary.

General Treasury,
Colombo, February 5, 1934

මෙම විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා සංග්‍රහය අවස්ථා කිහිපයකදීම සංශෝධනය විය. ඒ අනුව දැනට ක්‍රියාත්මක වන්නේ 1972 මැයි මස 05 දින නිකුත් වූ සංශෝධිත විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා සංග්‍රහය වේ.

## 2.3 වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදල් ආඥා පනත

1898 දී නීතිගත වූ වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදල් ක්‍රමය තුල එකී අරමුදල් ක්‍රමයට දායක විය හැක්කේ විශ්‍රාම වැටුප් සහිත පත්වීම්ධාරීන්ට පමණි. ඒ අනුව එම දිනයට පෙර සිට විශ්‍රාම වැටුප් ක්‍රමය ක්‍රියාත්මක වූ බවට ද සාක්ෂි ඇත. එමෙන්ම විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය හා වැන්දඹු අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදල් යෝජනා ක්‍රමය ඒකාබද්ධව ක්‍රියාත්මක වූ බව පිළිගත හැක. පසු කාලයේ දී වැන්දඹු අනත්දරු විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමයට අමතරව ආරම්භ කළ වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමය තුළ ද විශ්‍රාම වැටුප් සහිත පත්වීම් අනිවාර්ය අංගයක් විය.

## 2.4 රාජ්‍ය හා අධිකරණ නිලධාරීන් ( විශ්‍රාම ගැන්වීම ) ආඥා පනත

රජයේ හා අධිකරණ නිලධාරීන්ගේ විශ්‍රාම ගැන්වීමේ වයස, විශ්‍රාම යාම සඳහා බලපාන හේතු හා ඊට යටත් කොන්දේසි මෙහි අන්තර්ගත වේ.

### රාජ්‍ය හා අධිකරණ නිලධාරීන් (විශ්‍රාම ගැන්වීම)

**616 පරිච්ඡේදය**

රාජ්‍ය හා අධිකරණ නිලධාරීන් ( විශ්‍රාම ගැන්වීම )

ආඥා පනත් — රාජ්‍ය හා අධිකරණ නිලධාරීන් අනිවාර්ය විශ්‍රාම ගැන්වීම පිණිස වන ආඥා පනතකි.

1910 අංක 11 — ( 1910 අගෝස්තු 12 දින )

1917 අංක 21

ලුහුඬු ශීර්ෂය — 1. මෙම ආඥා පනත රාජ්‍ය හා අධිකරණ නිලධාරීන්ගේ ( විශ්‍රාම ) ආඥා පනත ලෙස හඳුන්වනු ලැබේ.

රාජ්‍ය හා අධිකරණ නිලධාරීන් අනිවාර්ය විශ්‍රාම ගැන්වීම සඳහා රෙගුලාසි පැනවීමේ බලය — 2. (1) රාජ්‍ය හා අධිකරණ නිලධාරීන් රාජ්‍ය හා අධිකරණ සේවයෙන් විශ්‍රාම ගැන්වීමට අපේක්ෂා කෙරෙන වයස, විශ්‍රාම යාම සඳහා හේතු සහ ඊට යටත් වන කොන්දේසීන් පාලනය කරමින් රෙගුලාසි පැනවීමට හා එසේ පැනවූ රෙගුලාසි අවලංගු කිරිමට, වෙනස් කිරීමට හෝ සංශෝධනය කිරිමට ආණ්ඩුකාරතුමාට පුළුවන.

(2) විශේෂ වශයෙන් ඉහත උප කොටසින් පවරා දී ඇති බලතල වල පොදු ස්වභාවයට අගතියකින් තොරව පැනවිය හැකි රෙගුලාසි වලින්

(අ) ඕනෑම රාජ්‍ය හෝ අධිකරණ නිලධාරීන්ගේ හෝ කිසියම් විශේෂිත රාජ්‍ය හෝ අධිකරණ නිලධාරි පන්තියකගේ අනිවාර්ය විශ්‍රාම ගැන්වීමේ වයස නියම කිරීමට පුළුවන

(ආ) එවන් අවස්ථාවන්හි දී නියම කළ හැකි කොන්දේසි වලට යටත්ව, අනිවාර්ය විශ්‍රාම යාම සඳහා නීතියෙන් නියම කර ඇති වයස අභිබවා ඉන් ඔබ්බට රාජ්‍ය සහ අධිකරණ නිලධාරින්ගේ රැකියා නියුක්තිය දීර්ඝ කිරීමට හා රාජ්‍ය හෝ අධිකරණ නිලධාරින්ගේ අනිවාර්ය විශ්‍රාම ගැන්වීමට අදාළ කවර හෝ රෙගුලාසියක ක්‍රියාකාරිත්වයෙන් කිසියම් විශේෂිත රාජ්‍ය හෝ අධිකරණ නිලධාරි පන්තියක් නිදහස් කිරීමට පුළුවන.

(ඇ) රාජ්‍ය හෝ අධිකරණ සේවයෙන් අනිවාර්ය විශ්‍රාම ගැන්වෙන වයසට පෙර විශ්‍රාම යාමේ වයසක් නියම කිරීමට හා එතැන්හි දී දැනුම් දෙන පරිදි නැතහොත් නියම කළ හැකි කොන්දේසිවලට යටත්ව, වෙනත් අයවළුන්ට අදාළ පත්වීම් දීමට බලය ඇති නිසි බලධරයාට රාජ්‍ය හෝ අධිකරණ නිලධාරීන් රාජ්‍ය හෝ අධිකරණයෙන් විශ්‍රාම ගැන්වීමට පුළුවන.

(3) අධිකරණ නිලධාරියා යන්නෙහි අර්ථය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා 114 වගන්තියෙහි දැක්වෙන අර්ථයම ගෙන දෙන අතර ( රාජ්‍ය නිලධාරියා ) යන්නෙහි අර්ථය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 170 වගන්තියන්හි දැක්වෙන අර්ථයම ගෙන දේ.

ඉහත ආඥා පනත යටතෙහි රෙගුලාසි පැනවිය හැකිය. 1949 අප්‍රේල් 21 දින ආණ්ඩුකාර ලේකම් විසින් එවැනි රෙගුලාසි පනවා ඇත. එම රෙගුලාසි වලට අනුව සෑම රාජ්‍ය හා අධිකරණ නිලධාරින්ගේ අනිවාර්ය විශ්‍රාම ගැන්වීමේ වයස අවුරුදු 60 වශයෙන් දක්වා ඇත. එමෙන්ම හෙදියන්, ගුරුවරියන් හා වෙනත් තෝරා ගත් සේවාවල කාන්තා නිලධාරීන්ට විශේෂිත වූ විශ්‍රාම ගැන්වීම් රෙගුලාසි ද මේ තුළින් පනවා ඇත.

එල්. ඩී. බී. 129/48, PN/1351

රාජ්‍ය හා අධිකරණ නිලධාරින්ගේ ( විශ්‍රාම ගැන්වීමේ ) ආඥා පනත

1947 සැප්තැම්බර් 24 දිනැති අංක 9773 දරන අති විශෙෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද රාජාඥාව මගින් හා 1948 ජුලි 28 දිනැති අංක 9889 දරන අති විශෙෂ ගැසට් පත්‍රයෙහි පළ කරන ලද රාජාඥාව මගින් සංශෝධනය කර ඇති පරිදි රාජ්‍ය හා අධිකරණ නිලධාරින්ගේ (විශ්‍රාම) ආඥා පනතේ (253 පරිච්ඡේදය ) 2 කොටස යටතේ අග්‍රාණ්ඩුකාරතුමා විසින් පනවන ලද රෙගුලාසි.

උතුමාණන්ගේ අණ පරිදි,

ජේ. ඒ. මුල්හෝල්
අග්‍රාණ්ඩුකාරතුමාගේ ලේකම්

රැජිනගේ නිවස්නය
නුවරඑළිය,
1949 අප්‍රේල් 21

# රෙගුලාසි

1. සෑම රාජ්‍ය සහ අධිකරණ නිලධාරියෙකුගේ අනිවාර්ය විශ්‍රාම ගැන්වීමේ වයස අවුරුදු 60 වේ.

එනමුත් අනිවාර්යය විශ්‍රාම ගැන්වීමේ වයස :-

1. නීතිවේදීන් නොවන ග්‍රාමීය අධිකරණ සභාපතිවරුන් සම්බන්ධයෙන් අවුරුදු 55 වේ.
2. වෛද්‍ය හා සනීපාරක්ෂක දෙපාර්තමේන්තුවෙහි හෙද පාලිකාවන් , හෙද සොයුරියන්, හෙදියන් හා වින්නඹු මාකාවන් සම්බන්ධයෙන් අවුරුදු 50 වේ.

මෙම ව්‍යවස්ථාවේ 1 ඡේදයෙහි පටහැනිව කුමක් සඳහන් වුවද, නිසිබලධරයා සුදුසු හා ප්‍රයෝජනවත් යැයි සලකන ඕනෑම රාජ්‍ය නිලධාරියෙකුගේ සේවා නියුක්තිය, ඔහුගේ අනිවාර්යය විශ්‍රාම ගැන්වීමේ වයස අභිබවා ඉන් ඔබ්බට :-

(අ) සේවයේ අභිවෘද්ධිය හා යහපැවැත්ම උදෙසා නිලධාරියාගේ සේවාවන් තවදුරටත් රඳවාගත යුතු යැයි ඔහු රැකියාවේ නියුක්ත දෙපාර්තමේන්තු ප්‍රධානියා සලකන්නේ නම්, හෝ

(ආ) නිලධාරියා දෙපාර්තමේන්තු ප්‍රධානියා වන තැන්හි, සේවයේ අභිවෘද්ධිය හා යහපැවැත්ම උදෙසා නිලධාරියාගේ සේවය තවදුරටත් රඳවාගත යුතු යැයි එම දෙපාර්තමේන්තුවට අයත් අමාත්‍යාංශයේ ලේකම් සලකන්නේ නම් ඔහු අනිවාර්යය විශ්‍රාම ගැන්වීමේ වයස අභිබවා ඉන් ඔබ්බට දීර්ඝ කිරීමට නිසි බලධරයාට පුළුවන.

2. මෙම ව්‍යවස්ථාවේ (1 ඡේදයෙහි) පටහැනිව කුමක් සඳහන් වුව ද , සේවාවේ යහපැවැත්ම හා අභිවෘද්ධිය වෙනුවෙන් අධිකරණ නිලධාරියෙකුගේ සේවය ප්‍රයෝජනවත් යැයි අධිකරණ සේවා කොමිෂන් සභාව සලකන්නේ නම් අනිවාර්යය විශ්‍රාම ගැන්වීමේ වයස අභිබවා ඉන් ඔබ්බට ඔහුගේ සේවය දීර්ඝ කිරීමට එම කොමිෂන් සභාවට පුළුවන.

3. වයස අවුරුදු 55 සම්පූර්ණ වීම මත හෝ ඉන් පසු ඕනෑම අවස්ථාවක දී හෝ රාජ්‍ය හෝ අධිකරණ නිලධාරියකු විශ්‍රාම ගැන්වීමට නිසි බලධරයාට අවශ්‍ය වීමට පුළුවන.

කෙසේ වෙතත්, මෙහි පහත 1 තීරුවෙහි නිශ්චිතව දක්වා ඇති ඕනෑම පන්තියක හෝ විස්තරයකින් යුත් ඕනෑම නිලධාරියකු සම්බන්ධයෙන් අනුරූපි 2 තීරුවෙහි නිශ්චිතව දක්වා ඇති අයුරින් වයස හෝ සේවා කාලය ( අවස්ථාවෝචිත පරිදි) සම්පූර්ණ වීමෙන් පසු ඕනෑම අවස්ථාවක විශ්‍රාම ගැන්වීමට පුළුවන.

| | (i) | (II) |
|---|---|---|
| (1) | වෛද්‍ය හා සනීපාරක්ෂක සේවා දෙපාර්තමේන්තුවෙහි හෙද පාලිකාවන්, හෙද සොයුරියන්, හෙදියන් හෝ වින්නඹු මාතාවන් | විසි අවුරුදු සේවය |
| (2) | තැපැල් හා විදුලි සංදේශ දෙපාර්තමේන්තුවෙහි සේවයේ නියුතු නිලධාරිනියන් සහ අධ්‍යාපන දෙපාර්තමේන්තුවෙහි නියුතු (1934 ජුනි 15 ට පෙර පත්කරන ලද ) ගුරුවරියන් | වයස අවු:50 හෝ විසි අවුරුදු සේවය යන්නෙන් පළමුව එළඹෙන අවස්ථාව |

1 රාජ්‍ය හෝ අධිකරණ නිලධාරියකු මෙම අවස්ථාවෙහි 1 ඡේදයෙන් පැවරී ඇති බලතලවලට යටත්ව සේවයෙන් විශ්‍රාම ගැනීම අවශ්‍ය වනු ලබන්නේ :

(අ) එවන් විශ්‍රාම ගැනීමක් මගින් එම නිලධාරියා විසින් දැරූ තනතුර හෝ එම නිලධාරියාගේ ශ්‍රේණියේ පහළ තනතුරක් කපා දැමීමට ( RETRENCH) හැකි නම් හෝ

(ආ) එම නිලධාරියාගේ කාර්යක්ෂමතාවය සාමාන්‍ය තත්වයට වඩා පහළ මට්ටමේ වේනම් ය.

එනමුත්, අතිදක්ෂ කාර්යක්ෂම නිලධාරියකු සම්බන්ධයෙන් ඔහු සේවයේ රැඳී සිටීම රජයේ යහපත හා අභිවෘද්ධිය උදෙසා වේ නම්, මෙම ඡේදයේ ( අ) උපඡේදයේ නිශ්චිතව දක්වා ඇති හේතුන් මත විශ්‍රාම ගැන්වීම අවශ්‍යවනු නොලැබේ.

2. මෙම ව්‍යවස්ථාවේ (1) පරිච්ඡේදය මගින් පැවරී ඇති බලතල යටතේ නිසි බලධාරියාට නිලධාරියෙකු සේවයෙන් විශ්‍රාම ගැන්වීමට අවශ්‍ය වීමට අවශ්‍ය වූ තැන්හි ඔහුගේ විශ්‍රාමය බලාත්මක දිනය වනු ලබන්නේ ඒ වෙනුවෙන් නිසි බලධරයා විසින් නිලධාරියා වෙත දෙනු ලබන එම නිවේදන දිනයේ සිට මාස 3 ට නොඅඩු දිනයකි.

3. ඉහත ව්‍යවස්ථාවන්හි මීට පටහැනිව කුමක් සදහන් වුවද , ඕනෑම අවස්ථාවක රාජ්‍ය හෝ අධිකරණ නිලධාරියකු පහත සදහන් හේතුන් මත විශ්‍රාම ගැන්වීමට නිසි බලධරයාට පුළුවන.

(අ) අයහපත් සෞඛ්‍ය තත්ත්වය මත නිලධාරියා තවදුරටත් සේවය සදහා නුසුදුසු බවට නියමිත පරිදි සැදුම්ලත් වෛද්‍ය මණ්ඩලයක් විසින් තීරණය කරන්නේ නම් : හෝ

(ආ) 1949 ජනවාරි 19 දිනැති අංක 9938 දරන ගැසට් පත්‍රයෙහි පළ කරන ලද රාජ්‍ය සේවා කොමිෂන් රෙගුලාසින්හි හෝ අධිකරණ සේවා නියෝගයන්හි( අවස්ථාවෝචිත පරිදි) දක්වා ඇති පරිදි සාමාන්‍ය අකාර්යක්ෂමතාවය මත

4. රාජ්‍ය නිලධාරිනියන් , විවාහය මත නිලධාරිනිය විශ්‍රාම ගන්වන බවට වන දෙපාර්තමේන්තු කොන්දේසියට යටත්ව විශ්‍රාම වැටුප් සහිත පත්වීමක් දරන කල්හි ,1 සහ 2 ව්‍යවස්ථාවන්හි ප්‍රතිපාදනවලට අමතරව, එම රෙගුලාසිය බලපැවැත්වෙන අතර එම රෙගුලාසියට අනුකූලව නිලධාරිනිය අනිවාර්යය ලෙස එලෙසින් විශ්‍රාම ගන්වනු ලැබේ.

5. ඕනෑම නිලධාරියෙකුගේ විශ්‍රාම ගැන්වීම සම්බන්ධයෙන් මෙම ව්‍යවස්ථාවෙහි සදහන් " නිසි බලධරයා" යනු නිලධරයන් දරන ලද තොරතුරු සදහා වෙන අයවළුන් පත් කිරීමට බලය ඇති නිලධරයාය.

## 2.5 1947 රාජ ආඥාව

විශ්‍රාම වැටුප අයිතිවාසිකම හා විශ්‍රාම වැටුප රාජ්‍ය ඒකාබද්ධ අරමුදලින් ගෙවීම පිළිබද විධිවිධාන පනවා ඇත.

64. (1) මේ රාජාඥාවේ මේ කොටස වලංගු වන දිනයට කලින් කවර වේලාවකදී හෝ දිවයිනේ ආණ්ඩුව වෙනුවෙන් ආණ්ඩුවේ සේවයේ යෙදී සිටියාවූ ද එම සේවය අවසන් කළාවූද යම් යම් පුද්ගලයින්ට හෝ එකී පුද්ගලයන්ගේ වැන්දඹු ස්ත්‍රීන්ට හෝ එකී පුද්ගලයන්ට හෝ දරුවන්ට හෝ ඒ පුද්ගලයින්ගෙන් යැපෙන්නන්ට දෙනු ලබන

විශ්‍රාම වැටුප් හෝ පාරිතෝෂික මුදල් හෝ එබඳු දීමනා සියල්ලම ඒවා ප්‍රදානය කරන ලද පනවන ලද නීතියෙන් හෝ ඒ විශ්‍රාම වැටුප් ප්‍රදානය කරන ලද්දේ එකී දිනයෙන් පසුව නම් එදිනට වලංගුව පවත්නා පනවන ලද නීතියෙන් හෝ ඒ දෙවැදෑරුම් අවස්ථාවලදී ම නම් ඊට වඩා අවාසි සහගත නොවූද ඒ දිනට පසුව සම්පාදිත වූ ද යම් පනවන ලද නීතියකින් හෝ පාලනය විය යුතුය.

(2) මේ රාජාඥාවේ මේ කොටස වලංගු වන දිනයේදී දිවයිනේ ආණ්ඩුව වෙනුවෙන් ආණ්ඩුවේ සේවයෙහි නියුක්ත ව සිටින පුද්ගලයින්ට හෝ එකී පුද්ගලයින්ගේ වැන්දඹු ස්ත්‍රීන්ට හෝ දරුවන්ට හෝ ඒ පුද්ගලයින් ගෙන් යැපෙන්නන්ට ගෙවිය හැකි වන විශ්‍රාම වැටුප් හෝ පාරිතෝෂික මුදල් හෝ එබඳු දීමනා සියල්ලම , මේ රාජාඥාවේ 63 වැනි වගන්තියේ විධිවිධානවලට යටත්ව, එකී දිනයේදී වලංගු ව පවත්නා පනවන නීතියෙන් හෝ ඊට වඩා අවාසි සහගත නොවූද ඒ දිනට පසුව සම්පාදිත වූද යම් කිසි පනවන ලද නීතියකින් හෝ පාලනය විය යුතුය.

65. මේ රාජාඥාවේ විධිවිධාන අනුව දෙන විශ්‍රාම වැටුප් හා පාරිතෝෂික මුදල් සියල්ල ම ඒකාබද්ධ අරමුදලෙන් ගෙවිය යුතුය.

## 2.6 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව

රටක උත්තරීතර නීතිය වශයෙන් සැලකෙන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මගින් විශ්‍රාම වැටුප් අයිතිය සනාථ කොට තිබුණි. විශේෂයෙන්ම 1972 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 54 පිටුව 109- ( 1) (2) වගන්තින් වලින් රාජ්‍ය නිලධාරීන්ට ලබා දී තිබූ අනබිභවනීය නෛතික අයිතිය පැහැදිලිව දක්වා තිබුණි. මෙම අයිතිය 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් ගිලිහී ඇත.

ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව 1972

රාජ්‍ය නිලධාරීන් පත් කිරීම මාරු කිරීම සේවයෙන් පහ කිරීම සහ ඔවුන්ගේ විනය පාලනය පිළිබඳව 106 වන වගන්තියේ (3) වන උපවගන්තිය යටතේ විධිවිධාන සලසනතුරු ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව ක්‍රියාත්මක වීම ආරම්භ වන තෙක් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් ඒ බලධරයන් වෙත පවරා තිබුනේ ද ඒ බලධරයෝ තවදුරටත් ඒ බලතල ක්‍රියාත්මක කරන්නාහ.

| | | |
|---|---|---|
| විශ්‍රාම වැටුප් හා නිලධාරියෙකුගේ සේවා පාරිතෝෂිකය | 109 (1) | ලංකාණ්ඩුවේ සේවයෙහි නියුක්තව සිටි කිසියම් නිලධාරියෙකුගේ සේවය නතර කර ඇත්නම් නැතහොත් ශ්‍රී ලංකා ජනරජයේ සේවයෙහි නියුක්තව සිටින රාජ්‍ය නිලධාරියෙකුගේ සේවය නතර වන්නේ නම් ඒ නිලධාරියාට හෝ ඒ නිලධාරියාගේ වැන්දඹුවට හෝ දරුවන්ට හෝ ඔහුගේ යැපෙන්නන්ට හෝ ගෙවිය යුතු විශ්‍රාම වැටුප පාරිතෝෂිකය හෝ වෙනත් එවැනි දීමනා ප්‍රදානය කරනු ලැබුයේ කිසියම් ලිඛිත නීතියක් යටතේ ද ඒ ලිඛිත නීතියෙන් හෝ ඒ නීතිය හා සසඳන විට ඉහත කී විශ්‍රාම වැටුප් පාරිතෝෂිකය හෝ දීමනා ලබන්නන් කෙරෙහි අහිතකර ලෙස බලනොපානා කිසියම් නීතියක් ඉන් අනතුරුව පනවනු ලැබුව හොත් ඒ නීතියෙන් හෝ පාලනය වන්නේය. |
| | (2) | මේ වගන්තියේ සඳහන් සියලුම විශ්‍රාම වැටුප් පාරිතෝෂික හා වෙනත් එවැනි දීමනා ඒකාබද්ධ අරමුදලට වැය බරක් වන්නේය. |

## 2.7 1953 අංක 44 දරන පාසල් ගුරුවරුන්ගේ විශ්‍රාම වැටුප් පනත හා රෙගුලාසි

රජයේ ආධාර ලබන සහ ආධාර නොලබන පාඨශාලා ගුරුභවතුන් වෙනුවෙන් විශ්‍රාම වැටුප් හිමිකම, දායක මුදල් අය කිරීම, විශ්‍රාම වැටුප් ගණන් බැලීම, දායක මුදල් ආපසු ගෙවීම, විශ්‍රාම වැටුප් පරිවර්තනය කිරීම, විනය කටයුතු යනාදිය මෙම පනතින් සහ රෙගුලාසි වලින් ආවරණය කෙරේ. එමෙන්ම මෙකී පාඨශාලාවන්හි ගුරුවරියන්ට ද වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප් හිමිකම ලැබෙන පරිදි නීතිමය ප්‍රතිපාදන 2008 වසරේ දී ඇති කරනු ලැබීය.

## 2.8 අමාත්‍ය මණ්ඩලය මගින් විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා සංග්‍රහයට සිදු කරන සංශෝධන හා ගැසට් නිවේදන

විවිධ අමාත්‍ය මණ්ඩල පත්‍රිකා මගින් සිදු කරන අනුමැතිය මත විශ්‍රාම වැටුප් ගෙවිය හැක. එම අනුමැතිය රජයේ ගැසට් පත්‍රයෙහි පළ කිරීම තුළින් විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා සංග්‍රහය සංශෝධනය කෙරේ. විවිධ අමාත්‍යවරුන් මෙවැනි අමාත්‍ය මණ්ඩල පත්‍රිකා ඉදිරිපත් කිරීම කාලීනව දැකිය හැකි විශේෂ ලක්ෂණයකි. හිටපු ගරු ආණ්ඩුකාරවරයකු වූ විලියම් ගොපල්ලව මැතිතුමා හා අධ්‍යාපන ප්‍රකාශන මණ්ඩලයෙහි ලේකම් වරයකු වූ එස්. ඩී. වීරසිංහ මහතා වෙනුවෙන් විශ්‍රාම වැටුප් ප්‍රදානය කිරීමට අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබා දීම ඉතා හොඳ උදාහරණයක් වේ.

## ජාතික රාජ්‍ය සභාවේ කාර්යය සටහන්

1978 පෙබරවාරි මස 23 වැනි බ්‍රහස්පතින්දා අ.භා.2 ට

විලියම් ගොපල්ලව උතුමාණෝ විශ්‍රාම ගැනීමේ දී විශ්‍රාම වැටුප් :- රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු ඇමතිතුමා ඉදිරිපත් කළ යෝජනාව , ජනාධිපති විලියම් ගොපල්ලව උතුමාණෝ විශ්‍රාම ගැනීමේ දී ජාතික රාජ්‍ය සභාවේ යෝජනාවකින් අනුමැතිය ලත් ව්‍යවස්ථාගත නොවූ විශ්‍රාම වැටුප් ප්‍රදානයන් පිළිබඳ වූ 66 වන ශීර්ෂය 1 වන වැඩසටහනේ 2 වන ව්‍යාපෘතියේ 8 වන වැය සංකේතයේ 15 වන විෂය යටතේ ආදායම් බද්දෙන් නිදහස්, මසකට රු. 2500 ක විශ්‍රාම වැටුපක් ගෙවිය යුතුය.

ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

MINUTES OF THE HOUSE OF REPRESENTATIVES

Pension to widow and children of late Mr S.D. Weerasinghe (Secretary, Educational Publications Board (the Minster of finance moved. that a pension of Rs. 801.06 per annum chargeable to Head 21, 21 Vote 1, sub-head 18 non-statutory awards granted by special Regulation of parliament, be paid to the widow and children of the late Mr. S. D. Weerasinghe, Secretary Educational Publications board, with effect from June 9, 1953; the pension to be subject to the same conditions on which a pension is paid under the Widows and Orphans' pension Scheme.

Question put and agreed to

## 2.9 විවිධ අණ පනත්හි විශ්‍රාම වැටුප් පිළිබඳ රීති

විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා සංග්‍රහය මූලික නීතිය වුවත් විවිධ අණපනත් සම්මත කිරීමේ දී කාර්යය මණ්ඩල සුරක්ෂිතභාවය සඳහා විශ්‍රාම වැටුප් පිළිබඳ වගන්ති එකී කෘතින්වල අන්තර්ගත වේ. එවැනි නීති කෘතීන් ගණනාවකි.

1978 අංක 19 දරන ගමනාගමන මණ්ඩල පනත
1975 අංක 14 දරන ශ්‍රී ලංකා තේ මණ්ඩල පනත
1974 අංක 16 දරන පළාත් පාලන සේවා පනත
1981 අංක 54 දරන ජාතික ජලජ පරියේෂණ හා සංවර්ධන නියෝජන පනත
1985 අංක 07 දරන විශ්ව විද්‍යාල ( සංශෝධන) පනත
1988 අංක 32 දරන ලංකා විදුලිබල මණ්ඩල ( සංශෝධන ) පනත
1990 අංක 36 දරන ශ්‍රී ලංකා වරායවල් පිළිබඳ අධිකාරිය ( විශේෂ විධිවිධාන)
1996 අංක 27 දරන ශ්‍රී ලංකා ගුවන්විදුලි සංදේශ ( සංශෝධන )
1996 අංක 8 දරන ශ්‍රී ලංකා ගුවන්විදුලි සංස්ථාව ( විශේෂ විධිවිධාන )
2002 අංක 34 දරන ශ්‍රී ලංකා සිවිල් ගුවන් සේවා අධිකාරිය පනත
2007 අංක 51 දරන ගම්පහ වික්‍රමආරච්චි ආයුර්වේද ශික්ෂණ රෝහල ( පැවරීමේ)පනත
1953 අංක 09 දරන පාර්ලිමේන්තු කාර්ය මණ්ඩල පනත
1993 අංක  දරන පලාත් සභා විශ්‍රාම වැටුප් පනත
1974 අංක 02 දරන ජාතික ජල සම්පාදන හා ජල පවාහන පනත
විශ්‍රාම වැටුප් ( විශේෂ විධිවිධාන) ( සංශෝධන ) පනත්
1987 අංක 42 දරන පළාත් සභා පනත
1979 අංක 64 දරන පිරිවෙන් අධ්‍යාපන පනත

මෙම පනත්හි විශ්‍රාම වැටුප පිළිබඳ ඇතැම් වගන්ති විශ්‍රාම ව්‍යවස්ථා සංග්‍රහය අභිබවා ක්‍රියාත්මක වේ. උදාහරණ වශයෙන් ඇතැම් පනත් වලට අනුව සංස්ථා හෝ අධිකාරිය සේවා කාලය ද රාජ්‍ය සේවාව වශයෙන් සලකා විශ්‍රාම වැටුප ගණනයට විධාන පනවනු ඇත.

## 2.10 ආයතන සංග්‍රහය

රාජ්‍ය සේවයට අදාළ බඳවා ගැනීම්, පත් කිරීම්, උසස් කිරීම් සහ එම කාර්යයන්ට අදාළ කාර්යය පටිපාටිය ඇතුළත් ආයතන සංග්‍රහයෙහි විවිධ වගන්තීන් විශ්‍රාම වැටුප් හා විශ්‍රාම ගැන්වීම සම්බන්ධව බල පැවැත්වෙනු ලැබේ.

විශ්‍රාම වැටුප් හිමි තනතුරු හා විශ්‍රාම වැටුප් හිමිකම, ඉල්ලා අස්වීමේ දී විශ්‍රාම වැටුප් හිමිකම අහිමි වීම, විශ්‍රාම ගැන්වීම, විශ්‍රාම වැටුප් ගෙවීම සඳහා අවශ්‍ය වන ලේඛන, විශ්‍රාම ගන්නා විට චරියා සටහන් පිළියෙල කිරීම, විශ්‍රාමික නිලධාරීන්ට ගමන් වියදම් ගෙවීම, විශ්‍රාම පූර්ව නිවාඩු, විශ්‍රාම යන විට ගමන් වියදම් ගෙවීම, විශ්‍රාමික නිලධාරීන්ට දුම්රිය බලපත්‍ර නිකුත් කිරීම, විශ්‍රාම පූර්ව නිවාඩු අවසන් වන තෙක් නිල නිවාසයේ පදිංචි වී සිටීම, ඇප කරුවන් විශ්‍රාම ගැන්වීම යනාදී වශයෙන් විශ්‍රාම ගැන්වීමේ විධිවිධාන මෙහි ඇතුළත් වේ.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික හා සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහය I වැනි කාණ්ඩයෙහි විශ්‍රාම වැටුප් පිළිබඳ පහත සඳහන් වගන්ති ඇතුළත් වේ.

## IV වැනි පරිච්ඡේදය

## මාස්පඩි, තාවකාලික තත්ත්වය, ස්ථිර තත්ත්වය හා විශ්‍රාම වැටුප් හිමිකම ප්‍රදානය කිරීම

6. විශ්‍රාම වැටුප් හිමි තනතුර සහ විශ්‍රාම වැටුප් හිමිකම

6:1 ස්ථිර තනතුරක් අවශ්‍යයෙන්ම විශ්‍රාම වැටුප් හිමි තනතුරක් නොවන්නේය. විශ්‍රාම වැටුප් හිමි තනතුරක් වශයෙන් සැලකෙන්නේ විශ්‍රාම වැටුප් ව්‍යවස්ථාව යටතේ උපලේඛන ගත කරන ලද ස්ථිර තනතුරක් පමණකි. විශ්‍රාම වැටුප් ව්‍යවස්ථාව යටතේ තනතුරක් එලෙස උපලේඛන ගත කරනු ලබන්නේ රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශයේ ලේකම්වරයාගේ බලය පිටය.

6:2 විශ්‍රාම වැටුප් හිමි නිලධාරියකු වනාහි විශ්‍රාම වැටුප් ව්‍යවස්ථාවේ 2 වන වගන්තිය යටතේ විශ්‍රාම වැටුප් හිමි තනතුරක් ලෙස උපලේඛනගත කර ඇති තනතුරකට විශ්‍රාම වැටුප් හිමි නිලධාරියකු හැටියට පත් කරනු ලබන තැනැත්තෙකි.

6:3 විශ්‍රාම වැටුප් හිමි තනතුරක් දරන තැනැත්තෙකු අවශ්‍යයෙන්ම විශ්‍රාම වැටුප් හිමි තැනැත්තෙකු නොවන්නේය. උදාහරණයක් වශයෙන් කියතොත් විශේෂ හේතු නිසා විශ්‍රාම වැටුප් හිමි තනතුරකට ගිවිසුමක් පිට හෝ විශ්‍රාම වැටුප් අහිමි පදනම මත හෝ පත්වීම් දිය හැකිය.

6:4 කම්කරු ශ්‍රේණිවල I-III පන්තිවල ස්ථිර වැටුප් සහිත තනතුරක් දරන්නෙකුට විශ්‍රාම වැටුප් හිමි තත්ත්වය අත්කර ගැනීම සඳහා අවුරුදු 10ක අවම සේවා කාලයක් සම්පූර්ණ කිරීම අවශ්‍යය. මෙම දස අවුරුදු කාලයේ දී ඔහු දායක වන්නේ වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදලට හෝ වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදලට හෝ නොව, රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදලටය.

## V වැනි පරිච්ඡේදය

## මුදා හැරීම, කලින් දැරූ තනතුරට පෙරලා යැවීම හා සේවය අවසන් කිරීම

2. රජයේ සේවයෙන් පරිබාහිර වූ සේවයක් සඳහා මුදා හැරීම

2:6 නිලධාරියෙකු රාජ්‍ය සංස්ථාවක සේවය සඳහා ස්ථිරව මුදා හරිනු ලැබුවහොත් ඔහු මුදා හැරීම පිළිබඳ නියමයන් හා කොන්දේසි පාලනය විය යුත්තේ එකී රාජ්‍ය සංස්ථාව සංස්ථාපනය කරන ලද ව්‍යවස්ථාවෙන් හා විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා සංග්‍රහයේ ඊට අදාළ විධිවිධාන වලිනි.

4. ඉල්ලා අස්වීම

4:3 විශ්‍රාම වැටුප් හිමි නිලධාරියෙකු ඉල්ලා අස්වුවහොත්, විශ්‍රාම වැටුපකට හෝ පාරිතෝෂිකයකට හෝ ඇති අයිතිවාසිකම් සියල්ල ද, පසුකලක දී රජය යටතේ යළිත් රැකියාවක් ලබා ගත හොත් ඉල්ලා අස්වීමට පෙර කරන ලද සේවයට හිමි අනෙක් එල ප්‍රයෝජන ද ඔහුට අහිමි වන බව, විශ්‍රාම වැටුප් හිමි නිලධාරියෙකුගේ ඉල්ලා අස්වීමේ ලිපිය ලැබුණු විට දෙපාර්තමේන්තු ප්‍රධානියා එම නිලධාරියාට ලියා දැන්විය යුතුය.

4:6 ඉල්ලා අස්වීමට පෙර තමා විසින් කරන ලද සේවාවන්ගේ ප්‍රතිඵලයක් වශයෙන් ලැබෙන සියලුම හිමිකම් සහ ප්‍රතිලාභ ඉල්ලා අස්වන නිලධාරියෙකුට අහිමි වෙයි. කෙසේ නමුත්, සේවයෙන් ඉල්ලා අස්වී යළිත් සේවයට බැඳුනු නිලධාරියෙකුගේ වැඩ හා හැසිරීම සතුටුදායකව පැවතුණි නම් සේවයෙන් ඉල්ලා අස්වීමට පෙර වූ සේවා කාලය, විශ්‍රාම වැටුප් කාර්යයන් සඳහා පමණක් සලකා බලනු ලැබේ. (ඵෂෂ වැනි පරිච්ඡේදයේ 8.1 උප වගන්තිය බලන්න)

5. විශ්‍රාම ගැන්වීම

5:3:1 සේවා කාලය දීර්ඝ කිරීමේ දී, වයස අවුරුදු 55 සම්පූර්ණ වී සිටින නමුත් අවුරුදු 10 ක විශ්‍රාම වැටුප් හිමි සේවයක් සම්පූර්ණ කර නැති විශ්‍රාම වැටුප් හිමි තනතුරක් දරන නිලධාරියෙකුට වයස අවුරුදු 58 පිරෙන දිනයය, අවුරුදු 10 ක විශ්‍රාම වැටුප් හිමි සේවයක් සම්පූර්ණ වන දිනයය යන දෙකින් කලින් එලඹෙන දිනය දක්වා සේවයේ රැඳී සිටීමට අදාළ අමාත්‍යවරයාගෙන්ද විමසා ඉඩ දීමට අදාළ ලේකම්ට පුළුවන. ඒකාබද්ධ සේවාවන් සම්බන්ධයෙන් අදාළ ලේකම් රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශයේ ලේකම් වන අතර එවැනි නිලධාරියෙකු සේවයේ නියුතුව සිටින අමාත්‍යාංශයේ ලේකම් නිර්දේශ කළ යුතු වන්නේ ඔහු වෙතය.

5:4 වයස අවුරුදු 58 ඉක්මවා අවුරුදු 60 දක්වා සේවය දීර්ඝ කිරීමේ බලධාරියා අදාළ අමාත්‍යවරයා වේ.

5:4:1 ඒකාබද්ධ සේවාවකට අයත් වූ වයස අවුරුදු 58 ඉක්ම වූ නිලධාරියෙකුගේ සේවා කාලය දීර්ඝ කිරීමට ඉල්ලීමක් කරනු ලබන විටක, එවැනි ඉල්ලීමකට අදාළ අමාත්‍යවරයාගේ කැමැත්ත දන්වා සිටින ලිපිය ලේකම් පෞද්ගලිකව අත්සන් කළ යුතුය.

5.5 අමාත්‍යාංශයක අතිරේක ලේකම් වරයකු, දෙපාර්තමේන්තු ප්‍රධානියෙකු, ආණ්ඩුවේ ඒජන්තවරයකු සහ අමාත්‍යාංශයක ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම්වරයකු සම්බන්ධයෙන් වයස අවු: 58 න් ඔබ්බට සේවය දීර්ඝ කිරීම් සලකා බලන්නේ අමාත්‍ය මණ්ඩලය විසිනි.

5:6 සිය සේවය දීර්ඝ කරන කාල සීමාව නිලධාරියාට ලියා දන්වන අතර එක් වරකට වර්ෂයකට වඩා වැඩි කාලයක් එලෙස දීර්ඝ නොකළ යුතුය.

5:7 ඊළඟ වර්ෂය අවසාන වීමට පෙර වයස අවුරුදු 55 සම්පූර්ණ වන සිය දෙපාර්තමේන්තුවල සේවය කරන සියලුම නිලධාරීන් සම්බන්ධයෙන් 91 වැනි පොදු ආකෘති පත්‍රයේ ලියන ලද වාර්තාවක් සෑම වර්ෂයකදීම දෙසැම්බර් මස 1 වැනි දිනට පෙර දෙපාර්තමේන්තු ප්‍රධානියා ලේකම්ට ඉදිරිපත් කළ යුතුය.

වයස අවු: 55 එළඹීමේ දී නිලධාරියා විශ්‍රාම ගැන්වීමට හෝ සේවය දීර්ඝ කිරීමට (අදාළ පරිදි) කටයුතු කරන බවට ඔහු වග බලා ගත යුතුය.

ඉහත සඳහන් විධිවිධාන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 5/2002 මගින් සංශෝධනය වී ඇත.

5.1 රාජ්‍ය නිලධාරියෙකුගේ විශ්‍රාම ගැන්වීම, රජයේ හා අධිකරණ නිලධාරීන්ගේ (විශ්‍රාම ගැන්වීමේ) ආඥා පනතද, ඒ යටතේ පනවන ලද ව්‍යවස්ථා ද යටතේ පාලනය වෙයි.

5.2 නිලධාරියෙකුගේ වෛකල්පිත විශ්‍රාම ගැන්වීමේ වයස අවුරුදු 55 වේ.

5.3 පහත සඳහන් උප වගන්තිවල දැක්වෙන විධිවිධානවලට යටත්ව වාර්ෂිකව සේවා දීර්ඝ කිරීමකින් තොරව අවුරුදු 57 දක්වා නිලධාරියෙකුට සේවයේ යෙදී සිටීමට හැකියාව ඇත.

5.3.1 වයස අවුරුදු 55 ඉක්මවූ නිලධාරියෙකුට තමන්ගේ අභිමතය පරිදි අවම වශයෙන් මාස තුනකට පෙර අදාළ පත්කිරීමේ බලධාරියාට දැනුම්දීමක් කර විශ්‍රාම යාමට හැකියාව ඇත.

5.3.2 වයස අවුරුදු 55 ඉක්මවූ නිලධාරියෙකුගේ කාර්යක්ෂමතාවය හා සේවා තත්ත්වය සතුටුදායක නොවන බව පත්කිරීමේ බලධාරියා තීරණය කරන්නේ නම් මාස තුනක කල්දීමකින් පසුව විශ්‍රාම ගැන්වීමේ අයිතිය පත්වීම් බලධාරියා සතුය.

5.4. සේවා දිගුව පිළිබඳව පත්වීම් බලධාරියා විසින් ලබාදී ඇති නියෝගයක් සම්බන්ධව එම නියෝගයට පාත්‍රවූ නිලධාරියා විසින් ඉදිරිපත් කරනු ලබන අභියාචනයක සඳහන් කරුණු මත අදාල වන පරිදි අභියාචන බලධාරීත්වය දරන අමාත්‍ය මණ්ඩලයට හෝ රාජ්‍ය සේවා කොමිෂන් සභාවට එම නියෝගය ප්‍රතිශෝධනය කිරීමට හෝ වෙනස් කිරීමට හෝ අහෝසි කිරීමට හෝ බලය ඇත.

5.5 පහත සඳහන් විධිවිධානවලට යටත්ව සේවයේ අවශ්‍යතාවය මත රාජ්‍ය සේවකයෙකුගේ සේවය වයස අවුරුදු 57 සිට 60 දක්වා දීර්ඝ කිරීමේ අධිකාරී බලය පත්වීම් බලධරයා සතුය.

5.5.1 වයස අවුරුදු 57න් පසු සේවය කිරීමට අදහස් කරන නිලධාරියෙකු තම සේවය දීර්ඝ කිරීම සඳහා වූ ඉල්ලුම් පත්‍රය දෙපාර්තමේන්තු ප්‍රධානියා මගින්, පත්වීම් බලධරයා වෙත වාර්ෂිකව ඉදිරිපත් කළ යුතුය. පළමු සේවය දීර්ඝ කිරීම සඳහා වූ ඉල්ලීම නිලධාරියාගේ වයස අවුරුදු 57 එළඹෙන දිනට මාස හයකට පෙරත් ඉන් පසුව වයස අවුරුදු 60 දක්වා වන සේවා දීර්ඝ කිරීම් සඳහා වූ ඉල්ලීම් සේවා දිගුව ආරම්භ වන දිනට මාස තුනකට පෙරත් ඉදිරිපත් කළ යුතුය. එම ඉල්ලීම් පිළිබඳව සලකා බලා පත්වීම් බලධරයා විසින් සේවා දිගුව ලබාදීම පිළිබඳව තීරණය කළ යුතුය.

5.5.3 නිලධාරියෙකුගේ සේවය දීර්ඝ කරන කාල සීමාව ඔහුට දැන්විය යුතු අතර, එක්වරකට වර්ෂයකට වඩා වැඩි කාලයකින් සේවය දීර්ඝ නොකළ යුතුය.

5.6 විනය නියෝගයක් නොවන්නේ නම්, නිලධාරියෙකුගේ විශ්‍රාම වැටුප් සඳහා ගණන් ගත හැකි සේවා කාලය, අවුරුදු දහයකට වඩා අඩු වන්නේ නම් අවුරුදු දහය සම්පූර්ණ වන දිනය හෝ නිලධාරියෙකුගේ වයස අවුරුදු 60 සම්පූර්ණ වන දිනය හෝ යන දින දෙකෙන් පළමුව එළඹෙන දිනට පෙර ඉහත විධිවිධාන යටතේ නිලධාරියෙකු විශ්‍රාම ගැන්වීමට අදාළ බලධාරියා කටයුතු නොකළ යුතුය.

## VI වැනි පරිච්ඡේදය

### සේවා ලේඛන, වාර්තා සහ සහතික

1 : 3 නිලධාරියෙකුගේ විශ්‍රාම වැටුප් තීරණය කොට ගෙවීම සඳහා අවශ්‍ය ලේඛන විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ නිකුත් කරන ලද උපදෙස් වලට අනුකූලව දෙපාර්තමේන්තුවක් විසින් තබා ගත යුතුය. නිලධාරියා අවසානයේ දී විශ්‍රාම ගන්නා විට විශ්‍රාම වැටුප් අනුමත කිරීමේ ප්‍රමාදයන් මගහැරවීම සඳහා මේ ලේඛන පවත්වා ගෙන යාම කෙරෙහි උපරිම සැලකිල්ලක් දැක්විය යුතුය.

2. චරියා සටහන් පත්‍රය

2:9:9 නිලධාරියෙකු විශ්‍රාම ගන්නා විට ඔහුගේ චරියා සටහන් පත්‍රය විශ්‍රාම වැටුප ගණන් බැලීම සඳහා පිළියෙල කරනු ලබන විස්තර පත්‍රිකාවට අමුණා කෙලින්ම විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ වෙත ඉදිරිපත් කළ යුතුය.

7. සේවා සහතිකය

7:1 විශ්‍රාම ගැනීමෙන් හෝ සිය කැමැත්තෙන් ඉල්ලා අස්වීමෙන් හෝ රජයේ සේවයෙන් අස්ව යන රජයේ නිලධාරියෙකුට හැර වෙනත් කිසිම රජයේ නිලධාරියෙකුට මොනම අවස්ථාවකදීවත් කිසිම චරිත සහතිකයක් හෝ කුසලතා සහතිකයක් හෝ සේවා සහතිකයක් හෝ නොදිය යුතුය.

7:2 විශ්‍රාම ගැනීම නිසා හෝ සිය කැමැත්තෙන්ම ඉල්ලා අස්වීම නිසා හෝ සේවය නොහොත් හැසිරීම අසතුටුදායක වීම හැර වෙනත් හේතු මත තාවකාලික පත්වීමක් අවසන් කරනු ලැබීම නිසා හෝ රජයේ සේවයෙන් ඉවත්ව යන නිලධාරියෙකුට පහත සඳහන් විස්තර අඩංගු සහතිකයක් නිකුත් කළ හැකිය.

නිලධාරියාගේ නම :-

ආණ්ඩුව යටතේ සේවය කළ කාලය:-

දිනයන් ද දෙපාර්තමේන්තුවල නම් ද ඇතුළුව දැරූ තනතුරු :-

රජයේ සේවයෙන් ඉවත් වීමට හේතුව :-

කාර්යක්ෂමතාවය :-

සාමාන්‍ය හැසිරීම :-

## X පරිච්ඡේදය

### ජූරි සභිකයන්ට, සාක්ෂි කරුවන්ට, නිල නොලත් මහේස්ත්‍රාත්වරුන්ට, හදිසි මරණ පරීක්ෂකවරුන්ට සහ විවිධ සේවා වෙනුවෙන් කරනු ලබන ගෙවීම්

1:2:1 විශ්‍රාම ගැනීමට ප්‍රථමයෙන් රජයේ සේවකයකු වශයෙන් ක්‍රියා කිරීමේ දී තමන්ට දැන ගැනීමට ලැබුණු කරුණු හෝ තමාට කටයුතු කිරීමට සිදු වූ කරුණු හෝ සම්බන්ධයෙන් සාක්ෂි දීමට යන විශ්‍රාමලත් රජයේ නිලධාරියකුට විශ්‍රාම ගැනීමෙන්

පසුව ඇති ආදායම් නොහොත් කරන වෘත්තිය පදනම් කොටගෙන 1:1 වැනි උප වගන්තිය අනුව හෝ විශ්‍රාම ගත් දිනයේදී තමන්ට ලැබුණු වැටුප හා දැරූ පදවිය පදනම්කොටගෙන XIV වැනි පරිච්ඡේදයේ රෙගුලාසි හා ගාස්තු ප්‍රමාණයන් අනුව හෝ තමන්ගේ අභිමතය පරිදි වියදම් ලබා ගත හැකිය.

10 විශ්‍රාම ගැනීමට පෙරාතුව තම නිල තත්ත්වයෙහි ලා තමන්ට දැනගන්නට ලැබී ඇති සිද්ධි පිළිබඳව හෝ යම් කරුණු සම්බන්ධව ක්‍රියා කිරීමට තමන්ට සිදු වූයේද ඒ කරුණු පිළිබඳව හෝ සාක්ෂි දීම පිණිස අධිකරණය වෙත පැමිණෙන විශ්‍රාමලත් රාජ්‍ය නිලධාරීන් හට ද, විශේෂඥ සාක්ෂි දීම පිණිස අධිකරණය විසින් කැඳවනු ලැබූ තැනැත්තන් හටද, එනම් තමන්ගේ සාක්ෂි අදාළ වන විෂයයන් පිළිබඳව අධිකරණයේ මතයට අනුව තමන් විශේෂඥයන් ලෙස සුදුස්සන් කිරීමට ප්‍රමාණවත් වන්නා වූ විශේෂ දැනුමක්, නිපුණත්වයක්, පළපුරුද්දක්, පුහුණුවක් හෝ අධ්‍යාපනයක් ඇත්තාවූ තැනැත්තන් හටද, මේ නියෝගයේ (9) වන ඡේදයේ විධිවිධාන අදාළ විය යුතුය.

## XII වැනි පරිච්ඡේදය

## නිවාඩු

10: 6 නිවාඩු අවසන් වූ පසු සෑහෙන තරම් දිගු කලක් රජය යටතේ තවදුරටත් සේවය කිරීමට ආපසු නොපැමිණෙන නිලධාරියෙකුට ඉකුත් නිවාඩු නොදිය යුතුය. ඉකුත් නිවාඩු දෙනු ලැබූ නිලධාරියෙකු සේවයට ආපසු නොපැමිණ විශ්‍රාම ගතහොත් හෝ යම්කිසි හේතුවක් පිට බලයෙන් විශ්‍රාම ගැන්වූවහොත් හෝ එසේ නැතහොත් සේවයට ආපසු පැමිණීමෙන් පසු, ඔහුට දී තිබුණු ඉකුත් නිවාඩු කාලයට නොඅඩු කාලයක් සේවය කිරීමට කලින් විශ්‍රාම ගතහොත් නොහොත් විශ්‍රාම ගැන්වූවහොත් හෝ එබඳු නිලධාරියෙකුට දී ඇති ඉකුත් නිවාඩුව ඉදින් අසනීපයක් වෙනුවෙන් දෙන ලද්දක් නොවේ නම් අඩ වැටුප් නිවාඩුවක් බවට පරිවර්තනය කළ යුතුය.

10.6.1 දෙපාර්තමේන්තු ප්‍රධානියෙකු විසින් එබඳු සියලුම අවස්ථාවන්හි දී අදාළ නිලධාරියාගේ විශ්‍රාම ලියකියවිලි යැවීමට පෙර තම ලේකම්වරයාගෙන් උපදෙස් ලබාගත යුතුය.

### 11. විශ්‍රාම පූර්ව නිවාඩු

11: 1 මෙහි 8 වැනි වගන්තිය යටතේ විවේක නිවාඩු ලබා ගැනීමට සුදුසුකම් ඇති රජයේ නිලධාරියෙකු විශ්‍රාම ගැනීමට ආසන්නව සිටිය දී, එසේ විශ්‍රාම ගන්නා අවස්ථාවේ දී ඉතිරිව තිබෙන විවේක නිවාඩු ප්‍රමාණය 11 : 2 හා 11: 3 දරන උප වගන්තිය දක්වා ඇති ආකාරයට ඔහුට දිය හැකිය.

11: 2 නිලධාරියෙකුගේ විශ්‍රාම පූර්ව නිවාඩුව යම්කිසි ලිත් වර්ෂයක අප්‍රේල් මාසයේ 1 දාට කලින් දිනයක සිට ආරම්භ වෙතොත් ඔහුගේ මනාපය අනුව එක්කෝ - ඊට කලින් අවුරුද්ද වෙනුවෙන් නිලධාරියාට ඉතිරිව ඇති සාමාන්‍ය විවේක නිවාඩු දවස් ගණන සහ විශ්‍රාම පූර්ව නිවාඩුව ආරම්භ වන අවුරුද්දේ දී ඒ නිවාඩුව පටන් ගැනීමට පෙර සේවය කර ඇති හැම මාසයක්ම වෙනුවෙන් විවේක නිවාඩු ප්‍රමාණයෙන් 1/3 බැගින් වූ අනුපාතික නිවාඩු දවස් ගණන, එසේ නැතහොත් ඊට කලින් අවුරුද්ද වෙනුවෙන් නිලධාරියාට ඉතිරිව ඇති සාමාන්‍ය විවේක නිවාඩු දවස් ගණන, එසේ නැතහොත් ඊට කලින් දෑවුරුද්ද වෙනුවෙන් නිලධාරියාට ඉතිරිව ඇති සාමාන්‍ය විවේක නිවාඩු දවස් ගණන, ඔහුට දිය හැකිය.

11:2:1 විශ්‍රාම පූර්ව නිවාඩු ආරම්භ වන අවුරුද්දේ දී නිලධාරියා යම් විවේක නිවාඩුවක් ලබාගෙන ඇතොත් එය එම උප වගන්තිය යටතේ ඇති නිවාඩුවෙන් අඩු කරනු ලැබේ.

11:3 නිවාඩු පිට මේ රටින් පිට ගොස් පෙරළා පැමිණීමෙන් පසු මාස 9ක් සේවය සම්පූර්ණ කර ඇති නමුත් , මාස 18 ක සේවය සම්පූර්ණ කිරීමට පෙර රජයේ සේවයෙන් විශ්‍රාම ගන්නා නිලධාරියෙකුට පහත සඳහන් අයුරින් ගණන් බලන ලද නිවාඩු දිය හැකිය:-

ඔහු නිවාඩු ගොස් ආපසු පැමිණි අවුරුද්ද තුළ සේවයකර ඇති එක් එක් මාසය වෙනුවෙන් ඔහුගේ වාර්ෂික විවේක නිවාඩුවෙන් 1/9 ක් බැගින් වූ අනුපාතික විවේක නිවාඩුවෙන් ඔහු ඒ අවුරුද්ද තුළ ඒ වන විට ලබා ගෙන ඇති විවේක නිවාඩු අඩු කිරීමෙන් පසු ඉතිරිවන කොටසේ, සහ ඊළඟ අවුරුද්ද වෙනුවෙන් ඉතිරිව ඇති සමාන්‍ය විවේක නිවාඩු ප්‍රමාණයේ එකතුව.

විශ්‍රාම පූර්ව නිවාඩු ආරම්භ වන්නේ ඔහු මේ රටින් පිට නිවාඩුවක් ගතකොට පැමිණි අවුරුද්ද එක්කම ඇති ඊළඟ අවුරුද්දේ අප්‍රේල් මස 1 වැනිදාට පෙර දිනයක නම් එම අවුරුද්දේ නිවාඩුව ගණන් බැලිය යුත්තේ ඒ අවුරුද්ද තුළ සේවය කර ඇති එක් එක් සම්පූර්ණ මාසය වෙනුවෙන් වාර්ෂික විවේක නිවාඩුවෙන් 1/3 බැගිනි.

11:4 මෙහි 26 වැනි වගන්තිය යටතේ නිවාඩු දෙනු ලබන කනිෂ්ඨ සේවකයකුට හෝ 27 වැනි වගන්තිය යටතේ නිවාඩු දෙනු ලබන දවස් පඩි පිට සිටින නිලධාරියෙකුට ඔහු විශ්‍රාම ගන්නා අවස්ථාවේදී එසේ විශ්‍රාම ගන්නා අවුරුද්ද වෙනුවෙන් සහ ඒ එක්කම ඊට කලින් අවුරුද්ද වෙනුවෙන් ඉහත සඳහන් වගන්ති යටතේ ඉතිරිව ඇති අසනීප නිවාඩු ප්‍රමාණය විශ්‍රාම පූර්ව නිවාඩු වශයෙන් දිය හැකිය. ඔහු විශ්‍රාම ගන්නා අවුරුද්ද තුළ වැඩ කර තිබේ නම් එම අවුරුද්ද වෙනුවෙන් ඉතිරිව තිබෙන සියලුම අනියම් නිවාඩු ද ඉහත සඳහන් නිවාඩු වලට අතිරේක වශයෙන් ඔහුට දිය හැකිය.

11:5 අකාර්යක්ෂමතාවය නිසා විශ්‍රාම ගන්වනු ලබන නිලධාරියෙකුට විශේෂ හේතූන් උඩ විශ්‍රාම පූර්ව නිවාඩු දීම යුක්ති සහගත හෝ යෝග්‍ය හෝ වන අවස්ථාවල දී හැර විශ්‍රාම පූර්ව නිවාඩු ලබා ගැනීමට හිමිකමක් නැත. විශ්‍රාම පූර්ව නිවාඩු දීම යුක්ති සහගත හෝ යෝග්‍ය හෝ වන අවස්ථාවක දී ඒ බව සනාථ කිරීමට හේතු දක්වමින් එම නිවාඩුව සඳහා ඉල්ලුම් පත්‍රයක් ලේකම්වරයා වෙත යැවිය යුතුය.

11:6 සිය තනතුරෙන් ඉල්ලා අස්වීමේ ලියකියවිලි බාර දී ඇති නිලධාරියෙකුට එම ලියකියවිලි බාර දුන් දින සිට විවේක නිවාඩු හෝ අනියම් නිවාඩු කිසිවක් ලැබීමට හිමිකම් නැත.

ඉහත සඳහන් විධිවිධාන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 367, 3/97 හා 19/2010 මගින් සංශෝධනය වී ඇත.

රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක : 367 හා 3/97

11.1. ආයතන සංග්‍රහයේ XII පරිච්ඡේදයේ 8 වන වගන්තිය යටතේ විවේක නිවාඩු ලබා ගැනීමට සුදුසුකම් ඇති රජයේ නිලධාරියෙකුට සහ 26 වගන්තිය යටතේ නිවාඩු දෙනු ලබන කණිෂ්ඨ සේවකයෙකුට ඔහු විශ්‍රාම ගන්නා අවස්ථාවේදී ඔහු ඉතිරි කරගෙන ඇති ඕනෑම පෙර වර්ෂ දෙකක ඉතිරි විවේක/අසනීප නිවාඩු විශ්‍රාම පූර්ව නිවාඩු ලෙසට ඔහුට දිය හැකිය.

11.2. මෙම විශ්‍රාම පූර්ව නිවාඩුවට අමතරව, පවත්නා වසර සඳහා ඔහුට හිමි විවේක/අසනීප නිවාඩු ද දිය හැක.

11.3. ආයතන සංග්‍රහයේ XII පරිච්ඡේදයේ 27 වන වගන්තිය යටතේ නිවාඩු දෙනු ලබන දවස් පඩි පිට සිටින රජයේ සේවකයෙකුට ඔහු විශ්‍රාම ගන්නා අවස්ථාවේදී එසේ විශ්‍රාම ගන්නා අවුරුද්ද වෙනුවෙන් සහ ඊට පූර්වාසන්න අවුරුද්ද වෙනුවෙන් ඉහත සඳහන් වගන්ති යටතේ ඉතිරිව ඇති අසනීප නිවාඩු ප්‍රමාණය විශ්‍රාම පූර්ව නිවාඩු වශයෙන් දිය හැකිය. ඔහු විශ්‍රාම ගන්නා අවුරුද්ද තුළ වැඩකර තිබේනම්, එම අවුරුද්ද වෙනුවෙන් ඉතිරිව තිබෙන සියළුම අනියම් නිවාඩුද ඉහත සඳහන් නිවාඩු වලට අතිරේක වශයෙන් ඔහුට දිය හැකිය.

11.4. අකාර්යක්ෂමතාවය නිසා විශ්‍රාම ගන්වනු ලබන නිලධාරියෙකුට විශේෂ හේතූන් උඩ, විශ්‍රාම පූර්ව නිවාඩු දීම යුක්ති සහගත හෝ යෝග්‍ය හෝ වන අවස්ථාවලදී හැර, විශ්‍රාම පූර්ව නිවාඩු ලබා ගැනීමට හිමිකමක් නැත. එවැනි අවස්ථාවකදී ඒ බව සනාථ කිරීමට හේතු දක්වමින්, එම නිවාඩු සඳහා ඉල්ලුම් පත්‍රයක් ලේකම්වරයා වෙත යැවිය යුතුය.

11.5. සිය තනතුරෙන් ඉල්ලා අස්වීමේ ලිය කියවිලි භාරදී නිලධාරියෙකුට එම ලිය කියවිලි භාරදුන් දින සිට විවේක නිවාඩු හෝ අනියම් නිවාඩු හෝ කිසිවක් ලැබීමට හිමිකමක් නැත.

රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක : 19/2010

01. I. විශ්‍රාම ලබන අවස්ථාව වන විට ඉතිරිකරගත් නිවාඩු මත යළි සේවයේ යෙදවීමට දී ඇති අනුග්‍රහය 2010.12.31 දින දක්වා පමණක් බල පැවැත්වේ. 2010.12.31 දින දක්වා විශ්‍රාම ගන්නා නිලධාරීන් ඉහත සඳහන් කර ඇති චක්‍රලේඛ විධිවිධාන අනුව නැවත සේවයේ යෙදවිය හැකිය.

II. එසේ සේවයේ යොදවන කාලය මාස 03 ක උපරිමයකට සීමාවිය යුතුය. එම කාලය තුළදී අදාල අමාත්‍යාංශ ලේකම්/ දෙපාර්තමේන්තු ප්‍රධානීන් විසින් පුරප්පාඩුවන තනතුර සඳහා සුදුසු නිලධාරියකු කල්තියා හඳුනාගෙන පුහුණුකරගත යුතුය.

III. එසේ සේවයේ යොදවනු ලබන කාලපරිච්ඡේදයට 2007.05.11 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 9/2007 හි විධිවිධාන අනුව ගෙවීම් කළ යුතුය.

02. 2011.01.01 දිනෙන් පසුව විශ්‍රාම යන නිලධාරීන් සඳහා විශ්‍රාම පූර්ව නිවාඩු වශයෙන් මාස 03 ක උපරිම කාලයක් දක්වා සිය ප්‍රයෝජනයට නොගත් නිවාඩු ලබා ගැනීමට අවසර දිය යුතුය.

03. ඉහත 02 ඡේදයේ සඳහන් පරිදි විශ්‍රාම පූර්ව නිවාඩු හෝ ආයතන සංග්‍රහයේ XII පරිච්ඡේදයේ 11 වගන්තියේ සඳහන් විශ්‍රාම පූර්ව නිවාඩු හෝ යන විශ්‍රාම පූර්ව නිවාඩු ක්‍රමයන් දෙකෙන් නිලධාරියා මනාපය පලකරන්නාවූ එක් ක්‍රමයක් මත විශ්‍රාම පූර්ව නිවාඩු ලබාදිය යුතුය.

36. විදේශයක සේවය සඳහා පත්කළ නිලධාරියෙකුගේ කලත්‍රයාට වැටුප් රහිත නිවාඩු

36.1.3 මෙම වගන්තිය ප්‍රකාරව දෙනු ලබන නිවාඩු විශ්‍රාම වැටුප් සඳහා ගණන් ගත යුතු නොවේ.

37. විශ්‍රාම ගැන්වීමෙන් අනතුරුව නැවත සේවයේ යොදවන නිලධාරියෙකුගේ නිවාඩු (රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 329)

37.1 විශ්‍රාම ගැනීමෙන් අනතුරුව නැවත සේවයේ යොදවන නිලධාරියෙකුට

37.1.1 සේවා කඩවීමක් නොමැතිව නැවත සේවයේ යොදවන ලද නම්

(1) නැවත සේවයේ යොදවන ලිත් වර්ෂයේදී නැවත සේවයේ යෙදවීමට පෙර සිටි තනතුරේ ඉතිරි නිවාඩු,

(11) ඊට පසු ලිත් වර්ෂ සඳහා, තම තනතුරට අදාල නිවාඩු

ලබාදිය හැකිය.

37.1.2 සේවා කඩවීමක් ඇතිව නැවත සේවයේ යොදවන ලද නම්,

(1) නැවත සේවයේ යොදවන ලද කාලය සඳහා නැවත සේවයේ යොදවන ලද ලිත් වර්ෂයේ තනතුරට අදාල අනුපාතික නිවාඩු

(11) ඊට පසු ලිත් වර්ෂ සඳහා, තනතුරට අදාල නිවාඩු

ලබාදිය හැකිය.

## XIV වැනි පරිච්ඡේදය
## දිවයින ඇතුලත රාජකාරී ගමන්

29:3 විශ්‍රාම යන විට ගමන් වියදම් ගෙවීම :- විනය හේතු මත අනිවාර්යයෙන් විශ්‍රාම ගන්වනු ලැබීම නිසා නොව විශ්‍රාම යායුතු වයස සම්පූර්ණ වීම නිසා හෝ අයහපත් සෞඛ්‍ය තත්ත්වය නිසා හෝ පදවිය අහෝසි කිරීම නිසා හෝ විශ්‍රාම ගන්නා නිලධාරියෙකුට තමාත්, තම පවුලේ අයත්, මෙහෙකරුවනුත්, ගෘහ භාණ්ඩත්, (බයිසිකල් ඇතුළුව) ගමන් බඩුත්, වාහනත් ශ්‍රී ලංකාවේ පිහිටි සිය නිවසට ප්‍රවාහනය කිරීම වෙනුවෙන් මෙම ව්‍යවස්ථා යටතේ ගමන් වියදම් ගෙවීමට පුළුවන. එහෙත් එවැනි අවස්ථාවල දී සංයුක්ත දීමනාව ගෙවනු නොලැබේ.

29:4 සේවයේ යෙදී සිටිය දී මියගිය නිලධාරියෙකුගේ වැන්දඹුව :- සේවයේ යෙදී සිටිය දී මියගිය නිලධාරියකුගේ වැන්දඹුවට ද 29 : 3 වැනි වගන්තිය යටතේ වන අනුග්‍රහය දීමට පුළුවන.

## XVI වැනි පරිච්ඡේදය
## නිවාඩු ගමන්

1:1 රාජ්‍ය සේවයෙහි නැවත සේවයේ යොදවා ඇති විශ්‍රාමිකයෙකුට හා ඔහුගේ පවුලේ සාමාජිකයන්ට අනිකුත් රජයේ නිලධාරීන්ට බලපාන කොන්දේසි හා නියමයන් පරිදිම යාම හා ඊම යන දෙකම සඳහා දෙන බලපත්‍ර තුනක්.

විශ්‍රාමිකයකුට හා ඔහුගේ පවුලේ සාමාජිකයන්ට, යෑමට හා ඊමට දෙන බලපත් දෙකක් (එනම්, කට්ටල දෙකක්) (රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 16/90)

1:1:4 යම් මුදල් වර්ෂයක් තුළ දී විශ්‍රාම ගන්නා නිලධාරියෙකුට ලබා ගත හැකි නිවාඩු බලපත්‍ර කට්ටල ගණන ඔහු නියත වශයෙන් විශ්‍රාම ගන්නා දිනය වන විට එකී මුදල් වර්ෂය තුළ සේවය කර ඇති මාස ගණනට අනුපාත විය යුතුය. මේ අනුව, බලපත්‍ර කට්ටල තුනකට හිමිකම් ඇති නිලධාරියෙකු යම් මුදල් වර්ෂයක පස්වන මාසයට ප්‍රථම විශ්‍රාම ගන්නේ නම් ඔහුට නිකුත් කළ යුත්තේ බලපත්‍ර එක් කට්ටලයක් පමණි. ඔහු නම වෙනි මාසයට ප්‍රථම විශ්‍රාම ගන්නේ නම් ඔහුට නිකුත් කළ යුත්තේ බලපත්‍ර කට්ටල දෙකක් පමණි.

1:3:2 අවිවාහක හෝ වැන්දඹු හෝ නිලධාරියෙකු සම්බන්ධයෙන් නම් ඔහුගෙන් සැබැවින්ම යැපෙන පියා/මව/හා/ හෝ සහෝදරයා/සහෝදරිය සඳහා ද ඔහුට ඉහත 1 : 1 වගන්තිය යටතේ හිමි බලපත්‍ර ප්‍රමාණයම හිමි වේ. යැපෙන්නන් සඳහා දෙන මුළු බලපත්‍ර ගණන පහත සඳහන් සීමාවන්ට යටත් වේ.

| | |
|---|---|
| රු.7,410 හෝ ඊට වැඩි වැටුපක් ලබන නිලධාරියා | කට්ටල තුනක් හෝ යාමට හෝ ඊමට පමණක් දෙන බලපත්‍ර හයක් |
| රු. 7,410 ට අඩු වැටුපක් ලබන නිලධාරියා | එක කට්ටලයක් හෝ යාමට හෝ ඊමට පමණක් දෙන බලපත්‍ර දෙකක් |

(රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 6/2006 මගින් ඉහත සඳහන් වැටුප සංශෝධනය වී ඇත)

## XVII වැනි පරිච්ඡේදය

## අනුග්‍රහ වාර ප්‍රවේශ පත්‍ර

2. වාර ප්‍රවේශ පත්‍ර ආපසු භාරදීම හා පාවිච්චි නොකරන කාල පරිච්ඡේදය

2: 1 නිලධාරියෙකු එක් කාර්ය ස්ථානයකින් වෙනත් කාර්ය ස්ථානයකට මාරු කරනු ලැබූ විට හෝ විශ්‍රාම ගන්නා විට හෝ විශ්‍රාම පූර්ව නිවාඩුපිට යන විට හෝ (ඔහුගේ වැඩ තහනම් කරනු ලැබීම, දෙමසකට වැඩි කාලයකට නිවාඩු ලබා ගැනීම යන මේ ආදී) දීර්ඝ කාල පරිච්ඡේදයක් තුළ සේවයට නොපැමිණ සිටීමට සිදුවන සෙසු ප්‍රස්තාවක දී හෝ අනුග්‍රහ වාර ප්‍රවේශ පත්‍ර දෙපාර්තමේන්තු ප්‍රධානියාට ආපසු බාර දිය යුතුය. එසේ ආපසු බාර දෙන ප්‍රවේශ පත්‍රය පාවිච්චි නොකෙරෙන කාලයට අයවිය යුතු මුදල ආපසු ගෙවන ලෙස ඉල්ලා දෙපාර්තමේන්තු ප්‍රධානියා, එම ප්‍රවේශ පත්‍රය දුම්රිය සාමාන්‍යාධිකාරී වෙත හරවා යැවිය යුතුය.

## XIX වැනි පරිච්ඡේදය

## රජයේ නිවාස

6:11 වෛද්‍ය හේතුමත විශ්‍රාම ගන්වන ලද නිලධාරියෙකුට 6:10 වැනි උප වගන්තිය යටතේ නිවාසයක පදිංචි වී සිටීමට අවසර දිය හැකි අවසාන දිනය ඉක්මවා විශ්‍රාම පූර්ව නිවාඩු හිමිවන් කල්හි, සිය විශ්‍රාම පූර්ව නිවාඩුව අවසන් වන තෙක් එම නිවාසයේ පදිංචි වී සිටිය හැකිය.

## XXIV වැනි පරිච්ඡේදය

## වැටුප් ණය

3:17:7 ප්‍රධාන ණයකරු වෙනත් පිළිගත හැකි ඇපකරුවෙකු ඉදිරිපත් කරන තුරු, ඇපකරු වී සිටින කිසිම නිලධාරියෙකුට සිය කැමැත්තෙන්ම ඉල්ලා අස්වීමට හෝ විශ්‍රාම ගැනීමට හෝ අවසර දීමද ඔහු සේවයෙන් මුදා හැරීම ද, ඇපකරු වශයෙන් ඇති බැඳීමෙන් ඔහු නිදහස් කිරීම ද නොකළ යුතුය.

4: ණය මුදලක් ආපසු ගෙවා අවසන් වීමට පෙර විශ්‍රාම ගන්නා වූ හෝ මිය යන්නාවූ හෝ සේවය අවසන් වන්නා වූ හෝ නිලධාරියෙකු සහ රාජ්‍ය සංස්ථාවක සේවයට මුදාහරිනු ලබන නිලධාරියෙකු

4.1 යම් නිලධාරියෙකුගේ සේවය අවසන් වෙතැයි සිතන අවස්ථාවලදීත්, විශ්‍රාම ගැනීම නිසා හෝ අන්කිසි හේතුවක් නිසා හෝ ඔහුගේ සේවය අවසන් වීමට නියමව ඇති අවස්ථා වලදීත්, ණය මුදල ආපසු ගෙවා අවසන් කිරීමට නිලධාරියාට ඉඩ සලසනු වස් නියමිත වාරික ගණනට වඩා අඩු වාරික ගණනකින් සම්පූර්ණ ණය මුදල ආපසු අයකර ගත හැකිය. එතකුදු වුවත් අඩු කිරීම් සම්බන්ධයෙන් 3.5 වැනි උප වගන්තියේ නියම කර ඇති සීමාවන් නොඉක්මවිය යුතුය.

4.1.1 4.2 වැනි උපවගන්තියේ ව්‍යතිරේකයට යටත්ව, නිලධාරියෙකුගේ සේවය අවසන් වීමට පෙර මුළු ණය මුදලම ආපසු අයකර ගැනීමට නොහැකි නම් ණය මුදලක් නොදෙනු ලැබේ.

4.2 4.2.1 සිට 4.2.6 දක්වා ඇති උප වගන්ති වලට යටත්ව, විශ්‍රාම ගැනීමට නියමිත නිලධාරියෙකුට ඔහු විශ්‍රාම ගැනීමට පෙර ආපසු අයකර ගැනීම නිම කළ නොහැකි වුවද, තම රාජකාරී කටයුතු ඉටුකිරීම සඳහා මෝටර් වාහනයක් මිලදී ගැනීමට 7 වැනි හෝ 8 වැනි වගන්තිය යටතේ හෝ, ආපදාවක් මගහරවා ගැනීම සඳහා 10 වැනි වගන්තිය යටතේ හෝ නිවාසයක් තැනීමට ඉඩමක් හෝ නිවාස දේපලක් හෝ මිලට ගැනීම සඳහා 11 වැනි වගන්තිය යටතේ හෝ 13 වැනි වගන්තිය යටතේ හෝ ණය මුදලක් දීමට පුළුවන.

## XXVI වැනි පරිච්ඡේදය

## නිලධාරීන්ගේ කායික යෝග්‍යතාවය පිළිබඳ වෛද්‍ය පරීක්ෂණය සහ වෛද්‍ය උපචාරය

3:10 නිලධාරියෙකු විශ්‍රාම ගතහොත් හෝ සේවයෙන් පහකරනු ලැබුවහොත් හෝ මිය ගියහොත් හෝ එම නිලධාරියාගෙන් ආරෝග්‍යශාලා ගාස්තු වශයෙන් ලැබිය යුතු මුදලක් වේ නම් එය, ඔහුට ගෙවිය යුතුව ඇති අන්තිම වැටුපෙන් හෝ විශ්‍රාම වැටුපෙන් හෝ පාරිතෝෂිකයෙන් හෝ අර්ථසාධක අරමුදලින් හෝ ඔහුට ලැබිය යුතු වෙනත් කිසියම් මුදලකින් හෝ අඩුකර ගැනීමට වහාම පියවර ගත යුතුය. අඩුකර ගතයුතු මුදල නිලධාරියාට ලැබීමට ඇති මුදලට වැඩිවන අවස්ථාවන්හිදී ඒ සම්බන්ධයෙන් භාණ්ඩාගාරයේ ( මුදල් අංශයේ ) උපදෙස් ලබා ගත යුතුය.

2.11 රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් සලසනු ලැබූ විධිවිධාන

රාජ්‍ය නිලධාරීන් පත් කිරීම, උසස් කිරීම හා ස්ථාන මාරු කිරීම පිළිබඳව සහ ඒ හා සම්බන්ධ ඊට ආනුෂාංගික වන කරුණු පිළිබඳව විධිවිධාන සැලසීම සඳහා වන කාර්යය පටිපාටි රීති රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් සකස් කොට අති විශේෂ ගැසට් පත්‍රයක් විසින් 2009. 02. 20 දින නිකුත් කර ඇත. මෙය ආයතන සංග්‍රහය වෙනුවට පනවන ලද කාර්යය පටිපාටින් වේ.

එහි වැදගත් රෙගුලාසි පහත දැක්වේ.

## III වැනි පරිච්ඡේදය

### පත් කිරීම

22. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 55(1) ව්‍යවස්ථාව ප්‍රකාරව රජයේ සේවයට නිලධරයන් පත් කිරීමේ බලය කොමිෂන් සභාව වෙත පැවරී ඇත්තේ ය. 55(2), 55(3) සහ 61 ඊ ව්‍යවස්ථාවන්ට යටත්ව, අවස්ථෝචිත පරිදි කොමිෂන් සභාව විසින් යම් කමිටුවක් හෝ නිලධරයෙකු හෝ වෙත එකී බලය අභිනියෝජනය කළ හැකි වන්නේ ය.

23. කොමිෂන් සභාව විසින් කරනු ලබන පත් කිරීම් පහත සඳහන් පරිදි වන්නේ ය. එහි අංක V හා VI යටතේ දැක්වෙන පත් කිරීම් හැර සෙසු පත් කිරීම් කොමිෂන් සභාව විසින් අභිනියෝජනය කරන ලද බලය ක්‍රියාත්මක කරනු ලබන බලධරයෙකු විසින් ද කළ හැකි වන්නේ ය.

(i) අනියම්, ආදේශක, කොන්ත්‍රාත්, රාජකාරි ඉටු කරනං වැඩ බලන හා ස්ථිර තනතුරකට පත් කිරීම;

(ii) රජයේ නිලධරයෙකුගේ පවත්නා සේවා තත්ත්වය වෙනස් කිරීම ;

(iii) රජයේ සේවයේ තනතුරක් දරන නිලධරයෙකු රජයේ සේවයේ වෙනත් යම් තනතුරකට පත් කිරීම;

(iv) තනතුර අතහැර ගියා සේ සැලකූ තැනැත්තෙකු නැවත සේවයේ පිහිටුවීම ;

(v) රජයේ සේවයෙන් විශ්‍රාම ලත් රජයේ නිලධරයෙකු හෝ විධිමත්ව ඉල්ලා අස් වූ රජයේ නිලධරයෙකු හෝ නැවත සේවයට බඳවා ගැනීම හෝ නැවත සේවයේ පිහිටුවීම ;

(vi) සේවයෙන් පහ කරනු ලැබුවා වූ තැනැත්තෙකු නැවත සේවයේ පිහිටුවීම ;

(vii) රජයේ සේවයේ කිසියම් සේවාවක ශ්‍රේණිගත උසස් කිරීම් හැර රජයේ සේවයේ පහළ තත්වයේ තනතුරකින් ඉහළ තත්ත්වයේ තනතුරකට රජයේ නිලධරයෙකු පත් කිරීම ;

## V වැනි පරිච්ඡේදය

### රජයේ සේවයට පත් කරනු ලැබීමට නුසුදුසු තැනැත්තන්

39. රජයේ සේවයෙහි හෝ රජයේ සංස්ථාවක සේවයෙහි හෝ නියැලී සිට අකාර්යක්ෂමතාව මත අනිවාර්යයෙන් විශ්‍රාම ගන්වා ඇත්තා වූ හෝ, සේවයෙන් පහ කිරීම වෙනුවට සානුකම්පික විකල්පයක් වශයෙන් විශ්‍රාම ගන්වා ඇත්තා වූ හෝ දඬුවමක් වශයෙන් විශ්‍රාම ගන්වා ඇත්තා වූ හෝ විධිමත් විනය පරීක්ෂණයක ප්‍රතිඵල මත සේවයෙන් පහ කර ඇත්තා වූ හෝ, සිය තනතුර අතහැර ගියා වූ හෝ තැනැත්තෙක් රජයේ සේවයට පත් කරනු ලැබීමට නුසුදුස්සෙක් වන්නේය.

## VI වැනි පරිච්ඡේදය

### පත් කිරීම් කෙරෙහි බලපාන නියමයන් හා කොන්දේසි

46. ස්ථිර හා විශ්‍රාම වැටුප් හිමි තනතුරකට පත්වීමක් ලබන සෑම තැනැත්තෙක් ම අදාළ පරිදි වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට හෝ වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට හෝ දායක විය යුතු වන්නේ ය. ගෙවිය යුතු දායක මුදල රජය විසින් විටින් විට ප්‍රකාශයට පත් කරනු ලබන ආකාරයට විය යුත්තේ ය.

47. ස්ථිර එහෙත් විශ්‍රාම වැටුප් අහිමි තනතුරක් දරන තැනැත්තෙක් රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදලට දායක විය යුතු වන්නේ ය. ගෙවිය යුතු දායක මුදල රජය විසින් විටින් විට ප්‍රකාශයට පත්කරනු ලබන ආකාරයට විය යුත්තේ ය.

## VII වැනි පරිච්ඡේදය

### පත් කිරීමෙන් පසු අනුගමනය කළ යුතු කාර්ය පටිපාටිය

88. රජයේ සේවයේ පත්වීමක් ලද තැනැත්තෙක්, සේවයට වාර්තා කිරීමෙන් අනතුරුව ඉහත 87 වන වගන්තියෙහි විස්තර කළ ලියවිලි ද, මෙම වගන්තියෙහි පහතින් සඳහන් කරනු ලබන ලියවිලි ද ඇතුළත් කොට නිලධරයා වෙනුවෙන් පෞද්ගලික ලිපිගොනුවක් ආරම්භ කොට යාවත්කාලීනව පවත්වාගෙන යාමට අදාළ පරිදි පත් කිරීම් බලධරයා හෝ පරිපාලන බලධරයා හෝ දෙපාර්තමේන්තු ප්‍රධානී හෝ ආයතන ප්‍රධානී හෝ ක්‍රියා කළ යුතු වන්නේ ය.

(i) පත්වීම් ලිපියේ පිටපතක් ;

(ii) චර්යා සටහන් පත්‍රය ;

(iii) අදාළ වන පරිදි වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප හෝ වැන්දඹු පුරුෂ අනත්දරු විශ්‍රාම වැටුප හෝ පිළිබඳ ප්‍රකාශයේ පිටපත හෝ රාජ්‍ය සේවා අර්ථ සාධක අරමුදලේ දායකත්වය පිළිබඳ ප්‍රකාශයේ පිටපත ;

(iv) පත්වීමේ ස්වභාවය අනුව ඇපයක් තැබීමට නියම කර ඇත්නම් එසේ නියම කර ඇති ආකාරයට ඇප තැන්පතුවක් තබා ඇති බවට නිකුත් කළ සහතිකයේ සහතික කළ ඡායා පිටපත ;

(v) සෞඛ්‍ය 169 ආකෘති පත්‍රය ප්‍රකාරව නිකුත් කළ වෛද්‍ය පරීක්ෂණ වාර්තාව.

## X වැනි පරිච්ඡේදය

### කාර්යක්ෂමතා කඩඉම්

127. ඉහත 125 වැනි වගන්තියෙහි සඳහන් පරිදි වැටුප් වර්ධකය විලම්බනය කිරීමට භාජනය වූ රජයේ නිලධරයෙකු එසේ වැටුප් වර්ධකය විලම්බනය කරන ලද දින සිට වසර තුනක කාලයක් තුළ අදාළ කාර්යක්ෂමතා කඩඉම ඉක්මවා යාමට අවශ්‍ය සුදුසුකම් සපුරාලීමට අසමත් වන්නේ නම්, එම වසර තුන සම්පූර්ණ වූ දිනයේ සිට ඔහුගේ පත්වීම අකාර්යක්ෂමතාව මත අවසන් වන්නේය.

එතකුදු වුවත් එම දිනය වන විට රජයේ නිලධරයාගේ පත්වීම ස්ථිර කර ඇත්නම් හා ඔහු විසින් විශ්‍රාම වැටුප් හිමිකම් සපුරා ඇත්නම් හා එම රජයේ නිලධරයා අකාර්යක්ෂමතාව මත එම දිනයේ සිට විශ්‍රාම ගැන්විය යුතු වන්නේය. එවැනි අවස්ථාවක දී ඔහු විශ්‍රාම වැටුප ලබා ගැනීමට හිමිකම් ලබනුයේ වෛකල්පික විශ්‍රාම ගැන්වීමේ වයසට එළඹෙන දිනයේ සිට හා විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා සංග්‍රහයේ විධිවිධානවලට අනුකූලව වන්නේය.

## XII වැනි පරිච්ඡේදය

### රජයේ නිලධරයෙකු රජයේ සේවයෙන් තාවකාලිකව හෝ ස්ථිරව හෝ මුදා හැරීම

148. රජයේ නිලධරයෙකු රජයේ සේවයෙන් පරිබාහිර තනතුරකට තාවකාලිකව මුදා හරින ලද්දේ රජයේ අවශ්‍යතාව හේතු කොට ගෙන නම්, ඔහුට විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා සංග්‍රහයේ 10(1) වන වගන්තිය යටතේ ප්‍රකාශිත ප්‍රතිලාභ හිමි වන්නේ ය. එතකුදු වුවත් ඔහු එම කාල සීමාව තුළ වැටුප් රහිත නිවාඩු ලබා ඇති සේ සලකා ක්‍රියා කළ යුතු වන්නේය.

149. රජයේ නිලධරයෙකු රජයේ සේවයෙන් පරිබාහිර තනතුරකට තාවකාලිකව මුදා හරිනුයේ එම රජයේ නිලධරයාගේ ඉල්ලීමක් පරිදි වන්නේ නම්, ඔහුට වැටුප් රහිත නිවාඩු අනුමත කළ යුතු අතර, විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා සංග්‍රහයේ 10(1) වන වගන්තිය යටතේ ප්‍රකාශිත ප්‍රතිලාභ ඔහුට හිමි නොවන්නේ ය.

150. රජයේ සේවයෙන් පරිබාහිර තනතුරකට මුදා හරිනු ලබන රජයේ නිලධරයෙකුගේ විශ්‍රාම වැටුප් අයිතිවාසිකම් ආරක්ෂා කිරීම අරභයා අවශ්‍ය පියවර ගැනීමට හැකි වනු පිණිස, එම රජයේ නිලධරයා රජයේ සේවයෙන් මුදා හැරීම සහ කලින් දැරූ තනතුරට ආපසු යැවීම සඳහා වන ලිපි වල පිටපත් ඔහු මුදා හරින අවස්ථාවේදීම හා ඔහු කලින් දැරූ තනතුරට ආපසු යවන අවස්ථාවේදීම රාජ්‍ය පරිපාලන විෂය බාර අමාත්‍යාංශයේ ලේකම් වෙත හා විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ ජනරාල් වෙත යැවීමට පත් කිරීම් බලධරයා ක්‍රියා කළ යුතු වන්නේ ය.

151. විශ්ව විද්‍යාලයයකට හෝ රාජ්‍ය සංස්ථාවකට හෝ රජයට අයත් සමාගමකට හෝ රජයට 50% ට වැඩි කොටස් ප්‍රමාණයක් හිමි හා පාලන බලය හිමි සමාගමකට හෝ රජයේ ව්‍යාපෘතියකට හෝ රජයේ නිලධරයෙකු තාවකාලිකව මුදා හැර ඇති විටක, එම රජයේ නිලධරයාගේ ඒකාබද්ධ වැටුපෙන් 25%කට සමාන මුදලක් විශ්‍රාම වැටුප් දායක මුදල වශයෙන් ද, අදාළ පරිදි වැන්දඹු හා අනත්දරු හෝ වැන්දඹු පුරුෂ හා අනත්දරු හෝ අරමුදලේ දායක මුදල් ද විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ ජනරාල් වෙත ප්‍රේෂණය කිරීම අදාළ ආයතනයේ වගකීමක් වන අතර, එය එපරිදි ඉටු වන බවට වග බලා ගැනීම පත් කිරීම් බලධරයාගේ ද, එම රජයේ නිලධරයාගේ ද වගකීම වන්නේ ය.

## XIII වැනි පරිච්ඡේදය

## රජයේ සේවයෙන් විශ්‍රාම ලත් තැනැත්තෙක් නැවත රජයේ සේවයෙහි යෙදවීම

154. රජයේ සේවයෙන් විශ්‍රාම ලත් තැනැත්තෙක්, නැවත රජයේ සේවයෙහි යෙදවීමේ බලය රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත පමණක් පැවරෙන්නේ ය.

155. පහත සඳහන් තැනැත්තන් නැවත රජයේ සේවයෙහි යෙදවීමට සුදුසුකම් නොලබන්නේය.

(i) සේවයෙන් පහ කිරීමට විකල්පයක් වශයෙන් අනිවාර්ය විශ්‍රාම ගන්වන ලද තැනැත්තෙකු;
(ii) විනයානුකූල දඬුවමක් මත විශ්‍රාම ගන්වන ලද තැනැත්තෙකු ;
(iii) සාමාන්‍ය අකාර්යක්ෂමතාව මත විශ්‍රාම ගන්වන ලද තැනැත්තෙකු ;
(iv) සේවා දිගු ලබා දීම ප්‍රතික්ෂේප කිරීම මත විශ්‍රාම ගන්වන ලද තැනැත්තෙකු ;
(v) රජයේ ප්‍රතිපත්තිමය තීරණයක් අනුව විශ්‍රාම යෑමට සිය කැමැත්තෙන් එකඟ වීම මත විශ්‍රාම ගන්වන ලද තැනැත්තෙකු;
(vi) විශ්‍රාම ගැන්වීමට ආසන්නතම පූර්ව වර්ෂ 03 තුළ කොමිෂන් සභා කාර්ය පටිපාටික රීති II කාණ්ඩයේ හෝ ආයතන සංග්‍රහයේ II කොටසේ හෝ දැක්වෙන පළමු වන උපලේඛනය යටතේ වන වරදකට වරදකරු කරනු ලැබූ තැනැත්තෙකු ;
(vii) විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා සංග්‍රහයේ 12 වගන්තියට යටත් කොට විශ්‍රාම ගන්වා ඇති තැනැත්තෙකු;
(viii) විනයානුකූල කටයුතුවලට භාජනය වී සිටින තැනැත්තෙකු ;

156. අනිවාර්ය විශ්‍රාම ගැන්වීමේ වයසට එළඹීමට පෙර රජයේ සේවයෙන් විශ්‍රාම ලබා ඇති තැනැත්තෙත්, සුවිශේෂ අවස්ථාවල දී හැර නැවත රජයේ සේවයෙහි පිහිටුවීම නොකළ යුතු වන්නේය. එවැනි තැනැත්තෙත්, නැවත රජයේ සේවයෙහි පිහිටුවනු ලබන්නේ නම් එසේ කළ යුත්තේ, ඔහු

අනිවාර්ය විශ්‍රාම ගැන්වීමේ වයසට එළඹෙන තෙක් ඔහුගේ විශ්‍රාම වැටුප අවුරා තැබීමේ පදනම මත වන්නේ ය.

157. රජයේ සේවයෙන් විශ්‍රාම ලත් තැනැත්තෙක්, නැවත සේවයෙහි යෙදවිය හැක්කේ තොන්ත්‍රාත් පදනම මත පමණක් වන්නේ ය. එවැනි පත් කිරීමක් එක් අවස්ථාවක දී එක් අවුරුද්දක කාල පරිච්ඡේදයකට සීමා කළ යුතු ය. එවැනි අවස්ථාවක දී අදාළ පත් කිරීම් ලිපිය අංක 02 පරිශිෂ්ටය ප්‍රකාරව නිකුත් කළ යුතු වන්නේ ය.

158. වෛද්‍ය හේතු මත රජයේ සේවයෙන් විශ්‍රාම ගැන්වූ තැනැත්තෙක්, නැවත රජයේ සේවයෙහි යෙදවිය හැක්කේ පහත සඳහන් සියලුම අවශ්‍යතා සපුරා ඇත්නම් පමණක් වන්නේ ය.

(i) නැවත සේවයෙහි පිහිටුවන දිනය වන විට ඔහු විශ්‍රාම ගැන්වීමේ වෛකල්පික වයස නොඉක්මවා තිබීම ;
(ii) අදාළ තනතුරෙහි රාජකාරි කටයුතු සතුටුදායක ලෙස ඉටු කිරීමට තරම් ඔහුගේ ශාරීරික හා මානසික සෞඛ්‍ය තත්ත්වය යෝග්‍ය බවට විධිමත්ව ස්ථාපිත රජයේ වෛද්‍ය මණ්ඩලයක් විසින් සහතික කර තිබීම ;
(iii) විශ්‍රාම ගැන්වූ දිනයේ සිට යටත් පිරිසෙයින් එක් වසරක්වත් ගත වී තිබීම ;
(iv) විශ්‍රාම ගැන්වූ දිනට ආසන්නතම පූර්ව වර්ෂ තුනක කාල පරිච්ඡේදය තුළ දී ඔහු කොමිෂන් සභා කාර්ය පටිපාටික රීතීන්හි II වන කාණ්ඩයෙහි හෝ ආයතන සංග්‍රහයෙහි II වන කාණ්ඩයෙහි හෝ දැක්වෙන පළමුවන උපලේඛනයේ සඳහන් වරදකට දඬුවම් ලබා නොතිබීම.

159. වෛද්‍ය හේතු මත විශ්‍රාම ගැන් වූ තැනැත්තෙක්, නැවත සේවයෙහි යොදවන විට ඔහුගේ විශ්‍රාම වැටුප අවුරා තැබිය යුතු අතර, විශ්‍රාම ගන්වන අවස්ථාවේ දී ඔහුට හිමිව තිබූ වැටුප් පියවරෙහි හෝ වැටුප් සංශෝධනයක් සිදුව ඇත්නම් අදාළ අනුරූපී වැටුප් පියවරෙහි හෝ ඔහු පිහිටුවිය යුතු වන්නේය.

## XIV වැනි පරිච්ඡේදය

### පත්වීම අවසන් කිරීම හා රජයේ සේවයෙන් ඉල්ලා අස්වීම

164. ඉහත 162 වන වගන්තියෙහි දැක්වෙන කිසිදු කරුණක් හේතු කොට ගෙන ඉල්ලා අස්වීම පිළිගැනීමට බාධාවක් ඇති නොවන බව දෙපාර්තමේන්තු ප්‍රධානට තහවුරු වන්නේ නම්, ඉල්ලා අස්වීම හේතු කොට ගෙන එම රජයේ නිලධරයාට විශ්‍රාම වැටුපතට හෝ පාරිතෝෂිතයතට හෝ ඇති අයිතිවාසිකම් සියල්ල ද, පසු කලකදී යළිත් රජයේ සේවයේ පත්වීමක් ඔහු ලබාගතහොත් ඉල්ලා අස්වීමට පෙර තරන ලද සේවයට හිමි අනෙක් ප්‍රතිලාභ සියල්ල ද ඔහුට අහිමි වන බව හා ඉල්ලා අස්වීම පිළිගතහොත් එය නැවත ඉවත් තර ගැනීමට අවස්ථාවක් නොලැබෙන බව ද ඔහුට ලිඛිතව දැන්විය යුතු වන්නේ ය. එම ලිපිය හැකි සෑම විටකම නිලධරයාට පෞද්ගලිකව ම භාරදීමට හෝ එසේ තළ නොහැකි අවස්ථාවක දී ලියාපදිංචි තැපෑලෙන් යැවීමට හෝ ක්‍රියා කළ යුතු වන්නේ ය.

## XVI වැනි පරිච්ඡේදය

### සේවය දීර්ඝ කිරීම හා විශ්‍රාම ගැන්වීම

175. රජයේ නිලධරයෙක්, විශ්‍රාම ගැන්වීම රජයේ හා අධිකරණ නිලධරයන්ගේ (විශ්‍රාම ගැන්වීමේ) ආඥාපනත ද, ඒ යටතේ පනවන ලද ව්‍යවස්ථා ද, විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා සංග්‍රහය ද හා අමාත්‍ය මණ්ඩලය විසින් ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණ ද යටතේ පාලනය වන්නේ ය.

176. විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා සංග්‍රහයේ 14 වන වගන්තියෙහි සඳහන් විශේෂ සේවක කාණ්ඩවලට ඇතුළත් නොවන, රජයේ සේවයේ වර්ෂ 20ක සේවා කාලයක් සම්පූර්ණ කර ඇති නිලධරයෙකුට ස්වකීය අභිමතය පරිදි සේවයෙන් විශ්‍රාම ගත හැකි වන්නේ ය. එසේ වුවත් ඔහුට විශ්‍රාම වැටුප් හිමි වන්නේ වයස අවුරුදු 55 සම්පූර්ණ වන දිනයේ සිට පමණක් වන්නේය.

177. රජයේ හා අධිකරණ නිලධරයන්ගේ (විශ්‍රාම ගැන්වීමේ) ආඥාපනතේ විධිවිධානවලට යටත්ව රජයේ නිලධරයෙකුගේ වෛකල්පික විශ්‍රාම ගැන්වීමේ වයස අවුරුදු 55 ක් වන අතර අනිවාර්ය විශ්‍රාම ගැන්වීමේ වයස අවුරුදු 60 ක් වන්නේය.

178. වාර්ෂිකව සේවා දීර්ඝ කිරීමකින් තොරව වයස අවුරුදු 57 දක්වා සේවයේ යෙදී සිටීමට නිලධරයකුට හැකියාව ඇත්තේය. එසේ වුවත් වයස අවුරුදු 55 සම්පූර්ණ වූ විට දී හෝ ඉන්පසු අවස්ථාවක දී හෝ අනිවාර්ය විශ්‍රාම ගැන්වීමේ වයසට එළඹීම නිසා හෝ රජයේ නිලධරයෙකු රජයේ සේවයෙන් විශ්‍රාම ගැනීමට අදහස් කරනනේ නම්, තමා විශ්‍රාම ගැනීමට අපේක්ෂිත දිනට අවම වශයෙන් මාස හයකට පෙර ලැබෙන සේ එම ඉල්ලීම තම පත් කිරීම් බලධරයා වෙත විධිමත්ව හා ලිඛිතව ඉදිරිපත් කිරීමට එම නිලධරයා ක්‍රියා කළ යුතු වන්නේ ය.

එසේ වුවත්,

(i) නිලධරයාට එරෙහිව විනයානුකූල කටයුතු සිදු කෙරෙමින් පවතින විටක දී හෝ විනයානුකූල කටයුතු කිරීමට අදහස් කර ඇති විටක දී හෝ නිලධරයා විශ්‍රාම ගැන්විය යුත්තේ විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා සංග්‍රහයේ 12 වගන්තියට යටත් කොට වන්නේ ය. රජයේ නිලධරයන් විශ්‍රාම ගැන්වීම සඳහා ඉල්ලීම් කරන අවස්ථාවන්හි දී මෙම කරුණු පත් කිරීම් 'බලධරයාගේ අවධානයට යොමු කිරීම දෙපාර්තමේන්තු ප්‍රධානගේ හා/ හෝ ආයතන ප්‍රධානගේ වගකීම වන්නේය.

(ii) පත් කිරීම් බලධරයා විසින් රජයේ නිලධරයෙකුගේ විශ්‍රාම ගැන්වීම අනුමත කිරීමෙන් අනතුරුව, විනයානුකූලව ක්‍රියා කළ යුතු වන වරදක් නිලධරයා විසින් සිදු කර ඇති විටක, එම කරුණු විශ්‍රාම ගැන්වීම බලාත්මක වීමට පෙර පත් කිරීම් බලධරයාගේ අවධානයට යොමු කළ හොත්, එවිට සාමාන්‍ය විශ්‍රාම ගැන්වීම විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා සංග්‍රහයේ 12 වන වගන්තියට යටත් විශ්‍රාම ගැන්වීමක් ලෙසට පරිවර්තනය කිරීමට හා එම නියෝගයේ පිටපතක් නිලධරයා වෙත ලබා දීමට හෝ ලැබීමට සැලැස්වීමට හෝ පත් කිරීම් බලධරයා ක්‍රියා කළ යුතු වන්නේ ය.

(iii) නිලධරයාට එරෙහිව පවත්නා විනයානුකූල පියවර නොමැති වීම හා විනයානුකූල කටයුතු කිරීමට අදහසක් නොමැති වීම යන කරුණු මත, පත් කිරීම් බලධරයා විසින් රජයේ නිලධරයෙකු සාමාන්‍ය පරිදි විශ්‍රාම ගැන්වීම අනුමත කර ඇති විටක, එවැනි විනයානුකූල පියවර නිලධරයාට එරෙහිව ගනිමින් පවතින බව හෝ ගැනීමට අදහස් කර ඇති බව හෝ එම සාමාන්‍ය පරිදි විශ්‍රාම ගැන්වීම අනුමත කළ දිනට පසුව හා විශ්‍රාම ගැන්වීම බලාත්මක වන දිනට පෙරාතුව පත් කිරීම් බලධරයාගේ අවධානයට යොමු කළ හොත් එම සාමාන්‍ය විශ්‍රාම ගැන්වීම විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා සංග්‍රහයේ 12 වන වගන්තියට යටත් විශ්‍රාම ගැන්වීමකට පරිවර්තනය කිරීමට හා එම නියෝගයේ පිටපතක් නිලධරයා වෙත ලබා දීමට හෝ ලැබීමට සැලැස්වීමට හෝ පත් කිරීම් බලධරයා ක්‍රියා කළ යුතු වන්නේ ය.

179. පූර්ව වසර 03 හි කාලය තුළ රාජකාරි ඉටු කිරීම, හැසිරීම හා පැමිණීම යහපත්ව පැවැතියා වූ ද, තමන් දරමින් සිටින තනතුරට අදාළ රාජකාරි තවදුරටත් ඉටු කිරීමට තරම් යහපත් කායික හා

මානසික සෞඛ්‍ය තත්ත්වයකින් යුක්ත වන්නා වූ ද රජයේ නිලධරයෙකුගේ සේවය පහත සඳහන් විධිවිධාන වලට යටත්ව, වයස අවුරුදු 57 සිට 60 දක්වා දීර්ඝ කිරීමේ බලය පත් කිරීමේ බලධරයා සතු වන්නේ ය.

(i) වයස අවුරුදු 57 න් පසු සේවය කිරීමට අදහස් කරන නිලධරයෙක්, තම සේවය දීර්ඝ කිරීම සඳහා වූ අයදුම් පත්‍රය අංක 13 පරිශිෂ්ටය ප්‍රකාරව දෙපාර්තමේන්තු ප්‍රධාන මගින් හෝ ආයතන ප්‍රධාන මගින් හෝ පත්කිරීම් බලධරයා වෙත වාර්ෂිකව ඉදිරිපත් කළ යුතු වන්නේ ය. එසේ ම සේවා දිගුව ආරම්භ වන දිනට මාස 06 කට පෙර, පළමු අයදුම් පත්‍රය ද ඊළඟ අයදුම් පත්‍ර, ඊළඟ සේවා දිගු ආරම්භ වන දිනට මාස 03 කට පෙරද ලැබෙන සේ ඉදිරිපත් කිරීම ද අවශ්‍ය වන්නේය.

(ii) වයස අවුරුදු 57 න් ඔබ්බට සේවා දිගුවක් ලබා ගැනීම සඳහා රජයේ නිලධරයෙක්, වෙතින් විධිමත් ඉල්ලීම පත් කිරීම් බලධරයා වෙත ලද පසු අදාළ නිලධරයා වෙත එම සේවා දිගුව ලබා දීමට පත් කිරීම් බලධරයා තීරණය කරන්නේ නම්, ඒ බැව් නිලධරයා වෙත වහාම විධිමත් ව දැන්වීමට පත්කිරීම් බලධරයා ක්‍රියා කළ යුතු වන්නේය. සෑම විටකම සේවා දිගුවක් ලබා දීම එක් වර්ෂයක කාල පරිච්ඡේදයක් සඳහා පමණක් විය යුතු වන්නේ ය.

(iii) වයස අවුරුදු 57 න් ඔබ්බට සේවා දිගුවක් ලබා ගැනීම සඳහා කරන ලද රජයේ නිලධරයෙකුගේ විධිමත් ඉල්ලීමක් ප්‍රතික්ෂේප කරනු ලබන අවස්ථාවක දී, තම තීරණයට තුඩු දුන් හේතු ඉතා සවිස්තරවත්, නිවැරදිවත් හා පැහැදිලිවත් අදාළ ගොනුවෙහි සටහන් කර තැබීමට පත් කිරීම් බලධරයා ක්‍රියා කළ යුතු අතර හේතු පිළිබඳව අදාල නිලධරයා වෙත විධිමත්ව දැන්වීමටද පත් කිරීම් බලධරයා ක්‍රියා කළ යුතු වන්නේ ය. තවද නිලධරයාට අවශ්‍ය වන්නේ නම් තම සේවා කාලය අවසන් වීමට පෙර අභියාචනයක් ඉදිරිපත් කිරීමට ප්‍රමාණවත් කාලයක් ලැබෙන සේ, එම තීරණය අප්‍රමාදව නිලධරයා වෙත දැන්වීම පත් කිරීම් බලධරයාගේ වගකීමක් ද වන්නේ ය.

180. ඉහත 179(iii) උප වගන්තියෙහි කෙසේ සඳහන් වුව ද, කිසියම් රජයේ නිලධරයෙකුගේ විශ්‍රාම වැටුප් හිමිකම් තහවුරු කර ගැනීමට අවශ්‍ය අවුරුදු දහයක සේවා කාලය සම්පූර්ණ වනුයේ වෛකල්පිත විශ්‍රාම ගැන්වීමේ දිනයෙන් පසුව හා වයස අවුරුදු 60 සම්පූර්ණ වීමේ දිනයට පෙරාතුව නම්, නිලධරයාට විශ්‍රාම වැටුප් අයිතිවාසිකම් හිමි වන සේ සේවා දිගු ලබා දීමට පත් කිරීම් බලධරයා ක්‍රියා කිරීම වඩාත් උචිත වන්නේ ය. එසේ වුවද, නිලධරයාගේ අවිනය මත හෝ රාජකාරී යථා පරිදි ඉටු කළ නොහැකි ආකාරයේ කායික හෝ මානසික හෝ දුබලතාවයකින් නිලධරයා පෙළෙන බව විධිමත්ව පත් කරන ලද වෛද්‍ය මණ්ඩලයකින් තහවුරු කර ඇත්නම් හෝ එවැනි පියවරක් මගින් ආයතනයේ යහ පැවැත්මට හා රාජකාරී සාර්ථකව ඉටුකිරීමට බරපතළ බාධා එළඹෙන්නේ නම් හෝ එවැනි අවස්ථාවක දී පත් කිරීම් බලධරයා විසින් නිලධරයා හට සේවා දිගුවක් ලබා දීම ප්‍රතික්ෂේප කිරීම පිළිබඳව මෙම වගන්තියෙන් බාධා ඇති නොවන්නේ ය. තවද එවැනි තීරණයක් ගැනීමට පාදක වූ සියලු කරුණු නිරවුල්ව, පැහැදිළිව හා සවිස්තරව ලිපිගොනුවෙහි සටහන් කර තැබීමටත්, තම තීරණය තහවුරු කරන සියලු සාධක සුරක්ෂිතව තැබීමටත් පත් කිරීම් බලධරයා වග බලා ගත යුතු වන්නේ ය.

181. රජයේ නිලධරයෙක්, විශ්‍රාම ගත් විට ඔහුගේ විශ්‍රාම වැටුප දුෂ්කරතාවයකින්, ප්‍රමාදයකින් හා නිලධරයා පීඩාවට පත් කිරීමකින් තොරව ගෙවිය හැකි වනු පිණිස, රජයේ නිලධරයෙකුගේ වෛකල්පික විශ්‍රාම ගැනීමේ වයස එළඹීමට යටත් පිරිසෙයින් මාස නවයකට පෙරාතුවවත්, ඔහුගේ පෞද්ගලික ලිපිගොනුව හා චර්යා සටහන අංග සම්පූර්ණවත්, නිවැරදිවත්, යාවත්කාලීනවත් සැකසීම හා නිලධරයා විශ්‍රාම ගන්නා දිනය දක්වා එම ක්‍රියාවලිය අඛණ්ඩව පවත්වාගෙන යාම අදාළ පරිපාලන බලධරයාගේ හා දෙපාර්තමේන්තු ප්‍රධානගේ වගකීමක් වන්නේ ය.

182. රජයේ නිලධරයෙක්, රජයේ සේවයෙන් විශ්‍රාම ගන්නා දිනට අවම වශයෙන් මාස තුනකටත් පෙරාතුව, ඔහුගේ විශ්‍රාම වැටුප් ගෙවීමට අදාළ සියලු ලියවිලි විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ වෙත ඉදිරිපත් කිරීමට අදාළ පරිපාලන බලධරයා හෝ දෙපාර්තමේන්තු ප්‍රධාන හෝ ආයතන ප්‍රධාන හෝ පත් කිරීම් බලධරයා හෝ ක්‍රියා තළ යුතු වන්නේ ය.

## XIX වැනි පරිච්ඡේදය

### රජයේ නිලධරයන් සම්බන්ධයෙන් ලේඛන හා වාර්තා සකස් කිරීම

225. සෑම බලය අභිනියෝජිත බලධරයෙක්ම, සෑම දෙපාර්තමේන්තු ප්‍රධානයෙක්ම හා සෑම ආයතන ප්‍රධානයෙක්ම තමන්ගේ විෂය පථයට ඇතුළත් වන සියලුම රාජ්‍ය නිලධරයන් පිළිබඳව අදාල සියලු තොරතුරු ඇතුලත් පහත සඳහන් ලේඛන, පහත සඳහන් පරිශිෂ්ට ප්‍රකාරව අඛණ්ඩව හා සාවක්කාලීනව පවත්වා ගත යුතු වන්නේය.

| | පවත්වාගත යුතු ලේඛනය | පරිශිෂ්ඨය |
|---|---|---|
| (i) | පත් කිරීම් හා උසස් කිරීම් සම්බන්ධ ලේඛනය | - අංක 15 |
| (ii) | සේවයෙන් පහ කළ නිලධරයන් සම්බන්ධ ලේඛනය | - අංක 16 |
| (iii) | සේවයෙන් ඉල්ලා අස්වූ නිලධරයන් සම්බන්ධ ලේඛනය | - අංක 17 |
| (iv) | තනතුර අතහැර ගිය නිලධරයන් සම්බන්ධ ලේඛනය | - අංක 18 |
| (v) | වැඩ තහනම් කර ඇති හා අනිවාර්යය නිවාඩු ගන්වා ඇති නිලධරයන් සම්බන්ධ ලේඛනය | - අංක 19 |
| (vi) | විශ්‍රාම ගන්වනු ලැබූ නිලධරයන් සම්බන්ධ ලේඛනය | - අංක 20 |

226. ඉහත 225 වගන්තියේ සඳහන් පරිදි පවත්වාගෙන යනු ලබන ලේඛනයන්හි ඇතුලත් දත්ත වල සංඛ්‍යාත්මක සාරාංශයක් අංක 21 පරිශිෂ්ටය ප්‍රකාරව අර්ධ වාර්ෂිකව කොමිෂන් සභාවේ ලේකම් වෙත ඉදිරිපත් කිරීමට අදාල පරිදි බලය අභිනියෝජිත බලධරයා, දෙපාර්තමේන්තු ප්‍රධාන හා ආයතන ප්‍රධාන ක්‍රියා තළ යුතු වන්නේය. ඒ අනුව සෑම වසරතම ජූනි මස 30 වැනි දිනට අදාල දත්ත ජූලි මස 20 වැනි දිනට පෙරද, දෙසැම්බර් මස 31 වැනි දිනට අදාල දත්ත ජනවාරි මස 20 වැනි දිනට පෙරද, කොමිෂන් සභාවේ ලේකම් වෙත ලැබිය යුතු වන්නේය.

## XX වැනි පරිච්ඡේදය

### උසස් කිරීම් හා ස්ථාන මාරු තීරණ වලට එරෙහි අභියාචනා සම්බන්ධ ක්‍රියා පටිපාටිය

233. තමන් රජයේ සේවයේ නියැලී සිටි කාලය තුලදී ලැබිය යුතුව තිබූ උසස්වීමක් සම්බන්ධයෙන් වන නියමයන් තමන් රජයේ සේවයෙන් විශ්‍රාම ලැබූ පසු අදාල බලය අභිනියෝජිත බලධරයා විසින් කර ඇති විටක, ඊට විරුද්ධ අභියාචනයක් ඉදිරිපත් කරනු ලබන විශ්‍රාමික රජයේ නිලධරයෙකු, එම අභියාචනය සෘජුවම කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කළ යුතු වන්නේය. එසේවුවද වුවත් එම අභියාචනයෙහි පිටපතක් ඔහුගේ පූර්ව දෙපාර්තමේන්තු ප්‍රධාන හෝ පූර්ව ආයතන ප්‍රධාන වෙත ද යැවිය යුතු වන්නේය.

## 2.12 රජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය මගින් ස්වකීය මුදල් ගනුදෙනු නිසි ආකාරයෙන් පවත්වාගෙන යාම පිණිස වන රෙගුලාසි පනවා ඇත. ඒ අනුව වාර්ෂික වියදම් හා ඇස්තමේන්තු, වියදම් සඳහා අධිකාරී බලය, ලැබීම් හා ගෙවීම් ගිණුම්ගත කිරීම, ආණ්ඩුවේ මුදල් කටයුතු පිළිබඳ භාරකාරත්වය, සැපයුම් හා වැඩ වැනි විෂයයන් මින් සාකච්ඡා කෙරේ. මුදල් රෙගුලාසින්හි 212 යටතේ වැටුප් හා විශ්‍රාම වැටුප් ගෙවිය යුත්තේ කවදාද යන වග මුදල් රෙගුලාසි 270 යටතේ විශ්‍රාම වැටුප් ගෙවීම සම්බන්ධව රෙගුලාසි පනවා ඇත.

මු.රෙ. 212 (4) විශ්‍රාම වැටුප් - එක් එක් මාසයේ විශ්‍රාම වැටුප් ගෙවන දින විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ විසින් සියලුම ගෙවන බලධාරීන් වෙත කල් ඇතුව දැනුම් දෙනු ලැබේ.

මු.රෙ. 270 විශ්‍රාම වැටුප් ගෙවීම - විශ්‍රාම වැටුප් ද ගෙවිය යුත්තේ නියම ආදායකයන්ටම පමණි. එසේ ද වුව ගෙවන කාර්යාලයට පැමිණීමට හෝ බලය පවරනු ලැබූ නියෝජිතයකු මගින් පවා විශ්‍රාම වැටුප ඉල්ලුම් කර සිටීමට හෝ විශ්‍රාම වැටුප්ලාභියෙකුට පුළුවම්කමක් නැති කල්හි, භාණ්ඩාගාර හා විගණන 128 පෝරමයේ නිසි පරිදි අත්සන් තැබූ සහතිකයක් තමා වෙත ඉදිරිපත් කරනු ලැබූ කල්හි එම විශ්‍රාම වැටුප රාජකාරි මුදල් ඇනවුමකින් හෝ යැවීමට චෙක් පතකින් හෝ ගෙවන නිලධාරියාට සිය අභිමතය පරිදි පුළුවන.

එමෙන්ම විශ්‍රාම වැටුප්ලාභියකු විසින් එකී පෝරමය නිසි පරිදි සහතිකකොට අත්සන් තබා කල් ඇතිව ඉදිරිපත් කරමින් ඉල්ලීමක් කර සිටියහොත් ඔහුගේ විශ්‍රාම වැටුප ඔහුගේ බැංකු ගිණුමට ගෙවිය හැක.

## 2.13 අධිකරණ තීන්දු

ශ්‍රේෂ්ඨාධිකරණය, අභියාචනාධිකරණය හා විවිධ අධිකරණ විසින් විශ්‍රාම වැටුප් හිමිකමට අදාළ තීන්දු ප්‍රකාශයට පත්කර ඇත. විශේෂයෙන්ම විශ්‍රාම වැටුප් නොගෙවීම, අත්හිටුවීම වැනි හේතුමත මූලික අයිතිවාසිකම් පෙත්සම් පවා ගරු ශ්‍රේෂ්ඨාධිකරණයට ඉදිරිපත් වී ඇත. විශේෂයෙන්ම විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා සංග්‍රහයේ 2-12 වගන්තිය අනුව විනය බලධාරීන් ලබා දුන් තීරණ අභියෝගයට ලක් කරමින් අධිකරණය වෙත පෙත්සම නිරතුරුවම ඉදිරිපත් වේ. ඒවා විභාග කොට ලබා දෙන තීන්දු ප්‍රකාශ කළ නීතියේ කොටසක් ලෙස පිළිගැනේ.

ලේකම්වරයකු විශ්‍රාම වැටුප් 02 ක් ලබා ගැනීම සම්බන්ධව ගරු ශ්‍රේෂ්ඨාධිකරණය හා අභියාචනාධිකරණය ලබාදුන් තීන්දුව කදිම උදාහරණයක් වේ.

IN THE COURT OF APPEAL OF THE DEMOCRATIC SOCIALIST
REPUBLIC OF SRI LANKA

In the matter of an application
For writs in the nature of
Certiorari and Mandamus

"There shall be deducted from the amount of any pension…any overpayment made to him out of Government funds…."

Hence it is abundantly clear that the petitioner is entitled to only one pension. It follows that the petitioner had been drawing payments in excess of what is due. Thus the issuing of the two documents marked as P12 and P16 appear to be justified. Due to the foregoing reasons a writ cannot lie. Hence this application is dismissed with costs.

Judge of the Court of Appeal .

## 2.14 නීතිපති දෙපාර්තමේන්තුව, මානව හිමිකම් කොමිෂන් සභාව, පරිපාලන කටයුතු පිළිබඳ පාර්ලිමේන්තු මහා කොමසාරිස් ( ඔම්බුඩ්ස්මන්වරයා) පාර්ලිමේන්තු පෙත්සම් කාරක සභා නිර්දේශ

ගැටලු සහගත අවස්ථාවල දී පැහැදිලි කර ගැනීම හා ඉහත ආයතනයන් විසින් සිදු කරන පරීක්ෂණ අනුව ලබා දෙන නිර්දේශයන් ද වැදගත් වේ.

## 2.15 විශ්‍රාම වැටුප් චක්‍රලේඛ

විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා සංග්‍රහයට අනුව එහි අවසානාත්මක තීරණ ගැනීමේ බලය රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශයේ ලේකම් සතු වේ. ඒ නිසාම ඇතැම් විනය හේතු හා සේවා අකාර්යක්ෂමතාවය මත විශ්‍රාම ගැන්වීමේ දී අධිකරණ සේවා කොමිෂන් සභාව, රාජ්‍ය සේවා කොමිෂන් සභාව, ජාතික පොලිස් කොමිසම හා පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවන්ගේ විශ්‍රාම ගැන්වීමේ තීරන රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශයේ ලේකම් වරයාගේ අනුමැතියට යටත් කෙරේ. එමෙන්ම විෂය භාර දෙපාර්තමේන්තු ප්‍රධානියා වන විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ ජනරාල් විසින් විශ්‍රාම වැටුප් ක්‍රමය පරිපාලන සඳහා විවිධ චක්‍රලේඛ නිකුත් කෙරේ.

# 3

# විශ්‍රාමික පොදු අයිතීන් හා විශ්‍රාම වැටුප් විෂමතාවය

## 3.1 විශ්‍රාමික අයිතිවාසිකම්

රාජ්‍ය සේවයට ආයුබෝවන් කියන ලද හා රාජ්‍ය විශ්‍රාම වැටුපකට හිමිකම් ලද පසු ජ්‍යෙෂ්ඨ පුරවැසි විශ්‍රාමිකයින් සම්බන්ධව ආයතන සංග්‍රහය, මුදල් රෙගුලාසි හෝ රාජ්‍ය සේවා කොමිෂන් සභා විධිවිධාන බලපවත්වනු නොලැබේ. රාජ්‍ය සේවයේදී ඉල්ලා අස්වීම, සේවය අතහැර යාම සහ සේවයෙන් පහ කිරීම මත විශ්‍රාම වැටුප අහිමි වනවා සේම විශ්‍රාමිතයින්ගේ විශ්‍රාම වැටුප අහිමිකළ හැක්කේ බන්ධනාගාර ගතවීම මත පමණි. එබැවින් සෑම විශ්‍රාමිතයකුටම තම විශ්‍රාම වැටුප බාධාවකින් තොරව ලබා ගැනීමටත් එය පරිහරණය කිරීමටත් පූර්ණ හිමිතම ඇත්තේය. එය විශ්‍රාමිකයන්ගේ අයිතියකි. තෙසේ වෙතත් විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා සංග්‍රහයෙහි 41 වන වගන්තිය අනුව අප අමතක නොකළ යුත්තක්ද පවතී.

41 වන වගන්තිය :- මෙම රෙගුලාසි යටතේ දෙනු ලබන කිසිදු විශ්‍රාම වැටුපක් හෝ පාරිතෝෂිකයක් අන් සතු කළ හැකි හෝ පැවරිය හැකි හෝ නොවේ.

විශ්‍රාමික අයිතිය 1946 රාජාඥාව මඟින් තහවුරු කර තිබේ. ඒ අනුව විශ්‍රාම වැටුප රාජ්‍ය ඒකාබද්ධ අරමුදලින් ගෙවීම පිළිබඳව විධිවිධාන පනවා තිබේ. එමෙන්ම 1972 රාජාණ්ඩු ක්‍රමය අහෝසි කරමින් සම්මත කළ ජනරජ ව්‍යවස්ථාවෙන්ද එය නීතිගත වී ආරක්ෂා විය. රටක උත්තරීතර නීතිය වශයෙන් සැලකෙන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මඟින් විශ්‍රාම වැටුප් අයිතීන් සනාථ කර තිබුණි. විශේෂයෙන්ම සියලුම විශ්‍රාම වැටුප් පාරිතෝෂික හා වෙනත් එවැනි දීමනා ඒකාබද්ධ අරමුදලට වැය බරක් විය යුතු බව විශේෂයෙන්ම දක්වා ඇත.

1978 ශ්‍රී ලංකා ජනරජය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව තුළ එතෙක් පැවති විශ්‍රාම වැටුප් අයිතිය පිළිබඳ වගන්ති ඇතුළත් නොවීම බරපතල අඩුපාඩුවක් බව ජ්‍යෙෂ්ඨ විශ්‍රාමිකයන්ගේ මතයයි.

### විශ්‍රාමික ආර්ථික අයිතිවාසිකම්

මෙය වැටුප, විශ්‍රාම වැටුප් දීමනා හා ජීවනාධාර හා බැඳුන අයිතිවාසිකමකි. ඒ තුළින්

- වනසිංහ, සෙනෙවිරත්න, බී. සී. පෙරේරා, කොමිෂන් හා කමිටු වලින් විශ්‍රාමිකයින් සඳහා නිර්දේශිත ප්‍රතිපත්ති මත එම යෝජනා අදාළ පරිදි ක්‍රියාත්මත කිරීම
- විශ්‍රාම වැටුප් විෂමතාවය ඉවත් කිරීම
- ජාතික විශ්‍රාම වැටුප් ප්‍රතිපත්තියක් ක්‍රියාත්මක කිරීම අපේක්ෂිත වේ.

## විශ්‍රාමික සාමාජීය අයිතිවාසිකම් :

තෘප්තිමත් වූ විශ්‍රාමික ප්‍රජාවක් බිහිකිරීමේ ලා සමාජමය අයිතිවාසිකම් ගණනාවක් පවතී.

- විශ්‍රාමික සංගම් ප්‍රාදේශීය, දිස්ත්‍රික්ක හා ජාතික මට්ටමින් පවත්වා ගැනීම
- විශ්‍රාමික සුභ සාධනය සඳහා භාරකාර අරමුදල්, රක්ෂණ ක්‍රම, නිවාඩු නිකේතන පවත්වාගෙන යාම
- තම විශ්‍රාම වැටුප පිළිබඳ තොරතුරු දැන ගැනීමේ අයිතිය, ලිපි ලේඛන සඳහා නිසි පිළිතුරු ලබා ගැනීම හා අදාළ බලධාරීන් හමුවී සාකච්ඡා කර ගැටළු විසඳා ගැනීමේ අයිතිය
- සෞඛ්‍ය විවේකය, ගමනාගමනය, ඉඩම් නිවාස වැනි මූලික අවශ්‍යතා වෙනුවෙන් පහසුකම් සැලසීම
- විශ්‍රාමිකයින්ගේ භාර්යාවන්, උරුමකරුවන්, යැපෙන්නන් හා දරුවන්ගේ අයිතිවාසිකම් ප්‍රචලිත කිරීම

## විශ්‍රාමික ජනතා සේවය පිළිබඳ වගකීම් දැරීමේ අයිතිවාසිකම්

- විශ්‍රාමිකයින් ඇගයීමේ ක්‍රියාවලියක් පවත්වාගෙන යාම
- විශ්‍රාමික ප්‍රජාවගේ දැනුම කුසලතා සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම
- විශ්‍රාමිකයින්ගේ සේවය තව දුරටත් ජාතික වැඩසටහන් සඳහා ලබා ගැනීම
- තම විශ්‍රාම වැටුප පිළිබඳ තොරතුරු දැන ගැනීමේ අයිතිය
- සියළු ජාතික වැඩසටහන්වලට සහභාගි වීම
- රාජ්‍ය ප්‍රතිපත්ති බුද්ධිමත් මතයකින් යුතුව ඇගයීමට ලක් කිරීම

## 3.2 විශ්‍රාමික පොදු අයිතිය හා කොමිෂන් සභා නිර්දේශ ක්‍රියාත්මක වීම

රාජ්‍ය සේවාව ප්‍රතිව්‍යුහගත කිරීම, නව වැටුප් ක්‍රම හඳුන්වා දීම, සේවක ශ්‍රේණි නිර්මානය, පාලන ආකල්ප වෙනස් කිරීම වැටුප්/ විශ්‍රාම වැටුප් විෂමතාවය ඉවත් කිරීම වැනි අරමුණු මත පදනම් වූ විවිධ කොමිෂන් සභා පසුගිය කාලයේ ස්ථාපිත කරන ලදී. එල්.බී. සිල්වා කොමිසම, විල්මට් ඒ. පෙරේරා, ඩී. ජී. දයාරත්න කොමිසම, වනසිංහ කොමිසම හා සේනාරත්න කමිටු වාර්තාව, ඒකනායක කමිටු වාර්තාව ඊට උදාහරණයන්ය. මෙම කොමිෂන් සභා හා වාර්තා මඟින් විශ්‍රාම වැටුප් සම්බන්ධවද යම් යම් යෝජනා ඉදිරිපත් කර තිබුණි.

### 3.2.1 පරිපාලන ප්‍රතිසංස්කරණ කමිටු වාර්තාව - (වනසිංහ වැටුප් කොමිෂන් වාර්තාව) නිර්දේශ (1987)

මෙම කොමිෂන් සභාව විසින් විශ්‍රාම වැටුප් සම්බන්ධව ඉදිරිපත් කරන ලද නිර්දේශයන් පහත දැක්වේ.

- රජයේ සේවකයන් විශ්‍රාම ගැන්වීමට සහ විශ්‍රාම ලැබූ එවැනි සේවකයන් නැවත සේවයට යොදවා ගැනීමට අදාළ විධිවිධාන සහ ක්‍රියාමාර්ග පරීක්ෂා කර බැලීමේ

අවශ්‍යතාවය ගැන කමිටුව වෙත කීපදෙනෙක් විසින්ම කරුණු ඉදිරිපත් කරනු ලැබීය. දැනට ක්‍රියාත්මක වන ක්‍රියාපටිපාටි සහ ක්‍රියාමාර්ග රජයේ සේවය තුළ කාර්යක්ෂමතාවය පවත්වාගෙන යාම සඳහා උපරිම අන්දමින් ඉවහල් නොවන බව මේ ගැන පරීක්ෂා කරන ලද මෙම කමිටුවට පෙනී ගොස් ඇත. මෙම ක්‍රියාපටිපාටිය ක්‍රියාත්මක කිරීමේදී ඒකාකාරභාවයක් අනුගමනය කරන බවක් නොපෙනේ. දැනට පවත්නා ක්‍රියාපටිපාටිය අනුව අවුරුදු 55 විකල්ප විශ්‍රාම ගැනීමේ වයස හැටියට ගණන් ගනු ලැබේ. ඉන්පසු සේවා කාලය දීර්ඝ කිරීම වාර්ෂිකව කෙරෙන අතර එය රජයේ අභිමතය මත රඳා පවතී. ඇත්ත වශයෙන් මෙයින් අදහස් කරන්නේ අදාල ඇමතිවරයාගේ අභිමතය පරිදි සේවා කාලය දීර්ඝ කෙරෙන බවය. අයහපත් සෞඛ්‍ය තත්වය නිසා හෝ යම් තනතුරක් හෝ සේවාවක් අහෝසි කිරීම නිසා එම තනතුර දැරූ අයට විශ්‍රාම ගැනීමට අවකාශ සලසන අතර මෙම කමිටු වාර්තාවෙහි වැදගත් වගන්ති කිහිපයක් වේ. විශේෂ පටිපාටියක් යටතේ අවුරුදු 55 ට පෙර විශ්‍රාම යාමට රජයේ සේවකයන්ට අයිතියක් නැත.

(106) දැනට පවත්නා ක්‍රියාපටිපාටිය සහ ක්‍රියාමාර්ග නිසා එකිනෙකට සම්බන්ධ ප්‍රශ්න කිහිපයක් උද්ගතව ඇත. වයස අවු : 55 ට ආසන්නව තිබියදී ද එම වයස් සීමාව එළඹීමෙන් පසුවද රජයේ සේවකයන්ට අස්ථිර භාවය පිළිබඳ හැඟීම නිසා රජයේ සේවකයන්ගේ වැඩ කටයුතුවල ගුණාත්මක පක්ෂය කෙරෙහිද නිදහසේ සිතීමට සහ ක්‍රියා කිරීමට ඔවුන් තුළ ඇති හැකියාව කෙරෙහිද බලපෑමක් ඇති වන්නේය. එමෙන්ම රජයේ සේවයේ නිලධාරීන් තුළ පවත්නා ධෛර්යය හීන කිරීමටද හේතු වේ. ඒ ඒ නිලධාරියා දරන තත්වය කුමක් වුවද මෙම වයස් සීමාවට එළඹීමට ආසන්නව තිබියදී ඔවුන් තම දරුවන්ගේ අධ්‍යාපන සහ අවාහ විවාහ කටයුතු වලදී අදාළ වන සිය පවුල වෙත ඉටු කළ යුතු යුතුකම් වෙනුවෙන් එක්තරා පීඩාකාරී තත්වයකට මුහුණ දෙන බව පෙන්වා දීමට කමිටුව කැමතිය. එමෙන්ම විශ්‍රාම යාමට ආසන්නව සිටින්නන් තමන්ගේ පදිංචිය සඳහා සුදුසු ස්ථානයක් සකස් කර ගැනීමේ අවශ්‍යතාවයෙන්ද පෙළෙති. එබැවින් අස්ථිරභාවය පිළිබඳ හැඟීම වඩාත් දැඩි වේ.

(107) අවුරුදු 55ට පෙර විශ්‍රාම යාමේ අයිතිය නොමැතිකම නිසා රජයේ සේවකයන්ට ඔවුන්ගේ මුළු සේවා කාලය තුළදීම රැකියා වෙනස් කිරීමට අවකාශ නොලැබේ. මෙය ද රජයේ සේවය තුළ අපේක්ෂාභංගත්වයක් වර්ධනය වීමට හේතුවේ. ඍජු හෝ වක්‍ර ආයතනික සම්බාධක මගින් රජයේ සේවකයන් එම සේවය තුළ රඳවා ගැනීමට බල කළ යුතු යැයි යන මතය හා මෙම කමිටුව එකඟ නොවේ. එවැනි ප්‍රතිපත්තියක් නිසා සධාන්තික වශයෙන් රාජ්‍ය සේවයේ තනතුරු පිරී පැවතුනද එහි තුලවූ සේවකයන්ගේ ධෛර්යය සහ ඵලදායකත්වය හීන වී යන බව පෙනේ. අවුරුදු 55න් ඔබ්බට සේවා කාලය දීර්ඝ නොකිරීමට සේවා යෝජකයා වශයෙන් රජය ගන්නා තීරණය මගින් විශ්‍රාම යැවීම විනයානුකූල ක්‍රියාමාර්ගයක් වශයෙන් භාවිතා නොකළ යුතු යැයිද කමිටුව විශ්වාස කරයි.

(108) එබැවින් කමිටුව රජයේ සේවය තුළ පවත්නා අස්ථිරභාවය පිළිබඳ හැඟීම තුරන් කිරීමට ඉවහල් වන විධිවිධාන සමූහයක්ම එකවර නිර්දේශ කරයි. (ඔවුන් විසින් උපයාගත් විශ්‍රාම වැටුප් කැප නොකොට) එසේ කිරීමට කැමති රජයේ සේවකයන්ට රජයේ සේවයෙන් අස්වී නව රැකියාවක් සොයා ගැනීමට එයින් අවකාශ ලැබේ. එම යෝජනා සමූහය පහත සඳහන් අයුරුයි.

(අ) අනිවාර්යයෙන් විශ්‍රාම යායුතු වයස අවුරුදු 60 විය යුතුය. මෙම වයස් සීමාවේදී විශ්‍රාම ගන්නා රජයේ සේවකයන් සම්පූර්ණ විශ්‍රාම වැටුප් ලැබීමට සුදුසු විය යුතුය.

(ආ) රජයේ නිලධාරීන්ගේ සේවා කාලය ඔවුන්ගේ හැටවන උපන් දිනයෙන් ඔබ්බට දීර්ඝ නොකළ යුතුය.

(ඇ) සෑම රජයේ නිලධාරියකුටම විශ්‍රාම යාමට නියම දිනට පෙර ඔහුගේ/ ඇයගේ මනාපය පරිදි විශ්‍රාම යාමටද අවුරුදු 55 සම්පූර්ණ වීමෙන් පසුව විශ්‍රාම වැටුප් ලබා ගැනීමටද ඉඩ දිය යුතුය. එසේ විශ්‍රාම ගැනීමේ අයිතිය හුදෙක්ම අදාළ රජයේ නිලධාරීන්ගේ මනාපය පරිදි විය යුතු අතර රජයේ අභිමතය පරිදි නොවිය යුතුය.

(ඈ) ස්වකීය වයස අවු: 55 ජන්ම දිනය එළඹීමට කලින් වුවද, විශ්‍රාම යාමට රජයේ නිලධාරීන්ට ඒ සඳහා තම මනාපය අනුව ක්‍රියා කිරීමට අවකාශ තිබිය යුතුය. එහෙත් එවැනි අවස්ථාවලදී,

- ඔහු/ ඇය විශ්‍රාම වැටුප් ලැබීමට හිමිකම ඇති තනතුරක 20 අවුරුද්දකට නොඅඩු සේවා කාලයක් සපුරා තිබිය යුතුය.
- විශ්‍රාම වැටුප් ලැබීම සඳහා ඔහුගේ/ඇයගේ අයිතිය ක්‍රියාත්මක වන්නේ වයස අවු:55 එළඹීමෙන් පසුවය.

(109) රජයේ සේවයෙන් විශ්‍රාමගත් නිලධාරීන් නැවත සේවයට යොදවා ගනු ලබන අවස්ථා ක්‍රමයෙන් වැඩිවීමේ ප්‍රවණතාවයක් ඇති බව කමිටුවට පෙනී යයි. අවශ්‍ය වන විශේෂ ප්‍රාගුණ්‍යයෙන් යුත් නිලධාරීන් සොයා ගැනීම සඳහා වූ කාර්ය ක්‍රමයක් මගින් ඉතා විශේෂ අවස්ථාවකදී පමණක් එසේ සේවයේ යෙදවිය යුතු බව කමිටුවේ අදහසය. නැවත සේවය දැඩි නීති වලින් පාලනය විය යුතුය. එබැවින් කමිටුව පහත සඳහන් නිර්දේශ ඉදිරිපත් කරයි.

(අ) යම් රජයේ නිලධාරියකු නැවත සේවයෙහි යෙදවිය යුත්තේ ඔහු වයස අවු: 60 සම්පූර්ණ කර ඇත්නම් පමණි.

(ආ) විශ්‍රාම ලත් රජයේ නිලධාරීන් නැවත සේවයෙහි යෙදවිය යුත්තේ නිශ්චිත කොන්ත්‍රාත් පදනම මත වන අතර, එසේ බඳවාගනු ලබන සේවා කාලය එක් වරෙක මාස 12ක කාලයක් නොඉක්මවිය යුතුය. යම් හෙයකින් සේවා කාලය මාස 12 න් ඔබ්බට දීර්ඝ කිරීමට සිදු වුවහොත්, එම අතිරේක කාලය නව පත්වීමක් වශයෙන් සැලකිය යුතු අතර එය මාස 12 ක උපරිම කාලයකට සීමා විය යුතුය.

(ඇ) ස්වකීය අනුප්‍රාප්තිකයන් පුහුණු කිරීම නැවත සේවයෙහි යොදවා ගනු ලබන්නවුන් වෙත පැවරිය යුතු කොන්දේසියක් වන්නේය. නැවත සේවයෙහි යොදවනු ලැබූ යම් නිලධාරියෙකු ස්වකීය අනුප්‍රාප්තිකයන් පුහුණු කිරීමේදී ලබා ඇති ප්‍රගතිය සේවා කාලය දීර්ඝ කිරීමේදී සලකා බැලිය යුතුය.

(ඈ) නැවත සේවයේ යොදවා ගනු ලැබූ විශ්‍රාමිකයින්ට වැටුප් ගෙවීමේදී ඔවුන් විසින් ලබන විශ්‍රාම වැටුප සැලකිල්ලට නොගත යුතුය. එහෙත් ඔවුන්ට ගෙවනු ලබන නව වැටුප විශ්‍රාම වැටුප් නියම කිරීම පිණිස උපයෝගී කර නොගත යුතුය.

(110) විශ්‍රාම ලත් රජයේ නිලධාරීන් තුළ ඇති අපේක්ෂා භංගත්වය සහ දුක්ගැනවිලි මිශ්‍ර හැඟීම් ගැන කමිටුව සඳහන් කිරීමට සතුටුය. ක්‍රමයෙන් වැඩිවන ජීවන වියදම් නිසා ඔවුන්ගේ විශ්‍රාම වැටුප් වල මූර්ත අගය ක්ෂය වීම සහ ඔවුන්ට ඇති එකම ආදායම් මාර්ගය විශ්‍රාම වැටුප වශයෙන් ලැබෙන මුදල පමණක් වීම යන කරුණු දෙක නිසා මෙවැනි මානසික තත්වයක් හේතු වෙයි. රජයේ සේවකයින් සිය මහළු වියේදී උපයෝගී කර ගැනීම සඳහා අතිරේක ආදායම් මාර්ගයක් සකස් කර ගැනීමෙහි හැකියාවක් දක්වන්නේ ඉතා කලාතුරකින්

බව හා ජීවන තත්වයක්වත් සලස්වා ගැනීමට අසීරු තත්වයකට රජයේ නිලධාරීන් වැටෙන්නේ මෙවැනි සාධක සමුච්චිත ප්‍රතිඵල නිසාය.

(111) වැඩිවන ජීවන වියදම නිසා ඇතිවන පාඩු පිරිමසන පරිදි රජය විසින් වැටුප් සංශෝධනය කළ යුතු යැයි කමිටුව තරයේ නිර්දේශ කෙරේ. මෙම සංශෝධනය රජයේ සේවයේ වැටුප් සංශෝධන සමඟ සමාන්තික විය යුතුය. මෙම නිර්දේශය නිසා රජයට මූල්‍යමය වශයෙන් උද්ගත වන කරුණු ඇති විය හැකි බව කමිටුව දනී. එහෙත් බොහෝ විශ්‍රාමිකයින් සම්බන්ධයෙන් වැටුප් ගෙවීමට සිදු වන කාල පරතරය එතරම් දීර්ඝ නොවන බව කමිටුව පෙන්වා දෙයි. මෙම නිර්දේශය පිළිගැනීම නිසා රජයට අතිරේක වියදමක් දරන්නට සිදුවන බව සැබැවි. එහෙත් විශ්‍රාමිකයින්ගේ ගෞරවාන්විත භාවයට ඇතිවන හානිය වලක්වාලමින්ද, රජයේ සේවයෙන් උපරිම ඵල ලබා ගැනීමෙන්ද එම පාඩුව මුළුමණින්ම පිරිමසා ගත හැකි යැයි කමිටුව අදහස් කරයි.

## 3.2.2 සෙනෙවිරත්න විශ්‍රාම වැටුප් විෂමතා කමිටු නිර්දේශය (1994. 02. 01)

පහත සඳහන් නිර්දේශයන් වැදගත් වේ.

"සේවයේ යෙදී සිටින නිලධාරීන් සඳහා වැටුප් ප්‍රතිශෝධන සිදු කෙරෙන සෑම විටකම එම ප්‍රතිශෝධන වල කලින් විශ්‍රාම ගිය විශ්‍රාමිකයින්ගේ විශ්‍රාම වැටුප් ද ඊට අනුරූපී වන සේ ප්‍රතිසංශෝධනය කළ යුතු යැයි යන තර්කය ප්‍රබල එකක් බව කමිටුවේ ඒකමතික අදහසයි. මෙම වැඩි කිරීම්, දීමනා වල ස්වරූපයක් නොගත යුතු අතර ඇත්ත වශයෙන්ම ඒවා මූලික විශ්‍රාම වැටුප් ප්‍රතිශෝධන වශයෙන් සිදු කළ යුතුය".

එම වැටුප් තලයේ වැටුප් ප්‍රතිසංශෝධනය කෙරෙන ප්‍රතිශතයට ගැලපෙන සේ විශ්‍රාම වැටුප් ප්‍රතිශෝධනය කරනු ලබන්නේ වැඩිවන ජීවන වියදම සඳහා සහනයක් සැලසීමට බැවින් සේවයේ නියුක්ත නිලධාරීන් තරමටම එම ප්‍රතිශෝධන වලින් ප්‍රතිලාභ ලැබීමට විශ්‍රාමිකයින්ටද සාධාරණ හිමිකමක් ඇත. සේවයේ නියුක්ත නිලධාරීන්ගේ වැටුප් සමඟ සසඳන විට විශාල පරතරයක් ඇති වීම මේ මඟින් වැළැක්වේ. විශේෂයෙන් රජයේ සේවයේ උසස් තනතුරු දරමින් සිට විශ්‍රාම ලැබූ නිලධාරීන්ගේ විශ්‍රාම වැටුප්වල ඇති කැපී පෙනෙන ඌණතා මෙම වාර්තාවේ මුල් කොටසේ මැනවින් පෙන්වා දී ඇත. සමහර ඌණතා 211% ක් තරම් අධික වේ. විශ්‍රාම වැටුප් ප්‍රතිශෝධනය සම්බන්ධයෙන් ස්ථිර ප්‍රතිපත්තියක් අනුගමනය කිරීමෙන් අපේ විශ්‍රාම ලැබූ ජ්‍යෙෂ්ඨ පුරවැසියන් අතර විශ්වාසයක් හා ආත්ම ගෞරවයක් ඇති වන අතර දැනට වඩාත් ප්‍රීතිමත් ලෙස ඔවුනගේ ජීවිතයේ සන්ධ්‍යා සමය ගත කිරීමට එය ඉවහල් වන බව කමිටුවේ අදහසයි. අංක 4 දරන වැටුප් හා සේවක සංඛ්‍යා කොමිෂන් වාර්තාවේ 110 සහ 111 දරන වගන්තිවලින්ද වනසිංහ කමිටුව මඟින් ද මෙම නිර්දේශයම කර ඇති බව සඳහන් කිරීම මෙහිදී වැදගත් වේ.

## 3.2.3 බී. සී. පෙරේරා කොමිෂන් සභා වාර්තාව - නිර්දේශ (1996)

මෙම කොමිෂන් සභා වාර්තාවද ඉහත සඳහන් කරන ලද වාර්තාවන් පදනම් කොටගෙන විවිධ නිර්දේශයන් ලබා දී තිබේ.

1987 වනසිංහ නිර්දේශ ද උපුටා දක්වමින් බී. සී. පෙරේරා කොමිෂන් වාර්තාව සිය වාර්තාවේ (සැසි වාර්තා අංක 11-1996) වැටුප් විෂමතාවය ඉවත් කිරීම සහ තත්කාලීන ජීවන අංකයට ගැලපෙන වැටුපක් විශ්‍රාමිකයින්ට ගෙවිය යුතු යැයිද විශ්‍රාමිකයින්ගේ අවම වැටුප රුපියල් 3000/- ක් බවට පත් කරමින්, රු. 2200/- ට අඩුවෙන් විශ්‍රාම ලබන්නන්ගේ වැටුපට රු. 800/- ක් එකතු කළ යුතු බවටද නිර්දේශ කරයි.

(8:5) පරිපාලන ප්‍රතිසංස්කරණ කමිටුවේ 4 වෙනි වාර්තාව (සැසි වාර්තා අංක vi - 1987) සඳහන් පහතින් කියවෙන කොටස යලි සිහිපත් කිරීම උචිත වෙයි. හැඟීම් වලට හේතුව ක්‍රමයෙන් වැඩිවන ජීවන වියදම නිසා ඔවුන්ගේ විශ්‍රාම වැටුප් වල මූර්ත අගය ක්ෂය වීම සහ ඔවුන්ට ඇති එකම අදායම් මාර්ගය, විශ්‍රාම වැටුප වශයෙන් ලැබෙන මුදල පමණක් වීමයි. වැඩිවන ජීවන වියදම නිසා ඇතිවන පාඩු පිරිමැසෙන පරිදි රජයේ සේවයේ වැටුප් සංශෝධනය කළ යුතුය." පරිපාලන ප්‍රතිසංස්කරණ කමිටුවේ මෙම නිර්දේශවලට අපිද එකඟ වෙමු. රජය විසින් මේ තත්වය ප්‍රතිපත්තියක් වශයෙන් පිළිගෙන රජයේ සේවකයන්ගේ වැටුප් සංශෝධන සඳහා කොමිෂන් සභා පත් කිරීමේදී මෙන්ම, විශ්‍රාමිකයින්ගේ වැටුප් සංශෝධනය කිරීමේදීද එම කොමිෂන් සභාවල කාර්ය, නිර්දේශ වලට ඇතුළත් විය යුතු යැයි කොමිෂම නිර්දේශ කරයි.

(8:18) පෙර කී හේතු නිසා රජයට මූල්‍යමය වශයෙන් සිදුවන අපහසුතාද සැලකිල්ලට ගනිමින් දැනට විශ්‍රාමිකයින්ට ගෙවනු ලබන සියළුම දීමනා ඇතුළුව ඔවුන්ගේ ඒකාබද්ධ විශ්‍රාම වැටුප 30% කින් වැඩි කිරීමට නිර්දේශ කරමු. 1982 ජනවාරි 1 වෙනි දිනට පෙර විශ්‍රාම ගනු ලැබූවන් අතුරින් මාසික වැටුප රු. 2200/- ට අඩු වෙන් ලබන අය පිළිබඳව සැලකිල්ලට ගනිමින් අවම වැඩි කිරීම රු. 800/- විය යුතු යැයි නිර්දේශ කරමු.

## 3.2.4 සේනාරත්න කමිටු වාර්තාව - නිර්දේශ (2000)

ඉහත සඳහන් කරන ලද විවිධ වාර්තා අධ්‍යයනය කොට තව දුරටත් විශ්‍රාම වැටුප් විෂමතාවය පිළිබඳව නිර්දේශ ඉදිරිපත් කිරීමට මෙම කමිටුව පත් කරන ලදී. රාජ්‍ය සේවයේ වැටුප් වැඩිකරන සෑම අවස්ථාවකදීම එම වැඩිවීම්වලින් 70% ක ප්‍රමාණයකින් විශ්‍රාම වැටුප්ද වැඩි කළ යුතු බවට මෙම කමිටු වාර්තාව නිර්දේශ කළ නමුත් එම වාර්තාව ප්‍රසිද්ධියට පත් නොවීය.

## 3.2.5 ඒකනායක කමිටු වාර්තාව නිර්දේශ (2003)

විශ්‍රාම වැටුප් විෂමතාවය පිළිබඳ සොයා බලා නිර්දේශ ඉදිරිපත් කිරීම සඳහා රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය අතිරේක ලේකම් එස්. ඒ. ඒකනායක මහතාගේ සභාපතිත්වයෙන්ද විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂක වික්ටර් සමරවීර මහතා ලේකම් වශයෙන් ක්‍රියා කරමින්ද, ආර්.කේ.ඒ. දයානන්ද, ආර්.ඩබ්. පියසේන, වයි.පී. ගුණතිලක සහ කේ.ඒ.ඩී. ආර්. නිශාන්ති යන මහත්ම මහත්මින්ගේ සහභාගීත්වයෙන් මෙම කමිටුව ක්‍රියාත්මක විය. මින් ඉහත ක්‍රියාත්මක වූ සියලුම වාර්තා සලකා බැලූ මෙම කමිටුවේ නිර්දේශයන් වූයේ,

I. 1997.01.01 දිනට පෙර විශ්‍රාම ලැබූ රාජ්‍ය නිලධාරීන්ගේ විශ්‍රාම වැටුප 1997.01.01 දිනට විශ්‍රාම ලැබූ රාජ්‍ය නිලධාරීන්ගේ විශ්‍රාම වැටුපට සමාන කිරීම.

II. අදාළ සංශෝධනයේදී අඩු නොකළ හා දීමනා රහිත වැටුප මත සංශෝධනය ලබා දීම සහ දැනට ලබා දෙන රු. 500/- හෝ 10% සහ රු. 750/- යන දීමනා එලෙසින්ම ලබා දීම.

III. නිර්දේශ ක්‍රියාත්මක වීම හේතුවෙන් යම් විශ්‍රාමිකයකුට දැනට ලැබෙන විශ්‍රාම වැටුප අඩු නොවිය යුතුය යන්න සහ යම් විශ්‍රාමිකයකු දැනට ලබන විශ්‍රාම වැටුපට වඩා වර්තමාන වැටුපෙන් 75% හෝ 70% යන අගය අඩුවන අවස්ථාවලදී දැනට ලබන විශ්‍රාම වැටුප එසේම ලබා දීම වේ. එමෙන්ම කවර නිර්දේශ සමඟ වුවද ක්‍රියාත්මක කළ යුතු අනෙකුත් යෝජනා 2 ක් ද කමිටුව යෝජනා කරයි.

- කමිටු නිර්දේශය ක්‍රියාත්මක කිරීම තුළින් බොහෝදුරට පවතින විශ්‍රාම වැටුප් විෂමතාවය ඉවත්ව යනු ඇතැයි කමිටුව අදහස් කරයි.

එසේ වුවද විශ්‍රාම වැටුප් විෂමතාවය ඇති වීම කෙරහි වූ හේතුවල බලපෑම තුළින් නැවතත් විශ්‍රාම වැටුප් විෂමතාවන් ඇති වීමට ඇති ඉඩකඩ සම්බන්ධයෙන් ද මෙහි දී අවධානය යොමු කිරීම වැදගත් වේ. එහෙයින් ඉදිරි කාලයේදී රටේ ආර්ථික තත්වය හා උද්ධමනකාරී තත්වය සලකා බලා රජයේ සේවකයින් සඳහා සිදු කෙරෙන වැටුප් වැඩි කිරීම් හෝ අතුරු දීමනා ලබා දීමේ දී එම වැටුප් වැඩි වීමෙන්/ අතුරු දීමනාවෙන් 70% ට සමාන මුදලක් සියළුම විශ්‍රාමිකයින් සඳහා ද ලබා දීමට කමිටුව යෝජනා කරයි.

- ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ නිලධාරීන්ගේ විශ්‍රාම වැටුප් විෂමතා වලට හේතු වී ඇත්තේ ගුරු සේවය හා විදුහල්පති සේවය ඇති කිරීමෙන් පසු ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ වැටුප් පරිමාණ එම සේවා වල වැටුප් පරිමාණවලට ඉහළින් පවතින ලෙස සංශෝධනය නොවීමයි. එසේ කරන තෙක් එම සේවාවන්ට අදාළ විෂමතා ඉවත් කළ නොහැකි වේ. එසේ කිරීමේදී ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ මෙන්ම දීප ව්‍යාප්ත සියළුම සේවාවල වැටුප් පරිමාණ සංශෝධනය විය යුතු බවද සඳහන් කරමු.

### 3.2.6 පොදුජන එක්සත් පෙරමුණ ප්‍රතිපත්ති ප්‍රකාශනය (1994)

පොදුජන එක්සත් පෙරමුණ පිහිටුවීමට පෙර අගමැති අපේක්ෂිකාව වශයෙන් හිටපු ජනාධිපතිනිය විසින් රජයේ නිල ප්‍රතිපත්ති ප්‍රකාශනයේ විශ්‍රාමිකයින් වෙනුවෙන් ඉටු කිරීමට යෝජිත වූ කරුණු 08 කි.

I. "රටේ යහපත වෙනුවෙන් හා සංවර්ධනය වෙනුවෙන් සිය ජීවිතයේ ශක්තිමත් වයස කැප කර තම සඳැ සමය විශ්‍රාම සුවයෙන් ගත කළ යුතුය. අපගේ විශ්‍රාමික ජනතාවට ඇති ප්‍රශ්න හා ගැටළු ගැන අපේ විශේෂ අවධානය යොමු කොට ඇත. බොහෝ දෙනෙකු තවමත් ජීවත් වන්නේ කුලී නිවෙස්වලය. දරුවෝ බාල වයස්වල පසුවෙති. විශ්‍රාම වැටුපෙන්ද විශාල වශයෙන් ණය මුදලක් කැපේ. මේ තත්වයෙන් වලකා විශ්‍රාමික සුභ සාධනය සඳහා විශේෂ ජාතික වැඩපිළිවෙලක් අප විසින් ක්‍රියාත්මක කරනු ඇත"

II. විශ්‍රාම වැටුප් සැකසීමේදී ඇති සියලුම විෂමතා අහෝසි කර, විශ්‍රාමික වැටුප උපරිම වන ලෙස ජාතික විශ්‍රාම වැටුප් ක්‍රමයක් සකස් කෙරේ. විශ්‍රාම වැටුප් ජීවන වියදම් දර්ශකයට අනුව සකස් කිරීමට පියවර ගන්නා අතර විශ්‍රාමිකයින්ට අඩු මිලට ගමනා ගමන පහසුකම්ද සපයනු ඇත.

III. රු. 260/- දීමනාවේ හිඟ මුදල වහා ගෙවනු ලැබේ.

IV. රජයේ ආයතනවල පුරප්පාඩු පිරවීමේදී එම ආයතනවල විශ්‍රාමිකයින්ගේ දරුවන් පිළිබඳව යම් විශේෂත්වයක් දැක්වීමේ වැඩ පිළිවෙලක් ක්‍රියාත්මක කරනු ඇත.

V. බොහෝ කාලයක් ගමින් පිටත සේවය කිරීමේ හේතුවෙන් විශ්‍රාමිකයින්ගේ දේපල වල සුරක්ෂිතභාවයට මතුවන ප්‍රශ්න නිරාකරණය කිරීම සඳහා විශේෂ විධිවිධාන සැකසේ.

VI වැන්දඹු අනත්දරු අරමුදලට කපා ගන්නා ලද මුදල් සහ පොලිය ආපසු ලබා ගැනීමේ අදාළ ප්‍රතිලාභියෙකු නොමැති විට එම මුදල විශ්‍රාමිකයාට ලබා ගැනීමට අවශ්‍ය විධිවිධාන යොදනු ඇත.

VII අවශ්‍ය අයට සිය සන්ධ්‍යා භාගය ඉතා සුළු මුදලක් ගෙවා වෛද පහසුකම් ඇතිව විවේකයෙන් ගත කිරීම සඳහා පහසුකම් ඇති නේවාසිකාගාර ක්‍රමයක් දිස්ත්‍රික් මට්ටමින් ගොඩ නැගෙනු ඇත.

VIII පාසල්වල ඉගෙනීම ලබන දරුවන් සිටින විශ්‍රාමිකයින්ගේ වැටුපට ඒ දරුවන් ගණන අනුව අමතර දීමනාවක් එකතු කරනු ඇත.

### 3.2.7 මහින්ද චින්තන ප්‍රතිපත්ති ප්‍රකාශය (2005)

"ජ්‍යෙෂ්ඨ පුරවැසි බුහුමන්" වැඩසටහන

"තම ජීවිතය දරුවන් වෙනුවෙන්, රටදැය වෙනුවෙන් කැප කළ ජ්‍යෙෂ්ඨ පුරවැසියන්ට තනිවන්නට මම ඉඩ නොතබමි. රජයේ සේවකයන්ගේ වැටුප් වැඩි කිරීම්වලට සාපේක්ෂව විශ්‍රාම වැටුප්ද වැඩි කිරීමට පියවර ගන්නේය. දැනට විශ්‍රාම වැටුප් ලබන සියලුම සේවා කාණ්ඩයන්හි පවතින විෂමතා ඉවත් කොට විශ්‍රාමිකයන්ගේ ආත්ම ගෞරවය ආරක්ෂාවන අන්දමට විශ්‍රාම වැටුප් ක්‍රමය සංශෝධනය කරමි"

"රාජ්‍ය අංශය"

"රජයේ සේවකයන්ගේ විශ්‍රාම වැටුප් පිළිබඳව මෑත කාලයේදී සිදු කරන ලද සියලුම සංශෝධනයන් ඉවත් කොට මේ වන විට රාජ්‍ය සේවයේ යෙදෙන සියලුම දෙනාටත් ඉදිරියේදී බඳවාගන්නා ලද සියලුම දෙනාටත් විශ්‍රාම වැටුප් ලැබීමට ඇති අයිතිය සහතික කරමි "

මහින්ද චින්තන ප්‍රතිපත්ති ප්‍රකාශය පදනම් කරගෙන 2006 අයවැය ලේඛනය තළින් 1997.01.01 දිනය පදනම් කරගෙන විශ්‍රාම වැටුප් විෂමතා ඉවත් කිරීමටත් එමෙන්ම 2003 සිට 2007 දක්වා ක්‍රියාත්මක වූ දායකත්ව විශ්‍රාම වැටුප් ක්‍රමය අහෝසි කොට යලිත් පැරණි විශ්‍රාම වැටුප් ක්‍රමය ක්‍රියාත්මක කිරීමටත් තීරණය විය.

### 3.2.8 මහින්ද චින්තන ඉදිරිදැක්ම ප්‍රතිපත්ති ප්‍රකාශය දෙවන පියවර (2010)

විශ්‍රාම දිවියට අක්වැලක් ...........

අත්දැකීම්වලින් පෝෂණය වූ අප රටේ විශ්‍රාමික රජයේ සේවකයන්ට ගෞරවයක් සහිතව රට සංවර්ධනය කිරීමේ ක්‍රියාවලියේදී ද උපදේශනාත්මක භූමිකාවක් නිරූපණය කිරීමෙන් සක්‍රීය දායකත්වයක් ලබා දීම සඳහා පහත සඳහන් පියවරයන්ද අනුගමනය කිරීමට අපේක්ෂා කරමි.

- විශ්‍රාමිකයින් මාසිකව ලබන විශ්‍රාම වැටුප "රට වෙනුවෙන් කිසිදු සේවාවක් ඉටු කිරීමෙන් තොරව ලබන පිං පඩියක්" බවට පසුගිය ආණ්ඩු විසින් ගොඩනැගූ මතය සහමුලින්ම ප්‍රතික්ෂේප කොට දීර්ඝ කාලයක් ඔවුන් රට වෙනුවෙන් ඉෂ්ට සිද්ධ කරන ලද ඉමහත් සේවාව වෙනුවෙන් අනිවාර්යයෙන් ඔවුන්ට ලැබිය යුතු ගෞරවාන්විත දීමනාවක් බැවින් එකී සත්‍යය සමාජය වෙත තදින් කා වැද්දීමට පියවර ගනිමි.
- රාජ්‍ය ආයතන හා බැංකු ආශ්‍රිතව විවිධ වූ මහජන සේවාවන් ලබා ගැනීමට යන්නා වූ විශ්‍රාමිකයින්ට දැනට ලැබෙන ප්‍රමුඛතාව තවත් පුළුල් කොට විශ්‍රාමික හැඳුනුම්පත, ජ්‍යෙෂ්ඨ පුරවැසි හැඳුනුම්පත හෝ වැඩිහිටි හැඳුනුම්පත ඉදිරිපත් කිරීමෙන් ඕනෑම ආයතනයකින් ප්‍රමුඛතාවය ලබා ගත හැකි වැඩපිළිවෙලක් ඉදිරියට ක්‍රියාත්මක කරමි.

- විශ්‍රාම වැටුප් ලබා ගැනීමේ ක්‍රියාවලියේදී ජ්‍යෙෂ්ඨ පුරවැසියන් මුහුණපාන දුෂ්කරතා සහ රස්තියාදුවීම් වලක්වා ගැනීම සඳහා විශ්‍රාම වැටුප නිවසටම ලැබෙන ක්‍රමයක් ක්‍රියාත්මක කරමි.
- 2006 ට පෙර විශ්‍රාම ලැබූ සියළුම රජයේ සේවකයින්ගේ විශ්‍රාම වැටුප 2006 වැටුප් ක්‍රමයට ගැලපෙන අයුරින් සකස් කොට මීලඟ අයවැයේ සිට ක්‍රියාත්මක කරමි.
- විශ්‍රාමික රජයේ සේවකයන්ට සෞඛ්‍ය පහසුකම් වෙනුවෙන් ඖෂධ සහ වෛද්‍ය ගාස්තු සඳහා වර්ෂයකට රුපියල් 10,000 ක් වන සෞඛ්‍ය රක්ෂණ ක්‍රමයක් හඳුන්වා දෙන්නෙමි..............
- වයස අවුරුදු 60 ඉක්මවන ජ්‍යෙෂ්ඨ පුරවැසියන් සතු ස්ථිර තැන්පතු සඳහා විශේෂ පොලී ප්‍රසාද දීමනාවක් ලබා දීමට කටයුතු කරමි.
- වැඩිහිටි අසරණ සරණ දීමනාව රුපියල් 1000 දක්වා ඉහළ නංවමි.
- දැනට පවත්නා රජයේ වැඩිහිටි නිවාස උසස් තත්වයට පත් කිරීම සඳහා කටයුතු කරන අතර පෞද්ගලික අංශය හෝ විවිධ සංවිධාන මඟින් පවත්වාගෙන යන වැඩිහිටි නිවාස දියුණු කිරීම පිණිස ආනයනය කෙරෙන උපකරණ ආදිය ආනයන බදුවලින් නිදහස් කරමි.

## 3.3 විශ්‍රාම වැටුප් විෂමතාවය ඉවත් කර ගැනීමේ අරගලය

ඉහත සඳහන් කරන ලද විවිධ ප්‍රතිපත්ති ප්‍රකාශන, කොමිෂන් සභා වාර්තා, කමිටු වාර්තා හා නිර්දේශයන්හි විශ්‍රාම වැටුප් විෂමතාවය සම්බන්ධව අදහස් සහ එය ඉවත් කිරීම පිළිබඳව විවිධ යෝජනා ඇතුළත් විය. මෙහිදී විශ්‍රාම වැටුප් විෂමතාවය යනුවෙන් අදහස් කරනු ලැබුවේ විවිධ වූ හේතු මුල් කර ගනිමින් රාජ්‍ය අංශයේ විශ්‍රාමිකයින් අතර විශ්‍රාම වැටුපෙහි විෂමතාවයක් පැවතීමයි. එනම් එකම තනතුරක එක හා සමාන ලෙස සේවය කළ පුද්ගලයින් දෙදෙනෙක් විශ්‍රාම ගන්නා දිනය අනුව විශ්‍රාම වැටුපෙහි වෙනසක් පැවතීමයි.

1997.01 .01 දින රාජ්‍ය සේවයෙහි වැටුප් සැලකිය යුතු අයුරින් වැඩි විය. එදිනට පෙර විශ්‍රාම ලැබූ සමාන මට්ටමේ නිලධාරියකුගේ විශ්‍රාම වැටුපට වඩා එදිනට පසු විශ්‍රාම ලැබූ සමාන මට්ටමේ නිලධාරියකුගේ විශ්‍රාම වැටුප ඉහළ අගයක් ගන්නා ලදී. යම් රජයේ නිලධාරියකු අවසන් වශයෙන් ලබන වැටුප හා ඔහුගේ සේවා කාලයට අනුව විශ්‍රාම වැටුප තීරණය වේ. ඒ අනුව රාජ්‍ය සේවයේ සෑම වැටුප් වැඩි වීමක් සමඟම ඊට පෙර විශ්‍රාම ලැබුවන්ගේ විශ්‍රාම වැටුප අතර විෂමතාවයක් පැන නඟී. මෙම තත්වයම 2006 වසරේදී යළි ඇති විය. 2006.01.01 දින සිට රාජ්‍ය සේවයේ විශාල වැටුප් වැඩිවීමක් සිදුවිය. ඒ සමඟම එදිනට පෙර සහ එදිනට පසු වශයෙන් යළිත් විශ්‍රාම වැටුප් විෂමතාවයක් පැන නැඟී ඇත.

ඒකනායක කොමිෂන් සභා නිර්දේශයන්ට අනුව 2004 වසරේදී විශ්‍රාම වැටුප් විෂමතා ඉවත් කිරීමට කිසියම් දුරකට කටයුතු කරන ලදී. විශ්‍රාම වැටුප් චක්‍රලේඛ 6/2004 මඟින් ඊට විධිවිධාන සලසන ලදී. ඒ අනුව 1996.12.31 දිනය පදනම් කොට විශ්‍රාම වැටුප් විෂමතාවය ඉවත් කරන ලදී. මින් අදහස් වූයේ 1996.12.31 දිනට පෙර විශ්‍රාම ලැබූ සියළුම රාජ්‍ය නිලධාරීන් 1996.12.31 දින සේවයේ යෙදී සිටියේය යන උපකල්පනය මත එදිනට හිමි වැටුප මත විශ්‍රාම වැටුප යළි සකස් කිරීමයි.

උදා:- 1994.10.06 වන දින ශ්‍රී ලංකා ගුරු සේවය ස්ථාපිත කරන ලද අතර ඒ නිසාම ගුරු සේවයේ වැටුප් සැලකිය යුතු පරිදි ඉහළ යන ලදී. එම වාසි ලැබුනේ 1994.10.06 දින සේවයේ යෙදී සිටි ගුරුවරුන්ට පමණි. ඊට පෙර විශ්‍රාම ලැබූ කිසිම ගුරුවරයකු ගුරු සේවයට අන්තර්ග්‍රහණය නොවීය. මේ නිසා 1994.10.06 දිනට පෙර විශ්‍රාම ලැබූ අයට වඩා වැඩි විශ්‍රාම වැටුපක් එදිනට පසු විශ්‍රාම ලැබුවන්ට හිමි විය. විශ්‍රාම වැටුප් විෂමතා ඉවත් කිරීම යටතේ 1996.12.31 දින සේවයේ යෙදී සිටියේය යන උපකල්පනය මත

සහ එදිනට හිමි වැටුප මත විශ්‍රාම වැටුප් විෂමතා ඉවත් කිරීම සමඟ ගුරු සේවයට අන්තර්ග්‍රහණය නොවූ ගුරුවරුන්ගේ විශ්‍රාම වැටුපද ගුරු සේවයට අන්තර්ග්‍රහණය වූ ගුරුවරුන්ගේ විශ්‍රාම වැටුප හා සමාන ලෙස ඉහළ යන ලදී.

ඒකනායක කමිටු වාර්තාව 1997.01.01 දිනය පදනම් කොට විශ්‍රාම වැටුප් විෂමතා ඉවත් කිරීමට යෝජනා කරනු ලැබුවත් පැවති මුදල් ප්‍රතිපාදන ගැටළු හේතුවෙන් විශ්‍රාම වැටුප් විෂමතා ඉවත් කරනු ලැබුවේ 1996.12.31 දිනය පදනම් කරගෙනය. එයද ක්‍රියාත්මක කරනු ලැබුවේ හිඟ විශ්‍රාම වැටුප් ගෙවීමකින් තොරව 2004.01.01 දින සිටය. මෙම විෂමතා ඉවත් කිරීමේදී ගුරුසේවය හා විදුහල්පති සේවය වැනි සේවාවන්ට වාසිදායක තත්වයක් ඇති වුවත් අනෙකුත් සේවාවන්ට එතරම් වාසි දායක තත්වයක් ඇති නොවීය.

1996.12.31 දිනට පෙර විශ්‍රාම ලැබූ හා 2004.01.01 දිනට විශ්‍රාම වැටුප් ලබන විශ්‍රාමිකයින්ගේ විශ්‍රාම වැටුප 6/2004 විශ්‍රාම වැටුප් විෂමතා ඉවත් කිරීමේ චක්‍රලේඛය යටතේ පහත සඳහන් පරිදි සංශෝධනය විය. ඒ අනුව විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා සංග්‍රහයේ පහත දැක්වෙන වගන්ති යටතේ විශ්‍රාම ලැබූවන්ට එම සංශෝධනය අදාළ විය.

| විශ්‍රාම යාමේ හේතුව | වගන්ති |
|---|---|
| (අ) වයස අවු 55 හා 60 අතර විශ්‍රාම ගැනීම | 17 සහ 26 (IX) |
| (ආ) වයස අවු: 60 දී විශ්‍රාම ගැන්වීම | 17 |
| ▪ වෛද්‍ය හේතූන් මත විශ්‍රාම ගැනීම | 14 |
| ▪ තනතුර අහෝසි කිරීම නිසා හෝ දෙපාර්තමේන්තුව වසා දැමීම නිසා විශ්‍රාම ගැන්වීම | 7 |
| ▪ රාජ්‍ය භාෂා ප්‍රතිපත්තිය නිසා විශ්‍රාම ගැනීම | 48 (ක) |
| ▪ විශ්‍රාම වැටුප අවුරා තබා මණ්ඩලයකට හෝ සංස්ථාවකට ගොස් එම ආයතනයෙන් විශ්‍රාම යාම හෝ විශ්‍රාම ගැන්වීම | 48 (අ) |
| ▪ හෙදියන් ගුරුවරියන් හෝ පොළිස් නිලධාරියන් සඳහා වයස අවුරුදු 50 එලඹෙන දිනය හෝ සේවා කාලය වසර 20 ක් සම්පූර්ණ වන දිනය යන දින දෙකෙන් පළමුව එලඹෙන දිනයේ දී විශ්‍රාම යාම | 14 |
| ▪ විෂමාචාර ක්‍රියාවන් මත විශ්‍රාම ගැන්වීම | 12 |
| ▪ රා.ප.ච. අංක 30/88 යටතේ විශ්‍රාම ගැන්වීම | 14 |
| ▪ අකාර්යක්ෂමතාවය නිසා විශ්‍රාම ගැන්වීම | 15 |
| ▪ ශ්‍රේෂ්ඨාධිකරණයේ, අභියාචනාධිකරණයේ, මහාධිකරණයේ විනිශ්චයකාරවරුන් සහ අධිකරණ නිලධාරීන් විශ්‍රාම ගැන්වීම | 25 |
| ▪ රා.ප.ච 44/90 යටතේ විශ්‍රාම ගැනීම | 2(1) අ<br>2(1) ආ<br>2(1) ඇ |
| ▪ විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා සංග්‍රහයේ "ට" උපලේඛනයේ සඳහන් වූ ධුරයකින් විශ්‍රාම ගැනීම | 2 අ අ |

### 3.3.1 විෂමතා ඉවත් කිරීමේ චක්‍රලේඛය යටතේ විශ්‍රාම වැටුප් සංශෝධනය කිරීමේ ක්‍රියාවලිය

01. විශ්‍රාමිකයාගේ විශ්‍රාම වැටුප් ලිපිගොනුව ආශ්‍රයෙන් ඔහු/ඇය විශ්‍රාම යන අවස්ථාවේදී දරන ලද තනතුර, තනතුර අයත් සේවාව, පන්තිය හා ශ්‍රේණිය ද අවසාන වරට ලැබූ වැටුප් කාණ්ඩය, වැටුප් ක්‍රමය, වැටුප් පියවර හා වාර්ෂික වැටුප නිශ්චය කර ගැනීම.

02. විශ්‍රාම යන අවස්ථාවේදී සේවා කාලය හා වැටුප් රහිත නිවාඩු ප්‍රමාණය නිර්ණය කර ගැනීම.

03. ඉහත සඳහන් විස්තර අනුව 1996.12.31 වැනි දිනට අදාළ අනුරූපිත වැටුප තීරණය කිරීම.

04. අනුරූපිත වැටුප් හා සේවා කාලය පදනම් කරගෙන 1996.12.31 දිනට පැවති විශ්‍රාම වැටුප් ගණන් බැලීමේ ක්‍රමය මත විශ්‍රාම වැටුප නැවත ගණන් බැලීම.

05. 1996.12.31 වැනි දිනට ගණන් බලන ලද විශ්‍රාම වැටුප අනුව එදිනට හිමි දීමනා තීරණය කිරීම. රුපියල් 600 දීමනාව හා විශ්‍රාම වැටුප් ප්‍රදානය අනුව අඩු නොකළ මාසික විශ්‍රාම වැටුප රු.4060 ට හෝ ඊට අඩුවන අවස්ථාවේදී රු. 260 ක ජීවන වියදම් දීමනාවක් 1996.12.31 වැනි දිනට හිමිවේ. ජීවන වියදම් දීමනාව තීරණය කිරීමේදී ප්‍රදානය අනුව අඩු නොකළ විශ්‍රාම වැටුප ලෙස සැලකිය යුත්තේ නව සංශෝධිත විශ්‍රාම වැටුපයි. (විශ්‍රාම වැටුප් චක්‍රලේඛ 5/99).

06. 1997 හා 1998 විශ්‍රාම වැටුප් වැඩිවීම් ලබා දීම.
මෙහිදී 1996.12.31 වැනි දිනට හිමි අඩු නොකළ මාසික විශ්‍රාම වැටුපට ඉහත 5 සඳහන් පරිදි දීමනා එකතු කර, එම මුදල මත 10% කින් විශ්‍රාම වැටුප වැඩිකර ඉන් 5% ක් 1997.01.01 වැනි දින සිට ද ඉතිරි අර්ධය 1998.01.01 වැනි දින සිට එකතු කළ යුතුය. (රා.ප.ච 21/97 (III); විශ්‍රාම වැටුප් චක්‍රලේඛ 1/97 (I)

07. 2000.01.01 වැනි දින සිට මාසික විශ්‍රාම වැටුප රු. 4000 හෝ ඊට අඩු සියළුම විශ්‍රාමිකයින්ට ඔවුන් ලබන විශ්‍රාම වැටුපට රු. 400 ක් එකතු කළ යුතුය. එසේම මාසික විශ්‍රාම වැටුප රු. 4001 සිට රු. 4399 දක්වා ලබන සියළුම විශ්‍රාමිකයින්ගේ මාසික විශ්‍රාම වැටුප රු. 4400 ලෙස සැලකිය යුතුය. (විශ්‍රාම වැටුප් චක්‍රලේඛ 1/2000)

08. 2004.01.01 වැනි දිනට අදාළ විශ්‍රාම වැටුප් වැඩිවීම ලබා දීම.
2003.12.31 දිනට හිමි අඩු නොකළ විශ්‍රාම වැටුප 2004.01.01 දින සිට 10% කින් වැඩි කිරීම (විශ්‍රාම වැටුප් චක්‍රලේඛ 17/2003)

09. ඉහත සඳහන් පරිදි පරිවර්තනය කරන ලද අඩු නොකළ හෝ අඩුකළ නාව සංශෝධිත විශ්‍රාම වැටුප, (අදාල පරිදි) 2004.01.01 වැනි දිනට ගෙවන ලද විශ්‍රාම වැටුපට වඩා වැඩි වන්නේ නම් හිඟ මුදල 2004.01.01 වැනි දින සිට ගෙවීම.

10. සංශෝධිත මාසික විශ්‍රාම වැටුප දැනට ගෙවන විශ්‍රාම වැටුපට වඩා අඩුවන විට දැනට ගෙවන විශ්‍රාම වැටුප එලෙසම ඇරිය යුතුය.

සංශෝධිත විශ්‍රාම වැටුපට දීමනා එකතු කිරීම

01. වි.වැ.ච.ලේ 9/2000 හා 9/2000 (i) යටතේ ගෙවනු ලබන රු. 500 අවමයකට යටත්ව අඩු නොකළ විශ්‍රාම වැටුප මත දැනට ගෙවනු ලබන 10% අතුරු දීමනාව සංශෝධිත විශ්‍රාම වැටුප අනුව ගැලපිය යුතුය.

02. වි.වැ.ච.ලේ 7/2001 යටතේ දැරිය යුතු රු. 750 ක දීමනාව තවදුරටත් දැරිය යුතුය.

## 3.4 විශ්‍රාම වැටුප් සංශෝධනයේදී සැළකිල්ලට ගත් විශේෂ කරුණු

01. විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා සංග්‍රහයේ 7 වැනි වගන්තිය යටතේ තනතුර අහෝසි කිරීම නිසා හෝ දෙපාර්තමේන්තුව වසා දැමීම නිසා විශ්‍රාම ගත්වා ඇත්නම් දළ සේවා කාලය අවු. 5 ක් එකතු කර ගණන් බැලිය යුතුය.

02. විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා සංග්‍රහයේ 2අ.අ වගන්තියට සම්බන්ධව "ට" උපලේඛණයේ (ඇමුණුම 8) සඳහන් ධුරයකින් විශ්‍රාම ගැන්වීම සිදුකර ඇත්නම් 1996.12.31 දිනට විශ්‍රාම වැටුප් ගණන් බැලිය යුත්තේ පහත සඳහන් පරිදිය.

(අ) අවුරුදු 5 ක දළ සේවා කාලයක් සඳහා 1996.12.31 වැනි දිනට අනුරූපිත මාසික වැටුපෙන් 1/3 ක්ද, එයට වැඩි සම්පූර්ණ කරන ලද සෑම වසරක් සඳහා 1/30 බැගින් එකතු කළ යුතුය. කෙසේ වෙතත් මෙම විශ්‍රාම වැටුප 1996.12.31 වැනි දිනට හිමි මාසික වැටුපෙන් 2/3 ක් නොඉක්ම විය යුතුය.

03. අමාත්‍ය මණ්ඩලයේ/අමාත්‍යාංශ ලේකම් තනතුරක් සඳහා එම තනතුරට රාජ්‍ය සේවයෙන් බාහිරව පත්කළ නිලධාරීන්ගේ විශ්‍රාම වැටුප් ගණනය කළ යුත්තේ පහත සඳහන් පරිදිය.

(අ) අදාළ නිලධාරියා අවුරුදු 5 ක සේවා කාලයක් සම්පූර්ණ කර ඇත්නම් 1996.12.31 දිනට අනුරූපිත වැටුපෙන් 2/3 ක විශ්‍රාම වැටුපක් ලබා දිය යුතුය.

(ආ) අවුරුදු 5 කට වඩා වැඩිවන සෑම මසකටම 0.51% බැගින් ඉහත ප්‍රතිශතයට එකතු කළ යුතුය.

(ඇ) මෙසේ ගණන් බැලිය හැකි සම්පූර්ණ සේවා කාලය අවුරුදු 08 ක් වන අතර විශ්‍රාම වැටුප් ප්‍රතිශතය 85% ක උපරිමයකට යටත් විය යුතුය.

04. විනිශ්වයකරුවන්, අධිකරණ හා නීති නිලධාරීන්ගේ විශ්‍රාම වැටුප් 1996.12.31 වැනි දිනට ගණන් බැලිය යුතු වන්නේ පහත සඳහන් පරිදිය :-

(අ) ශ්‍රේෂ්ඨාධිකරණයේ හෝ අභියාචනාධිකරණයේ විනිශ්වයකරුවකු තත්වයෙන් හෝ නැත්නම් ඒ දෙයාකාරයෙන්ම හෝ මාස 36 ත් විශ්‍රාම ගත්තා අවස්ථාවේදී ලද වැටුපෙන් 90% ක පදනම මත ගණන් බලන ලද විශ්‍රාම වැටුපක් හිමිවේ.

(ආ) මහාධිකරණ විනිශ්වයකරුවෙකු වශයෙන් මාස 84 කට නොඅඩු සේවා කාලයක් සම්පූර්ණ කර එම ධූරයෙන් විශ්‍රාම ගිය විට විශ්‍රාම වැටුපකට හිමිකම් ලැබේ. මහාධිකරණ විනිශ්වය කරුවෙකු වශයෙන් සේවා කාලය මාස 168 ට නොඅඩු නම් අවු. 30 ක සේවා කාලයක් සම්පූර්ණ කර ඇති සේ සලකා ඊට අදාල ප්‍රතිශතය මත විශ්‍රාම වැටුපක් දැරිය හැක. මාස 180 කට අඩුවන්නාවූ සෑම මාස 6 ක් හෝ ඉන් කොටසක් සඳහාම මාස 180 ට හිමි ප්‍රතිශතයෙන් 01 % බැගින් අඩු කළ යුතුවේ.

(ඇ) යම් නීති නිලධාරියකු එවැනි නිලධාරියෙකු ලෙස මාස 120 ට නොඅඩු සේවා කාලයක් සම්පූර්ණ කර ඇත්නම් මාසික විශ්‍රාම වැටුපක් හිමිවේ. එසේම නීති නිලධාරියෙකු එවැනි නිලධාරියෙකු ලෙස මාස 300 ට නොඅඩු සේවා කාලයක් සහිතව විශ්‍රාම ලබා ඇත්නම් අවුරුදු 30 ක සේවා කාලයක් සම්පූර්ණ කර ඇති සේ සලකා ඊට අදාළ ප්‍රතිශතය මත විශ්‍රාම වැටුපක් දැරිය හැක. මාස 300 ට අඩුවන්නා වූ සෑම මාස 6 ක් හෝ ඉන් කොටසක් සඳහාම මාස 300 ට හිමි ප්‍රතිශතයෙන් 01 % බැගින් අඩු කළ යුතුවේ.

සටහන :-

අවුරුදු 30 ක සේවා කාලයකට අදාළ විශ්‍රාම වැටුප් ප්‍රතිශතය සඳහා 6/2004 විශ්‍රාම වැටුප් චක්‍රලේඛයේ 01 ඇමුණුම භාවිතා කරන්න.

05. විශ්‍රාම ගන්නා දිනය හා ගෙවීම ආරම්භ වන දිනය වෙනස් වන විට ක්‍රියා කළ යුතු ආකාරයඃ

විශ්‍රාම ගන්නා දිනයේදී අවසන් වරට ලැබූ වැටුප, කල්පිත පදනම මත 1996.12.31 වැනි දිනට පරිවර්තනය කර විශ්‍රාම වැටුප සංශෝධනය කළ යුතුය.

උදාඃ-
- විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා සංග්‍රහයේ 48 (අ) යටතේ විශ්‍රාම ගැනීම.
- රා.ප.ච 30/88 හා රා.ප.ච 44/90 හි 2 (1) අ යටතේ විශ්‍රාම ගැන්වීම.
- විශ්‍රාම ගන්නා දිනට පසු දිනයක සිට විශ්‍රාම වැටුප් ගෙවීමට විනය නියෝගයක් නිකුත් කර ඇති අවස්ථාවකදී.

### 3.4.1 විශ්‍රාම වැටුප් ගෙවීම් ගොනුව පමණක් ඇති අවස්ථාවක දී ක්‍රියා කළ යුතු ආකාරය

01. විශ්‍රාම වැටුප් ප්‍රදාන පත්‍රය අනුව විශ්‍රාමිකයා දරන ලද තනතුරක, තනතුර අයත් සේවාව, පංතිය හා ශ්‍රේණිය හඳුනා ගැනීම

02. ප්‍රදාන පත්‍රය අනුව විශ්‍රාම ගත් දිනයේදී ලබමින් සිටි වාර්ෂික වැටුපට අනුව මේ සමඟ ඉදිරිපත් කර ඇති වැටුප් පරිවර්තන වගු ආශ්‍රයෙන් 1996.12.31 වැනි දිනට අදාළ වන්නාවූ වැටුප් පියවර තෝරා ගැනීම. පරිවර්තන වගු ඉදිරිපත් කර නොමැති තනතුර සම්බන්ධයෙන් වන විට විශ්‍රාම යන අවස්ථාවේදී ලබමින් සිටි වැටුපට අනුරූපී 1996.12.31 වැනි දිනට නියමිත වැටුප අදාළ වැටුප් චක්‍රලේඛ ආශ්‍රයෙන් සොයාගත යුතුය.

03. විශ්‍රාම වැටුප් සහිත දීමනාවක් හෝ උපයාගත් වැටුප් වර්ධක අනුපාත අගයක් ලබා දී ප්‍රදාන පත්‍රයේ විශ්‍රාම ගත් දිනයේදී ලබමින් සිටි වැටුප සඳහන් කර තිබේ නම් එම දීමනාව/ උපයාගත් වැටුප් වර්ධක අනුපාත අගය රහිත වැටුප පදනම් කරගෙන 1996.12.31 වැනි දිනට අනුරූපීව වැටුප තීරණය කළ යුතුය.

04. විශ්‍රාම වැටුප් ප්‍රදාන පත්‍රයේ පන්තිය හෝ ශ්‍රේණිය නොමැතිව තනතුර පමණක් සඳහන්ව තිබීම නිසා වැටුප් පියවර නිශ්චය කළ නොහැකි අවස්ථාවක පහත දැක්වෙන පියවර අනුගමනය කරන්න.

(අ) විශ්‍රාමිකයාගෙන් ඔහු සතුව තිබිය හැකි සේවා ලියකියවිලි ගෙන්වා පරීක්ෂා කර ශ්‍රේණිය, පන්තිය පිළිබඳව නිගමනයකට එළඹීම.

(ආ) ලියකියවිලි ඉදිරිපත් කිරීමට අපොහොසත් වන අවස්ථාවකදී විශ්‍රාමිකයාගෙන් දිවුරුම් ප්‍රකාශයක් මඟින් තොරතුරු ලබා ගැනීම.

(ආ) විශ්‍රාම යන අවස්ථාවේදී දැරූ තනතුරේ/ශ්‍රේණියේ සේවා කාලයට සමාන වැටුප් වර්ධක සංඛ්‍යාවක් 1996.12.31 දිනට අදාළ වැටුප් පරිමාණයේ උපරිමයේ උපරිමය ඉක්මවා නොයන සේ ලබා දිය යුතුය.

**3.4.2 විශ්‍රාම වැටුප් අංක කාණ්ඩ 4 ලක්ෂ, 5 ලක්ෂ, 6 ලක්ෂ හා 7 ලක්ෂ යටතේ විශ්‍රාම වැටුප් ගණන් බැලීමේදී සම්පූර්ණ සේවා කාලය සලකා නොමැති අවස්ථාවේදී ක්‍රියා කළ යුතු ආකාරය**

01. මෙවැනි අවස්ථාවලදී විශ්‍රාම වැටුප් ප්‍රදාන පත්‍රයේ සඳහන් කර ඇත්තේ ශුද්ධ සේවා කාලය "මාස 120 ට අධිකය" "මාස 240 ට අධිකය" හෝ "මාස 360 ට අධිකය" වශයෙනි. එම නිසා පහත සඳහන් පරිදි කටයුතු කරන්න.

i. සම්පූර්ණ සේවා කාලය පොදු 55 විශ්‍රාම වැටුප් අයදුම්පත්‍රයේ 15 වැනි ඡේදයේ සඳහන් කර ඇත්නම් හා චර්යා සටහන් මඟින් එම සේවා කාලය තහවුරු වේ නම් එම සේවා කාලය අදාළ කරගෙන විශ්‍රාම වැටුප සංශෝධනය කරන්න.

ii. විශ්‍රාම වැටුප් ලිපිගොනුවේ ඇති පොදු 55 අයදුම්පතේ සම්පූර්ණ සේවා කාලය සඳහන් කර නොමැති නම් හෝ එම අයදුම්පත්‍රයේ ඇති සේවා කාලය සඳහන් කර නොමැති නම් හෝ එම අයදුම්පත්‍රයේ ඇති සේවා කාලය සනාථ කිරීමට චර්යා සටහන් නොමැති නම් හෝ විශ්‍රාමිකයන්ගේ සියලුම සේවා කාලයන් පිළිබඳ නිශ්චිත තොරතුරු ලබා ගැනීම සඳහා දිවුරුම් සහතිකයක් ලබා ගන්න.

iii. එම දිවුරුම් ප්‍රකාශයේ ඔහුගේ/ඇයගේ උපන්දිනය, සේවයේ මුල් පත්වීම් දිනය, විශ්‍රාම ගිය දිනය, ඇතුලත් කිරීම අනිවාර්යය වන අතර, ඊට අතිරේකව සේවා කාලය හඳුනාගත හැකි වෙනත් සාක්ෂි ඉදිරිපත් කළ හැකි නම් ඒවාද සඳහන් කළ යුතුය.

iv. දිවුරුම් ප්‍රකාශයේ සඳහන් කර ඇති උපන් දිනය, මුල් පත්වීම් දිනය සමඟ ගැලපීමේදී පිළිගත හැකි බව පෙනී යන්නේ නම් එම දිනය මුල් පත්වීම් දිනය ලෙස සලකා සේවා කාලය ගණනය කරන්න.

v. ගුරුභවතුන් සම්බන්ධයෙන් වන විට අධ්‍යාපන සී 8 ඒ අයදුම්පත්‍රයේ සඳහන් වන දෙපාර්තමේන්තුවේ ගුරුවරුන්ගේ ලේඛනයෙහි ප්‍රථමයෙන් ලියාපදිංචි කළ දිනය ලෙස සඳහන් කර ඇති දිනය මුල් පත්වීම් දිනය ලෙස සළකා සේවා කාලය ගණනය කරන්න. ගුරුභවතා විසින් ඉදිරිපත් කරන විශ්‍රාම වැටුප් විෂමතා ඉවත් කිරීම සඳහා තොරතුරු ලබාදීමේ දිවුරුම් ප්‍රකාශයෙන්ද මෙම සේවා කාලය තහවුරු විය යුතුය.

විශ්‍රාමික අර්ගලය වූයේ 1997.01.01 දිනය පදනම්කොට විශ්‍රාම වැටුප් විෂමතාවය ඉවත් කරගැනීමටයි. ඒකනායක කමිටුව වෙත විශ්‍රාමිකයින් හා විශ්‍රාමික සංවිධාන 155 දෙනෙකු ලිඛිත ඉල්ලීම් ඉදිරිපත් කර තිබුණි. එමෙන්ම මෙම කමිටුව විශ්‍රාමිකයින් හා විශ්‍රාමික සංගම් 13 සමඟ සම්මුඛ සාකච්ජා පවත්වා තිබුණි. ඒ සියල්ලන්ගේම ඉල්ලීම වී තිබුනේ 1997.01.01 දිනය පදනම් කොටගෙන විශ්‍රාම වැටුප් විෂමතාවය ඉවත් කරවා ගැනීමයි.

විශ්‍රාම වැටුප් චක්‍රලේඛ 2/2006 විධිවිධාන මඟින් 1997.01.01 දිනයට හිමි වැටුප පදනම් කොට විශ්‍රාම වැටුප් විෂමතා ඉවත් කිරීමට රජය තීරණය කරන ලදී. එහිදී පහත සඳහන් කොන්දේසි බලපාන ලදී.

2006 අයවැය යෝජනාවන්ට අනුව 1997.01.01 දිනය ට හිමි වැටුප පදනම් කොට පහත සඳහන් කොන්දේසි වලට අනුකූලව විශ්‍රාම වැටුප් විෂමතා ඉවත් කිරීමට රජය තීරණය කරන ලදී.

I. 2006 ජනවාරි 01 දින සිට මෙම චක්‍රලේඛය ක්‍රියාත්මක කිරීම
II. 1997.01.01 දින හෝ ඊට පෙර විශ්‍රාම ගොස් 2006.01.01 දින වන විට විශ්‍රාම වැටුප් ලබමින් සිටින විශ්‍රාමිකයින්ගේ විශ්‍රාම වැටුප සංශෝධනය කිරීම.
III. විශ්‍රාමික නිලධාරීන් තම තනතුරෙහි/සේවයෙහි 1997.01.01 දිනට අදාල වැටුප් ක්‍රමයෙහි සිටිනා සේ සලකා එම පදනම මත විශ්‍රාම වැටුප ගණන් බලා සංශෝධනය කිරීම.
IV. (විනය හේතු සහ සේවා අකාර්යක්ෂමතාවය මත විශ්‍රාම ගැන්වූවන් හැර) විශ්‍රාමිකයින්ගේ අවම සේවා කාලය අවු 25 ක්සේ සැලකීම සහ ඇමුණුම 1 හි සඳහන් ප්‍රතිශත මත කටයුතු කිරීම.
V. 1997.01.01 දිනට විශ්‍රාම වැටුපට එකතු කරන ලද රු. 860 හෝ රු. 600 ක දීමනාව සහ රා.ප.ච. 2/97 (1) යටතේ ගෙවූ විශ්‍රාම වැටුප වැඩිවීම නොගෙවීම සහ එම දිනෙන් පසු අනුමත දීමනා සහ වෙනත් වැඩි කිරීම් තව දුරටත් ගෙවීම
VI. 2006.01.01 දිනට හිමි විශ්‍රාම වැටුප ගණන් බැලීමෙන් පසු මුළු වැඩිවීම අදියර දෙකකින් ගෙවනු ලැබේ. එනම් 2006.01.01 දිනට මුළු විශ්‍රාම වැටුප් වැඩිවීමෙන් 50% ක් දැරිය යුතු අතර ඉතිරි 50% 2007.01.01 දින සිට ගෙවිය යුතුය. (2006.01.01 දිනට පෙර කාලයට හිඟ විශ්‍රාම වැටුප් ගෙවනු නොලැබේ)
VII. 1997.01.01 දින සේවයේ යෙදී සිටියේය යන උපකල්පනය මත විශ්‍රාම වැටුප් ගණන් බලන අතර සේවා උසස් කිරීම්, වැටුප් වර්ධක හෝ රැදී සිටීමේ වාසි මෙම ගණනය කිරීම සඳහා අදාළ නොවේ.
VIII. විශ්‍රාමික නිලධාරීන් විශ්‍රාම ගන්නා දිනට ලැබූ වැටුප් පරිමාණයේ නියමිත වැටුප් පියවර 1997.01.01 දිනට අදාළ වැටුප් පියවරට කල්පිත පදනම මත පරිවර්තනය කරනු ලැබේ.
IX. ගුරු සේවය, විදුහල්පති සේවය, ගුරු අධ්‍යාපනඥ සේවය හා ශ්‍රී ලංකා පරිපාලන සේවය සම්බන්ධයෙන් අතිරේක චක්‍රලේඛ උපදෙස් සපයනු ලැබීය.
X. ත්‍රිවිධ හමුදා විශ්‍රාම ලැබූවන් සම්බන්ධයෙන් හමුදා මුලස්ථාන වලින් නිකුත් කරන ලද චක්‍රලේඛ උපදෙස් ආධාර කරගනිමින් එම වැටුප් පරිමාණයේ වැටුප් පියවරට අනුරූපී 1997.01.01 දිනට අදාල වැටුප් පියවරේ තබා විශ්‍රාම වැටුප සංශෝධනය කළ යුතුවේ.

මෙම විෂමතා වැඩසටහන තුළ සැළකිය යුතු වැටුප් වර්ධනයක් රාජ්‍ය සේවයේ සිදු විය.

2005 මහින්ද චින්තන ප්‍රතිපත්ති ප්‍රකාශනය හා 2006 අයවැය තුළින් 1997.01.01 දිනය පදනම් කොට ගෙන විශ්‍රාම වැටුප් විෂමතා ඉවත් කර ගැනීමට ප්‍රතිපාදන සලසා දී තිබුණි. එය පාදක කොට 2/2006 විශ්‍රාම වැටුප් චක්‍රලේඛය නිකුත් විය. ඒ අනුව 1997.01.01 දිනට පෙර විශ්‍රාම ලැබූ සියලුම විශ්‍රාමිකයින් 1997.01.01 දිනට සේවයේ යෙදී සිටියේය යන උපකල්පනය මත එදිනට හිමි වැටුප් පරිමාණය මත යළිත් විශ්‍රාම වැටුප ගණන් බලා 2006.01.01 දින සිට ගෙවනු ලැබීය. මේ නිසා විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා සංග්‍රහය සහ වැන්දඹු අනත්දරු විශ්‍රාම වැටුප් පනතින් ආවරණය ලැබ එකී විශ්‍රාම වැටුප් හිමිකම් ලබා 2006.01.01 දින ජීවත්ව සිටි විශ්‍රාමිකයින්, වැන්දඹුවන්, අනත්දරුවන් සහ අබාධිත අනත්දරුවන්ගේ විශ්‍රාම වැටුප එදින සිට සංශෝධනය විය.

විශ්‍රාම වැටුප් විෂමතාවයේ පළමු අදියර නිමවී ඇති නමුත් එය අවසානය නොවීය. 2004.01.01 දිනද 2004.12.01 දිනද රාජ්‍ය සේවයේ වැටුප් සුළු මට්ටමින් වැඩිවී 2006.01.01 දින එකී වැටුප විශාල වශයෙන් වැඩි විය. ඒ නිසාම 2006.01.01 දිනට පෙර විශ්‍රාම ලැබූවන් සහ එදිනට පසුව විශ්‍රාම ලැබූවන් අතර යළිත් විශ්‍රාම වැටුප් විෂමතාවයක් පැනනැගී ඇත. මේ නිසා වර්තමානයේදී 2006.01.01 දිනය පදනම් කොට විශ්‍රාම වැටුප් විෂමතාවය ඉවත් කිරීමේ අරගලය දියත් වී ඇත. ගතවූ කෙටි කාලසීමාව තුළ (2004 පසුව) විශ්‍රාම වැටුප් ප්‍රතිලාභ සම්බන්ධව පහත සඳහන් මෙහෙය සිදුවී ඇත.

## 3.5 රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් ප්‍රතිලාභ වර්ධනය

- දායකත්ව විශ්‍රාම වැටුප අහෝසි කොට රාජ්‍ය සේවකයන්ගේ විශ්‍රාම වැටුප් හිමිකම යළි ලබා දීම.
- රජයේ සේවකයන්ට ගෙවනු ලබන ජීවන වියදම් දීමනාව පදනම් කොට ගෙන ඉන් හරි අඩක ජීවන වියදම් දීමනාවක් විශ්‍රාමිකයින්ට ගෙවීම. මෙම දීමනාව 2012 වසර ආරම්භයේ රු. 2675/- ක් විය.
- 2008 සිට සෑම වසරකම ඔක්තෝබර් 08 දිනය ජාතික විශ්‍රාමික දිනය වශයෙන් නම් කිරීමට අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය ලබා දීම.
- ජ්‍යෙෂ්ඨ විශ්‍රාමික පුරවැසියන්ට "දේශකීර්ති ජ්‍යෙෂ්ඨ පුරවැසි ජනාධිපති සම්මාන" පිරිනැමීම.
- සේවයේ යෙදී සිටියදී සිදුවන හදිසි අනතුරුවලින් ආබාධිත වන හෝ මියයන රාජ්‍ය නිලධාරීන් සඳහා වසර 10 ක වැටුප විශේෂ වන්දි වශයෙන් ගෙවීම.
- උපකෘත/පෞද්ගලික පාඨශාලා ගුරුවරියනට වැන්දඹු පුරුෂ හා අනාත්දරු විශ්‍රාම වැටුප් හිමිකම ලබා දීම.

### රණවිරු සේවා විශ්‍රාම වැටුප් ප්‍රතිලාභ - පොලිස් සේවය

- සියළු පොලිස් උපසේවා නිලධාරීන් නිත්‍ය සේවයට අන්තර්ග්‍රහණය කොට ඔවුන් සියළුම දෙනාටම විශ්‍රාම වැටුපක් හා වැන්දඹු අනාත්දරු විශ්‍රාම වැටුප් හිමිකම ලබා දීම.
- පොලිස් සහායක සේවාවේ සියළු නිලධාරීන්ට ස්ථිර විශ්‍රාම වැටුප් තත්වය පිරිනැමීම.
- වෛද්‍ය සහතික රහිතව පොලිස් කාන්තාවන්ට වසර 20 ක සේවා කාලයකින් විශ්‍රාම යෑමට අවස්ථාව හිමිකර දීම.
- පූර්ණ වශයෙන් ආබාධිත වූ පොලිස් නිලධාරීන්ට වයස අවු: 55 දක්වා ගෙවන වැටුපකට හා එම සේවා කාලයට අදාළව විශ්‍රාම වැටුප් සංශෝධනය කිරීම.
- සන්නද්ධ හමුදා නිලධාරීන්ට මෙන්ම ත්‍රස්තවාදී හේතු මත ආබාධිත වන පොලිස් නිලධාරීන්ට දුබලතා විශ්‍රාම වැටුපක් ගෙවීම අනුමත කිරීම.

### රණවිරු සේවා විශ්‍රාම වැටුප් ප්‍රතිලාභ සන්නද්ධ හමුදා නිලධාරීන්/සාමාජිකයින්ගේ ප්‍රතිලාභ

- 2010 ජනවාරි සිට බල පැවැත්වෙන පරිදි සන්නද්ධ හමුදා සාමාජිකයන්ට පූර්ණ විශ්‍රාම වැටුපක් (85%) හිමිගන්වනු ලැබීය.
- ක්‍රියාන්විත රාජකාරි, ත්‍රස්තවාදී ක්‍රියා සහ නීතිය ක්‍රියාත්මක කිරීමේදී ආබාධිත තත්වයට පත්වන වෛද්‍ය මණ්ඩලය මගින් ඉවත් කරන ලද සන්නද්ධ හමුදා සාමාජිකයන්ට පූර්ණ විශ්‍රාම වැටුප් ප්‍රතිලාභ ලබා දීම. ඒ අනුව වයස අවු: 55 දක්වා ගෙවනු ලබන වැටුප හා ඊට අදාළ සේවා කාලය මත යළි විශ්‍රාම වැටුප් ප්‍රතිශෝධනය කිරීම.
- මියගිය, අතුරුදහන් විවාහක රණවිරුවන්ගේ වැන්දඹුවන් වෙත ගෙවනු ලබන වැටුප හා දීමනා වලින් 25% ක් දෙමාපියන් වෙත ගෙවීම හා අසාමාන්‍ය හේතුන් මත මියයන

සන්නද්ධ සේවා පුද්ගලයින් වෙනුවෙන් වැටුප් හා දීමනා ගෙවීම. ඒ අනුව දරුවන් නොමැති වැන්දඹුවන් යළි විවාහ වන විට වසර 10 ක වැටුප් හා දීමනාවට සමාන වන්දි මුදලක් එකවර වැන්දඹුවට ගෙවීම/ දරුවන් සිටින්නේ නම් වැටුප් හා දීමනා වලින් 50% ක් එකවර වැන්දඹුවට ගෙවීම. දරුවන්ට වන්දි ගෙවීමේ වයස අවු.26 දක්වා ඉහළ දැමීම, ත්‍රස්තවාදී ප්‍රදේශවලදී අසනීපවීම, දුෂ්කර හමුදා පුහුණුව, රිය අනතුරුවලට ලක්වීම, බංකර් කඩා වැටීම, දියේ ගිලීම, අකුණුසැර වැදීම, වෙනත් අයෙකු විසින් වෙඩි තැබීම, සර්පයින් දෂ්ට කිරීම, බෝම්බ අනපේක්ෂිත අයුරින් පිපිරියාම, අවිය අත්වැරදීමකින් පත්තුවීම වෙනුවෙන් හිමිකම් ප්‍රදානයට පියවර ගෙන තිබේ.

- ස්වෙච්ඡා බලසේනාවේ නිලධාරින්ට සහ කාන්තා සෙබළියන්ට වසර 15 ක සේවය සම්පූර්ණ කිරීමෙන් පසු විශ්‍රාම වැටුප් සඳහා හිමිකම ලබා දීම (නිත්‍ය බලසේනා සාමාජිකාවන්ට හිමිව තිබූ වරප්‍රසාද ස්වෙච්ඡා බලසේනා නිලධාරින් හා කාන්තා සෙබළියන්ට ලබා දීම)

- සන්නද්ධ හමුදා ස්වේච්ඡා බලසේනා සඳහා වැන්දඹු අනත්දරු විශ්‍රාම වැටුප් හිමිකම ලබා දීම.

මේ නිසා නිත්‍ය හමුදා සාමාජිකයා ඇවෑමෙන් හිමිවන වැන්දඹු අනත්දරු විශ්‍රාම වැටුප එලෙසම ස්වේච්ඡා බලසේනා සාමාජිකයන්ගේ වැන්දඹුවන්ටද හිමිකර දීමට පියවර ගත්තෙමි.

**සියයට 85 ක පූර්ණ විශ්‍රාම වැටුප් හිමිකම ලබා දීම**

ත්‍රස්තවාදය පරාජය කල 2009.05.19 දින සේවයේ සිටි සියලු නිලධාරින්/සාමාජිකයින් විශ්‍රාම යාමේදී මෙම ප්‍රතිශතය මත විශ්‍රාම වැටුප ගණන් බලන ලදී . එමෙන්ම ඊට පෙර විශ්‍රාම ලැබූවන් වසර 05 ක ක්‍රියාන්විත සේවයක යෙදී සිටියේ නම් මෙම සහනය හිමි විය. මේ අනුව සමස්ථ විශ්‍රාමික ප්‍රජාව වෙනුවෙන් බොහෝ දේ සිදුවී ඇත . එමෙන්ම විශ්‍රාම වැටුප් විෂමතාවය ඉවත් කර ගැනීමේ අරගලයෙහි පහත සඳහන් අවධීන් මේ වන විට පසුකොට ඇත.

1. ජාතික මට්ටමින් ක්‍රියාත්මක විශ්‍රාමික සංගම් නියෝජිතයින් විසින් ඒකරාශි වී 2006.01.01 දිනය පදනම් කොට විශ්‍රාම වැටුප් විෂමතාවය ඉවත් කර ගැනීමට සංදේශයක් සකස් කර ගැනීම. මෙම සංදේශය සකස් කිරීමේදී සමස්ත ලංකා විශ්‍රාමික සමිති ඒකාබද්ධ ජාතික සංවිධානය, රාජ්‍ය සේවා විශ්‍රාමිකයින්ගේ භාර අරමුදල, රාජ්‍ය හා පළාත් පාලන විශ්‍රාමික දීප ව්‍යාප්ත සමුළුව, උණ වැටුප් ලාභී විශ්‍රාමික ගුරු සංවිධානය, සමස්ත ලංකා යුධ හමුදා විශ්‍රාමික රණවිරු සංවිධානය, රජයේ හා පළාත් පාලන විශ්‍රාමිකයින්ගේ සංගමය, ශ්‍රී ලංකා සන්නද්ධ සේවා (යුධ, නාවුක, ගුවන්) විශ්‍රාමික සංගමය, පළාත් පාලන හා පළාත් රාජ්‍ය සේවා විශ්‍රාමිකයින්ගේ සංගමය, සමස්ත ලංකා විශ්‍රාමික දුම්රිය ස්ථානාධිපති සංගමය, විශ්‍රාමික දුම්රිය නියාමක නිලධාරීන්ගේ සංගමය සහ තවත් සංවිධාන කිපයක් ක්‍රියාකාරී විය. ඒ අනුව සමස්ථ විශ්‍රාමික ප්‍රජාවගේ මූලික ඉල්ලීම වූ 2006. 01. 01 දිනය පදනම් කොට ගෙන විශ්‍රාම වැටුප් විෂමතා ඉවත් කරන ලෙස ඉල්ලීම් කර ඇත. මෙම ඉල්ලීම අතිගරු ජනාධිපතිතුමා, ගරු අග්‍රාමාත්‍යතුමා, ගරු රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු පිළිබඳ අමාත්‍යතුමා හා වෙනත් අදාළ අංශ වෙත යොමු කොට ඇත .

2. ඉහත සංදේශයෙහි කරුණු පිළිබඳව ජාතික වැටුප් හා සේවක සංඛ්‍යා කොමිෂන් සභාව විසින්ද ඔවුන්ගේ නිර්දේශ ලබා දී තිබේ.



10 - H39510

විශ්‍රාම වැටුප් සම්බන්ධයෙන් ජාතික වැටුප් හා සේවක සංඛ්‍යා කොමිෂන් සභාව විසින් නිර්දේශ කරනු ලැබූ ප්‍රතිපත්තිමය මූල ධර්මයන්

1. රජයේ සේවයේ වැටුප් සංශෝධනය කරනු ලැබීමේදී අදාළ සංශෝධනයට පෙර විශ්‍රාම ලැබූ සහ ඉන්පසුව විශ්‍රාම ලබන විශ්‍රාමිකයින් අතර විශ්‍රාම වැටුප් සම්බන්ධයෙන් ඇති වන විෂමතාවයන්ට පිළියම් වශයෙන් ගත යුතු ක්‍රියාමාර්ගයක් ලෙස "රාජ්‍ය සේවක වැටුප් සංශෝධනය හා සමගාමීව විශ්‍රාම වැටුප් සංශෝධනයද කළ යුතුය." යනුවෙන් රජය විසින් මේ වන විට ද ප්‍රතිපත්තිමය තීරණයක් ගෙන තිබේ. මේ අනුව විශ්‍රාම වැටුප් රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 2/97 (III) පදනම් කොට පිළිගත් ගණනය කිරීමේ පරාසය වූ 85% සහ 90% අතර ගැලපීම කිරීමට රජය කටයුතු යොදා තිබේ. එහෙත් රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 2/97 (III) මඟින් සිදු කරන ලද රාජ්‍ය සේවයේ වැටුප් සංශෝධනයෙන් පසුව රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 15/2003, 09/2004 සහ 06/2006 මඟින් අවස්ථා 3දී වැටුප් සංශෝධනය කර තිබේ.

2. කෙසේ වුවද, දැනට පවත්නා විශ්‍රාම වැටුප් ගණනය කිරීමේ අනුපාතය සමඟ වැටුප් සංශෝධනයේදී යොදා ගනු ලබන වර්ධක අනුපාතය අනුව විශ්‍රාම වැටුප් ද ගැලපීම කළහොත් එමඟින් රජයට දැරිය නොහැකි තරමේ වැය බරක් ඇති විය හැක. රජයේ නිලධාරියෙකු කිසියම් තනතුරක් දරමින් සිටිය දී ඒ සඳහා, පූර්ණ කාලීනව නිරතව සිටීම හේතුවෙන් උද්ගත වන්නාවූ වියදම සැළකිය යුතු ප්‍රමාණයක් අඩුවේ. බොහෝ රටවල විශ්‍රාම වැටුප් ගෙවීමේදී සේවයේ යෙදී සිටියදී ලබා ගන්නා ලද වැටුපෙන් විශ්‍රාම වැටුප 50% - 65 % දක්වා වූ පරාසයක පිහිටුවා ඇත . ශ්‍රී ලංකාවේ දැනට පවත්නා තත්වය අනුව විශ්‍රාම වැටුප වර්තමාන වැටුපෙන් 70% සීමාවේ පවත්වා ගැනීම යෝග්‍ය වේ. ඒ අනුව කිසියම් අවස්ථාවකදී පූර්ණ විශ්‍රාම වැටුප වර්තමාන වැටුපෙන් 70% ට වඩා අඩුවන්නේ නම් එවන් අවස්ථාවන්හි දී පූර්ණ විශ්‍රාම වැටුප වර්තමාන වැටුපෙන් 70% ක් වශයෙන් ගැලපීම මැනැවැයි යෝජනා කෙරේ. ස්වකීය විශ්‍රාම වැටුප් හිමි සේවා කාලය වසර 30ට අඩු වීම හේතුවෙන් විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා සංග්‍රහයේ විධිවිධාන පරිදි පූර්ණ විශ්‍රාම වැටුපට අඩු විශ්‍රාම වැටුප් පරිමාණයකට හිමිකම් ලබන්නාගේ විශ්‍රාම වැටුප ඉහත කී උපරිම සීමාව වූ 70% අනුපාතය පදනම් කොට ව්‍යවස්ථා සංග්‍රහයේ විධිවිධාන අනුකූලව ගණනය කළ යුතුවේ. පහත සඳහන් කරුණු හැරුණු කොට විශ්‍රාම ලබන අවස්ථාවේදී විශ්‍රාම වැටුප් ගණනය කිරීමේ ක්‍රමවේදය දැනට පවත්නා පරිදිම අවසන් වරට ලද වැටුපෙන් 85% සිට 90% දක්වා වූ පරාසය තුලම සිදු කළ යුතු වේ.

3. වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප ගණනය කිරීමේදී ඉහත නිර්දේශ ක්‍රමයට වර්තමාන වැටුපෙන් 50% පදනමින් එය ගණන කිරීම නිර්දේශ කෙරේ.

අතිගරු ජනාධිපතිතුමාගේ මහින්ද චින්තන ඉදිරි දැක්මෙහි 2006ට පෙර විශ්‍රාම ලැබූ සියලුම රජයේ සේවකයින්ගේ විශ්‍රාම වැටුප් 2006 වැටුප් ක්‍රමයට ගැලපෙන අයුරින් සකස් කොට මීලග අයවැය සිට ක්‍රියාත්මක කරන බව සඳහන් වේ. එසේම රජයේ විශ්‍රාමිකයින් පුද්ගලික වශයෙන් හා සංවිධාන වශයෙන් මෙම විෂමතාවය පිළිබඳව ඔවුන්ගේ නියෝජනයන් අතිගරු ජනාධිපතිතුමාගේ අවධානයට යොමු කර තිබූ බවත් එමෙන්ම වැටුප් හා සේවක සංඛ්‍යා කොමිෂන් සභාව මෙම විෂමතාවය පිළිබඳ සලකා බලා විශ්‍රාම වැටුප් සංශෝධන සඳහා ප්‍රතිපත්තිමය වශයෙන් ඔවුන්ගේ යෝජනා දක්වා ඇති බවද ඒ නිසාම අවශ්‍ය ක්‍රියාමාර්ග ගන්නා ලෙසද ජනාධිපති ලේකම් විසින් මුදල් හා ක්‍රම සම්පාදන ලේකම් වෙත දන්වා ඇත. ඊට අනුව විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ ජනරාල් විසින් පහත දැක්වෙන නිරීක්ෂණ මුදල් අමාත්‍යාංශයේ ලේකම් වෙත වැඩි දුරටත් යවා ඇත.

# 4

# විශ්‍රාම වැටුප් ගණන් බැලීමේ ක්‍රම විකාශනය

## 4.1 ආරම්භයේ සිට 1984. 12. 31 වැනි දින දක්වා පැවති ගණන් බැලීමේ ක්‍රමය

විශ්‍රාම වැටුප = (ශුද්ධ සේවා කාලය + දේශගුණ ප්‍රසාද දීමනා ) x අවසානයට ලැබූ වැටුප / 720

විශ්‍රාම වැටුපට හිමිකම් කීම සඳහා දළ සේවා කාලය මාස 120 කි.

මෙම ගණන් බැලීමේ ක්‍රමය සඳහා පහත සඳහන් විශ්‍රාම වැටුප් අංක යොදා ගෙන ඇත.

| කාණ්ඩ අංකය | ක්‍රියාත්මක කාලය | අදාල වැටුප |
|---|---|---|
| එක් ලක්ෂය<br>(1 සිට 1,99,999 දක්වා ) | 1977. 12. 31 දක්වා | කල්පිත වැටුප |
| දෙලක්ෂය<br>(2,00,001 සිට 2,99,999 දක්වා) | 1978. 01. 01. දින සිට<br>1982. 01. 01 දක්වා | ඒකාබද්ධ වැටුප්<br>(රා.ප.ව.96) |
| තුන් ලක්ෂය<br>(3,00,001 සිට 3,99,999 දක්වා ) | 1982. 01. 02 දින සිට<br>1984. 12. 31 දක්වා | නව ඒකාබද්ධ වැටුප්<br>(රා.ප.ව 197 ) |

සටහන් :-

- 1969. 10. 01 වැනි දින සිට 1977. 12. 31 වැනි දින දක්වා විශ්‍රාම ගිය නිලධාරීන් විශ්‍රාම ගිය දිනයේ දී ලැබූ වැටුප භාණ්ඩාගාර 770 හෝ රා.පරි.ච. 96 අනුව වැටුප වුවද විශ්‍රාම වැටුප් ගණන් බැලීම සඳහා උපයෝගි කරගෙන ඇත්තේ එම වැටුප් 1969. 10. 01 වැනි දිනට පෙර පැවති කල්පිත වැටුපට පරිවර්තනය කිරීමෙනි.
- 1978. 01. 01 වැනි දින සිට 1982. 01. 01 වැනි දින දක්වා විශ්‍රාම ගිය නිලධාරීන්ගේ වැටුප රා.පරි.ච 96 අනුව තීරණය කර ඇත. එහෙත් විශ්‍රාම වැටුප ගණන් බැලීමේදී එම වැටුපට පහත සඳහන් පරිදි විශ්‍රාම වැටුප් සහිත දීමනා එකතු කර ඇත.
- වාර්ෂික ඒකාබද්ධ වැටුප රුපියල් 2,550 ට වැඩි නම්,

  විශ්‍රාම වැටුප ගණන් බැලිම සඳහා වාර්ෂික වැටුප = වාර්ෂික ඒකාබද්ධ වැටුප + විශ්‍රාම වැටුප් සහිත දීමනාව (රුපියල් 1,680)
- වාර්ෂික ඒකාබද්ධ වැටුප රුපියල් 2,550 ට අඩු නම්,

  විශ්‍රාම වැටුප ගණන් බැලිම සඳහා වාර්ෂික වැටුප = වාර්ෂික ඒකාබද්ධ වැටුප+වාර්ෂික ඒකාබද්ධ වැටුප /5+1170
- 1982. 01. 02 වැනි දින සිට 1985. 12. 31 වැනි දින දක්වා විශ්‍රාම ගිය නිලධාරීන්ගේ අවසානයට ලැබූ වැටුප රා.ප.ව. 197 අනුව වාර්ෂික නව ඒකාබද්ධ වැටුප හා එම චක්‍රලේඛයේම සඳහන් තාවකාලික වැටුප් සැකසීම ද එකතු කිරීමෙනි.

* 1984. 12. 31 වැනි දින දක්වා විශ්‍රාම ගිය නිලධාරියෙකු ලබා ගත හැකි උපරිම විශ්‍රාම වැටුප වූයේ ඉහත සදහන් පරිදි ගැලපීම් කිරීමෙන් පසු අවසානයට ලැබූ වැටුපෙන් 2/3 පමණි.

## 4.2 1985. 01. 01 වැනි දින සිට 1990. 08. 31 වැනි දින දක්වා පැවති ගණන් බැලීමේ ක්‍රමය

1985. 01. 01 වැනි දින සිට 1990. 08. 31 වැනි දින දක්වා විශ්‍රාම වැටුප් ගණනය කර ඇත්තේ විශ්‍රාම ගිය නිලධාරියාගේ වයස හා අවසානයට ලැබූ වැටුප පදනම් කරගෙනය. මෙම ගණන් බැලීම සේවා කාලය මත පදනම් වූවක් නොවන බැවින් මාස 120 ක අවම සේවයක් තිබීම ප්‍රමාණවත් ලෙස සළකන ලදී. ගණන් බැලීමේ වක්‍රයේ ඇතුලත් කර ඇත්තේ වයස අවු: 55 සිට අවු : 60 දක්වා වූ කාලය සදහා වූ විශ්‍රාම වැටුප් ප්‍රතිශත පමණි. වයස අවු: 55 ට අඩු සෑම වසරක් හෝ ඉන් කොටසක් සදහා 1% බැගින් වයස අවු: 55 ට හිමි ප්‍රතිශතයෙන් අඩුකල යුතුය. එමෙන්ම වැටුප් රහිත නිවාඩු සදහා මසකට හෝ ඉන් කොටසක් සදහා 0.2% බැගින් නිලධාරියාට හිමි ප්‍රතිශතයෙන් අඩු කල යුතුය. ( ගණන් බැලීමේ වක්‍රලේඛ ඇමුණුම 6) මෙම ගණන් බැලීමේ ක්‍රමය සදහා පහත සදහන් විශ්‍රාම වැටුප් අංක යොදාගෙන ඇත.

| කාණ්ඩ අංකය | ක්‍රියාත්මක කාලය | වැටුප |
|---|---|---|
| හාර ලක්ෂ (4,00,001 සිට 4,99,999 දක්වා) | 1985. 01. 01 සිට 1987. 11. 16 දින දක්වා | රා.ප.ව.197 හා රා. ප.ව. 327 |
| පන්ලක්ෂ (5,00,001 සිට 5,89,999 දක්වා ) | 1987. 11. 17 සිට 1990. 08. 31 දින දක්වා | රා.ප.ව 387 |

## 4.3 1990. 09. 01 වැනි දින සිට 1990. 10. 17 දින දක්වා පැවති ගණන් බැලීමේ ක්‍රමය

1990. 09. 01 වැනි දින සිට 1990. 10. 17 වැනි දින දක්වා විශ්‍රාම වැටුප ගණනය කර ඇත්තේ විශ්‍රාම ගිය නිලධාරියාගේ සේවා කාලය හා අවසානයට ලැබූ වැටුප පදනම් කරගෙනය. මෙම ක්‍රමය 1996. 12. 24 වැනි දින සිට නැවත ක්‍රියාත්මක විය.

| කාණ්ඩ අංකය | ක්‍රියාත්මක කාලය | වැටුප |
|---|---|---|
| පන්ලක්ෂ අනූ දහස් 5,90,001 සිට 5,99,999 දක්වා) | 1990. 09. 01 සිට 1990. 10. 17 දක්වා | රා.ප.ව 387 |

## 4.4 1990. 10. 18 දින සිට 1996. 12. 23 දක්වා පැවති ගණන් බැලීමේ ක්‍රමය

1990. 10. 18 දින සිට 1996. 12. 23 දක්වා විශ්‍රාම වැටුප ගණනය කර ඇත්තේ රා.ප.ව. 44 /90 අනුවය. මෙම ක්‍රමය යටතේද මාසික විශ්‍රාම වැටුපක් ලබා ගැනීම සදහා අවම සේවා කාලය මාස 120 ක් තිබිය යුතුය. මෙහිදි අඩුකළ විශ්‍රාම වැටුප අවසානයට ලැබූ වැටුපෙන් 80% ද, අඩු නොකළ විශ්‍රාම වැටුප 90% ද ලෙස ප්‍රදානය කරන ලදී. ශුද්ධ සේවා කාලය මාස 360 ක් හෝ ඊට අධික වන්නේ නම් අඩු නොකළ විශ්‍රාම වැටුප් විශ්‍රාම ගිය දින සිට ප්‍රදානය කරන ලදී.

| කාණ්ඩ අංකය | ක්‍රියාත්මක කාලය | වැටුප |
|---|---|---|
| හය ලක්ෂ (6,00.001 සිට 6,99,999 දක්වා) | 1990. 10. 18 සිට 1992. 11. 17 දක්වා | රා.ප.ච.387 |
| හත් ලක්ෂ (7,00.001 සිට 7,89,999 දක්වා) | 1992. 11. 18 සිට1996. 12. 23 දක්වා | රා.ප.ච. 37/92 |

## 4.5 1996. 12. 24 දින සිට ක්‍රියාත්මක ගණන් බැලීමේ ක්‍රමය

1996. 12. 24 දින සිට ඉහත 23 ඡේදයේ දක්වා ඇති විශ්‍රාම වැටුප් ගණන් බැලීමේ ක්‍රමය නැවත ආරම්භ විය. මෙම ක්‍රමය මේ දක්වා ක්‍රියාත්මක වේ. 6/2004 විශ්‍රාම වැටුප් විෂමතා ඉවත් කිරීමේ චක්‍රලේඛය පරිදි විශ්‍රාම වැටුප සංශෝධනය කළ යුත්තේ ද මෙම ක්‍රමය අනුවය.

| කාණ්ඩ අංකය | ක්‍රියාත්මක කාලය | වැටුප |
|---|---|---|
| හත්ලක්ෂ අනූ දහස් (7,90,001 සිට 7,99,999 | 1996. 12. 24 සිට 1997. 01. 01 දක්වා | රා.ප.ච. 37/92 |

## 4.6 1996. 12. 31 දිනට වලංගු විශ්‍රාම වැටුප් ගණන් බැලීමේ ක්‍රමය

6/2004 චක්‍රලේඛයෙන් අරමුණු කළ පරිදි විශ්‍රාම වැටුප් විෂමතා ඉවත් කිරීමේ කාර්ය සඳහා විශ්‍රාම වැටුප් නැවත ගණනය කිරීමේ දී පාදක කර ගත යුතු වන්නේ 1996. 12. 31 වැනි දිනට බලාත්මකව පැවති විශ්‍රාම වැටුප් ගණනය කිරීමේ ක්‍රමයයි. එම ක්‍රමයේ විශේෂ ලක්ෂණ පහත සඳහන් කරනු ලැබේ.

1. විශ්‍රාම වැටුප ගණනය කිරීම අවසන් වරට ලද වැටුප් සහ සේවා කාලය මත පදනම්වේ.
2. එක් එක් වැටුප් කාණ්ඩ හා සේවා කාලය අනුව අවු: 25ට සිට 30 දක්වා අඩු නොකළ හා අඩුකළ විශ්‍රාම වැටුප් ප්‍රතිශතය තීරණය වේ.
3. සේවා කාලය අවු: 25 ට අඩුවන අවස්ථාවලදී එසේ අඩුවන සේවා කාලයේ මාස 6 ක් හෝ ඉන් කොටසක් සඳහන් 1%ක් බැගින් අවු : 25 හිමි ප්‍රතිශතයෙන් අඩු කරනු ලැබේ.
4. පහත සඳහන් අවස්ථා යටතේ සහන දීමෙන් අනතුරුව ඉතිරි වැටුප් රහිත නිවාඩු සෑම මාසයක් හෝ ඉන් කොටසක් සඳහා 0.2%ක් හිමි විශ්‍රාම වැටුප් ප්‍රතිශතයෙන් අඩු කරනු ලැබේ.
5. එසේ වුවත් වැටුප් රහිත නිවාඩු ගණනය කිරීමේදි පහත සඳහන් වැටුප් රහිත නිවාඩු හා සේවා කාලය මුළු වැටුප් රහිත නිවාඩු ප්‍රමාණයෙන් අඩු කිරීමට ඉඩ දෙනු ලැබේ.
   - (අ) එක් අවුරුද්දක් දක්වා වැටුප් රහිත නිවාඩු.
   - (ආ) පාසල් ගුරුවරුන්ගේ 1970. 04. 01 වැනි දිනයේ දි සිවිල් විශ්‍රාම වැටුප් ක්‍රමයට අන්තර් ග්‍රහනය කිරීමට පෙරාතුව ලබා ගත් වැටුප් රහිත නිවාඩු
   - (ඇ) රජයේ නිලධාරියෙකුගේ වැඩ කටයුතුවලට අදාළව ප්‍රයෝජනවත් විය හැකි උසස් සුදුසුකම් ලබා ගැනීමේ කාර්යය සඳහා ප්‍රදානය කරන ලද වැටුප් රහිත නිවාඩු
   - (ඈ) විශ්‍රාම වැටුප් සඳහා ගණන් ගතහැකි දළ සේවා කාලය වසර 30 ට වැඩි වන්නේ නම් එසේ වැඩිවන සේවා කාලය

### 4.7 1997. 01. 02 දින සිට 2004. 01. 01 දක්වා පැවති ගණන් බැලීමේ ක්‍රමය

විශ්‍රාම වැටුප් ගණනය කර ඇත්තේ විශ්‍රාම ගිය නිලධාරියාගේ සේවා කලය හා අවසානයට ලැබූ වැටුප පදනම් කරගෙනය.

| කාණ්ඩ අංකය | ක්‍රියාත්මක කාලය | වැටුප |
|---|---|---|
| අට ලක්ෂ<br>(8,00,001 සිට 8,99,999 දක්වා | 1997. 01. 02 සිට<br>2004. 01. 01 දක්වා | රා.පරි.ච. 02 /97 (iii) |

### 4.8 2004. 01. 02 දින සිට 2004. 12. 01 දක්වා පැවති ගණන් බැලීමේ ක්‍රමය

මෙම කාල සීමාව තුළ විශ්‍රාම වැටුප් ගණනය කර ඇත්තේ විශ්‍රාම ගිය නිලධාරියාගේ සේවා කාලය හා අවසානයට ලැබූ වැටුප පදනම් කරගෙනය.

| කාණ්ඩ අංකය | ක්‍රියාත්මක කාලය | වැටුප |
|---|---|---|
| නව ලක්ෂ<br>(9,00,001 සිට 9,99,999 | 2004. 01. 02 සිට<br>2004. 12. 01 දක්වා | රා.පරි.ච. 15/2003 |

### 4.9 2004. 12. 02 දින සිට 2006. 01. 01 දක්වා පැවති ගණන් බැලීමේ ක්‍රමය

මෙම කාල සීමාව තුළ ද විශ්‍රාම වැටුප් ගණනය කර ඇත්තේ විශ්‍රාම ගිය නිලධාරියා ගේ සේවා කාලය හා අවසානයට ලැබූ වැටුප පදනම් කරගෙනය

| කාණ්ඩ අංකය | ක්‍රියාත්මක කාලය | වැටුප |
|---|---|---|
| (10,00.001 සිට 10,99,999<br>දක්වා) | 2004. 12. 02 සිට<br>2006. 01. 01 දක්වා | රා.පරි.ච 09/2004 |

### 4.10 2006. 01. 02 දිනට පසු ක්‍රියාත්මක ගණන් බැලීමේ ක්‍රමය

මෙම කාල සීමාව තුළද විශ්‍රාම වැටුප ගණනය කරනු ලබන්නේ විශ්‍රාම ගිය නිලධාරියාගේ සේවා කාලය හා අවසානයට ලැබූ වැටුප පදනම් කරගෙනය.

| කාණ්ඩ අංකය | ක්‍රියාත්මක කාලය | වැටුප |
|---|---|---|
| එකොලොස් ලක්ෂ<br>(11,00,001 සිට ) | 2006. 01. 02 සිට<br>මේ දක්වා | රා.පරි.ච 06/2006 |

## 4.11 රජයේ විශ්‍රාමිකයින්ගේ ජීවන වියදම් දීමනාව

1 මෑත කාලීනව ජීවන වියදම් දීමනාව ගෙවීම ආරම්භ වූයේ 1980 නොවැම්බර් පළමු වෙනිදා සිටය. 1980 ජූලි මහා වැඩවර්ජනය හේතුවෙන් රාජ්‍ය සේවය අඩපන වූ විට ඉතිරිව සිටි රාජ්‍ය සේවකයින් සැනසීම සඳහා 1980. 11. 17 දිනැති ආයතන චක්‍රලේඛ ලිපි අංක 356 මගින් මසකට රු. 70 ක ජීවන වියදම් දීමනාවක් ගෙවීමට රජය පියවර ගත්තේය. එම රු. 70 ජීවන වියදම් දීමනාව රජයේ විශ්‍රාමිකයින්ටද නොඅඩුව ලැබුණි.

2 අංක 378 හා 1981. 11. 18 දිනැති ආයතන චක්‍රලේඛ ලිපිය මගින් පළමුවරට 1981 නොවැම්බර් 01 දින සිට වෙනස්වන ජීවන අංකය මත ජීවන වියදම් දීමනාව ගෙවීම ආරම්භ විය. ඒ සඳහා පාදක අංකය 360 වූ අතර ඉන් එහා මෙහා සිදුවන එක් අංකයක වෙනස් වීමට රු. 2 ක මුදලක් වැඩි වීම හෝ අඩු වීම සිදු කෙරේ. මේ ක්‍රමය යටතේ 1981 නොවැම්බර් 01 දා වැඩි වූ මුදලරු. 62/- කි. ඉන් අනතුරුව චක්‍රලේඛ උපදෙස් නොමැතිව , ජන ලේඛන හා සංඛ්‍යා ලේඛන අධ්‍යක්ෂ නිකුත් කරන මාසික ජීවන වියදම් අංකය මත මෙම ගෙවීම සිදු විය. වැන්දඹු අනත්දරු විශ්‍රාමිකයින්ටද මෙම මුදල පූර්ණ වශයෙන් ගෙවනු ලැබිණ.

3 අංක 404 හා 1983 මාර්තු 01 දිනැති ආයතන චක්‍රලේඛ ලිපියෙන් පෙර කී වෙනස්වන ජීවන වියදම් දීමනාව රු. 140/- දී අවුරා තැබූ අතර මාස 6 කින් පසුව නැවත සමාලෝචනය කිරීමට තීරණය විය. තවද එම චක්‍රලේඛයන් රු. 1000/- ට අඩු ඒකාබද්ධ මාසික වැටුපක් ලබන සියලුම විශ්‍රාමිකයින්ට හා රජයේ සේවකයින්ට අතිරේක වශයෙන් රු. 100/- ක විශේෂ දීමනාවක් ගෙවීම ආරම්භ විය.

4 1983. 09.15 දිනැති ආයතන චක්‍රලේඛ ලිපි අංක 411 මගින් 1983. 09. 01 දින සිට ඊට පෙර ආයතනචක්‍රලේඛ ලිපි අංක 404 මගින් ගෙවූ රු. 100/- හා අතිරේක රු. 6/- ගැලපීමක්ද සහිතව කලින් ගෙවූ රු.140/- ජීවන වියදම් දීමනාව මසකට රු. 246/- ක් කරන ලදී. තවත් මාස 6 කින් නැවත සමාලෝචනයට පත්වන තුරු රජයේ විශ්‍රාමිකයින්ටද එම දීමනාව ගෙවීම ද ආරම්භ විය.

5 1984. 04. 05 දිනැති රා.පරි.247මගින් පෙරකී රු. 246/- ට අතිරේකව මසකට රු. 102/- ක දීමනාවක් ගෙවීම ආරම්භ විය. මෙම චක්‍රලේඛයේ ඇති විශේෂත්වය නම් වැන්දඹු හා වැන්දඹු පුරුෂයන්ට මෙම අතිරේක රු. 102/- ඒ ආකාරයටම හිමි වුවත් , රාජ්‍ය සේවයේ ජීවන වියදම් දීමනාව ගෙවීමට අදාළ ස්ථානයක්/ස්ථානවල සේවයේ යෙදෙන අඹුසැමි දෙදෙනාට පෙර කී රු. 102/- දෙකට බෙදා රු. 51/- ක් පමණක් එක් අයෙකුට ගෙවීමත්, රජයේ සේවයේ අවිවාහක වී නම් ඔහුට රු.102/- නොඅඩුව ගෙවනු ලැබීම ද මෙම චක්‍රලේඛයේ තවත් විශේෂත්වයක් විය.

6 1984.09. 21 දිනැති රා.පරි 247 මගින් 1984. අගෝස්තු මස සිට අතිරේක වශයෙන් තවත් රු.56/- ක ජීවන වියදම් දීමනාවක් ගෙවීම ආරම්භ විය. පෙර කී රා.පරි.247 හි කොන්දේසි ඊට ද බලපැවේය. ඒ අනුව සියලුම විශ්‍රාමිකයිනට රු. 56/- ක අතිරේක මුදලක් හිමි වුවත් රාජ්‍ය සේවයේ අඹුසැමි දෙදෙනාම සේවයේ සිටි විටත් අවිවාහක අයටත් රු.28/- ක් වශයෙන් මෙම දීමනාව අඩකින් පහළ ගියේය.

7 වනසිංහ වැටුප් කොමිසමේ නිර්දේශ මත 1988 ජනවාරියේ දී රජයේ සේවකයින්ට වැටුප් වැඩි කිරීමට කළ නිර්දේශයත් සමග රජයේ විශ්‍රාමිකයින් පිළිබඳව ද ඉතාමත් වැදගත් නිර්දේශයක් එම කොමිසම ප්‍රකාශයට පත් කරනු ලැබුණි. එනම්, රජයේ සේවකයන්ගේ වැටුප් වැඩි කරන සෑම අවස්ථාවකදීම සමානුපාතිකව විශ්‍රාම වැටුප් ද වැඩි කළ යුතුය යන නිර්දේශයයි. කෙසේ වුවත් රජයේ සේවකයන්ගේ දීමනා හා ජීවන වියදම් දීමනා ගෙවීමේදි විශ්‍රාමිකයින් අමතක කිරීමක් සිදු විය. 1970 න් පසුව රජයේ සේවකයන්ට ගෙවූ දීමනාවක් නොගෙවූ පළමු අවස්ථාව මෙය වේ. ජීවන වියදම් ගණනය සඳහා එම අවස්ථාවේ පාදක කර ගත්තේ අංක 612යි. මෙහි අංකයක් වැඩි වූ විට රු.2 ක ඉහළ යන දීමනාවක් ගෙවීම රජයේ සේවකයන්ට පමණක් සීමා විය.

8 1988. 01. 01 දින සිට ආරම්භ වූ පෙර කී වෙනස්වන ජීවන වියදම් දීමනාව ක්‍රියාත්මක වූයේ මාස 7 ක් පමණකි. 1988. 08. 03 දිනැති රා.පරි. 24/88 මගින් 1988. 08. 01 දිනට මෙම දීමනාව රු. 260/- දි අවුරා තැබිණි. විශ්‍රාමික ප්‍රජාව අතර ප්‍රසිද්ධ රු. 260/- විශ්‍රාමික සටන ඇරඹියේ මෙම අවස්ථාවේදිය.

9 රු. 260/- වැඩි වූ ජීවන වියදම් දිමනාව වැඩි වැටුප් ලැබූ රජයේ සේවකයින්ට හා රජයේ විශ්‍රාමිකයින්ට ගෙවීම රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 9/93 හා 10/93 චක්‍රලේඛ මගින් සිදු විය. ඒ වන විට නොගෙවා තිබූ රු. 600 ක දීමනාවද සියලු දෙනාටම ඒකාකාරව ගෙවීම සිදු විය.

10 මෙම රා.පච 387(iv) මගින් සිදු වු වෙනස්කම හැරෙන්නට 1970 සිට 1994 දක්වා රජයේ සේවකයන්ට ගෙවූ ජීවන වියදම් දීමනාව රජයේ විශ්‍රාමිකයින්ද භුක්ති විඳ ඇත. කෙසේ වෙතත් රා.ප.ච 9/96 න් රජයේ සේවකයින්ට ලබා දුන් රු. 250 /- විශ්‍රාමිකයින්ට නොගෙවීමට තීරණය විය.

11 2006 ජනවාරි 01 සිට එතෙක් පැවති ජීවන වියදම් දීමනාව වැටුපට එකතු කරන ලද අතර එදින සිට රු. 500/- ක ජීවන වියදම් දීමනාවක් ලබා දුනි. එය මාස හයෙන් හයට ජීවන අංකය සමග ගලපන ලදී. ඒ අනුව 2006. 07. 01 දින සිට රු. 687.50 ක් වශයෙන් ද 2007. 01. 01 දින සිට රු. 875.00 ක් වශයෙන් ද 2007. 07. 01 දින සිට රු. 1062.50 වශයෙන්ද 2008. 01. 01 දින සිට රු. 1250 ක් වශයෙන් ද 2008. 07. 01 දින සිට රු. 1437. 50 ක් වශයෙන්ද 2009. 01. 01 දින සිට රු. 2000 ක් වශයෙන් ද ජීවන වියදම් දීමනාව ගෙවනු ලැබේ.

12 2009 වසරේ සිට රාජ්‍ය නිලධාරින්ට රු. 5250/- ක ජීවන වියදම් දීමනාවක් විශ්‍රාමිකයින්ට රු. 2375/- ක ජීවන වියදම් දීමනාවක් ද 2009. 11. 01 දින සිට ගෙවනු ලැබේ.

13. 2011. 01. 01 සිට රාජ්‍ය නිලධාරින්ට හිමි ජීවන වියදම් දීමනාව 5850.00 ක් ද විශ්‍රාමිකයින්ට රු. 2675.00ක් ද වේ.

# 5

# ශ්‍රී ලංකාව තුළ ක්‍රියාත්මක කළ විවිධ විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රම

රාජ්‍ය නිලධාරින් සඳහා සිවිල් විශ්‍රාම වැටුප සන්නද්ධ හමුදා නිලධාරින් සඳහා හමුදා විශ්‍රාම වැටුප් ක්‍රමය මෙන්ම වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමය හා බැඳුණු විවිධ විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රම ගණනාවක් අත්දැකීම් ශ්‍රී ලංකාව සතු වේ. ඇතැම් විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රම භාවිතයෙන් ඉවත්ව ඇතත් ඒවා අධ්‍යයනය කිරීම වැදගත් වේ.

## 5.1 දායකත්ව විශ්‍රාම වැටුප් ක්‍රමය

පැරණි විශ්‍රාම වැටුප් ක්‍රමය වෙනුවට දායකත්ව විශ්‍රාම වැටුප් ක්‍රමය 2003. 01 .01 දින සිට හඳුන්වා දෙනු ලැබීය . එදිනට පසුව රාජ්‍ය හෝ පළාත් රාජ්‍ය සේවා ස්ථිර පදනම මත බඳවා ගත් සේවකයන් වෙනුවෙන් මෙය අදාළ වේ. අදාළ නීති ප්‍රතිපාදන සඳහා 1958 අංක 15 දරන සේවක අර්ථ සාධක අරමුදල් පනතෙහි සංශෝධනයක් ලෙස 2002 නොවැම්බර් 29 දින සේවක අර්ථ සාධක අරමුදල් (දායකත්ව විශ්‍රාම වැටුප් ) සංශෝධන පනත පාර්ලිමේන්තුවට ඉදිරිපත් කෙරුණි. එමෙන්ම මහා භාණ්ඩාගාරය විසින් කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 18 මගින් අවශ්‍ය උපදෙස් නිකුත් කරන ලදී. මෙම විශ්‍රාම වැටුප් ක්‍රමය යටතෙහි දායක විශ්‍රාම වැටුප් අරමුදලක් ස්ථාපිත කෙරුණ අතර එය මහා බැංකුව විසින් පවත්වා ගන්නා ලදී. එමෙන්ම මෙම විශ්‍රාම වැටුප් ක්‍රමයෙහි පරිපාලකයා විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ ජනරාල් විය. ස්ථිර විශ්‍රාම වැටුප් සහිත පත්වීම්ධාරින් මෙම දායකත්ව විශ්‍රාම වැටුප් ක්‍රමය සඳහා තම වැටුපෙන් 8%දායක මුදල් ගෙවිය යුතු විය. මධ්‍යම රජය හෝ ඒ ඒ පළාත් සභා ද සේවක ඉපයුම් වලින් සියයට 12% ක මුදලක් ද ඊට අනිවාර්යයයෙන්ම දායක මුදල් ගෙවිය යුතු විය. මේ නිසාම පත්වීම් ලිපියේ " ඔබට දායකත්ව විශ්‍රාම වැටුපකට හිමිකම් ඇත" යනුවෙන් වගන්ති ඇතුළත් කරනු ලැබීය. දායකත්ව විශ්‍රාම වැටුප් ක්‍රමය යටතෙහි වැන්දඹු /වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක මුදල් අය නොකරන ලද අතර විශ්‍රාම වැටුප් මෙන්ම වැන්දඹු අනත්දරු විශ්‍රාම වැටුප් ප්‍රතිලාභයන්ද ඉන් ආවරණය විය.

පැවති විශ්‍රාම වැටුප් ක්‍රමය හා යෝජනා වූ දායකත්ව විශ්‍රාම වැටුප් ක්‍රමය අතර පැවති සමාන අසමානතා සංසන්දනය කර බැලීම පහත දැක්වේ.

1 මධ්‍යම රජය හා පළාත් රාජ්‍ය නිලධාරින් විශ්‍රාම වැටුප් කාර්ය සඳහා අවම වශයෙන් මාස 120ක දළ සේවා කාලයක් පවත්නා ගත යුතු විය. දායකත්ව විශ්‍රාම වැටුප තුළ ද මෙම අවම දළ සේවා කාලය එසේම පැවතුණි.

2 පෞද්ගලික පාසල් හා පිරිවෙන් ගුරුවරුන් අවම වශයෙන් මාස 120 ක කාල සීමාවක් තුළ දායක මුදල් ගෙවීම පැරණි විශ්‍රාම වැටුප් ක්‍රමයෙහි පැවතුණි. මෙම ගුරුවරුන් රාජ්‍ය සේවකයන් වශයෙන් නොසැලකූ නිසා වැටුපෙන් 2% ක් විශ්‍රාම වැටුප් අරමුදලට දායක මුදල් ගෙවිය යුතු විය.මීට අමතරව ගුරුවරුන් පමණක් වැන්දඹු අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට නියමිත දායක මුදල් ගෙවිය යුතු විය. නව ක්‍රමය එනම් දායකත්ව විශ්‍රාම වැටුප තුළ ද 8% දායක මුදල් ගෙවීම අනිවාර්යය විය. මෙම දායක මුදල් වලින් වැන්දඹු අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමය ද අනාවරණය විය.

3 ශ්‍රේෂ්ඨාධිකරණ හා අභියාචනාධිකරණ විනිසුරුවන්ගේ අවම සේවා කාලය මාස 36 විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රම දෙකෙහිම ඒ ආකාරයෙන්ම පැවතුනි. එමෙන්ම මහාධිකරණ විනිසුරුවන් සඳහා අවම සේවා කාලය වූ මාස 84ද අනෙකුත් අධිකරණ නිලධාරින් සඳහා වූ අවම සේවා කාලය මාස 84ද නොවෙනස්ව පැවතුණි.

4 සිවිල් විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා සංග්‍රහයට පරිබාහිර වූ සන්නද්ධ සේවා විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා සංග්‍රහය මගින් යුධ, ගුවන් හා නාවික හමුදා නිලධාරින් හා සමාජිකයන්ගේ විශ්‍රාම වැටුප් පරිපාලනය කෙරේ. මෙම විශ්‍රාම වැටුප් ද දායකත්ව විශ්‍රාම වැටුප් ක්‍රමයට ඇතුළත් විය. ඒ අනුව අධිකාරිලත් නිලධාරියෙකු සඳහා මාස 240ක සේවා කාලය, අධිකාරි නොලත් නිලධාරින් සාමාජිකයන් සඳහා මාස 264ක සේවා කාලය, වෛද්‍ය හේතූන් මත විශ්‍රාම යන අධිකාරිලත් නිලධාරින්ගේ මාස 120ක සේවා කාලය හා අධිකාරි නොලත් නිලධාරින්ගේ මාස 144ක සේවා කාලය යන අවශ්‍යතා දායකත්ව විශ්‍රාම වැටුප් ක්‍රමය තුළ ද අන්තර්ගත විය. සේවයේ යෙදී සිටිය දී මියගිය හොත් මරණ පාරිතෝෂිකයට හිමිකම් කීම පැරණි විශ්‍රාම වැටුප් ක්‍රමයෙහි දැකිය හැකි විය. ඒ සඳහා වසර 5කට වඩා ශුද්ධ සේවා කාලයක් පැවතිය යුතුව තිබුණි. මරණයට පත් වූ දිනට අදාළ වාර්ෂික වැටුප් හෝ පරිවර්තනය කළ වැටුප මත පාරිතෝෂිකයක් ද හිමි ගන්වනු ලැබීය. නමුත් දායකත්ව විශ්‍රාම වැටුප් ක්‍රමයෙහි ප්‍රතිලාභ වූයේ සම්පූර්ණ දායක මුදල හා ඊට එකතු වූ පොලියයි . එමෙන්ම වසර 10කට වඩා සේවා කාලයක් පැවති විට නව ක්‍රමය යටතෙහි පාරිතෝෂිකයකට හිමිකම් කිව හැකි විය.

5 විශ්‍රාම වැටුප් පාරිතෝෂිකයක් හා මාසික විශ්‍රාම වැටුපක් විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා සංග්‍රහය යටතෙහි ලැබිය හැකි විය. පරිවර්තික පාරිතෝෂිකය වූයේ අඩු නොකළ විශ්‍රාම වැටුප් ප්‍රතිශතය මෙන් 24 ගුණයකි. එවැනි පාරිතෝෂිකයන් ලබා ගත් විට වසර 10ක් යනතෙක් අඩු කළ විශ්‍රාම වැටුපක් ද ඉන් අනතුරුව අඩු නොකළ විශ්‍රාම වැටුපක් ද හිමි ගන්වනු ලැබීය. දායකත්ව විශ්‍රාම වැටුප යටතෙහි අය නොකරන පාරිතෝෂිකයක් හිමි ගන්වනු ලැබීය. එමෙන්ම විශ්‍රාම ගත් දින සිටම නියමිත විශ්‍රාම වැටුප ලැබීමට හිමිකම් පැවතුණි.

6 රාජකාරියේ දි මියයන නිලධාරීන්ට රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 22/93 ට අනුව විශේෂ වන්දි හා වන්දි විශ්‍රාම වැටුප් ද නිදහස් දුම්රිය බලපත්‍ර වැනි පහසුකම් ද නව ක්‍රමය තුළ ජනිත විය.

7 වැන්දඹු අනත්දරු විශ්‍රාම වැටුප් පනතෙහි විධිවිධාන වලට අනුව දායකයා මියගිය පසු සේවා කාලය නොසලකා කලත්‍රයාට හිමිකම් ලබා ගත හැකි විය. එකී පහසුකම් නව ක්‍රමය තුළ වසර 10ක සේවා කාලයකින් පසුව පැවතුණි .

දායකත්ව විශ්‍රාම වැටුප් ක්‍රමය තුළින් සිවිල් විශ්‍රාම වැටුප් ප්‍රතිශතය සියයට 90 සිට 70 දක්වා අඩු කිරීම යෝජනා කොට තිබුණි. මෙම දායකත්ව විශ්‍රාම වැටුප් ක්‍රමය 2007 වසර ආරම්භයේ දී අවසන් කරන ලදී. ඊට හේතු සාධක වූ කරුණු හා අවසන් නිරීක්ෂණ පහත දැක් වේ.

8 දායකත්ව විශ්‍රාම වැටුප් පනතට නීතිමය බලය ලැබීමේ බලාපොරොත්තුවෙන් කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 18 සහ 18 (1) මඟින් 2003.01.01 දින සිට රාජ්‍ය සේවයට බඳවා ගනු ලබන සියලුම දෙනාට දායකත්ව විශ්‍රාම වැටුප් ක්‍රමය යටතේ පත්වීම් ලබා දිය යුතු බවට උපදෙස් නිකුත් කරන ලදී. මෙම විධිවිධාන හේතුවෙන් පත්වීම් ලාභීන්ගෙන් වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමය සඳහා දායක මුදල් අයකිරීමක් ද සිදු නොකෙරුණ අකර ඔවුන් දායක විශ්‍රාම වැටුප් ක්‍රමයෙහි සාමාජිකයින් බවට පත්කර ගනිමින් ඒ සඳහා නිලධාරීන්ගෙන් 8% ක් ද රජය විසින් 12% ක දායක මුදල් වශයෙන් ගෙවමින් නව ක්‍රමය ක්‍රියාත්මක කරගෙන යන අතර ශ්‍රී ලංකා මහ බැංකුව විසින් එකී ගිණුම පවත්ව ගෙන යනු ලැබේ.

9 මේ අනුව එවකට පැවති රජය විසින් 1958 අංක 15 දරන සේවක අර්ථ සාධක අරමුදල් පනතෙහි සංශෝධනයක් ලෙස 2002 නොවැම්බර් 29 වැනි දින සේවක අර්ථසාධක අරමුදල් (දායකත්ව විශ්‍රාම වැටුප්) සංශෝධන කෙටුම්පත පාර්ලිමේන්තුවට ඉදිරිපත් කෙරුණි. එම කෙටුම්පත පාර්ලිමේන්තුව විසින් සභා සම්මත කළ නමුත් පාර්ලිමේන්තුව විසුරුවා හරින ලද අවස්ථාව වන විට ගරු කථානායකතුමා එය අත්සන් තබා නොතිබීමේ හේතුවෙන් එය වලංගු නීතියක් බවට පත් වී නොමැත.

10 2003.01.01 දින සිට මේ වන විට ලක්ෂයකට අධික නිලධාරීන් සංඛ්‍යාවක් රාජ්‍ය සේවයට බඳවා ගෙන ඇති අතර ඉන් 42,000 ක් පමණ 2005 වර්ෂයේ දී රාජ්‍ය සේවයට ඇතුළත් කර ගත් උපාධිධාරීහු වෙති. නීතිමය බලයක් නොමැති කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 18 හා 18 (1) අනුව රාජ්‍ය සේවයේ පත්වීම් ලිපි ප්‍රදානය කිරීම නිසා මොවුන්ගේ විශ්‍රාම වැටුප් සහ වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් පිළිබඳව මෑත කාලයේ සිදු කරන ලද සියලුම සංශෝධනයන් ඉවත් කොට මේ වන විට රාජ්‍ය සේවයේ නිරත සියලුම දෙනාටත්, ඉදිරියේ දී බඳවා ගනු ලබන සියලුම දෙනාටත් විශ්‍රාම වැටුප් ලැබීමට ඇති අයිතිය සහතික කරන බව දක්වා ඇත.

11 එබැවින් මෙම කරුණු සැලකිල්ලට ගනිමින් මේ පිළිබඳව වෘත්තිය සමිති නියෝජිතයින්ගේ අදහස් ලබා ගැනීම සඳහා ඔවුන් සමඟ 2006.02.17 දින භාණ්ඩාගාරයේ පැවති සාකච්ඡාවේදී, සියලුම වෘත්තීය සමිති එකඟ වී ඇත්තේ දායකත්ව විශ්‍රාම වැටුප් ක්‍රමය අහෝසි කොට 2003.01.01 දිනට පෙර පැවති තත්වය යළි ස්ථාපනය කළ යුතු බවයි. එබැවින්, මෙම ගැටලු සහගත තත්ත්වය මඟහරවා ගනිමින් විශ්‍රාම වැටුප් හිමිකම ආරක්ෂා කරදීම සඳහා පහත සඳහන් යෝජනා ක්‍රියාත්මක කිරීමට නිර්දේශ කර තිබුණි.

විශ්‍රාම වැටුප් ආඥා පනත සංශෝධනය කරමින් පාර්ලිමේන්තුවට නව කෙටුම්පතක් ඉදිරිපත් කිරීම.

I. විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා සංග්‍රහය යටතේ ක්‍රියාත්මක වන විශ්‍රාම වැටුප් ක්‍රමය හා වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදල යටතේ ක්‍රියාත්මක වන වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමය 2003.01.01 දිනෙන් පසු රාජ්‍ය සේවයට ඇතුළත් වූ නිලධාරීන් සඳහා ද ක්‍රියාත්මක කිරීම.

II. වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදල යටතේ නිලධාරීන්ගේ වැටුපෙන් අය කරනු ලබන මුදල, ඒකාබද්ධ අරමුදලට බැර කිරීමේ දැනට පවතින ක්‍රමය වෙනස් කරමින් එය වෙනම විශ්‍රාම අරමුදල් ගිණුමක තැන්පත් කිරීම සඳහා වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් ආඥා පනත සංශෝධනය කරමින් පාර්ලිමේන්තුවට නව කෙටුම්පතක් ඉදිරිපත් කිරීම.

III. මහා භාණ්ඩාගාරය විසින් නිකුත් කරන ලද කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 18 සහ 18 (1) ඒවා නිකුත් කරන්නට යෙදුන දින සිටම ක්‍රියාත්මක වන පරිදි අවලංගු කිරීම.

IV. 2003.01.01 දින සිට රාජ්‍ය සේවයට බඳවා ගනු ලැබූ සියලුම දෙනාටම ලබා දී ඇති පත්වීම් විශ්‍රාම වැටුප් සහිත පත්වීම් ලෙස සංශෝධනය කිරීම.

V. ඉහත අංක I යටතේ සිදුකරන සංශෝධන වලට අනුකූලව වැන්දඹු අනත්දරු/වැන්දඹු පුරුෂ අනත්දරු/සන්නද්ධ සේවා වැන්දඹු අනත්දරු පනත්ද සංශෝධනය කිරීම.

VI විශ්‍රාම වැටුප් ගෙවීමේ දී, ඉදිරියේ දී මුහුණ දීමට ඇති ප්‍රශ්න ද සැලකිල්ලට ගනිමින් ඒ සඳහා යෝජනා ඉදිරිපත් කිරීම සඳහා ජාතික වැටුප් කොමිසමට ආධාර වනු පිණිස වෙනම ස්ථාවර කමිටුවක් රාජ්‍ය අංශයේ වෘත්තිය සමිති ද ඇතුළත්ව පත් කිරීම.

දායකත්ව විශ්‍රාම වැටුප් අරමුදල යටතෙහි එකතු කළ රුපියල් බිලියන 1.5 ක අයෝජනයක් මේ වන විට මහ බැංකුව සතුව පවතී.

## 5.2 රන් පවුම් විශ්‍රාම වැටුප්

1948 පෙබරවාරි 04 දින ශ්‍රී ලංකාව නිදහස ලැබීය. යටත් විජිත ආර්ථිකය තුළ බ්‍රිතාන්‍ය ජාතිකයින් ශ්‍රී ලංකාවේ සේවා නියුක්ත විය.. විශේෂයෙන් යටත් විජිත ලේකම් වරයකුගේ පාලනය යටතේ සුදු ජාතිකයින් විශාල සංඛ්‍යාවක් සේවයේ නියුක්ත විය. 1920 වසර අවසානයේ දී රාජ්‍ය සේවයෙන් විශ්‍රාම ලැබුවන්ගේ සංඛ්‍යාව 1200 වූ අතර ඉන් 970 ප්‍රමාණයන් විදේශිකයින් විය. එමෙන්ම සමස්ථ විශ්‍රාම වැටුප් වියදම රු. 2155792.00 වූ අතර ඉන් රු. 905958.00 මුදලක් ගෙවා ඇත්තේ එංගලන්තයේ crown agent විශ්‍රාම වැටුප් අංශය මඟිනි. මෙම විශ්‍රාම වැටුප් රන් පවුම් වලින් ගෙවනු ලැබීය. නිදහසෙන් පසු විශ්‍රාම වැටුප් ගෙවනු ලැබුවේ රුපියල් සත වලිනි. කෙසේ වෙතත් 1948 පෙබරවාරි 04 දිනට පෙර රජයේ සේවයේ නියුක්තව සිටියේ නම් ඔවුන් ඉන් පසුව විශ්‍රාම ලැබුවේද තම විශ්‍රාම වැටුප රන් පවුම් වලින් ලබා ගැනීමේ අවස්ථාව සලසා දී තිබුණි. විශ්‍රාම වැටුප් ප්‍රදාන පත්‍රය නිකුත් කිරීමේදී ප්‍රදානයෙහි වටිනාකමද රන් පවුම් වලින් එකතු කොට තිබීම විශේෂ ලක්ෂණයකි.

රන් පවුම් විශ්‍රාම වැටුප් ප්‍රදානය විශ්‍රාමිකයින්ට පමණක් නොව ඔවුන්ගේ වැන්දඹු භාර්යාවන්ටද අදාළ විය. ඒ අනුව රන් පවුම් වලින් විශ්‍රාම වැටුප් ලැබුවකු 1981. 07. 02 දිනට පසු මිය ගියේ නම් වැන්දඹුවටද රන් පවුම් වැන්දඹු අනත්දරු ප්‍රදාන පත්‍රයක් හිමි විය. මෙහි දී සැලකිය යුතු කරුණක් වන්නේ රන් පවුම් විශ්‍රාම වැටුප් ලාභියකු වුවත් ඔහු 1981. 07. 02 දිනට පෙර මිය ගියේ නම් භාර්යාවට රන් පවුම් ප්‍රදාන පත්‍රයක් හිමි නොවන බවයි. ඊට හේතුව වූයේ එම දිනයට පෙර මියගිය රාජ්‍ය නිලධාරීන් වෙනුවෙන් ජීව ගණක පදනම මත වැන්දඹු අනත්දරු විශ්‍රාම වැටුප් ගණන් බැලීමයි. නමුත් 1981. 07. 02 දින සිදු කළ සංශෝධනයට අනුව ජීව ගණක ක්‍රමය වෙනුවට විශ්‍රාම වැටුප් ගණන් බැලීමේ ක්‍රමයම වැන්දඹු අනත්දරු විශ්‍රාම වැටුප ගණන් බැලීම සඳහා උපයෝගී කර ගන්නා ලදී. ඒ නිසා එම වැන්දඹු වැටුප ද රන් පවුම් වලින් ගණනය කිරීමට හැකි විය.

රන් පවුම් විශ්‍රාම වැටුප් 1994. 08. 01 දින සිට විනිමය අනුපාතයට පරිවර්තනය කර ගෙවීම ආරම්භ කරන ලදී. ඒ අනුව සෑම වසරකම ජනවාරි පළමු දින සහ ජූලි පළමු දින එනම් මාස 06කට වරක් පවතින විනිමය අනුපාතයට රන් පවුම් විශ්‍රාම වැටුප් පරිවර්තනය විය. ඒ අනුව පහත සඳහන් පරිදි පසුගිය කාලයේ දී අදාළ පරිවර්තන ලබා දී තිබුණි.

- 1987. 01. 01 හිමි වැටුප් පරිවර්තනය, එනම් 1987. 01. 01 දිනට පැවති විනිමය අනුපාතය පදනම් කරගෙන විශ්‍රාම වැටුප පරිවර්තනය කර 50% වැඩිවීම හෝ රු. 700 ක් යන දෙකෙන් අඩු අගය ගෙවන ලදී.
- 1988. 01. 01 දිනට පවති වැටුප් පරිවර්තනය අනුවද සංශෝධනය විය.
- විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තු චක්‍රලේඛ 16/94 අනුව හිමි වැටුප් වැඩිවීම හිමිවිය.
- 1994. 08. 01 දින සිට එම විනිමය අනුපාතයට අනුව විශ්‍රාම වැටුප පරිවර්ථනය විය. මුලින් සඳහන් කළ අවස්ථා යටතේ හිමි වැඩිවීම් එකතු කර 1994. 08. 01 දින සිට ගෙවිය යුතුය.
  1997 වසරේදී 5% වැටුප් වැඩිවීමත් 1998 දී ඉතිරි 5% වැටුප් වැඩිවීමත් හිමි විය.

ඉන් අනතුරුව සෑම වසරකම ජනවාරි 01 සහ ජූලි 01 දින වැටුප් පරිවර්තනය කොට ගෙවිය යුතු වුවත් එය ප්‍රායෝගිකව ක්‍රියාත්මක නොවීය. ඊට හේතු කීපයකි.

01. රන් පවුම් විශ්‍රාම වැටුප් හිමිකරුවන්ට අනෙකුත් විශ්‍රාමිකයින්ට හිමි වැටුප් වැඩිවීම් අමතර දීමනා සහ වැටුප් පරිවර්තන හිමි නොවීය. මේ නිසා රන් පවුම් වලින් විශ්‍රාම වැටුප ලබා ගැනීම අවාසි දායක වීම.

02. 2004 වසරේ දී සහ 2006 වසරේ දී විශ්‍රාම වැටුප් විෂමතාවය ඉවත් කිරීමට රජය ප්‍රතිපත්තිමය තීරණ ගන්නා ලදී. ඒ අනුව 1996. 12. 31 දිනට සහ 1997. 01. 01 දිනය පදනම් කොට විශ්‍රාම වැටුප් විෂමතාවය ඉවත් කරනු ලැබීය. මෙම විෂමතාවය ඉවත් කිරීම රන් පවුම් විශ්‍රාම වැටුප් ලාභින්ට අදාළ නොවීය.

03. විශ්‍රාමිකයා සහ වැන්දඹුව මිය යාමෙන් අනතුරුව ද ඇතැම් ආබාධිත අනත්දරු විශ්‍රාම වැටුප්ද රන් පවුම් වලින් ගෙවා තිබුණි. කිසිදු පිළිසරණක් නැති මෙවැනි ආබාධිතයින්ට රන් පවුම් වලින් ගණනය කළ විශ්‍රාම වැටුප රුපියල් බවට පරිවර්තනය කර ගෙවනු ලැබීය. එය කිසිදු අවශ්‍යතාවයක් නැති ක්‍රියාවලියක් විය.

විශ්‍රාම වැටුප් විෂමතාවය ඉවත් කිරීමේ වාසිදායක තත්ත්වය සැළකිල්ලට ගෙන රන් පවුම් වෙනුවට රුපියල් වලින් විශ්‍රාම වැටුප් ලබා ගැනීමේ අවශ්‍යතාවය මතු විය. එබැවින් රන් පවුම් විශ්‍රාම වැටුප් ක්‍රමය අහෝසි කරමින් එය සාමාන්‍ය විශ්‍රාම වැටුප් ක්‍රමයක් බවට 2007 වසරේ දී පත් කරනු ලැබීය. එබැවින් නාමික වශයෙන් රන් පවුම් විශ්‍රාම වැටුප් ලිපිගොනු 42ක ප්‍රමාණයක් 2010 වසර ආරම්භ වන විට පැවතියත් එය අනෙකුත් විශ්‍රාම වැටුප් මෙන් රුපියල් වලින් ගෙවනු ලැබීය. ඒ අනුව රන් මිනුම වනාහි ම්ලේච්ඡ යුගයේ නෂ්ඨාවශේෂයක් වනවා සේම රන් පවුම් විශ්‍රාම වැටුප් ද නෂ්ඨාවශේෂයක්ම පමණක් වේ.

## 5.3 ගුරු විශ්‍රාම වැටුප් ක්‍රමය

1927 අංක 6 දරණ පාසල් ගුරුවරුන්ගේ විශ්‍රාම වැටුප් ආඥා පනතින් ගුරුවරුන් සඳහා විශ්‍රාම වැටුප් ක්‍රමයක් ක්‍රියාත්මක කිරීමට පදනම වැටී ඇත. ගුරුවරුන් සිවිල් රාජ්‍ය නිලධාරීන්ගෙන් වෙන් වූ වෙනම කොටසක් වශයෙන් සළකන ලදී. මේ නිසා විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා සංග්‍රහයට ආවරණය නොවන විශේෂිත පනතක් යටතේ ක්‍රියාත්මක වන රාජ්‍ය සේවකයින් කොටසක් වශයෙන් ගුරුවරුන් සළකන ලදී. ඉහත සඳහන් පනතට අමතරව 1953 අංක 44 දරන පාසල් ගුරුවරුන්ගේ විශ්‍රාම වැටුප් පනතින් ගුරු විශ්‍රාම වැටුප් ආවරණය විය.

ගුරුවරුන් හා බැඳුණු විශ්‍රාම වැටුප් ක්‍රම 2 ක් ක්‍රියාත්මක විය.

1. ගුරු විශ්‍රාම වැටුප් ක්‍රමය
2. ගුරු වැන්දඹු අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමය

ගුරුවරුන් විශ්‍රාම වැටුපට දායක මුදල් දැරිය යුතු විය. මෙම දායක මුදල් ගෙවීම 1970.04.01 දින දක්වා ක්‍රියාත්මක විය. ඒ අනුව ගුරු අරමුදලින් ගෙවූ විශ්‍රාම වැටුපක් ගුරුවරුන්ට හිමි විය. එය දායකත්ව විශ්‍රාම වැටුපක් සේ සළකන ලදී. කෙසේ වෙතත් 1970.04.01 දින ගුරු විශ්‍රාම වැටුප් ක්‍රමය අහෝසි කළ අතර ඒ අනුව ගුරුවරුන් ද සිවිල් විශ්‍රාමිකයින් වශයෙන් සළකන ලදී. ගුරු විශ්‍රාම වැටුප් ක්‍රමය අහෝසි වීමත් සමඟ දායක මුදල් අය කිරීමද අහෝසි කරන ලදී. 1970.04.01 දින වන විට වසර 10ක සේවා කාලයක් සපුරා තිබූ විට ඔවුන් ගුරු විශ්‍රාම වැටුපකට ද හිමිකම් කියන ලදී. ඉන් අනතුරුව රාජ්‍ය සේවය තුළ තවදුරටත් ගුරුවරයකු වශයෙන් කළ සේවය සඳහා ද සිවිල් විශ්‍රාම වැටුපක් හිමි විය. මෙම ගුරු විශ්‍රාම වැටුප් ක්‍රමය යටතේ යම් ගුරුවරයකු විශ්‍රාම ලබන විට ඔහුගේ ගුරු විශ්‍රාම වැටුප් දායකත්වය සනාථ කිරීම අත්‍යවශ්‍ය විය. ඒ අනුව දායක මුදල් වාර්තා ඉදිරිපත් කළ යුතු විය. ඒ ඒ පාසල්හි ලැබූ නිවාඩු වෙනමම වාර්තා කළ යුතු විය. ගුරු විශ්‍රාම වැටුප් ක්‍රමය අහෝසි වීමත් සමඟම 1970.04.01 දිනට පෙර ලැබූ සියලුම වැටුප් රහිත නිවාඩු අතහැර දමන ලදී.

ගුරු විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක වූවන්ට ගුරු වැන්දඹු අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමය තුළ දායක විය හැකි විය. ඒ සඳහා ද දායක මුදල් දැරිය යුතු විය. ගුරුවරයාගේ ඇවෑමෙන් පසු වැන්දඹුව සහ අනත්දරුවන්ට ගුරු වැන්දඹු අනත්දරු ක්‍රමයෙහි ප්‍රතිලාභ හිමි විය.

1960 දී පෞද්ගලික පාසල් රජයට පවරා ගනු ලැබූ අතර එසේ රජයට පවරා ගැනීමට එකඟ නොවූ පාසල් 74ක් පෞද්ගලික පාසල් හෝ උපකෘත පාසල් වශයෙන් ක්‍රියාත්මක විය. මෙම පාසල් විවිධ කතෝලික නිකායන්හි අගරදගුරුවරුන් හෝ පාසල් කළමනාකරුවන් විසින් පාලනය කරන ලදී. එසේ ම ඇතැම් පාසල් භාරකාර මණ්ඩල මගින් පාලනය විය. පාසල්වල ළමුන් සංඛ්‍යාව පදනම් කරගෙන රජය විසින් වැටුප් ගෙවීම අනුමත කරන ලදී. ගුරුවරුන් සඳහා පමණක් විශ්‍රාම වැටුප් හිමිකම ලැබී තිබුණි. මෙම ගුරුවරුන් මුලින් සඳහන් කළ පරිදි විශ්‍රාම වැටුප ආරක්ෂා කර ගැනීම සඳහා ගුරු විශ්‍රාම වැටුප් දායක මුදල් දැරිය යුතු විය. මේ අනුව වර්තමානයේදී ගුරු විශ්‍රාම වැටුප් ක්‍රමය මෙවැනි පෞද්ගලික පාඨශාලා හෝ උපකෘත පාසල් වෙනුවෙන් ද එමෙන්ම 1979 අංක 64 දරන පිරිවෙන් අධ්‍යාපන පනතින් ආවරණය වන පිරිවෙන් ගුරුවරුන් සම්බන්ධයෙන් ද ක්‍රියාත්මක වේ. ගුරු විශ්‍රාම වැටුප් සඳහා අවම වශයෙන් මාස 120ක දායක මුදල් ගෙවීම අත්‍යාවශ්‍ය වන අතර අනෙකුත් සිවිල් රාජ්‍ය නිලධාරීන් සඳහා අදාල වන කරුණු සියල්ල මෙම ගුරුවරුන් සම්බන්ධව ද විශ්‍රාම වැටුප් හිමිකම ලබා දීමට බල පැවැත්වේ. දායක මුදල් අය කරනු ලැබුවත් දායක මුදල් මත පදනම් වූ විශ්‍රාම වැටුපක් මෙම ගුරුවරුන්ට ගෙවනු නොලැබේ. රජයේ අනෙකුත් සේවකයින්ට මෙන් අවසන් වැටුප සහ සේවා කාලය මත පදනම් වූ විශ්‍රාම වැටුපක් මොවුනට හිමි ගැන්වේ.

ගුරු විශ්‍රාම වැටුප් ප්‍රතිලාභ ලැබූ පිරිවෙන් හා පෞද්ගලික පාඨශාලා ගුරුවරුන් තුළ ද සිවිල් විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා සංග්‍රහය යටතේ ගෙවන මරණ පාරිතෝෂික ලැබීමට හැකි වන පරිදි පාසල් ගුරු විශ්‍රාම වැටුප් රෙගුලාසි 1985.10.01 දින අංක 368/06 දරන ගැසට් පත්‍රය මගින් සංශෝධනය කරන ලදී. එමෙන්ම 1985.02.19 වන දින සිට සේවයේ යෙදී සිටිය දී මිය යන ගුරුවරුන්ගේ යැපෙන්නන්ට ද විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා සංග්‍රහය යටතේ ලැබිය හැකි මරණ පාරිතෝෂික හිමිකම් ලැබෙන සේ අදාළ සංශෝධනයන් කරන ලදී. එමෙන්ම 1981 අංක 44 දරන වැන්දඹු අනත්දරු විශ්‍රාම වැටුප් සංශෝධිත පනතින් ලැබෙන අනුග්‍රහයන් ගුරුවරුන්ගේ විශ්‍රාම වැටුප් පනතේ 5වන සහ 9වන වගන්ති සංශෝධන කර ගුරු වැන්දඹු අනත්දරු සමාජිකයන්ට ද එම අනුග්‍රහය ලබා දීමට තීරණය කරන ලදී.

ගුරු වැන්දඹු අනත්දරු විශ්‍රාම වැටුප ද මුලින් සඳහන් කළ පරිදි රාජ්‍ය නිලධාරීන්ට සාපේක්ෂව හිමිකම් ලැබේ. කෙසේ වෙතත් වර්තමානයේ දී ගුරු වැන්දඹු අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදලක් ස්ථාපිතව පවතී. ඒ අනුව ගුරු වැන්දඹු අනත්දරු ක්‍රමය සඳහා දායක මුදල් අය කිරීමත්, එම දායක මුදල් ආපසු ගෙවීමත් අරමුදලේ ඇති අතිරික්තය අයෝජනය කිරීමත් එම අරමුදලේ ගිණුම් පවත්වා ගැනීමත් විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුවේ කාර්යය භාරය වේ. මෙම අරමුදලේ වැදගත් දත්ත කීපයක් පහත දැක්වේ.

| වර්ෂය | දායක මුදල් ලැබීම් | දායක මුදල් ආපසු ගෙවීම් |
|---|---|---|
| 2005 | 22303503 | 215721 |
| 2006 | 24470730 | 793285 |
| 2007 | 25164112 | 224097 |
| 2008 | 46808373 | 973348 |
| 2009 | 34632280 | 1464109 |

ගුරු වැන්දඹු අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදලෙහි ආයෝජන ශේෂය 2010.01.01 දිනය වන විට රු. 331745432.17 කි. එය ජාතික ඉතිරි කිරීමේ බැංකුවෙහි රු. 254759902. 17 වශයෙන් ද ශ්‍රී ලංකා මහ බැංකුවෙහි රු. 76985530 වශයෙන් ද විය.

## 5.4. රාජකීය විශ්‍රාම වැටුප් (Kandyan Royal Pension)

ශ්‍රී වික්‍රම රාජසිංහ රජුගේ පාරම්පරික පවුල් සමාජිකයින්ට සහ ඔවුන්ගේ ආවතේවකරුවන්ට මෙවැනි විශ්‍රාම වැටුපක් ගෙවනු ලැබීය. විශේෂයෙන්ම මෙම සාමාජිකයින් ඉන්දියාවේ කේරළය, කර්නාටක සහ තමිල්නාඩුව ආශ්‍රිතව ජීවත් වුවත් මෙම විශ්‍රාම වැටුප ඉන්දියානු රජය මඟින් ගෙවනු ලැබීය. එමෙන්ම මෙම විශ්‍රාම වැටුප් විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව ඉන්දියානු රජය වෙත ප්‍රතිපූර්ණය කරනු ලැබීය. ඉතිහාසයේ යම් යම් අවස්ථාවල දී මෙම රාජකීය විශ්‍රාම වැටුප් වැඩි කළ අවස්ථා ද විද්‍යමාන වේ.

The Hon .the Ceylonese member - 2 I risk to ask Sir " whether the members of the late Kandiyan royal family resident in south India have had the benefit of the 50 percent increment allowed to government pensioners " and if they have not yet had when will the govt.sanction it.

The Hon.Acting colonial secretary The Hon. member is not quite correct with regard to the percentage of the increment allowed to government pensioners ' the question of a grant of a 50 percent increase to kandyan pensioners has already been under Consideration of govt' and sanction for its payment will be sought form the finance committee at its next meeting

1920/21 Hansard
June 20 th 1920- page 156

1990 දශකය ආරම්භ වන විට මෙම රාජකීය පවුල් සමාජිකයන්ට විශ්‍රාම වැටුප ගෙවා අවසන් කොට තිබුණි. නමුත් ඉහත සඳහන් කළ කේරළය, කර්නාටක සහ තමිල්නාඩු ප්‍රාන්තයන්හි පුද්ගලයින් ගණනාවකට ඉන්දියානු වැටුප් සහ ගිණුම් අංශ විශ්‍රාම වැටුප් ගෙවා තිබුණි. 1994 දී විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂවරයා ප්‍රමුඛ ශ්‍රී ලංකා නියෝජිත කණ්ඩායමක් ඉන්දියාවේ සංචාරය කළ අතර එහි දී මෙම විශ්‍රාම වැටුප් ගෙවීම පිළිබඳව අවබෝධතා ගිවිසුමක් ද අත්සන් කරන ලදී. එමෙන්ම 2008 වසරේ දී යළිත් විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තු නිලධාරි කණ්ඩායමක් ඉන්දියාව වෙත ගොස් මෙම විශ්‍රාම වැටුප් ගෙවීම් අධ්‍යයනය කරන ලදී. ඒ අනුව තවදුරටත් මෙම විශ්‍රාම වැටුප් නොදැරිය යුතු යැයි ගනු ලැබූ තීරණයකට අනුව Kandyan Pension අත්හිටුවා ඇත.

ප්‍රසිද්ධ ලේඛිකා සුනේත්‍රා රාජකරුණා මිය ලියූ මතක පොත ( ප්‍රථම මුද්‍රණය) රාජසිංහ හමුවීම හා කුමාරගමුවේ " මනස් මාලිගය " යන පරිච්ඡේදයේ Kandyan රාජකාරි විශ්‍රාම වැටුප ගැන තව දුරටත් කරුණු අනාවරණය කෙරේ.

මදුරෙයි පුරයේ රාජසිංහලාගේ නිවසේ දී මට පැරණි ලියවිලි කිහිපයක් කියවීමේ අවස්ථාව ලැබුණා. ඒ අනුව 1930 ජුනි 14 වැනිදා මහනුවර රජ පවුලේ දේශපාලන විශ්‍රාමිකයන් ගේ සම්මන්ත්‍රණයක් පවත්වා තියෙනවා. රාත්‍රී හතට තන්ජෝන් මාලිගයේ පැවති මේ පවුලේ රැස්වීමට දේශපාලන විශ්‍රාමිකයන් 27 ක් සහභාගි වෙලා තියනවා. මූලාසනයේ ඉඳලා තියෙන්නේ වෙන්කට නරසිම්හල රාජායි. ඔහු යෝජනාවක් ගෙනත් තියනවා. මහනුවර රජ පවුල බ්‍රිතාන්‍ය මහා රාජෝත්තමයාණන්ටත් පක්ෂපාති බව ප්‍රකාශ කළ යුතුය කියලා. ඒක ස්ථිර කරලා තියෙන්නේ කීර්ති සිංහල රාජායි. ඒක සභාවෙන් ඒකමතිකව සම්මත වෙලා.

මා හිතන්නේ එවැනි යෝජනාවකින් සභාවේ වැඩ ඇරඹෙන්න ඇත්තේ ආරක්ෂිත පියවරක් වශයෙන් වෙන්න ඇති. රාජසිංහලාගේ ජීවිතය තිබුණේ බ්‍රිතාන්‍යයන් අතේනේ. ඔවුන්ගේ අදහස් වන්නේ රිසර්ව්ඩ් ක්ලාස් කියලා. එහෙම කියලා තියෙන්නේ ලේ ඥාතීන්ට විතරයි. එදා රැස්වීමේ දී විශ්‍රාමිකයන්ගේ දුක් ගැනවිල්ල වෙලා තිබුණේ තමන්ගේ දරු මුණුබුරන්ගේ අධ්‍යාපනයයි. "අපේ දරු මුණුබුරන්ගේ

අධ්‍යාපන දීමනාවයි, අපේ පෙන්ෂන් එක නැවැත්තුවේ කලින් දැනුම් දෙන්නෙත් නැතුව. මගේ අප්පා සල්ලි ගන්න ගියාම එක පාරටම කියලා ඒක නවත්වලයි කියලා. අපිට එකපාර මුකුත් දීමනාවක් දෙන්නෙවත් නැතිව හිටි ගමන්මයි ඒක කළේ.”

ඔහුගේ පියාට අවසාන වරට ලංකාවෙන් ගෙවූ විශ්‍රාම වැටුප රු. 266.60 යි. ඒ 1964 ඔක්තෝම්බර් මාසය සඳහාය.

1869 අංක 5 දරන පනතින් රාජසිංහලාට නැවත ලංකාවට ඒමට අවසර ලැබිලා තියෙනවා. නමුත් කවුරුවත් එන්න කැමති වෙලා නෑ.

1927 දී මහනුවර විශ්‍රාමිකයන් ගේ තත්ත්වය විග්‍රහ කරන්න බ්‍රිතාන්‍ය රජයෙන් කොමිටියක් පත් කරලා තියෙනවා. සී.වී.බ්‍රෙයින් ගේ සභාපතිත්වයෙන් පත්වූ මෙම කමිටුවේ හය දෙනෙක් ඉඳලා තියනවා. ජී. ඊ. ඩබ්. පෙරේරා, සී. ඩබ්. ඩබ්. කන්නන්ගර, එල්. ආර්. තම්බිමුත්තු, පී. බී.රඹුක්වැල්ල, ඩී. බී. ජයතිලක හා නඩේසන් අයියාර් යන මහත්වරුන්.

1871 විගණකාධිපතිව සිටි සර් ජෝන් ඩග්ලස් ගේ වාර්තාව අනුව ඒ වෙනකොට මහනුවර විශ්‍රාමිකයන් 1871 ක් ඉඳලා තියෙනවා. එයින් 48 ක් උපතින්, සහෝදරකමට සදා ගැනීමෙන් හෝ මහනුවර රජ පවුලට සෘජු සම්බන්ධයක් තියෙන අයයි. විගණකාධිපති යෝජනා කරලා තියෙන්නේ විශ්‍රාම වැටුප සහ අනෙකුත් දීමනා වලට එක් පවුලකින් එක් අයෙකුට පමණක් හිමිකම් කිව හැකි විය යුතුය කියලා විශ්‍රාමිකයන්ගේ පුත්තුන්ට අධ්‍යාපන දීමනාවක් දුන්නට මොකද දූවරුන්ට විශ්‍රාම වැටුපකටත් හිමිකමක් ලැබිලා නැහැ.

1929 දී පළ වූ බ්‍රෙයින් කොමිසමේ වාර්තාවෙන් පෙනෙන්නේ ඉන්දියානු රජය එක්ක කතා කරලා සමින්දාරි ඉඩම් ලබා දීමකටත් උත්සහ කළ බවයි. ඒ වෙනකොට හොඳටම ණය වෙලා හිටියත් ගොවිතැන කිරීම තමන්ගේ තත්ත්වයට නොගැළපෙන බවයි රාජසිංහලාගේ මතය වෙලා තියෙන්නේ. අධ්‍යාපන දීමනාව කෙලින්ම ගුරුවරුන්ට දීලා තියෙන්නේ වැඩිහිටියෝ ඒක නාස්ති කරයි කියලයි. ඇතැම් ශ්‍රමිකයන් ණය වුනාම වරින් වර ලංකාවෙන් ඒ ණය ගෙවා දාලාත් තියෙනවා. පවුලේ වැදගත් අය මැරුණාම පොලිස් ආචාර පැවැත්වීමටත් අවමංගල දීමනාවකුත් සැපයෙනවලු. කමිටු වාර්තාවෙන් පොලිස් ආචාර නැවැත්වීමටත් අවමංගල දීමනාව වැඩි නොකිරීමටත් යෝජනා කරලා. මගුලකට රු.1000 කුත් මරණයකට රු.500කුත් උපරිමය විය යුතු බව කමිටුව කියා තියෙනවා. හැම විශ්‍රාමිකයෙක් වටේම දුගී ඥාතීන් රැස්වෙලා හිටි නිසා මේ දීමනා භුක්තිය එක් බිරිඳකට හා එක් පුතකුට පමණක් හිමි විය යුතු වගට අවධාරණය කරනවා.

වරින්වර රාජසිංහ පවුලෙන් ඉදිරිපත් කළ ඉල්ලීම් කමිටුවේ විමසුමට ලක් කරලා තියෙනවා. මහනුවර බිසවුන්ට හිමිව තිබූ ශ්‍රී දාන ඉඩ කඩම් ගැන ප්‍රශ්නය මතුවෙලා තියෙන්නේ ඒ අනුවයි. බලයේ සිටිනා රජුගේ බිසවුන්ට රජු ගේ මනාපය අනුවයි ශ්‍රී දාන ගම්වර භුක්ති විඳිය හැකි වෙන්නේ. ඒ ගම්වර පෞද්ගලික දේපළ හැටියට නොතකන නිසා බිසවුන්ට ඒවායේ කිසිම උරුමයක් නැති හැටියටයි තීන්දු වෙලා තියෙන්නේ.

දොස්තර රාජසිංහ කියන්නේ ශ්‍රී ලංකාවෙන් තමාට සුළු මුදලක් හෝ ලැබිය යුතු බවයි. ඔහු ඒ ගැන ඉල්ලා සිටිමින් වර්තමාන ජනපතිනියට ලියූ ලිපියක පිටපතක් මට දක්නට ලැබුණා. ඔහු ඇය අමතා තිබෙන්නේ අතිගරු ශ්‍රීමත් චන්ද්‍රිකා බණ්ඩාරනායක කුමාරතුංග වර්තමාන ශ්‍රී ලංකා මහනුවර ජනාධිපතිනිය ලෙසයි.

“දැන් මහනුවර රාජධානියක් නෑ. ඒ හින්දා ඔය විදිහට ලියන්න එපා ” කියන්න මට දුන්නේ නෑ.

එදා රාත්‍රියේ අදිති හෝටලයේ කුඩා අංගනයට වී ලැසි බොමින් මා කල්පනා කළේ එතරම් දුරක් ගෙවා පැමිණ සොයා ගත් තොරතුරු වලින් කුමක් කළ යුතුදැයි කියාය.එහෙත් මට කිසිම දෙයක් පැහැදිළිව හිතා ගන්නට බැරි වුණා. ටික වේලාවකින් අසල කෝවිලක සණ්ඨාර හඬක් ඇහුණා.

ඉතිහාසයේ නින්නාදය මිහිරි හඬක් හෝ එකම අදෝනාවක් නෙවෙයි. මගේ ජාතියට- පරපුරට සිදුවූ අසාධාරණයක් නෙවෙයි . ලෝකාරම්භයේ සිට මිනිසාට පසු කරන්නට වෙන මං සන්ධියක් පමණක්ය යන්න තේරුම් ගැනීම හෝ නොගැනීමේ චිත්ත ස්වභාවය ටාං.... ටාං.... ටාං.... ගාලා ඔලුවට වැදෙන්න ගත්තා.

## 5.5 විදේශ විශ්‍රාම වැටුප්

ශ්‍රී ලාංකික විශ්‍රාමිකයින් 25000කට ආසන්න ප්‍රමාණයක් විදේශගතව වාසය කෙරේ. ඔවුන් ප්‍රධාන වශයෙන්

ඕස්ට්‍රේලියාව (නවසීලන්තය ඇතුළුව)
ඉන්දියාව
එක්සත් රාජධානිය
එක්සත් ජනපදය
කැනඩාව

යන රටවල්හි ජීවත්වේ. මීට අමතරව මැදපෙරදිග රැකියා සඳහා ද සැලකිය යුතු විශ්‍රාමිකයින් ප්‍රමාණයක් විදේශගතවී ඇත. එමෙන්ම ඉතාලිය, ජර්මනිය, ස්විස්ටර්ලන්තය වැනි රටවල් කීපයක් ද ශ්‍රී ලාංකික විශ්‍රාමිකයන් ජීවත් වෙති.

**ශ්‍රී ලංකාවේ විශ්‍රාමිකයන් විදේශයන්හි වාසය කිරීමට හේතු කිහිපයක් බලපා ඇත**

01. සුදු ජාතික නිලධාරීන් ශ්‍රී ලංකාවේ සේවය කිරීම හා නැවත ඔවුන් තම මව්රට බලා යාම.
02. භාෂා හේතු මත විශ්‍රාමගත් නිලධාරීන් වෙනත් රටවලට සංක්‍රමණය වීම.
03. පොදු රාජ්‍ය මණ්ඩලීය රටවල් (ඕස්ට්‍රේලියාව) වෙත සංක්‍රමණය වීමට තිබූ වාසිසහගත තත්ත්වය සැලකිල්ලටගෙන විදේශගත වීම.
04. 1983 ජනවාර්ගික අර්බුදය හේතුවෙන් සරණාගතයින් ලෙසින් සංක්‍රමණය වීම.
05. යටත් විජිත ආර්ථිකය තුළ ශ්‍රී ලංකාවේ රාජකාරී ඉටුකළ ඇතැම් ඉන්දියානු ජාතිකයන් එම රටට යාම.
06. ඉන්දියානු පුරවැසිභාවය ලැබීම හේතුවෙන් ඇතැම් නිලධාරීන් ඉන්දියාවට සංක්‍රමණය වීම.
07. ශ්‍රී ලංකාව රාජසිංහ පරම්පරාවේ පරම්පරාගත නිලධාරීන්ට කැන්ඩියන් විශ්‍රාම වැටුප ගෙවීම. (Kandyan Pension)
08. මෑත කාලයේ උතුරු ප්‍රදේශයේ පදිංචි ශ්‍රී ලාංකික විශ්‍රාමිකයින් ජනවාර්ගික අර්බුදය හේතුවෙන් විදේශගත වීම.
09. දූ දරුවන් විදේශගතවීම මත විශ්‍රාමික දෙමාපියන් විදේශගත වීම.
10. විශ්‍රාමිකයන්ගේ වැන්දඹුවන් හා අනත්දරුවන් ද ඉහත හේතු මත විදේශගත වීම.

විදේශගත ශ්‍රී ලාංකිකයන්ට විශ්‍රාම වැටුප් ගෙවීමේදී ඒ සඳහා ක්‍රියාමාර්ග ගණනාවක් අනුගමනයකර තිබේ.

Crown Agent මඟින් ගෙවීම

එංගලන්තයේ පිහිටි Crown Agent විශ්‍රාම වැටුප් අංශය මඟින් ශ්‍රී ලාංකික විශ්‍රාමිකයින්ට විශ්‍රාම වැටුප් ගෙවීමට පහසුකම් සලසා තිබුණි. ඒ අනුව එංගලන්තය, ඉන්දියාව, ඇමෙරිකා එක්සත් ජනපදය, නවසීලන්තය, කැනඩාව, ඕස්ට්‍රේලියාව, ජර්මනිය වැනි රටවල්වල පදිංචිව සිටි සියකට (100) ආසන්න විශ්‍රාමිකයින්ට විශ්‍රාම වැටුප් ගෙවීම එම ආයතනය භාරගෙන තිබුණි. මෙම සේවාව 1970 දී විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව පිහිටුවීමට පෙර සිටම එනම් මුදල් අමාත්‍යංශය යටතේ ක්‍රියාත්මක වූ අතර එකී විශ්‍රාම වැටුප ගෙවීම වෙනුවෙන් Crown Agent වෙත පවුම් 5 ක කොමිස් මුදලක් මුදල් අමාත්‍යංශය විසින් ගෙවන ලදී. එමෙන්ම Crown Agent විසින් සිදුකළ විශ්‍රාම වැටුප් පිරිවැය ද මහා භාණ්ඩාගාරය විසින් එම ආයතනය වෙත ප්‍රතිපූර්ණය කරන ලදී.

Crown Agent මඟින් විශ්‍රාම වැටුප් ගෙවීමේදී පහත සඳහන් ගැටළු පැන නැගුණි:

* විශ්‍රාමික නාමලේඛනය, විශ්‍රාම වැටුප් ගොනුව නොමැති වීම;
* විශ්‍රාමිකයා හඳුනාගත නොහැකිවීම හා ඔහු ජීවත්වන බව සනාථ නොවීම;
* ගෙවූ මුදල නිවැරදි නොවීම;
* ප්‍රතිපූර්ණය කිරීම කුමන පදනමක් මත සිදු කෙරුනි ද යන්න තහවුරු නොවීම;
* විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුවේ හෝ ශ්‍රී ලංකා රජයේ අධීක්ෂණයක් සිදු නොවීම;
* එංගලන්තයේ පිහිටි ආයතනයක් ලෝකයේ වෙනත් රටක විශ්‍රාම වැටුප් ගෙවීම;
* එම ගෙවීම මහ කොමසාරිස් කාර්යාලයේ අධීක්ෂණයට යටත් නොවීම;
* විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුවෙන් පරිබාහිරව මහා භාණ්ඩාගාරය ගෙවීම සිදු කිරීම;
* අධික කොමිස් මුදල් ගෙවීමට සිදු වීම;
* ශ්‍රී ලංකා මහ කොමසාරිස් කාර්යාල ක්‍රියාත්මක වූ රටවල් වලද ඇතැම් ගෙවීම් Crown Agent හරහා සිදු වීම;

**මහ කොමසාරිස් කාර්යාලය මඟින් ගෙවීම.**

එක්සත් රාජධානිය, කැනඩාව, ඉන්දියාව හා ඕස්ට්‍රේලියාව මඟින් එම රටවල්හි පදිංචි විශ්‍රාමිකයින් විශ්‍රාම වැටුප් ගෙවනු ලැබේ. ඒ, ඒ මහ කොමසාරිස් කාර්යාලයන්හි විශ්‍රාම වැටුප් ඒකක ක්‍රියාත්මක වන අතර පදිංචිය හඳුනාගෙන ඔවුනට ගෙවීම් සිදු කරනු ලැබේ. මේ සඳහා අවශ්‍ය ප්‍රතිපාදන විදේශ කටයුතු අමාත්‍යංශය මඟින් ඒ ඒ මහ කොමසාරිස් වෙත ලබාදීමට පියවර ගෙන ඇත. මෙම ගෙවීම් ක්‍රමය තුළ ද පහත සඳහන් ගැටළු මතුවී ඇත

01. විදේශ විශ්‍රාමිකයින් සම්බන්ධව පැහැදිලි Data Base නොතිබීම;
02. ඔවුන් ජීවත්වන බව සනාථ නොවීම;
03. වැරදිසහගත ගෙවීම් සිදුවීම;
04. විශ්‍රාම වැටුප් වැඩියෙන් හෝ අඩුවෙන් ගෙවීම;
05. ලිපිගොනු නොමැති ගෙවීම් සිදුවීම;
06. වැන්දඹුවන්ගේ සිවිල් තත්වය සනාථ නොවීම;

පවතින ක්‍රමවේදය තුළ පවතින අඩුපාඩු හඳුනා ගැනීමටත් ඒ සඳහා පිළියම් යෙදීමටත් කටයුතු කෙරෙමින් පවතී. ඒ අනුව මේ වන විටත් මහ කොමසාරිස් කාර්යාලය මඟින් විශ්‍රාම වැටුප් ලබාගන්නා විශ්‍රාමිකයන්ගේ දත්ත ගබඩාවක් (Data Base) ඇති කිරීමත් ඔවුන්ගේ විශ්‍රාම වැටුප් ගැටලුව සඳහා පිළියම් යෙදීමටත් අවශ්‍යතාවය මතු විය.

## ඉන්දියානු රජය මඟින් ගෙවනු ලබන විශ්‍රාම වැටුප් ප්‍රතිපූර්ණය කිරීම

ඉන්දියාවේ පදිංචි ශ්‍රී ලාංකික විශ්‍රාමිකයන්ට විවිධ ක්‍රම මඟින් විශ්‍රාම වැටුප් ගෙවා තිබුණි.

(a) එංගලන්තය Crown Agent මඟින්, (මෙම ගෙවීම් 2008 මාර්තු සිට නවතා දමා ඇත.)

(b) ඉන්දියානු ශ්‍රී ලංකා නියෝජ්‍ය මහ කොමසාරිස් කාර්යාලය මඟින් ගෙවීම.

ඉන්දියාවේ මහ කොමසාරිස් කාර්යාලය දිල්ලියෙහි පිහිටුවා ඇති අතර නියෝජ්‍ය මහ කොමසාරිස් කාර්යාලය චෙන්නායිවල පිහිටුවා ඇත. මහ කොමසාරිස් හරහා ගෙවීම් සිදු නොවන අතර නියෝජ්‍ය මහ කොමසාරිස් කාර්යාලය විසින් විශ්‍රාමිකයින් 100 දෙනෙකුට පමණ ගෙවීම් සිදු වේ. ඊට අවශ්‍ය ප්‍රතිපාදන විදේශ කටයුතු අමාත්‍යාංශය හරහා මුදාහරිනු ලැබේ. මෙහි දී නියෝජ්‍ය මහ කොමසාරිස් කාර්යාලය මඟින් පුද්ගලයින් හඳුනාගෙන එනම් ජීවිත සහතික ලබාගෙන ගෙවීම් සිදු කරනු ලැබේ.

## ඉන්දියාවේ Pay & Account Officer හරහා විශ්‍රාම වැටුප් ගෙවීම

ඉන්දියාවේ රජය මඟින් පුද්ගලයින් 400 කට පමණ කේරළය, කර්නාටක, දිල්ලි හා චෙන්නායි යන නගර වලින් ගෙවීම් සිදු කරන අතර එම ගෙවීම් ඉන්දියානු රජය වෙත ප්‍රතිපූර්ණය කරනු ලැබේ. අදාළ ගෙවීම් වවුචර තැපැල් මඟින් විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුවට ලැබුණු පසු දැරිය යුතු මුදල ඇමරිකන් ඩොලර් වලින් ශ්‍රී ලංකාවේ පිහිටි ඉන්දියානු මහ කොමසාරිස් කාර්යාලය වෙත ලබා දීමට පියවර ගෙන ඇත.

ශ්‍රී ලංකා මහ කොමසාරිස් කාර්යාලය මඟින් විශ්‍රාම වැටුප් ගෙවීමේදී පැනනැගෙන ගැටළු එම මහ කොමසාරිස් කාර්යාලයේ නිලධාරීන් සමඟ සාකච්ඡාකොට විසඳා ගැනීමේ හැකියාව පවතී. කෙසේ වෙතත් ඉන්දියානු රජය මඟින් විශ්‍රාම වැටුප් ගෙවීම හා එම විශ්‍රාම වැටුප් වියදම ශ්‍රී ලංකාව විසින් ප්‍රතිපූර්ණය කිරීමේ දී පහත ගැටළු පැනනැගී ඇත;

01. ඉන්දියානු රජය විසින් කුමන බලතල යටතේ මෙම විශ්‍රාම වැටුප් ගෙවා ශ්‍රී ලංකාවෙන් ප්‍රතිපූර්ණය කරන්නේදැයි පැහැදිලි නොවීම;

02. මෙම විශ්‍රාමිකයන්ගේ විශ්‍රාම වැටුප් ලිපිගොනුවක් නොමැති වීම;

03. ගෙවන විශ්‍රාම වැටුප් හුදෙක්ම විශ්‍රාම වැටුප් ද එසේත් නැත්නම් කරුණා සහගත හෝ වෙනත් දීමනාවක් ද යන්න පැහැදිලිව අනාවරණය නොවීම;

04. විශ්‍රාමිකයන් ජීවත් වන බව සහ අදාල පුද්ගලයින්ට නිවැරදිව ගෙවන බවට තහවුරු නොවීම;

05. මුදල් ප්‍රතිපූර්ණය කිරීමේදී බොහෝ කල්ගත වූ වවුචර් පත් මෙම දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කිරීම සහ අපිළිවෙළ;

06. වාර්ෂිකව රුපියල් මිලියන පහක පමණ මුදලක් ඉන්දියානු රජය වෙත ප්‍රතිපූර්ණය කිරීම හා එම මුදල් භාවිතය පිළිබඳව සෑහීමකට පත් විය නොහැකි වීම;

07. ඉන්දියානු රජය වෙත ඇමරිකන් ඩොලර් භාවිතයෙන් අදාළ වියදම ප්‍රතිපූර්ණය කරන අතර ඉන්දියානු මහ කොමසාරිස් වෙත භාර දුන් පසු ඉන්දියානු මහ කොමසාරිස් විසින් ඉන්දියානු

රජය වෙත එකී මුදල් ප්‍රේෂණය කෙරේ. මෙසේ කිරීමේ දී විනිමය අනුපාත පිළිබඳ ගැටළු පැනනැගීම. මේ නිසාම අධි හා අව ගෙවීම් සිදුවිය හැකි වීම

08. විටින් විට ශ්‍රී ලාංකික රජය වෙතින් විශ්‍රාමිකයන් වෙනුවෙන් පනවන කොන්දේසි හා ලබා දෙන සහන මෙම විශ්‍රාමිකයන්ට නොලැබීම. (විශ්‍රාම වැටුප් විෂමතාවයන් ගෙවා නොතිබීම.)

09. විශ්‍රාමික පුද්ගලයින් මිය ගිය පසු මෙම විශ්‍රාම වැටුප වෙනත් පුද්ගලයෙකුට ලබා ගැනීමේ හැකියාව පැවතීම;

10. ආරම්භයේ සිට 2006. 01. 01 දක්වා මහ භාණ්ඩාගාරය විසින් මෙම විශ්‍රාම වැටුප් වෙනුවෙන් ගෙවීම් ප්‍රතිපූර්ණය ඉන්දියානු රජය විසින් සිදු කළ අතර ඉන් අනතුරුව මෙම දෙපාර්තමේන්තුව වෙත මෙම විෂය පවරා ගැනීමෙන් අනතුරුව පැරණි ක්‍රමවේදය දිගටම අනුගමනය කිරීම;

11. විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව ඉන්දියානු ගෙවීම් පිළිබඳව අධීක්ෂණය නොකිරීම;

12. ගෙවීම් අනුගමනය කිරීමේ දී හා වියදම් සහතික කිරීමේදී ගැටළු පැනනැගීම;

13. ඉන්දියානු රජය මුදල් ප්‍රතිපූර්ණය කිරීමේ දී කල් ගත වී වවුචර් ඉදිරිපත් කිරීම නිසා එහි නිරවද්‍යතාවය පිළිබඳව අපහැදිළි බව;

14. ඉන්දියානු රජය ඉල්ලා සිටිනු ලබන මුළු මුදලම ප්‍රතිපූර්ණය කිරීම කළ යුතු වීම;

### ශ්‍රී ලංකා බැංකු මඟින් විශ්‍රාම වැටුප් ගෙවීම

ඉහත සඳහන් ක්‍රමවලට අමතරව විදේශගත විශ්‍රාමිකයන් ශ්‍රී ලංකාවේ පිහිටි බැංකු ගිණුමක් මඟින් විශ්‍රාම වැටුප් ලබා ගැනීමේ පහසුකම් ද සලසා ඇත. එය පහත සඳහන් තත්ත්වයන්ට අනුව ක්‍රියාත්මක වේ;

01. යම් පුද්ගලයෙකු විදේශගතවන විට විශ්‍රාම වැටුප් ගෙවීම පරිගණකයේ විදේශ ගොනුවට ඇතුළත් කිරීම (Overseas Column);

02. ප්‍රාදේශීය ලේකම් විසින් විශ්‍රාම වැටුප විශ්‍රාමිකයාගේ බැංකු ගිණුමට යැවීම;

03. විශ්‍රාමිකයා මාස්පතා ජීවිත සහතිකයක් තම ගිණුම පිහිටි බැංකුව වෙත ඉදිරිපත් කළ යුතුවේ;

04. ජීවිත සහතිකයක් ලැබීමෙන් අනතුරුව මුදල ගිණුම් හිමියා වෙත මුදාහැරීම;

මෙම ක්‍රියාවලියේ දී පහත ගැටළු මතුව ඇත;

- ඇතැම් විශ්‍රාමිකයන් විදේශගතවීමේ දී දැනුම් නොදීම හා එම ගෙවීම Local Column යටතේ ක්‍රියාත්මක වීම;
- බැංකු ගිණුම බද්ධ ගිණුමක් වශයෙන් ක්‍රියාත්මක වීම;
- ව්‍යාජ ජීවිත සහතික ඉදිරිපත් කිරීම;
- ඇතැම් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශවල ඉතා විශාල සංඛ්‍යාවක් විදේශගතව සිටීම ;

  (උදා: කොළඹ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය;)
- මෑතදී සිදුකළ ගෘහමූලික සමීක්ෂණයට අනුව ඇතැම් විශ්‍රාමිකයන්ගේ පදිංචිය අනාවරණය නොවීම;
- ග්‍රාම නිලධාරී මඟින් පදිංචිය සනාථ කරගත නොහැකි වීම;

## විදේශ විශ්‍රාම වැටුප් ප්‍රතිපත්තීන් සහ උපායමාර්ග

විදේශ විශ්‍රාම වැටුප් ගෙවීම සඳහා ක්‍රමානුකූල ක්‍රමවේදයක් නිර්මාණය කිරීම වෙනුවෙන් මෙම ප්‍රතිපත්ති සහ උපායමාර්ග පිළියෙල කරනු ලැබේ. විශේෂයෙන්ම විදේශ විශ්‍රාම වැටුප් ගෙවීම් ක්‍රියාවලියෙහි පැන නැගී ඇති ගැටළු සහ අපිළිවෙළ හඳුනාගැනීමෙන් පසු ඒවා ඉවත්කරමින් පහත සඳහන් උපායමාර්ග ගෙන ඇත.

### විදේශ විශ්‍රාම වැටුප් ගෙවීම සම්බන්ධව සියලුම කටයුතු විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව යටතට පවරා ගැනීම

1970 දී විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව පිහිටුවන අවස්ථාවේ දී විදේශ විශ්‍රාම වැටුප් ගෙවීමේ ඇතැම් කටයුතු මෙම දෙපාර්තමේන්තුවට පවරා නොතිබුණි. එබැවින් එම කටයුතු 2006 ජනවාරි 01 දින සිට පවරාගනු ලැබීය.

### Crown Agent විශ්‍රාම වැටුප් අංශය මඟින් සිදුකළ විශ්‍රාම වැටුප් ගෙවීම් සියල්ල අත්හිටුවීම සහ එම ගෙවීම් ශ්‍රී ලංකා විදේශ දූත මණ්ඩල කාර්යාලය වෙත පවරා දීම

2008 වසර ආරම්භවන විට Crown Agent විශ්‍රාම වැටුප් අංශය මඟින් සිදුකළ ගෙවීම් පහත සඳහන් පරිදි පැවතුණි;

| | | |
|---|---|---|
| ඇමරිකා එක්සත් ජනපදය | - | 62 |
| නවසීලන්තය | - | 16 |
| ඕස්ට්‍රේලියාව | - | 30 |
| කැනඩාව | - | 15 |
| ඉන්දියාව | - | 06 |
| වෙනත් | - | 05 |

මෙම Crown Agent වෙත එක් ගෙවීමක් වෙනුවෙන් පවුම් 5.5 ක කොමිස් මුදලක් ශ්‍රී ලංකා රජය විසින් ගෙවනු ලැබීය. මෙම ගෙවීම් ද අත්හිටවනු ලැබේ. එමෙන්ම ඒ ඒ රටවල පිහිටි ශ්‍රී ලංකා දූත මණ්ඩල කාර්යාල වෙත අදාළ ගෙවීම් මාරු කිරීමට පියවරගනු ලැබේ. 2008 මාර්තු සිට ඇමරිකාව, ඉන්දියාව, කැනඩාව, ඕස්ට්‍රේලියාව, බ්‍රිතාන්‍ය යන රටවල පිහිටි දූත මණ්ඩල කාර්යාල වෙතට පැවරීම් කර ඇත.

## විදේශ විශ්‍රාම වැටුප් ඒකකය පිහිටුවීම

විශේෂ අමාත්‍ය මණ්ඩල පත්‍රිකාවකට අනුව විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ ජනරාල් තනතුරක් ඇති කිරීමත් ඒ සමඟ දෙපාර්තමේන්තුව ප්‍රතිව්‍යුහගත කිරීම යටතේ විදේශ විශ්‍රාම වැටුප් අංශයක් පිහිටුවීම හා මෙම අංශය සහකාර අධ්‍යක්ෂවරයකුගේ පාලනය යටතේ පවතී. (කාර්ය මණ්ඩලයට විශ්‍රාම වැටුප් නිලධාරීන් හා කළමනාකරණ සහකාර නිලධාරීන් ඇතළු 10 කි.) විදේශ විශ්‍රාම වැටුප් මෙම අංශයට සිවිල් හමුදා, පළාත් පාලන සහ වැන්දඹු අනත්දරු විශ්‍රාම වැටුප් සියල්ල පවරා ඇත.

**ඉන්දියානු රජය මඟින් ගෙවනු ලබන විශ්‍රාම වැටුප් දීම අත්හිටුවීම සහ එම ගෙවීම් ඉන්දියාවේ චෙන්නායිහි පිහිටි ශ්‍රී ලංකා නියෝජ්‍ය මහ කොමසාරිස් කාර්යාල වෙත පැවරීම.**

1971 පෙර සිට ඉන්දියානු රජය ශ්‍රී ලාංකික පුද්ගලයන් වෙනුවෙන් විශ්‍රාම වැටුප් දීමනාවක් ගෙවනු ලබන අතර එම ගෙවීම් ශ්‍රී ලංකාව තුළින් ප්‍රතිපූර්ණය කරනු ලැබේ. මෙම ගෙවීම් ආරම්භය පිළිබඳ නිශ්චිත තොරතුරු නැතත් කේරළය, කර්නාටක සහ තමිල්නාඩු උප භාණ්ඩාගාර විසින් පුද්ගලයන් 500 කට ආසන්න සංඛ්‍යාවකට විශ්‍රාම වැටුප් දීමනාවක් ගෙවනු ලබන අතර එම ගෙවීම් ඉන්දියානු මුදල් අමාත්‍යාංශය යටතේ ඇති Pay & Account Office මඟින් ප්‍රතිපූර්ණය කරගනු ලැබේ. 1994 දී ශ්‍රී ලාංකික නියෝජිත කණ්ඩායමක් ඉන්දියානු රජය සමඟ මෙම විශ්‍රාම වැටුප් ගෙවීම සම්බන්ධව අවබෝධතා ගිවිසුමකට අත්සන්කොට ඇත.

මෙම ගිවිසුමට අනුව විශ්‍රාම වැටුප් දීමනා ඉන්දියානු විශ්‍රාම වැටුප් ගෙවන ආකාරයට බැංකු ගිණුම්වලට සෘජුව ගෙවීමටත් ඉන් අනතුරුව එම මුදල් ප්‍රතිපූර්ණයකර ගැනීමටත් එකඟතාවය ප්‍රකාශ කොට ඇත. කෙසේ වෙතත් මෙම ගිවිසුමට අනුව ක්‍රියාත්මක වී නොමැති අතර 2008 වසර අවසන් වන විටත් 1994 ට පෙර පැවති ක්‍රමවේදයම අනුගමනයකොට ඇත;

මෙම ගෙවීම් ක්‍රමවේදය අධ්‍යනය කිරීමට 2008 නොවැම්බර් 29 - දෙසැම්බර් 07 දක්වා විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුවෙහි නියෝජිත කණ්ඩායමක් ඉන්දියාව වෙත යවන ලද අතර එහි දී මෙම යම් ක්‍රමයෙහි ගැටලු සහ නව ක්‍රමවේදයන් සාකච්ඡා කරන ලදී. ඊට අනුව මෙම ගෙවීම් ශ්‍රී ලංකා මහ කොමසාරිස් කාර්යාල වෙත පැවරීමට කටයුතු කරන ලදී. 2009 අගෝස්තු මස සිට ඉන්දියාවේ Pay & Account ආයතනය මඟින් සිදුකළ විශ්‍රාම වැටුප් ගෙවීම ශ්‍රී ලංකා නියෝජ්‍ය මහා කොමසාරිස් කාර්යාලයට පවරා ගැනීමට කටයුතු කර ඇත.

**විදේශ රටවල් වල පදිංචි නිතර ශ්‍රී ලාංකික පුරවැසියන්ගේ විශ්‍රාම වැටුප විදේශීය දූත මණ්ඩල කාර්යාල මඟින් ගෙවීම**

5.1 2008 මාර්තු 01 දින සිට ඇමරිකා එක්සත් ජනපදයෙහි ශ්‍රී ලංකා තානාපති කාර්යාලය මඟින් විශ්‍රාම වැටුප් ගෙවීමේ නව ක්‍රමවේදය හඳුන්වාදෙන ලදී. ඒ අනුව Crown Agent මඟින් ඇමරිකා එක්සත් ජනපදයෙහි ගෙවන ලද සියලුම විශ්‍රාම වැටුප් අත්හිටුවන ලදී. විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව විසින් විශ්‍රාමිකයන් පිළිබඳ තොරතුරු ලේඛනයක් (Pension File) සකස් කරන ලද අතර විශ්‍රාම වැටුප් ලිපිගොනුව මෙම දෙපාර්තමේන්තුව විසින් සකස්කොට අන්තර්ජාලයට එකතු කරන ලදී. එමෙන්ම ගෙවීම් ගොනුව සකස්කොට විදේශ කටයුතු අමාත්‍යාංශය හරහා ඇමරිකා එක්සත් ජනපදයෙහි ශ්‍රී ලංකා තානාපති කාර්යාලය වෙත යවනු ලැබූ අතර අදාළ ප්‍රතිපාදන මුදාහරින ලදී. එමෙන්ම ගෙවීම් කිරීමට අවශ්‍ය උපදෙස් පැහැදිලිව ලබාදී ඇත. එමෙන්ම ජීවිත සහතික ලබාගැනීම සහ එම ලබාගැනීමේ දී අනුගමනය කළ යුතු ක්‍රියා පටිපාටිය ද හඳුන්වා දී ඇත.

5.2 ඕස්ට්‍රේලියාවේ මහකොමසාරිස් කාර්යාලය මඟින් සිදුකළ විශ්‍රාම වැටුප් ගෙවීම් අධ්‍යනයට 2006 වසරේ දී විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ ජනරාල් ඇතුළු නියෝජිත කණ්ඩායමක් සහභාගි විය. ඒ අනුව නවසීලන්තයේ පදිංචි ශ්‍රී ලාංකික විශ්‍රාමිකයන්ගේ (Crown Agent) මඟින් ගෙවනු ලැබූ විශ්‍රාම වැටුප් ඕස්ට්‍රේලියානු මහ කොමසාරිස් කාර්යාලය හරහා ගෙවීමට තීරණය විය.

5.3 විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ ජනරාල්වරයා 2009.07.14 දින ඇමරිකා එක්සත් ජනපදයේ ලොස් ඇන්ජලීස්හි ශ්‍රී ලංකා කොන්සියුලර් ජනරාල්වරයා සමඟ එරට විශ්‍රාම වැටුප් ගෙවීම් ප්‍රගතිය හා ගැටලු පිළිබඳව සාකච්ඡාවක් පවත්වනු ලැබීය. ඉහත සඳහන් පරිදි දැනට ඇමරිකා එක්සත් ජනපදයෙහි ගෙවනු ලබන විශ්‍රාම වැටුප් ක්‍රමවේදය මහාබ්‍රිතාන්‍ය, ඉන්දියාව, කැනඩාව, සහ ඕස්ට්‍රේලියාව යන රටවල් සඳහා හඳුන්වා දීමට නියමිත අතර එය 2010 ජනවාරි මස සිට ක්‍රියාත්මක කෙරුණි.

5.4 ප්‍රධාන රටවල් හැරුණු කොට විශ්‍රාමිකයන් විශාල සංඛ්‍යාවක් ජීවත්වන ජර්මනිය, ස්විඩනය, සිංගප්පූරුව ස්විස්ටර්ලන්තය, ඉතාලිය, ඩුබායි වැනි අනිකුත් රටවල් සඳහාද ඉහත සඳහන් පරිදි යෝජිත ක්‍රමවේදය මත විශ්‍රාම වැටුප් ගෙවීමට පියවර ගනු ලැබේ.

## විදේශයන්හි පදිංචිව සිට ශ්‍රී ලංකාවෙන් විශ්‍රාම වැටුප් ලබාගන්නා විශ්‍රාමිකයන්ගේ ගෙවීම් ප්‍රතිසංවිධානය

විශ්‍රාමික විශාල සංඛ්‍යාවක් මෙම ක්‍රමය යටතේ විශ්‍රාම වැටුප් ලබාගනී. කොළඹ දිස්ත්‍රික්කයේ පමණක් 15,000 ක් වැනි විශාල ප්‍රමාණයක් විදේශගතව සිට ශ්‍රී ලාංකික බැංකුවක් මඟින් විශ්‍රාම වැටුප ලබාගනී. පහත සඳහන් පරිදි මෙම ගෙවීම් ප්‍රතිසංවිධානය කෙරේ.

01. විදේශීය නිත්‍ය පදිංචිය ඇති විට ගෙවීම විදේශීය දූත මණ්ඩල කාර්යාල වෙත මාරු කිරීම.

02. අනිකුත් ලිපිගොනු ප්‍රාදේශීය ලේකම් කාර්යාල වෙතින් විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුවට පවරා ගැනීම සහ එකම බැංකුවක විවෘත කරන විශේෂ ගිණුමකට පමණක් එම මුදල් බැර කිරීමට අවස්ථාව සලසා දීම. (මෙම බැංකු ගිණුම් තනි ගිණුමක් වශයෙන් පමණක් පවත්වා ගැනේ, යම් අවස්ථාවකදී ගිණුමේ ඇති මුදල් විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ ජනරාල් වෙත පවරාගත හැකි වේ).

03. තාවකාලිකව සහ කෙටිකාලීන වශයෙන් පමණක් විදේශගත වූ අයගේ තාවකාලිකව අත්හිටුවා තැබීම හෝ ජීවිත සහතිකයක් ලබාගෙන තවදුරටත් ගෙවීමට ඒ ඒ ප්‍රාදේශීය ලේකම්වරුන් වෙත පැවරීම.

විදේශගත විශ්‍රාමිකයාට විශ්‍රාම වැටුප් ගෙවීම සම්බන්ධව 16/2011වක්‍රලේඛය මඟින් උපදෙස් නිකුත් කර ඇත. ඒ අනුව මේ වන විට එවැනි විශ්‍රාමිකයන් 8000ක් සම්බන්ධව තොරතුරු පරිගණකගත කර තිබේ; මෙම විශ්‍රාම වැටුප ගෙවීම පිළිබඳව පහත සඳහන් තත්ත්වයන් වර්තමානයේ දී නිරූපණය වේ;

1. දීර්ඝ කාලීනව විදේශගත වූ සහ ඉතා වයස් විශ්‍රාමිකයන් විදේශ දූත මණ්ඩල කාර්යාල හරහා විශ්‍රාම වැටුප් ගැනීමට තම කැමැත්ත ප්‍රකාශකොට තිබේ. වාර්ෂිකව රුපියල් මිලියන 600ක් පමණ මුදලක් මෙම විශ්‍රාම වැටුප් ගෙවීමට අයත් වේ;
2. බොහෝ විශ්‍රාමිකයන් තම විශ්‍රාම වැටුප දේශීය බැංකු ගිණුමක තැන්පත් කිරීමට පියවර ගෙන තිබේ. මහජන බැංකුව, ලංකා බැංකුව හා පෑන් ඒෂියා බැංකුවෙහි නම් කළ බැංකු ශාඛාවක විශේෂිත ගිණුම්වල මෙම මුදල් තැන්පත් කරනු ලැබේ. මෙම ගිණුම්වල මුදල් වෙනත් බැංකු ගිණුමකට හෝ විදේශවලට මාරුකර ගැනීමට හැකි සේ පහසුකම් සලසා ඇත. සැලකිය යුතු විශ්‍රාමික ප්‍රමාණයක් මෙම මුදල් විදේශවලට මාරු කරනු ලැබේ.
3. විදේශගත විශ්‍රාමිතයන් බොහෝ දෙනෙකුට ශ්‍රී ලාංකික පුරවැසිභාවය නැත. ඇතැම් දීමනා හා ජීවනාධාර ගෙවීම් පාලනයකර ඇත.
4. විදේශ විනිමය විශ්‍රාම වැටුප් වශයෙන් ගලාගෙන යෑම පාලනය සඳහා නීති හෝ ප්‍රතිපත්ති සම්පාදනය කළ යුතුව ඇත.

## 5.6 පළාත් පාලන සේවා විශ්‍රාම වැටුප් ක්‍රමය

ප්‍රාදේශීය පාලනය පිළිබඳව ලංකාවට ඇත්තේ දිගුකාලීන අත්දැකීමකි. එය ක්‍රි.පූ. 4 වන සියවස කරම් ඈතට දිව යයි. නගර පාලනය උදෙසා නගරගුත්තික ධුරයක් එකල පැවති බවට මහාවංශය සාක්ෂි දරයි. අනුරාධපුර නගරයෙහි නගර ගුත්තිකයතු යටතේ පැවති අංගසම්පූර්ණ කාර්යක්ෂම පාලන ක්‍රමයක් පැවති බව ඒ අනුව පැහැදිලි වෙයි.

ගම්සභාව යනු ලක්දිව ග්‍රාම පාලනය පිළිබඳව බොහෝ සෙයින් ඉපැරණි අංගයක් විය. අතීතයේ දී ගම්සභාව සැදුම් ලද්දේ තලතුනා, සැලකිය යුතු ප්‍රභූ පුද්ගලයන්ගෙනි. ඔවුන් රැස්වූයේ අම්බලමක්, විසල් තුරුසෙවණක හෝ වෙනත් පහසු ස්ථානයකය. ගමෙහි සිදුවන සුළු අපරාධ සඳහා දඬුවම් නියම කිරීමක්, ආරවුල් නිරාකරණය එමඟින් සිදුවිය. ඒ අනුව සොරකම, අඬදබර, කෝලාහල, ණය ගනුදෙනු ආරවුල් ආදිය විසඳන ලද්දේ ගම්සභාව විසිනි. 1818 දී ලංකාවට පැමිණ හමුදා සෙබළෙක්ව සේවය කොට 1842 දී මහාමාර්ග කොමසාරිස් ධුරයට පත් මේජර් තෝමස් ස්කිනර්, ඔහු දුටු ගම්සභා ක්‍රමය විස්තර කරනුයේ මෙසේය.

"ස්වදේශීය ආණ්ඩුවෙහි ගන්සයිබ්" නැති නම් "ගම්සභිබ්" යනුවෙන් සරල පිහිටුවීමක් තිබේ. මේවා පළමු කොට ඇතිවූයේ ඉන්දියාවේ ද, නැතිනම් ලංකාවේ ද යනුවෙන් පැවැසීමට මට නොහැකිය. වචනයේ පළමු අක්ෂර වලින් කියැවෙන්නේ සිංහලෙන් ගමට කියැවෙන නමයි. දෙවැන්නෙන් කියැවෙන්නේ හින්දුස්ථාන්වලින් "ස්වාමියා නැතිනම් පාලකයා" යන්නට කියන නාමයකි. උතුරු ඉන්දියාවේ, පංජාබයේ පැරණි ආණ්ඩුක්‍රමවල මේවා තිබුණු බවට අපි අසා ඇත්තෙමු.

මේ ගම්සභාවල වැඩිහිටියෝ තුන් දෙනෙක් හෝ පස්දෙනෙක් ඇත්තාහ. මොවුන් විශාල ගමකින් හෝ යාබද කුඩා ගම් කීපයකින් සැකැසෙන පිරිසකි. මොවුන් තෝරාගනු ලබන්නේ ගම්මුන් වන සේම, ඔවුන්ගේ රැස්වීම් ආදී සියලු කටයුතු සිදු කෙරෙන්නේ ගමේ තිබුණු සැලකිය යුතු අතුපතර විහිදුනු විශාල ගසක් යටදී ය.

මේ ගම්සභාවලට ලැබී ඇති බලතල කොයි කාලයකදී සිට පැවතෙන එකක් දැයි මම නොදනිමි. එහෙත්, සුළු සුළු ආරවුල් ඈත ගම්බද දිස්ත්‍රික්කවල අඩු කිරීමට ඒවා සමත් වී තිබේ. දබර සහ ආරවුල් ඒවා සිදුවුණු තැන්වල දී මෙය සිදුකරන නිසා, කලින් අරමුණු කරගත් බොරු දිවුරුම් ආදී දේවලට මෙහි දී ඉඩක් නොලැබේ. සෑම සිදුවීම් දහයකින් නවයක තීරණවලට කෝලාහලයකට මැදි වූ පක්ෂ එකඟ වෙන බව මට කිමට පිළිවන. එහෙත්, මෙවැන්නක දී වුව මින පිරිසකගේ කෙනෙකුට කම නඩුව ඉහළ උසාවියකට ඉදිරිපත් කිරීමට ඉඩකඩ තිබේ. එහෙත්, නඩුව විභාග කිරීම පළමුව ගමේ වැඩිහිටියන් ඉදිරියේ සිදුවුණු බැවින් බොහෝ අවස්ථාවල දී කිසිවකුට කලින් සැළසුම් කරන ලද බොරු සාක්ෂි ඉදිරිපත් කිරීමට ඉඩකඩක් නොලැබී යයි.

ගම්සභාවල කටයුතු මෙසේ අමුතු ක්‍රියාකාරීත්වයකින් සිදු වෙද්දී, ඔවුනට නාගරික ශාලා වැනිදෙයක් ඉදිකර දිය යුතු වේ. ඔවුන්ට ඒවායෙහි කම කාර්යයන්ගේ අත්තිවාරම දමා ගැනීමට හැකි වේ. සුදුසුකම්, තෝරා ගැනීම් සහ ක්‍රියාකාරීත්වයන් ලෙහෙසියෙන්ම කළ හැකි වේ.

මේ කරුණු මෙසේ සිදු වෙද්දී, සෑම පළාතකම, දිස්ත්‍රික්කයකම සහ ගමකම සිටින්නා වූ නායකයින්ගේ ප්‍රමාණය කාර්යයන් සහ බලතල, හොඳ පරීක්ෂාවකින් පසුව යළිත් පුනරීක්ෂණය කොට නීතිමය වශයෙන් හඳුනා ගනිමු. ගම්සභාවලට සම්බන්ධව කටයුතු කරන, ආණ්ඩුවේ ඒජන්තවරුන්ට සහ ඔවුනගේ නියෝජිතයන්ට (සාමදාන විනිශ්චයකරුවන්ට) සීමාසහිතව අප රට අධිකරණ කටයුතු භාර දෙමු. ඊට අමතරව ඔවුනට හරක් හොරුනට දඬුවම් පැමිණවීමේ අධිකරණ බලයද පැවැරීම තහවුරු කළ යුතුව ඇත.........."

(Fifty years in Ceylon - Major Thomas skinner පරිවර්තනය - පරාක්‍රම ඇස්. විජේවර්ධන)

1856 දී පැනවූ, 1856 අංක 09 දරන තුඹුරු ඉඩම් සහ වාරිමාර්ග ආඥා පනත යටතේ නැවක වරක් මේ ගම් සභා පිහිට වූ අතර, පෙර පැවති නඩු හබ විසඳීම වැනි කාර්යයන් ගෙන් පූර්ණ වශයෙන් ඉවත් ව කෘෂිකර්මාන්තය වර්ධනය කිරීම, වාරිමාර්ග කටයුතු නඩත්තුව සහ අධීක්ෂණය කිරීම එහි අරමුණ විය. පෙර පැවති ගම්සභා මෙන් නොව මෙය නෛතික බලයක් සහිත පළාත් පාලන ඒකකයක් විය. රජයේ දිසාපති හෝ උප දිසාපති එහි මුලසුන දැරූ අතර, අනෙකුත් සාමාජිකයන් පත් කරන ලද්දේ ඔහු විසිනි.

1861 පනවන ලද 1861 අංක 10 දරන මාර්ග කමිටු ආඥා පනත මඟින් පළාත්බද මාර්ග කමිටු සහ දිස්ත්‍රික් මාර්ග කමිටු පිහිටුවිණි. පොදු මාර්ග පද්ධතිය නඩත්තු කිරීම එමඟින් සිදු විය.

1848 දී ඇති වූ කැරැල්ලට හේතු වූ කරුණු සොයා බලා වාර්තා කිරීමට විශේෂ කමිටුවක් පත් කළ අතර, එහි නිර්දේශයන් පිළිබඳව අවධානය යොමු කළ බ්‍රිතාන්‍ය පාර්ලිමේන්තුව කොළඹ නගරයට මහා නගර සභාවක් ලබා දෙන ලෙස යෝජනාවක් 1850 දී සම්මත කරන්නට යෙදුණි. ඒ සඳහා අණපනත් පිළියෙල කරන ලද්දේ ප්‍රසිද්ධ රාජ නීතිඥයකු වූ රිචඩ් මෝගන් විසිනි. කෙසේ වෙතත් කොළඹ නගරය තුළ නාගරික සභාවක් සංස්ථාපනය කිරීම සඳහා ව්‍යවස්ථාදායක මන්ත්‍රන සභාව වෙත පනතක් ඉදිරිපත් වන්නේ 1865 දී වන අතර, එය ඉදිරිපත් කරන ලද්දේ ආණ්ඩුකාරවර සර් හර්කියුලස් රොබින්සන් විසිනි.

1865 නොවැම්බර් මස 25 දින කොළඹ මහා නගර සභාවේ නගර සීමාවන් නියම කිරීමේ නිවේදනය නිකුත් කරනු ලැබීය. 1866 ජනවාරි 05 දින කොළඹ මහා නගර සභාව සඳහා ආණ්ඩුකාර වරයා විසින් පත් කරන ලද සභිකයන් ප්‍රකාශයට පත් කළ අතර 1866 ජනවාරි 12 දින සිට 15 දින දක්වා පැවති ඡන්ද විමසීමෙන් සභිකයින් 09 දෙනෙකු පත් කරගන්නා ලදී. ආණ්ඩුකාරවරයා විසින් සභිකයින් 05 දෙනෙකු පත් කරන්නට යෙදුණි. පත්කළ මන්ත්‍රී, රජයේ දිසාපති, සී. පී. ලෙයාඩ් මහතා සභාපතිවරයා ලෙස පත්කරන ලදී. කෝරා ගන්නා ලද සභිකයන්ද සමඟ පළමු නගර සභා රැස්වීම 1866 ජනවාරි 16 දා පැවැත්වුණි.

මහනුවර මහා නගර සභාව සහ ගාල්ල මහනගර සභාව 1866 වසරේදීම සංස්ථාපනය වූ අතර ඊට අදාළ ආඥා පනත්ද සම්මත කර ගැනුණි.

1871 දී ගෙන එන ලද 1871 අංක 26 දරණ ග්‍රාම ප්‍රජා පිළිබඳ ආඥා පනත සමඟ ගම්සභා නැවත ව්‍යවස්ථාගත කරන ලදී. මුල් කාලීනව ග්‍රාම කමිටු ලෙස හැඳින්වුනු මේවා පසුකාලීනව ගම් කාර්ය සභා ලෙස හඳුන්වන්නට යෙදුණි. අදාළ ප්‍රදේශයේ ගම්වාසීන්ගේ ඉල්ලීම මත ආණ්ඩුකාරවරයා සහ ව්‍යවස්ථාදායකය විසිනි. ග්‍රාම කමිටුවක් පත් කළ අතර, මුලසුන දරන ලද්දේ රජයේ ඒජන්තවරයා විසින් සුළු අපරාධ සහ සුළු ආරවුල් පිළිබඳව අධිකරණය බලයක්ද ග්‍රාම කමිටු සඳහා ලැබුණි. 1884 වර්ෂයේ දී ග්‍රාම කමිටු ආඥා පනතට ගෙන එන ලද සංශෝධනයක් අනුව ග්‍රාම කමිටුවේ සභාපතිවරයා ලෙස ගම්මුලාදෑනියා නිල බලයෙන් පත් විය.

1892 අංක 18 දරන සනීපාරක්ෂක මණ්ඩල ආඥා පනත අනුව කුඩා නාගරික ප්‍රදේශයන්හි පොදු සෞඛ්‍ය සේවා, ජලපවාහනය, මලපවාහනය, පොදු වෙළඳ සැල ආදී මහජන සේවාවන් ඉටු කිරීම උදෙසා සනීපාරක්ෂක මණ්ඩල පිහිටුවන ලදී.

1898 අංක 13 දරන ප්‍රාදේශීය මණ්ඩල ආඥා පනත අනුව විශාල නගර සඳහා ප්‍රාදේශීය සෞඛ්‍ය සහ සනීපාරක්ෂක මණ්ඩල සංස්ථාපනය කෙරුණි. මෙහි මීට පෙර සංස්ථාපනය කරන ලද කාර්යයන්ද සනීපාරක්ෂක මණ්ඩලයන්හි කාර්යයන් හා සමාන විය. මලපවාහනය, ජලපවාහනය හා සෞඛ්‍ය සේවා සැපයීම ඉංග්‍රීසි බසින් sanitary board ලෙස හැඳින්වූ සනීපාරක්ෂක මණ්ඩලවල ප්‍රධානතම කාර්යයන් විය. වත්මනෙහි වුවද ජනවහරේ යෙදෙන " සැන්ටිබෝඩ් " යන්න sanitary +board - santi + board යන්නෙන් බිඳී සකස් වූවක් විය.

1920 අංක 11 දරන පළාත් පාලන ආඥා පනත අනුව නාගරික දිස්ත්‍රික් සභා ප්‍රාදේශීය දිස්ත්‍රික් සභා සහ පොදු සභා පිහිටුවන්නට යෙදුණි. 1936 අංක 61 දරන නගර සභා ආඥා පනත යටතේ ක්‍රමයක් විශාල නගර සඳහා නගර සභා පිහිටුවන ලදි. ඒ අනුව ස්ථාපිත කරන ලද නගර සභා සංඛ්‍යාව 27 ක් විය.

1946 අංක 03 දරන සුළු නගර සභා ආඥා පනත යටතේ කුඩා නගර සඳහා සුළු නගර සභා පිහිටු වූ අතර , සනීපාරක්ෂක සභා සහ ප්‍රාදේශීය සෞඛ්‍ය හා සනීපාරක්ෂක සභා අහෝසි කරන ලදී. ඒ අනුව පිහිටුවන ලද සුළු නගර සභා සංඛ්‍යාව 24 ක් වන අතර පොදු මාර්ග , මහජන සෞඛ්‍ය , පොදු පහසුකම් සැපයීම සහ ආදායම් එකතු කිරීම එහි කාර්යයන් අතර විය.

ඉහත සඳහන් සියලුම ආයතනයන්හි සේවක මණ්ඩලය බඳවා ගැනීම ඇතුළු පරිපාලනමය කටයුතු උදෙසා ආයතනගත ක්‍රමවේදයක් පැවති අතර සේවක වැටුප් ප්‍රමාණයන් එකී ආයතනයන් සතු මූල්‍යමය හැකියාව අනුව සකස් වී තිබුණි. ඇතැම් පළාත් පාලන ආයතන මගින් පශ්චාත් විශ්‍රාමික සුභ සාධක ක්‍රමයක්

ලෙස විශ්‍රාම වැටුප් ක්‍රමය ක්‍රියාත්මක වු අතර ඒ වෙනුවෙන් අතුරු ව්‍යවස්ථා සකස් කර ගැනීම උදෙසා අවැසි ප්‍රතිපාදන අදාළ ආඥා පනත් වලින්ම සළසා තිබුණි. ඒ අනුව එවක පැවති මහා නගර සභා සහ ඇතැම් ගම් සභා විශ්‍රාම වැටුප් අතුරු ව්‍යවස්ථා සකස් කොටගෙන අමාත්‍යවරයාගේ අනුමැතිය යටතේ ආයතනගත විශ්‍රාම වැටුප් ක්‍රමයක් ක්‍රියාත්මක කොට තිබුණි. 1946 අප්‍රේල් 01 දක්වාම මෙම ක්‍රමය ඒ ඒ පළාත් පාලන ආයතන තුළ සම්පූර්ණයෙන්ම ක්‍රියාත්මක වෙමින් පැවතුණි.

## පළාත් පාලන සේවයෙහි ආරම්භය

1945 අංක 43 දරන පළාත් පාලන සේවා ආඥා පනත සම්මත වීමෙන් පසුව 1946 අප්‍රේල් මස 01 දින සිට පළාත් පාලන සේවය ආරම්භ විය. සෑම පළාත් පාලන ආයතනයකම කාර්ය මණ්ඩලය බඳවා ගැනීම හා අනුෂංගික කටයුතු කිසියම් පොදු නෛතික රාමුවක් යටතට ගෙන ඒම මෙමගින් සිදුවිය. මෙම ආඥා පනත තුළින් පළාත් පාලන සේවා කොමිෂන් සභාව ස්ථාපිත වූ අතර එතැන් සිට පළාත් පාලන සේවයේ කාර්ය මණ්ඩල පත් කිරීම, මාරු කිරීම, උසස් කිරීම, විශ්‍රාම ගැන්වීම සහ ඔවුන්ගේ විනය පාලනය එකී කොමිසම මගින් සිදුවීය. අදාළ ආඥා පනතේ පළමුවන උපලේඛනයෙහි සඳහන් කර ඇති තනතුරුවල නිරත මහා නගර සභා, නගර සභා, සුළු නගර සභා සහ ගම්සභාවල නිලධාරීන්ගෙන් සහ සේවකයන්ගෙන් පළාත් පාලන සේවය සංස්ථාපනය වූ අතර ඔවුන් වෙනුවෙන් පළාත් පාලන සේවා විශ්‍රාම වැටුප් ක්‍රමයක් හඳුන්වා දුණි. මෙම උපලේඛනයේ සඳහන් නොවුණු සේවකයන් තවදුරටත් ආයතනගත සේවකයන් ලෙස සලකනු ලැබිණ. පළාත් පාලන සේවා ආඥා පනතෙහි 29 වන වගන්තිය අනුව පළාත් පාලන සේවා අර්ථ සාධක අරමුදලක් පිහිටුවීමටත් 26 වගන්තිය අනුව "විශ්‍රාම වැටුප් ක්‍රමය" යනුවෙන් යෝජනා ක්‍රමයක් සහ සේවයේ සාමාජිකයන්ගේ වැන්දඹුවන්ට සහ අනත්දරුවන්ට විශ්‍රාම වැටුප් ලබාගැනීම සඳහා වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදලක් හෝ ක්‍රමයක් පිහිටුවීමටත් විධිවිධාන සළසා තිබුණි. එකී විධිවිධාන අනුව එම අරමුදල් පිහිටුවීම පිළිබඳ ගැසට් නිවේදනය 1952 ජූලි මස 30 අංක 10,429 දරන රජයේ විශේෂ ගැසට් පත්‍රයේ පළ විණ.

කෙසේ වෙතත් පළාත් පාලන සේවා ව සංස්ථාපනය කිරීම පිළිබඳව මහා නගර සභාවන් තුළ වූයේ දැඩි අකමැත්තකි. සභාව විසින් සිය සේවකයන් පත් කිරීමට තිබූ අයිතිවාසිකම් අහෝසි කරමින් , පළාත් පාලන සේවය පිහිටුවීම ප්‍රතිගාමී ක්‍රියාවක් ලෙස සභාව සලකන ලදී. ඒ පිළිබඳව සිය විරෝධය දැක්වීම පිණිස වූ යෝජනාවක්, 1947 අප්‍රේල් 12, සහ 13 දිනයන්හිදී කරච්චියේ පැවති, ඉන්දියාවේ, පාකිස්තානයේ , බුරුමයේ සහ ලංකාවේ නගරාධිපතිවරුන් සහ උපනගරාධිපතිවරුන්ගේ සම්මේලනයේදී සම්මත කර ගැනුණි.

"ලංකාවේ පළාත් පාලන ආයතන විසින් සේවයේ යොදවා ඇති, පළාත් පාලන ආයතනයේ අරමුදලින් වැටුප් ලබන, සියලු සේවකයින් පළාත් පාලන සේවා කොමිෂන් සභාව යටතට ගෙන , ඔවුන් එම කොමිෂමේ සේවකයින් කරමින් 1945 අංක 43 දරන ලංකාවේ පළාත් පාලන සේවා ආඥා පනතේ සඳහන් විධිවිධානයන් කෙරෙහි ඉන්දියාවේ පාකිස්තානයේ ,බුරුමයේ සහ ලංකාවේ නගරාධිපතිවරුන් සහ උපනගරාධිපතිවරුන්ගෙන් සමන්විත මෙම සම්මේලනය විරෝධය පළ කරන්නී ය. මෙම ක්‍රියාව වූ කලි, ආපස්සට තැබූ පියවරක් වන අතර, ප්‍රජාතන්ත්‍රවාදයේ වැඩිවීමට අවහිරයක්ද වන හෙයින් ස්වතන්ත්‍ර පාලනය අහෝසි කිරීමක් වන්නේය. තවද, එම ආඥා පනතේ විධිවිධානවලින්, කොළඹ , මහනුවර හා ගාල්ල යන නාගරික සභා නිදහස් කරන මෙන්ද මෙම සම්මේලනය ඉල්ලා සිටින්නි ය."

කෙසේ වෙතත් මෙම යෝජනාව පිළිබඳව රජය සැලකිල්ලක් දැක්වූයේ නැත. විටෝල් බවුස්ටඩ් සහෝදර සමාගම මගින් පවත්වාගෙන ගිය ට්‍රෑම් රථ සේවාව 1944 සැප්තැම්බර් 01 දින කොළඹ මහා නගර සභාව විසින් පවරා ගනු ලැබීය. නගරයේ මාර්ගයන්ගේ වූ තදබදය වැළැක්වීම පිණිස ට්‍රොලි බස් රථ සේවාවක් ආරම්භ කිරීමට මහා නගර සභාව තීරණය කළේය.

## 1969 අංක 18 දරන පළාත් පාලන සේවා පනත

පළාත් පාලන සේවා ආඥා පනත පරිච්ඡින්න කරමින් 1969 අංක 18 දරන පළාත් පාලන සේවා පනත සම්මත විය. මෙහි දී පළාත් පාලන සේවා ආඥා පනත පරිච්ඡින්න කරනු ලැබුවද 1945 අංක 43 දරන පළාත් පාලන පනතේ 29, 31,සිට 44, 47 සිට 52 , 54 සහ 59 සිට 62 දක්වා වගන්ති තවදුරටත් බලාත්මක

වන පරිදි විධිවිධාන සළසා තිබුණි. මේ හේතුව නිසා වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයේ දායකත්වය පිළිබඳ තීරණය පෙර පරිදිම ගනු ලැබිය යුතු විය. 1969. 10. 01 දින සිට රාජ්‍ය සේවයට සමාන්තරව පළාත් පාලන සේවයේ ද වැටුප් ප්‍රතිශෝධන ක්‍රියාත්මක වුණු අතර ඒ අනුව ඒකාබද්ධ වැටුප් ක්‍රමයක් ක්‍රියාත්මක විය. 1969 ඔක්තෝබර් මස 01 දා සිට ආයතනගත සේවකයන්ගේ වැටුප් ද ඒ අනුව වැඩි විය. 1969 අංක 18 දරන පළාත් පාලන සේවා පනතේ උපලේඛනය අනුව , මෙම වැටුප් ප්‍රතිශෝධන සමග පළාත් පාලන සේවයට අයත් නොවූ ආයතනගත සේවකයන් විශාල ප්‍රමාණයකට පළාත් පාලන සේවයට අන්තර්ග්‍රහනය වීමේ අවස්ථාව උදා විය. එහෙත් ඔවුන්ට වැන්දඹු අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදලේ සමාජිකත්වය ලබා දීම කළ නොහැකි විය. පළාත් පාලන සේවා ආඥා පනතෙහි අදාළ වගන්ති තවදුරටත් ක්‍රියාත්මක වීම ඊට හේතු විය.

## ට්‍රොලි බස්රථ සේවාව පවරා ගැනීම

විටෝල් බවුස්ටඩ් සහෝදර සමාගම මගින් පවත්වාගෙන ගිය ට්‍රෑම් රථ සේවාව 1944 සැප්තැම්බර් 01 දින කොළඹ මහා නගර සභාව විසින් පවරා ගනු ලැබීය. නගරයේ මාර්ගයන්ගේ වූ තදබදය වැළැක්වීම පිණිස ට්‍රොලි බස් රථ සේවාවක් ආරම්භ කිරිමට මහා නගර සභාව ඒ අතර තීරණය කළේ ය. කොළඹ නගරය තුළ ක්‍රියාත්මක වූ ට්‍රොලි බස්රථ සේවාව පවත්වා ගෙන යන ලද්දේ විටෝල් බවුස්ටඩ් සහෝදර සමාගම විසිනි. ඒ අනුව එය 1953.07.22 දින කොළඹ මහා නගර සභාව විසින් පවරා ගන්නා ලදී. එය පාඩු ලබන කර්මාන්තයක් වූ නිසා පසු කාලීනව 1965. 01. 01 දින වසා දැමුණු අතර ඊට අදාළ සේවකයන් 1965. 04. 01 දින තනතුර අහෝසි වීම මත විශ්‍රාම ගැන්වුණි. මොවුන් අතුරින් විටෝල් බවුස්ටඩ් සහෝදර සමාගමේ සිට කොළඹ මහා නගර සභාවේ සේවයට පළාත් පාලන සේවයේ තනතුරු ලාභින් ලෙස ඇතුළත් කරගන්වන ලද තැනැත්තන්ට වැන්දඹු අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදලේ දායකත්වය පිරිනැමීම ආඥා පනතේ පැවති නියමයන් නිසා කළ නොහැකි විය. එහෙත් ට්‍රොලි බස්රථ සේවාව සඳහා පළාත් පාලන කොමිෂන් සභාව මගින් බඳවා ගනු ලැබූ තැනැත්තන්ට මේ හිමිකම ලබා ගැනීමට අවස්ථාව සැළසිණ.

## 1974 අංක 16 දරන පළාත් පාලන සේවා පනත

පළාත් පාලන සේවයක් සංස්ථාපනය කිරීම සහ විධිමත් කිරීම සඳහා විධිවිධාන සැළැස්වීමත්, පළාත් පාලන සේවා උපදේශක මණ්ඩලයක් සහ විනය මණ්ඩලයක් පිහිටුවීම සහ 1969 අංක 18 දරන පළාත් පාලන සේවා පනත ඉවත් කිරීම ඇතුළු අරමුණු කිහිපයක් මුල් කොටගෙන 1974 අංක 16 දරන පළාත් පාලන සේවා පනත, ජාතික රාජ්‍ය සභාව විසින් සම්මත කරන ලදී. මෙමගින් පළාත් පාලන සේවා දෙපාර්තමේන්තුවක් සහ පළාත් පාලන සේවා අධ්‍යක්ෂ ධුරයක් ඇති කිරීමට ප්‍රතිපාදන සැලසුණි. මෙම පනතේ 15 වගන්තිය යටතේ පළාත් පාලන සේවයේ විශ්‍රාම වැටුප් හිමි සාමාජිකයන් සඳහා විශ්‍රාම වැටුප් සහ පාරිතෝෂිත දීමනා ගෙවීම සඳහා පළාත් පාලන සේවා විශ්‍රාම වැටුප් අරමුදල ද , 16 වගන්තිය යටතේ පළාත් පාලන සේවයේ විශ්‍රාම වැටුප් සහිත සමාජිකයන්ගේ වැන්දඹුවන්ට සහ අනත්දරුවන්ට විශ්‍රාම වැටුප් ගෙවීම සඳහා පළාත් පාලන සේවා වැන්දඹු සහ අනත්දරු අරමුදල ද , 17 වගන්තිය යටතේ පළාත් පාලන සේවයේ විශ්‍රාම වැටුප් රහිත සමාජිකයන්ට ප්‍රතිලාභ සැළැස්වීම සඳහා පළාත් පාලන සේවා අර්ථ සාධක අරමුදල ද පිහිටුවා ඇත. එකී අරමුදල් පාලනය කිරීමේ බලය පළාත් පාලන සේවා අධ්‍යක්ෂ වෙත හෝ ඒ සඳහා අමාත්‍යවරයා විසින් පත් කරනු ලබන නිලධාරියෙකු වෙත පැවරුණි.

## 1985 අංක 10 දරන පළාත් පාලන සේවා ( සංශෝධන ) පනත

1985 අංක 10 දරන පළාත් පාලන සේවා ( සංශෝධන ) පනත මගින් , පළාත් පාලන සේවා උපදේශක මණ්ඩලය වෙනුවට පළාත් පාලන සේවා කොමිෂන් සභාවක් පිහිටුවීම ඇතුළු සංශෝධනයන් කිහිපයක් සිදු කරන ලදී. ප්‍රධාන ප්‍රඥප්තියේ ( 1974 අංක 16 දරන පළාත් පාලන සේවා පනත ) " 16 අ" නමින් නව වගන්තියක් ඇති කළ අතර , පළාත් පාලන සේවයේ විශ්‍රාම වැටුප් සහිත සාමාජිකයන්ගේ වැන්දඹු පුරුෂයන්ට සහ අනත්දරුවන්ට විශ්‍රාම වැටුප් ගෙවීම සඳහා පළාත් පාලන සේවා වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදල නමින් අරමුදලක් පිහිටුවීමට නීතියෙන් ඉඩකඩ සළස්වා දෙනු ලැබිණ.

## 1975 පළාත් පාලන සේවා විශ්‍රාම වැටුප් නියෝග

පළාත් පාලන සේවයේ සාමාජිකයන් සඳහා විශ්‍රාම වැටුප් ක්‍රමයත් ක්‍රියාත්මක වීම ආරම්භ වූයේ 1952 අගොස්තු 01 දා සිටය . මෙම නියෝග අංක 10, 429 දරන 1952. 07. 30 දිනැති අති විශේෂ ගැසට් පත්‍රයෙන් ප්‍රකාශයට පත් කර ඇත. 1974 අංක 16 දරන පළාත් පාලන සේවා පනතේ 23 සහ 24 වගන්තිය යටතේ පළාත් පාලන අමාත්‍යවරයා විසින් මෙම නියෝග පරිච්ඡින්න කරමින් 1975 පළාත් පාලන සේවා විශ්‍රාම වැටුප් නියෝග ප්‍රකාශයට පත් කර ඇත. මෙම නියෝග 1976 ජනවාරි මස 09 වන දින අංක 198 දරන ගැසට් පත්‍රයේ පළ කර ඇති අතර , එකී නියෝගයන් වෙත කරන ලද සංශෝධනයන් 1978 ජුනි 07 දින අංක 320/8 දරන රජයේ අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කෙරුණි.

## 1985 පළාත් පාලන සේවා වැන්දඹු අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදල් නියෝග

1945 පළාත් පාලන සේවා ආඥා පනත යටතේ සාදන ලද 1952 වැන්දඹු අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදල පිළිබඳ ව්‍යවස්ථාවන් වෙනුවට ජාතික රාජ්‍ය සභාවේ 1974 අංක 16 දරන පළාත් පාලන සේවා පනතේ 23 වගන්තිය යටතේ එවකට සිටි පළාත් පාලන , නිවාස සහ ඉදිකිරීම් අමාත්‍යවරයා විසින් සාදන ලද නියෝගයන් 1985 පළාත් පාලන සේවා වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදල් නියෝග යනුවෙන් හැඳින්වුණි.

1986 ජුනි 03 අංක 404/11 දරන අතිවිශේෂ ගැසට් පත්‍රය මගින් මෙම නියෝග ප්‍රකාශයට පත්වූ අතර අදාළ අරමුදල් පාලනය කිරීමේ බලකල පළාත් පාලන සේවා අධ්‍යක්ෂවරයා වෙත පැවරිණි. පළාත් පාලන සේවයේ සේවා කොන්දේසි රාජ්‍ය සේවයේ සේවා කොන්දේසි හා සම කිරීමට 1978. 03. 25 දින අමාත්‍ය මණ්ඩලය විසින් ගනු ලැබූ ප්‍රතිපත්තිමය තීරණයට අනුව සිවිල් වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදලේ දායකයින්ගේ ආබාධික දරුවන් සඳහා ලබා දෙනු ලැබූ විශේෂ සහනය පළාත් පාලන සේවයේ සාමාජිකයින්ගේ ආබාධිත දරුවන් වෙතද ලබා දීමට හැකි වන පරිදි , අදාළ නීතිමය ප්‍රතිපාදන මෙහිදී ලබා දුණි.

## 1986 පළාත් පාලන වැන්දඹු පුරුෂ හා අනත්දරු අරමුදල් නියෝග

පළාත් පාලන සේවා කොන්දේසි රාජ්‍ය සේවා කොන්දේසි හා සම කිරීමට ගෙන ඇති ප්‍රතිපත්තිමය තීරණයට අනුව යමින් , 1974 අංක 16 දරන පළාත් පාලන සේවයේ සමාජිකාවන් සඳහා ද වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයක් ඇති කිරීමට නීතිමය ප්‍රතිපාදන ඇති කෙරුණි. මේ යටතේ අමාත්‍යවරයා විසින් සාදන ලද නියෝග 1987 ජනවාරි 28 දින අංක 438/08 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ ප්‍රකාශයට පත් කෙරුණි.

## පළාත් පාලන සේවා විශ්‍රාම වැටුප් අරමුදල

පළාත් පාලන ආයතනයන්හි සේවය කොට විශ්‍රාම වැටුප් කොට විශ්‍රාම ලැබූ , විශ්‍රාම වැටුප් හිමිකම් සහිත නිලධාරින් සඳහා විශ්‍රාම වැටුප් ගෙවීම සිදු කරන ලද්දේ මෙම අරමුදල මගිනි. අරමුදල සඳහා රජය විසින් දායකත්වය සැපයීමක් එකල සිදු නොවුණි. පාරිතෝෂික හා විශ්‍රාම වැටුප් ගෙවීම සඳහා දායකත්වය පළාත් පාලන ආයතන වෙතින් සැපයුනු අතර එක් එක් පළාත් පාලන ආයතන විසින් ඒ ඒ සේවකයන්ට ගෙවන ලද පඩිනඩිවල අනුපාතය අනුව අදාළ පළාත් පාලන ආයතන විසින් ගෙවිය යුතු අරමුදල් ප්‍රමාණය තිරණය වුණි. සමහර පළාත් පාලන ආයතන විසින් නියමිත දිනට විධිමත් පරිදි දායක මුදල් ගෙවීම සිදුකළත් සමහර පළාත් පාලන ආයතන විසින් නිසි පරිදි ගෙවීම් නොකරන ලදී. නිසි පරිදි ගෙවීම් කරනු නොලැබූ එවැනි ආයතනයන්හි සේවය කොට විශ්‍රාම ලැබූ සේවකයන් , විශ්‍රාම වැටුප් ගෙවන දිනය එළඹියත් කිසිත් නොලබා බිඳුනු සිතින් පිටව යනු දකින්නට ලැබුණි. මෙම වේදනාබර තත්වය අවසන් කිරීම සඳහා රජයේ ඒකාබද්ධ අරමුදලින් , පළාත් පාලන සේවා විශ්‍රාම වැටුප් ගෙවීම සඳහා අත්තිකාරම් ලබා ගැනීමට පළාත් පාලන සේවා කොමිෂන් සභාව විසින් පියවර ගන්නා ලදී. එතැන් සිට සෑම විශ්‍රාමිකයෙකුටම නියමිත දිනයේදී තමාට හිමි විශ්‍රාම වැටුප ලබා ගැනීමට ඉඩ ප්‍රස්ථාව සැළසුණි. 1982. 01. 02 හෝ එදිනට පසුව විශ්‍රාම ගනු ලබන පළාත් පාලන විශ්‍රාමිකයන් ගේ විශ්‍රාම වැටුප් සහ ඒ සමග ගෙවිය යුතු වෙනත් දීමනා පළාත් පාලන ආයතන වලට සහ ඒකාබද්ධ අරමුදලට වැය බරක් වන සේ බෙදා වෙන් කර තිබුණි. ඒ පහත පරිදිය .

| නිලධාරියා සේවය කළ පළාත් පාලන ආයතන වර්ගය | පළාත් පාලන ආයතනය විසින් ගෙවිය යුතු දායක මුදල් ප්‍රතිශතය | රජය මගින් ගෙවිය යුතු මුදල් ප්‍රතිශතය |
|---|---|---|
| මහා නගර සභාවල පමණක් | 85% | 15% |
| මහා නගර සභා ඒකක හෝ ඊට වැඩි ගණනක් සමග අනෙකුත් වර්ගයේ (නගර සභා, සුළු නගර සභා , ගම් සභා සහ ප්‍රාදේශීය සභා ) පළාත් පාලන ආයතන වල සේවය කළ | 70% | 30% |
| මහා නගර සභා හැර වෙනත් පළාත් පාලන ආයතන වල (නගර සභා, සුළු නගර සභා , ගම්සභා සහ ප්‍රාදේශීය සභා සේවය කළ) | 55% | 45% |

2002 වසරේ සිට පළාත් පාලන සේවා විශ්‍රාම වැටුප් ගෙවීමේ කාර්යය ද සම්පූර්ණයෙන්ම විමධ්‍යගත කළ අතර මධ්‍යම රජයේ අරමුදල් මගින් , ප්‍රාදේශීය ලේකම් කාර්යාල විසින් විශ්‍රාම වැටුප් ගෙවීම සිදු කරනු ලබයි.

## පළාත් පාලන සේවා වැන්දඹු අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදල

පළාත් පාලන සේවා විශ්‍රාම වැටුප් හිමිකම් සහිත සේවකයන්ගේ වැන්දඹුවන්ට සහ අනත්දරුවන්ට ප්‍රතිලාභ ගෙවීම සඳහා මෙම අරමුදල පිහිටුවා ඇත. අදාළ සේවකයාගේ සහ අදාළ ආයතනයේ දායකත්වයෙන් මෙම අරමුදල ගොඩනැගී ඇති අතර දායක මුදලින් 3/4 ප්‍රමාණයක් සභා දායකය ලෙස අය කරනු ලබයි. අරමුදලේ මුදල් භාණ්ඩාගාර බිල්පත්හි ආයෝජනය කර ඇති අතර 2009 වර්ෂ අවසානයේ මුළු ආයෝජනය රු. 84,991,082.00 කි.

## පළාත් පාලන සේවා වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදල

පළාත් පාලන සේවා වැන්දඹු අනත්දරු විශ්‍රාම වැටුප් හිමිකම සහිත සේවිකාවන්ගේ වැන්දඹු පුරුෂයන්ට හා අනත්දරුවන්ට ප්‍රතිලාභ ගෙවීම සඳහා මෙම අරමුදල පිහිටුවා ඇත. අරමුදලේ මුදල් ආයෝජනය කර ඇති අතර 2009 වසර අවසානයේ මුළු ආයෝජනය රු. 319, 266, 402. 17 කි.

## 13 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය

1987 වර්ෂයේදී සිදු කරන ලද 13 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයට අනුව පළාත් සභා සංස්ථාපනය කරන ලදී. පළාත් පාලන සේවා දෙපාර්තමේන්තුවේ කාර්ය භාරය තුළට අයත්ව තිබූ කාර්යමණ්ඩල කළමනාකරණ කටයුතු 1989. 12. 31 දිනෙන් පසුව එක් එක් පළාත් පාලන කොමිෂන් සභාව වෙත පවරනු ලැබුණි. ඉතිරිව තිබූ විශ්‍රාම වැටුප් සහ වැන්දඹු අනත්දරු විශ්‍රාම වැටුප් කාර්යය විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව වෙත පවරනු ලැබුණි.

විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුවට පැවරුණු මෙම නව කාර්ය භාරය ඉටු කිරීම සඳහා පළාත් පාලන විශ්‍රාම වැටුප් ඒකකය යනුවෙන් වෙනම ඒකකයක් 1990. 01. 01 වන දින විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුවෙහි ස්ථාපිත කෙරුණි.

එක් එක් පළාත් සභාව විසින් සම්මත කරගන්නට යෙදුණු පළාත් පාලන අයතන (කාර්යාල මණ්ඩල ) ප්‍රඥප්තිය අනුව , ඒ ඒ පළාත් සභා බල ප්‍රදේශයට අයත්ව තිබූ පළාත් පාලන අයතනවල සේවය කරන ලද පළාත් පාලන සේවයේ සාමාජිකයන්, අදාළ පළාත් සභාව තුළ ක්‍රියාත්මක වන පළාත් රාජ්‍ය සේවාවට අන්තර් ග්‍රහණය කර ගැනීම සඳහා අවශ්‍ය නෛතික විධිවිධාන ඇතිකර ගැනුණි. මෙම නෛතික විධිවිධානයන්ට අනුව පළාත්

පාලන සේවකයන් පළාත් රාජ්‍ය සේවාවට අන්තර්ග්‍රහණය කළ යුතු වූයේ , එතෙක් ඔවුන් පළාත් පාලන සේවයේ අත්කර ගෙන තිබූ අයිතිවාසිකම් සහ වරප්‍රසාදවලට අගතියක් නොවන පරිදි ය.

කෙසේ වෙතත් විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා සංග්‍රහය අදාළ වන්නේ රාජ්‍ය සේවයේ සමාජිකයන් සඳහා පමණක් වන බැවින් පළාත් රාජ්‍ය සේවාවේ සාමාජිකයන් සඳහා එය අදාළ කරගත නොහැකි තත්වයක් ඇති විය. එය මගහරවාලීම පිණිස පළාත් රාජ්‍ය සේවාවේ සමාජිකයන්ටද පළාත් රාජ්‍ය 'සේවාව සඳහා අන්තර්ග්‍රහණය කර ගනු ලැබූවන්ට ද විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා සංග්‍රහය, 1898 වැන්දඹු අනත්දරු ආඥා පනත සහ 1983 අංක 24 දරන වැන්දඹු පුරුෂ අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදල් පනත අදාළ කරවීම පිණිස 1993 අංක 17 දරන පළාත් සභා විශ්‍රාම වැටුප් පනත පාර්ලිමේන්තුවේ සම්මත කරගන්නට යෙදුණි. මෙම පනතේ නියමයන් 1993. 09. 03 දින සිට ක්‍රියාත්මක විණි. මේ අනුව වත්මන් පළාත් පාලන විශ්‍රාම වැටුප් ඒකකයේ ප්‍රධානතම කාර්යය වන්නේ 1993. 09. 03 දිනට පෙර පළාත් පාලන ආයතනයන්හි සේවය කොට විශ්‍රාම ලැබූ තැනැත්තන් සඳහාත්, ඔවුන්ගේ කලත්‍රයන් , අනත්දරුවන් සහ ආබාධිත දරුවන් සඳහා ප්‍රතිලාභ ගෙවීමය.

## පළාත් පාලන සේවා විශ්‍රාම වැටුප් කාර්යයන්

* පළාත් පාලන සේවා විශ්‍රාම වැටුප් නියෝගයන්හි 20 නියෝගය අදාළ කරවමින් රාජ්‍ය සංස්ථාවකට හෝ ව්‍යවස්ථාපිත මණ්ඩලයකට ස්ථිරවම මුදාහරින ලද තැනැත්තන්ගේ විශ්‍රාම වැටුප් සකස් කිරීම , විශ්‍රාම වැටුප් ප්‍රදාන පත්‍ර නිකුත් කිරීම සහ මරණ පාරිතෝෂික ප්‍රදානය
* ප්‍රතිශෝධිත ප්‍රදාන පත්‍ර නිකුත් කිරීම
* කලින් කලට එනු ලබන විශ්‍රාම වැටුප් සංශෝධනයන් සකස් කිරීම
* 1993. 09. 03 දිනට පෙර විශ්‍රාම ලැබූ නිලධාරින් මියගිය පසු වැන්දඹු අනත්දරු විශ්‍රාම වැටුප් ප්‍රදානය කිරීම.
* 1993. 09. 03 දිනට පෙර විශ්‍රාම ලැබූ නිලධාරිනියන් මියගිය පසු වැන්දඹු පුරුෂ අනත්දරු විශ්‍රාම වැටුප් ප්‍රදානය කිරීම.
* ආබාධිත විශ්‍රාම වැටුප් ප්‍රදානයක් සකස් කිරීම
* පළාත් පාලන සේවයේ පත්වීම් ලද සේවක සේවිකාවන් වැන්දඹු අනත්දරු/වැන්දඹු පුරුෂ අනත්දරු විශ්‍රාම ක්‍රමයේ ලියාපදිංචි කිරීම සහ ලියාපදිංචි කිරීමෙන් පසු අදාළ ගොනු සිවිල් අංශයට මාරු කිරීම.
* පළාත් පාලන සේවා , පළාත් පාලන වැන්දඹු පුරුෂ අනත්දරු අරමුදල් යටතේ ගිණුම් පවත්වාගෙන යාම, බැංකු සැසඳුම් සකස් කිරීම සහ ගිණුම් වාර්තා පිළියෙළ කිරීම.
* අරමුදල් එකතු කිරීම සහ ආයෝජනය කිරීම.

## පළාත් පාලන විශ්‍රාම වැටුප් ක්‍රමයෙහි වර්තමාන තත්වය

1987 වර්ෂයේ සිදුකළ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 13 වන සංශෝධනය, 1993 පළාත් සභා විශ්‍රාම වැටුප් පනත හා 1993.09.03 දිනැති අති විශේෂ ගැසට් නිවේදනය අනුව පළාත් පාලනය වෙනුවෙන් පළාත් රාජ්‍ය සේවාව ස්ථාපිත විය. එබැවින් සිවිල් රාජ්‍ය නිලධාරින්ට හිමි විශ්‍රාම වැටුප් හා වැන්දඹු අනත්දරු විශ්‍රාම වැටුප් ප්‍රතිලාභ මෙම පළාත් රාජ්‍ය නිලධාරීන්ට ද හිමි වේ. එබැවින් පළාත් පාලන විශ්‍රාම වැටුප් ක්‍රමය අහෝසි කරමින් එය සිවිල් විශ්‍රාම වැටුපට ඒකාබද්ධ කරනු ලැබ ඇත.

# 6
# සන්නද්ධ සේවා (යුධ, ගුවන්, නාවුක) විශ්‍රාම වැටුප

## 6.1 ආරම්භය

- එක්සත් රාජධානියේ යටත් විජිතයක්ව පැවතුන ශ්‍රී ලංකාව 1948.02.04 දින නිදහස ලැබීමෙන් අනතුරුව ඒ වන විට ශ්‍රී ලංකාවේ ස්ථාපනය කර තිබූ රාජකීය යුධ හමුදාව ශ්‍රී ලංකා යුධ හමුදාව වශයෙන් 1949.10.10 දින සිට නගා සිටු වන ලදී. එදින සිටම ශ්‍රී ලංකා යුධ හමුදා සාමාජිකයින් හට විශ්‍රාම වැටුප් හා පාරිතෝෂික දීමනා හිමිකම් ලබා දී ඇත.
- 1949.10.10 දින සිට ක්‍රියාත්මක වූ විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා සංග්‍රහය යටතේ යුද හමුදා නිත්‍ය බල සේනාවට අයත් නිලධාරි, සෙසු නිලයින් සඳහා විශ්‍රාම වැටුප් හිමි වුව ද යුද හමුදා ස්වේච්ඡා බල සේනාවේ නිලධාරි /සෙසු නිලයින්ට සහ කාන්තා නිලධාරිණියන් හට හා සෙබළියන්ට විශ්‍රාම වැටුප් හිමිකම් ලබා දෙන ලද්දේ 1981.09.01 දින සිට වේ.
- දැනට බල පැවැත්වෙන 1981 යුද හමුදා විශ්‍රාම වැටුප් හා පාරිතෝෂික ව්‍යවස්ථා සංග්‍රහය 1981.09.01 දින සිට මේ දක්වා ක්‍රියාත්මක වේ.

විශ්‍රාම වැටුප් සංග්‍රහයට ඇතුළත් කරන ලද වැදගත් සංශෝධනයන්

- ස්වේච්ඡා බල සේනාවේ පිරිමි නිලධාරි/සෙසු නිලයින් සඳහා විශ්‍රාම වැටුප් හිමිකම් ලබා දීම (අංක 679/10 හා 1991.09.11 දිනැති අති විශේෂ ගැසට් පත්‍රය)
- 1985.01.01 දින සිට විශ්‍රාම වැටුප් ප්‍රතිශත වගුව හඳුන්වාදීම - (අංක 726/11 හා 1992.08.03 දිනැති අති විශේෂ ගැසට් පත්‍රය)
- 1983.09.26 දින සිට නිත්‍ය (පොදු) උප සේවයේ හා ස්වේච්ඡා උප සේවයේ ඉටු කරන ලද සේවය එකතු කර මුල් විශ්‍රාම වැටුප ප්‍රතිශෝධනය කිරීම, විශ්‍රාම වැටුපක් ප්‍රදානය කිරීම (අංක 794/9 හා 1993.11.24 දිනැති අති විශේෂ ගැසට් පත්‍රය)
- නිත්‍ය කාන්තා බලකායේ නිලධාරිණියන්/සෙබළියන් හට අවු. 15 ක් සේවය සම්පූර්ණ කිරීමේ දී විශ්‍රාම වැටුප හිමිකම් ලබා දීම (අංක 951/7 හා 1996.11.26 දිනැති අති විශේෂ ගැසට් පත්‍රය)
- ජාතික සන්නද්ධ මිනිස්බල සංචිතයේ සහ ජාතික සහායක හමුදාව යටතේ පූර්ණ වැටුප් සහිතව කළ සේවය විශ්‍රාම වැටුප් කටයුතු සඳහා ගණන් ගැනීම (අංක 1179/27 හා 2001.04.12 දිනැති අති විශේෂ ගැසට් පත්‍රය)
- ස්වේච්ඡා බල හමුදාවේ නිලධාරිණියන්ට හා කාන්තා සෙබළියන්ට වසර 15ක සේවය සම්පූර්ණ කිරීමෙන් පසු විශ්‍රාම වැටුපක් සඳහා හිමිකම් ලබා දීම (අංක 1512/19 හා 2007.08.31 හා අංක 1554/9 හා 2008.06.20 දිනැති අති විශේෂ ගැසට් පත්‍රය)
- ත්‍රස්තවාදී ක්‍රියා හේතුවෙන් ආබාධිතව සේවයෙන් ඉවත් කළ නිලධාරින් හා සෙසු නිලයින් (නිත්‍ය/ස්වේච්ඡා) සේවයෙන් ඉවත් කිරීමෙන් පසු වයස අවු. 55 දක්වා වැටුප් හා දීමනා ලබන කාල සීමාව විශ්‍රාම වැටුප් සඳහා ගණනය කර වයස අවුරුදු 55 දී සේවා විශ්‍රාම වැටුපක් ගෙවීම/ප්‍රතිශෝධනය ( අංක 1512/19 හා 2007.08.31 හා අංක 1554/9 හා 2008.06.20 දිනැති අති විශේෂ ගැසට් පත්‍ර)

1981 යුද හමුදා විශ්‍රාම වැටුප් හා පාරිතෝෂික ව්‍යවස්ථා සංග්‍රහය යටතේ හිමිවන දීමනා

1. සේවා විශ්‍රාම වැටුප
2. පරිවර්තික පාරිතෝෂිකය
3. සේවා පාරිතෝෂික දීමනා
4. දුබලතා විශ්‍රාම වැටුප
5. දුබලතා පාරිතෝෂික දීමනා
6. යැපෙන්නන් වෙනුවෙන් ලබන දීමනාව
7. මරණ පාරිතෝෂිකය
8. විශේෂ වන්දි (රා.ප.ච. 22/93 ට අනුව)

## 6.2 සේවා විශ්‍රාම වැටුප

**සේවා විශ්‍රාම වැටුප් සඳහා අවශ්‍ය සේවා සුදුසුකම්**

- නිත්‍ය බලසේනාවේ නිලධාරීන් හට අවු. 20කට නොඅඩු ගණන් ගත හැකි සේවා කාලයක් තිබිය යුතුය.
- නිත්‍ය බලසේනාවේ කාන්තා නිලධාරිණියන් හට සහ සෙබළියන්ට අවු. 15කට නොඅඩු ගණන් ගත හැකි සේවා කාලයක් තිබිය යුතුය.
- ස්වේච්ඡා බලසේනාවේ නිලධාරීන් හට අවු 20කට නොඅඩු සක්‍රිය හමුදා සේවා කාලයක් සම්පූර්ණ කර තිබිය යුතුය
- වෛද්‍ය හේතුන් මත විශ්‍රාම ගන්නා නිත්‍ය බලසේනාවේ නිලධාරීන් හට අවු. 10කට නොඅඩු ගණන් ගත හැකි සේවා කාලයක් තිබිය යුතුය
- නිත්‍ය බලසේනාවේ සෙසු නිලයින් හට අවු. 22කට නොඅඩු ගණන් ගත හැකි සේවා කාලයක් තිබිය යුතුය
- ස්වේච්ඡා බලසේනාවේ සෙසු නිලයින් හට අවු. 22කට නොඅඩු සක්‍රිය හමුදා සේවා කාලයක් සම්පූර්ණ කර තිබිය යුතුය.
- වෛද්‍ය හේතුන් මත විශ්‍රාම ගන්නා නිත්‍ය සෙසු නිලයින් හට අවු. 12කට නොඅඩු ගණන් ගත හැකි සේවා කාලයක් තිබිය යුතුය.
- ස්වේච්ඡා බලසේනාවේ කාන්තා සෙබළියන් හට අවු. 15කට නොඅඩු සක්‍රිය හමුදා සේවා කාලයක් සම්පූර්ණ කර තිබිය යුතුය.

**නිත්‍ය නිලධාරීන් විශ්‍රාම ගත යුතු අවස්ථා**

1. උපරිම වයස් සීමාව සම්පූර්ණ වීමෙන් ( අවුරුදු 55 සම්පූර්ණ වීම )
2. සේවා කාලය සම්පූර්ණ වීමෙන්

උපකරණ පාලන නිලධාරියෙකු හෝ කෙටි කාලීන අධිකාරිලත් නිලධාරියෙකු එම නිලයේ රැඳී සිටිය හැකි සේවා කාලය සම්පූර්ණ වීම හේතුවෙන් විශ්‍රාම ගත යුතුය.

එදා රාත්‍රියේ අදිති හෝටලයේ කුඩා අංගනයට වී ලැසි බොමින් මා කල්පනා කළේ එතරම් දුරක් ගෙවා පැමිණ සොයා ගත් තොරතුරු වලින් කුමක් කළ යුතුදැයි කියාය.එහෙත් මට කිසිම දෙයක් පැහැදිළිව හිතා ගන්නට බැරි වුණා. ටික වේලාවකින් අසල කෝවිලක සණ්ඨාර හඬක් ඇහුණා.

ඉතිහාසයේ නින්නාදය මිහිරි හඬක් හෝ එකම අදෝනාවක් නෙවෙයි. මගේ ජාතියට- පරපුරට සිදුවූ අසාධාරණයක් නෙවෙයි . ලෝකාරම්භයේ සිට මිනිසාට පසු කරන්නට වෙන මං සන්ධියක් පමණක්ය යන්න තේරුම් ගැනීම හෝ නොගැනීමේ චිත්ත ස්වභාවය ටාං.... ටාං.... ටාං.... ගාලා ඔලුවට වැදෙන්න ගත්තා.

## 5.5 විදේශ විශ්‍රාම වැටුප්

ශ්‍රී ලාංකික විශ්‍රාමිකයින් 25000කට ආසන්න ප්‍රමාණයක් විදේශගතව වාසය කෙරේ. ඔවුන් ප්‍රධාන වශයෙන්

ඕස්ට්‍රේලියාව (නවසීලන්තය ඇතුළුව)
ඉන්දියාව
එක්සත් රාජධානිය
එක්සත් ජනපදය
කැනඩාව

යන රටවල්හි ජීවත්වේ. මීට අමතරව මැදපෙරදිග රැකියා සඳහා ද සැලකිය යුතු විශ්‍රාමිකයින් ප්‍රමාණයක් විදේශගතවී ඇත. එමෙන්ම ඉතාලිය, ජර්මනිය, ස්විස්ටර්ලන්තය වැනි රටවල් කීපයක් ද ශ්‍රී ලාංකික විශ්‍රාමිකයන් ජීවත් වෙති.

**ශ්‍රී ලංකාවේ විශ්‍රාමිකයන් විදේශයන්හි වාසය කිරීමට හේතු කිහිපයක් බලපා ඇත**

01. සුදු ජාතික නිලධාරීන් ශ්‍රී ලංකාවේ සේවය කිරීම හා නැවත ඔවුන් තම මව්රට බලා යාම.
02. භාෂා හේතු මත විශ්‍රාමගත් නිලධාරීන් වෙනත් රටවලට සංක්‍රමණය වීම.
03. පොදු රාජ්‍ය මණ්ඩලීය රටවල් (ඕස්ට්‍රේලියාව) වෙත සංක්‍රමණය වීමට තිබූ වාසිසහගත තත්ත්වය සැලකිල්ලටගෙන විදේශගත වීම.
04. 1983 ජනවාර්ගික අර්බුදය හේතුවෙන් සරණාගතයින් ලෙසින් සංක්‍රමණය වීම.
05. යටත් විජිත ආර්ථිකය තුළ ශ්‍රී ලංකාවේ රාජකාරී ඉටුකළ ඇතැම් ඉන්දියානු ජාතිකයන් එම රටට යාම.
06. ඉන්දියානු පුරවැසිභාවය ලැබීම හේතුවෙන් ඇතැම් නිලධාරීන් ඉන්දියාවට සංක්‍රමණය වීම.
07. ශ්‍රී ලංකාව රාජසිංහ පරම්පරාවේ පරම්පරාගත නිලධාරීන්ට කැන්ඩියන් විශ්‍රාම වැටුප ගෙවීම. (Kandyan Pension)
08. මෑත කාලයේ උතුරු ප්‍රදේශයේ පදිංචි ශ්‍රී ලාංකික විශ්‍රාමිකයින් ජනවාර්ගික අර්බුදය හේතුවෙන් විදේශගත වීම.
09. දූ දරුවන් විදේශගතවීම මත විශ්‍රාමික දෙමාපියන් විදේශගත වීම.
10. විශ්‍රාමිකයන්ගේ වැන්දඹුවන් හා අනත්දරුවන් ද ඉහත හේතු මත විදේශගත වීම.

විදේශගත ශ්‍රී ලාංකිකයන්ට විශ්‍රාම වැටුප් ගෙවීමේදී ඒ සඳහා ක්‍රියාමාර්ග ගණනාවක් අනුගමනයකර තිබේ.

## Crown Agent මඟින් ගෙවීම

එංගලන්තයේ පිහිටි Crown Agent විශ්‍රාම වැටුප් අංශය මඟින් ශ්‍රී ලාංකික විශ්‍රාමිකයින්ට විශ්‍රාම වැටුප් ගෙවීමට පහසුකම් සලසා තිබුණි. ඒ අනුව එංගලන්තය, ඉන්දියාව, ඇමෙරිකා එක්සත් ජනපදය, නවසීලන්තය, කැනඩාව, ඕස්ට්‍රේලියාව, ජර්මනිය වැනි රටවල්වල පදිංචිව සිටි සීයකට (100) ආසන්න විශ්‍රාමිකයින්ට විශ්‍රාම වැටුප් ගෙවීම එම ආයතනය භාරගෙන තිබුණි. මෙම සේවාව 1970 දී විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව පිහිටුවීමට පෙර සිටම එනම් මුදල් අමාත්‍යංශය යටතේ ක්‍රියාත්මක වූ අතර එකී විශ්‍රාම වැටුප ගෙවීම වෙනුවෙන් Crown Agent වෙත පවුම් 5 ක කොමිස් මුදලක් මුදල් අමාත්‍යංශය විසින් ගෙවන ලදී. එමෙන්ම Crown Agent විසින් සිදුකළ විශ්‍රාම වැටුප් පිරිවැය ද මහා භාණ්ඩාගාරය විසින් එම ආයතනය වෙත ප්‍රතිපූර්ණය කරන ලදී.

Crown Agent මඟින් විශ්‍රාම වැටුප් ගෙවීමේදී පහත සඳහන් ගැටළු පැන නැඟුණි:

* විශ්‍රාමික නාමලේඛනය, විශ්‍රාම වැටුප් ගොනුව නොමැති වීම;
* විශ්‍රාමිකයා හඳුනාගත නොහැකිවීම හා ඔහු ජීවත්වන බව සනාථ නොවීම;
* ගෙවූ මුදල නිවැරදි නොවීම;
* ප්‍රතිපූර්ණය කිරීම කුමන පදනමක් මත සිදු කෙරුනි ද යන්න තහවුරු නොවීම;
* විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුවේ හෝ ශ්‍රී ලංකා රජයේ අධීක්ෂණයක් සිදු නොවීම;
* එංගලන්තයේ පිහිටි ආයතනයක් ලෝකයේ වෙනත් රටක විශ්‍රාම වැටුප් ගෙවීම;
* එම ගෙවීම මහ කොමසාරිස් කාර්යාලයේ අධීක්ෂණයට යටත් නොවීම;
* විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුවෙන් පරිබාහිරව මහා භාණ්ඩාගාරය ගෙවීම සිදු කිරීම;
* අධික කොමිස් මුදල් ගෙවීමට සිදු වීම;
* ශ්‍රී ලංකා මහ කොමසාරිස් කාර්යාල ක්‍රියාත්මක වූ රටවල් වලද ඇතැම් ගෙවීම් Crown Agent හරහා සිදු වීම;

**මහ කොමසාරිස් කාර්යාලය මඟින් ගෙවීම.**

එක්සත් රාජධානිය, කැනඩාව, ඉන්දියාව හා ඕස්ට්‍රේලියාව මඟින් එම රටවල්හි පදිංචි විශ්‍රාමිකයින් විශ්‍රාම වැටුප් ගෙවනු ලැබේ. ඒ, ඒ මහ කොමසාරිස් කාර්යාලයන්හි විශ්‍රාම වැටුප් ඒකක ක්‍රියාත්මක වන අතර පදිංචිය හඳුනාගෙන ඔවුනට ගෙවීම් සිදු කරනු ලැබේ. මේ සඳහා අවශ්‍ය ප්‍රතිපාදන විදේශ කටයුතු අමාත්‍යංශය මඟින් ඒ ඒ මහ කොමසාරිස් වෙත ලබාදීමට පියවර ගෙන ඇත. මෙම ගෙවීම් ක්‍රමය තුළ ද පහත සඳහන් ගැටළු මතුවී ඇත

01. විදේශ විශ්‍රාමිකයින් සම්බන්ධව පැහැදිලි Data Base නොතිබීම;
02. ඔවුන් ජීවත්වන බව සනාථ නොවීම;
03. වැරදිසහගත ගෙවීම් සිදුවීම;
04. විශ්‍රාම වැටුප් වැඩියෙන් හෝ අඩුවෙන් ගෙවීම;
05. ලිපිගොනු නොමැති ගෙවීම් සිදුවීම;
06. යැපෙන්දඹුවන්ගේ සිවිල් තත්වය සනාථ නොවීම;

පවතින ක්‍රමවේදය තුළ පවතින අඩුපාඩු හඳුනා ගැනීමටත් ඒ සඳහා පිළියම් යෙදීමටත් කටයුතු කෙරෙමින් පවතී. ඒ අනුව මේ වන විටත් මහ කොමසාරිස් කාර්යාලය මඟින් විශ්‍රාම වැටුප් ලබාගන්නා විශ්‍රාමිකයන්ගේ දත්ත වගුවක් (Data Base) ඇති කිරීමත් ඔවුන්ගේ විශ්‍රාම වැටුප් ගැටලුව සඳහා පිළියම් යෙදීමටත් අවශ්‍යතාවය මතු විය.

## ඉන්දියානු රජය මඟින් ගෙවනු ලබන විශ්‍රාම වැටුප් ප්‍රතිපූර්ණය කිරීම

ඉන්දියාවේ පදිංචි ශ්‍රී ලාංකික විශ්‍රාමිකයන්ට විවිධ ක්‍රම මඟින් විශ්‍රාම වැටුප් ගෙවා තිබුණි.

(a) එංගලන්තය Crown Agent මඟින්, (මෙම ගෙවීම් 2008 මාර්තු සිට නවතා දමා ඇත.)

(b) ඉන්දියානු ශ්‍රී ලංකා නියෝජ්‍ය මහ කොමසාරිස් කාර්යාලය මඟින් ගෙවීම.

ඉන්දියාවේ මහ කොමසාරිස් කාර්යාලය දිල්ලියෙහි පිහිටුවා ඇති අතර නියෝජ්‍ය මහ කොමසාරිස් කාර්යාලය චෙන්නායිවල පිහිටුවා ඇත. මහ කොමසාරිස් හරහා ගෙවීම් සිදු නොවන අතර නියෝජ්‍ය මහ කොමසාරිස් කාර්යාලය විසින් විශ්‍රාමිකයින් 100 දෙනෙකුට පමණ ගෙවීම් සිදු වේ. ඊට අවශ්‍ය ප්‍රතිපාදන විදේශ කටයුතු අමාත්‍යාංශය හරහා මුදාහරිනු ලැබේ. මෙහි දී නියෝජ්‍ය මහ කොමසාරිස් කාර්යාලය මඟින් පුද්ගලයින් හඳුනාගෙන එනම් ජීවිත සහතික ලබාගෙන ගෙවීම් සිදු කරනු ලැබේ.

## ඉන්දියාවේ Pay & Account Officer හරහා විශ්‍රාම වැටුප් ගෙවීම

ඉන්දියාවේ රජය මඟින් පුද්ගලයින් 400 කට පමණ කේරළය, කර්නාටක, දිල්ලි හා චෙන්නායි යන නගර වලින් ගෙවීම් සිදු කරන අතර එම ගෙවීම් ඉන්දියානු රජය වෙත ප්‍රතිපූර්ණය කරනු ලැබේ. අදාළ ගෙවීම් වවුචර තැපැල් මඟින් විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුවට ලැබුණු පසු දැරිය යුතු මුදල ඇමරිකන් ඩොලර් වලින් ශ්‍රී ලංකාවේ පිහිටි ඉන්දියානු මහ කොමසාරිස් කාර්යාලය වෙත ලබා දීමට පියවර ගෙන ඇත.

ශ්‍රී ලංකා මහ කොමසාරිස් කාර්යාලය මඟින් විශ්‍රාම වැටුප් ගෙවීමේදී පැනනැගෙන ගැටළු එම මහ කොමසාරිස් කාර්යාලයේ නිලධාරීන් සමඟ සාකච්ඡාකොට විසඳා ගැනීමේ හැකියාව පවතී. කෙසේ වෙතත් ඉන්දියානු රජය මඟින් විශ්‍රාම වැටුප් ගෙවීම හා එම විශ්‍රාම වැටුප් වියදම ශ්‍රී ලංකාව විසින් ප්‍රතිපූර්ණය කිරීමේ දී පහත ගැටළු පැනනැගී ඇත;

01. ඉන්දියානු රජය විසින් කුමන බලතල යටතේ මෙම විශ්‍රාම වැටුප් ගෙවා ශ්‍රී ලංකාවෙන් ප්‍රතිපූර්ණය කරන්නේදැයි පැහැදිලි නොවීම;

02. මෙම විශ්‍රාමිකයන්ගේ විශ්‍රාම වැටුප් ලිපිගොනුවක් නොමැති වීම;

03. ගෙවන විශ්‍රාම වැටුප් හුදෙක්ම විශ්‍රාම වැටුප් ද එසේත් නැත්නම් කරුණා සහගත හෝ වෙනත් දීමනාවක් ද යන්න පැහැදිලිව අනාවරණය නොවීම;

04. විශ්‍රාමිකයන් ජීවත් වන බව සහ අදාල පුද්ගලයින්ට නිවැරදිව ගෙවන බවට තහවුරු නොවීම;

05. මුදල් ප්‍රතිපූර්ණය කිරීමේදි බොහෝ කල්ගත වූ වවුචර් පත් මෙම දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කිරීම සහ අපිළිවෙළ;

06. වාර්ෂිකව රුපියල් මිලියන පහක පමණ මුදලක් ඉන්දියානු රජය වෙත ප්‍රතිපූර්ණය කිරීම හා එම මුදල් භාවිතය පිළිබඳව සෑහීමකට පත් විය නොහැකි වීම;

07. ඉන්දියානු රජය වෙත ඇමරිකන් ඩොලර් භාවිතයෙන් අදාළ වියදම ප්‍රතිපූර්ණය කරන අතර ඉන්දියානු මහ කොමසාරිස් වෙත භාර දුන් පසු ඉන්දියානු මහ කොමසාරිස් විසින් ඉන්දියානු

රජය වෙත එකී මුදල් ප්‍රේෂණය කෙරේ. මෙසේ කිරීමේ දී විනිමය අනුපාත පිළිබඳ ගැටළු පැනනැගීම. මේ නිසාම අධි හා අව ගෙවීම් සිදුවිය හැකි වීම

08. විටින් විට ශ්‍රී ලාංකික රජය වෙතින් විශ්‍රාමිකයන් වෙනුවෙන් පනවන කොන්දේසි හා ලබා දෙන සහන මෙම විශ්‍රාමිකයන්ට නොලැබීම. (විශ්‍රාම වැටුප් විෂමතාවයන් ගෙවා නොතිබීම.)

09. විශ්‍රාමික පුද්ගලයින් මිය ගිය පසු මෙම විශ්‍රාම වැටුප වෙනත් පුද්ගලයෙකුට ලබා ගැනීමේ හැකියාව පැවතීම;

10. ආරම්භයේ සිට 2006. 01. 01 දක්වා මහ භාණ්ඩාගාරය විසින් මෙම විශ්‍රාම වැටුප් වෙනුවෙන් ගෙවීම් ප්‍රතිපූර්ණය ඉන්දියානු රජය විසින් සිදු කළ අතර ඉන් අනතුරුව මෙම දෙපාර්තමේන්තුව වෙත මෙම විෂය පවරා ගැනීමෙන් අනතුරුව පැරණි ක්‍රමවේදය දිගටම අනුගමනය කිරීම;

11. විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව ඉන්දියානු ගෙවීම් පිළිබඳව අධීක්ෂණය නොකිරීම;

12. ගෙවීම් අනුගමනය කිරීමේ දී හා වියදම් සහතික කිරීමේදී ගැටළු පැනනැගීම;

13. ඉන්දියානු රජය මුදල් ප්‍රතිපූර්ණය කිරීමේ දී කල් ගත වී වවුචර් ඉදිරිපත් කිරීම නිසා එහි නිරවද්‍යතාවය පිළිබඳව අපහැදිළි බව;

14. ඉන්දියානු රජය ඉල්ලා සිටිනු ලබන මුළු මුදලම ප්‍රතිපූර්ණය කිරීම කළ යුතු වීම;

### ශ්‍රී ලංකා බැංකු මගින් විශ්‍රාම වැටුප් ගෙවීම

ඉහත සඳහන් ක්‍රමවලට අමතරව විදේශගත විශ්‍රාමිකයන් ශ්‍රී ලංකාවේ පිහිටි බැංකු ගිණුමක් මඟින් විශ්‍රාම වැටුප් ලබා ගැනීමේ පහසුකම් ද සලසා ඇත. එය පහත සඳහන් තත්ත්වයන්ට අනුව ක්‍රියාත්මක වේ;

01. යම් පුද්ගලයෙකු විදේශගතවන විට විශ්‍රාම වැටුප් ගෙවීම පරිගණකයේ විදේශ ගොනුවට ඇතුළත් කිරීම (Overseas Column);

02. ප්‍රාදේශීය ලේකම් විසින් විශ්‍රාම වැටුප විශ්‍රාමිකයාගේ බැංකු ගිණුමට යැවීම;

03. විශ්‍රාමිකයා මාස්පතා ජීවිත සහතිකයක් තම ගිණුම පිහිටි බැංකුව වෙත ඉදිරිපත් කළ යුතුවේ;

04. ජීවිත සහතිකයක් ලැබීමෙන් අනතුරුව මුදල ගිණුම් හිමියා වෙත මුදාහැරීම;

මෙම ක්‍රියාවලියේ දී පහත ගැටළු මතුව ඇත;

- ඇතැම් විශ්‍රාමිකයන් විදේශගතවීමේ දී දැනුම් නොදීම හා එම ගෙවීම Local Column යටතේ ක්‍රියාත්මක වීම;
- බැංකු ගිණුම බද්ධ ගිණුමක් වශයෙන් ක්‍රියාත්මක වීම;
- ව්‍යාජ ජීවිත සහතික ඉදිරිපත් කිරීම;
- ඇතැම් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශවල ඉතා විශාල සංඛ්‍යාවක් විදේශගතව සිටීම ;

  (උදා: කොළඹ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය;)
- මෑතදී සිදුකළ ගෘහමූලික සමීක්ෂණයට අනුව ඇතැම් විශ්‍රාමිකයන්ගේ පදිංචිය අනාවරණය නොවීම;
- ග්‍රාම නිලධාරී මඟින් පදිංචිය සනාථ කරගත නොහැකි වීම;

## විදේශ විශ්‍රාම වැටුප් ප්‍රතිපත්තීන් සහ උපායමාර්ග

විදේශ විශ්‍රාම වැටුප් ගෙවීම සඳහා ක්‍රමානුකූල ක්‍රමවේදයක් නිර්මාණය කිරීම වෙනුවෙන් මෙම ප්‍රතිපත්ති සහ උපායමාර්ග පිළියෙල කරනු ලැබේ. විශේෂයෙන්ම විදේශ විශ්‍රාම වැටුප් ගෙවීම් ක්‍රියාවලියෙහි පැන නැගී ඇති ගැටළු සහ අපිළිවෙළ හඳුනාගැනීමෙන් පසු ඒවා ඉවත්කරමින් පහත සඳහන් උපායමාර්ග ගෙන ඇත.

### විදේශ විශ්‍රාම වැටුප් ගෙවීම සම්බන්ධව සියලුම කටයුතු විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව යටතට පවරා ගැනීම

1970 දී විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව පිහිටුවන අවස්ථාවේ දී විදේශ විශ්‍රාම වැටුප් ගෙවීමේ ඇතැම් කටයුතු මෙම දෙපාර්තමේන්තුවට පවරා නොතිබුණි. එබැවින් එම කටයුතු 2006 ජනවාරි 01 දින සිට පවරාගනු ලැබීය.

### Crown Agent විශ්‍රාම වැටුප් අංශය මඟින් සිදුකළ විශ්‍රාම වැටුප් ගෙවීම් සියල්ල අත්හිටුවීම සහ එම ගෙවීම් ශ්‍රී ලංකා විදේශ දූත මණ්ඩල කාර්යාලය වෙත පවරා දීම

2008 වසර ආරම්භවන විට Crown Agent විශ්‍රාම වැටුප් අංශය මඟින් සිදුකළ ගෙවීම් පහත සඳහන් පරිදි පැවතුණි;

| | | |
|---|---|---|
| ඇමරිකා එක්සත් ජනපදය | - | 62 |
| නවසීලන්තය | - | 16 |
| ඕස්ට්‍රේලියාව | - | 30 |
| කැනඩාව | - | 15 |
| ඉන්දියාව | - | 06 |
| වෙනත් | - | 05 |

මෙම Crown Agent වෙත එක් ගෙවීමක් වෙනුවෙන් පවුම් 5.5 ක කොමිස් මුදලක් ශ්‍රී ලංකා රජය විසින් ගෙවනු ලැබීය. මෙම ගෙවීම් ද අත්හිටවනු ලැබේ. එමෙන්ම ඒ ඒ රටවල පිහිටි ශ්‍රී ලංකා දූත මණ්ඩල කාර්යාල වෙත අදාළ ගෙවීම් මාරු කිරීමට පියවරගනු ලැබේ. 2008 මාර්තු සිට ඇමරිකාව, ඉන්දියාව, කැනඩාව, ඕස්ට්‍රේලියාව, බ්‍රිතාන්‍ය යන රටවල පිහිටි දූත මණ්ඩල කාර්යාල වෙතට පැවරීම් කර ඇත.

### විදේශ විශ්‍රාම වැටුප් ඒකකය පිහිටුවීම

විශේෂ අමාත්‍ය මණ්ඩල පත්‍රිකාවකට අනුව විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ ජනරාල් තනතුරක් ඇති කිරීමත් ඒ සමඟ දෙපාර්තමේන්තුව ප්‍රතිව්‍යුහගත කිරීම යටතේ විදේශ විශ්‍රාම වැටුප් අංශයක් පිහිටුවීම හා මෙම අංශය සහකාර අධ්‍යක්ෂවරයකුගේ පාලනය යටතේ පවතී. (කාර්ය මණ්ඩලයට විශ්‍රාම වැටුප් නිලධාරීන් හා කළමනාකරණ සහකාර නිලධාරීන් ඇතළු 10 කි.) විදේශ විශ්‍රාම වැටුප් මෙම අංශයට සිවිල් හමුදා, පළාත් පාලන සහ වැන්දඹු අනත්දරු විශ්‍රාම වැටුප් සියල්ල පවරා ඇත.

ඉන්දියානු රජය මඟින් ගෙවනු ලබන විශ්‍රාම වැටුප් දීම අත්හිටුවීම සහ එම ගෙවීම් ඉන්දියාවේ චෙන්නායිහි පිහිටි ශ්‍රී ලංකා නියෝජ්‍ය මහ කොමසාරිස් කාර්යාල වෙත පැවරීම.

1971 පෙර සිට ඉන්දියානු රජය ශ්‍රී ලාංකික පුද්ගලයන් වෙනුවෙන් විශ්‍රාම වැටුප් දීමනාවක් ගෙවනු ලබන අතර එම ගෙවීම් ශ්‍රී ලංකාව තුළින් ප්‍රතිපූර්ණය කරනු ලැබේ. මෙම ගෙවීම් ආරම්භය පිළිබඳ නිශ්චිත තොරතුරු නැතත් කේරළය, කර්නාටක සහ තමිල්නාඩු උප භාණ්ඩාගාර විසින් පුද්ගලයන් 500 කට ආසන්න සංඛ්‍යාවකට විශ්‍රාම වැටුප් දීමනාවක් ගෙවනු ලබන අතර එම ගෙවීම් ඉන්දියානු මුදල් අමාත්‍යාංශය යටතේ ඇති Pay & Account Office මඟින් ප්‍රතිපූර්ණය කරගනු ලැබේ. 1994 දී ශ්‍රී ලාංකික නියෝජිත කණ්ඩායමක් ඉන්දියානු රජය සමඟ මෙම විශ්‍රාම වැටුප් ගෙවීම සම්බන්ධව අවබෝධතා ගිවිසුමකට අත්සන්කොට ඇත.

මෙම ගිවිසුමට අනුව විශ්‍රාම වැටුප් දීමනා ඉන්දියානු විශ්‍රාම වැටුප් ගෙවන ආකාරයට බැංකු ගිණුම්වලට සෘජුව ගෙවීමටත් ඉන් අනතුරුව එම මුදල් ප්‍රතිපූර්ණයකර ගැනීමටත් එකඟතාවය ප්‍රකාශ කොට ඇත. කෙසේ වෙතත් මෙම ගිවිසුමට අනුව ක්‍රියාත්මක වී නොමැති අතර 2008 වසර අවසන් වන විටත් 1994 ට පෙර පැවති ක්‍රමවේදයම අනුගමනයකොට ඇත;

මෙම ගෙවීම් ක්‍රමවේදය අධ්‍යනය කිරීමට 2008 නොවැම්බර් 29 - දෙසැම්බර් 07 දක්වා විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුවෙහි නියෝජිත කණ්ඩායමක් ඉන්දියාව වෙත යවන ලද අතර එහි දී මෙම යම් ක්‍රමයෙහි ගැටලු සහ නව ක්‍රමවේදයන් සාකච්ඡා කරන ලදී. ඊට අනුව මෙම ගෙවීම් ශ්‍රී ලංකා මහ කොමසාරිස් කාර්යාල වෙත පැවරීමට කටයුතු කරන ලදී. 2009 අගෝස්තු මස සිට ඉන්දියාවේ Pay & Account ආයතනය මඟින් සිදුකළ විශ්‍රාම වැටුප් ගෙවීම ශ්‍රී ලංකා නියෝජ්‍ය මහා කොමසාරිස් කාර්යාලයට පවරා ගැනීමට කටයුතු කර ඇත.

විදේශ රටවල් වල පදිංචි නිතර ශ්‍රී ලාංකික පුරවැසියන්ගේ විශ්‍රාම වැටුප විදේශීය දූත මණ්ඩල කාර්යාල මඟින් ගෙවීම

5.1 2008 මාර්තු 01 දින සිට ඇමරිකා එක්සත් ජනපදයෙහි ශ්‍රී ලංකා තානාපති කාර්යාලය මඟින් විශ්‍රාම වැටුප් ගෙවීමේ නව ක්‍රමවේදය හඳුන්වාදෙන ලදී. ඒ අනුව Crown Agent මඟින් ඇමරිකා එක්සත් ජනපදයෙහි ගෙවන ලද සියලුම විශ්‍රාම වැටුප් අත්හිටුවන ලදී. විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව විසින් විශ්‍රාමිකයන් පිළිබඳ තොරතුරු ලේඛනයක් (Pension File) සකස් කරන ලද අතර විශ්‍රාම වැටුප් ලිපිගොනුව මෙම දෙපාර්තමේන්තුව විසින් සකස්කොට අන්තර්ජාලයට එකතු කරන ලදී. එමෙන්ම ගෙවීම් ගොනුව සකස්කොට විදේශ කටයුතු අමාත්‍යාංශය හරහා ඇමරිකා එක්සත් ජනපදයෙහි ශ්‍රී ලංකා තානාපති කාර්යාලය වෙත යවනු ලැබූ අතර අදාළ ප්‍රතිපාදන මුදාහරින ලදී. එමෙන්ම ගෙවීම් කිරීමට අවශ්‍ය උපදෙස් පැහැදිලිව ලබාදී ඇත. එමෙන්ම ජීවිත සහතික ලබාගැනීම සහ එම ලබාගැනීමේ දී අනුගමනය කළ යුතු ක්‍රියා පටිපාටිය ද හඳුන්වා දී ඇත.

5.2 ඕස්ට්‍රේලියාවේ මහකොමසාරිස් කාර්යාලය මඟින් සිදුකළ විශ්‍රාම වැටුප් ගෙවීම් අධ්‍යනයට 2006 වසරේ දී විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ ජනරාල් ඇතුළු නියෝජිත කණ්ඩායමක් සහභාගි විය. ඒ අනුව නවසීලන්තයේ පදිංචි ශ්‍රී ලාංකික විශ්‍රාමිකයන්ගේ (Crown Agent) මඟින් ගෙවනු ලැබූ විශ්‍රාම වැටුප් ඕස්ට්‍රේලියානු මහ කොමසාරිස් කාර්යාලය හරහා ගෙවීමට තීරණය විය.

5.3 විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ ජනරාල්වරයා 2009.07.14 දින ඇමරිකා එක්සත් ජනපදයේ ලොස් ඇන්ජලීස්හි ශ්‍රී ලංකා කොන්සියුලර් ජනරාල්වරයා සමඟ එරට විශ්‍රාම වැටුප් ගෙවීම් ප්‍රගතිය හා ගැටලු පිළිබඳව සාකච්ඡාවක් පවත්වනු ලැබීය. ඉහත සඳහන් පරිදි දැනට ඇමරිකා එක්සත් ජනපදයෙහි ගෙවනු ලබන විශ්‍රාම වැටුප් ක්‍රමවේදය මහාබ්‍රිතාන්‍ය, ඉන්දියාව, කැනඩාව, සහ ඕස්ට්‍රේලියාව යන රටවල් සඳහා හඳුන්වා දීමට නියමිත අතර එය 2010 ජනවාරි මස සිට ක්‍රියාත්මක කෙරුණි.

5.4 ප්‍රධාන රටවල් හැරුණු කොට විශ්‍රාමිකයන් විශාල සංඛ්‍යාවක් ජීවත්වන ජර්මනිය, ස්වීඩනය, සිංගප්පූරුව ස්විස්ටර්ලන්තය, ඉතාලිය, ඩුබායි වැනි අනිකුත් රටවල් සඳහාද ඉහත සඳහන් පරිදි යෝජිත ක්‍රමවේදය මත විශ්‍රාම වැටුප් ගෙවීමට පියවර ගනු ලැබේ.

## විදේශයන්හි පදිංචිව සිට ශ්‍රී ලංකාවෙන් විශ්‍රාම වැටුප් ලබාගන්නා විශ්‍රාමිකයන්ගේ ගෙවීම් ප්‍රතිසංවිධානය

විශ්‍රාමික විශාල සංඛ්‍යාවක් මෙම ක්‍රමය යටතේ විශ්‍රාම වැටුප් ලබාගනී. කොළඹ දිස්ත්‍රික්කයේ පමණක් 15,000 ක් වැනි විශාල ප්‍රමාණයක් විදේශගතව සිට ශ්‍රී ලාංකික බැංකුවක් මඟින් විශ්‍රාම වැටුප ලබාගනී. පහත සඳහන් පරිදි මෙම ගෙවීම් ප්‍රතිසංවිධානය කෙරේ.

01. විදේශීය නිත්‍ය පදිංචිය ඇති විට ගෙවීම විදේශීය දූත මණ්ඩල කාර්යාල වෙත මාරු කිරීම.

02. අනිකුත් ලිපිගොනු ප්‍රාදේශීය ලේකම් කාර්යාල වෙතින් විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුවට පවරා ගැනීම සහ එකම බැංකුවක විවෘත කරන විශේෂ ගිණුමකට පමණක් එම මුදල් බැර කිරීමට අවස්ථාව සලසා දීම. (මෙම බැංකු ගිණුම් තනි ගිණුමක් වශයෙන් පමණක් පවත්වා ගැනේ, යම් අවස්ථාවකදී ගිණුමේ ඇති මුදල් විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ ජනරාල් වෙත පවරාගත හැකි වේ).

03. තාවකාලිකව සහ කෙටිකාලීන වශයෙන් පමණක් විදේශගත වූ අයගේ තාවකාලිකව අත්හිටුවා තැබීම හෝ ජීවිත සහතිකයක් ලබාගෙන තවදුරටත් ගෙවීමට ඒ ඒ ප්‍රාදේශීය ලේකම්වරුන් වෙත පැවරීම.

විදේශගත විශ්‍රාමිකයාට විශ්‍රාම වැටුප් ගෙවීම සම්බන්ධව 16/2011චක්‍රලේඛය මඟින් උපදෙස් නිකුත් කර ඇත. ඒ අනුව මේ වන විට එවැනි විශ්‍රාමිකයන් 8000ක් සම්බන්ධව තොරතුරු පරිගණකගත කර තිබේ; මෙම විශ්‍රාම වැටුප ගෙවීම පිළිබඳව පහත සඳහන් තත්ත්වයන් වර්තමානයේ දී නිරූපණය වේ;

1. දීර්ඝ කාලීනව විදේශගත වූ සහ ඉතා වයස් විශ්‍රාමිකයන් විදේශ දූත මණ්ඩල කාර්යාල හරහා විශ්‍රාම වැටුප් ගැනීමට තම කැමැත්ත ප්‍රකාශකොට තිබේ. වාර්ෂිකව රුපියල් මිලියන 600ක් පමණ මුදලක් මෙම විශ්‍රාම වැටුප් ගෙවීමට අයත් වේ;
2. බොහෝ විශ්‍රාමිකයන් තම විශ්‍රාම වැටුප දේශීය බැංකු ගිණුමක තැන්පත් කිරීමට පියවර ගෙන තිබේ. මහජන බැංකුව, ලංකා බැංකුව හා පැන් ඒෂියා බැංකුවෙහි නම් කළ බැංකු ශාඛාවක විශේෂිත ගිණුම්වල මෙම මුදල් තැන්පත් කරනු ලැබේ. මෙම ගිණුම්වල මුදල් වෙනත් බැංකු ගිණුමකට හෝ විදේශවලට මාරුකර ගැනීමට හැකි සේ පහසුකම් සලසා ඇත. සැලකිය යුතු විශ්‍රාමික ප්‍රමාණයක් මෙම මුදල් විදේශවලට මාරු කරනු ලැබේ.
3. විදේශගත විශ්‍රාමිකයන් බොහෝ දෙනෙකුට ශ්‍රී ලාංකික පුරවැසිභාවය නැත. ඇතැම් දීමනා හා ජීවනාධාර ගෙවීම් පාලනයකර ඇත.
4. විදේශ විනිමය විශ්‍රාම වැටුප් වශයෙන් ගලාගෙන යෑම පාලනය සඳහා නීති හෝ ප්‍රතිපත්ති සම්පාදනය කළ යුතුව ඇත.

## 5.6 පළාත් පාලන සේවා විශ්‍රාම වැටුප් ක්‍රමය

ප්‍රාදේශීය පාලනය පිළිබඳව ලංකාවට ඇත්තේ දිගුකාලීන අත්දැකීමකි. එය ක්‍රි.පූ. 4 වන සියවස තරම් ඈතට දිව යයි. නගර පාලනය උදෙසා නගරගුත්තික ධුරයක් එකල පැවති බවට මහාවංශය සාක්ෂි දරයි. අනුරාධපුර නගරයෙහි නගර ගුත්තිකයකු යටතේ පැවති අංගසම්පූර්ණ කාර්යක්ෂම පාලන ක්‍රමයක් පැවති බව ඒ අනුව පැහැදිලි වෙයි.

ගම්සභාව අනු ලක්දිව ග්‍රාම පාලනය පිළිබඳව බොහෝ සෙයින් ඉපැරණි අංගයක් විය. අතීතයේ දී ගම්සභාව සැදුම් ලද්දේ කලතුනා, සැලකිය යුතු ප්‍රභූ පුද්ගලයන්ගෙනි. ඔවුන් රැස්වූයේ අම්බලමක්, විසල් තුරුසෙවණක හෝ වෙනත් පහසු ස්ථානයකය. ගමෙහි සිදුවන සුළු අපරාධ සඳහා දඬුවම් නියම කිරීමත්, ආරවුල් නිරාකරණය එමඟින් සිදුවිය. ඒ අනුව සොරකම, අඬදබර, කෝලාහල, ණය ගනුදෙනු ආරවුල් ආදීය විසඳන ලද්දේ ගම්සභාව විසිනි. 1818 දී ලංකාවට පැමිණ හමුදා සෙබළෙක්ව සේවය කොට 1842 දී මහාමාර්ග කොමසාරිස් ධුරයට පත් මේජර් තෝමස් ස්කිනර්, ඔහු දුටු ගම්සභා ක්‍රමය විස්තර කරනුයේ මෙසේය.

"ස්වදේශීය ආණ්ඩුවෙහි ගන්සයිබ්" නැති නම් "ගම්සහිබ්" යනුවෙන් සරල පිහිටුවීමක් තිබේ. මේවා පළමු කොට ඇතිවූයේ ඉන්දියාවේ ද, නැතිනම් ලංකාවේ ද යනුවෙන් පැවැසීමට මට නොහැකිය. වචනයේ පළමු අක්ෂර වලින් කියැවෙන්නේ සිංහලෙන් ගමට කියැවෙන නමයි. දෙවැන්නෙන් කියැවෙන්නේ හින්දුස්තාන්වලින් "ස්වාමියා නැතිනම් පාලකයා" යන්නට කියන නාමයකි. උතුරු ඉන්දියාවේ, පංජාබයේ පැරණි ආණ්ඩුක්‍රමවල මේවා තිබුණු බවට අපි අසා ඇත්තෙමු.

මේ ගම්සභාවල වැඩිහිටියෝ තුන් දෙනෙක් හෝ පස්දෙනෙක් ඇත්තාහ. මොවුන් විශාල ගමකින් හෝ යාබද කුඩා ගම් කීපයකින් සැකැසෙන පිරිසකි. මොවුන් කෝරාගනු ලබන්නේ ගම්මුන් වන සේම, ඔවුන්ගේ රැස්වීම් ආදී සියලු කටයුතු සිදු කෙරෙන්නේ ගමේ තිබුණු සැලකිය යුතු අතුපතර විහිදුනු විශාල ගසක් යටදී ය.

මේ ගම්සභාවලට ලැබී ඇති බලතල කොයි කාලයකදී සිට පැවකෙන එකක් දැයි මම නොදනිමි. එහෙත්, සුළු සුළු ආරවුල් ඇත ගම්බද දිස්ත්‍රික්කවල අඩු කිරීමට ඒවා සමත් වී තිබේ. දබර සහ ආරවුල් ඒවා සිදුවුණු තැන්වල දී මෙය සිදුකරන නිසා, කලින් අරමුණු කරගත් බොරු දිවුරුම් ආදී දේවලට මෙහි දී ඉඩක් නොලැබේ. සෑම සිදුවීම් දහයකින් නවයක තීරණවලට කෝලාහලයකට මැදි වූ පක්ෂ එකඟ වෙන බව මට කීමට පිළිවන. එහෙත්, මෙවැන්නක දී වුව ඕන පිරිසකගේ තෙනෙකුට කම නඩුව ඉහළ උසාවියකට ඉදිරිපත් කිරීමට ඉඩකඩ තිබේ. එහෙත්, නඩුව විභාග කිරීම පළමුව ගමේ වැඩිහිටියන් ඉදිරියේ සිදුවුණු බැවින් බොහෝ අවස්ථාවල දී කිසිවකුට කලින් සැළසුම් කරන ලද බොරු සාක්ෂි ඉදිරිපත් කිරීමට ඉඩකඩක් නොලැබී යයි.

ගම්සභාවල කටයුතු මෙසේ අමුතු ක්‍රියාකාරිත්වයකින් සිදු වෙද්දී, ඔවුනට නාගරික ශාලා වැනිදෙයක් ඉදිකර දිය යුතු වේ. ඔවුන්ට ඒවායෙහි කම කාර්යයන්ගේ අත්තිවාරම දමා ගැනීමට හැකි වේ. සුදුසුකම්, කෝරා ගැනීම් සහ ක්‍රියාකාරිත්වයන් ලෙහෙසියෙන්ම කළ හැකි වේ.

මේ කරුණු මෙසේ සිදු වෙද්දී, සෑම පළාතකම, දිස්ත්‍රික්කයකම සහ ගමකම සිටින්නා වූ නායකයින්ගේ ප්‍රමාණය කාර්යයන් සහ බලතල, හොඳ පරීක්ෂාවකින් පසුව යළිත් පුනරීක්ෂණය කොට නීතිමය වශයෙන් හඳුනා ගනිමු. ගම්සභාවලට සම්බන්ධව කටයුතු කරන, ආණ්ඩුවේ ඒජන්තවරුන්ට සහ ඔවුනගේ නියෝජිතයන්ට (සාමදාන විනිශ්චයකරුවන්ට) සීමාසහිකව අප රට අධිකරණ කටයුතු භාර දෙමු. ඊට අමතරව ඔවුනට හරක් හොරුනට දඬුවම් පැමිණවීමේ අධිකරණ බලයද පැවැරීම තහවුරු කළ යුතුව ඇත........."

(Fifty years in Ceylon - Major Thomas skinner පරිවර්තනය - පරාක්‍රම ඇස්. විජේවර්ධන)

1856 දී පැනවූ, 1856 අංක 09 දරන කුඹුරු ඉඩම් සහ වාරිමාර්ග ආඥා පනත යටතේ නැවත වරක් මේ ගම් සභා පිහිට වූ අතර, පෙර පැවති නඩු හබ විසඳීම වැනි කාර්යයන් ගෙන් පූර්ණ වශයෙන් ඉවත් ව කෘෂිකර්මාන්තය වර්ධනය කිරීම, වාරිමාර්ග කටයුතු නඩත්තුව සහ අධීක්ෂණය කිරීම එහි අරමුණ විය. පෙර පැවති ගම්සභා මෙන් නොව මෙය නෛතික බලයක් සහිත පළාත් පාලන ඒකකයත් විය. රජයේ දිසාපති හෝ උප දිසාපති එහි මූලසුන දැරූ අතර, අනෙකුත් සාමාජිකයන් පත් කරන ලද්දේ ඔහු විසිනි.

1861 පනවන ලද 1861 අංක 10 දරන මාර්ග කමිටු ආඥා පනත මගින් පළාත්බද මාර්ග කමිටු සහ දිස්ත්‍රික් මාර්ග කමිටු පිහිටුවිණි. පොදු මාර්ග පද්ධතිය නඩත්තු කිරීම එමගින් සිදු විය.

1848 දී ඇති වූ කැරැල්ලට හේතු වූ කරුණු සොයා බලා වාර්තා කිරීමට විශේෂ කමිටුවක් පත් කළ අතර, එහි නිර්දේශයන් පිළිබඳව අවධානය යොමු කළ බ්‍රිතාන්‍ය පාර්ලිමේන්තුව කොළඹ නගරයට මහා නගර සභාවක් ලබා දෙන ලෙස යෝජනාවක් 1850 දී සම්මත කරන්නට යෙදුණි. ඒ සඳහා අණපනත් පිළියෙල කරන ලද්දේ ප්‍රසිද්ධ රාජ නීතිඥයකු වූ රිචඩ් මෝගන් විසිනි. කෙසේ වෙතත් කොළඹ නගරය තුළ නාගරික සභාවක් සංස්ථාපනය කිරීම සඳහා ව්‍යවස්ථාදායක මන්ත්‍රණ සභාව වෙත පනතක් ඉදිරිපත් වන්නේ 1865 දී වන අතර, එය ඉදිරිපත් කරන ලද්දේ ආණ්ඩුකාරවර සර් හර්කියුලස් රොබින්සන් විසිනි.

1865 නොවැම්බර් මස 25 දින කොළඹ මහා නගර සභාවේ නගර සීමාවන් නියම කිරීමේ නිවේදනය නිකුත් කරනු ලැබීය. 1866 ජනවාරි 05 දින කොළඹ මහා නගර සභාව සඳහා ආණ්ඩුකාර වරයා විසින් පත් කරන ලද සභිකයන් ප්‍රකාශයට පත් කළ අතර 1866 ජනවාරි 12 දින සිට 15 දින දක්වා පැවති ඡන්ද විමසීමෙන් සභිකයින් 09 දෙනෙකු පත් කරගන්නා ලදී. ආණ්ඩුකාරවරයා විසින් සභිකයින් 05 දෙනෙකු පත් කරන්නට යෙදුණි. පත්කළ මන්ත්‍රී, රජයේ දිසාපති, සී. පී. ලෙයාඩ් මහතා සභාපතිවරයා ලෙස පත්කරන ලදී. තෝරා ගන්නා ලද සභිකයන්ද සමග පළමු නගර සභා රැස්වීම 1866 ජනවාරි 16 දා පැවැත්වුණි.

මහනුවර මහා නගර සභාව සහ ගාල්ල මහනගර සභාව 1866 වසරේදීම සංස්ථාපනය වූ අතර ඊට අදාළ ආඥා පනත්ද සම්මත කර ගැනුණි.

1871 දී ගෙන එන ලද 1871 අංක 26 දරණ ග්‍රාම ප්‍රජා පිළිබඳ ආඥා පනත සමඟ ගම්සභා නැවත ව්‍යවස්ථාගත කරන ලදී. මුල් කාලීනව ග්‍රාම කමිටු ලෙස හැඳින්වුනු මේවා පසුකාලීනව ගම් කාර්ය සභා ලෙස හඳුන්වන්නට යෙදුණි. අදාළ ප්‍රදේශයේ ගම්වාසීන්ගේ ඉල්ලීම මත ආණ්ඩුකාරවරයා සහ ව්‍යවස්ථාදායකය විසිනි. ග්‍රාම කමිටුවක් පත් කළ අතර, මුලසුන දරන ලද්දේ රජයේ ඒජන්තවරයා විසින් සුළු අපරාධ සහ සුළු ආරවුල් පිළිබඳව අධිකරණය බලයක්ද ග්‍රාම කමිටු සඳහා ලැබුණි. 1884 වර්ෂයේ දී ග්‍රාම කමිටු ආඥා පනතට ගෙන එන ලද සංශෝධනයත් අනුව ග්‍රාම කමිටුවේ සභාපතිවරයා ලෙස ගම්මුලාදෑනියා නිල බලයෙන් පත් විය.

1892 අංක 18 දරන සනීපාරක්ෂක මණ්ඩල ආඥා පනත අනුව කුඩා නාගරික ප්‍රදේශයන්හි පොදු සෞඛ්‍ය සේවා, ජලපවාහනය, මලපවාහනය, පොදු වෙළඳ සැල ආදී මහජන සේවාවන් ඉටු කිරීම උදෙසා සනීපාරක්ෂක මණ්ඩල පිහිටුවන ලදී.

1898 අංක 13 දරන ප්‍රාදේශීය මණ්ඩල ආඥා පනත අනුව විශාල නගර සඳහා ප්‍රාදේශීය සෞඛ්‍ය සහ සනීපාරක්ෂක මණ්ඩල සංස්ථාපනය කෙරුණි. මෙහි මීට පෙර සංස්ථාපනය කරන ලද කාර්යයයන්ද සනීපාරක්ෂක මණ්ඩලයන්හි කාර්යයන් හා සමාන විය. මලපවාහනය, ජලපවාහනය හා සෞඛ්‍ය සේවා සැපයීම ඉංග්‍රීසි බසින් sanitary board ලෙස හැඳින්වූ සනීපාරක්ෂක මණ්ඩලවල ප්‍රධානතම කාර්යයන් විය. වත්මනෙහි වුවද ජනවහරේ යෙදෙන " සැන්ටිබෝඩ් " යන්න sanitary +board = santi + board යන්නෙන් බිඳී සකස් වූවක් විය.

1920 අංක 11 දරන පළාත් පාලන ආඥා පනත අනුව නාගරික දිස්ත්‍රික් සභා ප්‍රාදේශීය දිස්ත්‍රික් සභා සහ පොදු සභා පිහිටුවන්නට යෙදුණි. 1936 අංක 61 දරන නගර සභා ආඥා පනත යටතේ තරමක් විශාල නගර සඳහා නගර සභා පිහිටුවන ලදී. ඒ අනුව ස්ථාපිත කරන ලද නගර සභා සංඛ්‍යාව 27 ක් විය.

1946 අංක 03 දරන සුළු නගර සභා ආඥා පනත යටතේ කුඩා නගර සඳහා සුළු නගර සභා පිහිටු වූ අතර , සනීපාරක්ෂක සභා සහ ප්‍රාදේශීය සෞඛ්‍ය හා සනීපාරක්ෂක සභා අහෝසි කරන ලදී. ඒ අනුව පිහිටුවන ලද සුළු නගර සභා සංඛ්‍යාව 24 ත් වන අතර පොදු මාර්ග , මහජන සෞඛ්‍ය , පොදු පහසුකම් සැපයීම සහ ආදායම් එකතු කිරීම එහි කාර්යයන් අතර විය.

ඉහත සඳහන් සියලුම ආයතනයන්හි සේවක මණ්ඩලය බඳවා ගැනීම ඇතුළු පරිපාලනමය කටයුතු උදෙසා ආයතනගත ක්‍රමවේදයක් පැවති අතර සේවක වැටුප් ප්‍රමාණයන් එකී ආයතනයන් සතු මූල්‍යමය හැකියාව අනුව සකස් වී තිබුණි. ඇතැම් පළාත් පාලන ආයතන මගින් පශ්චාත් විශ්‍රාමික සුභ සාධක ක්‍රමයක්

ලෙස විශ්‍රාම වැටුප් ක්‍රමය ක්‍රියාත්මක වූ අතර ඒ වෙනුවෙන් අතුරු ව්‍යවස්ථා සකස් තර ගැනීම උදෙසා අවැසි ප්‍රතිපාදන අදාළ ආඥා පනත් වලින්ම සළසා තිබුණි. ඒ අනුව එවක පැවති මහා නගර සභා සහ ඇතැම් ගම් සභා විශ්‍රාම වැටුප් අතුරු ව්‍යවස්ථා සතස් කොටගෙන අමාත්‍යවරයාගේ අනුමැතිය යටතේ ආයතනගත විශ්‍රාම වැටුප් ක්‍රමයක් ක්‍රියාත්මක කොට තිබුණි. 1946 අප්‍රේල් 01 දක්වාම මෙම ක්‍රමය ඒ ඒ පළාත් පාලන ආයතන තුළ සම්පූර්ණයෙන්ම ක්‍රියාත්මත වෙමින් පැවතුණි.

## පළාත් පාලන සේවයෙහි ආරම්භය

1945 අංක 43 දරන පළාත් පාලන සේවා ආඥා පනක සම්මක වීමෙන් පසුව 1946 අප්‍රේල් මස 01 දින සිට පළාත් පාලන සේවය ආරම්භ විය. සෑම පළාත් පාලන ආයතනයකම කාර්ය මණ්ඩලය බඳවා ගැනීම හා අනුෂංගික කටයුතු තිසියම් පොදු නෛතික රාමුවක් යටතට ගෙන ඒම මෙමගින් සිදුවිය. මෙම ආඥා පනත තුළින් පළාත් පාලන සේවා කොමිෂන් සභාව ස්ථාපිත වූ අතර එතැන් සිට පළාත් පාලන සේවයේ කාර්ය මණ්ඩල පත් කිරීම, මාරු කිරීම, උසස් තිරීම, විශ්‍රාම ගැන්වීම සහ ඔවුන්ගේ විනය පාලනය එකී කොමිසම මගින් සිදුවිය. අදාළ ආඥා පනතේ පළමුවන උපලේඛනයෙහි සඳහන් කර ඇති තනතුරුවල තිරක මහා නගර සභා, නගර සභා, සුළු නගර සභා සහ ගම්සභාවල නිලධාරින්ගෙන් සහ සේවකයන්ගෙන් පළාත් පාලන සේවය සංස්ථාපනය වූ අතර ඔවුන් වෙනුවෙන් පළාත් පාලන සේවා විශ්‍රාම වැටුප් ක්‍රමයක් හඳුන්වා දුණි. මෙම උපලේඛනයේ සඳහන් නොවුණු සේවකයන් කවදුරටත් ආයතනගක සේවකයන් ලෙස සලකනු ලැබිණ. පළාත් පාලන සේවා ආඥා පනතෙහි 29 වන වගන්තිය අනුව පළාත් පාලන සේවා අර්ථ සාධක අරමුදලක් පිහිටුවීමටත් 26 වගන්තිය අනුව "විශ්‍රාම වැටුප් ක්‍රමය" යනුවෙන් යෝජනා ක්‍රමයක් සහ සේවයේ සාමාජිකයන්ගේ වැන්දඹුවන්ට සහ අනත්දරුවන්ට විශ්‍රාම වැටුප් ලබාගැනීම සඳහා වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදලක් හෝ ක්‍රමයක් පිහිටුවීමටත් විධිවිධාන සළසා තිබුණි. එකී විධිවිධාන අනුව එම අරමුදල් පිහිටුවීම පිළිබඳ ගැසට් නිවේදනය 1952 ජූලි මස 30 අංක 10,429 දරන රජයේ විශේෂ ගැසට් පත්‍රයේ පළ විණ.

කෙසේ වෙතත්.පළාත් පාලන සේවා ව සංස්ථාපනය කිරීම පිළිබඳව මහා නගර සභාවන් තුළ වූයේ දැඩි අකමැත්තකි. සභාව විසින් සිය සේවකයන් පත් කිරීමට තිබූ අයිතිවාසිකම් අහෝසි කරමින් , පළාත් පාලන සේවය පිහිටුවීම ප්‍රතිගාමී ක්‍රියාවක් ලෙස සභාව සලකන ලදී. ඒ පිළිබඳව සිය විරෝධය දැක්වීම පිණිස වූ යෝජනාවක්, 1947 අප්‍රේල් 12, සහ 13 දිනයන්හිදී කරච්චියේ පැවති, ඉන්දියාවේ, පාකිස්තානයේ , බුරුමයේ සහ ලංකාවේ නගරාධිපතිවරුන් සහ උපනගරාධිපතිවරුන්ගේ සම්මේලනයේදී සම්මත කර ගැනුණි.

"ලංකාවේ පළාත් පාලන ආයතන විසින් සේවයේ යොදවා ඇති, පළාත් පාලන ආයතනයේ අරමුදලින් වැටුප් ලබන, සියලු සේවකයින් පළාත් පාලන සේවා කොමිෂන් සභාව යටකට ගෙන , ඔවුන් එම කොමිෂමේ සේවකයින් කරමින් 1945 අංක 43 දරන ලංකාවේ පළාත් පාලන සේවා ආඥා පනතේ සඳහන් විධිවිධානයන් කෙරෙහි ඉන්දියාවේ, පාකිස්තානයේ ,බුරුමයේ සහ ලංකාවේ නගරාධිපතිවරුන් සහ උපනගරාධිපතිවරුන්ගෙන් සමන්විත මෙම සම්මේලනය විරෝධය පළ කරන්නී ය. මෙම ක්‍රියාව වූ කලී, ආපස්සට තැබූ පියවරක් වන අතර, ප්‍රජාතන්ත්‍රවාදයේ වැඩිවීමට අවහිරයක්ද වන හෙයින් ස්වතන්ත්‍ර පාලනය අහෝසි කිරීමක් වන්නේය. තවද, එම ආඥා පනතේ විධිවිධානවලින්, කොළඹ , මහනුවර හා ගාල්ල යන නාගරික සභා නිදහස් කරන මෙන්ද මෙම සම්මේලනය ඉල්ලා සිටින්නී ය."

කෙසේ වෙතත් මෙම යෝජනාව පිළිබඳව රජය සැලකිල්ලක් දැක්වූයේ නැත. විටෝල් බවුස්ටඩ් සහෝදර සමාගම මගින් පවත්වාගෙන ගිය ට්‍රෑම් රථ සේවාව 1944 සැප්තැම්බර් 01 දින කොළඹ මහා නගර සභාව විසින් පවරා ගනු ලැබීය. නගරයේ මාර්ගයන්ගේ වූ තදබදය වැළැක්වීම පිණිස ට්‍රොලි බස් රථ සේවාවක් ආරම්භ කිරීමට මහා නගර සභාව තීරණය කළේය.

## 1969 අංක 18 දරන පළාත් පාලන සේවා පනත

පළාත් පාලන සේවා ආඥා පනත පරිච්ඡින්න කරමින් 1969 අංක 18 දරන පළාත් පාලන සේවා පනත සම්මත විය. මෙහි දී පළාත් පාලන සේවා ආඥා පනත පරිච්ඡින්න කරනු ලැබූවද 1945 අංක 43 දරන පළාත් පාලන පනතේ 29, 31,සිට 44, 47 සිට 52 , 54 සහ 59 සිට 62 දක්වා වගන්ති තවදුරටත් බලාත්මක

වන පරිදි විධිවිධාන සළසා තිබුණි. මේ හේතුව නිසා වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයේ දායකත්වය පිළිබඳ තීරණය පෙර පරිදිම ගනු ලැබිය යුතු විය. 1969. 10. 01 දින සිට රාජ්‍ය සේවයට සමාන්තරව පළාත් පාලන සේවයේ ද වැටුප් ප්‍රතිශෝධන ක්‍රියාත්මක වුණු අතර ඒ අනුව ඒකාබද්ධ වැටුප් ක්‍රමයක් ක්‍රියාත්මක විය. 1969 ඔක්තෝබර් මස 01 දා සිට ආයතනගත සේවකයන්ගේ වැටුප් ද ඒ අනුව වැඩි විය. 1969 අංක 18 දරන පළාත් පාලන සේවා පනතේ උපලේඛනය අනුව , මෙම වැටුප් ප්‍රතිශෝධන සමග පළාත් පාලන සේවයට අයත් නොවූ ආයතනගත සේවකයන් විශාල ප්‍රමාණයකට පළාත් පාලන සේවයට අන්තර්ග්‍රහනය වීමේ අවස්ථාව උදා විය. එහෙත් ඔවුන්ට වැන්දඹු අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදලේ සමාජිකත්වය ලබා දීම කළ නොහැකි විය. පළාත් පාලන සේවා ආඥා පනතෙහි අදාළ වගන්ති තවදුරටත් ක්‍රියාත්මක වීම ඊට .හේතු විය.

## ට්‍රොලි බස්රථ සේවාව පවරා ගැනීම

විටෝල් බවුස්ටඩ් සහෝදර සමාගම මගින් පවත්වාගෙන ගිය ට්‍රෑම් රථ සේවාව 1944 සැප්තැම්බර් 01 දින කොළඹ මහා නගර සභාව විසින් පවරා ගනු ලැබීය. නගරයේ මාර්ගයන්ගේ වූ තදබදය වැළැක්වීම පිණිස ට්‍රොලි බස් රථ සේවාවක් ආරම්භ කිරීමට මහා නගර සභාව ඒ අතර තීරණය කළේ ය. කොළඹ නගරය තුළ ක්‍රියාත්මක වූ ට්‍රොලි බස්රථ සේවාව පවත්වා ගෙන යන ලද්දේ විටෝල් බවුස්ටඩ් සහෝදර සමාගම විසිනි. ඒ අනුව එය 1953.07.22 දින කොළඹ මහා නගර සභාව විසින් පවරා ගන්නා ලදී. එය පාඩු ලබන කර්මාන්තයක් වූ නිසා පසු කාලීනව 1965. 01. 01 දින වසා දැමුණු අතර ඊට අදාළ සේවකයන් 1965. 04. 01 දින තනතුර අහෝසි වීම මත විශ්‍රාම ගැන්වුණි. මොවුන් අතුරින් විටෝල් බවුස්ටඩ් සහෝදර සමාගමේ සිට කොළඹ මහා නගර සභාවේ සේවයට පළාත් පාලන සේවයේ තනතුරු ලාභීන් ලෙස ඇතුළත් කරගන්වන ලද තැනැත්තන්ට වැන්දඹු අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදලේ දායකත්වය පිරිනැමීම ආඥා පනතේ පැවති නියමයන් නිසා කළ නොහැකි විය. එහෙත් ට්‍රොලි බස්රථ සේවාව සඳහා පළාත් පාලන කොමිෂන් සභාව මගින් බඳවා ගනු ලැබූ තැනැත්තන්ට මේ හිමිකම ලබා ගැනීමට අවස්ථාව සැළසිණ.

## 1974 අංක 16 දරන පළාත් පාලන සේවා පනත

පළාත් පාලන සේවයක් සංස්ථාපනය කිරීම සහ විධිමත් කිරීම සඳහා විධිවිධාන සැළැස්වීමත්, පළාත් පාලන සේවා උපදේශක මණ්ඩලයක් සහ විනය මණ්ඩලයක් පිහිටුවීම සහ 1969 අංක 18 දරන පළාත් පාලන සේවා පනක ඉවත් කිරීම ඇතුළු අරමුණු කිහිපයක් මුල් කොටගෙන 1974 අංක 16 දරන පළාත් පාලන සේවා පනක, ජාතික රාජ්‍ය සභාව විසින් සම්මත කරන ලදී. මෙමගින් පළාත් පාලන සේවා දෙපාර්තමේන්තුවක් සහ පළාත් පාලන සේවා අධ්‍යක්ෂ ධූරයක් ඇති කිරීමට ප්‍රතිපාදන සැලසුණි. මෙම පනතේ 15 වගන්තිය යටතේ පළාත් පාලන සේවයේ විශ්‍රාම වැටුප් හිමි සාමාජිකයන් සඳහා විශ්‍රාම වැටුප් සහ පාරිතෝෂික දීමනා ගෙවීම සඳහා පළාත් පාලන සේවා විශ්‍රාම වැටුප් අරමුදල ද , 16 වගන්තිය යටතේ පළාත් පාලන සේවයේ විශ්‍රාම වැටුප් සහිත සමාජිකයන්ගේ වැන්දඹුවන්ට සහ අනත්දරුවන්ට විශ්‍රාම වැටුප් ගෙවීම සඳහා පළාත් පාලන සේවා වැන්දඹු සහ අනත්දරු අරමුදල ද , 17 වගන්තිය යටතේ පළාත් පාලන සේවයේ විශ්‍රාම වැටුප් රහිත සමාජිකයන්ට ප්‍රතිලාභ සැළැස්වීම සඳහා පළාත් පාලන සේවා අර්ථ සාධක අරමුදල ද පිහිටුවා ඇත. එකී අරමුදල් පාලනය කිරීමේ බලය පළාත් පාලන සේවා අධ්‍යක්ෂ වෙත හෝ ඒ සඳහා අමාත්‍යවරයා විසින් පත් කරනු ලබන නිලධාරියෙකු වෙත පැවරුණි.

## 1985 අංක 10 දරන පළාත් පාලන සේවා ( සංශෝධන ) පනත

1985 අංක 10 දරන පළාත් පාලන සේවා ( සංශෝධන ) පනත මගින් , පළාත් පාලන සේවා උපදේශක මණ්ඩලය වෙනුවට පළාත් පාලන සේවා කොමිෂන් සභාවක් පිහිටුවීම ඇතුළු සංශෝධනයන් කිහිපයක් සිදු කරන ලදී. ප්‍රධාන ප්‍රඥප්තියේ ( 1974 අංක 16 දරන පළාත් පාලන සේවා පනත ) " 16 අ" නමින් නව වගන්තියක් ඇති කළ අතර , පළාත් පාලන සේවයේ විශ්‍රාම වැටුප් සහිත සාමාජිකයන්ගේ වැන්දඹු පුරුෂයන්ට සහ අනත්දරුවන්ට විශ්‍රාම වැටුප් ගෙවීම සඳහා පළාත් පාලන සේවා වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදල නමින් අරමුදලක් පිහිටුවීමට නීතියෙන් ඉඩකඩ සළස්වා දෙනු ලැබිණ.

## 1975 පළාත් පාලන සේවා විශ්‍රාම වැටුප් නියෝග

පළාත් පාලන සේවයේ සාමාජිකයන් සඳහා විශ්‍රාම වැටුප් ක්‍රමයක් ක්‍රියාත්මක වීම ආරම්භ වූයේ 1952 අගෝස්තු 01 දා සිටය . මෙම නියෝග අංක 10, 429 දරන 1952. 07. 30 දිනැති අති විශේෂ ගැසට් පත්‍රයෙන් ප්‍රකාශයට පත් කර ඇත. 1974 අංක 16 දරන පළාත් පාලන සේවා පනතේ 23 සහ 24 වගන්තිය යටතේ පළාත් පාලන අමාත්‍යවරයා විසින් මෙම නියෝග පරිච්ඡින්න කරමින් 1975 පළාත් පාලන සේවා විශ්‍රාම වැටුප් නියෝග ප්‍රකාශයට පත් කර ඇත. මෙම නියෝග 1976 ජනවාරි මස 09 වන දින අංක 198 දරන ගැසට් පත්‍රයේ පළ කර ඇති අතර , එකී නියෝගයන් වෙත කරන ලද සංශෝධනයන් 1978 ජුනි 07 දින අංක 320/8 දරන රජයේ අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කෙරුණි.

## 1985 පළාත් පාලන සේවා වැන්දඹු අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදල් නියෝග

1945 පළාත් පාලන සේවා ආඥා පනත යටතේ සාදන ලද 1952 වැන්දඹු අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදල පිළිබඳ ව්‍යවස්ථාවන් වෙනුවට ජාතික රාජ්‍ය සභාවේ 1974 අංක 16 දරන පළාත් පාලන සේවා පනතේ 23 වගන්තිය යටතේ එවකට සිටි පළාත් පාලන , නිවාස සහ ඉදිකිරීම් අමාත්‍යවරයා විසින් සාදන ලද නියෝගයන් 1985 පළාත් පාලන සේවා වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදල් නියෝග යනුවෙන් හැඳින්වුණි.

1986 ජුනි 03 අංක 404/11 දරන අතිවිශේෂ ගැසට් පත්‍රය මගින් මෙම නියෝග ප්‍රකාශයට පත්වූ අතර අදාළ අරමුදල් පාලනය කිරීමේ බලතල පළාත් පාලන සේවා අධ්‍යක්ෂවරයා වෙත පැවරිණි. පළාත් පාලන සේවයේ සේවා කොන්දේසි රාජ්‍ය සේවයේ සේවා කොන්දේසි හා සම කිරීමට 1978. 03. 25 දින අමාත්‍ය මණ්ඩලය විසින් ගනු ලැබූ ප්‍රතිපත්තිමය තීරණයට අනුව සිවිල් වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදලේ දායකයින්ගේ ආබාධිත දරුවන් සඳහා ලබා දෙනු ලැබූ විශේෂ සහනය පළාත් පාලන සේවයේ සාමාජිකයින්ගේ ආබාධිත දරුවන් වෙතද ලබා දීමට හැකි වන පරිදි , අදාළ නීතිමය ප්‍රතිපාදන මෙහිදී ලබා දුණි.

## 1986 පළාත් පාලන වැන්දඹු පුරුෂ හා අනත්දරු අරමුදල් නියෝග

පළාත් පාලන සේවා කොන්දේසි රාජ්‍ය සේවා කොන්දේසි හා සම කිරීමට ගෙන ඇති ප්‍රතිපත්තිමය තිරණයට අනුව යමින් , 1974 අංක 16 දරන පළාත් පාලන සේවයේ සමාජිකාවන් සඳහා ද වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයක් ඇති කිරීමට නිතිමය ප්‍රතිපාදන ඇති කෙරුණි. මේ යටතේ අමාත්‍යවරයා විසින් සාදන ලද නියෝග 1987 ජනවාරි 28 දින අංක 438/08 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ ප්‍රකාශයට පත් කෙරුණි.

## පළාත් පාලන සේවා විශ්‍රාම වැටුප් අරමුදල

පළාත් පාලන ආයතනයන්හි සේවය කොට විශ්‍රාම වැටුප් කොට විශ්‍රාම ලැබූ , විශ්‍රාම වැටුප් හිමිකම් සහිත නිලධාරින් සඳහා විශ්‍රාම වැටුප් ගෙවීම සිදු කරන ලද්දේ මෙම අරමුදල මගිනි. අරමුදල සඳහා රජය විසින් දායකත්වය සැපයීමක් එකල සිදු නොවුණි. පාරිතෝෂික හා විශ්‍රාම වැටුප් ගෙවීම සඳහා දායකත්වය පළාත් පාලන ආයතන වෙතින් සැපයුනු අතර එක් එක් පළාත් පාලන ආයතන විසින් ඒ ඒ සේවකයන්ට ගෙවන ලද පඩිනඩිවල අනුපාතය අනුව අදාළ පළාත් පාලන ආයතන විසින් ගෙවිය යුතු අරමුදල් ප්‍රමාණය තිරණය වුණි. සමහර පළාත් පාලන ආයතන විසින් නියමිත දිනට විධිමත් පරිදි දායක මුදල් ගෙවීම සිදුකළත් සමහර පළාත් පාලන ආයතන විසින් නිසි පරිදි ගෙවීම් නොකරන ලදි. නිසි පරිදි ගෙවීම් කරනු නොලැබූ එවැනි ආයතනයන්හි සේවය කොට විශ්‍රාම ලැබූ සේවකයන් , විශ්‍රාම වැටුප් ගෙවන දිනය එළඹියත් තිසිත් නොලබා බිඳුනු සිතින් පිටව යනු දකින්නට ලැබුණි. මෙම වේදනාබර තත්වය අවසන් කිරීම සඳහා රජයේ ඒකාබද්ධ අරමුදලින් , පළාත් පාලන සේවා විශ්‍රාම වැටුප් ගෙවීම සඳහා අත්තිකාරම් ලබා ගැනිමට පළාත් පාලන සේවා කොමිෂන් සභාව විසින් පියවර ගන්නා ලදී. එතැන් සිට සෑම විශ්‍රාමිකයෙකුටම නියමිත දිනයේදි කමාට හිමි විශ්‍රාම වැටුප ලබා ගැනිමට ඉඩ ප්‍රස්ථාව සැළසුණි. 1982. 01. 02 හෝ එදිනට පසුව විශ්‍රාම ගනු ලබන පළාත් පාලන විශ්‍රාමිකයන් ගේ විශ්‍රාම වැටුප් සහ ඒ සමග ගෙවිය යුතු වෙනත් දීමනා පළාත් පාලන ආයතන වලට සහ ඒකාබද්ධ අරමුදලට වැය බරක් වන සේ බෙදා වෙන් කර තිබුණි. ඒ පහත පරිදිය .

| නිලධාරියා සේවය කළ පළාත් පාලන ආයතන වර්ගය | පළාත් පාලන ආයතනය විසින් ගෙවිය යුතු දායක මුදල් ප්‍රතිශතය | රජය මගින් ගෙවිය යුතු මුදල් ප්‍රතිශතය |
|---|---|---|
| මහා නගර සභාවල පමණක් | 85% | 15% |
| මහා නගර සභා ඒකක හෝ ඊට වැඩි ගණනක් සමග අනෙකුත් වර්ගයේ (නගර සභා, සුළු නගර සභා , ගම් සභා සහ ප්‍රාදේශීය සභා ) පළාත් පාලන ආයතන වල සේවය කළ | 70% | 30% |
| මහා නගර සභා හැර වෙනත් පළාත් පාලන ආයතන වල (නගර සභා, සුළු නගර සභා , ගම්සභා සහ ප්‍රාදේශීය සභා සේවය කළ) | 55% | 45% |

2002 වසරේ සිට පළාත් පාලන සේවා විශ්‍රාම වැටුප් ගෙවීමේ කාර්යය ද සම්පූර්ණයෙන්ම විමධ්‍යගත කළ අතර මධ්‍යම රජයේ අරමුදල් මගින් , ප්‍රාදේශීය ලේකම් කාර්යාල විසින් විශ්‍රාම වැටුප් ගෙවීම සිදු කරනු ලබයි.

## පළාත් පාලන සේවා වැන්දඹු අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදල

පළාත් පාලන සේවා විශ්‍රාම වැටුප් හිමිකම් සහිත සේවකයන්ගේ වැන්දඹුවන්ට සහ අනත්දරුවන්ට ප්‍රතිලාභ ගෙවීම සඳහා මෙම අරමුදල පිහිටුවා ඇත. අදාළ සේවකයාගේ සහ අදාළ ආයතනයේ දායකත්වයෙන් මෙම අරමුදල ගොඩනැගී ඇති අතර දායක මුදලින් 3/4 ප්‍රමාණයක් සභා දායකය ලෙස අය කරනු ලබයි. අරමුදලේ මුදල් භාණ්ඩාගාර බිල්පත්හි ආයෝජනය කර ඇති අතර 2009 වර්ෂ අවසානයේ මුළු ආයෝජනය රු. 84,991,082.00 කි.

## පළාත් පාලන සේවා වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදල

පළාත් පාලන සේවා වැන්දඹු අනත්දරු විශ්‍රාම වැටුප් හිමිතම සහිත සේවිකාවන්ගේ වැන්දඹු පුරුෂයන්ට හා අනත්දරුවන්ට ප්‍රතිලාභ ගෙවීම සඳහා මෙම අරමුදල පිහිටුවා ඇත. අරමුදලේ මුදල් ආයෝජනය කර ඇති අතර 2009 වසර අවසානයේ මුළු ආයෝජනය රු. 319, 266, 402. 17 කි.

## 13 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය

1987 වර්ෂයේදී සිදු කරන ලද 13 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයට අනුව පළාත් සභා සංස්ථාපනය කරන ලදී. පළාත් පාලන සේවා දෙපාර්තමේන්තුවේ කාර්ය භාරය තුළට අයත්ව තිබූ කාර්යමණ්ඩල කළමනාකරණ කටයුතු 1989. 12. 31 දිනෙන් පසුව එක් එක් පළාත් පාලන කොමිෂන් සභාව වෙත පවරනු ලැබුණි. ඉතිරිව තිබූ විශ්‍රාම වැටුප් සහ වැන්දඹු අනත්දරු විශ්‍රාම වැටුප් කාර්යය විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව වෙත පවරනු ලැබුණි.

විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුවට පැවරුණු මෙම නව කාර්ය භාරය ඉටු කිරීම සඳහා පළාත් පාලන විශ්‍රාම වැටුප් ඒකකය යනුවෙන් වෙනම ඒකකයක් 1990. 01. 01 වන දින විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුවෙහි ස්ථාපිත කෙරුණි.

එක් එක් පළාත් සභාව විසින් සම්මත කරගන්නට යෙදුණු පළාත් පාලන අයතන (කාර්යාල මණ්ඩල ) ප්‍රඥප්තිය අනුව , ඒ ඒ පළාත් සභා බල ප්‍රදේශයට අයත්ව තිබූ පළාත් පාලන අයතනවල සේවය කරන ලද පළාත් පාලන සේවයේ සාමාජිකයන්, අදාළ පළාත් සභාව තුළ ක්‍රියාත්මක වන පළාත් රාජ්‍ය සේවාවට අන්තර් ග්‍රහණය කර ගැනීම සඳහා අවශ්‍ය නෛතික විධිවිධාන ඇතිතර ගැනුණි. මෙම නෛතික විධිවිධානයන්ට අනුව පළාත්

පාලන සේවකයන් පළාත් රාජ්‍ය සේවාවට අන්තර්ග්‍රහණය කළ යුතු වූයේ , එතෙක් ඔවුන් පළාත් පාලන සේවයේ අත්කර ගෙන තිබූ අයිතිවාසිකම් සහ වරප්‍රසාදවලට අගතියක් නොවන පරිදි ය.

කෙසේ වෙතත් විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා සංග්‍රහය අදාළ වන්නේ රාජ්‍ය සේවයේ සමාජිකයන් සඳහා පමණක් වන බැවින් පළාත් රාජ්‍ය සේවාවේ සාමාජිකයන් සඳහා එය අදාළ කරගත නොහැකි තත්වයක් ඇති විය. එය මගහරවාලීම පිණිස පළාත් රාජ්‍ය සේවාවේ සමාජිකයන්ටද පළාත් රාජ්‍ය සේවාව සදහා අන්තර්ග්‍රහණය කර ගනු ලැබූවන්ට ද විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා සංග්‍රහය, 1898 වැන්දඹු අනත්දරු ආඥා පනත සහ 1983 අංක 24 දරන වැන්දඹු පුරුෂ අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදල් පනත අදාළ කරවීම පිණිස 1993 අංක 17 දරන පළාත් සභා විශ්‍රාම වැටුප් පනත පාර්ලිමේන්තුවේ සම්මත කරගන්නට යෙදුණි. මෙම පනතේ නියමයන් 1993. 09. 03 දින සිට ක්‍රියාත්මක විණි. මේ අනුව වත්මන් පළාත් පාලන විශ්‍රාම වැටුප් ඒකකයේ ප්‍රධානතම කාර්යය වන්නේ 1993. 09. 03 දිනට පෙර පළාත් පාලන ආයතනයන්හි සේවය කොට විශ්‍රාම ලැබූ තැනැත්තන් සඳහාත්, ඔවුන්ගේ කලත්‍රයන් , අනත්දරුවන් සහ ආබාධිත දරුවන් සඳහා ප්‍රතිලාභ ගෙවීමය.

## පළාත් පාලන සේවා විශ්‍රාම වැටුප් කාර්යයන්

* පළාත් පාලන සේවා විශ්‍රාම වැටුප් නියෝගයන්හි 20 නියෝගය අදාළ කරවමින් රාජ්‍ය සංස්ථාවකට හෝ ව්‍යවස්ථාපිත මණ්ඩලයකට ස්ථිරවම මුදාහරින ලද තැනැත්තන්ගේ විශ්‍රාම වැටුප් සකස් කිරීම , විශ්‍රාම වැටුප් ප්‍රදාන පත්‍ර නිකුත් කිරීම සහ මරණ පාරිතෝෂික ප්‍රදානය
* ප්‍රතිශෝධිත ප්‍රදාන පත්‍ර නිකුත් කිරීම
* කලින් කලට එනු ලබන විශ්‍රාම වැටුප් සංශෝධනයන් සකස් කිරීම
* 1993. 09. 03 දිනට පෙර විශ්‍රාම ලැබූ නිලධාරීන් මියගිය පසු වැන්දඹු අනත්දරු විශ්‍රාම වැටුප් ප්‍රදානය කිරීම.
* 1993. 09. 03 දිනට පෙර විශ්‍රාම ලැබූ නිලධාරිනියන් මියගිය පසු වැන්දඹු පුරුෂ අනත්දරු විශ්‍රාම වැටුප් ප්‍රදානය කිරීම.
* ආබාධිත විශ්‍රාම වැටුප් ප්‍රදානයක් සකස් කිරීම
* පළාත් පාලන සේවයේ පත්වීම් ලද සේවක සේවිකාවන් වැන්දඹු අනත්දරු/වැන්දඹු පුරුෂ අනත්දරු විශ්‍රාම ක්‍රමයේ ලියාපදිංචි කිරීම සහ ලියාපදිංචි කිරීමෙන් පසු අදාළ ගොනු සිවිල් අංශයට මාරු කිරීම.
* පළාත් පාලන සේවා , පළාත් පාලන වැන්දඹු පුරුෂ අනත්දරු අරමුදල් යටතේ ගිණුම් පවත්වාගෙන යාම, බැංකු සැසඳුම් සකස් කිරීම සහ ගිණුම් වාර්තා පිළියෙළ කිරීම.
* අරමුදල් එකතු කිරීම සහ ආයෝජනය කිරීම.

## පළාත් පාලන විශ්‍රාම වැටුප් ක්‍රමයෙහි වර්තමාන තත්වය

1987 වර්ෂයේ සිදුකළ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 13 වන සංශෝධනය, 1993 පළාත් සභා විශ්‍රාම වැටුප් පනත හා 1993.09.03 දිනැති අති විශේෂ ගැසට් නිවේදනය අනුව පළාත් පාලනය වෙනුවෙන් පළාත් රාජ්‍ය සේවාව ස්ථාපිත විය. එබැවින් සිවිල් රාජ්‍ය නිලධාරීන්ට හිමි විශ්‍රාම වැටුප් හා වැන්දඹු අනත්දරු විශ්‍රාම වැටුප් ප්‍රතිලාභ මෙම පළාත් රාජ්‍ය නිලධාරීන්ට ද හිමි වේ. එබැවින් පළාත් පාලන විශ්‍රාම වැටුප් ක්‍රමය අහෝසි කරමින් එය සිවිල් විශ්‍රාම වැටුපට ඒකාබද්ධ කරනු ලැබ ඇත.

# 6
# සන්නද්ධ සේවා (යුධ, ගුවන්, නාවුක) විශ්‍රාම වැටුප

## 6.1 ආරම්භය

- එක්සත් රාජධානියේ යටත් විජිතයක්ව පැවතුන ශ්‍රී ලංකාව 1948.02.04 දින නිදහස ලැබීමෙන් අනතුරුව ඒ වන විට ශ්‍රී ලංකාවේ ස්ථාපනය කර තිබූ රාජකීය යුධ හමුදාව ශ්‍රී ලංකා යුධ හමුදාව වශයෙන් 1949.10.10 දින සිට නගා සිටු වන ලදී. එදින සිටම ශ්‍රී ලංකා යුධ හමුදා සාමාජිකයින් හට විශ්‍රාම වැටුප් හා පාරිතෝෂික දීමනා හිමිකම් ලබා දී ඇත.
- 1949.10.10 දින සිට ක්‍රියාත්මක වූ විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා සංග්‍රහය යටතේ යුද හමුදා නිත්‍ය බල සේනාවට අයත් නිලධාරී, සෙසු නිලයින් සඳහා විශ්‍රාම වැටුප් හිමි වුව ද යුද හමුදා ස්වේච්ඡා බල සේනාවේ නිලධාරි /සෙසු නිලයින්ට සහ කාන්තා නිලධාරිණියන් හට හා සෙබළියන්ට විශ්‍රාම වැටුප් හිමිකම් ලබා දෙන ලද්දේ 1981.09.01 දින සිට වේ.
- දැනට බල පැවැත්වෙන 1981 යුද හමුදා විශ්‍රාම වැටුප් හා පාරිතෝෂික ව්‍යවස්ථා සංග්‍රහය 1981.09.01 දින සිට මේ දක්වා ක්‍රියාත්මක වේ.

### විශ්‍රාම වැටුප් සංග්‍රහයට ඇතුළත් කරන ලද වැදගත් සංශෝධනයන්

- ස්වේච්ඡා බල සේනාවේ පිරිමි නිලධාරී/සෙසු නිලයින් සඳහා විශ්‍රාම වැටුප් හිමිකම් ලබා දීම (අංක 679/10 හා 1991.09.11 දිනැති අති විශේෂ ගැසට් පත්‍රය)
- 1985.01.01 දින සිට විශ්‍රාම වැටුප් ප්‍රතිශත වගුව හඳුන්වාදීම - (අංක 726/11 හා 1992.08.03 දිනැති අති විශේෂ ගැසට් පත්‍රය)
- 1983.09.26 දින සිට නිත්‍ය (පොදු) උප සේවයේ හා ස්වේච්ඡා උප සේවයේ ඉටු කරන ලද සේවය එකතු කර මුල් විශ්‍රාම වැටුප ප්‍රතිශෝධනය කිරීම, විශ්‍රාම වැටුපක් ප්‍රදානය කිරීම (අංක 794/9 හා 1993.11.24 දිනැති අති විශේෂ ගැසට් පත්‍රය)
- නිත්‍ය කාන්තා බලකායේ නිලධාරිණියන්/සෙබළියන් හට අවු. 15 ක් සේවය සම්පූර්ණ කිරීමේ දී විශ්‍රාම වැටුප හිමිකම් ලබා දීම (අංක 951/7 හා 1996.11.26 දිනැති අති විශේෂ ගැසට් පත්‍රය)
- ජාතික සන්නද්ධ මිනිස්බල සංචිතයේ සහ ජාතික සහායක හමුදාව යටතේ පූර්ණ වැටුප් සහිතව කළ සේවය විශ්‍රාම වැටුප් කටයුතු සඳහා ගණන් ගැනීම (අංක 1179/27 හා 2001.04.12 දිනැති අති විශේෂ ගැසට් පත්‍රය)
- ස්වේච්ඡා බල හමුදාවේ නිලධාරිණියන්ට හා කාන්තා සෙබළියන්ට වසර 15ක සේවය සම්පූර්ණ කිරීමෙන් පසු විශ්‍රාම වැටුපක් සඳහා හිමිකම් ලබා දීම (අංක 1512/19 හා 2007.08.31 හා අංක 1554/9 හා 2008.06.20 දිනැති අති විශේෂ ගැසට් පත්‍රය)
- ත්‍රස්තවාදි ක්‍රියා හේතුවෙන් ආබාධිතව සේවයෙන් ඉවත් කළ නිලධාරීන් හා සෙසු නිලයින් (නිත්‍ය/ස්වේච්ඡා) සේවයෙන් ඉවත් කිරීමෙන් පසු වයස අවු. 55 දක්වා වැටුප් හා දීමනා ලබන කාල සීමාව විශ්‍රාම වැටුප් සඳහා ගණනය කර වයස අවුරුදු 55 දී සේවා විශ්‍රාම වැටුපක් ගෙවීම/ප්‍රතිශෝධනය ( අංක 1512/19 හා 2007.08.31 හා අංක 1554/9 හා 2008.06.20 දිනැති අති විශේෂ ගැසට් පත්‍ර)

1981 යුද හමුදා විශ්‍රාම වැටුප් හා පාරිතෝෂික ව්‍යවස්ථා සංග්‍රහය යටතේ හිමිවන දීමනා

1. සේවා විශ්‍රාම වැටුප
2. පරිවර්තික පාරිතෝෂිකය
3. සේවා පාරිතෝෂික දීමනා
4. දුබලතා විශ්‍රාම වැටුප
5. දුබලතා පාරිතෝෂික දීමනා
6. යැපෙන්නන් වෙනුවෙන් ලබන දීමනාව
7. මරණ පාරිතෝෂිකය
8. විශේෂ වන්දි (රා.ප.ව. 22/93 ට අනුව)

## 6.2 සේවා විශ්‍රාම වැටුප

**සේවා විශ්‍රාම වැටුප් සඳහා අවශ්‍ය සේවා සුදුසුකම්**

- නිත්‍ය බලසේනාවේ නිලධාරීන් හට අවු. 20කට නොඅඩු ගණන් ගත හැකි සේවා කාලයක් තිබිය යුතුය.
- නිත්‍ය බලසේනාවේ කාන්තා නිලධාරිණියන් හට සහ සෙබළියන්ට අවු. 15කට නොඅඩු ගණන් ගත හැකි සේවා කාලයක් තිබිය යුතුය.
- ස්වේච්ඡා බලසේනාවේ නිලධාරීන් හට අවු 20කට නොඅඩු සක්‍රිය හමුදා සේවා කාලයක් සම්පූර්ණ කර තිබිය යුතුය
- වෛද්‍ය හේතූන් මත විශ්‍රාම ගන්නා නිත්‍ය බලසේනාවේ නිලධාරීන් හට අවු. 10කට නොඅඩු ගණන් ගත හැකි සේවා කාලයක් තිබිය යුතුය
- නිත්‍ය බලසේනාවේ සෙසු නිලයින් හට අවු. 22කට නොඅඩු ගණන් ගත හැකි සේවා කාලයක් තිබිය යුතුය
- ස්වේච්ඡා බලසේනාවේ සෙසු නිලයින් හට අවු. 22කට නොඅඩු සක්‍රිය හමුදා සේවා කාලයක් සම්පූර්ණ කර තිබිය යුතුය.
- වෛද්‍ය හේතූන් මත විශ්‍රාම ගන්නා නිත්‍ය සෙසු නිලයින් හට අවු. 12කට නොඅඩු ගණන් ගත හැකි සේවා කාලයක් තිබිය යුතුය.
- ස්වේච්ඡා බලසේනාවේ කාන්තා සෙබළියන් හට අවු. 15කට නොඅඩු සක්‍රිය හමුදා සේවා කාලයක් සම්පූර්ණ කර තිබිය යුතුය.

**නිත්‍ය නිලධාරීන් විශ්‍රාම ගත යුතු අවස්ථා**

1. උපරිම වයස් සීමාව සම්පූර්ණ වීමෙන් ( අවුරුදු 55 සම්පූර්ණ වීම )
2. සේවා කාලය සම්පූර්ණ වීමෙන්

උපකරණ පාලන නිලධාරියෙකු හෝ කෙටි කාලීන අධිකාරිලත් නිලධාරියෙකු එම නිලයේ රැඳී සිටිය හැකි සේවා කාලය සම්පූර්ණ වීම හේතුවෙන් විශ්‍රාම ගත යුතුය.

වැන්දඹු අනත්දරු විශ්‍රාම වැටුප්

- 1890 අංක 1 දරන වැන්දඹු අනත්දරු විශ්‍රාම වැටුප් ආඥාපනත - 431 වැනි අධිකාරිය ක්‍රියාත්මක දිනය 1898.06.23
- 1906 අංක 13 දරන ආඥාපනත
- 1981 අංක 44 දරන (සංශෝධන) පනත
- 1998 අංක 57 දරන (සංශෝධන) පනත
- 1998 අංක 64 දරන (සංශෝධන) පනත
- 2010 අංක 08 දරන (සංශෝධන) පනත

වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප්

- 1983 අංක 24 දරන වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප් පනත ක්‍රියාත්මක දිනය 1983. 08.01
- 1985 අංක 19 දරන (සංශෝධන) පනත
- 1997 අංක 16 දරන (සංශෝධන) පනත
- 1998 අංක 56 දරන (සංශෝධන) පනත
- 1998 අංක 65 දරන (සංශෝධන) පනත
- 2001 අංක 02 දරන (සංශෝධන) පනත
- 2010 අංක 09 දරන (සංශෝධන) පනත

සන්නද්ධ හමුදා වැන්දඹු/ වැන්දඹු පුරුෂ අනත්දරු විශ්‍රාම වැටුප්

- 1970 අංක 18 දරන වැන්දඹු හා අනත්දරු (සන්නද්ධ හමුදා) පනත හා ඒ යටතේ පනවන ලද 1970.11.28 දිනැති නියෝග මාලාව ක්‍රියාත්මක දිනය 1968.10.11
- 1985 අංක 18 දරන (සංශෝධන) පනත
- 1998 අංක 60 දරන වැන්දඹු පුරුෂ හා අනත්දරු (සන්නද්ධ හමුදා) පනත ක්‍රියාත්මක දිනය- 1983.08.01
- 2009 අංක 29 දරන (සංශෝධන) පනත

පළාත් පාලන විශ්‍රාම වැටුප්

- 1952 ජූලි 30 වන දින අංක 10429 දරන අති විශෙෂ ගැසට් නිවේදනයෙන් ප්‍රකාශිත පළාත් පාලන සේවා වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදල් පනත
- 1974 අංක 16 දරන (සංශෝධිත) පනත
- 1985 අංක 10 දරන (සංශෝධිත) පනත
- 1985 අංක 10 දරන පළාත් පාලන සේවා වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදල් පනත

පුද්ගලික පාසල් හා පිරිවෙන් ගුරුවරුන්

- 1953 අංක 44 දරන පාසල් ගුරුවරුන්ගේ විශ්‍රාම වැටුප් පනත
- 2008 අංක 32 දරන පාසල් ගුරුවරුන්ගේ විශ්‍රාම වැටුප් (සංශෝධන) පනත



13 - H39510

පනත්වල අරමුණු

විශ්‍රාම වැටුප් හිමි තනතුරු දරන රාජ්‍ය නිලධාරීන් හෝ නිලධාරිණියන් මිය යාමෙන් පසු ඔහුගේ හෝ ඇයගේ කලත්‍රයාට, අනත්දරුවන්ට හා ආබාධිත අනත්දරුවන්ට මාසික විශ්‍රාම වැටුප් ගෙවීමට ප්‍රතිපාදන සලසා ඇත.

ඒ අනුව මෙම ක්‍රමයටතේ ප්‍රතිලාභ හිමිවනුයේ මෙහි සාමාජිකත්වය ලබා ඇති නිලධාරීන්ට හෝ නිලධාරිණියන්ට නොව ඔහුගේ හෝ ඇයගේ පහත සඳහන් නිත්‍යානුකූල තැනැත්තන්ටය.

- වැන්දඹුව
- වැන්දඹු පුරුෂයා
- අනත්දරුවන්
- ආබාධිත අනත්දරුවන්

**හිමිකම**

දායකයා මිය යාමෙන් පසු වැන්දඹුව හෝ වැන්දඹු පුරුෂයා (යළි විවාහ වන තෙක් ප්‍රතිලාභ ලැබිය හැක)

- වයස අවුරුදු 21 ට අඩු පිරිමි දරුවන්
- වයස අවුරුදු 21 ට අඩු අවිවාහක ගැහැණු දරුවන්
- වයස අවුරුදු 21 සිට 26 දක්වා රැකියා විරහිත පිරිමි දරුවන්
- වයස අවුරුදු 21 සිට 26 දක්වා රැකියා විරහිත අවිවාහක ගැහැණු දරුවන්
- වෛද්‍ය මණ්ඩල අනුමැතිය ලත් වයස අවුරුදු 26 ඉක්මවන ලද ශාරීරික හෝ මානසික ආබාධිත අනත්දරුවන්

2010 සංශෝධිත පනත් මගින් අනත්දරුවන් යනු වයස අවුරුදු 26 ට අඩු රැකියා විරහිත දරුවන් ලෙස අර්ථකතනය කොට ඇත. ඒ තුළින් අනත්දරුවන් වර්ගීකරණයේ තිබූ ස්ත්‍රී පුරුෂ සමාජ භාවය පිළිබඳ ගැටළුව ඉවත් කරනු ලැබීය. එමෙන්ම මෙම පනත තුළින් යළි විවාහ වන වැන්දඹුව / වැන්දඹු පුරුෂයාටද විශ්‍රාම වැටුපෙන් අඩක් එනම් 50% ක් යළි ලබා ගැනීමේ ඉඩ ප්‍රස්ථාව ඇති කොට තිබේ.

මෙම විශ්‍රාම වැටුප් ක්‍රමයට කුමන ප්‍රමාණයක දායක මුදල් ගෙවා තිබියදී වුවද දායකයා මියගිය දින සිට වැන්දඹුවට/ වැන්දඹු පුරුෂයාට අඩු නොකළ මාසික විශ්‍රාම වැටුප ලබා ගැනීමට හිමිකම ඇත. එය දායකයාගේ අවසාන වැටුපෙන් 50% කට වඩා අඩු නොවේ. සේවයේ යෙදී සිටියදී මියයන විට අවසන් වැටුපෙන් 85% ක විශ්‍රාම වැටුපක් ගෙවනු ලැබේ.

## 7.2 ලියාපදිංචිය හා ඊට අදාල සුදුසුකම්

මූලික සුදුසුකම ස්ථිර විශ්‍රාම වැටුප් සහිත පත්වීමක් ලැබීමයි. ඒ අනුව,

- ස්ථිර, විශ්‍රාම වැටුප් සහිත පත්වීම
- දායකත්ව විශ්‍රාම වැටුප් සහිත පත්වීම (2003- 01- 01 සිට 2006- 12- 31 දක්වා)
- රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදල් සහිත පත්වීම්ධාරීන් පසුව ස්ථිර විශ්‍රාම වැටුප් සහිත පත්වීම් බවට පරිවර්තනය වීම.

උදා: පොලිස් උප සේවාව ස්ථිර විශ්‍රාම වැටුප් සහිත සේවය බවට පරිවර්තනය වීම, වැන්දඹු/ වැන්දඹු පුරුෂ හා අනත්දරු ක්‍රමයෙහි ලියාපදිංචිවීමට සුදුසුකම වේ.

### සිවිල් හා අධිකරණ නිලධාරීන්

විශ්‍රාම වැටුප් සහිත තනතුරකට පත්වන නිලධාරියා එම තනතුරට පත්වී මාස 03ක් ඇතුලත වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමය යටතේ ලියාපදිංචි වී අංකයක් ලබාගත යුතුය. අංකය ලබාගැනීමට පොදු 86 (මූලික ප්‍රකාශනය) සම්පූර්ණ කර තමා සේවය කරන දෙපාර්තමේන්තුව/ ආයතනය මඟින් ඉදිරිපත් කළ යුතුය.

### සිවිල් හා අධිකරණ නිලධාරිණියන්

1983 අගෝස්තු 01 දිනට පසු විශ්‍රාම වැටුප් හිමි තනතුරකට පත්වන රාජ්‍ය නිලධාරිණියන් අනිවාර්යයෙන්ම වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමය යටතේ ලියාපදිංචි විය යුතුය. 1983- 08- 01 දිනට පෙර විශ්‍රාම වැටුප් සහිත තනතුරක් දරන ලද රාජ්‍ය නිලධාරිණියන්ටද කැමති නම් මනාපය ප්‍රකාශ කොට මෙම ක්‍රමය යටතේ සාමාජිකත්වය ලබා ගැනීමට, අංකයක් ලබා ගැනීමට 86 අ (මූලික ප්‍රකාශනය) සම්පූර්ණ කර දෙපාර්තමේන්තුව මඟින් ඉදිරිපත් කළ යුතුය. පනත් 3(6) වගන්ති බලන්න. (මෙම අවස්ථාව 2012.12.31 දිනට අවසන් වේ.)

- යෝජිත e - විශ්‍රාම වැටුප් ව්‍යාපෘතිය යටතෙහි මෙම නිලධාරීන් හා නිලධාරිනියන් සඳහා PD 1 නව ආකෘති පත්‍ර හඳුන්වා දී තිබේ.
- 1983.08.01 දිනට පෙර විශ්‍රාම ලබා ඇති රාජ්‍ය නිලධාරිණියන්ට මෙම ක්‍රමයට මනාපය පළ කිරීමේ නීතිමය ප්‍රතිපාදන නැත.
- මනාපය ප්‍රකාශ කිරීමේදී දායිකාව (රාජ්‍ය නිලධාරිණිය) මියගොස් ඇත්නම්, ඇයගේ ස්වාමියා මනාපය පළ කළා සේ සලකා කටයුතු කළ හැක.

### ත්‍රිවිධ හමුදා සාමාජිකයන්

1968.09.30 දිනට හෝ ඊට පසු යුධ, ගුවන් හා නාවික හමුදාවේ නිත්‍ය සාමාජිකයන් අනිවාර්යයෙන්ම සාමාජිකත්වය ලබා ගත යුතුය.1968.09.30 දිනට පෙර නිත්‍ය හමුදා සාමාජිකයන් හා ඊට පසුවද සේවයේ සිටින ලද ත්‍රිවිධ හමුදා සාමාජිකයන්ට ඉඩදී ඇති කාලය තුළ සිය මනාපය පළකර සාමාජිකත්වය ලබාගත හැක. (මෙම කාලසීමාව 2006.06.30 දිනෙන් අවසන් විය)

සැ. යු.

- 1968.09.30 දිනට පෙර විශ්‍රාම ලබා ඇති නිත්‍ය හමුදා සාමාජිකයන්ට මෙම ක්‍රමයට දායකවීමට අවකාශ නොමැත.

### ත්‍රිවිධ හමුදා සාමාජිකාවන්

1983- 08- 01 දින හෝ ඊට පසුව පත්වීම් ලැබූ හෝ ලබන සන්නද්ධ හමුදාවේ නිත්‍ය බලකායේ සාමාජිකාවන් අනිවාර්යයෙන්ම දායකත්වය ලබාගත යුතුය. 1983- 08- 01 දින හෝ ඊට පෙර සන්නද්ධ හමුදාවල නිත්‍ය හමුදාවේ පත්වීම් ලැබ එදිනට පසුවද නොකඩවා සාමාජිකාවකව සිටින තැනැත්තියනටද ඉඩ දී ඇති කාලය තුළ සිය මනාපය පළකර සාමාජිකත්වය ලබාගත හැකි විය.

සැ. යු.

- 1983- 08- 01 දිනට පෙර විශ්‍රාම ලබා ඇති සාමාජිකාවන්ට මෙම ක්‍රමයට මනාපය පළ කිරීමට නීතිමය ප්‍රතිපාදන නැත.

වැදගත්:-

- ත්‍රිවිධ හමුදා සාමාජිකයන් හා සාමාජිකාවන් ලියාපදිංචි වීම සඳහා අයදුම්පත් විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුවට එවීම අවශ්‍ය නොවේ. අදාල ලියාපදිංචිය ඒ ඒ හමුදාවල විශ්‍රාම වැටුප් අංශය

විසින් සිදු කරනු ලැබේ. කෙසේ වෙතත් යෝජිත ඉ විශ්‍රාම වැටුප් ව්‍යාපෘතිය තුළින් යළිත් සියලු හමුදා නිලධාරීන්, නිලධාරිනියන් ලියාපදිංචියට පියවර ගනු ලැබේ.

**පළාත් පාලන සේවා නිලධාරීන් හා නිලධාරිණියන්**

ඉහත සඳහන් පනත් අනුව පළාත් පාලන විශ්‍රාම වැටුප්, වැන්දඹු අනත්දරු විශ්‍රාම වැටුප හා වැන්දඹු පුරුෂ විශ්‍රාම වැටුප් සම්පූර්ණයෙන් අරමුදල් ගිණුම් ක්‍රමය යටතේ ක්‍රියාත්මක වේ.

පළාත් පාලන විශ්‍රාම වැටුප් සඳහා ගෙවීමට අවශ්‍ය මුදල් පළාත් පාලන ආයතනවලින් මහ නගර සභා 85%, නගර සභා 70% හා ප්‍රාදේශීය සභා 55% ප්‍රතිශතයක් අරමුදලට ගෙවිය යුතුය. ඉතිරිය රජය මඟින් වැය කරනු ලැබේ.

වැන්දඹු විශ්‍රාම හා වැන්දඹු පුරුෂ විශ්‍රාම වැටුප් දායක මුදල් සඳහා රජයේ ප්‍රතිපත්ති මත අදාළ ප්‍රතිශතය දායකයා විසින් ගෙවන අතර, එම ප්‍රතිශතයන් 75% ක ප්‍රමාණයක් අදාළ පළාත් පාලන ආයතන විසින් අරමුදලට බැර කළ යුතුය.

1. 1993 අංක 17 දරන පළාත් සභා විශ්‍රාම වැටුප් පනත අනුව 1993- 09- 03 දිනට සේවයේ යෙදී සිටින පළාත් පාලන ආයතනවල ස්ථිර සේවකයින්, නිලධාරීන් රාජ්‍ය සේවයට අන්තර්ග්‍රහණය කරන ලදී.
2. එදිනට පෙර විශ්‍රාම ගිය පළාත් පාලන නිලධාරීන් හා සේවකයින් සඳහා මාසික විශ්‍රාම වැටුප් ගෙවීම එම දායකයින් මියගිය පසු ඔවුන්ගේ කලත්‍රයාට විශ්‍රාම වැටුප් ගෙවීම පළාත් පාලන විශ්‍රාම වැටුප් අරමුදල මඟින් ගෙවනු ලැබේ.
3. 1993- 09- 03 දිනට පසු විශ්‍රාම යන සියලුම පළාත් පාලන ආයතනවල දායකයින්ගේ විශ්‍රාම වැටුප් ගෙවීම සහ ඔවුන් මියගිය පසු කලත්‍රයාට වැන්දඹු/ වැන්දඹු පුරුෂ හා අනත්දරු, ආබාධිත විශ්‍රාම වැටුප් ගෙවීම් කරනුයේ සිවිල් වැන්දඹු අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමය යටතේය.
4. ඒ අනුව 1993- 09- 03 සේවයේ සිටින සියලුම පළාත් පාලන සේවකයින් පළමුව පළාත් පාලන වැන්දඹු/ වැන්දඹු පුරුෂ විශ්‍රාම වැටුප් ක්‍රමයේ දායකත්වය ලබා ගෙන සිවිල් වැන්දඹු අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට මාරු විය යුතුය.

**අරමුණු :-**

ඉහත සඳහන් කරුණු අනුව 1993- 09- 03 දිනට පෙර විශ්‍රාම ගිය සියලුම පළාත් පාලන ආයතනවල දායක දායිකාවන්ට විශ්‍රාම වැටුප් ගෙවීමට ඔවුන් මියයෑමෙන් පසු ඔහුගේ/ඇයගේ කලත්‍රයාට වැන්දඹු/ වැන්දඹු පුරුෂ හා අනත්දරු හා අබාධිත විශ්‍රාම වැටුප් ගෙවීම පළාත් පාලන විශ්‍රාම වැටුප් ව්‍යාපෘතියේ අරමුණ වේ.

මෙම ව්‍යාපෘතිය අරමුදල් ගිණුම් අනුව වෙනම පාලනය කළද විශ්‍රාම වැටුප් ගෙවීම හා වැන්දඹු අනත්දරු විශ්‍රාම වැටුප් ගෙවීමේදී සියලුම නීති රීති විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා සංග්‍රහය හා වැන්දඹු අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමය හා සමානය. වර්තමානයේදී පළාත් පාලන වැන්දඹු අනත්දරු විශ්‍රාම වැටුප් ගෙවීම සිවිල් අංශයට මාරු කිරීමට ප්‍රතිපත්තිමය තීරණ ගෙන තිබේ.

**පළාත් පාලන වැන්දඹු අනත්දරු විශ්‍රාම වැටුප් සමාජිකත්වය ලබා ගැනීම**

1. නිලධාරීන්

1952 අගෝස්තු 01 වන දිනෙන් පසු පළාත් පාලන සේවයේ විශ්‍රාම වැටුප් හිමි තනතුරකට පත්වන නිලධාරීන් අනිවාර්යයෙන්ම සිය පත්වීම් දිනයේ සිට පළාත් පාලන සේවා වැන්දඹු හා අනත්දරු

විශ්‍රාම වැටුප් අරමුදලට දායක විය යුතුය. 1952 අගෝස්තු 01 වන දිනට පෙර සිට පළාත් පාලන සේවයේ විශ්‍රාම වැටුප් හිමි තනතුරක් දරමින් සිටි නිලධාරීන්ට මේ මනාපය පරිදි මෙම අරමුදලේ සාමාජිකත්වය ලබා ගත හැකි විය.

2. නිලධාරිනියන්

1985 මාර්තු 27 වන දිනෙන් පසු පළාත් පාලන සේවයේ විශ්‍රාම වැටුප් හිමි තනතුරකට පත්වන නිලධාරිණියන් අනිවාර්යයෙන්ම සිය පත්වීම් දිනයේ සිට පළාත් පාලන සේවා වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක විය යුතුය. ඉන් පෙර සිට පළාත් පාලන සේවයේ විශ්‍රාම වැටුප් හිමි තනතුරක් දරමින් සිටි නිලධාරිණියන්ට තම මනාපය පරිදි මෙම අරමුදලේ දායකත්වය පිරිනමන ලදි.

3. පත්වීම් දිනයේ සිට හෝ මනාපය දුන් දිනයේ සිට තුන් මාසයක් ඉකුත්වීමට පෙර එල්.පී.එස්.8 ආකෘතිය සම්පූර්ණ කර අදාළ පළාත් පාලන ආයතනය මඟින් පළාත් පාලන සේවා විශ්‍රාම වැටුප් ඒකකයට ඉදිරිපත් කිරීමෙන් ඉහත අරමුදල් සඳහා ලියාපදිංචි වී අංකයක් ලබා ගත හැකිය.වයස අවුරුදු 55 සම්පූර්ණ වූ කිසිඳු නිලධාරියෙකුට/ නිලධාරිණියකට ඉහත සාමාජිකත්වය හිමි නොවේ.

ඉහත කී අරමුදල්වල ලියාපදිංචි වූ දායකයන්/ දායිකාවන් විසින් තමාගේ හා තම පවුලේ සාමාජිකයන් සම්බන්ධයෙන් ඇතිවන වෙනස්කම් එදින සිට තුන් මසක් ඇතුළත වාර්තාකළ යුතුය. තම විවාහය, දික්කසාදය හෝ කලත්‍රයා මියයාම පිළිබඳව එල්. ජී. එස්. 9 ආකෘතිය මඟින්ද, දරුවන්ගේ උපත්, විවාහ හෝ මියයාම් එල්. ජී. එස්. 10 ආකෘතිය මඟින්ද දැනුම් දිය යුතුය. පළාත් පාලන විශ්‍රාම වැටුප් වැන්දඹු/ වැන්දඹු පුරුෂ/ අනත්දරුවන් හා ආබාධිත දරුවන්ට ගෙවීමට සිවිල් වැන්දඹු විශ්‍රාම වැටුප් ක්‍රමය යටතේ නීතිමය තත්ත්වය එලෙසම බලපානු ලැබේ.

### පෞද්ගලික පාසල් හා පිරිවෙන් ගුරුවරුන්

සම්පූර්ණ වශයෙන් හෝ අර්ධ වශයෙන් රජයේ අරමුදලින් නඩත්තු වන පාසල් හා පිරිවෙන්වල පිරිමි ගුරුවරුන් සඳහා අදාළ ඩබ්.TWP 1 ආකෘතිපත්‍රය මඟින් ලියාපදිංචිය ඉල්ලුම් කළද වර්තමානයේදී e - විශ්‍රාම වැටුප් ව්‍යාපෘතිය යටතෙහි ආකෘතිය මගින් ඉල්ලුම් කළ හැක. වර්තමානයේදී පෞද්ගලික පාසල්වල ගුරුවරියන් සඳහා ද වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප් හිමිකම ලබාදීමට නීතිමය ප්‍රතිපාදන 2008 අංක දරන පනත මගින් හිමිකර දී තිබේ.

## 7.3 ලියාපදිංචි වීම සඳහා ඉදිරිපත් කළයුතු ලියවිලි

### සිවිල් හා අධිකරණ නිලධාරීන්

A. පොදු 86 අයදුම්පත හෝ PD 1 අයදුම්පත

B. පත්වීම් ලිපියේ සහතික කළ පිටපත

C. විවාහ සහතිකය

D. පෙර විවාහ වී නම් මරණ සහතිකය හෝ දික්කසාද සහතිකය

E. භාර්යාවගේ/ දරුවන්ගේ උප්පැන්න සහතික පිටපත්

F. නිලධාරියාගේ/ භාර්යාවගේ හැඳුනුම්පතේ ඡායා පිටපත

G. නමේ වෙනසක් වෙතොත් එම වෙනසට හේතු (දිවුරුම් සහතිකය)
(වැඩි දුරටත් විශ්‍රාම වැටුප් 1/2007 (සංශෝධන) චක්‍රලේඛය බලන්න)

ලියාපදිංචියට කල්ගත වී ඇත්නම් වැන්දඹු අනත්දරු විශ්‍රාම වැටුප් අංකයක් ලබා ගෙන නොමැති බවටත්, දායක මුදල් නිසි පරිදි අය කෙරෙන බවටත් ආයතන ප්‍රධානියා සහතික කළ යුතුය. ඉහත ලේඛන දෙපාර්තමේන්තු/ ආයතන ප්‍රධානියා මඟින් විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුවෙහි වැන්දඹු අනත්දරු විශ්‍රාම වැටුප් අංශයට ඉදිරිපත් කළ යුතුය.

**සිවිල් හා අධිකරණ නිලධාරිණියන්**

A. පොදු 86 අ අයදුම්පත හෝ PD 1 අයදුම්පත

B. ඉහත 7.1 හි ලියවිලි

මෙම ලේඛන ඉහත සඳහන් පරිදි වැන්දඹු අනත්දරු විශ්‍රාම වැටුප් අංශයට යොමු කළ යුතුය.

**පළාත් පාලන නිලධාරීන්/ නිලධාරිණියන් (පෙර විස්තර කර ඇත)**
**පුද්ගලික පාසල් හා පිරිවෙන් ගුරුවරුන්/ගුරුවරියන්**

- අයදුම්පත ( PD ආකෘති පත්‍රය)
- පත්වීම් ලිපියේ සහතික කළ පිටපත
- දායක මුදල් මුල් පත්වීම් දින සිට අය කරන බවට සහතිකය
- විවාහ සහතිකය
- පෙර විවාහ වී නම් මරණ සහතිකය හෝ දික්කසාද සහතිකය
- භික්ෂූන් වහන්සේ නමක් නම් උප්පැන්න සහතිකය සමඟ සාමණේර හෝ උපසම්පදා සහතික

කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ මඟින් වැන්දඹු අනත්දරු විශ්‍රාම වැටුප් අංශය වෙත එවිය යුතුය.

**ත්‍රිවිධ හමුදා සාමාජිකයන් හා සාමාජිකාවන්**

| | | |
|---|---|---|
| යුධ හමුදාව | - | වැටුප් හා ලේඛන අධ්‍යක්ෂ මණ්ඩලය.<br>යුධ හමුදා ජනපදය, පනාගොඩ. |
| නාවික හමුදාව | - | වැටුප් හා විශ්‍රාම වැටුප් අංශය.<br>ශ්‍රී ලංකා නාවික හමුදාව, වැලිසර. |
| ගුවන් හමුදාව | - | ගුවන් හමුදා මූලස්ථානය.<br>කොළඹ 02. |

වෙත අයදුම් කළ යුතුය. වර්තමානයේ හමුදා සමාජිකයන් මිය යාමෙන් පසු සන්නද්ධ හමුදා ඒ ඒ විශ්‍රාම වැටුප් අංශ ලිපිගොනු සකසා ප්‍රාදේශීය ලේකම් වෙත යොමු කරනු ලැබේ. නමුත් e විශ්‍රාම වැටුප් යටතේ සියලු හමුදා සමාජිකයන් යළි ලියාපදිංචියට පියවර ගනු ලැබේ.

සැ. යු.

1- පත්වීම ලබා මාස 03 ක් ඇතුළත සාමාජිකත්වය ලබාගත යුතුය.
2- ප්‍රමාද වී ඉදිරිපත් කරන අයදුම්පත් සමඟ ප්‍රමාදයට හේතු ඉදිරිපත් කළ යුතුය.
3- නම්වල වෙනස්වීම් සඳහා දිවුරුම් සහතික
4- නිත්‍ය හමුදා සාමාජිකයන්ගේ වැන්දඹු අනත්දරු අංකය හමුදා සාමාජිකයාගේ සේවා අංකය වේ.

## 7.4 ලිපිගොනු යාවත්කාලීන කිරීම (සිවිල් හා අධිකරණ නිලධාරීන් සඳහා)

| සිදුවීම | ඉදිරිපත් කළ යුතු ලියවිලි | ඉදිරිපත් කළ යුතු ආකාරය |
|---|---|---|
| විවාහය | පොදු 224- නිලධාරීන් සඳහා<br>224 අ- නිලධාරිනියන් සඳහා<br>සමඟ විවාහ සහතිකය | දෙපාර්තමේන්තු ප්‍රධානියා මඟින් විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ ජනරාල්, වැන්දඹු අනත්දරු අංශය වෙත |
| කලත්‍රයාගේ මරණය<br>දික්කසාදවීම<br>දරු උපත<br>දරුවාගේ විවාහය | පොදු 87- නිලධාරීන් සඳහා<br>පොදු 87 අ - නිලධාරිණියන් සඳහා<br>සමඟ අදාළ සහතික | එම |
| විශ්‍රාම යාමකදී<br>සේවයේ යෙදී<br>සිටියදී මියයාමකදී | පොදු 55 වි. වැ. අයදුම්පත<br>චර්යා සටහන්<br>මුදල් රෙගුලාසි 1729 වාර්තාව<br>විශ්‍රාම වැටුප් ප්‍රදානපත්‍රයේ පිටපතක් | එම |
| සේවයෙන් පහ කිරීම හෝ සේවය අතහැර යාමකදී | අදාල විනය නියෝගය<br>චර්යා සටහන්<br>මුදල් රෙගුලාසි<br>1729 වාර්තාව | එම |

- අදාළ ආකෘතිපත්‍රවල නිලධාරියා වැන්දඹු අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයේ ලියාපදිංචි වී ඇති අංකය සටහන් කර තිබීම අත්‍යවශ්‍ය වේ.

### වැන්දඹු අනත්දරු විශ්‍රාම වැටුප් ගෙවීමේදී සම්පූර්ණ විය යුතු සුදුසුකම්

- දායකයා/ දායිකාව විශ්‍රාම වැටුප් හිමි තනතුරක් දැරිය යුතුවීම
- දායක මුදල් ගෙවා අවසන්වීමට පෙර විවාහ වී සිටිය යුතුවීම
- දායකයා / දායිකාව මියයෑම හෝ අතුරුදහන්වීමෙන් පසුව වැන්දඹු විශ්‍රාම වැටුප් ගෙවීම සම්බන්ධ කටයුතු කළ යුතුවීම

### වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් ගෙවීම සඳහා අවශ්‍ය ලිපිලේඛන සම්පූර්ණ කර ගැනීම

විශ්‍රාම වැටුප් ගණන් බැලීමට පෙර අදාළ විශ්‍රාම වැටුප් වර්ගය අනුව ලිපි ලේඛන සම්පූර්ණ කර ගත යුතුය. එම තොරතුරු සපයා ගැනීමේදී සම්බන්ධිත පාර්ශවයන් ප්‍රධාන කොටස් තුනකට බෙදා දැක්විය හැක.

ප්‍රතිලාභ භුක්ති විඳින පාර්ශවය විසින් සැපයිය යුතු වන ලිපිලේඛන එනම් වැන්දඹු, වැන්දඹු පුරුෂ, අනත්දරුවන් හෝ භාරකරුවන් විසින් සැපයිය යුතු වාර්තා හා ලේඛනයි.

උදා : විවාහ සහතිකය, මරණ සහතිකය, දික්කසාද සහතිකය ආදී වශයෙනි.

දායකයා/ දායිකාව සේවය කළ දෙපාර්තමේන්තුවෙන්/ අමාත්‍යාංශයෙන් සැපයිය යුතු ලිපිලේඛන දායකයා සේවයේ සිටියදී මියගිය අයෙකු නම් පහත සඳහන් වාර්තා ලබාගත යුතුයි.

- විශ්‍රාම වැටුප් අයදුම්පත
- චර්යා සටහන් (දෛනික සේවයට හා මාසික සේවයට)
- මුදල් රෙගුලාසි 1729 වාර්තාව
- අඩ වැටුප් හා වැටුප් රහිත නිවාඩු විස්තර
- රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදල් ප්‍රදානයක් ගෙවා ඇත්නම් ඒ සම්බන්ධ විස්තර

අවශ්‍ය විට වෙනත් පාර්ශවයන්ගෙන් තැඳවන ලිපි ලේඛන

උදා:-

- ප්‍රාදේශීය ලේකම් වෙතින් වාර්තාවක්.
- පළාතේ ප්‍රභූන් වෙතින් පරිචය හා ප්‍රසිද්ධිය මත විවාහයක් පැවති බව සනාථ කිරීමට කැඳවන වාර්තා.

- වෛද්‍ය වාර්තා - ආබාධිත විශ්‍රාම වැටුප් ගෙවීම සම්බන්ධ තීරණයක් ගැනීම ආදී වශයෙනි.

## 7.5 ප්‍රතිලාභ ලබා ගැනීම ඉල්ලුම් කිරීම (සාරාංශය)

| ***ප්‍රතිලාභය*** | ***ඉදිරිපත් කළ යුතු ලියකියවිලි*** | ***ඉදිරිපත් කළ යුතු ස්ථානය*** |
|---|---|---|
| වැන්දඹු/ වැන්දඹු පුරුෂ විශ්‍රාම වැටුපක් තලත්‍රයා විසින් ඉල්ලීම | වැන්දඹු අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයේ ලියාපදිංචි අංකය සඳහන් වැන්දඹු අනත්දරු විශ්‍රාම වැටුප් 15 අයදුම්පත, මරණ සහතිකය | පදිංචි ප්‍රදේශයේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලය. |
| අනත්දරු විශ්‍රාම වැටුපක් අවුරුදු 21 දක්වා | දෙමව්පියන්ගේ මරණ සහතික දරුවන්ගේ උප්පැන්න සහතික භාරකරු දිවුරුම් ප්‍රකාශය. (අනත් 1) | ප්‍රාදේශීය ලේකම් කාර්යාලය |
| අනත්දරු විශ්‍රාම වැටුපක් අවුරුදු 21 ට වැඩි 26 දක්වා | අනත් 5/1 හෝ අනත් 5/2 අයදුම්පත්‍රය<br>අනත් 6- ප්‍රාදේශීය ලේකම්/ ග්‍රාම නිලධාරී නිර්දේශය<br>අනත් 8- දිවුරුම් ප්‍රකාශය<br>අනත් 7- විශ්‍රාම වැටුප් නොඉල්ලන්නන්ගෙන් | ප්‍රාදේශීය ලේකම් කාර්යාලය. |

| ප්‍රතිලාභය | ඉදිරිපත් කළ යුතු ලියකියවිලි | ඉදිරිපත් කළ යුතු ස්ථානය |
|---|---|---|
| ආබාධිත අනත්දරු විශ්‍රාම වැටුපක් සහතික (වෛද්‍ය 307 ) | මූලික ප්‍රකාශය - අබා1<br>දෙමව්පියන්ගේ මරණ සහතික භාරකරු අවශ්‍ය නම්, භාරකරු දිවුරුම් ප්‍රකාශය - අබා 2<br>අබා 5- ආබාධිත අනත්දරුවාගේ අත්සන් සහතිකය | විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ ජනරාල් වැන්දඹු අනත්දරු අංශය වෙත |

ඒ ඒ විශ්‍රාම වැටුප් වර්ග අනුව ලබාගත යුතු වාර්තා

වැන්දඹු විශ්‍රාම වැටුප් ගෙවීමකදී,

රෙජිස්ට්‍රාර් ජනරාල් කාර්යාලයෙන් හෝ දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාලයෙන් නිකුත් කරන විවාහ සහතිකය. ආගමානුකූලව විවාහයක් නම් ආගමික මධ්‍යස්ථානයෙන් (දේවස්ථානයෙන්) නිකුත් කරනු ලබන විවාහ සහතිකයක් ද පිළිගැනීමට සලකා බැලිය හැකිය.

- දායකයාගේ මරණ සහතිකය.
- දායකයා එක් විවාහයකට වැඩි ගණනක් සිදුකරගෙන තිබුණේ නම්, පළමු විවාහයෙන් නීත්‍යානුකූලව අවසන් වූ බවට සාක්ෂි.

  උදා: පළමු විවාහයේ භාර්යාවගේ මරණ සහතිකය හෝ දික්කසාද සහතිකය.
- වැන්දඹුව කලින් විවාහ වී ඇත්නම් පළමු ස්වාමිපුරුෂයාගේ මරණ සහතිකය හෝ දික්කසාද සහතිකය.
- පැරණි ජීව ගණක වක්‍ර ප්‍රයෝජනයට ගනිමින් ගණනය කරනු ලබන වැන්දඹු විශ්‍රාම වැටුප් සම්බන්ධයෙන් (1981-07-02) පෙර භාර්යාවගේ උප්පැන්න සහතිකය, විශ්‍රාම වැටුප් අංශය වෙත ගණනය කිරීමේදී ජීව ගණක වක්‍ර ප්‍රයෝජනයට නොගන්නේ නම් භාර්යාවගේ උප්පැන්න සහතිකය අවශ්‍යම නොවේ.
- දායකයාගේ හෝ වැන්දඹුවගේ නම්වල වෙනස්කම් තිබේ නම් එය සනාථ කිරීම සඳහා ප්‍රමාණවත් සාක්ෂි

  උදා : දිවුරුම් සහතිකයක් ලබා ගැනීම අවශ්‍යනම් ප්‍රාදේශීය ලේකම් වාර්තා කැඳවීම හා නම් වෙනස් කිරීම සම්බන්ධ ප්‍රමාණවත් සාක්ෂි ලබා ගැනීම.

නීත්‍යානුකූල විවාහයක් තිබී ඇති නමුත්, විවාහ සහතිකය ඉදිරිපත් කළ නොහැකි නම්, මෙහිදී රෙජිස්ට්‍රාර් ජනරාල් කාර්යාලයෙන් හෝ දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාලයෙන් නිකුත් කරනු ලබන හිස් ප්‍රතිඵල ලේඛනය හෝ දිරාපත්වී ඇති බව සනාථ කෙරෙන ලේඛනය හෝ සමඟ වැඩීමල්ම හා බාලම ළමයින් දෙදෙනාගේ උප්පැන්න සහතිකද, අවශ්‍ය යැයි හැඟේ නම්, සියලුම ළමයින්ගේ උප්පැන්න සහතිකද දෙදෙනා අතර නීත්‍යානුකූල විවාහයක් පැවති බව ප්‍රකාශ කෙරෙන දිවුරුම් සහතිකයක්ද(මෙම දිවුරුම් සහතික ආකෘති පත්‍රය කාර්යාලයෙන් සපයයි) අවශ්‍ය යැයි හැඟේ නම් ග්‍රාම නිලධාරී වාර්තාවක්ද ලබාගත යුතුයි. මෙහිදී විවාහය පිළිගත හැකිද යන්න පිළිබඳ විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ ජනරාල් විසින් හෝ අදාළ මාණ්ඩලික නිලධාරී විසින් තීරණය කිරීම වඩාත් සුදුසුයි.

පරිචය හා ප්‍රසිද්ධිය අනුව සිදුකරගත් චාරිත්‍රානුකූල විවාහයක් නම් ඒ සම්බන්ධව සනාථ කර ගැනීම සඳහා පහත සඳහන් සහතික ලබාගත යුතුයි.

- දරුවන්ගේ උප්පැන්න සහතික.
- ගෘහ මූලික ලැයිස්තු, ඡන්ද ලැයිස්තු.
- එම දෙදෙනා ජීවත් වූ ප්‍රදේශයේ පැවැත්මේ හා ප්‍රසිද්ධියේ දී අඹුසැමියන් ලෙස ජීවත් වූ බවට සාධක ඉදිරිපත් කළ යුතුය. මේ සඳහා ප්‍රදේශයේ ආගමික නායකයෙකුගෙන් හෝ ප්‍රදේශයේ ප්‍රභූන්ගේ සාක්ෂි පිළිගනු ලැබේ. මෙම අවස්ථාවලදී වුවත්, දායකයාට විවාහ එකකට වැඩි ගණනක් තිබුනේ නම්, පළමු විවාහක බිරිඳගේ/ ස්වාමිපුරුෂයාගේ මරණයෙන් හෝ දික්කසාදයෙන් අවසන් වීමක් නොමැතිව ඊට පසුව සිදුවන විවාහයන් පිළිගනු නොලැබේ.
- ප්‍රාදේශීය ලේකම් විසින් අවසාන තීරණයක් සඳහා විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ ජනරාල්ගේ අනුමැතිය ලබා ගත හැකිය. අවශ්‍ය අවස්ථාවලදී නීතිපතිගේ උපදෙස් හෝ රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශයේ ලේකම්ගේ අනුමැතිය ලබා ගැනීමට කටයුතු කරනු ඇත.

පළමු විවාහය ස්වාමිපුරුෂයාගේ හෝ භාර්යාවගේ මරණයෙන් හෝ දික්කසාදයකින් අවසන් කර නොමැතිව එයට පසුව ලියාපදිංචි කර හෝ චාරිත්‍රානුකූලව කරගන්නා ලද විවාහයක් වලංගු නොවේ. විවාහ කිහිපයක් තිබේ නම් පළමුව ලියාපදිංචි කර ඇති දායකයා මියයන විටත්, නීත්‍යානුකූලව පැවති විවාහය පිළිගත යුතුයි. එවැනි අවස්ථාවලදී විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ ජනරාල්ගේ අනුමැතිය ලබා ගන්න.

පනතේ 18 වැනි වගන්තිය මුස්ලිම් දායකයින් සම්බන්ධයෙන් අදාළ වේ. දායකයා මියයන විට වලංගුව තිබෙන්නාවූ පළමු විවාහයේ වැන්දඹුවට පමණක් විශ්‍රාම වැටුප හිමිය. තවද දික්කසාදයන් එකකට වඩා නොතිබිය යුතුයි. එක් දික්කසාදයකට වඩා ඇති අවස්ථාවක් ඇතිනම්, විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ ජනරාල්ගේ හෝ අදාළ මාණ්ඩලික නිලධාරිගේ උපදෙස් ලබා ගන්න.

පනතේ 28 වන වගන්තියෙන් ගැනෙනුයේ විවාහ වී අවුරුද්දක් ඇතුලත නීත්‍යානුකූල දරුවකු නොමැතිව මියයන දායකයින්ගේ වැන්දඹු විශ්‍රාම වැටුප් සම්බන්ධයෙනි. (වැන්දඹු පුරුෂ පනතේ 11 වන වගන්තිය ඇතුලත් වේ) මෙය මරණ මංචකයේ සිදු කරන ලද විවාහයක් ද? නැද්ද ? යන්න තීරණය කිරීම සඳහා පහත සඳහන් ක්‍රියාමාර්ග අනුගමනය කළ යුතුවේ.

- දායකයා මියගොස් ඇති අයුරු දැන ගැනීම සඳහා මරණ සහතිකය පරීක්ෂා කරන්න. ඉන් පසු අවශ්‍ය නම් පමණක් අනෙකුත් අවශ්‍ය වාර්තා කැඳවීම අවශ්‍යදැයි තීරණය කරන්න.
- මියයෑමට පෙර අවුරුදු දෙකක ලෙඩ නිවාඩු විස්තරයක් දෙපාර්තමේන්තුවෙන් ගෙන්වා ගැනීම.
- දායකයාගේ සෞඛ්‍ය තත්වය, (විවාහයට පෙර සහ පසුව) විවාහය සිදුකර ඇත්තේ හුදෙක්ම භාර්යාවට විශ්‍රාම වැටුපක් හිමිකරදීම සඳහා ද යන වග ඇතුලත් ග්‍රාම නිලධාරී/ ප්‍රාදේශීය ලේකම් වාර්තාවක් කැඳවීම.
- වැන්දඹුවගෙන් දිවුරුම් සහතිකයක් ලබා ගැනීම මෙම තොරතුරු පරීක්ෂා කිරීමෙන් පසුව මරණ මංචකයේ සිදුකරගත් විවාහයක් නොවන බවට සෑහීමකට පත්විය හැකි නම්, ඉන් පසුව විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ ජනරාල්ගේ අනුමැතිය ඇතිව වැන්දඹු විශ්‍රාම වැටුපක් ගෙවීමට පුළුවන.
- දායකයා සේවයේ යෙදී සිටියදී මියගියේ නම්, ඉහත සඳහන් වාර්තා ලබා ගන්න. විශ්‍රාම යාමෙන් පසු මියගියේ නම්, විශ්‍රාම වැටුප් ප්‍රදාන ලිපිය හා සිවිල් විශ්‍රාම වැටුප් ගොනුව ලබා ගන්න. එමෙන්ම දායකයාට/ දායිකාවට ගෙවනු ලබන සිවිල් විශ්‍රාම වැටුප් නතර කිරීමට ක්‍රියා කිරීමට වැදගත් වනු ඇත.
- පනතේ 43 වෙනි වගන්තිය අනුව, දායක මුදල් ගෙවා අවසන්වීමෙන් පසු කරන විවාහවල භාර්යාවන්ට හෝ ඔවුන්ගේ දරුවන්ට විශ්‍රාම වැටුප් හිමි නැත.

වැන්දඹු පුරුෂ විශ්‍රාම වැටුප් ගෙවීම

මේ සම්බන්ධයෙන් 1983 අංක 24 දරන වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප් පනත අදාළ වේ.

- ඉහත වැන්දඹු විශ්‍රාම වැටුප් ගෙවීමේදී පිළිතුරු විස්තර සියල්ල අදාළ වේ.
- 1983-08-01 වන දිනෙන් පසු රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් සහිත නිලධාරිණියන්ගේ ද1983-08-01 වන දිනට පෙර විශ්‍රාම වැටුප් සහිත තනතුරු දරන 1983-08-01 වන දින වනවිටත්, සේවයේ සිටි මෙම ක්‍රමයට බැඳීමට මනාපය දී ලියාපදිංචි වී ඇති නිලධාරිණියන්ගේ වැන්දඹු පුරුෂයින් සම්බන්ධයෙන් වැන්දඹු පුරුෂ විශ්‍රාම වැටුපක් හිමි වේ.
- 1983-08-01 වන දිනට පෙර විශ්‍රාම ගන්වන ලද හෝ එදිනට පෙර මියයන ලද විශ්‍රාම වැටුප් සහිත තනතුරු දරන ලද රාජ්‍ය නිලධාරිණියන්ගේ වැන්දඹු පුරුෂයින් සඳහා මෙම ක්‍රමය යටතේ ප්‍රතිලාභ ලැබීමට හිමිකම් නොමැත.
- 1983-08-01 වන දිනට පෙර විශ්‍රාම වැටුප් සහිත තනතුරු දරන රාජ්‍ය නිලධාරිණියන් මෙම ක්‍රමය යටතේ සාමාජිකත්වය ලබා ගෙන ඇත්නම්, 1983-08-01 වන දින සිට විශ්‍රාම ගන්වන ලද දින හෝ සේවයේ සිටියදී මියගියේ නම් මියගිය දිනය දක්වා අනිවාර්ය දායක මුදල් ගෙවා ඇත්ද යන්න පිළිබඳ සෑහීමකට පත්විය යුතුයි. ගෙවා නොමැති නම්, 4% වැල් පොලියක් සමඟ හිඟ දායක මුදල් අයකර ගන්න.
- දායක මුදල් ගණනයේදී විශ්‍රාම වැටුප් චක්‍රලේඛ 3/2008 විධිවිධාන යොදාගත හැක.

අනත්දරු විශ්‍රාම වැටුප් ගෙවීමකදී

පනතේ 29 වන වගන්තිය අනුව අනත් දරුවන් ලෙස පිළිගනු ලබන්නේ වයස අවුරුදු 21ට අඩු පිරිමි දරුවන් සහ වයස අවුරුදු 21 ට අඩු අවිවාහක ගැහැණු දරුවන් පමණි. (පසුව අවුරුදු 26 දක්වා අවිවාහක හා රැකියා විරහිත ගැහැණු දරුවන් හා වයස අවුරුදු 26 ට අඩු රැකියා විරහිත පිරිමි දරුවන් ලෙස සංශෝධනය කර ඇත). 2010 වසරේ සිදුකළ සංශෝධන අනුව රැකියා විරහිත වයස අවුරුදු 26 ට අඩු දරුවන් අනත්දරුවන් වේ. අනත්දරු විශ්‍රාම වැටුප් ගෙවීම සම්බන්ධයෙන් පනතේ 33,35,36 හා 40 වන වගන්තිය ද අදාළ වේ. වැන්දඹු පුරුෂ අනත්දරු විශ්‍රාම වැටුප් සම්බන්ධයෙන් නම් එම පනතේ 12,19,23,17 වගන්ති ඇතුලත් වේ.

- 39 වන වගන්තියට අනුව විශ්‍රාම වැටුපක් ලබන වැන්දඹුවක් ඇගේ බාලවයස්කාර දරුවන්ව රැකබලා නොගන්නා බව වාර්තා වේ නම්, වැන්දඹු විශ්‍රාම වැටුපින් කොටසක් බාලවයස්කාර දරුවන් සඳහා ගෙවීමට කටයුතු කළ යුතුයි. මෙහිදී බාලවයස්කරුවන් සඳහා වැන්දඹු විශ්‍රාම වැටුපෙන් කවර කොටසක් ගෙවිය යුතු දැයි තීරණය කළ පසු විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ ජනරාල්ගේ අනුමැතිය ලබාගත යුතුයි. වැන්දඹු පුරුෂ අනත්දරු විශ්‍රාම වැටුප සම්බන්ධයෙන් නම් එම පනතේ 22 වන වගන්තිය අදාළ වේ.
- 1981 අංක 44 දරන වැන්දඹු අනත්දරු විශ්‍රාම වැටුප් සංශෝධන පනතින් ප්‍රධාන ප්‍රඥප්තියේ 33 වන වගන්තියට කරන ලද 33 (1) සංශෝධනයට අනුව දරුකමට හදා ගන්නා ලද අනත්දරුවන් සඳහාද අනත්දරු විශ්‍රාම වැටුප් ගෙවීමට පුළුවන. වැන්දඹු පුරුෂ පනතේ 17 (2) හා 17 (3) වගන්ති මෙවැනි ගැටළු සම්බන්ධව අදාළ වේ.
- අනත්දරු විශ්‍රාම වැටුප් ගෙවීම සඳහා ඉහත ලේඛන හා විස්තරවලට අතිරේක වශයෙන් පහත සඳහන් වාර්තා අවශ්‍ය වේ.
    - අනත්දරුවන්ගේ උප්පැන්න සහතික.
    - අනත්දරුවන්ගේ මවගේ/ පියාගේ මරණ සහතිකය හෝ දික්කසාද සහතිකය. නැවත විවාහ වී ඇත්නම් විවාහ සහතිකය.

- දරුකමට හදාගත් අනත්දරුවෙක් නම් කුලවැද්දුම් නඩු තීන්දුවේ පිටපතක් හා එය සනාථ කෙරෙන වෙනත් සාක්ෂි.
- අනත්දරුවන්ගේ භාරකරු/ භාරකාරිය වෙතින් දිවුරුම් සහතිකයක් සම්පූර්ණ කර ගෙන්වා ගැනීම.
- භාරකරු/ භාරකාරිය සුදුසු ද යන්න පිළිබඳ ප්‍රාදේශීය ලේකම් වාර්තාවක් ලබා ගැනීම හෝ කාර්යාලයට කැඳවා කරනු ලබන භාරකාරිත්ව පරීක්ෂණ වාර්තාව.
- වැන්දඹු/ වැන්දඹු පුරුෂ විශ්‍රාම වැටුපක් ප්‍රදානය කර තිබේ නම් එය අවසන්වරට ගෙවා ඇති දිනය සනාථ කර ගැනීම.
- වයස සම්පූර්ණ වී ඇති අනත්දරුවන් (වයස අවුරුදු 18 ඉක්මවා ඇති) සම්බන්ධයෙන් ඔවුන්ට හිමි හිඟ අනත්දරු විශ්‍රාම වැටුප් මුදල් කෙලින්ම ගෙවිය හැක. භාරකරුවෙකු පත් කිරීම අවශ්‍ය නොවේ.

### අනත්දරු විශ්‍රාම වැටුප් කොටස කොපමණ ද යන්න තීරණය කිරීම

- දායකයාට හා දායිකාවට තිබී ඇත්තේ එකම විවාහයක් නම් සම්පූර්ණ විශ්‍රාම වැටුප අනත්දරුවන් අතර සමානම බෙදා හැරිය යුතුයි.
- දායකයා හෝ දායිකාව විවාහ එකකට වැඩි ගණනක් කර ගෙන ඇති අවස්ථාවක පළමු විවාහවල වයස අවු : 26 අඩු දරුවන් සිටී නම්, දායකයා/ දායිකාව වෙනුවෙන් ගෙවනු ලබන විශ්‍රාම වැටුප පළමු විවාහවල බාලවයස්කරුවන්ට හා අවසාන විවාහක බිරිඳට බෙදා ගෙවනු ලැබේ.

  උදා :විවාහ දෙකක් නම් පළමු විවාහයේ අනත්දරුවන් සඳහා මුළු විශ්‍රාම වැටුපෙන් 1/2 ක් ද, ඉතිරි 1/2 අවසාන විවාහක බිරිඳට බෙදා ගෙවනු ලැබේ.

- හිමි අනත්දරු විශ්‍රාම වැටුප තීරණය කිරීමෙන් පසු ඉන් සාධාරණ කොටසක් ජාතික ඉතිරි කිරීමේ බැංකුවේ අනත්දරුවන්ගේ නමින් තැන්පත් කිරීමට වුවද තීරණය කළ හැකිය. එය අනත්දරුවන්ගේ අනාගත සුරක්ෂිතතාවය තහවුරු කිරීමට ආධාර වේ. අවුරුදු 18 සම්පූර්ණවීමෙන් පසු එම මුදල අනත්දරුවන්ට ලබාදීමට පුළුවන.
- භාරකරු නිගමනය කිරීමෙන් පසු ඒ සඳහා විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ ජනරාල්ගේ අනුමැතිය ලබා ගත යුතුවේ. ඒ සඳහා බලපත්‍රය හා භාරකරුට විශ්‍රාම වැටුප් ගෙවීමේ ලිපියට අධ්‍යක්ෂ ජනරාල් අනුමැතිය ලබා ගත යුතුයි.

### බෙදී ගිය අනත්දරු විශ්‍රාම වැටුප් ගෙවීමකදී.

මින් අදහස් කරන්නේ අනත්දරුවන් කිහිප දෙනෙකු ඇති විට එම අනත්දරුවන් භාරකාරුවන් හෝ භාරකාරියන් කිහිප දෙනෙකුගේ රැකවරණය හා ආරක්ෂාව යටතේ සිටීමයි. මෙහිදී විශ්‍රාම වැටුප භාරකරුවන් හෝ භාරකාරියන් අතර බෙදා ගෙවීමට සිදු වේ. අනත්දරු විශ්‍රාම වැටුපෙන් ඒ ඒ භාරකරුවන්ට කොපමණ ප්‍රමාණයක් (අනුපාතයක්) ගෙවිය යුතු ද යන්න තීරණය කිරීමේදී ඒ ඒ භාරකරු වෙත සිටින අනත්දරුවන් ගණන කොපමණ ද යන්න පදනම් කර ගනී.

### වැන්දඹු භාරකරු විශ්‍රාම වැටුප් ගෙවීමකදී

පනතේ 38 වැනි වගන්තියට අනුව වැන්දඹුව මානසික රෝගයකින් හෝ වෙනත් විශ්‍රාම වැටුප් ලබා ගැනීමට නොහැකි සදාකාලික රෝගයකින් පෙලෙන්නේ නම් විශ්‍රාම වැටුප් භාරකරුවෙකුට පැවරීම වැන්දඹු පුරුෂ විශ්‍රාම වැටුප් පනතේ 21 වෙනි වගන්තිය මෙයට අදාළ වේ.

ආබාධිත විශ්‍රාම වැටුප් ගෙවීමේදී

වැන්දඹු සහ අනත්දරු විශ්‍රාම වැටුප් සංශෝධිත පනතින් ප්‍රධාන ප්‍රඥප්තියේ 29 වන වගන්තියට එකතු කරන ලද 29 "අ" වගන්තිය අනුව සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂවරයා විසින් පත් කරන ලද වෛද්‍ය නිලධාරීන් තුන් දෙනෙකුගෙන් සමන්විත වෛද්‍ය පරීක්ෂණ මණ්ඩලයක් විසින් අනත්දරුවකු ඔහුගේ ජීවනෝපාය සලසා ගැනීමට නොහැකි වන්නා වූ, ශාරීරික හෝ මානසික අවශ්‍යතාවයකින් පෙළෙන බවට තීරණය කළ විටක ඒ අනත්දරුවාට වයස ගැන නොතකා, යාවජීව විශ්‍රාම වැටුපක් ලැබීමට හිමිකම් ඇත.

- ආබාධිත විශ්‍රාම වැටුප් ඉල්ලීමක් ඉදිරිපත් වීමෙන් පසු, ආබාධිත විශ්‍රාම වැටුපක් ලෙස ලේඛනගත කර, ආබාධිත ස්වභාවය සම්බන්ධ වාර්තාවක් කැඳවීම.
- වෛද්‍ය වාර්තා ලබා ගැනීම අවශ්‍ය නම් දිස්ත්‍රික් වෛද්‍ය නිලධාරී සහතිකයක් ලබා ගත යුතුයි.
- ආබාධිත තැනැත්තාගේ/ තැනැත්තියගේ උප්පැන්න සහතිකය ලබාගත යුතුය.
- ආබාධිත ස්වභාවය මූලික පරීක්ෂණයක් පවත්වා තොරතුරු වාර්තා ගත කර ගැනීම. මෙහිදී රෝගී තත්වයේ හෝ ආබාධිත ස්වභාවයේ ඉතිහාසය, සිවිල් තත්වය, ඉපැයීම් හැකියාව, පවුලේ වෙනත් ආබාධිතයින් සිටී ද, භාරකාරත්වය සම්බන්ධ විමසිය යුතුයි.

> *වැදගත්:-* ආදර්ශ අත්සන් ලබා ගත යුතුයි. එම තොරතුරු මත ආබාධිත අය වෛද්‍ය පරීක්ෂණ මණ්ඩලයකට ඉදිරිපත් කිරීම සුදුසු ද නැද්ද යන්න තීරණය කළ යුතුයි.

- ආබාධිත තැනැත්තා හෝ තැනැත්තිය වෛද්‍ය පරීක්ෂණ මණ්ඩලයක් වෙත යොමු කිරීම. මේ සඳහා පොදු 142 ආකෘති පත්‍රය ප්‍රයෝජනයට ගත යුතුයි. වෛද්‍ය පරීක්ෂණ මණ්ඩලයේ තීරණය අනුව 29 "අ" වගන්තියට වැටේ නම් ආබාධිත විශ්‍රාම වැටුප් ගෙවිය හැක.
- භාරකාරයෙකු පත් කිරීම අවශ්‍ය නම් භාරකාරත්ව දිවුරුම් සහතිකයක් යවා සම්පූර්ණ කර ගෙන්වා ගත යුතුයි.
- භාරකාරත්වය සම්බන්ධ ප්‍රාදේශීය ලේකම් වාර්තාවක් ලබා ගන්න. මූලික පරීක්ෂණයේදී භාරකාරත්වය සම්බන්ධව සෑහීමකට පත් වූයේ නම් නැවත එම වාර්තාව කැඳවීම අවශ්‍ය නොවේ.
- භාරකරු නිගමනය කිරීමෙන් පසු ඒ සඳහා විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ ජනරාල් අනුමැතිය ලබා ගත යුතු වේ. ඒ සඳහා බලපත්‍රයට හා භාරකරුට විශ්‍රාම වැටුප් ගෙවීමේ ලිපියට අධ්‍යක්ෂ ජනරාල් අනුමැතිය ලබා ගත යුතුයි.
- මන්ධ බුද්ධික හෝ මානසික ආබාධිතයෙකු නොවන්නේ නම් ඔහුට කෙලින්ම ආබාධිත විශ්‍රාම වැටුප් ගෙවීමට කටයුතු කළ හැක.

## 7.6 ආබාධිත විශ්‍රාම වැටුපක් සකස් කිරීමේදී අනුගමනය කළ යුතු ක්‍රියාමාර්ග

මේ සම්බන්ධව විශ්‍රාම වැටුප් චක්‍රලේඛ 1/2009 විධිවිධාන හා ආබාධිත විශ්‍රාම වැටුප ගෙවීමේ රෙගුලාසි වැදගත්ය.

ආබාධිත අනත්දරු විශ්‍රාම වැටුප් සම්බන්ධව වෛද්‍ය වාර්තාව ලබා ගැනීම ඉතා වැදගත් වේ. එහි ආකෘතියක් පහත සඳහන් වේ.

සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල්
සෞඛ්‍ය දෙපාර්තමේන්තුව,
සුවසිරිපාය,
කොළඹ 07.

**<u>සදාකාලික වශයෙන් දුබලතාවයකට පත්වූ අනත්දරුවෙකුට යාවජීව විශ්‍රාම වැටුපක් ගෙවීම</u>**

වැන්දඹු අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයේ දායකයෙකුව සිටි......................................................මහතාගේ/ මහත්මියගේ පුතකු/ දියණියක වන ......................................................මයා/මෙනවිය ආබාධිත අනත්දරු විශ්‍රාම වැටුපක් ඉල්ලා සිටී. කරුණාකර ඔහු/ඇය වෛද්‍ය පරීක්ෂණ මණ්ඩලයක් මගින් පරීක්ෂා කර <u>නිත්‍ය ආබාධික කැනැත්තෙක්ද ?</u> යන්න වාර්තා කරන මෙන් ඉල්ලමි.

- ආබාධික විශ්‍රාම වැටුප් ඉල්ලුම්කරු පිළිබඳ තොරතුරු :-

1. ඉල්ලුම්කරුගේ නම :-
2. හැදුනුම්පත් අංකය :-
3. වයස :-
4. ලිපිනය :-

5. ඉල්ලුම්පතට අනුව ඉදිරිපත් කර ඇති රෝගී තත්වය :-

- "අ" ආකෘති පත්‍රය (පිටපත් තුනකින් යුතුව ) මේ සමග එවමි.
- මේ සමග ආබාධික අනත්දරුවාගේ /දැරියගේ ආදර්ශ අත්සන් සහතිකයක් හා ආබාධික ස්වාභාවය සම්බන්ධ දිස්ත්‍රික් වෛද්‍ය නිලධාරි සහතිකය යොමු කරමි.
- මෙම වෛද්‍ය පරීක්ෂණ පැවැත්වෙන දිනය ආබාධිත දරුවාට/දැරියට කෙලින්ම දැනුම් දෙන්න. දැන ගැනීමට එහි පිටපතක් මා වෙත එවන්න.

- නිත්‍ය ආබාධික තත්වයට පත්වූ දිනය හෝ කාලය දක්වන්න

වෛද්‍ය වාර්තාවේ රෝහල් අධ්‍යක්ෂගේ නම ඇතුලත් 181
- නිල මුද්‍රාව තබා අත්සන් කර එවීමට කාරුණික වන්න.

..................................................
විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ ජනරාල් වෙනුවට.

පිටපත :- භාරකරු/ආබාධිත තැනැත්තා ( නියමිත වෛද්‍ය අධිකාරි විසින් දැනුම් දෙනුලබන නියමිත දිනයේදි පරීක්ෂණයට ඉදිරිපත් වන්න. පරීක්ෂණය ප්‍රමාද වන්නේ නම් එම කාර්යාලයෙන් විමසන්න. )

Director General of Health Services
Department of Health
Suvasiripaya
Colombo 07.

**Payment of lifetime pension for permanently disabled orphans**

Mr./ Miss. ..............................................................., a son/ a daughter of Mr./ Mrs. ..............................................................., who was a contributor of Widows' and Orphans' Pension Scheme has requested a Disabled Orphans' Pension. Accordingly, you are kindly requested to report whether he/ she is permanently disabled by examined before a Medical Examination Board.

- Details of applicant for disable pension:-

  1. Name of applicant :-
  2. National Identity Card No. :-
  3. Age :-
  4. Address :-
  5. The disease as stated in application :-

- Form "A" is sent herewith (in triplicate)
- District Medical Officer's certificate on the disability and specimen signature of the disabled orphan is forwarded herewith.
- Please inform the date of medical examination directly to the orphan with a copy to me for my information.
- Permanently disabled date or period
- Please be kind enough to place the name included official stamp when signed.

**For Director General of Pensions**

Copy: - Guardian/ Disable
(Please attend the medical examination on due date informed by the Medical Superintendent or Regional Director of Health Services. If the examination delayed should be inquired from relevant office.)

"අ"

## රජයේ සේවයේ නියුතු නිලධාරින්ගේ ආබාධිත අනත්දරුවන් වෛද්‍ය පරීක්ෂණය ට භාජනය කිරීම

ස්ථිර විශ්‍රාම වැටුපක් හිමි රාජ්‍ය සේවකයෙකුගේ ආබාධිත දරුවන් සඳහා ආබාධිත අනත්දරු විශ්‍රාම වැටුපක් ලබා දීම වෙනුවෙන් බලපවත්නා වූ නීතිමය තත්වය පහත පරිදි වේ.

- 1981 අංක 44 දරණ වැන්දඹු හා අනත්දරු පනතේ 29 වන වගන්තිය.
- 1983 අංක 24 දරණ වැන්දඹු පුරුෂ හා අනත්දරු පනතේ 13 වන වගන්තිය.

පනතේ උධෘතය

29 සහ 13 වන වගන්ති - සදාකාලික ( නිත්‍ය ) වශයෙන් අබලතාවයට පත්වූ අනත්දරුවන්ට යාවජීව විශ්‍රාම වැටුපක් ගෙවීම

" සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂවරයා විසින් පත්කරන ලද වෛද්‍ය නිලධාරීන් තුන් දෙනෙක්ගෙන් සමන්විත පරීක්ෂණ මණ්ඩලයක් විසින් අනත්දරුවකු ඔහුගේ ජීවනෝපාය සලසා ගැනීමට නොහැකි වන්නා වූ ශාරීරික හෝ මානසික අශක්‍යතාවයකින් පෙළෙන බවට තීරණය කළ විට ඒ අනත්දරුවාට වයස ගැන නොතකා මේ පනත යටතේ යාවජීව විශ්‍රාම වැටුපක් ලැබීමට හිමිකම කිව්ය යුතුය "

" Where are medical board comprising three medical officers appointed by the director of Health Service Determines that an orphan of a contributor suffers from such physical or mental disability as renders him incapable of earning of livelihood such orphan shall, notwithstanding anything in this Act, be entitled to a pension under this Act during his life time"

වෛද්‍ය මණ්ඩල වාර්තාව ලබා දීමේදී සැලකිලිමත් විය යුතු කරුණු :-

රාජ්‍ය නිලධාරියාගේ හා කලත්‍රයාගේ ඇවෑමෙන් පසු වයස 26 දක්වා අනත්දරුවන්ටද ( රැකියා තත්වය සලකා ) අනත්දරු විශ්‍රාම වැටුපක් ලබා ගැනීමේ නීත්‍යානුකූලව හිමිකම පවතී. කෙසේ වෙතත් වයස අවු.26 ඉක්මවන ලද දරුවන් විවිධ රෝගී තත්වයන් හා අබාධිත තත්වයන් නිරූපණය කරමින් ආබාධිත විශ්‍රාම වැටුප් ලබා ගැනීමේ උත්සාහයන්ගේ වැඩිවීමක් මෑත කාලයේ වර්ධනය වී ඇත. එබැවින් පහත සඳහන් කරුණු කෙරෙහි අවධානය යොමු කිරීම වැදගත් වේ.

- අදාළ පුද්ගලයාගේ අනන්‍යතාවය තහවුරු කර ගැනීම.
- රෝගියා පරීක්ෂා කිරීමේදී පෙර සායනික වාර්තා නිරීක්ෂණය කිරීම හා ආබාධිත පුද්ගලයා පරීක්ෂාවට ලක් කිරීම.
- රෝගියා හා ආබාධිතයා යන්න, වෙන්කොට හඳුනාගැනීමෙන් පසුව නිත්‍ය ආබාධිත අයට පමණක් ඔබගේ නිර්දේශ ලබා දීම.
- එම ආබාධය කිසියම් කාලයකට පමණක් පවතින්නක් නම් වෛද්‍ය මණ්ඩල නිර්දේශයේ එය පැහැදිලිව දැක්වීම.
- දෙමාපියන් මිය යාමෙන් පසුව ආබාධිත විශ්‍රාම වැටුප් ලබා ගැනීමේ අරමුණින්ම ව්‍යාජ ආබාධිත තත්වයක් ඉදිරිපත් කිරීමක්ද යන්න පිළිබඳ සැලකිලිමත් වීම.
- වෛද්‍ය ප්‍රතිකාර මගින් සුවකල හැකි ආබාධයක් නම් එම කාලය වාර්තාවට ඇතුලත් කිරීම හා රෝගියා වෛද්‍ය ප්‍රතිකාර සඳහා යොමු කිරීම.
- වයස්ගත වීම මත ඇතිවන්නාවූ රෝගී හෝ ආබාධිත තත්වයන් සැලකිල්ලට ගැනීම. ඔහු/ඇය විවාහ වී සිටීම දරුවන් ලබා සිටීම වැනි හේතු මත තවදුරටත් පූර්ණ ආබාධිත තත්වයක් පැවතිය හැකිද යන්න ගැන සැලකිලිමත් වීම.

"A"

## Confronting disabled orphans of Public Officers to a medical examination

The legal basis effective for offering a Disabled Orphans' Pension for disabled orphans of public officers in permanent and pensionable posts is set out below.

- Section 29 of Widows' and Orphans' Pension Act No.44 of 1981
- Section 13 of Widowers' and Orphans' Pension Act No.24 of 1983

Abstract of the Act

Sections 29 and 13 - Payment of life time pension for orphans permanently disabled

"Where a medical board comprising three medical officers appointed by the Director of Health Services determines that an orphan of a contributor suffers from such physical or mental disability as renders him incapable of earnings of livelihood such orphan shall, notwithstanding anything in this Act, be entitled to a pension under this Act during his life time."

Facts to be noted when providing medical board report

After the death of a public officer and spouse, the orphans of them are legally entitled for an orphans' pension till age of 26 years (considering employment). However, requests for disable pensions on behalf of orphans over 26 years by implying disabilities have been rapidly increased in resent time. Therefore your attention should be draw to following facts.

- Identification of the relevant person
- Observing clinical reports and examining the disable
- Conveying your recommendations only in respect of persons permanently disabled by separating the patient and the disable
- If the disability can be seen only for a temporary period, please note the same in medical board recommendation
- Special attention should be given on applicants shows fake disabilities to draw disable pension after death of parents
- If the disability can be cured by medical treatments, the duration should be pointed out in the report and the patient should be directed for medical treatments
- Paying attention on illnesses and disabilities emerged due to aging
- Attention should be paid whether the disability can be further exist considering the applicant's being married and having children

To Director General of Pensions

(2)

විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ ජනරාල් වෙතටයි.

## වෛද්‍ය මණ්ඩල වාර්තාව

ආබාධිත පුද්ගලයාගේ නම :

හැඳුනුම්පත් අංකය :

පරීක්ෂණය පැවැත්වූ දිනය :

- රෝගය හෝ ආබාධය
- කවර කාලයක සිට පැවත එන්නක්ද ?
- ඒ බව ඉදිරිපත් කළ වෛද්‍ය සහතික ආදියෙන් සනාථ වූයේද ?
- ඉදිරියට කොපමණ කාලයක් රෝගය හෝ ආබාධය පවතීද ?
- සුවකල හැකි නම් , නිර්දේශිත කාල සීමාව
- මෙය රෝගයක්ද? එසේ නැත්නම් ආබාධයක්ද ? යන වග
- ආබාධයක් නම් එය උපතේ සිට පැවත එන්නක්ද?
- උපතේ සිට නොවන්නේ නම් ආබාධිත වීමට බලපෑ හේතු මොනවාද?
- රෝගයේ / ආබාධයේ වර්තමාන තත්වය.

**වෛද්‍ය මණ්ඩල තීරණය**

- රෝගයේ හෝ ආබාධය පිළිබඳ වෛද්‍ය නාමය
- රෝගය හෝ ආබාධය හේතුවෙන් ජීවනෝපාය සලසාගත නොහැකි තත්වයක් උද්ගතවී ඇත්ද ?
- එසේ නම් කොපමණ කලකටද ?

## MEDICAL BOARD REPORT

Name of disable person :
National Identity Card No. :
Date examined :

- Disease or disability
- Existing from?
- Whether it proved by medical reports?
- For how long the disease or disability will be existed?
- If can be cured, recommended duration
- Whether this a disease or disability?
- If a disability, whether it existed from birth?
- If not existed from birth, the reasons for disability?
- Present condition of the disease/ disability

**Decision of the medical Board**

- Medical name of the disease or disability
- Whether this disease or disability deprived the person from earning of livelihood?
- If so, for how long?

**වෛද්‍ය මණ්ඩල තීරණය :-**

වෛද්‍ය මණ්ඩලය                                   අත්සන

1.
2.
3.

<u>වෛද්‍ය මණ්ඩල වාර්තාව - ( දෙවන කොටස )</u>

..............................................................................................මයා/මිය/

මෙනවිය ඔබගේ .......................................අංක හා ..........................................දිනැති ලිපිය මගින් කරන ලද ඉල්ලීමට අනුව පහත සඳහන් අය ......................................දින වෛද්‍ය මණ්ඩලය වෙතට යොමු කරන ලදී.

- තීරණය පහත පරිදි වේ.

- ..............................................................................................මයා/මිය/ මෙනවිය. පූර්ණ කාලිනව ආබාධිත තත්වයට පත්ව ඇති බවත් එම ආබාධිත තත්වය ..............................................සිට පැවත එන්නක් බවත්, මේ හේතුවෙන් ඔහුගේ /ඇයගේ ඉපයීමේ ශක්තිය හීන වී ඇති බවත් සහතික කරමි. වෛද්‍ය මණ්ඩල වාර්තාව මේ සමග ඉදිරිපත් කරමි.

- .................................................................................... මයා/මිය/මෙනවිය. රෝගී තත්වයකින් පෙළෙන බවත්, එය ආබාධිත තත්වයක් නොවන බවත් සහතික කරමි. වෛද්‍ය මණ්ඩල වාර්තාව මේ සමග ඉදිරිපත් කරමි.

වෛද්‍ය අධිකාරී/ප්‍රාදේශිය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ
( නිල මුද්‍රාව )

පිටපත :- සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල්

**MEDICAL BOARD REPORT:-**

Medical Board Signature

1.
2.
3.

## MEDICAL BOARD REPORT – (Part II)

Below mentioned person was produced before the medical board on ................ as per the request made by Mr. / Mrs. / Miss. ........................................................ reference your letter .................................... dated ...................,

- Decision shown below

- It is certified that, Mr./ Mrs./ Miss. ...................................................... is suffering from life time disability and the disability existed from ........................, and this has caused to decline his/ her capacity to earning of livelihood. Medical Board report is submitted herewith.

- It is certified that Mr./ Mrs./ Miss. ......................................................... is suffering from a disease and it is not a disability. Medical Board report is submitted herewith.

Medical Superintendent/ Regional Director of Health Services

(Official Stamp)

Copy: - Director General of Health Services

- රෝගී ස්වභාවය සම්බන්ධ වෛද්‍ය වාර්තා හා දිස්ත්‍රික් වෛද්‍ය නිලධාරී සහතිකයක් කැඳවීම.
- භාරකාරත්ව දිවුරුම් සහතිකයක් සම්පූර්ණ කර ගෙන්වා ගැනීම.
- භාරකාරත්ව සම්බන්ධ ප්‍රාදේශීය ලේකම් වාර්තාවක් කැඳවීම . මෙහිදී වැන්දඹුවගේ රෝගී ස්වභාවය සම්බන්ධව, භාරකරු හා වැන්දඹුවගේ ඥාති සම්බන්ධය, භාරකරු විශ්‍රාම වැටුප් වැන්දඹුව හා අනත්දරුවන්ගේ සුභසිද්ධිය සඳහා පාවිච්චි කරයි ද, මසකට කොපමණ මුදලක් අවශ්‍ය වේ ද යන්න විමසීම වැදගත්.
- භාරකාරත්වය තීරණය කිරීමෙන් පසු ඒ සඳහා විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ ජනරාල් අනුමැතිය ලබා ගත යුතුයි.

## 7.7 අතුරුදහන් වූ දායකයින් සම්බන්ධ අනුගමනය කළ යුතු ක්‍රියා මාර්ගය:

මෙවැනි දායකයින් සම්බන්ධයෙන් මරණ සහතිකයක් ලබා ගත නොහැක. අතුරුදහන් වූ දායකයා විශ්‍රාමිකයෙක් නම් අතුරුදහන් වීමෙන් පසු මාස 4 කට පසුව සිට වැන්දඹු විශ්‍රාම වැටුප් ගෙවීම ආරම්භ කළ හැක. (මීට පෙර එම කාලය වසරක් විය) සේවයේ යෙදී සිටියදී අතුරුදහන් වූ අයෙකු නම් අතුරුදහන්වීමෙන් වසරකට පසුව සිට වැන්දඹු විශ්‍රාම වැටුප් ගෙවීමට කටයුතු කළ හැක (මුලදී වසර 7 ක් විය)

**විශ්‍රාම වැටුප් ගෙවීම සඳහා තීරණයක් ගැනීමට පහත සඳහන් වාර්තා හා විස්තර ලබා ගන්න.**

- සිවිල් විශ්‍රාම වැටුප් ගෙවූ නිලධාරීගෙන් අවසානවරට විශ්‍රාම වැටුප් ගෙවූ දිනය තහවුරු කර ගන්න. ඒ බව ඔහුට දන්වා වැන්දඹු විශ්‍රාම වැටුප් ගෙවීමට කටයුතු කරන බැවින් යම් දිනක විශ්‍රාමිකයා ඉදිරිපත් වුවහොත් මෙම කාර්යාලයට දන්වා උපදෙස් ලබාගන්නා තුරු විශ්‍රාම වැටුප් නැවත නොගෙවීමට සටහන් කර ගැනීමට එය සටහන් කර ගත් බව සනාථ කර ගන්න.

- වැන්දඹුවගෙන්/වැන්දඹු පුරුෂයාගෙන් දිවුරුම් සහතිකයක් ගෙන්වා ගන්න. අතුරුදහන් වූ දිනය, අතුරුදහන්වීමෙන් පසු ඔහු කිසිවකු විසින් දැක ඇති බවට තොරතුරු තිබේ ද යන්න එහි සඳහන් විය යුතුයි.

- අතුරුදහන්වීම සම්බන්ධ පොලීසියට වාර්තා කරන ලද පොලිස් වාර්තාවේ පිටපතක් ලබාගන්න.

- අතුරුදහන් වූ දායකයා සම්බන්ධ ප්‍රාදේශීය ලේකම් වාර්තාවක් කැඳවන්න. එහිදී අතුරුදහන් වූ දිනය, අතුරුදහන්වීමෙන් පසු දැක ඇති බවට සාක්ෂි තිබේද? අතුරුදහන්වීම සම්බන්ධ සැකයට තුඩුදිය හැකි කරුණු කිසිවක් තිබේද යන්න විමසිය යුතුයි.

- ඉහත විස්තර සම්පූර්ණ කර ගැනීමෙන් පසු අතුරුදහන්වීම සම්බන්ධ සෑහීමකට පත්විය හැකි නම් අධ්‍යක්ෂ ජනරාල් අනුමැතිය ලබාගන්න. 1971.11.08 දින පවත්වන ලද අධ්‍යක්ෂවරුන්ගේ රැස්වීමේ 1 වන අංකය යටතේ ගන්නා ලද තීරණයට අනුව මෙම අනුමැතිය ලබා ගත යුතුවේ.

## 7.8 වැන්දඹු සහ අනත්දරු විශ්‍රාම වැටුප් ගණනය කිරීම සම්බන්ධ නියමයන්

1981 අංක 44 දරන වැන්දඹු සහ අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදල් (සංශෝධිත) පනතින් වැන්දඹු සහ අනත්දරු විශ්‍රාම වැටුප් ගණන් බැලීමේ පදනම සම්පූර්ණයෙන්ම වෙනස් විය. මෙම පනතේ නියමයන් ක්‍රියාත්මක වන්නේ 1981 ජූලි මස 02 වන දිනෙන් පසුව සිටයි. ඒ අනුව විශ්‍රාම වැටුප් ගණන් බැලීමේදී පහත දැක්වෙන කරුණු දෙක පිළිබඳව සැලකිලිමත් විය යුතුය.

**1981 ජූලි මස 02 වන දිනට පෙර මියයන ලද දායකයෙක් ද (ජූලි 02 වන දින හැර)**

- 1981 ජූලි මස 2 වන දිනට පෙර සේවයේ යෙදී සිටියදී හෝ විශ්‍රාම යෑමෙන් පසු හෝ මිය යන ලද දායකයින් සම්බන්ධයෙන් විශ්‍රාම වැටුප් ගණනය කිරීම ජීවගණක චක්‍ර ආධාරයෙන් කළ යුතුයි. (පැරණි ක්‍රමය)
- 1981 ජූලි මස 02 වන දිනට පෙර විශ්‍රාම වැටුප් හිමි තනතුරක් දැරූ නමුත් විශ්‍රාම වැටුපක් නොලැබූ සේවයෙන් (ඉල්ලා අස්වීම, සේවයෙන් පහකිරීම, සේවය හැර යාම ආදී හේතූන් නිසා) ඉවත්ව යාමෙන් පසු 1981 ජූලි මස 2 වන දිනට පසු වුව ද මියයන දායකයින් සම්බන්ධයෙන් ද විශ්‍රාම වැටුප් ගණනය කිරීම ජීව ගණක චක්‍ර ආධාරයෙන් කළ යුතු වේ.
- මෙම වැන්දඹු අනත්දරු විශ්‍රාම වැටුප් කටයුතු තව දුරටත් වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් අංශය මඟින් සිදු කෙරෙන බැවින් ප්‍රදානය සඳහා විශ්‍රාම වැටුප් අයදුම්පත් තවදුරටත් වැන්දඹු සහ අනත්දරු විශ්‍රාම වැටුප් අංශය වෙත යොමු කළ යුතු වේ.

**1981 ජූලි මස 02 වන දිනට පසු මියයන ලද දායකයෙක් ද (ජූලි දෙවන දින ඇතුලත්ව)**

- 1981 ජූලි මස 2 වන දිනට පසු සේවයේ යෙදී සිටියදී හෝ ඊට පෙර හෝ පසු හෝ විශ්‍රාම යෑමෙන් පසුව මිය යන ලද දායකයින් සම්බන්ධයෙන් 1981 නව සංශෝධිත පනත අනුව නිලධාරියාගේ විශ්‍රාම වැටුපට සමාන හෝ ඊට අඩු නොවන විශ්‍රාම වැටුපක් වැන්දඹුවට හා අනත්දරුවන්ට ගෙවිය යුතු වේ.
- පනතේ 57 අ (2) (අ) 1 අනුව අනිවාර්ය විශ්‍රාම යාමේ වයසට එළඹීමට පෙර අවුරුදු 25 ක් සේවය කළ හැකි නමුත්, මිය යන විට හෝ විශ්‍රාම යන විට සේවා කාලය අවු: 25 ට අඩු නම් සේවයේ යෙදී සිටියදී හෝ විශ්‍රාම ගැන්වීමෙන් පසු දායකයකු මියගිය අවස්ථාවක මිය යන විට හෝ විශ්‍රාම යන විට හෝ ඔහු ලබමින් සිටි වැටුපෙන් 50% ක විශ්‍රාම වැටුපක් ප්‍රදානය කළ යුතුවේ.
- එමෙන්ම මිය යන විට හෝ විශ්‍රාම යන විට සේවා කාලය අවු: 25 ට අඩුනම් හා අනිවාර්ය විශ්‍රාම යාමේ වයසට එළඹීමට පෙර ඔහුට අවුරුදු 25 ක සේවයක් සම්පූර්ණ කළ නොහැකි නම් විශ්‍රාම වැටුප අනිවාර්ය විශ්‍රාම යාමේ වයස දක්වා නියම සේවා කාලය මත ගණනය කර ප්‍රදානය කළ යුතු වේ.

එය ගණන් බලන්නේ මෙසේය:

{ සේවය කළ නියම ශුද්ධ මාස ගණන + අනිවාර්යය විශ්‍රාම යාමේ වයස දක්වා කාලය +60 } + { මිය යන විට හෝ විශ්‍රාම යන විට ලබමින් සිටි වාර්ෂික වැටුප }

මාස 72

- පනතේ 57 අ (2) (අ) (11) වගන්තියට අනුව සේවා කාලය අවු: 25 ට නොඅඩු දායකයකු සේවයේ යෙදී සිටියදී හෝ විශ්‍රාම යෑමෙන් පසු හෝ මියගිය අවස්ථාවක ඔහුගේ විශ්‍රාම වැටුපට සමාන වැටුපක් වැන්දඹු සහ අනත්දරු විශ්‍රාම වැටුප ලෙස ප්‍රදානය කළ යුතුවේ.
- පනතේ 57 අ (2) (අ) (11) වගන්තිය අනුව විශේෂ නියමය නම් ශ්‍රේෂ්ඨාධිකරණයේ විනිශ්චයකාරවරයෙකු සහ විශ්‍රාම වැටුප් ව්‍යවස්ථාවේ ඊටට් උප ලේඛනයේ සඳහන් වෙනත් තනතුරක් හෝ නිලයක් හෝ සහ විශ්‍රාම වැටුප් ව්‍යවස්ථාවේ 25 වෙනි වගන්තියෙන් අදහස්

කෙරෙන අධිකරණ නිලධාරියෙකු විසින් දරනු ලබන ඕනෑම තනතුරක් සම්බන්ධයෙන් නම්, අනිවාර්ය විශ්‍රාම යාමේ වයසට එළඹීමට පෙර අවුරුදු 25 ක් සේවය කළ නොහැකි වුවත්, මියයන විට හෝ විශ්‍රාම යන විට හෝ ලබමින් සිටි වැටුපෙන් 50% විශ්‍රාම වැටුපක් ප්‍රදානය කළ යුතු වේ.

- පනතේ 57 අ (2) (ආ) වගන්තියට අනුව විශ්‍රාම යෑමෙන් පසු මිය ගියේ නම්, පනතේ 57 අ (2) (ඇ) වගන්තියේ විධි විධානයන්ට යටත්ව විශ්‍රාම වැටුපට සමාන මුදලක් වැන්දඹු විශ්‍රාම වැටුප ලෙස ප්‍රදානය කළ යුතුවේ.
- පනතේ 57 අ (2) (ඇ) වගන්තියට අනුව දායකයා 1981-07-02 වන දිනට පෙර විශ්‍රාම ගියේ නම්, ඔහුගේ විශ්‍රාම වැටුප හෝ ප්‍රධාන ප්‍රඥප්තියේ 57 වන වගන්තියට අනුව ගණන් බලන ලද විශ්‍රාම වැටුප හෝ යන දෙකෙන් වැඩි මුදල විශ්‍රාම වැටුප ලෙස ප්‍රදානය කළ යුතුවේ.
- පනතේ අ (2) (ඇ) (1) වගන්තියට අනුව 1981-07-02 වන දිනට පෙර රජයේ සේවයෙන් ව්‍යවස්ථාපිත මණ්ඩල සේවාවට ස්ථිරව මුදා හරින ලද දායකයින් සම්බන්ධයෙන් නම්, ඔහුගේ විශ්‍රාම වැටුපට සමාන මුදල හෝ ප්‍රධාන ප්‍රඥප්තියේ 57 වන වගන්තිය යටතේ ගණන් බැලූ මුදල හෝ යන මේ දෙකෙන් වැඩි මුදල විශ්‍රාම වැටුප ලෙස ප්‍රදානය කළ යුතු වේ.
- පනතේ 57 අ (2) (ඇ) (11) වගන්තියට අනුව 1981-07-02 වන දිනට පසු ව්‍යවස්ථාපිත මණ්ඩල ආදියට ස්ථිරවම සේවයෙන් මුදාහරින ලද දායකයින් සම්බන්ධයෙන් නම්, විශ්‍රාම වැටුප් ව්‍යවස්ථාවට අනුකූලව ගෙවනු ලබන විශ්‍රාම වැටුපට සමාන මුදලක් විශ්‍රාම වැටුප් ලෙස ප්‍රදානය කළ යුතු වේ.
- පනතේ 57 ඇ වගන්තියට අනුව 1970-04-01 වන දිනට පසු සිවිල් විශ්‍රාම වැටුප් ව්‍යවස්ථාව යටතට පැමිණ, වැන්දඹු අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදල් ආඥාපනත යටතේ දායකයන් වූ, ගුරු/වැන්දඹු අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදලේ දායකයෙකුගේ මරණය 1981-07-02 වන දිනට පසු සිදු වුනි නම්, එවැනි දායකයින්ගේ අර්ථලාභීන්ට, ඔවුන්ගේ සම්පූර්ණ හිමිකම්, සිවිල් වැන්දඹු අනත්දරු විශ්‍රාම වැටුප් කාර්යාලයෙන් ගෙවනු ලැබේ. මේ සඳහා පහත සඳහන් ක්‍රියා පිළිවෙත්ද අනුගමනය කළ යුතුයි.

1. ගුරු/ වැන්දඹු අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදලට, එවැනි ගුරුවරයෙකු වෙනුවෙන් රජය විසින් ගෙවන ලද දායක මුදල් සහ
2. එවැනි දායක මුදල් වලින් උපයන ලද පොලිය ඇතුළුව
3. ගුරු/වැ.අ.වි.වැ අරමුදලට ගෙවන ලද සියළුම දායක මුදල් ගුරු/වැ.අ.වි.වැ අරමුදල විසින් ඒකාබද්ධ අරමුදලට (ආදායම් ශීර්ෂ 7-1-1) බැර කළ යුතුය. ගුරු/වැ.අ.වි.වැ ක්‍රමය යටතේ කිසිම වාසියක් ලැබීමට එම අර්ථලාභීන්ට හිමිකමක් නැත.
4. පනතේ 57 ඇ (1) වගන්තියට අනුව විශ්‍රාම වැටුප් හිමි රජයේ නිලධාරියෙකු, සන්නද්ධ හමුදාවල සාමාජිකයකු වීම නිසා, මෙම අරමුදලට ගෙවූ කාලසීමාව සන්නද්ධ හමුදාවලට දායක මුදල් ගෙවූ කාලය සේ සැලකේ. ඒ අනුව සන්නද්ධ හමුදා පනත යටතේ විශ්‍රාම වැටුප් ප්‍රදානය කරනු ලබන බැවින් මෙම අරමුදලට ගෙවූ දායක මුදල් කිසිවක් ආපසු නොගෙවනු ලැබේ.
5. පනතේ 57 ඇ (2) වගන්තියට අනුව විවාහක රජයේ නිලධාරියෙකු සන්නද්ධ හමුදාවල සාමාජිකයෙකු වූ විට මෙම අරමුදලට දායක මුදල් දිගටම ගෙවීමට නිලධාරියා කැමැත්ත පළ කර ඇත්නම්, මෙම අරමුදල යටතේද විශ්‍රාම වැටුප් ප්‍රදානය කළ යුතු වේ.
6. පනතේ 57 අ හා 57 ඇ යටතේ විශ්‍රාම වැටුප් ප්‍රදානය කිරීමේදී පහත සඳහන් නියමයන්ටද යටත්විය යුතුවේ. එනම්:

- දායකයෙකු කලින් රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදලට දායකයෙකුව් සිටියේ නම්,එම අරමුදල දායක මුදල් ගෙවූ කාලසීමාව සඳහා අයවිය යුතු දායක මුදල් රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදලේ ප්‍රදානයෙන් අයකර ගත හැකිය.

- දායකයෙකුගේ විශ්‍රාම වැටුප් සඳහා ගණන් ගන්නා සේවා කාලයෙන් කිසියම් කාලසීමාවක් සඳහා අයකරන, නොකරන ලද දායක මුදලක් වෙතොත් එවැනි අයකුගේ කැමැත්ත ඇති ඔහුගේ වැටුප් එකතුවේ 4% බැගින් (කල්පිත වැටුපෙන්) අයවිය යුතු දායක මුදලට 4% ක පොළියත් සමඟ ඔහුට හිමි ඕනෑම මුදලකින් අයකර ගත හැක.

- යටතේ අයවිය යුතු දායක මුදලත් දායකයා ජීවත්ව සිටියදී නොපියවූයේ නම්, දායකත්වයේ ප්‍රතිලාභ භුක්ති විඳින පුද්ගලයා හෝ පුද්ගලයින් විසින් එසේ අයවිය යුතු මුදල හා එයට අදාල පොළිය ගෙවීමට කැමැත්ත පළ කිරීමට හෝ නොකිරීමට පුළුවන.එසේ නොගෙවන්නේ නම් දායක මුදල් නොගෙවූ කාලය තුළ සේවය කළ එක් එක් පූර්ණ මාසයක් සඳහා 1/600 බැගින් එම පුද්ගලයාට හෝ පුද්ගලයින්ට හිමි විශ්‍රාම වැටුපෙන් අඩු කළ යුතුයි.

- නිලධාරියෙකු විශ්‍රාම ගොස් මියයන අවස්ථාවලදී දායකයාගේ අඩු නොකළ විශ්‍රාම වැටුප් ප්‍රදානය කරනු ලැබේ.

- දායකයා සේවයේ සිටියදී මියයන අවස්ථාවලදී, ඔහු මියයන දිනයේ විශ්‍රාම ලැබුවාසේ සලකා එදිනට ඔහුට හිමිවන විශ්‍රාම වැටුප් ගණන් බලා එහි අඩු නොකළ විශ්‍රාම වැටුප ගෙවනු ලැබේ.

## 7.9 දායක මුදල් ආපසු ගෙවීමේදී ඉදිරිපත් කල යුතු ආකෘති පත්‍ර

| | දායකයාගෙන් ලබා ගත යුතු ආකෘති පත්‍ර | සේවා ස්ථානයෙන් ලබා ගත යුතු ආකෘති පත්‍ර | ඉදිරිපත් කල යුත්තේ |
|---|---|---|---|
| 1. අවිවාහකව රාජ්‍ය සේවය අවසන් කිරීමේදී | 1. දායකයාගේ අයදුම්පත<br>2. අවිවාහක දිවුරුම් ප්‍රකාශය<br>3. බැංකු ගිණුම් අංකය සහවැටුප් නාම සදහන් කර ගෙවීම් වවුචර<br>4.විශ්‍රාම වැටුප් ප්‍රදාන පත්‍රය | 1.චර්යා සටහන්<br>2.වැන්දඹු අනත්දරු විශ්‍රාම 16 ආකෘතිය මු.රේ1729<br>3.සේවා කාලය තුළ දායක මුදල් අයවීමේ වාර්තාව<br>4.ගෙවීම් නිර්දේශිත ලිපි | විශ්‍රාමවැටුප් අධ්‍යක්ෂ ජනරාල් වැන්දඹු අනත්දරු අංශය වෙත |
| 2.දරුවන් නොමැති වැන්දඹුවන් වැන්දඹු පුරුෂයන්ව සිට දායක මුදල් ඉල්ලීම | ඉහත 1 3 සහ 4 ට අමතරව<br>5.වැන්දඹු ප්‍රකාශය<br>6.දරුවන් නොමැති බවට දිවුරුම් ප්‍රකාශයක්<br>7.දරුවන් නොමැති බවට ප්‍රාදේශිය ලේකම් වාර්තාව<br>8.කලත්‍රයාගේ මරණ සහතිකය | ඉහත පරිදි | එම |

| | | | |
|---|---|---|---|
| 3.වැන්දඹු අනත්දරු විශ්‍රාම වැටුප් හිමිකම් ඇති දරුවන් නොමැති වැන්දඹුන් වැන්දඹු පුරුෂයන්ව සිට දායක මුදල් ඉල්ලීම | ඉහත 1 2 3 4 ට අමතරව<br>9.බාලම දරුවාගේ උප්පැන්න සහතිකය<br>10. බාලම දරුවා රැකියාවක නිරත නම් සේවා ස්ථානයේ ලිපිනය | ඉහත පරිදි | එම |
| 4.1981.07.02 පසුව දායක වී ඇති විශ්‍රාම වැටුපකට හිමිකම් නොමැතිව සේවය අවසන් කරන අවස්ථාවල දායක මුදල් ඉල්ලීම | ඉහත 1 සහ 3 | ඉහත 1 2 3 4 ට අමතරව සේවය අතහැරීම අස්වීම පහ කිරීමේ නියෝග ලිපිය | එම |

## ආකෘති පත්‍ර වර්ග ලබාගත හැකි ස්ථාන

| ආකෘති පත්‍ර වර්ගය | ලබා ගත හැකි ස්ථාන |
|---|---|
| 86 වැනි පොදු ආකෘති පත්‍රය<br>86 අ වැනි පොදු ආකෘති පත්‍රය<br>පොදු 224/ පොදු 224 අ<br>87 වැනි පොදු ආකෘති පත්‍රය<br>87 අ වැනි පොදු ආකෘති පත්‍රය | සේවය කරන රාජ්‍ය ආයතනය<br>රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව |
| වි. වි. අරමුදල 15 (වැන්දඹු ප්‍රකාශය) | ප්‍රාදේශීය ලේකම් කාර්යාලය<br>විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව |
| වැන්දඹු අනත්දරු විශ්‍රාම වැටුප් 16 ආකෘතිය<br>(මු. රෙ. 1729 වාර්තාව) | සේවය කරන රාජ්‍ය ආයතනය<br>රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව |
| අනත් 1 - භාරකාර දිවුරුම් ප්‍රකාශය.<br>අනත් 5/1, 5/2 - (අවුරුදු 21 - 26 අනත්දරු විශ්‍රාම වැටුප් ඉල්ලීම)<br>අනත් 6 - අනත්දරු විශ්‍රාම වැටුප් ගෙවීමේ ග්‍රාම නිලධාරී/ ප්‍රාදේශීය ලේකම් නිර්දේශය<br>අනත් 7 - 21 ට වැඩි දරුවන් අනත්දරු විශ්‍රාම වැටුප් නොඉල්ලීම<br>අනත් 8 - අනත්දරු දිවුරුම් ප්‍රකාශය | ප්‍රාදේශීය ලේකම් කාර්යාලය<br>විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව |
| අබා 1 - ආබාධිත මූලික ප්‍රකාශය<br>අබා 5 - ආබාධිත අනත්දරු සහතිකය ආකෘතිය<br>අබා 2 - භාරකාර දිවුරුම් ප්‍රකාශය | ප්‍රාදේශීයලේකම් කාර්යාලය<br>විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව |

## 7.10 වැන්දඹු/වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප් අංක නිකුත් කිරීම

| | |
|---|---|
| 1982- 07- 02 දිනෙන් පසු පත්වීම්ලත් නිලධාරීන් සඳහා | - 82/ 700000 සිට |
| වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප් නිලධාරිණියන් සඳහා | - 83/ 1 සිට |
| 1970- 04- 01 දිනට රාජ්‍ය සේවයේ සිටි ගුරුවරුන්ගේ | - 82/ 300000 සිට |
| සිවිල් වැන්දඹු අනත්දරු විශ්‍රාම වැටුප මාරු කළ විට 1993- 09- 01 දිනට පළාත් පාලන සේවයේ නිලධාරීන් | - 82/ 900000 සිට |
| සිවිල් වැන්දඹු අනත්දරු විශ්‍රාම වැටුප මාරු කළ විට පලාත් පාලන සේවයේ නිලධාරිණියන් සඳහා | - 83/ 500000 සිට |

| | | | | |
|---|---|---|---|---|
| 2005.12.31 | දස ලක්ෂ | නව ලක්ෂ | 900,000 | එම |
| 2006.01.01 සිට | එකලොස් | දස ලක්ෂ | 10,00,000 | එම |

### හිඟ දායක මුදල් ගණනය කිරීම හා අය කිරීම.

සේවා කාලය පදනම් කර ගණනය කරන ලද විශ්‍රාම වැටුපක් ලබන විශ්‍රාමිකයෙක් මියගිය විට වැන්දඹුවට/ වැන්දඹු පුරුෂයාට වැන්දඹු අනත්දරු විශ්‍රාම වැටුප් ගෙවීමේදී සේවා කාලයට දායක මුදල් අයවී නොමැති නම් හිඟ දායක මුදල් අයකළ යුතුයි.

### හිඟ දායක මුදල් ප්‍රධාන වශයෙන් කොටස් තුනකි

1. සේවා කාලය තුළ හිඟ දායක මුදල්.(අනිවාර්යයි)
2. නව ක්‍රමය යටතේ හිඟ දායක මුදල්
3. ගුරු වැන්දඹු අනත්දරු ක්‍රමය යටතේ හිඟ දායක මුදල්

### සේවා කාලය තුළ හිඟ දායක මුදල්

විශ්‍රාම වැටුප් කාර්යාලය 1966 වර්ෂය දක්වා එක් එක් දායකයා වෙනුවෙන් දායක මුදල් වර්ෂයක් පාසා ලේඛනගත කර ඇත. 1996 ට පෙර රාජ්‍ය සේවයට පැමිණි දායකයින් වැන්දඹු අනත්දරු විශ්‍රාම වැටුප් ගොනුවේ ඇති ගිණුම් පත්‍රයේ පත්වීම් ලත් දින සිට 1966 දක්වා දායක මුදල් සටහන් කරනු ලැබේ. එසේ යම්කිසි වර්ෂ ගණනක් ගිණුම්පත්‍රයේ සටහන් වී නොමැති නම් එම කාලයට හිඟ ගෙවිය යුතුය. අයවූ යයි සාධාරණ වැටහීමකින් පිළිගැනීමට හැකි නම් මාණ්ඩලික නිලධාරීන්ගේ නියෝගයක් අනුව අයවූ යයි සැලකිය හැකිය. මෙවැනි හිඟ දායක මුදලක් ඇතොත් එම හිඟ දායක මුදල සහ එදින සිට මියයන දිනය තෙක් 4% වැල් පොළියක් සමඟ ගණනය කර ගෙවීමේදීම අයකර ගත යුතුය.

| | | |
|---|---|---|
| දායක මුදල් ආරම්භ කළ දිනය | - | 1959- 01- 01 |
| දායකයා මියගිය දිනය | - | 1978- 12- 31 |

ගිණුම් පත්‍රයේ සටහන් වී ඇති ආකාරය

| | රුපියල් |
|---|---|
| 1959- 01-01 වැටුප | 414.00 |
| 1960 | 444.00 |
| 1961 | 454.00 |
| 1962 | - |
| 1963 | - |
| 1964 | - |
| 1965 | 594.00 |
| 1966 | 624.00 |

**නව ක්‍රමය යටතේ දායක මුදල්**

1981- 07- 02 දින සංශෝධන පනත අනුව සෑම දායකයෙකුම ලබා ගත් අඩු නොකළ විශ්‍රාම වැටුප වැන්දඹුවට ගෙවීමට තීරණය කරන ලදි. ඒ අනුව මුළු සේවා කාලයට දායක මුදල් ගෙවා තිබිය යුතුය. එසේ ගෙවා නොමැති නොගෙවූ කාලයට දායක මුදල් ගණනය කර හිඟ අය කිරීම නව ක්‍රමය යටතේ හිඟ අය කිරීම වේ. සේවා කාලය පදනම් කරගෙන විශ්‍රාම වැටුප් ගණනය කර ඇති සෑම විශ්‍රාමිකයෙක්ම මියයෑමෙන් පසු වැන්දඹු විශ්‍රාම වැටුප ගෙවීමේදී නව ක්‍රමය යටතේ ශුද්ධ සේවාකාලයට දායක මුදල් අයවී නොමැති නම් අයකළ යුතුය. (සිවිල් විශ්‍රාම වැටුප් අංක එක් ලක්ෂ,දෙලක්ෂ, පන් ලක්ෂ අනූ දහස්, හත් ලක්ෂ අනූ දහස්, අට ලක්ෂ කාණ්ඩවලට අයත් විශ්‍රාමිකයන්ගෙන්ය.)

**නව ක්‍රමය යටතේ හිඟ දායක මුදල් ගණනය කිරීම (විවැ චක්‍රලේඛ 14/2001 2001. 12. 20)**

**උදාහරණ 1**

විශ්‍රාම ගිය දිනය - 1997.09.06
දායකයා මියගිය දිනය - 1991.12.23
ශුද්ධ සේවා කාලය - මාස 295
විශ්‍රාම වැටුප් සහිත සේවයට බැඳුනු දිනය - 1966.04.07
දායක මුදල් ගෙවා ඇති කාලය - විශ්‍රාම ගිය දිනය
- දායක මුදල් ගෙවීම ආරම්භ කල දිනය

1997.09.06
1966.04.07
11.05

- දායක මුදල් අයකල කාලය මාස = 137
- දායක මුදල් අය නොකල කාලය මාස = 295 - 137 = 158 (වර්ෂ 13 මාස 02)

මේ අනුව නිලධාරියා විශ්‍රාම වැටුප් රහිත තනතුරට පත් වූ දිනය = ආරම්භක දිනය - හිඟ කාලය
= 1966.04.07
13.02
53.02.07

මේ අනුව 1953.02.07 සිට 1966.04.06 දක්වා හිඟ දායක මුදල් අයකළ යුතුය. ආරම්භක වැටුපෙන් 4% බැගින් 4% වැල් පොළියත් සමඟ අයකළ යුතුය.

මෙම ආරම්භක වාර්ෂික වැටුප රු. 624/= නම්

- 1966.02.07 දින තෙක් හිඟ දායක මුදල් වැල් පොළිය සමඟ රු. 428.76 කි.
- දායක මුදල් ගෙවීම් ආරම්භක දිනයේ සිට මියගිය දිනය දක්වා ඉහත හිඟ මුදලට 4% බැගින් අදාල පොළිය රු. 440.19

| | |
|---|---|
| 428.76 x 4/100 x අවු. 25 යි මාස 08 (25.66) | = රු. 440.19 |
| මේ අනුව අයකළ යුතු මුළු හිඟ දායක මුදල් | = රු. 428.76 + 440.19 |
| | = රු. 868.95 |

## ගුරු වැන්දඹු අනත්දරු හිඟ දායක මුදල්

නිලධාරියා ගුරුවරයෙකු වනවිට 1970- 04- 01 දිනට පෙර පත්විමක් නම් ගුරු වැන්දඹු අනත්දරු ක්‍රමය යටතේ හිඟ ගණනය කර ගොනුවේ සටහන් කර ඇත. එම හිඟ මුදල ප්‍රථම ගෙවීමෙන් අයකළ යුතුය.

දායක මුදල් අයකිරීමේ විවිධත්වය හා ගැටළු දායක බව සැලකිල්ලට ගෙන විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තු 3/ 2008 චක්‍රලේඛය නිකුත් කර ඇත. ඊට අනුව පහත සඳහන් උපදෙස් මත හිඟ දායක මුදල් ගණන් කළ යුතුවේ.

2006.01.01 දිනෙන් පසු වැන්දඹු/ වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප් සඳහා දායක මුදල් අයකළ යුත්තේ පහත සඳහන් පරිදිය.

| | |
|---|---|
| ප්‍රාථමික හා ද්විතියික මට්ටම | 6% |
| තෘතීක හා ජ්‍යෙෂ්ඨ මට්ටම | 7% |

2006 වසරට පෙර වැන්දඹු අනත්දරු විශ්‍රාම වැටුප් දායක මුදල් අයකිරීමේදී ඒ ඒ කාලසීමා වලදී විවිධ ප්‍රතිශතයන් භාවිතා කොට ඇත. එබැවින් හිඟ දායක මුදල් අයකිරීමේදී ගණන් බැලීම ගැටළු සහගත බවට පැමිණිලි ලැබී ඇත. මෙම කරුණ සලකා 2006- 01- 01 දිනට පෙර හිඟ දායක මුදල් අයකිරීමේදී පහත සඳහන් පරිදි අය කිරීම අනුමත කර තිබේ.

| | | | |
|---|---|---|---|
| 2004.11.30 දක්වා | - | ඒකාබද්ධ වැටුප | |
| | | 70260 දක්වා | 6% |
| | | 70261 සිට | 7% |
| 2004.12.01 දින සිට | - | ඒකාබද්ධ වැටුප | |
| 2005.12.31 දින දක්වා | | 124260 දක්වා | 6% |
| | | 124261 සිට | 7 |

ගණන් බලන ලද දායක මුදලේ එකතුවට 4% ක පොළී අනුපාතයක් එකතු කළ යුතු බව වේ.

## ත්‍රස්තවාදී හේතු මත මියයන දායකයින්

- රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 369 අනුව ගෙවීම් කරනු ලැබේ.
- දායකයාගේ වයස අවු. 55 වන තුරු අදාළ සේවා ස්ථානයෙන් වැටුප ගෙවනු ලැබේ.
- වැන්දඹු විශ්‍රාම වැටුප ද මිය ගිය දිනට පසු දින සිට හිමිවේ.
- වැන්දඹු විශ්‍රාම වැටුප ගෙවනු ලබන්නේ මියගිය දිනට ඇති වැටුප මත ඒ දින පැවති විශ්‍රාම වැටුප ගණනය කිරීමේ පදනම මතයි.

කලත්‍රයාට මාසිකව ගෙවනු ලබන වැටුපෙන් වැන්දඹු අනත්දරු විශ්‍රාම වැටුප් දායක මුදල් අය නොකළ යුතුය.දායකයාට වයස අවු. 55 පිරුණු දිනට ගෙවනු ලබන මාසික වැටුප නතර කරනු ලැබේ. එදිනට ගෙවන ලද වැටුප වැන්දඹු විශ්‍රාම වැටුප සංශෝධන කරනු ලැබේ.

## සේවයෙන් පහ කරන/ ඉල්ලා අස්වන නිලධාරීන්ගේ වැන්දඹු විශ්‍රාම වැටුප් එවැනි නිලධාරීන්/සේවයෙන් වෙනුවෙන්

1981- 07- 02 පෙර රාජ්‍ය සේවයේ ස්ථිර විශ්‍රාම වැටුප් තනතුරක් ලබාගත් නිලධාරීන් සේවයෙන් පහකරන/ ඉල්ලා අස්වන දිනට විවාහක නම් දායකයා මියගිය පසු වැන්දඹු විශ්‍රාම වැටුපක් හිමිවේ.

1981- 07- 02 පසු පත්වීම් ලත් නිලධාරීන් ඉල්ලා අස්වුවහොත් හෝ සේවයෙන් පහකළහොත් වැන්දඹු විශ්‍රාම වැටුපක්ද හිමි නොමැත. ගෙවන ලද වැන්දඹු අනත්දරු විශ්‍රාම වැටුප් දායක මුදල් පොලී රහිත ආපසු ගෙවනු ලැබේ .

## වැන්දඹු/ වැන්දඹු පුරුෂ අනත්දරු විශ්‍රාම වැටුප ගණනය කිරීම

1981 අංක 44 දරන වැන්දඹු අනත්දරු විශ්‍රාම වැටුප් සංශෝධන පනතේ 57 වගන්තිය අනුව 1981- 07- 02 දිනෙන් පසු මියගිය සියළුම රාජ්‍ය සේවකයින්ගේ වැන්දඹුවනට හෝ අනත්දරුවනට ගෙවන අනත්දරු විශ්‍රාම වැටුප පැරණි ගණන දීමේ ක්‍රමයෙන් ඉවත්වී සිවිල් විශ්‍රාම වැටුප පදනම් කරගෙන ගෙවිය යුතු බව දක්වා ඇත.

- මේ අනුව 1981- 07- 02 දින සිට විශ්‍රාම ලබා මියයන දායකයින්ගේ වැන්දඹුවනට හෝ අනත්දරුවනට ගෙවන වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප ඔහු වෙත ප්‍රදානය කරන ලද අඩු නොකළ විශ්‍රාම වැටුපට සමාන විය යුතුය.
- එහෙත් වැන්දඹු අනත්දරු විශ්‍රාම වැටුප ගණනය කිරීමේදී පහත සඳහන් අවස්ථාවන්හිදී පනතේ විධිවිධාන අදාල කර ගත නොහැකිය. එනම්
    - ආයතන සංග්‍රහයේ දක්වා ඇති හේතු මත (අකාර්යක්ෂමතාවය/ වෛද්‍ය හේතුන් මත විශ්‍රාම ගැන්වූවන්)
    - අනිවාර්ය විශ්‍රාම වයසට එළඹීමට පෙර විශ්‍රාම ලැබූ අය - වයස අවු. 55- 60 අතර විශ්‍රාම ගත් අය
    - ගුරුවරියන්/ හෙදියන් සේවාකාලය අවු. 20 හෝ වයස අවු. 50

    මෙම අවස්ථාවේ ගෙවිය හැක්කේ විශ්‍රාම වැටුප් ව්‍යවස්ථාව යටතේ ගණනය කළ විශ්‍රාම වැටුපකි.

- සිවිල් විශ්‍රාම වැටුප් හාර ලක්ෂ හා පන් ලක්ෂ (1985- 01- 01 දින සිට 1990- 08- 31 දින දක්වා කාලය තුළ විශ්‍රාම ලැබූවන්) යටතේ සිවිල් විශ්‍රාම වැටුප් ලැබූවන්ගේ විශ්‍රාම වැටුප ගණනය කර ඇත්තේ වැටුප වයසට අනුව ප්‍රතිශත පදනම් කරගෙනය. සේවා කාලය පිළිබඳව සැලකීමක් නොමැතිව සිවිල් විශ්‍රාම වැටුප් ගණනය කළ හෙයින් මෙම කාලය තුළ සේවයේ සිටියදී මියගිය හෝ විශ්‍රාම ලබා මියයන නිලධාරීන් වෙනුවෙන් වැන්දඹු අනත්දරු විශ්‍රාම වැටුප් පනතේ විධිවිධාන උපයෝගී කරගත නොහැකිය. ඒ අනුව අදාල ප්‍රතිශත වගු අනුව ගණනය කළ අඩු නොකළ විශ්‍රාම වැටුප වැන්දඹු අනත්දරු විශ්‍රාම වැටුප ලෙස ගෙවිය යුතුය.

## 7.11 සේවයේ යෙදී සිටියදී මියයන රාජ්‍ය සේවකයින්ගේ වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප ගණනය කිරීම

1981 අංක 44 සංශෝධන පනතේ 20 වගන්තිය අනුව අඩු සේවා කාලයක් සහිතව මියයන හෝ විශ්‍රාම යන දායකයින්ට අවු. 25 ක උපරිම සේවා කාලයකට යටත්ව වැන්දඹු අනත්දරු විශ්‍රාම වැටුපක් ගෙවිය හැකිය.

ඒ අනුව විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා සංග්‍රහයේ 2 වන වගන්තිය අනුව සේවා කාලය වසර 25 ක විශ්‍රාම වැටුප් සහිත සේවා කාලයක් සඳහා හෝ ඔහු මිය නොගියේ නම් අනිවාර්ය විශ්‍රාමයාමේ වයස එලඹීමේදී ඔහු

විසින් සම්පූර්ණ කළ හැකි වූ විශ්‍රාම වැටුප් හිමි සේවා කාලයක් සඳහා හෝ යන දෙකින් වඩා කෙටි කාලය සඳහා ගෙවිය යුතු විශ්‍රාම වැටුපට සමාන මුදලක් වැන්දඹු අනත්දරු විශ්‍රාම වැටුප ලෙස ගෙවිය හැකිය.

උදාහරණ 1

| | |
|---|---|
| උපන් දිනය | - 1965.01.01 |
| මුල් පත්වීමේ දිනය | - 1987.01.01 |
| මියගිය දිනය | - 1998.01.01 |
| සේවා කාලය | - අවු: 11 |
| අවසන් වාර්ෂික වැටුප | - රු. 84,000.00 |

### විශ්‍රාම වැටුප් ව්‍යවස්ථාව අනුව හිමි සිවිල් විශ්‍රාම වැටුප

| | |
|---|---|
| අවු. 25ක සේවා කාලයට අදාල ප්‍රතිශතය | = 79% |
| අඩු කිරීම් := (25-11) x 2 | = 28 |
| හිමි ප්‍රතිශතය | = 79 - 28= 51 |
| ඒ අනුව හිමි විශ්‍රාම වැටුප | = 84000 x 51 / 100 = රු. 42840.00 |

### වැන්දඹු අනත්දරු පනත අනුව හිමි වැන්දඹු අනත්දරු විශ්‍රාම වැටුප

| | |
|---|---|
| වයස අවු. 60 පිරෙන දිනය | = 1965 + 60 = 2025 |
| එදින තෙක් ජීවත් වී නම් සේවා කාලය | = අවු. 38 |
| වැන්දඹු අනත්දරු විශ්‍රාම වැටුප සඳහා ගණන් ගත හැකි කාලය | = අවු. 25 |
| ඒ අනුව ගෙවිය හැකි වැන්දඹු අනත්දරු විශ්‍රාම වැටුප | = 84000 x 79 |
| | = රු. 66360.00 |

උදාහරණ 11

ඉහත උදාහරණයේම උපන්දිනය 1946- 01- 01 ලෙසත් මුල් පත්වීමේ දිනය 1968- 01- 01 ලෙසත් සැලකුවහොත්

| | |
|---|---|
| සිවිල් විශ්‍රාම වැටුප | |
| සේවා කාලය | = අවු. 31 |
| අවු. 30 අදාල ප්‍රතිශතය | = 90% |
| හිමිවිය යුතු සිවිල් විශ්‍රාම වැටුප | = 84000.00 ₀ 90% |
| | = රු. 75600.00 |

මෙහිදී සේවා කාලය අවු. 25 ට වැඩිවන හෙයින් ඉහත උදාහරණ 1 පරිදි වැන්දඹු අනත්දරු විශ්‍රාම වැටුප ගණනය කිරීමේ අවශ්‍යතාවයක් ඇති නොවේ. ඒ අනුව වැන්දඹු අනත්දරු විශ්‍රාම වැටුප ලෙස සිවිල් විශ්‍රාම වැටුප වන රු. 75600.00 ගෙවිය හැකිය.

**විශේෂ කරුණු :-**

වැටුප් රහිත නිවාඩු - එක් අවුරුද්දක් දක්වා වැටුප් රහිත නිවාඩු නොසලකා හරින අතර ඊට වැඩි කාලය සඳහා මාසයක් හෝ ඉන් කොටසක් සඳහා 0.2% බැගින් අඩු කළ යුතුය.

## 7.12 වැන්දඹු අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක මුදල් අයකිරීම හා ගිණුම් ගත කිරීම

මේ සඳහා විශ්‍රාම වැටුප් චක්‍රලේඛ 1/ 2001 සහ 14/ 2001 චක්‍රලේඛ මඟින් සියළුම අමාත්‍යාංශ ලේකම්වරු, දෙපාර්තමේන්තු ප්‍රධානීන්, පළාත් සභා ප්‍රධාන ලේකම්වරු ඇතුළු සියළුම ආයතන ප්‍රධානීන්හට අවශ්‍ය උපදෙස් නිකුත් කර ඇත.

වැටුප් ගෙවීමේදී වැන්දඹු අනත්දරු ක්‍රමයට දායක නොවන වෙනත් අරමුදලකට දායකවිය යුතු සාමාජිකයින් සිටිය හැකිය. ඔවුන්ගේ දායක මුදල් අදාල අරමුදලට බැර කිරීමට හෝ ප්‍රේෂණය කිරීමට පියවර ගත යුතුය.

උදාහරණ වශයෙන්,

- රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදලේ සාමාජිකයින්ගෙන් (විශ්‍රාම වැටුප් හිමිකම රහිත නිලධාරීන්) අයකරන මුදල් එම අරමුදලට බැර කිරීම හෝ එම කාර්යාලයට ප්‍රේෂණය කිරීම කළ යුතුය.
- පිරිවෙන් හා පෞද්ගලික පාසල්වල සේවයේ නියුතු අනුමත කාර්ය මණ්ඩලයට අයත් ගුරුවරුන්ගේ වැන්දඹු අනත්දරු විශ්‍රාම වැටුප් අයකිරීම් ගුරු වැන්දඹු අනත්දරු අරමුදලට බැර කිරීම/ ප්‍රේෂණය කිරීම කළ යුතු වේ. මෙම අයකිරීම් පිළිබඳව අදාල ලේඛන නිසි පරිදි නඩත්තු කිරීම හා ඉල්ලූ විටක ප්‍රධාන කාර්යාලය වෙත ඉදිරිපත් කිරීම කළ යුතු වේ.

පලාත් අධ්‍යාපන දෙපාර්තමේන්තු සහ කලාප අධ්‍යාපන කාර්යාල මේ පිළිබඳව අවධානය යොමු කළ යුතුවේ.

## 7.13 වැන්දඹු අනත්දරු දායක මුදල් අය කිරීම සහ ආපසු ගෙවීම

වැන්දඹු අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදල් ආඥා පනතින් ඊට දායක මුදල් ගෙවනු ලැබූ විට අදාළ හිමිකම් ලබාගත හැකි විය. දායක මුදල් ගෙවීම වසර 35 ක් හෝ වයස අවුරුදු 65 දක්වා කල හැකි විය. යම් රාජ්‍ය නිලධාරියෙකුගේ සේවා කාලය වසර 35 ක් ඉක්මවන විට එතැන් පටන් දායක මුදල් ගෙවීම නතර කර ගැනීමට අවස්ථාව පැවතුණි. එමෙන්ම විශ්‍රාම ලැබීම සේවය අතහැර යාම හෝ ඉල්ලා අස්වූ නිලධාරියෙකුට වුවද වයස අවුරුදු 65 දක්වාම දායක මුදල් ගෙවීමේ හැකියාව පැවතුණි.

වඩාත් වැදගත් වූයේ හිමිකම් ලැබීමට නම් දායක මුදල් ගෙවන කාල සීමාව තුල විවාහ වී සිටිමයි. ඒ අනුව විශ්‍රාම දිනය දක්වා දායක මුදල් අය කිරීමක් නොවීය. අදාළ හිමිකම් ගණනය කරනු ලැබූවද නිලධාරියාගේ විශ්‍රාම වැටුප මත නොව ජීව ගණක ක්‍රමය පාදක කොටගෙනය. 1981 සංශෝධන පනත අනුව විශ්‍රාම වැටුප ගණන් බැලීමම වැන්දඹු අනත්දරු විශ්‍රාම වැටුප් විශ්‍රාම වැටුප ගණන් බැලීමේ පදනම විය. ඒ අනුව දායක මුදල් අයකිරීමටද විශ්‍රාම ලබන දින දක්වාම කල යුතු විය. අද රාජ්‍ය සේවයේ ස්ථිර විශ්‍රාම වැටුප් සහිත තනතුරකට පත්වන පුද්ගලයකු විශ්‍රාම දින දක්වාම දායක මුදල් ගෙවීම කල යුතු විය. විශ්‍රාම වැටුප් ගණනයේදී ස්ථිර විශ්‍රාම වැටුප් සහිත සේවා කාලයට පෙර පැවති වෙනත් ගණනය කල හැකි සේවා කාලයන්ද එමෙන්ම වැටුප් රහිත සේවා කාලයද සැලකිල්ලට ගන්නා බැවින් එම කාලයටද අදාළව වැන්දඹු අනත්දරු දායක මුදල් අය කල යුතුය. දායක මුදල් අය කිරීම කාලානුරූපව පහත සඳහන් පරිදි වෙනස් විය.

මුල සිට 1970.03.31 දක්වා
- 4% කල්පිත වැටුපට ගුරුවරුන්ට
- 4% කල්පිත වැටුපට වෙනත් නිලධාරීන්

1975.04.01- 1975.03.31
- දක්වා - 4% කල්පිත වැටුපට අනුව පොදුවේ සියලුම නිලධාරීන්ට

**සියලුම නිලධාරීන්ට පොදුවේ**

75.04.01 සිට 77.05.30 දක්වා
- 3600/- දක්වා ඒකාබද්ධ වැටුප අනුව 2%
- 3601/- සිට 9600/- දක්වා 3 %
- 3601/- සිට 4%

77.06.01 සිට 77.11.30 දක්වා
- 3600/- දක්වා ඒකාබද්ධ වැටුප අනුව 2%
- 3601/- සිට 10680/- දක්වා 3 %
- 10681/- සිට ඉහලට 4%
- ඒකාබද්ධ වැටුප රු.1080/-එකතු කරන්න

77.12.01 සිට 81.12.31 දක්වා
- 3600/- දක්වා 2%
- 3601/- සිට 10680/- දක්වා 3 %
- 10681/- සිට ඉහලට 4%
- ඒකාබද්ධ වැටුප රු.1080/-එකතු කරන්න

82.01.01 සිට 85.12.31 දක්වා
- නව ඒකාබද්ධ වැටුප
- 8580/- දක්වා 1 1/2 %
- 8581/- සිට 15600/- දක්වා 3 %
- 15601/- සිට ඉහලට 4%



15 - H39510

86.01.01 සිට 87.12.31 දක්වා - 8640/- දක්වා 1 1/2 %
- 8641/- සිට 15600/- දක්වා 3%
- 15601/- සිට ඉහලට 4%

88.01.01 සිට 88.12.31 දක්වා - 17280/- දක්වා 1 1/2 %
- 17281/- සිට 28800/- 3%
- 28801/- සිට ඉහලට 4%

89.01.01 සිට - 17280/- දක්වා 3 %
- 17281/- සිට 28800/- 5%
- 28801/- සිට ඉහලට 6%

93.01.01 සිට - 23400/- දක්වා 3 %
- 23400/- 35700/- 5%
- 35701/- සිට ඉහලට 6%

97.01.01 සිට - 45600/- දක්වා 4 %
- 45601/- 70260/- දක්වා 6%
- 70261/- වැඩි 7%

2004.12.01 සිට - 124260/- හෝ ඊට අනුව 6 %
- 45601/- වැඩි 6%
– 124260/- වැඩි 7%

| | | | |
|---|---|---|---|
| 2005.12.31 | දස ලක්ෂ | නව ලක්ෂ | 900,000 |
| 2006.01.01 සිට | එකලොස් | දස ලක්ෂ | 100,000 |

වැන්දඹු පුරුෂ හා අනත්දරු දායක මුදල් සඳහා

මුලසිට -1975.03.31 දක්වා 4% බැගින් කල්පිත වැටුප අනුව සියලුම නිලධාරිනියන් ගෙන් පොදුවේ අය කෙරේ.

1975.04.01 සිට 77.05.30 දක්වා - ඒකාබද්ධ වැටුපට 4% බැගින්

77.06.01 සිට 77.11.30 දක්වා - ඒකාබද්ධ වැටුපට 4% බැගින්
- ඒකාබද්ධ වැටුප රු.1080/-එකතු කරන්න

77.12.01 සිට 81.12.31 දක්වා - 3600/- දක්වා 2%
- 3601/- සිට 10680/- දක්වා 3 %
- 10681/- සිට ඉහලට 4%
- ඒකාබද්ධ වැටුප රු.1080/-එකතු කරන්න

| | |
|---|---|
| 82.01.01 සිට 83.07.31 දක්වා | - නව ඒකාබද්ධ වැටුප අනුව<br>- ඒකාබද්ධ වැටුප 4 % බැගින් |
| 83.08.01 සිට 85.12.31 දක්වා | - නව ඒකාබද්ධ වැටුප අනුව<br>- රු 8580/- දක්වා 1 1/2%<br>- 8581/- සිට 15600/- දක්වා 3%<br>- 15601/- සිට ඉහලට 4% |
| 88.01.01 සිට 88.12.31 දක්වා | - 17280/- දක්වා 1 1/2 %<br>- 17281/- සිට 28800/- 3%<br>- 28801/- සිට ඉහලට 4% |
| 89.01.01 සිට 1992.12.31 | - 17280/- දක්වා 3 %<br>- 17281/- සිට 28800/- 5%<br>- 28801/- සිට ඉහලට 6% |
| 93.01.01 සිට 96.12.31 | - 23400/- දක්වා 3 %<br>- 23400/- සිට 35700/- දක්වා 5%<br>- 35701/- සිට ඉහලට 6% |
| 97.01.01 සිට 2004.11.30 | - 45600/- දක්වා 4 %<br>- 45601/- 70260/- දක්වා 6%<br>- 70261/- සිට ඉහලට 7% |
| 2004.12.01 සිට | - 124260/- දක්වා 6 %<br>- 124260/- වැඩි 7% |

| | | | |
|---|---|---|---|
| 2005.12.31 | දස ලක්ෂ | නව ලක්ෂ | 900,000 |
| 2006.01.01 සිට | එකලොස් | දස ලක්ෂ | 100,000 |

**2 1/2% ක පොළී සහිතව දායක මුදල් ආපසු ගෙවන අවස්ථා**

- අවිවාහක තත්ත්වයෙන් සිට රාජ්‍ය සේවය අවසන් වූ විට.
- දරුවන් නොමැති වැන්දඹු/ වැන්දඹු පුරුෂයෙකු ලෙස රාජ්‍ය සේවය අවසන් වනවිට.

**පොළී රහිතව දායක මුදල් ආපසු ගෙවිය හැකි අවස්ථා**

- විශ්‍රාම වැටුපකට හිමිකම් ඇති දරුවන් නොමැති වැන්දඹුවකට/ වැන්දඹු පුරුෂයෙකුට කලත්‍රයා මියගිය දිනය හෝ සේවයේ යෙදී සිටින බාලම දරුවාට වයස අවුරුදු 26 පිරෙනදිනය හෝ බාලම දරුවා ස්ථිර රැකියාවක නිරත වන දිනය හෝ යන දිනයන්ගෙන් පසුව එළඹෙන දින සිට ගෙවී ඇති දායක මුදල් ප්‍රමාණය ආපසු ලබා ගත හැකිය.

- විශ්‍රාම වැටුපකට හිමිකමක් නොලබා සේවය අවසන් වන අවස්ථාවලදී සේවා කාලය තුළ අරමුදලට ගෙවා ඇති දායක මුදල ආපසු ලබාගත හැකිය. මෙම හිමිකම 1981- 07- 02 ට පසුව ලැබී ඇත. (1998 අංක 37 දරන වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදල් (සංශෝධන) පනත අනුව වයස අවුරුදු 55 සම්පූර්ණවීමෙන් පසු මෙම (ආ) අවස්ථාව යටතේ 2 % ක පොලී සමඟ දායක මුදල් ගෙවිය යුතුය

## 7.14 පනත් සංශෝධන

### 7.14.1 වැන්දඹු අනත්දරු විශ්‍රාම වැටුප් පනත් වැඩි ප්‍රතිලාභ හිමිවන පරිදි සංශෝධනය කිරීම.

- මෙම සංශෝධනයන්ට අනුව සහන රැසක් ස්ථාපිත කෙරුණි.
- ත්‍රස්තවාදී හේතු මත මිය යන රාජ්‍ය නිලධාරින්ට වයස අවු: 55 දක්වා වැටුප් ගෙවන හෙයින් එදිනට හිමි වැටුප මත වැන්දඹු අනත්දරු විශ්‍රාම වැටුප ලබා ගැනීමේ හැකියාව ඇති කිරීම.
- අනියම් හා තාවකාලික තනතුරු දරණ ත්‍රස්තවාදී හේතු මත මිය යන රාජ්‍ය නිලධාරින්ගේ කලත්‍රයාට හා අනත්දරුවන්ට වැන්දඹු අනත්දරු විශ්‍රාම වැටුප් හිමිකම ලබා දීම.
- වයස අවු: 26 අඩු අනත්දරුවන්ට ( ගැහැණු හා පිරිමි දරුවනට) සමාන අවස්ථා ලබා දීම.
- විශ්‍රාම යන දිනට වැන්දඹු අනත්දරු විශ්‍රාම වැටුප් හිමිකම ලබන අර්ථලාභින් නොමැති රාජ්‍ය නිලධාරින්ගෙන් අයකර ගන්නා ලද සම්පූර්ණ දායක මුදල් ආපසු දායකයන්ට ලබා දීම.
- තනතුරු අහෝසි කරන ලද නිලධාරින්ගෙන් කලත්‍රයනට වැන්දඹු අනත්දරු විශ්‍රාම වැටුප් ලබා ගැනීම හැකියාව ඇති කිරීම.
- සේවය අතහැර හෝ සේවයෙන් පහකල රාජ්‍ය නිලධාරින්ගේ වැන්දඹුවනට වැන්දඹු අනත්දරු විශ්‍රාම වැටුප් හිමිකම ලබා දීම.
- යලි විවාහ වන වැන්දඹුවන් වෙත විශ්‍රාම වැටුපෙන් හරි අඩක් (50%) ගෙවීම
- අමාත්‍ය කාර්යය මණ්ඩල සඳහා හිමිකම් ලබා දීම

මෙම සංශෝධන වැන්දඹු අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදල් පනතට මෙන්ම වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප් පනතට අදාළ වේ.

### 7.14.2 1953 අංක 44 දරණ පාසැල් ගුරුවරුන්ගේ විශ්‍රාම ගැන්වීමේ පනත සංශෝධනය

1961 දී රජයට පෞද්ගලික පාසැල් පවරා ගැනීමේදී ඇතැම් පාඨශාලා පවරා නොගැණුනි. එම පෞද්ගලික පාසැල් ගුරු භවතුන්ට රජයෙන් වැටුප් ගෙවූ අතර දායක මුදල් ගෙවමින් රජයේ විශ්‍රාම වැටුප් ප්‍රතිලාභ හිමිකර ගැනීමටද හැකි විය. ගුරුවරුන්ට විශ්‍රාම වැටුපට අමතරව වැන්දඹු අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයටද දායක වීමට හැකි විය. නමුත් මෙම පාඨශාලාවල සේවය කරන ගුරුවරියකට විශ්‍රාම වැටුප් හිමිකම පැවතියද වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුපට හිමිකම් කීමට අවශ්‍ය නීතිමය ප්‍රතිපාදන සලසා තිබුනේ නැත. එම අඩුව සපුරාලීමේ පරමාර්ථයෙන් 1953 පාසල් ගුරුවරුන්ගේ විශ්‍රාම ගැන්වීමේ පනත සංශෝධනයට කටයුතු කෙරුණි. එම පනත 2008 අගෝස්තු 07 දින පාර්ලිමේන්තුවේදී සම්මත විය. මේ අනුව 1983 වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප් පනතෙහි විධිවිධාන අනුව රජයේ වැටුප් ලබන පෞද්ගලික පාඨශාලාවල ගුරුවරියනටද මෙම ක්‍රමයට දායක වීමට නීතිමය ප්‍රතිපාදන සැලසේ. එමෙන්ම ඉහත පාඨශාලාවල දැනට සේවයේ යෙදී සිටින ගුරුවරියන්ද විශ්‍රාම ලබා ඇති ගුරුවරියන්ටද මෙම ක්‍රමයට දායක විය හැක. ගුරුවරිය මියගොස් ඇත්නම් ඇයගේ ස්වාමියාට හෝ අනත්දරුවන්ට හා ආබාධිත අනත්දරුවන්ට මෙම වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක විය හැකිවේ. ඒ අනුව 3500 ක් පමණ වන ගුරුවරියන්ටත් ඔවුන්ගේ ස්වාමි පුරුෂයන් හා අනත්දරුවනට මෙම ක්‍රමයේ ප්‍රතිලාභ සඳහා හිමිකම් කිව හැකිය.

### 7.14.3 1970 අංක 18 දරන වැන්දඹු අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රම ( සන්නද්ධ බල සේනා) පනත සංශෝධනය

වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් ( සන්නද්ධ හමුදා )පනත හා ඒ යටතේ පනවන ලද නියෝග මාලාවට අනුව සන්නද්ධ හමුදා සාමාජිකයන්ට වැන්දඹු අනත්දරු විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමයට බැඳීමට අවස්ථාව ලැබේ. එම අවස්ථාව හමුදා සාමාජිකාවන්ටද 1983 දී හිමිවිය . නිත්‍ය හමුදා සාමාජිකයන්ට විශ්‍රාම වැටුප් හිමිකම හා වැන්දඹු අනත්දරු විශ්‍රාම වැටුප් හිමිකම් ලැබුණි. නමුත් සන්නද්ධ හමුදා ස්වේච්ඡා බල සේනාංක සාමාජිකයනට හිමිව ඇත්තේ විශ්‍රාම වැටුප් හිමිකම පමණි. වැන්දඹු අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට බැඳීමට ඔවුනට නීතිමය ප්‍රතිපාදන නොතිබුණි.

මෙහි අවාසනාවන්ත තත්වය නම් යුද්ධයකදී මියයන නිත්‍ය හමුදා සාමාජිකයන්ගේ වැන්දඹුවට හා අනත්දරුවන්ට එකී වැන්දඹු අනත්දරු විශ්‍රාම වැටුප් හිමිවුවත් එම යුද්ධයේදීම මියයන ස්වේච්ඡා බලසේනා සාමාජිකයන්ගේ වැන්දඹුව හා අනත්දරුවන්ට එම ප්‍රතිලාභ හිමි නොවීමත්ය. එය බෙහෙවින් අසාධරණ තත්වයකි. මෙම ගැටලුව විසඳීමට ඉහත සන්නද්ධ හමුදා වැන්දඹු හා අනත්දරු පනත සංශෝධනය කරන ලදී. ඊට අනුව දැනට සේවයේ යෙදී සිටින ස්වේච්ඡා බලසේනා සාමාජිකයන්ට හා විශ්‍රාමික සාමාජිකයන්ට ඊට මනාපය පලකල හැකිය. එමෙන්ම සාමාජිකයා මියගොස් ඇත්නම් ඔහුගේ භාර්යාවට හා අනත්දරුවන්ට ඊට මනාපය පලකර ප්‍රතිලාභ ලබා ගැනීමේ අවස්ථාව උදා වී ඇත.

### 7.14.4 වැන්දඹු අනත්දරු විශ්‍රාම වැටුප් පනත් සංශෝධනය යටතෙහි රෙගුලාසි පැනවීම

මේ යටතේ පලමු වතාවට ආබාධිත අනත්දරු විශ්‍රාම වැටුප ගෙවීම සම්බන්ධව රෙගුලාසි පනවන ලදී.

1. ශාරීරික හෝ මානසික අශක්නුතාවය උපතේදී හෝ අනත්දරු වයස ඉක්මවීමට පෙර ඇතිවී තිබිය යුතුය.
2. උපතින් ආබාධික නොවන විට වෛද්‍ය මණ්ඩලයෙන් අනුමත වූ දින සිට විශ්‍රාම වැටුප ලබා ගැනීමට හිමිකම් ලැබේ.
3. ආබාධිත අනත්දරුවෙකු බවට විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ ජනරාල් සෑහීමකට පත් වන විට වෛද්‍ය මණ්ඩලයකට යොමු කල යුතුය.
4. දේපළ හිමිකම , පවුලේ ආදායම, වෙනත් ආදායම් මාර්ග තිබීම, විවාහ ජීවිතයට ඇතුලත්ව තිබීම වැනි හේතු මත හා ආබාධිත තැනැත්තාට තම ජීවනෝපාය සලසා ගතහැකිවීම මත විශ්‍රාම වැටුප ගෙවීම තීරණය කිරීමේ බලය විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ ජනරාල් සතුය.
5. මෙම විශ්‍රාම වැටුප් ලාභියා සිරගතවීම, සමාජ විරෝධියකු හෝ අපචාර ක්‍රියාවන්හි නිරත වීම හෝ විදේශගතව වාසය කිරීම මත විශ්‍රාම වැටුප නැවැත්විය හැකිය.
6. මුදල් පරිහරණය කිරීමේ හැකියාව නොමැති තැනැත්තන්ට සුදුසු භාරකරුවෙකු පත්කල යුතුය. ඔහු ආබාධිත අනත්දරුවාගේ ජීවනෝපාය සඳහා පමණක්ම මෙම විශ්‍රාම වැටුප යෙදවිය යුතුය.
7. විශ්‍රාම වැටුප හෝ ඉන් ප්‍රතිශතයක් ගෙවීමට නියම කිරීමට විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ ජනරාල්ට හැකිය.
8. මෙම විශ්‍රාම වැටුප සම්බන්ධව උරුමකරුවන් , යැපෙන්නන් සහ ඇටර්නි බලකරුවන් නොසිටිය යුතුය.
9. උපතින් පූර්ණ ආබාධිත නොවන තැනැත්තන් වසර 5 ට වරක් වෛද්‍ය මණ්ඩලයට යොමුකල යුතුය.
10. මෙම රෙගුලාසි විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ ජනරාල් වරයා විසින් ක්‍රියාත්මක කළ යුතු අතර ඔහු විසින් දෙනු ලබන තීරණයකට එරෙහිව රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශයේ ලේකම්වරයාට අභියාචනය කළ හැකිය. එම ලේකම්වරයාගේ තීරණය අවසානාත්මක වේ.

## 7.15 වැන්දඹු අනත්දරු විශ්‍රාම වැටුප් ගෙවීම ප්‍රමාද වීම

යම් රාජ්‍ය නිලධාරියෙකු මියගිය පසු වැන්දඹු අනත්දරු විශ්‍රාම වැටුප් ගෙවීමට දීර්ඝ කාලයක් ගතවන බව පෙනී ගොස් තිබේ. මෑතකාලයේ කොළඹ දිස්ත්‍රික්කයේ සිදුකල සමීක්ෂණයකින් හෙලිවූයේ අවම වශයෙන් සති 10 ට වඩා වැඩි කාලයක් මේ සඳහා ගතවන බවයි. එමෙන්ම ඇතැම් ප්‍රතිලාභ හිමිගැන්වීමට සති 500 ට වඩා අධික කාලයක් ගතවන බවද පෙනී ගොස් තිබේ. වැන්දඹු අනත්දරු විශ්‍රාම වැටුප් ගෙවීම ප්‍රමාදයට ප්‍රධාන හේතු කිහිපයක් බලපානු ලැබේ.

### 7.15.1 වැන්දඹු අනත්දරු විශ්‍රාම වැටුප් ලිපිගොනුව පිළිබඳ ගැටළුව

- වැන්දඹු අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයෙහි ලියාපදිංචි වී නොතිබීම
- වැන්දඹු අනත්දරු විශ්‍රාම වැටුප් අංකය නොදැන සිටීම හෝ සොයාගත නොහැකි වීම.
- අංකය වැරදියට සටහන් වීම.
- ලිපිගොනුව යාවත්කාලීන නොවීම.
- ලිපිගොනුව අස්ථානගත වීම.
- අංක මාරු කළ යුතු වීම.

පනතෙහි විධිවිධානට අනුව විශ්‍රාම වැටුප් සහිත පත්වීම් ලැබී මාස 3 ක් ඇතුලත වැන්දඹු අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයෙහි ලියාපදිංචි විය යුතු නමුත් එසේ නොකෙරේ. එම ලියාපදිංචි අංකය හා කාඩ්පත නිසි පරිදි ආරක්ෂා කර ගැනීමද සිදු නොවේ. ඇතැම් අවස්ථාවල වැන්දඹු අනත්දරු විශ්‍රාම වැටුප් අංශය විසින් නිකුත් කල අංකයද දෝෂ සහිත වී ඇත. එමෙන්ම විවිධ හේතු මත ලිපිගොනුව අස්ථානගත වීමද සිදුවී ඇත. මෙවැනි අවස්ථාවලදී අනුගමනය කල ක්‍රියාමාර්ග වූයේ වැන්දඹු අනත්දරු විශ්‍රාම වැටුප් ලිපිගොනුවක් යළි සකස් කිරීමටය. සමීක්ෂණයේදී හෙලි වූ ඉතා වැදගත් සාධකයක් නම් රාජ්‍ය සේවයේ කම්කරුවන් කාර්යාල සහයකයන්, ලිපිකරුවන්, කලමනාකරණ සහකාරවරුන් පමණක් නොව ගුරුවරුන් , පාලකයන් හා ජ්‍යෙෂ්ඨ නිලධාරින්ද වැන්දඹු අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයේ ලියාපදිංචිය නිසියාකාරව සිදු නොකරන බවයි.

### 7.15.2 නීත්‍යානුකූලව හිමිකාරත්වය /විවාහය සනාථ කිරීම ගැටලු සහගත වීම

- විවාහ සහතිකය සොයාගත නොහැකි වීම.
- බහු විවාහයන් පැවතීම.
- විවාහය නොමැතිවීම සිරිත් විවාහයක් පැවතියේද යන්න සනාථ කර ගැනීම.
- විශ්‍රාම ලැබීමෙන් අනතුරුව විවාහ වීම.
- උඩරට විවාහය මුස්ලිම් විවාහය පිළිබඳ ගැටලු මතුවීම. කලත්‍රයාගේ හිමිකාරත්වය විවාහය මත තීරණය වේ. එබැවින් නීත්‍යානුකූල විවාහයක් පැවති බව සනාථ කල යුතු වේ. එම සනාථ කිරීම ප්‍රමාද වීම වැන්දඹු අනත්දරු විශ්‍රාම වැටුප ප්‍රතිලාභ ප්‍රමාද වීමට හේතු වේ.

නීත්‍යානුකූ හිමිකම් විවාහය මත තීරණය වේ. එබැවින් විවාහ සහතිකය ඉදිරිපත් කිරීම ඉතා වැදගත්ය. සියලු හිමිකම් පළමු නීත්‍යානුකූල භාර්යාව සතු වේ. දෙවන විවාහක භාර්යාවක් වෙතොත් ඇය වෙත එම හිමිකම ලැබෙන්නේ පළමු විවාහය නෛතිකව අවසන් වී ඇත්නම් පමණි. එක්කෝ පළමු භාර්යාව මියයාමෙන් අනතුරුව (විශ්‍රාම යාමට පෙර) දෙවන විවාහය සිදුවිය යුතුය. එසේත් නැත්නම් පළමු භාර්යාව නීත්‍යානුකූලව දික්කසාද කිරීමෙන් අනතුරුව දෙවන විවාහය ( විශ්‍රාම යාමට පෙර ) සිදුවිය යුතුය.

7.15.3 වැන්දඹු අනත්දරු විශ්‍රාම වැටුප් ගණන් බැලීම පිළිබඳ ගැටලුව

- 1981. 07. 02 දිනට පෙර රාජ්‍ය සේවයට ඇතුලත් වූවන් ජීව ගණක පදනම මත ගණන් බැලීම.
- තොරතුරු නොමැති වීම රුපියල් පදනම මත ගණන් බැලීම.
- අඩු නොකල විශ්‍රාම වැටුප මත ගණන් බැලීම.
- දායකයාගේ ගෙවීම් වැන්දඹු අනත්දරු විශ්‍රාම වැටුපෙන් හිලව් කරගත නොහැකි වීම.
- සේවයේ යෙදී සිටියදී මියගිය විට ගණන් බැලීම.
- නිලධාරියන්ට දැනුම, කුසලතා හීනවීම. ( සේවා කාලය වසර 25 ට අඩුවීම මත ගණන් බැලීම කෙසේ කලයුතුද යන්න)
- අඩුපාඩු හේතුවෙන් ලිපිගොනුව ප්‍රාදේශීය ලේකම් කාර්යාලය හා ප්‍රධාන කාර්යාලය අතර හුවමාරු වීම.

දායකයා මියගිය පසු වැන්දඹු අනත්දරු විශ්‍රාම වැටුප් ලිපිගොනුව ගෙන්වාගෙන එය ගණන් බලා වැන්දඹුව වෙත විශ්‍රාම වැටුප ගෙවීම ප්‍රාදේශීය ලේකම්වරයාගේ වගකීම වේ. කෙසේ වෙතත් ඉහත දක්වන ලද විවිධ ගැටලුව නිසා එම ගණන් බැලීම සඳහා සැලකිය යුතු කාලයක් ගතවේ.

වැන්දඹු අනත්දරු විශ්‍රාම වැටුප් කඩිනමින් හිමි ගැන්වීම සඳහා පහත සඳහන් පරිපාලන තීන්දු මෑත කාලයේ ගෙන තිබීම අමතක කල යුතු නැත.

1. වැන්දඹු අනත්දරු විශ්‍රාම වැටුප් ලිපිගොනුව අස්ථානගත වීම , ලියාපදිංචිය නොවීම වැනි අවස්ථාවලදී විශ්‍රාම වැටුප් ලිපිගොනුවට වැන්දඹු අනත්දරු විශ්‍රාම වැටුප් ලිපිගොනුව බවට පරිවර්ථනය කොට ගෙවීම් සිදු කිරීම
2. සේවයේ යෙදී සිටියදී මියයාම හේතුවෙන් ගණනය පහසුව හා ප්‍රතිලාභ කඩිනම් කිරීම සඳහා අවසන් වරට ලැබූ වැටුපෙන් 85% ක ප්‍රතිලාභ හිමිගැන්වීම.
3. පනත් සංශෝධනයන්හි ප්‍රතිඵල දෙස විවිධ ඉල්ලීම් නිරතුරුවම ඉදිරිපත් විය. එබැවින් තොරතුරු නොමැති වීම හා වෙනත් අඩුපාඩුකම් පැවතිම හේතුවෙන් ප්‍රතිලාභ හිමි ගැන්වීම ප්‍රමාදවෙන තත්වයන් විද්‍යාමාන විය. එබැවින් නාමික විශ්‍රාම වැටුපක් ගෙවීම අනුමත කිරීම

# 8
# රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදල

## 8.1 පසුබිම

විශ්‍රාම වැටුප් අහිමි රජයේ ඇතැම් සේවක සේවිකාවන්ට මූල්‍යමය ප්‍රතිලාභ සැලසීමේ අරමුණින් 1942 අංක 18 දරන ආඥාපනත මගින් 1942.04.01 දින සිට ක්‍රියාත්මක වන පරිදි රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදල පිහිටුවා ඇත. භාණ්ඩාගාර නියෝජ්‍ය ලේකම් එහි සභාපතිත්වය දරනු ලැබීය. වරින්වර කරන ලද සංශෝධන මගින් මෙම අරමුදලේ සාමාජිකත්ව හැකියාව පුළුල්කර ඇත.

1970.05.30 දක්වා මුදල් අමාත්‍යාංශය යටතේ පැවති මෙම අරමුදල 1970.12.23 දින සිට රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශයට පවරා ඇත.

## 8.2 අරමුදලේ ව්‍යුහය

1970.12.23 දින සිට රාජ්‍ය පරිපාලන විෂය භාර ගරු ඇමතිවරයා වෙත කළමනාකරණ මණ්ඩලයේ සාමාජිකයන් පත් කිරීමේ බලතල පැවරී ඇති අතර එහි සාමාජිකයන් පහත පරිදිය :.

- විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ (සභාපති) ;
  (2006.08.23 දිනෙන් පසු විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ ජනරාල්)
- උප නීතිපති (සොලිස්ටර් ජනරාල්) ;
- කම්කරු කොමසාරිස් හෝ නියෝජ්‍ය කොමසාරිස්වරයකු ;
- වාරිමාර්ග අධ්‍යක්ෂ හෝ නියෝජ්‍ය අධ්‍යක්ෂවරයකු ;
- අරමුදලට දායක වන තැනැත්තන්ගෙන් එක් අයෙක් වශයෙනි.

විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ ජනරාල් විසින් අර්ථසාධක අරමුදල් කළමනාකරණ මණ්ඩලයේ ලේකම් හා ගණකාධිකාරී පත්කිරීම සිදු කරනු ලැබේ. මීට අමතරව අරමුදලේ කටයුතු සඳහා පරිපාලන නිලධාරී වරයකු ද පත් කිරීම සිදු කරයි.

1973 වර්ෂයේ සිට මේ දක්වා රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදලේ සභාපතිවරුන්ගේ නාමලේඛණය පහත පරිදිය:.

| | | |
|---|---|---|
| i | 1975 දක්වා | එල්. පනම්බලම් මයා |
| ii | 1976 සිට 1979 දක්වා | එස්. ජයසිංහ මයා |
| iii | 1979 සිට 1986 දක්වා | ඩී. අබේසිංහ මයා |
| iv | 1987 සිට 1989 දක්වා | එස්. සිවානන්දන් මයා |
| v | 1990 සිට 1991 දක්වා | ඕ. ජයවර්ධන මයා |
| vi | 1991 සිට 1995 දක්වා | ආර්. ඩබ්. පියසේන මයා |
| vii | 1995 සිට 1997 දක්වා | ඩී. ආරිය සමරවීර මයා |
| viii | 1997 සිට 2001 දක්වා | පී. එම්. පී. ජයවර්ධන මිය |
| ix | 2001 සිට 2002 දක්වා | එස්. ඩබ්. රාජපක්ෂ මයා |
| x | 2002 සිට 2004 දක්වා | වික්ටර් සමරවීර මයා |
| xi | 2004 සිට මේ දක්වා | කේ. ජී. තිලකරත්න මයා |

1973 වර්ෂයේ සිට මේ දක්වා රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදලේ ලේකම් හා ගණකාධිකාරීවරුන්ගේ නාම ලේඛනය පහත පරිදිය:


| | | |
|---|---|---|
| 1 | 1992 දක්වා | එස්. එම්. ඩී. ගුණසේන මයා |
| 2 | 1992 සිට 2006 දක්වා | ටී. ඕ. ආර්. වනිගරත්න මයා |
| 3 | 2006 සිට | එස්. එන්. හපුආරච්චි මිය |

## 8.3 අරමුදලේ කාර්යයන්

1. අරමුදල සඳහා දායකයින් බඳවා ගැනීම, ලියාපදිංචි කිරීම හා සාමාජික අංක නිකුත් කිරීම
2. අරමුදලට දායක වන සියලුම දායක දායිකාවනගේ වැටුපෙන් 8% අයකර ඒ සඳහා රජය මගින් ලැබෙන 12% ප්‍රසාද මුදල ද සමග අරමුදලට බැර කිරීම
3. එම අයකරනු ලබන මුදල් පිළිබඳව වාර්තා ගෙන්වා ගැනීම හා එම තොරතුරු නිසි පරිදි එක් රැස් කිරීම
4. අරමුදලේ දායකත්වය දරන සෑම සාමාජික සාමාජිකාවකටම තම ගිණුමේ ඇති ශේෂය පිළිබඳ ගිණුම් ප්‍රකාශනයක් යැවීම
5. දායක මුදල් ආපසු ගෙවීම
6. අරමුදලට එකතුවන හා අතිරික්ත මුදල් දායකයින්ට වැඩි පොලියක් ගෙවිය හැකි වන පරිදි රජයේ සුරකුම්පත්වල ආයෝජනය කිරීම
7. වර්ෂය අවසානයේ අරමුදලේ වාර්ෂික ගිණුම් පිළියෙල කිරීම හා දායකයින්ට පොලිය විසර්ජනය කිරීම

**කාර්ය මණ්ඩලය**

ඉහත සියලුම කාර්යයන් ඉටුකර ගැනීම සඳහා වූ කාර්ය මණ්ඩලය 1973 වර්ෂයේ දී 53 දෙනෙක් වූ අතර එය 2010 වර්ෂය වන විට 23 දක්වා අඩු වී ඇත.



### අරමුදලේ කටයුතු පුළුල් කිරීම

2003.01.01 දින සිට මෙහි කටයුතු පුළුල් කරමින් දෛනික ගෙවීම් හෝ මාසික දීමනා ලද විශ්‍රාම වැටුප් අහිමි සෑම රජයේ සේවක සේවිකාවන්ට ද මෙම අරමුදලේ සාමාජිකත්වය ලබා ගැනීමටත්, අනාගත මූල්‍ය ප්‍රතිලාභ ලබා ගැනීමටත් අවස්ථාව උදාකර දී ඇත. ඒ 2003 අංක 17 දරන (සංශෝධන) පනත මඟිනි.

## 8.4 සාමාජිකත්වය ලබා ගැනීමට සුදුසුකම් ලබන නිලධාරීන්

i විශ්‍රාම වැටුප් අහිමි ස්ථිර රජයේ සේවකයින්

ii තාවකාලිකව, මාසික වැටුප් ලබන රජයේ සේවකයින්

iii කොන්ත්‍රාත් පදනම මත බඳවා ගනු ලබන විශ්‍රාමිකයින් නොවන සේවකයින්

iv දෛනික ගෙවීම් හෝ මාසික ගෙවීම් ලබන විශ්‍රාම වැටුප් අහිමි රජයේ සේවකයින්

v ශ්‍රී ලංකික විදේශ දූත මණ්ඩලයක සේවය කරනු ලබන විශ්‍රාම වැටුප් රහිත විදේශීය සේවකයකු හෝ විශ්‍රාම වැටුප් රහිත ශ්‍රී ලාංකික සේවකයකු

vi ශ්‍රී ලංකා පොලිස් උප සේවයේ නිලධාරීන්

vii අමාත්‍ය කාර්ය මණ්ඩලවල නියුතු නිලධාරීන් සහ පළාත් සභා අමාත්‍ය කාර්ය මණ්ඩලවල නියුතු නිලධාරීන්


viii සිවිල් ආරක්ෂක බලකායේ නිලධාරීන්

## 8.5 සාමාජිකත්වය ලබා ගැනීමට සුදුසුකම් නොලබන නිලධාරීන්

විශ්‍රාමික රජයේ නිලධාරීන්

10. වයස අවු. 60 ඉක්මවූ නිලධාරීන් ද සාමාජිකත්වය ලබා ගැනීමට සුදුසුකම් නොලබයි.

11. "ට" උපලේඛනයට අයත් අමාත්‍ය කාර්ය මණ්ඩල නිලධාරීන් එම තනතුරුවල වසර 05 ක සේවා කාලයක් සපුරා ඇති විට විශ්‍රාම වැටුපකට හිමිකම් ලබන අතර, එලෙස විශ්‍රාම වැටුප් ලබන නිලධාරීන් නැවතත් සේවයේ යොදවාගන්නා විට මෙම අරමුදලේ සාමාජිකත්වය ලබා ගැනීමට සුදුසුකම් නොලබයි.




ඉහත තත්ත්වයන් යටතේ අරමුදලේ සාමාජික සංඛ්‍යාව 1973 වර්ෂයේ දී ආසන්න වශයෙන් 140,000 පමණ විය. එය 2010 වර්ෂය වන විට 2,32,779 කට අසන්නය.මෙහි වැඩිම සාමාජිකත්වය දරන්නේ 42,000 ක් පමණ වන ග්‍රාම ආරක්ෂක සේවයේ නිලධාරීන්ය. 2006 වර්ෂය වන විට වැඩිම සාමාජිකත්වය දරන ලද උප පොලිස් සේවයේ නිලධාරීන් 27,000 2006.02.01 දින සිට නිත්‍ය සේවයට අන්තර්ග්‍රහණය වීම මත අරමුදලේ සාමාජිකත්වයෙන් ඉවත්වෙමින් පවතී.

## 8.6 දායක මුදල්

දායක මුදල් වර්ග දෙකකි.
අනිවාර්ය දායක මුදල ( 8% ) ආයතනයේ දායක මුදල (12%)


මධ්‍යම රජයේ ආයතන අනිවාර්ය දායක මුදල් බැර කිරීම සිදු කරන්නේ මාසික ගිණුම් සාරාංශයෙන් වන අතර පළාත් සභා ආයතන චෙක්පත් මඟින් මෙම බැර කිරීම සිදු කෙරේ. මහා භාණ්ඩාගාරය විසින් රජයේ ප්‍රසාද මුදල අරමුදලට බැර කිරීම සිදු කරයි.

1973 වර්ෂයේ සිට 2009 වර්ෂය දක්වා අනිවාර්ය දායක මුදල් සහ රජයේ ප්‍රසාද මුදල් එකතු වීමේ ප්‍රගතිය පහත ප්‍රස්තාරයෙන් නිරූපණය කෙරේ :





## 8.7 ආයෝජන


අරමුදලේ පරිපාලන වියදම් සහ ප්‍රතිලාභ ගෙවීමෙන් පසු ඉතිරිවන මුදල් වැඩි ප්‍රතිලාභයක් ලැබෙන පරිදි රජයේ සුරැකුම්පත්වල වන භාණ්ඩාගාර බිල්පත්, භාණ්ඩාගාර බැඳුම්කර ,ස්ථාවර තැන්පතු යනාදියේ ආයෝජනය කිරීම සිදු කරනු ලැබේ. 1973 වර්ෂයේ දී රුපියල් මිලියන 92 ක් වූ ආයෝජනවල පිරිවැය 2009 වර්ෂය අවසානයට රුපියල් මිලියන 18,706 ක් පමණ වේ. මෙය 200 % ක වර්ධනයකි.





## 8.8 ආදායම් සහ වියදම්

අරමුදල් ආයෝජනය කිරීමෙන් ලැබෙන ආයෝජන පොලිය අරමුදලේ ප්‍රධානතම අදායම් මාර්ගය වේ. අරමුදල ආයෝජන වෙනුවෙන් බදු ගෙවීම සිදු කෙරේ. මීට අමතරව පරිපාලන වියදම් දැරීම් ද සිදු කෙරේ.



ආදායමෙන් වියදම් දැරීමෙන් පසු අතිරික්තය දායකයන්ට වාර්ෂිකව පොලිය වශයෙන් විසර්ජනය කිරීම සිදු කරයි.




## 8.9 සාමාජිකත්වය අහෝසි වීම

අරමුදලේ සාමාජිකත්වය දරමින් සිටින අයගේ සාමාජිකත්වය අහෝසිවීම පහත සඳහන් එක් කරුණක් මත සිදුවිය හැක :

* විශ්‍රාම වැටුප් සහිත තත්ත්වයට පත්වීම ;
* වයස අවු. 60 හෝ අවු. 55 සම්පූර්ණ වීම ;
* ඉල්ලා අස්වීම;
* තනතුර අහෝසි වීම;
* කොන්ත්‍රාත් කාලය අවසන්වීම ;
* විනයානුකුල හේතුවක් මත සේවය අහෝසි කිරීම ;
* තනතුර අතහැර යාම ;
* මිය යාම.

## 8.10 දායක මුදල් ගෙවීම්

රාජ්‍ය සේවයේ සිටින විශ්‍රාම වැටුප් අහිමි රජයේ නිලධාරීන් විවිධ ප්‍රතිපත්තිමය තීරණමත ස්ථිර තත්ත්වයට පත් කිරීම, සේවය අවසන් කිරීම සහ ඉහත සඳහන් සාමාජිකත්වය අහෝසි වීමේ හේතු මත රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදල් සහිත පත්වීම් අවසන් කිරීම නිසා ප්‍රදානයන් ලබා ගැනීම සඳහා අයදුම්පත් එවීම සිදු කෙරේ. එලෙස විශාල වශයෙන් අයදුම්පත් ලැබෙන අවස්ථාවන් පහත පරිදිය:

1. උප පොලිස් සේවයේ 27,000 ක් නිත්‍ය සේවයට අන්තර්ග්‍රහණය කිරීම:
2. සියලුම ආරක්ෂක සහායකයින් ස්ථිර කිරීම ;

3. තැපැල් දෙපාර්තමේන්තුවේ ලියුම් බෙදන්නා, ආදේශක කම්කරු, උප තැපැල් ස්ථානාධිපතිවරුන්, විදුලි පණිවුඩකරුවන් ඇතුලු විශාල සංඛ්‍යාවක් ස්ථිර කිරීම

4. සෞඛ්‍ය ක්ෂේත්‍රයේ සියලුම අනියම් සේවකයින් ස්ථිර කිරීම(සියළුම රෝහල් ද ඇතුලත්වන පරිදි)


5. ගුවන්,නාවික,යුධ යන ත්‍රිවිධ හමුදාවල සේවය කල ආදේශක, අනියම්,සිවිල් කම්කරුවන් ස්ථිර කිරීම

6. අමාත්‍ය මණ්ඩලය වෙනස් වීම මත සියළුම අමාත්‍ය කාර්ය මණ්ඩල වලින් ප්‍රදානයන් සඳහා අයදුම් පත්‍ර ලැබීම

7. පලාත් සභා අමාත්‍ය කාර්ය මණ්ඩල වලින් ප්‍රදානයන් සඳහා අයදුම් පත්‍ර ලැබීම


ඉහත තත්ත්වයන් මත රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදලින් පසු ගිය වර්ෂ 9 ක කාලය තුල ප්‍රදාන සඳහා දරන ලද වියදම් සහ ප්‍රදාන සංඛ්‍යාව පහත පරිදි පෙන්නුම් කල හැක.


| වර්ෂය | දායක මුදල් ගෙවීම් | |
|---|---|---|
| | 8% | 12% |
| 2000 | 13,534,729.00 | 14,736,760.00 |
| 2001 | 40,605,180.00 | 22,026,238.00 |
| 2002 | 42,717,018.00 | 9,461,425.00 |
| 2003 | 44,198,978.00 | 15,325,088.00 |
| 2004 | 40,598,357.00 | 32,040,617.00 |
| 2005 | 26,238,678.00 | 23,194,706.00 |
| 2006 | 34,584,501.00 | 33,738,070.00 |
| 2007 | 86,008,165.00 | 16,649,746.00 |
| 2008 | 223,077,515.00 | 38,432,843.00 |
| 2009 | 227,981,451.00 | 47,228,380.00 |




2000 වර්ෂයේ සිට ප්‍රතිලාභ ලබා ගැනීම සඳහා ඉදිරිපත් කරන ලද අයදුම් පත්‍ර සංඛ්‍යාව හා ප්‍රතිලාභ ගෙවීමේ ප්‍රගතිය පහත වගුවෙන් නිරූපනය කෙරේ.(2010 වර්ෂයේ ඔක්තෝබර් දක්වා පමණි.)

| වර්ෂය | අයදුම්පත්‍ර ලැබීම් | ප්‍රතිලාභ ගෙවීම් |
|---|---|---|
| 2000 | 1509 | 1348 |
| 2001 | 1734 | 1817 |
| 2002 | 1558 | 1512 |
| 2003 | 1331 | 1301 |
| 2004 | 1010 | 926 |
| 2005 | 689 | 670 |
| 2006 | 1103 | 622 |
| 2007 | 2432 | 1776 |
| 2008 | 4014 | 3289 |
| 2009 | 6151 | 4194 |
| 2010 | 8036 | 5258 |




## අරමුදලෙහි අනාගතය

අරමුදල සඳහා දායක මුදල් එකතු කරගැනීමේ අරමුණින් සහ අරමුදලේ කටයුතු පහසු කර ගැනීමෙන් වඩාත් කාර්යක්ෂම සේවාවක් සැලසීම සහ දායකයන්ට වැඩි ප්‍රතිලාභයක් ලබා දීමේ අරමුණින් 4/2010 චක්‍රලේඛය මඟින් උපදෙස් නිකුත් කර ඇති අතර ඉදිරියේ දී සියලුම දායක මුදල් චෙක්පත් මඟින් පමනක් ලබා ගැනීමට කටයුතු යොදා ඇත.

# 9

# ඉ - විශ්‍රාම වැටුප

## 9.1 හැඳින්වීම

### අපේක්ෂිත ප්‍රතිදානය

විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව, අනෙකුත් රාජ්‍ය ආයතන හා ප්‍රාදේශීය ලේකම් කාර්යාල සඳහා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ විසඳුමක් ලබාදීම.

### අපේක්ෂිත ප්‍රතිඵල

විශ්‍රාමිතයන් සඳහා කාර්යක්ෂම "සේවා අවසාන ප්‍රතිලාභ" ලබාදෙන සේවාවක් සැපයීම

### ඉලක්කය

විශ්‍රාම වැටුප් ක්‍රියාවලිය ප්‍රතිනිර්මාණය කිරීම සහ එම ප්‍රතිනිර්මාණය වූ ක්‍රියාවලිය තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය මගින් සවිබල ගැන්වීම

### අරමුණ

විශ්‍රාමිකයන් වෙත වඩාත් මිත්‍රශීලී සහ කාර්යක්ෂම සේවාවක් ලබාදීම සඳහා විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුවේ අභ්‍යන්තර කාර්යක්ෂමතාව ඉහළ දැමීම

### විෂය පථය

විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුවේ අනෙකුත් රාජ්‍ය ආයතනවල හා ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල සියලුම විශ්‍රාම වැටුප් සම්බන්ධව කටයුතු ඇතුළත් වේ.

### දායකත්වය

- බරපැන දරන්නේ ලෝක බැංකුව
- ගුරු හරුකම් ලබා දෙන්නේ තොරතුරු හා සන්නිවේදන හා තාක්ෂණ නියෝජිතායතනය
- අධීක්ෂණය කරන්නේ රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශය
- පද්ධතියේ අයිතිය විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව සතුවේ.

### ව්‍යාපෘතියේ ප්‍රධාන ක්‍රියාකාරකම්

- පද්ධති අධ්‍යයනය හා දෙපාර්තමේන්තු ක්‍රියාවලි ප්‍රතිනිර්මාණය
- තොරතුරු තාක්ෂණ විසඳුම නිර්මාණය කිරීම හා සංවර්ධනය කිරීම
- නියමු ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම
- සියලුම රාජ්‍ය ආයතනවල ඉ-විශ්‍රාම වැටුප් පද්ධතිය ස්ථාපනය කිරීම



16 - H39510

## 9.2. පද්ධති අධ්‍යයනය හා දෙපාර්තමේන්තු ක්‍රියාවලි ප්‍රතිනිර්මාණය

ප්‍රධාන ක්‍රියාකාරකම්

- විශ්‍රාම වැටුප් ක්‍රියාවලි ප්‍රතිනිර්මාණය
- පද්ධති අවශ්‍යතාවයන් නිර්වචනය කිරීම
- තොරතුරු කළමනාකරණ පද්ධති පිරිවිතර සෑදීම
- දෘඪාංග හා මෘදුකාංග පිළිබඳ පිරිවිතර සෑදීම
- වෙනස්වීම් කළමනාකරණ සැලැස්ම නිර්මාණය කිරීම
- තොරතුරු තාක්ෂණ උපායමාර්ග අධ්‍යයන වාර්තාව
- ඉ - විශ්‍රාම වැටුප් පද්ධතිය පිළිබඳ මූලාකෘතිය නිර්මාණය කිරීම

ඉ විශ්‍රාම වැටුප් පද්ධතිය නිර්මාණය කිරීමේ දී දෙපාර්තමේන්තුවේ පවතින ක්‍රියවලිය ප්‍රතිනිර්මාණය කරන ලද අතර ප්‍රතිනිර්මාණය වූ විශ්‍රාම වැටුප් ක්‍රියාවලිය ප්‍රධාන ක්‍රියාවලි 6 කින් සමන්විත වේ.

- ප්‍රධාන ක්‍රියාවලි වන්නේ,
  - අයදුම්පත්‍ර ලියාපදිංචි කිරීම
  - දායක මුදල් එකතු කිරීම සහ කළමනාකරණය
  - සෑම දෙනාටම එක වරක් කරන ප්‍රතිලාභ සැකසීම
  - මාසික ගෙවීම් සහ සංශෝධන සැකසීම
  - විමසීම් කළමනාකරණය
  - ලේඛන කළමනාකරණය

ඉහතින් දැක්වෙන සෑම ක්‍රියාවලියක්ම අංග කිහිපයකින් සමන්විත වේ. ඒවා නම්

- එක් එක් ක්‍රියාවලියේ අරමුණු
- එක් එක් අරමුණ සාක්ෂාත්කර ගැනීම සඳහා ඇතිකර ගනු ලැබූ අවධිගත සඵලතා සාධක
- එක් එක් අවධිගත සඵලතා සාධක කරා ගමන් කිරීම සඳහා ඇති කර ගන්නා ලද ලඟා කර ගත යුතු පරමාර්ථ

## 9.3 අයදුම් පත්‍ර ලියාපදිංචි කිරීමේ ක්‍රියාවලිය

හැඳින්වීම

- යම් පුද්ගලයකු රාජ්‍ය සේවයට පත්වීමක් ලද අවස්ථාවේ (විශ්‍රාම වැටුප් සහිතව හෝ රහිතව) හෝ විශ්‍රාම ගැනීමට අනුමැතිය ලද අවස්ථාවේදී හෝ ඒ අතරතුර කාලයේ දී හෝ;
- ලියාපදිංචි අංකයක් හා/හෝ ප්‍රදාන පත්‍රයක් ලැබීම හා ප්‍රදාන පත්‍රය සංශෝධනය කිරීම යන ක්‍රියා කාරකම්වලින් සමන්විත වේ.

අරමුණු

- අයදුම්පත්‍ර ක්‍රියාවලිය විශ්‍රාමිකයා විසින් මුල පිරීම
- ආකෘති පත්‍ර විශ්‍රාමිකයා විසින් හා අදාළ රාජ්‍ය ආයතනය විසින් සම්පූර්ණ කිරීම
- විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව මගින් අයදුම්පත්‍ර පරීක්ෂාව, ලියාපදිංචි අංක නිකුත් කිරීම හා දැනුම් දීම
- විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව මගින් ප්‍රදාන පත්‍ර සකස් කිරීම

අවධිගත සඵලතා සාධක

- වැරදි හා අඩුපාඩු හේතුවෙන් ආපසු හරවා යවන අයදුම් පත්‍ර ප්‍රමාණය අඩු කිරීම
- ලියාපදිංචි අංකයක් නිකුත් කිරීමට ගත වන කාලය අඩු කිරීම.

ළඟා කර ගත යුතු පරමාර්ථ

- වැරදි හා අඩුපාඩු හේතුවෙන් ආපසු හරවා යවන අයදුම් පත්‍ර ප්‍රමාණය ලැබෙන අයදුම්පත්‍ර වලින් 5%ක් දක්වා අඩු කිරීම.
- අයදුම් පත්‍ර ලියාපදිංචි කිරීමට ගත වන කාලය දින 2 දක්වා අඩු කිරීම

## 9.4. දායක මුදල් එකතු කිරීම සහ කළමනාකරණය කිරීමේ ක්‍රියාවලිය

හැඳින්වීම

- රාජ්‍ය සේවයේ සිටින්නන්ගෙන් වැටුපෙන් දායක මුදල් අඩු කර ගැනීමේ සිට එම සියළු දායක මුදල් විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුවට ලැබීම සහතික කර ගැනීම හා ඒවා පිළිබඳ වාර්තා යාවත්කාලීන කිරීම, ඇතුළුව දායකයන්ට වාර්ෂික වාර්තා නිකුත් කිරීම දක්වා ක්‍රියාවලිය මින් අදහස් වේ.

අරමුණු

- දායක මුදල් අයකර ගැනීම සහ විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුවට ඒවා ප්‍රේෂණය කිරීම

- දායක මුදල් වාර්තා ලබා ගැනීම සහ පවත්වා ගෙනයාම
- දායකවීම් සහතික කරමින් වෙන් වෙන් වශයෙන් සහතිකපත් නිකුත් කිරීම.

අවධිගත සඵලතා සාධක

- රජයේ සේවකයන්ගේ වැටුපෙන් මාසිකව අඩුකර ගන්නා සියලුම දායක මුදල් විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුවට ලැබීම සහ ඒවා වාර්තා ගත වීම තහවුරු කර ගැනීම
- පිරිවිතර කරන කාල රාමුවකට අනුව දායකයන් සඳහා ප්‍රකාශ නිකුත් කිරීම

ළඟා කර ගත යුතු පරමාර්ථ

- රජයේ සේවකයන්ගේ වැටුපෙන් අඩුකර ගන්නා දායක මුදල් මාස 2ක් ඇතුළත විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුවට ලැබෙන බවට හා ඒවා වාර්තාගත වී ඇති බවට තහවුරුකර ගැනීම
- අවුරුද්දක් අවසානයේ ඊළඟ මාස 2 ක් ඇතුලත වාර්ෂික වාර්තාවක් දායකයන් වෙත ඉදිරිපත් කිරීම.

## 9.5. සෑම දෙනාටම එක වරක් කරන ප්‍රතිලාභ සැකසීමේ ක්‍රියාවලිය

හැඳින්වීම

එක් වරක් පමණක් ගෙවන සේවා අවසාන ප්‍රතිලාභ සඳහා ඉල්ලීම ලද අවස්ථාවේ සිට එම ප්‍රතිලාභ ගෙවා අවසන් කරන තුරු සහ එම ප්‍රතිලාභ අයදුම්කරු වෙත ලැබීම දක්වා ක්‍රියාවලිය මින් අදහස් වේ.

අරමුණු

- එක් වරක් පමණක් ගෙවන සේවා අවසාන ප්‍රතිලාභ ගෙවීම සඳහා අයදුම්පත් සැකසීම හා ප්‍රදාන පත්‍රය අනුමත කිරීම
- අයදුම්කරු වෙත එක් වරක් පමණක් ගෙවන සේවා අවසාන ප්‍රතිලාභ ලැබුණේද යන්න තහවුරු කර ගැනීම සහ පසුවිපරම්

අවධිගත සඵලතා සාධක

- විශ්‍රාම යන දිනයේ දී එක් වරක් පමණක් ගෙවන සේවා අවසාන ප්‍රතිලාභ ගෙවීම හා ප්‍රාදන පත්‍රය නිකුත් කිරීම
- හිමිකම් ලේඛන ගෙවීමේ ඒකකයට ලැබී යම් නිශ්චිත කාල සීමාවක් තුළ අනෙකුත් එක් වරක් පමණක් ගෙවන සේවා අවසාන ප්‍රතිලාභ ගෙවා දැමීම

ළඟාකර ගත යුතු පරමාර්ථ

- යම් දිනකට විශ්‍රාම යන විශ්‍රාමිකයන්ගෙන් 95% ක ප්‍රතිශතයකට විශ්‍රාම යන දිනයේදීම එක් වරක් පමණක් ගෙවන සේවා අවසාන ප්‍රතිලාභ ගෙවීම හා ප්‍රදාන පත්‍රය නිකුත් කිරීම

- ගෙවීම් ඒකකයට ලැබී සතියක් ඇතුළත අනෙකුත් එක් වරක් පමණක් ගෙවන සේවා අවසාන ප්‍රතිලාභ අදාළ විශ්‍රාමිකයින්ට ගෙවීම.

## 9.6. මාසික ගෙවීම් හා සංශෝධන සැකසීමේ ක්‍රියාවලිය.

### හැඳින්වීම

- මාසිකව ගෙවන සේවා අවසාන ප්‍රතිලාභ සඳහා ප්‍රදාන පත්‍ර නිකුත් කළ අවස්ථාවේ සිට සිදුවන ක්‍රියාවලියයි. එම සේවා අවසාන ප්‍රතිලාභවලට අදාළ සංශෝධනයන් හා හිඟ සේවා අවසාන ප්‍රතිලාභ සැකසීම් ද මෙම ක්‍රියාවලියට අදාළ වේ.

### අරමුණු

- මාසික ගෙවීම සිදු කිරීම
- නව විශ්‍රමිකයන් පද්ධතියට ඇතුළත් කර ගැනීම
- සංශෝධන, විශ්‍රාම වැටුප් වර්ධක අනුව විශ්‍රාම වැටුපේ වෙනස්කම් කිරීම
- ගෙවීම් නැවැත්වීම
- විශ්‍රාමිකයන්ගේ තොරතුරු පද්ධතියෙන් ඉවත් කිරීම
- ලිපිගොනු යැවීම
- විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුවට වාර්තා කිරීම

### අවධිගත සඵලතා සාධක

- විශ්‍රාම ගැනීමෙන් පසු එළඹෙන පළමු මාසයේ දී මාසිකව ගෙවන සේවා අවසාන ප්‍රතිලාභ ගෙවීම.
- මාසිකව ගෙවන සේවා අවසාන ප්‍රතිලාභ සඳහා රජය නිර්දේශ කරන වැඩි කිරීම් එම නිර්දේශයන් කළ පසු එලඹෙන පළමු මාසයේ දී ගෙවීමට කටයුතු කිරීම.
- සියලුම විශ්‍රාමිකයින්ගේ තොරතුරු ඇතුළත් මධ්‍යගත දත්ත මූලයක් පවත්වා ගැනීම. එමගින් රජයේ ආයතන, දිස්ත්‍රික්ක හා ප්‍රාදේශීය මට්ටමින් ගෙවීම් සිදු කිරීමට හැකි වීම.
- විශ්‍රාමිකයන් පිළිබඳ තොරතුරු නියමිත පරිදි යාවත්කාලීන කිරීම.
- විශ්‍රාමිකයා මියයාමෙන් එලඹෙන පළමු මාසයේ දී වැන්දඹු/ වැන්දඹු පුරුෂ විශ්‍රාම වැටුප ගෙවීම.

### ළඟා කර ගත යුතු පරමාර්ථ

- විශ්‍රාම ගත් පසු එළඹෙන පළමු මාසයේ දී මාසික විශ්‍රාම වැටුප ගෙවීම.
- විශ්‍රාමිකයා මියයාමෙන් එළඹෙන පළමු මාසයේ දී වැන්දඹු/ වැන්දඹු පුරුෂ විශ්‍රාම වැටුප ගෙවීම.

## 9.7. විමසීම් කළමනාකරණය කිරීමේ ක්‍රියාවලිය.

හැඳින්වීම

- සේවා අවසාන ප්‍රතිලාභ පිළිබඳ විමසීමක්/ ගැටලුවක් ලද අවස්ථාවේ සිට එය විසඳීම, ඒ පිළිබඳ අදාල පුද්ගලයා දැනුවත් කිරීම සහ දැනුම් මූලය යාවත්කාලීන කිරීම යන කාර්යයන්ට අදාලු කටයුතු ඇතුළත් ක්‍රියාවලිය මින් අදහස් වේ.

අරමුණු

- විමසීම් ලැබීම හා විමසීම් පරීක්ෂා කිරීම
- විශ්‍රාමිකයන්ට පිළිතුරු සැපයීම
- දැනුම් මූලය පවත්වා ගෙන යාම

අවධිගත සඵලතා සාධක

- පුහුණු කරන ලද නිලධාරීන් පිරිසක් මගින් සියළුම සංකීර්ණ නොවන විමසීම් කාලානුරූපව විසඳීම
- විශ්‍රාමිකයන්ගේ විමසීම්වලට පිළිතුරු සැපයිය හැකි වන පරිදි සියලුම ප්‍රාදේශීය ලේකම් කාර්යාල ශක්තිමත් කිරීම.
- අනෙකුත් එනම් සංකීර්ණ සෑම විමසීක්ම පිරිවිතර කරන කාල රාමුවක් තුළදී විසඳීම

ළඟාකර ගත යුතු පරමාර්ථ

- පුහුණු කරන ලද නිලධාරීන් පිරිසක් මගින් සියළුම සංකිර්ණ නොවන ගැටළු වහාම හා/හෝ දින 07ක් ඇතුළත විසඳීම.
- අනෙකුත් සෑම ගැටලුවක්ම ප්‍රතිපත්ති කමිටු රැස්වීමෙන් පසු එළඹෙන පළමු සතිය තුළ විසඳීම.

## 9.8. ලේඛන කළමනාකරණය කිරීමේ ක්‍රියාවලිය.

හැඳින්වීම

- අනාගත භාවිතය සඳහා අවශ්‍ය කරන ලේඛනයන් විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුවට ලැබුණ දිනයේ සිට එම ලේඛන ගොනුගත කිරීම හා අවශ්‍ය විටක එය ආපසු ලබා ගැනීම දක්වා වූ ක්‍රියාවලිය මින් අදහස් වේ.

අරමුණු

- ලේඛන වාර්තා ලැබීම
- අදාළ වාර්තා හඳුනා ගැනීම සහ තැන්පත් කළ තැනකින් ආපසු ලබා ගැනීම.

- ලේඛන සංචලන නිවැරදිව හඳුනා ගැනීම
- ලේඛන ආරක්ෂිතව තැන්පත් කිරීම

අවධිගත සඵලතා සාධක

- දෙපාර්තමේන්තුවට ලද ලේඛන ආපසු තෝරාගත හැකි වන පරිදි වාර්තා තබා ගැනීම
- විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුවට අවශ්‍ය නොවන ලේඛන දෙපාර්තමේන්තුව තුළ ගබඩා නො කිරීම.
- ලේඛන සංචලන හඳුනාගත හැකි පද්ධතියක් හඳුන්වා දීම.

ළඟා කර ගත යුතු පරමාර්ථ

- කාර්තුවකට වරක් ලේඛනාගාරය තුළ ඇති ලේඛණ වලින් 1% බැගින් පරීක්ෂා කරමින් සියලුම ලේඛන ලේඛනාගාරයේ ඇති බවට තහවුරු කරගැනීම
- ඉල්ලීමක් ලැබී මිනිත්තු 30 ක් ඇතුළත ගොනුවක් හෝ ලේඛනයක් සොයා ගැනීම

## 9.9. ඉ - විශ්‍රාම වැටුප් පද්ධතියේ සුවිශේෂතා

### 1 ඉ විශ්‍රාම වැටුප් පද්ධතිය

ඉ-විශ්‍රාම වැටුප් පද්ධතිය පිරික්සුම් පදනම් (Browser Based) මෘදුකාංගයක් ලෙසින් මෙන්ම පරිශීලක භූමිකා පදනම් ( Role Base) මෘදුකාංගයක් ලෙසින් නිර්මාණය වී ඇති පද්ධතියකි.

එසේම මෙම පද්ධතිය ශ්‍රී ලංකාවේ විශ්‍රාම වැටප් කටයුතු සිදු කරන සියලුම රාජ්‍ය ආයතනවල විශ්‍රාම වැටුප් කටයුතු ආවරණය වන ආකාරයෙන් නිර්මාණය වූ සංකලිත පද්ධතියකි .

මෙම පද්ධතිය භාවිතයෙන් ඉ-විශ්‍රාම වැටුප් කටයුතු සිදු කිරීමට ලංකා රාජ්‍ය ජාල සම්බන්ධතාවය අනිවාර්ය වන අතර ලංකා රාජ්‍ය ජාල සම්බන්ධතාවයක් ඇති ඕනෑම පරිගණයක් භාවිත කර ඉ-විශ්‍රාම වැටුප් පද්ධතියට ප්‍රවේශ විය හැක.

මෙම ප්‍රවේශ වීම සඳහා භාවිතා කළ යුතු වෙබ් නාමය (URL ) පහත පරිදි වේ.

www.epensions.gov.lk/epension

ඕනෑම වෙබ් බවුසරයක් හරහා ඉහත වෙබ් නාමය සඳහන් කළ විට ඉ-විශ්‍රාම වැටුප් පද්ධතියට ප්‍රවේශ විය හැක.

### 2 ප්‍රධාන පාර්ශව

විශ්‍රාම වැටුප් රාජකාරි ප්‍රධාන වශයෙන් රාජ්‍ය ආයතන තුනක් හරහා සිදු වේ. එනම් විශ්‍රාම යාමට බලාපොරොත්තු වන නිලධාරියා අවසානයට රාජකාරි කරන රාජ්‍ය ආයතනය, විශ්‍රාම වැටුප්

දෙපාර්තමේන්තුව හා එම පුද්ගලයා විශ්‍රාම වැටුප් ගන්නට කැමති තමන් ජීවත් වන ප්‍රදේශයේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලය යනාදී වශයෙනි.

ඒ අනුව ඉ-විශ්‍රාම වැටුප් පද්ධතිය ප්‍රධාන වශයෙන් රාජකාරි ඉටු කරන පාර්ශවයන් තුනකින් සමන්විතය.

- රාජ්‍ය ආයතන පාර්ශවය
- ප්‍රාදේශීය ලේකම් කාර්යාල පාර්ශවය
- විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තු පාර්ශවය

**රාජ්‍ය ආයතන පරිච්ඡේදය**

ඉ-විශ්‍රාම වැටුප් පද්ධතිය රාජ්‍ය ආයතනය පාර්ශවයේ ක්‍රියාත්මක කිරීමට අදාළ ප්‍රධාන වශයෙන් ක්‍රියාවලි 2 ක් සම්බන්ධ වේ.

- අයදුම්පත්‍ර ලියාපදිංචි කිරීමේ ක්‍රියාවලිය
- දායක මුදල් එකතු කිරීමේ ක්‍රියාවලිය

**ප්‍රාදේශීය ලේකම් කාර්යාල පරිච්ඡේදය**

ඉ විශ්‍රාම වැටුප් පද්ධතිය ප්‍රාදේශීය ලේකම් කාර්යාල පාර්ශවයේ ක්‍රියාත්මක කිරීමට අදාළ ප්‍රධාන වශයෙන් එක් ක්‍රියාවලියක් සම්බන්ධ වේ.

- මාසික ගෙවීම් හා සංශෝධන සැකසීමේ ක්‍රියාවලිය

**විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තු පරිච්ඡේදය**

ඉ විශ්‍රාම වැටුප් පද්ධතියේ ප්‍රධාන මෙහෙයුම් මධ්‍යස්ථානය විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව බැවින් ප්‍රධාන ක්‍රියාවලි ඒට විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තු පාර්ශවයේ ඉටු කරනු ලබයි.

3 පරිශීලක භූමිකා

ඉහතින් සහන් කලෙක් එක් පාර්ශවයේ විශ්‍රාම වැටුප් කාර්ය භාරයට අදාල එක් එක් ක්‍රියාවලියේ රාජකාරී කටයුතු ඉටු කිරීමට පරිශීලක භූමිකාවන් හඳුනාගෙන ඇති අතර එම භූමිකාවන්ට අනුව පද්ධතියේ රාජකාරී නිර්මාණය වී ඇත.

රාජ්‍ය ආයයත පරිච්ඡේදයේ ප්‍රධාන ක්‍රියාවලි 2හි කාර්යන් ඉටු කිරීමට හඳුනාගත් පරිශීලක භූමිකා පහත පරිදි වේ;

අයදුම්පත්‍ර ලියාපදිංචි කිරීමේ ක්‍රියාවලිය

| පරිශීලක භූමිකාව | රාජකාරි |
|---|---|
| විශ්‍රාම වැටුප් සැකසුම් නිලධාරියා<br>Officer Processing Pensions | PD 1 අයදුම්පත්‍ර ග්‍රහණය කරගැනීම;<br>Capture PD1 |
| | PD 2 අයදුම්පත්‍ර ග්‍රහණය කරගැනීම;<br>Capture PD2 |
| | PD1 හා PD 2 තහවුරු කරගැනීම;<br>Validate PD1 and PD2 |
| | PEN 55 ජනනය කරගැනීම;<br>Generate PEN55<br>PEN 55 මාරු කිරීම; |
| ආයතන ප්‍රධානියා<br>Head of the Department | PEN 55 අනුමත කිරීම;<br>Approve PEN 55 |

දායක මුදල් එකතු කිරීමේ ක්‍රියාවලිය

| (පරිශීලක භූමිකාව) | (රාජකාරි) |
|---|---|
| විශ්‍රාම වැටුප් සැකසුම් නිලධාරියා<br>Officer processing Pensions | සැකසීමේ කාලය වෙනස් කිරීම<br>Change processing Period |
| | දායක මුදල් වෙනස්කම් ග්‍රහණය කිරීම<br>Capture Contribution Changes |
| | දායක මුදල් සැසඳීම<br>Reconcile Contributions |
| | මාසික දායකත්වය අරමුදල ජනනය කිරීම<br>Generate MCF |
| ආයතන ප්‍රධානියා<br>Head of the Department | සැසඳීමේ වාර්තාව අනුමත කිරීම<br>Approve Reconciliation Statement |

ප්‍රාදේශීය ලේකම් කාර්යාල පරිච්ඡේදයේ ප්‍රධාන ක්‍රියාවලියෙහි කාර්යයන් ඉටු කිරීමට හදුනාගත් පරිශීලක භූමිකා පහත පරිදි වේ.

| පරිශීලක භූමිකාව | විෂය | රාජකාරි |
|---|---|---|
| විශ්‍රාම වැටුප් කටයුතු භාර නිලධාරියා Officer Responsible for Pensions at DS | තොරතුරු ඇතුලත් කිරීම | ප්‍රතිනිර්මාණය කරන ලද ප්‍රදාන පත්‍ර ලබා ගැනීම Receive RAL |
| | | සම්මුඛ සාකච්ඡා සැලසුම් කිරීම Schedule Interview |
| | | සම්මුඛ සාකච්ඡා නැවත සැලසුම් කිරීම Reschedule Interview |
| | | සම්මුඛ සාකච්ඡා ලිපි ලබා ගැනීම View Interview Letter |
| | | තොරතුරු විශ්‍රාම වැටුප්දෙපාර්තමේන්තුවට යැවීම Sent to PD |
| විශ්‍රාම වැටුප් පිළිබඳ බලය ලත් නිලධාරියා Authorized Officer Responsible for Pensions at DS | තොරතුරු ඇතුලත් කිරීම | ගෙවීම් අනුමත කිරීම Approve Payment |
| | | විසංගණන යාවත්කාලීන කිරීම Update Discrepancies |
| | | සම්මුඛ සාකච්ඡා නැවත සැලසුම් කිරීම Reschedule Interview |
| | | නොගැලපෙන ප්‍රතිනිර්මාණය කිරීම Activate Inconsistent RAL |
| | | අර්ථලාභියා සම්මුඛ සාකච්ඡාවට බඳුන් කිරීම Interview Beneficiary |
| බලයලත් නිලධාරියා Authorized officer at DS | තොරතුරු වෙනස් කිරීම හා ඉවත් කිරීම | ගෙවීම් අත් හිටුවීම Suspend Payments |
| | | ලිපි ජනනය කිරීම Generate Letters |

| පරිශීලක භූමිකාව | විෂය | රාජකාරි |
| --- | --- | --- |
| | | ලිපි නැවත ජනනය කිරීම<br>Regenerate Letters |
| | | අර්ථලාභියාගේ ප්‍රතිචාරය ලබා ගැනීම<br>Beneficiary Response |
| | | අර්ථලාභියාට දැනුම් දීම<br>Inform Beneficiary |
| | | අත්හිටවූ ලිපිවල විසංගණන පරීක්ෂාව<br>Discrepancy in Suspension Letters |
| | | ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල අහෝසි කිරීම හා නැවැත්වීම<br>Stop/ Revoke at DS |
| | | වැන්දඹු/වැන්දඹු පුරුෂ හා අනාත්දරු ලියවිලි සමාලෝචනය<br>Review W&OP documents |
| විශ්‍රාම වැටුප් නිලධාරියා<br>Pension Officer at DS | ගෙවීම් සැසඳුම් ප්‍රකාශය | ගෙවීම් සැසඳුම් ප්‍රකාශනය සැකසීම<br>Prepare PRS |
| | | ගෙවීම් සැසඳුම් ප්‍රකාශය අතින් සැකසීම<br>Manual PRS |
| | | ගෙවීම් සැසඳුම් ප්‍රකාශය ඉවතලීම<br>Rejected PRS |
| බලයලත් නිලධාරියා<br>Authorized Officer | ගෙවීම් සැසඳුම් ගෙවීම් ප්‍රකාශය | ගෙවීම් සැසඳුම් ප්‍රකාශය අනුමත කිරීම<br>Approve PRS |
| | | ගෙවීම් ලදුපත් සැකසීම<br>Prepare Pay slips |
| මාරු කිරීම් පිළිබඳ බලයලත් නිලධාරියා<br>Authorized Officer Old DS for Transfer | තොරතුරු මාරු කිරීම | විශ්‍රාමිකයා මාරු කිරීම<br>Transfer Pensioner |
| | | මාරු වූ විශ්‍රාමිකයන් ලබා ගැනීම<br>Received Transfers |
| බලය ලත් නිලධාරියා<br>Authorized Officer | විදේශ විශ්‍රාම වැටුප් | විදේශ විශ්‍රාම වැටුප් ගෙවීම් ඉල්ලීම<br>Request For Foreign Pension Payment |

## පරිශීලක භූමිකා නිර්මාණය කිරීම

මෙම එක් එක් පරිශීලක භූමිකාවට අදාල රාජකාරි ඉටු කිරීමට ඒ ඒ භූමිකාවට අදාල පසුබිම පද්ධතිය තුල නිර්මාණය කළ යුතුය. එම කාර්ය කරනු ලබන්නේ විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුවේ තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ ඒකකය මගිනි.

තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ ඒකකයට මෙම කාර්ය ඉටු කිරීම සඳහා විශ්‍රාම වැටුප් කටයුතු කරන සියළුම රාජ්‍ය ආයතන විශ්‍රාම වැටුප් භූමිකා නිර්මාණය කිරීමට අවශ්‍ය දත්ත ලබා දිය යුතුය.

එම දත්ත භාවිතා කර "ඉ" විශ්‍රාම වැටුප් භූමිකා නිර්මාණය කරන අතර ඉන් පසු ඊට අදාල රාජකාරි පැවරීම සිදු කරනු ලබයි. ඉන් අනතුරුව එම රාජකාරි ඉටු කිරීමට රාජ්‍ය ආයතනය විසින් හඳුන්වා දෙන එම භූමිකාව ඉටු කරන පරිශීලකයා පද්ධතියට හඳුන්වා දිය යුතුය. මෙහිදී එම පරිශීලකයාට ඉ විශ්‍රාම වැටුප් පද්ධතියට ප්‍රවේශ වීමේ වරප්‍රසාදය නිර්මාණය කරනු ලබයි. එනම් එම පුද්ගලයා වෙනුවෙන් පරිශීලක නාමයක් හා මුර/රහස්පදයක් නිර්මාණය කිරීමයි. එම වරප්‍රසාදය භාවිතා කර පරිශීලකයන්ට පද්ධතියේ රාජකාරි කටයුතු ඉටු කළ හැක.

ඉන්පසු අදාල පරිශීලක විසින් එම පරිශීලක නාමය හා මුර/රහස් පදය භාවිතා කර පද්ධතියට ප්‍රවේශ වී තමාට අනන්‍ය මුර/රහස් පදයක් නිර්මාණය කර වැටුප් දෙපාර්තමේන්තුවේ තොරතුරු හා සන්නිවේදන ඒකක ලබා දුන් මුර/රහස් පදය වෙනස් කර ගත යුතුය. මෙම ක්‍රියාවලිය අඛණ්ඩව සිදුවිය යුතු බැවින් මේ සඳහා අනුගමනය කළ යුතු ක්‍රියා පිළිවෙත පහත දැක්වේ.

- එක් එක් භූමිකාව සඳහා යොදවන නිලධාරීන් ඒ ඒ රාජ්‍ය ආයතන විසින් නම් කළ යුතුය.
- එසේ නම් කරන නිලධාරීන් විසින් පරිශීලක විස්තර ලබා ගන්නා ආකෘති පත්‍රය පිරවිය යුතුය.
- එම ආකෘති පත්‍රය අදාල මාණ්ඩලික නිලධාරීන් අත්සන් කර විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුවේ තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ ඒකකයට ෆැක්ස් මගින් එවිය යුතුය. ෆැක්ස් අංකය 011 - 2441908 වේ.
- තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ ඒකකය විසින් අදාල පරිශීලක නාමය හා මුර/රහස් පදය නිර්මාණය කරන අතර ඒවා ආරක්ෂිත ආකාරයට අදාල ආයතනයට ලබා දෙනු ඇත.
- ඉන් පසු අදාල පරිශීලක විසින් එම පරිශීලක නාමය හා මුර/රහස් පදය භාවිතා කර පද්ධතිය තුලට ප්‍රවේශ වී මුර/රහස් පදය වෙනස් කර ගත යුතුය.
- නව මුර/රහස් පදය නිර්මාණය කර ගැනීමේදී සැලකිලිමත් විය යුතු කාරණා කිහිපයකි. එබැවින් මුර/රහස් පදයක් නිර්මාණය කර ගැනීමේදී අනුගමනය කළ යුතු නීති හා රීති කිහිපයක් ඇත. ඒවා මතු සඳහන් වේ.
- පරිශීලකයන් වෙනස්වන සෑම අවස්ථාවකම නව පරිශීලකයන් පිළිබඳ විස්තර තොරතුරු තාක්ෂණ ශාඛාවට ලබා දී නව පරිශීලක නාම හා මුර/රහස් පද ලබා ගත යුතුය.

## මුර/රහස් පදයක් ( Password )නිර්මාණය කර ගැනීමේ නීති හා රීති

- මුර/රහස් පදය අංග 3 කින් සමන්විත විය යුතුය. ඒවා නම්,

- ඉංග්‍රීසි අකුරු
- ඉලක්කම්
- සංකේත

- ඉංග්‍රීසි අකුරු යෙදීමේදී සැලකිය යුතු කාරණා කිහිපයක් වේ.
  - පරිශීලක නාමයේ (User Name) ඇති අකුරු යොදන්නේ නම් උපරිම යෙදිය හැකි අකුරු ගණන 3 කි.
  - පරිශීලක නාමනයේ නොමැති අකුරු ඕනෑම ප්‍රමාණයක් යෙදිය හැක.
  - පරිශීලක නාමයේ ඇති අකුරු එකකට වැඩි ගණනක් තිබේ නම් එම අකුරු යෙදීමෙන් වළකින්න.
  - මුර/රහස් පදය තුල අනිවාර්යයෙන්ම ඉලක්කමක් තිබිය යුතුය. ඉලක්කම් එකක් හෝ කිහිපයක් යෙදිය හැකි අතර එකම ඉලක්කම් කිහිප වරක් යෙදිය හැක.
  - සංකේත වලින් යෙදිය හැක්කේ පහත සංකේත 2 පමණි. මෙම සංකේත වලින් අනිවාර්යයෙන්ම කුමක් හෝ එක් සංකේතයක් මුර පදය තුල අන්තර්ගත විය යුතුය.
  - මුර/රහස් පදයේ තිබිය යුතු අකුරු ඉලක්කම් හා සංකේතවල ප්‍රමාණය අවමය 8ක් වන අතර උපරිමය පිළිබඳ සීමාවක් නැත.


මුර/රහස් පදය ආදාන කිරීමේදී ඒ සඳහා වැඩි අවධානයක් යොමු කල යුතුය. එසේ වන්නේ නිවැරදිව මුර/රහස් පදය අදාන කිරීමෙන් ගැටළුවකින් තොරව පද්ධතියට ප්‍රවිෂ්ට විය හැකි වන බැවිනි. නමුත් මුර/රහස් පදය නිවැරදිව ආදාන කිරීමට නොහැකි වුවහොත් එසේ වැරදියට ආදාන කරන අවස්ථා ගණන වාර 3 ක් වෙන අවස්ථාවේදී මුර/ රහස් පදය අගුලු වැටෙන (Lock) අතර පරිශීලකට නැවතත් පද්ධතියට ප්‍රවේශ වීමට අවස්ථාවක් නොලැබේ.

යළි පද්ධතියට ප්‍රවේශ වීමට නම් එම මුර/රහස් පදය නැවත සක්‍රියණය (Activate) කළ යුතුය. මේ කාර්ය පරිශීලකට කළ නොහැකිය. මේ සඳහා විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුවේ තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ ඒකකයේ සහය ලබා ගත යුතුය. ඒ සඳහා 011-2449108 යන දුරකථන අංකයට දැනුම් දී මුර/රහස් පදය යළි පිහිටුවා ගැනීමට කටයුතු කරන්න.

### විශ්‍රාම වැටුප් ලියාපදිංචි අංකය ප්‍රතිනිර්මාණය වීම

විශ්‍රාම වැටුප් අංකය ලෙස භාවිතා වන්නේ පද්ධතිය විසින් ජනනය කරනු ලබන අංකයකි. මෙම අංකය යම් විශ්‍රාම වැටුප් ප්‍රතිලාභයක් ගෙවා අවසන් වන තෙක්ම භාවිතා කල හැක. එනම් යම් ප්‍රතිලාභයක් විශ්‍රාමිකයා, ඔහුගේ/ඇයගේ කලත්‍රයා, අනත්දරුවන් හා ආබාධිත දරුවන් යන සියළුම පාර්ශවයන් ලබා ගන්නා තෙක්ම වලංගුව පැවතිමයි. වෙනත් වචන වලින් කියන්නේ නම් එකම අංකයක් යම් ප්‍රතිලාභයක් වෙනුවෙන් යම් ප්‍රතිලාභියෙක් හා ඔහුගේ ඇයගේ යැපෙන්නන් හා උරුමකරුවන් වෙනුවෙන් භාවිතා වන බවයි.

විශ්‍රාම වැටුප් අංකයේ සැකැස්ම පහත පරිදි වේ.




විශ්‍රාම වැටුප් වර්ගයට අදාල කේතය සේවා ප්‍රතිලාභ වර්ගය අනුව වෙනස් වේ.
දිනය ලෙස හැඳින්වෙන්නේ වර්තමාන තත්ත්වයට අදාල දිනය වේ.

උදාහරණ :

- රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදලට බැඳුන දිනය
- රාජ්‍ය සේවා අර්ථසාධක ප්‍රතිලාභ ලබා ගත් දිනය
- රාජ්‍ය සේවයට බැඳුන දිනය
- විශ්‍රාම ගිය දිනය
- මිය ගිය දිනය

තත්ත්වය යන්නෙන් අදහස් වන්නේ යම් ප්‍රතිලාභියෙක් ලබන සේවා අවසාන ප්‍රතිලාභයේ ස්වභාවයයි. එම තත්ත්වයන් පහත වගුවේ දක්වා ඇත.

විශ්‍රාමිකයන් සඳහා ලබා දිය යුත්තේ පද්ධතිය ජනනය කරන අංකය පමණි.

| තත්වය | සංකේතය | | විස්තරය |
|---|---|---|---|
| | දේශීය විචැ | විදේශීය විචැ | |
| දායක මුදල් ගෙවීම | C1 | | වැන්දඹු පුරුෂ හා අනත්දරු අරමුදලට දායක මුදල් ගෙවන්නා |
| | C2 | | රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදලට දායක මුදල් ගෙවන්නා |
| අරමුදල් ප්‍රතිලාභ ලැබීම | B1 | | රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදලේ දායක මුදල් ප්‍රතිලාභ ලබන්නා |
| | B2 | | වැන්දඹු, වැන්දඹු පුරුෂ හා අනත්දරු අරමුදලේ දායක මුදල් ප්‍රතිලාභ ලබන්නා |
| විශ්‍රාම වැටුප් | PN | FPN | සිවිල්/සන්නද්ධ සේවා විශ්‍රාම වැටුප් ලබන්නා |
| | DP | FDP | දුබලතා විශ්‍රාම වැටුප් ලබන්නා |
| | CP | FCP | වන්දි විශ්‍රාම වැටුප් ලබන්නා |
| | WP | FWP | වැන්දඹු, වැන්දඹු පුරුෂ විශ්‍රාම වැටුප් ලබන්නා |
| | WO | FWO | වැන්දඹු, වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප් ලබන්නා |
| | DO | FDO | වැන්දඹු, වැන්දඹු පුරුෂ හා අනත්දරු බෙදීගිය විශ්‍රාම වැටුප් ලබන්නා |
| | WG | FWG | වැන්දඹු, වැන්දඹු පුරුෂ භාරකාර විශ්‍රාම වැටුප් ලබන්නා |
| | OG | FOG | වැන්දඹු, වැන්දඹු පුරුෂ හා අනත්දරු භාරකාර විශ්‍රාම වැටුප් ලබන්නා |
| | DG | FDG | වැන්දඹු, වැන්දඹු පුරුෂ හා අනත්දරු භාරකාර බෙදීගිය විශ්‍රාම වැටුප් ලබන්නා |
| | WD | FWD | වැන්දඹු, වැන්දඹු පුරුෂ ආබාධිත විශ්‍රාම වැටුප් ලබන්නා |
| | DD | FDD | වැන්දඹු, වැන්දඹු පුරුෂ ආබාධිත බෙදීගිය විශ්‍රාම වැටුප් ලබන්නා |
| පාරිතෝෂික | G1 | | සිවිල්/සන්නද්ධ සේවා, සේවා පාරිතෝෂික |
| | G2 | | සිවිල්/සන්නද්ධ මරණ පාරිතෝෂික |
| | G3 | | දුබලතා පාරිතෝෂික |
| | G4 | | දෛනික සේවා පාරිතෝෂික |
| | G5 | | උප තැපැල් ස්ථානාධිපතිවරුන්ගේ පාරිතෝෂික |
| | G6 | | උප දුම්රිය ස්ථානාධිපතිවරුන්ගේ පාරිතෝෂික |
| දීමනා | A1 | | කරුණා සහගත දීමනා |
| | A2 | | තුවාල දීමනා ලබන්නා |
| | A3 | | පුණ්‍යාධාර දීමනා ලබන්නා |
| | A4 | FA4 | යැපෙන්නන්ගේ දීමනා |
| වන්දි | M1 | | සිවිල්/සන්නද්ධ විශේෂ වන්දි |
| | M2 | | පොලිස් වන්දි |

## විශ්‍රාම වැටුප් අංකය සඳහා උදාහරණ

අවස්ථාව 1 - යම් පුද්ගලයෙකු 1984 ජූනි 12 වැනිදා විශ්‍රාම වැටුප් සහිත තනතුරකට පත්වීම
ලියාපදිංචි අංකය - 82/1234567/840612/Ci

අවස්ථාව 2 - ඔහු 2001 අගෝස්තු 16 විශ්‍රාම යාම
ලියාපදිංචි අංකය - 01/1234567/010816/PN

අවස්ථාව 3 - ඔහු 2003 පෙබරවාරි 20 දින මිය යාමෙන් පසු ඔහුගේ වැන්දඹුව විශ්‍රාම වැටුප් ප්‍රතිලාභ ලැබීම
ලියාපදිංචි අංකය - 82/1234567/030220/WP

අවස්ථාව 4 - වැන්දඹුව 2003 ඔක්තෝම්බර් 01 දින මිය යාමෙන් පසු ඇයගේ අනත්දරුවා විශ්‍රාම වැටුප් ප්‍රතිලාභ ලැබීම
ලියාපදිංචි අංකය - 82/1234567/031001/WO

## විශ්‍රාම වැටුප් අයදුම්පත්‍ර ප්‍රතිනිර්මාණය වීම

විශ්‍රාම වැටුප් ප්‍රතිලාභ අයදුම් කිරීම සඳහා භාවිතා කළ යුතු අයදුම් පත්‍ර වර්ග 2 ක් පමණක් ඇත.

- PD 1 - අයදුම්කරු විසින් සම්පූර්ණ කළ යුතු අයදුම්පත්‍රය
- PD 2 - අයදුම්කරුගේ ආයතනයේ පරිගණක පද්ධතිය තුළ ස්ථාපනය කර ඇති ආයතනය විසින් සම්පූර්ණ කළ යුතු ආකෘති පත්‍රය

PD 1 හා PD 2 අයදුම්පත්‍ර තොරතුරු පද්ධතියට ආදාන කිරීමෙන් පසු පද්ධතිය විසින් ජනනය කරනු ලබන වාර්තාව PEN 55 ලෙස හැඳින්වේ. විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුවට එවිය යුතු වන්නේ මෙම ඉලෙක්ට්‍රොනික වාර්තාවයි.

මෙම වාර්තාවේ මෘදුපිටපත වාගේම දෘඩ පිටපතද (ආයතන ප්‍රධානි හා විශ්‍රාමිකයා විසින් අත්සන් කරන ලද මුද්‍රිත පිටපත) විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුවට එවිය යුතුය.
අයදුම්පත්‍ර ස්වරූපවල විස්තර පහත වගුවේ දක්වා ඇත.

| | | |
|---|---|---|
| 1 | වැන්දඹු/වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමය, ලියාපදිංචි වීම - අයදුම්පත | PD 1A PD 2A PEN 55A |
| 2 | වැන්දඹු/වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමය/ ජීවන තොරතුරු වෙනස්වීම යාවත්කාලීන කිරීම - අයදුම්පත. (දායකයා/ දායිකාවගේ විවාහක/දික්කසාදය/කලත්‍රයාගේ මරණය/ තනතුරෙහි සිදුවන වෙනස්කම්/ දරුවන්ගේ ඉපදීම, විවාහය, මරණය, රැකියාවක නියුක්ත බව, ආබාධිත බව, වාර්තා කිරීම කළ යුතුය) | PD 1B PD 2B PEN 55B |

| | | | | |
|---|---|---|---|---|
| 3 | විශ්‍රාම පාරිතෝෂිකය හා මාසික විශ්‍රාම වැටුප ලබා ගැනීම - අයදුම්පත (සේවා පාරිතෝෂිකය, දෛනික සේවා පාරිතෝෂිකය, කරුණාසහගත දීමනාව සඳහාද අදාල වේ) | PD 1C | PD 2C | PEN 55C |
| 4 | විශ්‍රාම පාරිතෝෂිකය හා මාසික විශ්‍රාම වැටුප ලබා ගැනීම (පිරිවෙන් හා පෞද්ගලික පාසල් ගුරුවරුන්) අයදුම්පත්‍රය. | PD 1D | PD 2D | PEN 55D |
| 5 | මරණ පාරිතෝෂිකය ලබා ගැනීම - අයදුම් පත්‍රය (සේවයේ යෙදී සිටිය දී මිය යාම, විශ්‍රාම ගෙන වසරක් තුළ විශ්‍රාම පාරිතෝෂිකය ලබා ගැනීමට මනාපය පලනොකර මිය යාම) | - | PD 2E | PEN 55E |
| 6 | මරණ පාරිතෝෂිකය ලබා ගැනීම (පිරිවෙන් හා පෞද්ගලික පාසල් ගුරුවරුන්) - අයදුම්පත. | - | PD 2F | PEN 55F |
| 7 | විශ්‍රාම පාරිතෝෂිකය හා මාසික විශ්‍රාම වැටුප ලබා ගැනීම (සන්නද්ධ සේවා සාමාජිකයන්) - අයදුම්පත | PD 1G | PD 2G | PEN 55G |
| 8 | සේවා පාරිතෝෂික දීමනාව ලබා ගැනීම (සන්නද්ධ සේවා සාමාජිකයන්) - අයදුම්පත | PD 1H | PD 2H | PEN 55H |
| 9 | දුබලතා විශ්‍රාම වැටුප් (සන්නද්ධ සේවා සාමාජිකයන්) - අයදුම්පත - | PD 21 | PEN | 55I 10 |
| | මරණ පාරිතෝෂිකය ලබා ගැනීම (සන්නද්ධ සේවා සාමාජිකයන්) - අයදුම්පත | - | PD 2J | PEN 55J |
| 11 | යැපෙන්නන්ගේ දීමනා ලබා ගැනීම (සන්නද්ධ සේවා සාමාජිකයන්) - අයදුම්පත | - | PD 2K | PEN 55K |
| 12 | රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 22/93 යටතේ වන්දි ගෙවීම (අසාමාන්‍යසිද්ධි මත මිය ගිය සන්නද්ධ සේවා සාමාජිකයන්ගේ යැපෙන්නන්) - අයදුම්පත | - | PD 2L | PEN 55L |
| 13 | රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 22/93 යටතේ වන්දි හා වන්දි විශ්‍රාම වැටුප් ගෙවීම (සේවයේ යෙදී සිටියදී මිය ගිය සිවිල් සේවකයින්ගේ යැපෙන්නන්) - අයදුම්පත | - | PD 2M | PEN 55M |
| 14 | රාජ්‍ය සේවා අර්ථ සාධක අරමුදල් දායකත්වය ලබා ගැනීම ලියාපදිංචි වීම - අයදුම්පත | PD 1N | PD 2N | PEN 55N |
| 15 | වැන්දඹු/වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදල් දායක මුදල් ආපසු ලබා ගැනීම- අයදුම්පත | PD 1O | PD 2O | PEN 55O |
| 16 | රාජ්‍ය සේවා අර්ථ සාධක අරමුදල් ප්‍රතිලාභ ලබා ගැනීම - අයදුම්පත | PD 1P | PD 2P | PEN 55P |
| 17 | වැන්දඹු/වැන්දඹු පුරුෂ හා අනත්දරු අරමුදල් විශ්‍රාම වැටුප් ප්‍රතිලාභ ලබා ගැනීම - අයදුම්පත | PD 1Q | PD 2Q | PEN 55Q |
| 18 | නැවත සේවයේ යොදවනු ලැබූ (සන්නද්ධ සේවා සාමාජිකයන්) නිළධාරීන් විශ්‍රාම ගැන්වීම - අයදුම්පත | PD 1R | PD 2R | PEN 55R |
| 19 | නැවත සේවයේ යොදවනු ලැබූ (කොන්ත්‍රාත් පදනම මත) නිලධාරීන් විශ්‍රාම ගැන්වීම - අයදුම්පත | PD 1S | PD 2S | PEN 55S |
| 20 | විදේශ විශ්‍රාම වැටුප් ක්‍රමය ලියාපදිංචි වීම - අයදුම්පත | PD 1T | PD 2T | PEN 55T |
| 21 | පුනර්‍යාධාර ලබා ගැනීම - අයදුම්පත | PD 1U | PD 2U | PEN 55U |

## 9.10 ප්‍රතිලාභ

ඉ-විශ්‍රාම වැටුප් ක්‍රමය ක්‍රියාත්මක කිරීමෙන් විශ්‍රාමිකයන් ඇතුළු සමස්ත රාජ්‍ය සේවකයින් සඳහා පහත සඳහන් ප්‍රතිලාභ හිමිවනු ඇක.

- අවශ්‍ය කරන ලේඛන ප්‍රමාණය අඩු වීම- විශ්‍රාම යන අවස්ථාවේදී වැන්දඹු අනත්දරු ගොනුවේ ඇති තොරතුරු අවශ්‍ය කටයුතු සඳහා යොදා ගත හැකි වීම.
- යාවත්කාලීන වූ තොරතුරු තිබීම - දායක මුදල් ගෙවීමේදී ලබා ගන්නා දත්ත උපයෝගී කර ගනිමින් යාවත්කාලීන වූ තොරතුරු පවත්වාගත හැක.
- ඉලෙක්ට්‍රොනික දත්ත හුවමාරුව හේතුවෙන් වැරදි අඩු වීම.
- විශ්‍රාම පාරිතෝෂිකය නියමිත දිනට ලබා දිය හැකි වීම.
- ප්‍රදාන පත්‍රය විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව නිකුත් කරන බැවින් මාසික විශ්‍රාම වැටුප නියමිත දිනයට ලබා දිය හැකි වීම.
- ජාතික, දිස්ත්‍රික්ක හා ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ මට්ටමින් විශ්‍රාම වැටුප් ගෙවිය හැකි වීම.
- දැනුම් මූලයකින් හා අදාල තොරතුරුවලින් සන්නද්ධ ඒක සහායක විමසීම් කවුළුවක් මගින් විමසීම් කටයුතු කළමනාකරණය කිරීම.
- විශ්‍රාමිකයන්ට උපකාර කිරීම සඳහා ප්‍රාදේශීය ලේකම් කාර්යාල වලට විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුවේ ස්ථාපිත සර්වරයේ ඇති තොරතුරුවලට ක්ෂණික ප්‍රවේශ තිබීම.
- මධ්‍යගතව කළමනාකරණය කිරීම හා යම් ප්‍රතිලාභයක් දැනුම් දීමෙන් පසු ඊලග මාසයේ බලපැවැත්වෙන පරිදි විශ්‍රාම වැටුපට අවශ්‍ය සංශෝධනයන් සිදු කිරීම.
- තොරතුරු ඉලෙක්ට්‍රොනිකව පවත්වා ගන්නා නිසා ලේඛන වලට වඩා ඉක්මන් ප්‍රවේශයක් තිබීම.
- දත්ත එක් ස්ථානයකින් වලංගු බවට පත් වන නිසා දත්ක වල සම්පූර්ණ භාවය වැඩිය.
- සියළුම ලගා කර ගත හැකි පරමාර්ථ අධීක්ෂණයවන අතර කළමනාකරණ තොරතුරු පද්ධති වාර්තා ජනනය කරනු ලැබීම.

## 9.11 තොරතුරු තාක්ෂණය යොදා ගැනීම

විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව තොරතුරු තාක්ෂණ නියෝජිත ආයතනය හා ඒකාබද්ධව තොරතුරු තාක්ෂණ ව්‍යාපෘති කිහිපයක්ම ක්‍රියාත්මක කරනු ලැබේ.

i. e - Pensions ව්‍යාපෘතිය
ii. තොරතුරු ආරක්ෂණ ප්‍රතිපත්තියක් නිර්මාණය කිරීම
iii. කාර්ය මණ්ඩලය තොරතුරු තාක්ෂණ දැනුමින් සන්නද්ධ කිරීම
iv. විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තු වෙබ් අඩවිය
v. ලංකා රාජ්‍ය ජාලයට (LGN) සම්බන්ධව වීම

## 1 e - Pensions ව්‍යාපෘතිය

ආර්ථික හා සාමාජීය වශයෙන් තෘප්තිමත් විශ්‍රාමික ප්‍රජාවක් බිහි කිරීම මූලික කර ගනිමින් විශ්‍රාමිකයන් සඳහා කාර්යක්ෂම හා ඵලදායි ලෙස විශ්‍රාම වැටුප් ප්‍රතිලාභ ලබා දෙන සේවාවක් සැපයුම සඳහා තොරතුරු තාක්ෂණයෙන් සවිබල ගැන්වූ විසඳුමකි. මේ යටතේ,

- විශ්‍රාම වැටුප් ක්‍රියාවලිය ප්‍රතිනිර්මාණය කිරීම සහ එම ප්‍රති නිර්මාණය වූ ක්‍රියාවලිය තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය මගින් ශක්තිමත් කිරීම.
- විශ්‍රාමිකයන් වෙත වඩාත් මිත්‍රශීලි හා කාර්යක්ෂම සේවාවක් ලබා දීම සඳහා විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුවේ අභ්‍යන්තර කාර්යක්ෂමතාවය ඉහල දැමීම.
- විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුවේ අනෙකුත් රාජ්‍ය ආයතනවල හා ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල සියලුම විශ්‍රාම වැටුප් කටයුතු සම්බන්ධීකරණය කිරීම ඇතුලත් වේ.

## 2 තොරතුරු ආරක්ෂක ප්‍රතිපත්තිය

e - Pensions ව්‍යාපෘතියට අදාළ තොරතුරු ආරක්ෂක ප්‍රතිපත්තියක් නිර්මාණය කිරීම සිදු කෙරේ. මේ යටතේ

e - Pensions පද්ධතිය ගොඩනැගු පසු එම පද්ධතියේ තොරතුරු සම්පත්වල සුරක්ෂිතතාව තහවුරු කිරීම සඳහා අනුගමනය කල යුතු පියවරයන් ඇතුලත් ආරක්ෂක ප්‍රතිපත්තියක් ගොඩනැගීම සිදුවේ.

## 3 කාර්ය මණ්ඩල තොරතුරු තාක්ෂණ දැනුමින් සන්නද්ධ කිරීම.

විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුවට අදාලව e - Pensions ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා දෙපාර්තමේන්තු කාර්ය මණ්ඩලය පරිගණක හැසිරවීම සම්බන්ධ දැනුමින් සන්නද්ධ කිරීම සඳහා ආයතනය හරහා අදියර 03කින් පාඨමාලා පවත්වන ලදී.

## 9.12 විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තු වෙබ් අඩවිය www.pensions.gov.lk

ආයතනයේ අනුග්‍රහයෙන් ආරම්භ කරන ලද මෙම වෙබ් අඩවිය 2005.12.23 දින නිල වශයෙන් විවෘත කරන ලදී. මෙම වෙබ් අඩවිය හරහා විශ්‍රාමිකයින් මෙන්ම අනිකුත් රජයේ ආයතනයන්ට පහත සඳහාන් සේවාවන් ලබා ගත හැකිය.

2005 වසරේ සිට

- චක්‍රලේඛ
- විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා සංග්‍රහය (සිංහල හා ඉංග්‍රීසි භාෂා වලින් )

2006 වසරේ සිට

- විශ්‍රාම වැටුප් ආකෘති පත්‍ර
- විශ්‍රාම වැටුප් ක්‍රියාවලිය පිළිබඳ තොරතුරු
- විශ්‍රාම වැටුප් හා සම්බන්ධ නීති රීති හා තොරතුරු
- අනිකුත් වැදගත් ලියවිලි

2007 වසරේ සිට

- විශ්‍රාමිකයිනට සිය ජාතික හැඳුනුම්පත් අංකය විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තු වෙබ් අඩවියට ඇතුලත් කොට සිය මාසික විශ්‍රාම වැටුප පිළිබඳවද පෙර මාසවල විශ්‍රාම වැටුප් පිළිබඳවද තොරතුරු ලබා ගත හැකි වීම.

2008 වසරේ සිට

- විශ්‍රාමිකයිනට සිය ජාතික හැඳුනුම්පත් අංකය විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තු වෙබ් අඩවියට ඇතුලත් කොට සිය පාරිතෝෂිකය පිළිබඳ තොරතුරු ලබා ගැනීමේ හැකියාව ඇති කොට ඇත.

## 9.13 ශ්‍රී ලංකා රාජ්‍ය ජාලය (LGN)

- ජාල ස්ථාපනය සහ ඒ සඳහා අවශ්‍ය පරිගණක හා උපාංග 2007 වසර තුල සපයන ලදී.
- මේ යටතේ පරිගණක 10ක් ලැබුණු අතර සියලු පරිගණක සඳහා 512 KB ධාරිතාවයෙන් යුත් අන්තර්ජාල පහසුකම් සපයා ඇත.
- මාණ්ඩලික නිලධාරීන් 10 දෙනෙකු වෙත රාජ්‍ය තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ ප්‍රතිපත්තියට අනුව e-mail ලිපිනයන් 10ක් ලබා දීම, 2008.01.28 දින ලබා දීමට හැකි වීම.

දෙපාර්තමේන්තු තොරතුරු තාක්ෂණ ව්‍යාපෘතිවලට සමගාමීව 2007 ජූනි 31 වන දින විශ්‍රාමිකයින්ගේ ගැටලු තනි කවුලුවකින් (Single Window) විසඳීමේ ක්‍රියාවලියක් ආරම්භ කොට ඇති අතර දෙපාර්තමේන්තු ශ්‍රවණාගාරය නවීකරණය කොට ඇත.

තොරතුරු තාක්ෂණ ව්‍යාපෘති හා e - Pensions ව්‍යාපෘතිය තුලින් විශ්‍රාම වැටුප් හා වැන්දඹු අනත්දරු විශ්‍රාම වැටුප් ගෙවීමේ ප්‍රමාදයට පිළියම් යෝජනා කෙරේ. ඒ අනුව පවතින ක්‍රමවේදයන් වෙනස් කොට නව ක්‍රමවේදයන් හඳුන්වාදීමට නියමිතය.

# 10

# ශ්‍රී ලංකාවේ සමාජ ආරක්ෂණ ප්‍රතිපත්තිය

## 10.1 හැඳින්වීම

සමාජ ආරක්ෂණය පිළිබඳ සම්ප්‍රදානුකූල නිර්වචනය යටතේ විවිධ කරුණු සාකච්ඡා කෙරේ. වියට්නාමයෙහි ග්‍රාමීය සෞඛ්‍යය ද, ඉන්දුනීසියාවෙහි වෙරළබඩ ජනතාවගේ සංවර්ධනය හා සෞඛ්‍ය හා පෝෂණ වර්ධනය ද, පිලිපීනයෙහි මත්ස්‍ය සම්පත් කළමනාකරණයද, මොංගෝලියාවෙහි කෘෂිකාර්මික අංශයේ සංවර්ධනය ද, ලාඕස් හි මූලික අධ්‍යාපනය ද ඉන් අදහස් වේ. එනම් සාම්ප්‍රදානුකූල නිර්වචනය තුළ සමාජ සහයෝගිතාවය හා සමාජ රක්ෂණය, පූර්ව ළමාවිය සංවර්ධනය, ප්‍රතිශක්තිය හා පෝෂණය වැනි කරුණු කෙරෙහි විශේෂයෙන්ම අවධානය යොමුකොට ඇත.

සමාජ ආරක්ෂණය පිළිබඳ ආසියානු සංවර්ධන බැංකු නිර්වචනය ඉතා පුළුල් තත්ත්වයක් පෙන්නුම් කෙරේ. කාර්යක්ෂම කම්කරු වෙළෙඳ පොලක් ඇති කිරීම, මිනිසා අවදානම් තත්ත්වයට මුහුණදීම අවම කිරීම, අනතුරු මෙන්ම ආදායම් හීනවීමෙන් ආරක්ෂා කිරීම, හැකියා වර්ධනය හා දිළිඳුකම අවම කිරීම වැනි පුළුල් ප්‍රතිපත්ති සමූහයක් ආවරණය ඉන් නිර්වචනය වේ.

සමාජ ආරක්ෂණය යන්න ප්‍රධාන අංශ 04 ක් යටතෙහි සාකච්ඡා කළ හැක :

1. සමාජයේ ඉතා දිළිඳු හා අවදානම් තත්ත්වයන්ට පහසුවෙන් ගොදුරු විය හැකි ජන කොටස් සඳහා සෘජු ප්‍රතිලාභ ලබාදීමේ වැඩසටහන්. එනම්, සමාජමය සහනයන්, ශිෂ්‍යත්ව, සෞඛ්‍ය පහසුකම්, ආහාර වැඩසටහන් වැනි සෘජු මූල්‍ය පහසුකම් සැපයෙන වැඩසටහන් මීට ඇතුළත් වේ ;

2. කුඩා කණ්ඩායම් වෙනුවට විශාල ජනගහනයක් ආවරණය වන පරිදි ක්‍රියාත්මක වන ආරක්ෂණ වැඩ සටහන් ;

3. තනි පුද්ගලයන් වශයෙන් නොව ප්‍රජාවක් නියෝජනය වන පරිදි ඇති කරන ප්‍රතිලාභ යෝජනා ක්‍රමයක් ;

   උදා- සමාජ අරමුදල්, ප්‍රදේශයන් පදනම්කර ගත් විවිධ සමාජ වැඩසටහන්

4. දිළිඳු තැනැත්තන් හා අවදානමට ලක් විය හැකි තැනැත්තන් ආරක්ෂා කිරීම සඳහා නෛතික හා ව්‍යවස්ථාමය රැකවරණය ඇති කිරීම් වැඩසටහන්.

   උදා- කම්කරු නීති, ළමා ආරක්ෂණ නීති

සමාජ ආරක්ෂණය පිළිබඳ සිදු කෙරෙන අධ්‍යයනවල දී එය අවස්ථා දෙකක් යටතේ විග්‍රහ කළ හැක. එනම්, සංකල්පනාත්මක ලෙස හා ප්‍රායෝගික තත්ත්වයන් ලෙස එය කොටස් කළ හැකි වේ. එහිදී, දිළිඳුභාවය තුරන් කිරීම හා සමාජ සංවර්ධනය යන වඩාත් සංවේදී කරුණු සමාජ ආරක්ෂණ ප්‍රතිපත්ති මගින් ඇති කළ හැකිද? එමෙන්ම, සමාජ ආරක්ෂණය කුමන ආකාරයෙන් නිර්වචනය කළ හැකි ද හා සමාජ ආරක්ෂණ දර්ශකයක් ඇති කිරීම සාර්ථකතර ගත හැක්කේ කෙසේද යන කරුණු පිළිබඳ විශේෂයෙන්ම අවධානයට ලක් කෙරේ. සමාජ ආරක්ෂණය යනු අවධානමට භාජනය විය හැකි පුද්ගලයන් ඉන් මුදා ගැනීමට ඇති ප්‍රතිපත්ති හා වැඩසටහන් ලෙස සරලව විග්‍රහ කළ හැක. එමගින් ඉලක්කගත කරනු ලබන්නේ අවධානමට ලක්වන පුද්ගලයන්ය.

මූල්‍ය හෝ සම්පත් හුවමාරු පිළිබඳ අදහස් ඉන් පෙන්නුම් කෙරේ. මෙය අප සාමාන්‍යයෙන් කරන කටයුතු එනම් ග්‍රාම සංවර්ධනය, මූලික යටිතල පහසුකම්, සෞඛ්‍ය හා අධ්‍යාපනය යන කාරණාවලින් ඔබ්බට ගිය කරුණු පිළිබඳව සාකච්ඡා කිරීමකි. එමෙන්ම සූක්ෂම ණය වැඩසටහන් පිළිබඳ අවධානය යොමු කිරීමක් දැනටමත් බංගලාදේශය හා වියට්නාමය යන රටවල් හි ක්‍රියාත්මක කෙරෙන එවැනි වැඩසටහන් අධ්‍යයනය කිරීම ද වැදගත් වේ. ඉහත සඳහන් තරුණු සාරාංශගත කළ හොත් ආසියානු සංවර්ධන බැංකුව විසින් නිර්වචනය කෙරෙන සමාජ ආරක්ෂණ සංකල්පයක් ඒ තුළ නිරූපණය වේ. එවැනි සංකල්පයන් ගණනාවකි :

- කම්කරු වෙළෙඳපොළ හා සෘජු රැකියා බිහි කිරීම ;
- කම්කරු හුවමාරු හා වෙනත් රැකියා හා සේවාවන් ;
- හැකියාවන් වර්ධනය කිරීම හා පුහුණු වැඩසටහන් ;
- අවම වයස, වැටුප, සෞඛ්‍ය පහසුකම් හා ආරක්ෂාව පිළිබඳ වූ කම්කරු නීති සම්පාදනය ;
- සමාජ ආරක්ෂක වැඩසටහන් ;
- සෞඛ්‍ය ආරක්ෂණ වැඩසටහන් ;
- සමාජ සුබසාධන වැඩසටහන් ;
- පවුල් පදනම් කර ගත් මූල්‍ය ආධාර වැඩසටහන් ;

  උදා- ආහාර මුද්දර සමෘද්ධි සහනාධාර ;
- නිවාස සඳහා තාවකාලික සහන හා ආධාර ;
- කෘෂිකාර්මික රක්ෂණ සමාජ අරමුදල් හා ආපදාවලට සූදානම් වීම පිළිබඳ කළමනාකරණය ;
- ළමා ආරක්ෂණය, ළමා අපයෝජනයට එරෙහිව දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම.

## 10.2 ශ්‍රී ලංකාවේ සමාජ ආරක්ෂණය

ශ්‍රී ලංකාවට සමාජ සංවර්ධනය පිළිබඳ පුළුල් නිර්වචනයක් නොමැත. කෙසේ වෙතත්, එය විවිධ අවස්ථාවල විවිධ ස්වභාවයෙන් සාකච්ඡාවට භාජනයකොට තිබේ. විශේෂයෙන්ම රජයේ විශ්‍රාම වැටුප් ක්‍රම, විවිධ දායකත්ව විශ්‍රාම වැටුප් ක්‍රම, ගොවි හා ධීවර විශ්‍රාම වැටුප් ක්‍රම සමාජයේ අවිධිමත් කණ්ඩායම්හි විශ්‍රාම වැටුප් ක්‍රම, ස්වයං රැකියා හා සමාජ ආරක්ෂණ යෝජනා ක්‍රම, නිදහස් අධ්‍යාපනය, නිදහස් සෞඛ්‍යය වැනි අංශ හරහා ද එය සාකච්ඡාකොට තිබේ. ශ්‍රී ලංකාවේ සමාජ සුබසාධන වැඩසටහන් හරහා විශාල පිරිසකට ආවරණයක් සැලසීම ද වැදගත්කොට සැලකිය යුතුව ඇත. සමාජ ආරක්ෂණ ක්‍රියාවලිය තුළ නිදහස් අධ්‍යාපනය හා නිදහස් සෞඛ්‍ය පහසුකම් ලබාදීම නිදහසෙන් පසු සියලු රජයන් අනුගමනය කළ ප්‍රතිපත්තියයි. එමෙන්ම රජයේ වියදම් ප්‍රවාහයෙහි වැඩි ප්‍රතිශතයක් ද සමාජ ආරක්ෂණවාදී කටයුතු සඳහා වැයකොට තිබේ. ශ්‍රී ලංකාවේ සමාජ ආරක්ෂණ ක්‍රියාවලිය ප්‍රධාන අංශ 03 ක් යටතෙහි පෙළගැස්විය හැකි වේ.

- රැකියා සුරක්ෂිතතාවය හා උසස්වීම්, කම්කරු නීති, වෘත්තීය සමිති, සාමූහික කේවල් කිරීම් හා කම්කරුවන්ගේ පුහුණුව මීට අයත් වේ.
- සමාජ ආරක්ෂණ හා සමාජ රක්ෂණ වැඩසටහන්, විශ්‍රාම වැටුප, ආබාධිත ආධාර වැඩසටහන්, ජීවිත රක්ෂණ හා අන්තර්ජාතික සෞඛ්‍ය රැකවරණය වැනි දෑ ඇතුළත් වේ.
- ආරක්ෂණ ජාල හෝ සමාජ සුබසාධන වැඩසටහන්

ශ්‍රී ලංකාවේ සමාජ ආරක්ෂණය අංශ කිහිපයක් ඔස්සේ විග්‍රහ කළ හැකි වේ. එකී අංශයන් වන්නේ කම්කරු වෙළෙඳපොළ වැඩසටහන්, සමාජ රක්ෂණය, සමාජ සුබසාධනය, ප්‍රදේශ හා සූක්ෂම ණය වැඩසටහන් හා ළමා ආරක්ෂණය වේ. මෙම අංශ සවිස්තරාත්මකව සාකච්ඡා කළ හැකිය.

## 10.3 කම්කරු වෙළෙඳපොළ වැඩසටහන් - Labor Market Programs

### 10.3.1. කම්කරු නීති සම්පාදනය - Labor Legislation

කම්කරුවන් සඳහා ඉතා වැදගත් හා පිළිගත් ප්‍රමිතීන්වල මූලික ආරක්ෂණය ලබාදීමට ශ්‍රී ලංකාව සමත් වී ඇත. රැස්වීමේ නිදහස හා සාමූහිකව කේවල් කිරීමට ඇති අයිතිය ඇතුළත්ව සම්පාදිත අටවන කම්කරු සංගමයේ ශක්‍යතා ප්‍රකාශනයට ද ශ්‍රී ලංකාව අත්සන් කරනු ලැබීය. වැටුප් විමර්ෂණ කොමිෂන් සභා, ත්‍රී පුද්ගල වැටුප් කමිටු, සාමූහිකව හඩනැගීම වැනි කාරණා හරහා වැටුප් තත්ත්වය ඉහළ නැංවීමට හැකියාව ලැබී ඇත. රාජ්‍ය අංශය, පෞද්ගලික අංශය හා අවිධිමත් අංශය නමින් වැටුප් ලබන ස්ථර තුනක් වේ. රාජ්‍ය අංශයෙන් වැටුප් පාලනය හා වැඩිවීම සිදු වන්නේ රජය කලින් කලට ඉදිරිපත් කරනු ලබන රීති මගිනි. මෙහිදී වැටුප් කොමිසමට, අමාත්‍ය මණ්ඩලය හා අයවැය හරහා අනුමැතිය ලැබේ. පෞද්ගලික අංශයෙහි වැටුප් වැඩි කිරීම ත්‍රී පුද්ගල කමිටුවක් හරහා සිදු වේ. ලංකා හාම්පුතුන්ගේ සංගමය හරහා එය ඉදිරියට ගෙන යැවේ. ශ්‍රී ලංකාවේ කම්කරුවන් සඳහා ඉහළ මට්ටමේ වන්දි ප්‍රදානයන් සිදු කෙරෙන අතර එය සේව්‍යයාට අමතර බරක් ඇති කරයි. 1971 කම්කරුවන්ගේ සේවය නැවැත්වීමේ පනතට අනුව යම් තනතුරක් අහිමි කිරීම සඳහා සේවකයන් පහළොස් දෙනෙකුගේ දැනුවත්භාවයෙන් කම්කරු කොමසාරිස් වරයාගේ අනුමැතිය ලැබිය යුතුය. පනත අනුව මාස තුනක් ඇතුළත පරීක්ෂණයක් පවත්වා තීරණය දැන්විය යුතුය. මෙම පනත අනුව වන්දිය වශයෙන් මාස හයක වැටුප් ගෙවිය යුතුය. 2000 වසරේද මෙම වන්දිය වැඩ කරන ලද වසරක් වෙනුවෙන් දළ වශයෙන් මාස 1.6 ක වැටුපක් ද 2001 වන විට මාස 3.1 වන්දියක් ද ගෙවනු ලැබීය. පසුව සේවයෙන් ඉවත් කරන සේවකයකු වෙනුවෙන් මාස 36-50 දක්වා වන්දි ගෙවනු ලැබීය.

### 10.3.2 සේවකයන්ගේ පාරිතෝෂිත - Employment Gratuities

වයස්ගත වීමේ දී ලැබෙන රැකවරණයක් මෙන්ම විරැකියාවෙන් ආරක්ෂා වීමේ ක්‍රමවේදයක් ලෙස ද පාරිතෝෂිත ගෙවීම පෙන්නුම් කළ හැකිය. පාරිතෝෂිත පනත අනුව සේවකයන්ට පහත සඳහන් හිමිකම් ලැබේ :

- සේවකයන් 15 දෙනෙකු හෝ ඊට වැඩි ප්‍රමාණයක් සිටින කාර්යාලයක යම් සේවකයකු වසර 05 ක් හෝ ඊට වඩා සේවා නියුක්තව සිට එය අවසාන කරන්නේ නම් පාරිතෝෂිකයකට හිමිකම් ලැබේ ;
- සේවකයකු මියගිය අවස්ථාවක දී ඔහුගේ උරුමක්කරුවනට හිමිකම් ලැබේ ;
- දින 30 කට වඩා මෙම ගෙවීම වෙනුවෙන් කාලය වැය වන්නේ නම් ඒ වෙනුවෙන් අධි භාරයක් ද ගෙවීමට සිදු වේ ;
- සේව්‍යයා විසින් පාරිතෝෂිත ගෙවීම පැහැරහැරිය අවස්ථාවක දී සහනයක් පතා කම්කරු කොමසාරිස් ජනරාල් වෙත පැමිණිලි කිරීමට සේවකයන්ට අයිතිය ඇත ;
- පාරිතෝෂිත ගෙවීම පැහැරහැරීම හෝ වැරදි ගෙවීමක් සිදු වූ අවස්ථාවක දී ඒ සම්බන්ධව සහනයක් ලැබීම සඳහා කම්කරු උසාවි වෙත යාමට හැකිය ;

  පාරිතෝෂිතයෙන් ගණන් බැලීම පහත සඳහන් පරිදි සිදු වේ ;

- මාසික වැටුප් ලබන සේවකයන් :- සේවය කරන ලද සෑම වසරක් වෙනුවෙන් මාසික අවසාන වැටුපෙන් අඩක් හිමි වේ.
  උදා - මාසික අවසාන වැටුප රු. 3000/- ක් නම් හා වසර 10 ක් සේවයකොට ඇත්නම් පාරිතෝෂිතය 3000 x10 x ½ = 15000 ක් වේ.

- දෛනික වැටුප් ලබන සේවකයන් :- සේවය කරන ලද එක් වසරක් වෙනුවෙන් දින 14 ක වැටුප හිමි වේ.

  උදා :- අවසාන වැටුප රු.100 ක් හා වසර 06 ක සේවයක් ඇත්නම් පාරිතෝෂිකය

  100 x 14 x 6 = 3400 ක් වේ.

- කෑලි වැඩ ක්‍රමයට ගෙවන ලද සේවකයන් :- සේවය අවසන් කිරීමට පූර්ව මාස 03 ක උපයා ගැනීම පාරිතෝෂිතය වශයෙන් ගෙවනු ලැබේ.

පාරිතෝෂිත ගෙවීම සඳහා අරමුදල් සේව්‍යයා විසින් පවත්වා ගැනීම අත්‍යවශ්‍ය නොවේ. නමුත්, ඒ සඳහා සංචිතයක් තබා ගත යුතුය. පාරිතෝෂිතය භාර අරමුදලක් ලෙස පවක්වා ගනිමින් රජයේ සුරකුම්පත්වල (අවම වශයෙන් 50) හා බැංකු තැන්පත් වශයෙන් ආයෝජනය කළ හැකිය. කෙසේ වෙතක් පාරිතෝෂිත මුදල සේවක අර්ථසාධක අරමුදල තරම් ප්‍රබල නැත. සේවකයන් වෙනුවෙන් සේව්‍යයන් කොපමණ මුදලක් අරමුදල් ගත කළේ ද යන්න සොයා ගැනීම දුෂ්කරය.

10.3.3. රැකියා වියුක්තිකයනට සේවාවන් සැපයීම - Service for the unemployment

රැකියා නියුක්තිය වඩාත් සුබසාධන කාර්යභාරයක් ඉටු කරයි. ශ්‍රී ලංකාවේ සේවා වියුක්තිකයන් ඇත. ආරක්ෂණයත් හෝ රක්ෂණ ක්‍රමයක් මෙතෙක් ක්‍රියාත්මක නොවේ. කෙසේ වෙතත් 2005 වසරේ දී උපාධිධාරීන් 40,000 ක් සඳහා රජ්‍ය අංශයෙන් සේවා නියුක්ති අවස්ථා ඇති කිරීමට ගනු ලැබූ තීරණය තරුණ පිරිසගේ සුබසාධනය ඉහළ මට්ටමට තල්ලු කිරීමට මහගු පිටිවහලක් විය. රැකියාවන්ට අමතර තරුණ පිරිස් සඳහා වෘත්තිකයන් පදනම් කරගත් පුහුණු අවස්ථා ඇති කිරීම වඩාත් වැදගත් වේ. තරුණ සේවා සභාව, වෘත්තීමය පුහුණු අධිකාරිය, ජාතික ආධුනිකත්ව මණ්ඩලය මෙම ක්‍රියාදාමයේ දී පෙරමුණ ගෙන ක්‍රියා කිරීම වැදගත් වේ.

## 10.4 සමාජ හා සෞඛ්‍යය ආරක්ෂණ වැඩසටහන් - Social and Health Insurance Programs

### 10.4.1. රජයේ විශ්‍රාම වැටුප් ක්‍රමය - Government Pension Scheme

ශ්‍රී ලංකාවේ විශාලතම සමාජ ආරක්ෂණ වැඩසටහන් ක්‍රියාත්මක කරන ආයතනය විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව වේ. මෙම දෙපාර්තමේන්තුව පහත සඳහන් සමාජ ආරක්ෂණ ක්‍රම ක්‍රියාත්මක කෙරේ:

1. සිවිල් විශ්‍රාම වැටුප් ක්‍රමය ;
2. සන්නද්ධ හමුදා විශ්‍රාම වැටුප් ක්‍රමය ;
3. වැන්දඹු / වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමය ;
4. රාජ්‍ය සේවා අර්ථ සාධක අරමුදල.

විශ්‍රාම පාරිතෝෂිත, මරණ පාරිතෝෂිත, මාසික විශ්‍රාම වැටුප, සේවා විශ්‍රාම වැටුප්, විශේෂ වන්දි හා විශ්‍රාම පාරිතෝෂිත මෙන්ම වැන්දඹුවන්ට අනත්දරුවන්ට හා ආබාධිත අනත්දරුවන්ට ගෙවන වාර්ෂික විශ්‍රාම වැටුප රුපියල් බිලියන 100 ඉක්මවා ඇත. එමෙන්ම සමස්ත විශ්‍රාමික ජනගහණය මිලියන භාගයකට ආසන්නව පවතී.

රාජ්‍ය නිලධාරීන්ගේ සහසාධක සමිතිය නමින් සුබසාධක කාර්යයන් ඉටු කරන සංගමයක් වේ. එම ආයතනය තම සාමාජිකයන් සඳහා නිවාස ණය, අධ්‍යාපන ණය, ආපදා ණය, විශේෂ උත්සව ණය, ගෘහ භාණ්ඩ මිලදී ගැනීමේ ණය පහසුකම් ලබා දේ. එමෙන්ම, වෛද්‍ය උපකාරක සේවාව හා මරණ පාරිතෝෂිකයක් ද හිමි ගන්වනු ලැබේ.

10.4.2 සේවක අර්ථසාධක අරමුදල හා සේවා නියුක්තකයන්ගේ භාර අරමුදල
Employees Provident Fund EPF and Employees Trust Fund ETF

සේවක අර්ථසාධක අරමුදල 1958 අංක 15 දරන සේවක අර්ථසාධක අරමුදල් පනත යටතෙහි ස්ථාපිත කෙරුණි. මෙම අරමුදල කම්කරු දෙපාර්තමේන්තුව මගින් පරිපාලනය කරනු ලැබේ. පෞද්ගලික අංශය හා රාජ්‍ය අංශයෙන් සංස්ථා සේවකයන්ගේ දායක අරමුදල් මත මෙය ක්‍රියාත්මක වේ. මෙම අරමුදලට සේවකයා තම වැටුපෙන් සියයට 8 ක් ද සේව්‍යයා සියයට 12 ක් ද දායක මුදල් ගෙවිය යුතුය. අරමුදල පවත්වා ගැනීම ශ්‍රී ලංකා මහ බැංකුව මගින් සිදු වේ. මෙම අරමුදල මෙතෙක් විශ්‍රාම වැටුප් ප්‍රතිලාභ ලබා නොදෙන අතර විශ්‍රාම යන අවස්ථාවේ දී එක් වරක් පමණක් ගෙවන ගෙවීමක් ලෙස එකතු වූ ප්‍රතිලාභ ගෙවනු ලැබේ.

සේවකයන් වයස අවුරුදු 55 දී (කාන්තාවන් අවුරුදු 50 දී) මෙම ප්‍රතිලාභ හිමි ගැන්වේ. ඊට අමතරව නිත්‍ය වශයෙන් විදේශගත වීම, විවාහ වීම හා රෝගී තත්ත්වයන්ට මුහුණපෑම මත ප්‍රතිලාභ ලබා ගැනීමේ පහසුකම් සලසා ඇත. මියයාමක දී උරුමක්කරුවනට අදාළ ප්‍රතිලාභ ලබාගත හැකිය. සාමාන්‍යයෙන් මිලියන 10 ක පමණ සේවක සංඛ්‍යාවක් සේවක අර්ථසාධක අරමුදල් ගිණුම් පවත්වා ගන්නා අතර, ඉන් සක්‍රියව ඇත්තේ මිලියන 2.6 ක සේවක පිරිසකගේ ගිණුම් පමණි.

1980 අංක 46 දරන පනත යටතේ සේවා නියුක්තිකයන්ගේ භාර අරමුදල ක්‍රියාත්මක වේ. මෙහි පරිපාලනය සේවක භාර අරමුදල් මණ්ඩලය විසින් සිදු කරනු ලැබේ. මෙම අරමුදලට සේව්‍යයා විසින් සියයට 3 ක දායකත්වයක් සිදු කළ යුතුය. සක්‍රීය සාමාජිකයෙකු සඳහා මරණයක දී ප්‍රතිලාභ, නිත්‍ය ආබාධිත ප්‍රතිලාභ, හෘද හා අක්ෂි ශල්‍යකර්ම සඳහා මුල්‍ය ආධාර, 5 වසර ශිෂ්‍යත්ව සඳහා මුල්‍ය ප්‍රදාන, විශ්‍රාම වැටුප් සහිත පත්වීමක් ලැබූ විට මුල්‍ය ප්‍රදාන යන ප්‍රතිලාභ හිමිගන්වනු ලැබේ. සම්පූර්ණ සාමාජික සංඛ්‍යාව මිලියන 2.5 ක් පමණ වේ.

10.4.3. ගොවි විශ්‍රාම වැටුප් හා සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ
Farmer's Pension and Social Security Benefit Scheme

1987 අංක 12 දරන පාර්ලිමේන්තු පනතින් 1987 දී ගොවි විශ්‍රාම වැටුප හා සමාජ ආරක්ෂක යෝජනා ක්‍රමය ආරම්භ කරන ලදී. කෘෂිකාර්මික හා කෘෂිකර්ම රක්ෂණ මණ්ඩලය විසින් මෙහි පරිපාලනය සිදු කෙරේ. මෙහිදී ඉලක්ක ගත කණ්ඩායම වනුයේ මිලියන 2 ක් පමණ වන ශ්‍රී ලංකික ගොවි ජනතාවගේ ලක්ෂ 12 ක් පමණ වූ කණ්ඩායමක් පමණි. මෙම ගොවි විශ්‍රාම වැටුප ක්‍රමය කොටස් දෙකකින් සමන්විත වේ.

- විශ්‍රාම වැටුප් ක්‍රමය :- වයස්ගත වූ විට මාසිකව ලැබෙන විශ්‍රාම වැටුප මින් අදහස් වේ.
- සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ :-ආබාධිත ප්‍රතිලාභ, ආබාධිත පාරිතෝෂිත හා මරණ පාරිතෝෂිත උදාහරණයන් වේ.

10.4.4. ධීවර කාර්මිකයන්ගේ විශ්‍රාම වැටුප හා සමාජ ආරක්ෂණ ක්‍රමය
Fishermen's Pension and Social Security Benefit Scheme

1990 අංක 23 දරන ධීවර කාර්මිකයන්ගේ විශ්‍රාම වැටුප හා සමාජ ආරක්ෂණ පනත මගින් මෙම විශ්‍රාම වැටුප් ප්‍රතිලාභ යෝජනා ක්‍රමය ආරම්භ කරනු ලැබීය. මෙම ක්‍රමය කෘෂිකාර්මික හා කෘෂිකර්ම රක්ෂණ මණ්ඩලය මගින් පරිපාලනය කෙරෙන අතර ගොවි විශ්‍රාම වැටුප් ක්‍රමයට සමාන නීතිමය රාමුවක් පවති. ධීවර විශ්‍රාම වැටුප් ක්‍රමයෙහි ප්‍රධාන අරමුණු කිහිපයක්ම පවති :

- වයස්ගත තත්ත්වයක දී ධීවර කාර්මිකයන්ට හා ඔවුන්ගේ පවුල්වල සාමාජිකයන්ට සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ ලබා දීම ;
- ධීවරයකුගේ මරණයක දී ඔවුන්ගේ යැපෙන්නන්ට සහන හිමිකර දීම ;
- ධීවර කර්මාන්තය තුළ රැඳී සිටින ධීවරයන් ධෛර්යමත් කිරීම ;
- ධීවර කර්මාන්තයට තරුණයන් ආකර්ෂණයකර ගැනීම ;
- ධීවරයන් අතර ඉතුරුම් තහවුරු කිරීම.

මෙම විශ්‍රාම වැටුප් ක්‍රමයට දායකවීම සඳහා සුදුසුකම් වන්නේ වයස, යම් යම් ධීවර වත්කම් පැවතීම, මේ හා සමාන වෙනත් සමාජ ආරක්ෂණ ක්‍රමයකට දායක වී සිටීම වැනි කරුණු වේ. මෙහි ප්‍රතිලාභ ගොවි විශ්‍රාම වැටුප් ක්‍රමයට සමාන වේ.

### 10.4.5. ස්වයං රැකියාවන්හි නියුක්තිකයන් සඳහා සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ යෝජනා ක්‍රමය The Pension and Social Benefit Scheme for the Employment

1996 අංක 17 දරන සමාජ ආරක්ෂණ මණ්ඩල පනත යටතේ මෙම ප්‍රතිලාභී ක්‍රමය ආරම්භ කරනු ලැබීය. මෙම ක්‍රමය පරිපාලනය කරනු ලබන්නේ ශ්‍රී ලංකා සමාජ ආරක්ෂණ මණ්ඩලය විසිනි. එය අධීක්ෂණය කරනුයේ සමාජ සේවා අමාත්‍යාංශයයි. මෙම ප්‍රතිලාභ ක්‍රමයෙහි අරමුණු කිහිපයක් වේ :

- වයස්ගත වූ විට ස්වයං රැකියාවන්හි නියුක්ත වූ අයට සමාජ ආරක්ෂාවක් ලබා දීම ;
- මරණයක දී යැපෙන්නන්ට සහනයක් ලබාදීම ;
- පුද්ගලයන් ස්වයං රැකියාවල නිරත වීමට උන්නඳු කිරීම ;
- ප්‍රතිලාභ සම්බන්ධ ස්වයං රැකියාවල නිරතවූවන් දැනුවත් කිරීම ;
- ස්වයං රැකියාවල නිරතවූවන්ගේ ජීවන තත්ත්වය උසස් කිරීම.

සාමාජිකත්වය සඳහා වයස් සීමාව අවුරුදු 18-59 අතර වේ. ආදායම් මට්ටම, වෙනත් රජයේ ප්‍රතිලාභ ක්‍රමයට සාමාජිකත්වය ලබා නොතිබීම වැනි කරුණු සොයා බැලේ. මෙම විශ්‍රාම වැටුප් ක්‍රමය යටතේ ප්‍රතිලාභ ක්‍රම හයක් පවතී. සහන, තිළිණ, ඉසුරු, සරණ, සුරකුම, ධනලක්ෂි ලෙස නම් කර තිබේ.

### 10.4.6. අනුමත පෞද්ගලික අර්ථසාධක අරමුදල් Approved Private Provident Fund

මුල් අර්ථසාධක පනත් ප්‍රතිපාදනයන්ට අනුව පෞද්ගලික අර්ථසාධක අරමුදල් බිහි කිරීමටත්, අනුමත දායක විශ්‍රාම වැටුප් ක්‍රම බිහි කිරීමටත් අවසරය පවතී. මෙවැනි පෞද්ගලික අර්ථසාධක අරමුදල් ක්‍රම සෘජුවම කම්කරු කොමසාරිස්ගේ අධීක්ෂණයට යටතේ පවතී. 2000 වසරේ ද ලෝක බැංකු වාර්තාව අනුව මෙවැනි පෞද්ගලික අර්ථසාධක අරමුදල් ක්‍රමවලින් 60ක් පමණ ක්‍රියාකාරී මට්ටමේ පැවති බව දක්වා තිබේ. මෙම ප්‍රතිලාභ ක්‍රමවල තොරතුරු සොයා ගැනීම අපහසු වීම ගැටලුවක් වී තිබේ.

## 10.5 සමාජ සහයෝගිතා වැඩසටහන් - Social Assistance Programs

### සෞඛ්‍ය ආරක්ෂණ - Health Care

නිදහසින් පසු ක්‍රියාත්මක වූ රජයේ සෞඛ්‍ය ප්‍රතිපත්තිය සෘජුව සෞඛ්‍ය සේවාවේ වර්ධනය සඳහා දායක වී තිබේ. එය ජනතාවගේ සෞඛ්‍ය තත්ත්වය හා සුබසාධක දර්ශකය ඉහළ නැංවීමට බලපා තිබේ. උදා- ජීවිත අපේක්ෂාව ඉහළ යාම, මරණ අනුපාතය අඩු වීම, රෝග මර්දනය.

සෞඛ්‍ය ආරක්ෂාව උප කොටස් කිහිපයක්ම යටතේ පැහැදිලි කළ හැක.

- නිදහස් සෞඛ්‍ය ආරක්ෂාව Free Health Care

සෞඛ්‍ය අමාත්‍යාංශය හා පළාත් සභා සෞඛ්‍ය ආයතන විසින් සියලු මහජනයා වෙත සෞඛ්‍ය පහසුකම් නොමිලයේ ලබාදීම මින් අදහස් වේ. නොමිලේ සෞඛ්‍ය පහසුකම්වලට අමතරව පාර්ලිමේන්තුව පනවා ඇති විවිධ නීතිරීති මගින් ද සෞඛ්‍ය ආරක්ෂණය සවිමත් කිරීමට සහය වේ. එමෙන්ම, විවිධ රාජ්‍ය නොවන ආයතන ද මෙම වැඩසටහන් සඳහා සක්‍රීයව දායක වේ.

උදා- පවුල් සෞඛ්‍ය සංවිධානය පවුල් සැලසුම් පිළිබඳවද, සහනය හා සුමිත්‍රයෝ ආයතන මානසික රෝග සම්බන්ධව ද, සර්වෝදය විවිධ පෝෂණ වැඩසටහන් සම්බන්ධව ද, සහාය ලබා දේ.

- ත්‍රිපෝෂ ලබාදීම Provision of Thriposha

ත්‍රිපෝෂ වැඩසටහන සෞඛ්‍ය අමාත්‍යාංශය විසින් දීප ව්‍යාප්තව සිදු කරනු ලබන වැඩසටහනකි. මෙය 1973 සිට කෙයාර් ශ්‍රී ලංකා පදනමේ සහාය ද ඇතිව සිදු කරනු ලැබේ. එය පී.එල්. 480 ආධාර යටතේ සිදුවූවකි. නමුත් 1991 සිට මෙම වැඩසටහන සම්පූර්ණයෙන්ම රජයේ අරමුදල් යටතේ ක්‍රියාත්මක වේ.

- 2002 වසරේ සිට ලෝක ආහාර වැඩසටහන මගින් අඩු බර ළමා උපත් සිදු වීම

වැළැක්වීම සඳහා ආහාර සැපයුම් වැඩසටහනක් ක්‍රියාත්මක කෙරේ. එමගින් කිරිදෙන මව්වරුන්ට හා ගැබිණි මව්වරුන්ට ආහාර මල්ලක් ලබා දීම සිදු වේ. සමෘද්ධි වැඩසටහන තුළ ද මෙවැනි පෝෂණ වැඩ සටහන් ක්‍රියාත්මක වේ.

- ජනාධිපති අරමුදල

1978 පාර්ලිමේන්තු පනතක් මගින් ජනාධිපති අරමුදල ඇති කරන ලදී. මෙම අරමුදල මගින් සමාජයේ දිළිඳු පුද්ගලයන්ට හා සම්පත් අඩු පුද්ගලයන්ට ආධාර සැපයීම සිදු කරනු ලැබේ. විශේෂයෙන්ම බරපතළ ශල්‍ය කර්ම සඳහා වියදම් මෙම අරමුදල දරනු ලැබේ. මෙම අරමුදල රෝහල්වල නව වෛද්‍ය ඒකක ඇති කිරීම සඳහා ද කොළඹ ජාතික රෝහලෙහි එම්ආර්අයි (MRI) ස්කෑන් යන්ත්‍ර ලබා ගැනීම සඳහා ද, ජයවර්ධනපුර රෝහලට කශේරුකා විකලාංග සුව කිරීමේ ඒකක ඇති කිරීමට ද අරමුදල් සපයා තිබේ.

## 10.6 සමාජ ආරක්ෂණ දැල - Social Safety Nets

දකුණු ආසියාවෙහි කැපීපෙනෙන සමාජ ආරක්ෂණ ක්‍රමවේදයක් අනුගමනය කරන රටක් වශයෙන් ශ්‍රී ලංකාව හැඳින්විය හැක. පසුගිය කාලය තුළ ක්‍රියාත්මක කළ ආහාර මුද්දර හා ජනසවිය වැඩසටහන ද වර්තමානයේ ක්‍රියාත්මක වන පාසල් ළමුන්ට නොමිලේ පොත් හා නිල ඇඳුම් සැපයුම්, අවතැන් පුද්ගලයන්ට සහන සැලසීම ආබාධිත සොල්දාදුවන්ට සහන සැලසීම හා ජාතික දුගී දුප්පත්කම මැඩලීමේ ව්‍යාපාරය වන සමෘද්ධි වැඩසටහන ඒ අතර කැපීපෙනේ.

### 10.6.1. සමෘද්ධි වැඩසටහන

දිළිඳු ජනතාවගේ සමාජ ආරක්ෂණය සඳහා රජය විසින් දියත්කර ඇති දැවැන්තම වැඩපිළිවෙල සමෘද්ධි ව්‍යාපාරයයි. එය 1995 දීම පාර්ලිමේන්තු පනතක් මගින් ආරම්භ විය. පරිපාලනය සමෘද්ධි අමාත්‍යාංශයට පැවරී තිබුණි. පසුව එය ජාතිය ගොඩනැගීමේ හා ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයට පැවරුණි. සමෘද්ධි

ව්‍යාපාරයෙහි ක්‍රියාකාරී ආයතනය සමෘද්ධි අධිකාරිය වේ. සමෘද්ධි කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව ඊට සම්බන්ධ වී සිටි සමෘද්ධි නිලධාරීන් රාජ්‍ය සේවයට අන්තර්ග්‍රහණය යටතේ මෙම අධිකාරිය හා දෙපාර්තමේන්තුව දිවි නැගුම නමින් වෙනත් දෙපාර්තමේන්තුවක් බවට පත් වීමට නියමිතය.

සමෘද්ධි ව්‍යාපාරය ශ්‍රී ලංකාවේ විශාලතම සමාජ සුරක්ෂිත දැල වේ. ඒ සඳහා වාර්ෂික අයවැයෙන් රුපියල් මිලියන 9000 ක් පමණ වැයවන අතර, වර්තමානයේ දී මිලියන 1.5 ක පවුල් සංඛ්‍යාවක් ඉන් ආවරණය වේ. සමෘද්ධි වැඩසටහන තුළ සංවර්ධන ප්‍රවේශ 03 ක් පැවතුණි. එනම් සුබසාධනය, සූක්ෂම ආර්ථිකය හා ප්‍රජා සංවර්ධනය යනුවෙනි. සමෘද්ධි පවුල් සඳහා පාරිභෝජන සහනයක් ලබාදීම හා සමාජ රක්ෂණ ආවරණය ලබාදීම සුභසාධන ප්‍රතිපත්තිය යටතෙහි සිදු වේ. සූක්ෂම ආර්ථිකය හෙවත් සූක්ෂම ණය ව්‍යාපාරය යටතෙහි මූල්‍ය සේවාවක් සැපයීම සිදු වේ. මෙය ලංකාවට හඳුන්වා දුන් සමෘද්ධි බැංකු සංගම් මගින් ඉටු කෙරේ. ප්‍රජා සංවර්ධනය යටතේ සමාජ හා ආර්ථික පසුතල පහසුකම් වර්ධනය කිරීම, කෘෂිකාර්මික සංවර්ධනය හා පෝෂණය වැඩිදියුණු කිරීම සිදු කරනු ලැබේ.

සමෘද්ධි ක්‍රියාවලිය තුළ අතිරේක ලක්ෂණ කිහිපයක් ද පවතී. පළමුව ඉහළ පාරිභෝජන හැකියාව ඇති පවුල් සඳහා විවිධ ආධාර යටතෙහි සමාජ ආරක්ෂණ වැඩසටහන් සකස්කර දීම සිදු වේ. ඒ සඳහා මූල්‍ය ආධාර ලබාදෙනු ඇත. දෙවනුව ඔවුන් තම මුද්දර ප්‍රතිලාභවලින් 20 ක් අනිවාර්ය ඉතිරි කිරීම් ලෙස යොදවනු ලැබේ. එමෙන්ම සමෘද්ධි වැඩසටහන් තුළින් ඉදිරියට පැමිණෙන තරුණයන් හා ප්‍රතිලාභී ක්‍රියාකාරීන් පරිපාලන වැඩසටහන් සඳහා ද සහභාගිකර ගැනීම සිදු වේ. මෙම සහභාගිත්ව සංවර්ධන ප්‍රවේශයකි. සිව්වෙනුව සමුපකාර වෙළෙඳසැල්වලින් අදාළ මුද්දර භාවිතාකොට පාරිභෝගික භාණ්ඩ ලබා ගත හැකි වේ. සමෘද්ධි වැඩසටහන තුළ ප්‍රධාන අංශයන් ගණනාවක්ම පවතී. ආහාර මුද්දර දීමනාව ඉන් ප්‍රධාන වේ. අඩු ආදායම්ලාභී පවුල්වල අලුතින් උපදින දරුවන් සිටින මව්වරුන්ට විශේෂ දීමනාවක් ගෙවනු ලැබේ. ඉන් පෝෂණ තත්ත්වය වැඩිදියුණු කිරීම අපේක්ෂා කෙරේ. සියලු සමෘද්ධි පවුල් සඳහා සමාජ ආරක්ෂණ ආවරණයක් ඇත. ළමා උපත්, විවාහය, රෝගාබාධ හා මරණවල දී ප්‍රතිලාභ හිමි ගන්වනු ලැබේ.

10.6.2. පළාත් සභා විසින් සිදු කෙරෙන සුබසාධන හා මහජන ආධාර වැඩසටහන්

පීඩාවන්ට පත් විය හැකි දිළිඳු පුද්ගලයන්ට හා පවුල්වලට ආහාර හා සෞඛ්‍ය පහසුකම් සැපයීම මෙම සුභසාධක වැඩසටහන්වල අරමුණ වේ. බොහෝ විට මෙහිදී පීඩාවට පත් වී ඇති පුද්ගලයන් වශයෙන් සලකන්නේ ආබාධිත හෝ වයස්ගත පුද්ගලයන්ය. මේ අනුව, ආබාධිත, වයස්ගත, දිළිඳු මව්වරුන් හා දරුවන් මේ යටතට ගැනේ. වෙන් කෙරෙන මුදල් ප්‍රතිපාදනවලින් සියයට හැත්තෑපහක්ම වයස්ගත පුද්ගලයන්ගේ සුබසාධන සඳහා යොදවනු ලැබේ. මෙම වැඩසටහන සඳහා තෝරා ගැනීමේ මිනුම් දණ්ඩ වන්නේ පුද්ගලයන්ගේ මාසික ආදායමයි. උදා - මාසික ආදායම රු. 1500ට අඩු වීම, ගංවතුර, සුළිසුළං හෝ වෙනත් විස්තීර්ණ ආපදා හේතුවෙන් විපතට පත් වන පුද්ගලයන්ගේ මාසික ආදායම රු. 3000ට අඩු වීම.

මෙම සුබසාධන ආධාර වැඩසටහන් පහත සඳහන් පරිදි වේ :

- මහජන ආධාර ;
- ලාදුරු ආධාර ;
- පිළිකා ආධාර
- ක්ෂය රෝගය සඳහා ආධාර ;
- පුනරුත්ථාපන ආධාර ;
- ඇස් කණ්නාඩි දීමනාව ;
- රෝද පුටු සැපයුම් ;

- ට්‍රයිසිකල් සැපයුම් ;
- ශ්‍රවනාධාර ලබාදීම් ;
- වෛද්‍ය පරීක්ෂණ සඳහා ආධාර ;
- ශාරීරික ආබාධිත පුද්ගලයන්ට ස්වයං රැකියා ආධාර ලබාදීම්.

අදාළ ප්‍රතිලාභීන් තෝරා ගැනීම් හා ආධාර ලබාදීම ප්‍රාදේශීය ලේකම් කාර්යාල හරහා සිදු වේ. සාමාන්‍යයෙන් වාර්ෂිකව මිලියන භාගයක පමණ ප්‍රමාණයකට මෙම ආධාර වැඩසටහනට ඇතුළත් වේ.

10.6.3. යුධමය වාතාවරණය යටතෙහි අවතැන් වූ පුද්ගලයන්ට ලබාදෙන අධාර වැඩසටහන්

රජය මැදිහත් වී අවතැන් වූ පුද්ගලයන් සඳහා වියලි ආධාර ලබාදීම, සුබසාධක කඳවුරු පවත්වාගෙන යාම හා නැවත පදිංචි කිරීමේ ක්‍රියාවලිය සිදු කරනු ලැබේ.
වියලි සලාක බොහෝ විට අභ්‍යන්තර වශයෙන් අවතැන්වූවන්ට හිමි වේ. සුබසාධන හා අවතැන් වූවන්ගේ කඳවුරු පදනම් කොටගෙන විවිධ වැඩසටහන් ක්‍රියාත්මක කෙරේ. විශේෂයෙන්ම මව්වරුන්ගේ හා දරුවන්ගේ පෝෂණය, අධ්‍යාපනය ඉහළ නැංවීම, වැඩ කිරීම සඳහා ආධාර, පුහුණු වැඩසටහන් ආදී වශයෙන් මෙම ආධාර වැඩසටහන් ක්‍රියාත්මක කෙරේ.

10.6.4. වැඩිහිටි සමාජ ආරක්ෂණ වැඩසටහන්

2000 අංක 9 දරන වැඩිහිටි අයිතිවාසිකම් ආරක්ෂා කිරීමේ පනත මගින් වැඩිහිටියන් සඳහා වන ජාතික කවුන්සිලය හා වැඩිහිටියන් සඳහා වන ජාතික ලේකම් කාර්යාලය බිහි කරන ලදි. මෙම ආයතන දෙක සමාජ සේවා අමාත්‍යාංශය යටතෙහි ක්‍රියාත්මක වේ. මෙහි ප්‍රධාන කාර්යභාරය වන්නේ වැඩිහිටියන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීමයි. ඒ අනුව පහත සඳහන් විවිධ වැඩසටහන් ක්‍රියාත්මක කරනු ලැබේ.

- ගම් මට්ටමින් වැඩිහිටි කමිටු බිහි කිරීම ;
- වයස අවුරුදු 60 ට වැඩි තැනැත්තන්ට වැඩිහිටි හැඳුනුම්පත් නිකුත් කිරීම, ජාතික ඔසුසල හරහා විශේෂ වට්ටම් යටතෙහි ඖෂධ සැපයුම, ජාතික ඉතිරි කිරීමේ බැංකුව මගින් ඉතුරුම් සඳහා විශේෂිත ඉතුරුම් අනුපාත ලබා දීම ;
- දිවා මධ්‍යස්ථාන ඇති කිරීම ;
- ආදායම් උත්පාදක ව්‍යාපෘති සඳහා ආධාර සැපයුම් ;
- වැඩිහිටි ආවරණ ආරක්ෂණ ක්‍රමය ;
- වෛද්‍ය සායන පැවැත්වීම/ කණ්ණාඩි ලබාදීම ;
- පුහුණු හා දැනුවත් කිරීමේ වැඩසටහන් ;
- වැඩිහිටි නිවාස ලියාපදිංචි කිරීම හා වැඩිහිටි නිවාස පවත්වා ගෙන යාම.

10.6.5. ආබාධිත පුද්ගලයන් සඳහා සමාජ ආරක්ෂණ වැඩසටහන්

ශ්‍රී ලංකා ජනරජ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ තුන්වන පරිච්ඡේදයෙහි මූලික අයිතිවාසිකම් යටතෙහි 12 වන ව්‍යවස්ථාව 4 වන උප වගන්තියට අනුව "ආබාධිත තත්ත්වයට පත් වූ කාන්තාවන්, දරුවන් හෝ / හා පුද්ගලයන්ගේ වැඩිදියුණුව සඳහා වන නීති සම්පාදනය මෙම වගන්තිය මගින් වළක්වාලීම සිදු නොකරයි" යනුවෙන් දක්වා ඇත. ආබාධිතයන් සඳහා සමාන අවස්ථා ලබාදීම සඳහා වූ ලෝක වැඩසටහනෙහි වගන්ති 108,109,110, 111 අනුව 1996 අංක 28 දරන පාර්ලිමේන්තු පනත සකස්කර ඇති අතර ඉන් ආබාධිතයන් සඳහා වන අයිතිවාසිකම් ආරක්ෂා කිරීමට විධිවිධාන සලසා ඇත. මෙම පනතට අනුව

ආබාධිකයෙකු යනු උපතින් හෝ එසේ නොවන යම්කිසි ශාරීරික හෝ මානසික ආබාධිත තත්ත්වයන් හේතුවෙන් තම කටයුතුකර ගැනීමට නොහැකි තැනැත්තෙකු වේ. අදාළ පනතට අනුව ආබාධිතයන් සඳහා වන ජාතික කවුන්සිලය මගින් ආබාධිත තැනැත්තන්ගේ තත්ත්වය වැඩිදියුණු කිරීම, ආරක්ෂා කිරීම මෙන්ම ඔවුන්ගේ අයිතිවාසිකම් පිළිබඳව ද කටයුතු සිදු කෙරේ. ආබාධිත තැනැත්තන්ගේ සුබසාධනය හා අයිතිවාසිකම් වෙනුවෙන් ඇතැම් පනත්හි විධිවිධාන බලපවත්වනු ලැබේ.

*උදාහරණ*

1. 1999 අංක 33 දරන සමාජ ආරක්ෂණ මණ්ඩල (සංශෝධිත) පනත අනුව, 4 වන වගන්තියෙහි පහත සඳහන් කරුණු කියවේ. ධීවර හෝ කෘෂිකාර්මික ක්ෂේත්‍රයෙහි පවත්වාගෙන යනු ලබන ක්‍රමයකට පරිබාහිරව ස්වයං රැකියා සිදු කරනු ලබන පුද්ගලයන් සඳහා විශ්‍රාම වැටුප් හා සමාජ ආරක්ෂණ ක්‍රමයක් සකස් කිරීමට මණ්ඩලයට බලය ඇත. එහිදී මෙම පනත අරමුණු ඊට තිබිය යුතුය. ස්වයං රැකියා කරන කැනැත්තන් වයස්ගත වූ හෝ ආබාධිත වූ අවස්ථාවක දී ඔවුන්ට සමාජ ආරක්ෂණය සැපයීම. මෙම පනත අනුව යම් තැනැත්තකු වයස අවුරුදු 35 ට පෙර මෙම ක්‍රමයට දායක වූ විට එම තැනැත්තා පිළිබඳව වෛද්‍යවරයකු යම් මානසික දුබලතාවයක් තිබේ යැයි නිර්දේශ කළ හොත් එම තැනැත්තා වයස අවුරුදු 40 දී විශ්‍රාම වැටුපකට හිමිකම් ලබයි.

2. 1906 අංක 13 දරන වැන්දඹු අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමය මගින් යම් තැනැත්තකු ආබාධිත තත්ත්වයට පත් වූ විට වයස නොතකා ආබාධිත අනත්දරු විශ්‍රාම වැටුප ලබාදීම සිදු වේ.

3. 2000 ජුනි 05 දින පාර්ලිමේන්තු පනතක් මගින් රණවිරු අධිකාරිය පිහිටවනු ලැබීය. මෙම ආයතනය අර්ධ රාජ්‍ය ආයතනයකි. ජනාධිපති කාර්යාලය යටතේ ක්‍රියාත්මක වේ. සන්නද්ධ සේවාවන්හි සිට ආබාධිත තත්ත්වයකට පත් වන රණවිරුවන් සඳහා සුබසාධනය, සමාජ ආර්ථික සංවර්ධන ආධාර වැඩසටහන් ක්‍රියාත්මක කෙරේ.

4. 1873 මානසික රෝග ආඥාපනත මඟින් මානසික ආබාධ සහිත පුද්ගලයන් සඳහා ආරක්ෂාව සැපයුම සිදු වේ.

5. 1992 දෘශ්‍යාබාධිත පුද්ගලයන් සඳහා වන පාර්ලිමේන්තු පනත හා දිළිඳුභාවය පිටුදැකීමේ පනත වැනි පනත් මඟින් සමාජයේ සහනයක් අපේක්ෂා කරන පුද්ගලයන්ට සහන සපයා ඇත. දෘශ්‍යාබාධිත පුද්ගලයන් සඳහා වන පනත මගින් ඇස් පෙනීමේ දුර්වල තැනැත්තන්ගේ වෘත්තීමය පුහුණු අධ්‍යාපන කටයුතු සඳහා ආධාර දීම සිදු කෙරේ. එමෙන්ම, ස්වයං රැකියා සඳහා ද ආධාර වැඩසටහන් ක්‍රියාත්මක කෙරේ. භාණ්ඩාගාර චක්‍රලේඛ 1221 යටතේ ද වාර්ෂික ආදායම රු. 1,23,480 ට අඩු තැනැත්තන් සඳහා නොමිලේ ඇස් කණ්ණාඩි ලබා ගැනීමට හැකියාව ඇත.

6. 1988 අගෝස්තු 18 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 27/88 ට අනුව රැකියා අවස්ථාවන්ගෙන් 3% ක් ආබාධිත තැනැත්තන් සඳහා ලබාදීමට අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු සංස්ථා සඳහා උපදෙස් ලබා දී තිබේ.

7. 1934 සේවක වන්දි පනතෙහි 139 පරිච්ඡේදය අනුව යම් සේවකයකු ආබාධිත තත්ත්වයට පත් වූ විට සේවක භාරකාර අරමුදලෙහි වන්දි ලබා ගැනීමට හැකියාව ඇත.

8. 1941 අංක 27 දරන වැටුප් මණ්ඩල ආඥාපනත අනුව "නොහැකියාවන්" සහිත පුද්ගලයන්ට සැහැල්ලු වැඩ දීමටත්, ආබාධිත නොවන පුද්ගලයන්ට වඩා අඩු වැටුප් ලබා දීමටත් විධිවිධාන සලසා ඇත.

9. 1948 දී ඇති කරන ලද සමාජ සේවා දෙපාර්තමේන්තුවෙහි මෙහෙවර වන්නේ සමාජයේ ප්‍රතිලාභ අඩු කණ්ඩායම් තෝරාගෙන ඔවුන් ප්‍රධාන සමාජ සුබසාධන ප්‍රවාහයකට යොමු කිරීම සඳහා අවශ්‍ය දිරිය ලබාදීමයි. එමෙන්ම තවත් ප්‍රධාන කාර්යයක් වනුයේ ආබාධිත පුද්ගලයන් ස්වයං ර කියාවලට යොමු කිරීමයි. ක්‍රියාත්මක කෙරෙන විවිධ වැඩසටහන් පහත දැක්වේ.

- ආබාධිත දරුවන්ට කථා කිරීමට පහසු කරවන ප්‍රතිකාර, වෘත්තීමය කටයුතු සඳහා ප්‍රතිකාර, ශාරීරික ප්‍රතිකාර, පූර්ව පාඨශාලා අධ්‍යයනය, ජීවත්වීමේ ක්‍රමවිධි පිළිබඳ දැනුම, දෙමාපියන් දැනුවත් කිරීමේ වැඩසටහන් දෙමාපියන් හා ගුරුවරුන් දැනුවත් කිරීමේ වැඩසටහන්, ආබාධිත දරුවන් සඳහා පූර්ව අධ්‍යාපනික පාඨමාලා හඳුන්වා දීම ;

- වෘත්තීමය පුහුණු වැඩසටහන් පවත්වා ගැනීම, සහභාගිවන්නන්ට දීමනාවක් ගෙවීම උපාධි පුහුණුවන්නන් සඳහා වටිනා උපකරණ ලබාදීම ;

- ආබාධිතයන් සඳහා කෘතීම අත් පා ලබාදීම ;

- මත්ද්‍රව්‍යවලට ඇබ්බැහිවූවන් පුනරුත්ථාපනය.

### 10.6.6. රණවිරු සෙවණ

මෙම වැඩසටහන 1990 ඔක්තෝබර් 10 දින ආරම්භ විය. රණවිරු සෙවණ පුනරුත්ථාපන මධ්‍යස්ථානය යුධ හමුදාව විසින් පාලනය කරන අතර, එය රාගම ඉදිකර තිබේ. ඒ තුළින් පරිගණක පුහුණුව, නිවාස අවශ්‍යතා සම්පාදනය, කෘතීම අත්පා ලබාදීම සිදු කරනු ලැබේ. ඉහත සඳහන් කළ සුබසාධන වැඩසටහන් වලට අමතරව විවිධ ස්වේච්ඡා සංවිධාන මෙවැනි ආබාධිත පුද්ගලයන් සඳහා නිවාස හා පුහුණු ආයතන පවත්වාගෙන යනු ලැබේ.

# 11

# දකුණු ආසියාතික කලාපීය රටවල්හි විශ්‍රාම වැටුප් පිළිබඳ උපාය මාර්ග

## 11.1 හැඳින්වීම

ඉතා අධික ජනගහනයක් ජීවත් වන ආසියාතික රටවල් මුහුණපාන ප්‍රධාන ගැටලුවක් ලෙස වයස්ගත වීම හැඳින්විය හැකිය. වයස් ගත ජනගහනය වර්ධනය මහත් අහිතකර විපාක ඇති කරවන අතර රාජ්‍ය ප්‍රතිපත්ති කෙරෙහිද අහිතකර බලපෑම් ඇති කරවනු ලබයි. ශ්‍රී ලංකාව , ඉන්දියාව , පාකිස්ථානය , බංගලාදේශය හා නේපාලය යන කලාපීය රටවල සෑම වසරක් පාසාම මහලු වයසට අලුතින් එකතු වන ජනගහනය මිලියන දහයක් පමණ වේ. මින් 90% ජීවිතයේ සැඳෑ සමය යහතින් ගත කළ හැකි විශ්‍රාම වැටුප් වැඩසටහනකට ඇතුළත් නොවේ. එ බැවින් විශ්‍රාම වැටුප් ආවරණයක් නොමැතිවීම කලාපයේ වයස්ගත ජනගහනය මුහුණපාන ඉතා බැරෑරුම් ගැටලුවක් වී තිබේ. ලෝකයේ ධනවත් බටහිර රටවල්හි, පසුගිය දශක දෙක පුරා විවිධ විශ්‍රාම වැටුප් ප්‍රතිසංස්කරණ වැඩසටහන් ක්‍රියාත්මක වූ අතර එහි ප්‍රතිඵලය වූයේ වැඩිහිටි ජනගහනයට තම සැඳෑ සමය ආත්ම තෘප්තියකින් යුතුව ගෙවා දැමීමට හැකි වීමයි. මෙම ප්‍රතිසංස්කරණ වැඩසටහන් දකුණු ආසියාතික රටවලට ආරෝපණය කිරීමට උත්සාහය ගෙන ඇති නමුත් එය එතරම් පහසු නොවේ. ඊට බොහෝ බාධක පවති. උදා:- දකුණු ආසියාතු කලාපීය රටවල 7% ට වඩා අඩු ප්‍රතිශතයක්, වයස අවුරුදු 60 ඉක්මවන ලද ජනගහනයෙන් සමන්විත වේ. එමෙන්ම ඉදිරි දශක දෙකක කාල සීමාව තුළ කලාපයන්හි වයස්ගත ජනගහනය දෙගුණයක් දක්වා වර්ධනය වනු ඇතැයි පුරෝකථනය කොට තිබේ.වර්තමානයේදී කලාපය තුළ විශාල තරුණ ශ්‍රම බලකායක් දක්නට ලැබේ. විධිමත් විශ්‍රාමික ප්‍රතිලාභ වැඩසටහන් වලින් මින් ආවරණය වන්නේ 10% ට වඩා අඩු ප්‍රතිශතයකි. එ මෙන්ම බොහෝ වැඩිහිටියන් හට තම දරුවන්ගෙන් හෝ විස්තිරණ පවුල් වලින් ජීවිතයේ සඳෑ සමයට ලැබෙන මූල්‍ය ආධාර ඉතා අවම මට්ටමකින් පැවතීම ද දැකිය හැකිවේ. බොහෝ තරුණ ශ්‍රමිකයින් ආදායම් සොයා විදේශගත වීම මෙම කලාපයේ කැපී පෙනේ. උදා:- ඉන්දියානුවන් මිලියන 5 ක් ද නේපාල ජාතිකයින් මිලියන 1.6 ක් ද ආසියාවේ හෝ ගල්ෆ් කලාපයෙහි අනෙකුත් රටවල ඉදිකිරීම් සනීපාරක්ෂක හා ගෘහස්ථ සේවා අංශයන්හි කෙටි කාලීනව සේවා නියුක්තව ඇත. ඔවුන් තම වැඩිහිටිවිය සුරක්ෂිත කර ගැනීම සඳහා සිදුකර ඇති ඉතුරුම් ඉතා අල්ප වේ. එමෙන්ම මොවුන් දේශීය වශයෙන් විධිමත් විශ්‍රාම වැටුප් හෝ අර්ථ සාධක අරමුදල් ක්‍රමවේදයක් සඳහාද සහභාගි වී නොමැත. ප්‍රතිඵලය වැඩිහිටි ජීවිතය අඳුරු වීම විනා වෙනත් කිසිවක් නොවේ.

## 11.2 දකුණු ආසියාතික රටවල ජනගහනය හා ශ්‍රම වෙළඳ පොළ

ආයු අපේක්ෂාව ඉහළ යාමත් , ශ්‍රමිකයන් විදේශගත වීමත් නිසා සාම්ප්‍රදායික ඒකාබද්ධ (විස්තීරණ) පවුල් ක්‍රමය බිඳ වැටීම තුළින් ඉතා මහලු වයසට පත්වන කලාපීය ජනගහනය , විවිධ ගැටලු වලට මුහුණ දෙනු ලැබේ. සාමාන්‍යයෙන් වියපත් වියෙහි වසර 20ක ට අධික කාලයක් යහතින් ගත කිරීම සඳහා වැඩ කළහැකි කාල සීමාව තුළ ප්‍රමාණවත් ඉතුරුම් රැස්කර තබාගත යුතුය. ජනගහනයෙන් වැඩි ප්‍රමාණයක් මූලික ජීවන මට්ටමින් පහළ ජීවත්වන බැවින් ඔවුන් සතු මූල්‍යමය ඉතුරුම් ඉතා අල්ප වේ. ආයු අපේක්ෂාව ඉහළ යාම සමඟ ඉතිරි කිරීම් ප්‍රමාණවත් වන කාලයට වඩා වැඩි කාලයක් ඔවුන්ගෙන් බහුතරය ජීවත් වනු දැකිය හැකිය.කලාපයෙහි අවිධිමත් අංශය ඉතා විශාලය. එහි සේවා නියුක්ත වූවන්ගෙන් හතරෙන් එක් කොටසක් පමණ යාන්තමින් වාර්ෂිකව ඩොලර් 1000 ක් පමණ වූ ආදායමකට හිමිකම් කියති. ඒ නිසා දළ වශයෙන් ඩොලර් 100ක් පමණ වාර්ෂික විශ්‍රාම වැටුප් ප්‍රතිලාභයක් ඔවුන් වෙත ලබාදිය

| | බංගලාදේශය | ඉන්දියාව | නේපාලය | පාකිස්ථානය | ශ්‍රී ලංකාව |
|---|---|---|---|---|---|
| ජනගහනය 2009 වසර (මිලියන ) | 162 | 1198 | 28 | 173 | 20 |
| වයස් ව්‍යුහය 0-14 | 31.3 | 31.5 | 38.3 | 36.9 | 24.3 |
| 15-59 | 62.5 | 61.3 | 54.5 | 56.9 | 63.9 |
| 60 වැඩි | 21.0 | 19.6 | 15.6 | 14.9 | 27.8 |
| 80 වැඩි | 2.3 | 2.6 | 1.7 | 1.8 | 6.5 |
| ශ්‍රම බලකාය (මිලියන) | 49.5 | 380.8 | 15.0 | 55.8 | 13.0 |
| විශ්‍රාම වැටුප් ආවරණය (ශ්‍රම බලකායෙන් ප්‍රතිශතයක්) | 10 | 12 | 5 | 10 | 15 |
| ඒක පුද්ගල ආදායම (ඇ.ඩොලර්) | 470 | 950 | 511 | 1095 | 2054 |
| මුල්‍යසේවාවන් (ජනගහනයෙන් ප්‍රතිශතයක් ලෙස) | - | | 52.3 | 30.0 | 26.6 |

*මූලාශ්‍රය :- ( ආසියානු සංවර්ධන බැංකුව )*

හැකි බව වත්මන් ඇස්තමේන්තු අනුව පෙනී ගොස් ඇත. එබැවින් මොවුන් සඳහා වූ විශ්‍රාම වැටුප් ක්‍රමයකට ප්‍රතිපත්ති වශයෙන් රජය මැදිහත් වීම අත්‍යාවශ්‍ය වේ. නො එසේ නම් විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක විය හැකි ශ්‍රමිකයින්ට පවා මහළු වයසේදී ජීවත්වීම සඳහා කිසියම් ආර්ථික කටයුත්තක නියැලීමට සිදුවේ. තව දුරටත් වැඩ කිරීමට නොහැකි වන විට දී දරුවන්ගේ උපකාරය බලාපොරොත්තු වීම අනිවාර්ය වේ. කෙසේ වෙතත් වේගවත් ශ්‍රම සංචලතාවයක් හා ඔවුන්ගේ දරුවන්ද අඩු ආදායම් ශ්‍රම බලකාය තුල සිටීමේ සම්භාවිතාවය වැඩිවීමත් හේතුවෙන් මහලුවිය අපල වලින් ගහන වේ. මෙය ඊළඟ මහළු පරම්පරාවටද අඳුරු බලාපොරොත්තු ඇති කරවයි. මහලු වයසෙහි දුප්පත්කම කලාපීය රටවලට පාලනය කළ නො හැකි වූ රාජ්‍ය ප්‍රතිපත්තිවලට අභියෝග කරන , කාලය වැඩි ඇතක නොවේ.

සෑම දකුණු ආසියාතික රටකම පාහේ රාජ්‍ය සේවකයින් සඳහා සිවිල් විශ්‍රාම වැටුප් ක්‍රමයක් ක්‍රියාත්මක වීම දැකිය හැකිය. එය රජයේ බදු ආදායම මත නඩත්තු කරන විශ්‍රාම වැටුප් ක්‍රමයකි. ආයු අපේක්ෂාව ඉහළ යාම සමග වැඩි කාලයක් විශ්‍රාම වැටුප් පිරිවැය දැරිය යුතුය. එමෙන්ම මෙම විශ්‍රාම වැටුප් ක්‍රමවලට අලුතින් ආදේශ කරන ත්‍යාගශීලී වැඩි කිරීම් හේතුවෙන් එහි පිරිවැය වාර්ෂිකව වේගයෙන් ඉහළ යාමද දැකිය හැකිය. උදා:- ඉන්දියාවෙහි ප්‍රාන්ත කීපයකම බදු ආදායමෙන් 70% ට වඩා ප්‍රමාණයක් සිවිල් විශ්‍රාම වැටුප් පරිපාලනය සඳහා වැයවේ. මේ නිසා කලාපීය රටවල් යම් යම් ප්‍රතිලාභ කපා හැරීම්, විශ්‍රාම ගැන්වීමේ වයස වැඩි කිරීම් , සාම්ප්‍රදායික සිවිල් විශ්‍රාම වැටුප් ක්‍රමය වෙනුවට නව

සේවකයින් සඳහා දායකත්ව විශ්‍රාම වැටුප් ක්‍රම ආදේශනය කිරීම වැනි වැදගත් ක්‍රියාවලියන් හඳුන්වා දෙමින් සිටී.

## 11.3 දකුණු ආසියාතික රටවල සිවිල් සේවා විශ්‍රාම වැටුප් ක්‍රම

| රට | ඉන්දියාව | නේපාලය | පාකිස්ථානය | ශ්‍රී ලංකාව |
|---|---|---|---|---|
| විශ්‍රාම වැටුප් ලබන සේවක සංඛ්‍යාව ( මිලියන ) | 30 | 0.3 | 3.5 | 1.8 |
| විශ්‍රාම වැටුප් ප්‍රතිශතය | 50 | 50 | 70 | 85 |
| වාර්ෂික වියදම ( බිලියන එ.ජ ඩොලර්) | 25 | 0.1 | 1.8 | 1 |
| විශ්‍රාම ගැන්වීමේ වයස අවුරුදු | 60 | 58 | 60 | 60 |
| අවු: 60 දී සාමාන්‍ය ආයු අපේක්ෂාව | 75 | 75 | 76 | 76 |

*මූලාශ්‍රය :- ( ආසියානු සංවර්ධන බැංකුව)*

විශාල පෞද්ගලික අංශයන්හි වැටුප් ලබන සේවකයින් සඳහා අනිවාර්යය වූ අර්ථ සාධක ප්‍රතිලාභ වැඩ සටහන් කලාපයෙහි රටවල ක්‍රියාත්මක වේ. එම වැඩසටහන් තුළින් ශ්‍රම බලකායේ ප්‍රතිශතයක් ලෙස ආවරණය වන ප්‍රමාණය ඉන්දියාවේ 6% ක් ද නේපාලයේ 4% ක් ද පාකිස්ථානයෙන් 7.6 % ක් ද ශ්‍රී ලංකාවේ 15% ක් ද වේ. සේවක සේව්‍යය දායකත්වය ඉන්දියාව 24%, නේපාලය 20 %, පාකිස්ථානය 6% ක් හා ශ්‍රී ලංකාව 20% ක් වේ. ප්‍රතිලාභ ලැබිය හැකි වයස ඉන්දියාවේ අවුරුදු 60 , නේපාලය 60 පාකිස්ථානයේ 60 හා ශ්‍රී ලංකාව පිරිමි 55 හා ගැහැනු 50 ක් වේ. කල්පිරීමට පෙර විවිධ හේතු මත මෙම ප්‍රතිලාභ ආපසු ලබා ගැනීමට ද අවස්ථාව ලැබී තිබේ.සෑම අවස්ථාවක දී ම විශ්‍රාම වැටුප් හා අර්ථ සාධක අරමුදල් පරිපාලනය කිරීම හා කළමනාකරණය කෙරෙනුයේ රාජ්‍ය දෙපාර්තමේන්තුව මගිනි.අදාළ මුදල් විධිමත් පරිදි ආයෝජනය කිරීම බලධාරින් සතු කාර්යභාරයක් වේ.

උපතේදී ආයු අපේක්ෂාව

| රට | 2000-2005 | 2010-2015 | 2020-2025 | 2045-2050 |
|---|---|---|---|---|
| බංගලාදේශය | 63 | 67.7 | 71 | 76.2 |
| ඉන්දියාව | 62 | 65.7 | 68.1 | 73.3 |
| නේපාලය | 63.6 | 68.1 | 71.3 | 76.5 |
| පාකිස්ථානය | 64.7 | 68 | 70.7 | 76 |
| ශ්‍රී ලංකාව | 73 | 74.9 | 76.6 | 80 |

*මූලාශ්‍රය :- ( ආසියානු සංවර්ධන බැංකුව )*

තලාපීය රටවල් විශ්‍රාම වැටුප් හා බැඳුන විවිධ සමාජ ආරක්ෂිත වැඩසටහන් ක්‍රියාත්මක කරන අතර ආයු කාලය වැඩිවීම සමගම එවැනි වැඩ සටහන් පවත්වාගෙන යාම අසීරු තත්වයකට පත්ව ඇත. ඉතා හොඳ මූල්‍ය වෙළඳ පොළක් දකුණු ආසියාතික රටවල නොමැති වීම ද තවත් ගැටලුවකි. අසංවර්ධිත වූ සුරැකුම්පත් වෙළඳපොළක් මෙම රටවල ඇත. ඒ නිසා විශ්‍රාම වැටුප් වත්කම් ආයෝජනය හා ඒ තුළින් වැඩි ප්‍රතිලාභ හිමිකර ගැනීම දුෂ්කර වී තිබේ. කලාපය තුළ ඉන්දියානු සුරැකුම්පත් වෙළඳපොළක් සංවර්ධනය වී ඇති අතර එය ලෝකයේ අනෙකුත් දියුණු රටවල කොටස් වෙළඳපොළ කටයුතු වලට සමාන වේ. නෙසේ නමුත් ඉන්දියාවේ පවා අවිධිමත් අංශයේ ශ්‍රම බලකායට, එනම් දූරස්ථ හා ග්‍රාමීය ප්‍රදේශවල ජනතාවට බැංකු මූල්‍ය පහසුකම් ඇත්තේ ඉතාම අල්ප වශයෙනි. සාක්ෂරතාවය මෙන්ම සාමාන්‍ය ඉතුරුම් නිපුනතාවය සමග බද්ධ වූ කාර්යක්ෂම සුරැකුම්පත් වෙළඳපොළක් නොමැති වීම මහලු වයසේ ආදායම් සුරක්ෂිතතාවය පවත්වා ගැනීම සීමා කරවන සාධකයකි. ස්වේච්ඡා විශ්‍රාමික ඉතුරුම් කලාපය තුල අඩුය. මහලු වයසේහි වියදම් වර්ධනය ඊට හේතුවේ. අවිධිමත් අංශයේ සේවකයන් දරිද්‍රතා කඩඉමට පහළ ආදායම් ලබන බැවින් ඔවුන්ගේ ඉතුරුම් බලාපොරොත්තු විය නො හැකිය. සූක්ෂම ණය හා බැඳුනු දුප්පතුන්ගේ ඇතැම් වැඩසටහන් තුලින් මෙම ඉතුරුම් වර්ධනයට ගත් උත්සාහයන්ද කලාපය තුළ වාර්තා වේ.

උසස් හා කාර්යක්ෂම රක්ෂණ වාර්ෂික දීමනා වෙළඳ පොළක් කලාපය තුළ ස්ථාපිතව නැත. සෞඛ්‍ය, අස්වැන්න, ගව රක්ෂණය සඳහා ප්‍රවේශයක අවිධිමත් අංශය තුළ නැත. දුප්පතුන්ට හා පොහොසතුන්ට වෙන්වූ රක්ෂණ ආවරණ ක්‍රමද නැත. උදා :- ඉන්දියාවේ 60 වන වියේදී ඉතා කෙටිකාලයක් ජීවිත අපේක්ෂාව ඇති දුප්පතුන්ට වෙනසක් නො දක්වා දුප්පත් පොහොසත් සැමට සමාන රක්ෂණ යෝජනා ක්‍රම ප්‍රතිලාභ ක්‍රියාත්මක කරවයි. ඒ නිසා පළමුව මිය යා හැකි දුප්පතුන්ට වඩා වැඩි ප්‍රතිලාභ , වැඩිකාලයක් ප්‍රතිලාභ පරිහරණය කළ හැකි ධනවතුන්ට හිමි වේ. එය දුප්පතුන්ගේ ප්‍රතිලාභ ධනවතුන් වෙත ගලා යාමකි. එබැවින් සැමට සාධාරණ වූ රක්ෂණ ආවරණ වැඩ සටහන් ඵලදායීව ක්‍රියාත්මක කිරීම වැදගත් වේ. ඒ සඳහා ප්‍රතිපත්ති සම්පාදකයන්ට මෙන් ම රක්ෂණ සමාගම්වලට ද මහත් වෙහෙසක් දැරීමට සිදුවේ.

## 11.4 බංගලාදේශීය අත්දැකීම් :-

2009 වසරේ දී බංගලාදේශ මුළු ජනගහනයෙන් දළ වශයෙන් 6% ක් මහලු ජනගහනයක් වූ (අවුරුදු 60 හා ඊට වැඩි ) අතර 2030 වන විට මිලියන 18 ක් දක්වා එය තෙගුණයක් වනු ඇතැයි අපේක්ෂා කෙරේ. 2050 වන විට බංගලාදේශ ජනතාවගෙන් 21% ක් වයස අවුරුදු 60 ට වැඩි අය බව එක්සත් ජාතීන් ඇස්තමේන්තු කරයි. කලාපයේ අනෙකුත් රටවල මෙන්ම බංගලාදේශයේද මහල්ලන් මහලු වයසේදී ආදායම් රැකවරණය සඳහා තම දරුවන් හා විස්තීරණ පවුල් මත තබන සාම්ප්‍රදායික විශ්වාසය බංගලාදේශයේද ශ්‍රම සංචලත්වය හා ආර්ථික අමාරුකම් නිසා වේගයෙන් ඛාදනය වෙමින් පවතී. දකුණු ආසියාවේ අනෙකුත් රටවල මෙන් බංගලිදේශ රජයද තම රාජ්‍ය සේවකයන් සඳහා ආදායම් ප්‍රතිලාභ අර්ථ ගැන් වූ , යැපෙන්නන්ට ද ප්‍රතිලාභ හිමිවන , බදු ආදායම් පදනම් කර ගත් විශ්‍රාම වැටුපක් ලබා දෙයි. වයස අවු: 57 දී විශ්‍රාම වැටුප ලැබීමට සිවිල් සේවකයින්ට හිමිකම් ලැබේ. වනවගා , උයන්වගා, සත්ව පාලනය හා ධීවර ඇතුළු ගොවිපළ අංශයේ නියුතු ශ්‍රම බලකායෙන් බහුතරයක් සඳහා කිසිදු විධිමත් ඉතිරිකිරීම් වැඩසටහනක් බංගලාදේශයට නැත. විශ්‍රාමයේදී ලැබෙන ප්‍රසාද දීමනාවක් හැරෙන්නට , විධිමත් කිසිඳු ඉතිරි කිරීම් වැඩසටහනකට ප්‍රවේශයක් පෞද්ගලික අංශයේ ආයතනවල සේවකයන්ට මහලු වයසේදී නැත. තමන්ගේම ඉතිරි කිරීම් මත හෝ විශ්‍රාම යාමේදී ජීවත්වීම සඳහා ප්‍රමාණවත් මහලු වයස් දීමනා වැඩසටහනක් කෙරෙහි හෝ පෞද්ගලික අංශයේ සේවකයන්ද අවිධිමත් අංශ ශ්‍රම බලකායේ බහුතරයක්ද විශ්වාසය තැබේ. ග්‍රාමීන් නම් වූ කුඩා මූල්‍ය ව්‍යාපාරයක් ( Micro Finance ) බංගලාදේශය පුරාම පාහේ පැතිර ඇත. BRAC ග්‍රාමීන් සහ ASA ආයතන ඇතුළත් බොහොමයක් කුඩා මූල්‍ය ආයතන, ප්‍රමාණවත් ලාභාංශ ගෙන දෙන හා ගනුදෙනුකරුවන්ට ණය දීම සඳහා කුඩා මූල්‍ය ආයතන වලට අරමුදල්

සැපයෙන මාර්ගයක් ලෙස සේවය සැලසෙන කෙටි හා දීර්ඝ කාලීන ඉතිරි කිරීම් ක්‍රමයක් ඉදිරිපත් කෙරේ. අවුරුදු 05 ක හෝ 10 ක කාල සීමාවක් සඳහා මසකට TK 50 ( ඩොලර් 0. 73 ) ක අවම මුදල හෝ එහි ගුණාකාරයන් රැස් කෙරෙන, ග්‍රාමීන් විශ්‍රාම ඉතිරි කිරීම් ගිණුමක් ග්‍රාමීන් බැංකුව මෑතකදී ආරම්භ කර තිබේ. සාම්ප්‍රදායික විශ්‍රාම වැටුප් ක්‍රමයක් මෙන් නොව, මෙම ග්‍රාමීන් විශ්‍රාම ඉතිරි කිරීම් ක්‍රමය නිශ්චිත විශ්‍රාම වයස් සීමාවන් හා සම්බන්ධ නොවේ. ග්‍රාමීන් විශ්‍රාම ඉතිරි කිරීම් සඳහා අඛණ්ඩව දායක මුදල ගෙවීම අනිවාර්යය වන අතර (දායකත්ව මුදල් ගෙවීම බණ්ඩනය වුවහොත් අඩු පොළී ප්‍රමාණය ගෙවීමේ දඬුවම් සහිත ) මෙම ක්‍රමයේ සාමාජිකත්වය දරන කාලය පුරා 10% සිට 12 % දක්වා වන ප්‍රමාණයක ස්ථාවර වාර්ෂික ප්‍රතිලාභ පිරිනමයි. මෙම ප්‍රතිලාභ බොහෝ විට ග්‍රාමීන් බැංකුවේ ආදායම් වලින් සහනාධාර ගෙවීම් ලෙස ප්‍රතිපූරණය කෙරේ. අවසාන ඉතිරිකිරීම් මුළු මුදල එකවර හෝ කොටස් වශයෙන් මාසිකව ආපසු ලබා ගැනීමට පුළුවන . විවාහය , අධ්‍යාපන, වියදම් ඇතුළත් අනාගත වියදම සඳහා කෙටි හා දීර්ඝ කාලීන ඉතිරිකිරීම් ක්‍රමයක් ලෙස ග්‍රාමීන් විශ්‍රාම ඉතිරි කිරීම් ක්‍රමය සේවය සලසයි. බොහෝ දකුණු ආසියානු රටවල මෙන් බංගලාදේශයේ ද කාන්තාවන්, පිරිමින්ට වඩා ඉහළ ආයු කාලයක් භුක්ති විඳින බැවින් , ඔවුන් පිරිමින්ට වඩා මහලු සමයේ දරිද්‍රතාවයට පහසුවෙන් ගොදුරු වේ. එහෙත් පිරිමින් හා සසඳන කල්හි සාපේක්ෂික අඩු ආදායම් පැවතීම , වැඩ කළ හැකි කාල පරාසය වඩා කෙටි වීම සහ දරු උපත් හා පවුලේ අනෙකුත් වගකීම් දැරීම මත රැකියාව අඛණ්ඩව කිරීමේ බාධා හේතුවෙන් බංගලාදේශීය කාන්තාවන් පිරිමින්ට වඩා වැඩි අවාසි සහගත තත්වයක සිටී. ජනගහනයෙන් ඉතාමත්ම පහසුවෙන් පීඩාවන්ට ගොදුරුවිය හැකි කොටස්වලට ණය මුදල් සහ කෙටි කාලීන ඉතිරි කිරීම් ප්‍රවේශය ලබා දීම සඳහා කුඩා මූල්‍ය ව්‍යාපාරය සාර්ථක වී තිබේ. කෙසේ වෙතත් මරණය හා දීර්ඝ අවදානම් මගින් රක්ෂණය නොවේ. එමෙන්ම ඊ ට සමාන්තර වූ ධාන්‍යය , ගව, සෞඛ්‍ය හා ජීවිතරක්ෂණාවරණයන් නොමැති වීම නිසා ග්‍රාමීය ශ්‍රම බලකාය මත කැපී පෙනෙන අවදානම් පැටවේ. මේ නිසාම දශකයන් කිපයක් පුරා ම පැතිරෙන අඛණ්ඩ විශ්‍රාම වැටුප් දායක මුදල් ගෙවීමේ හැකියාව ද සැලකිය යුතු ලෙස අඩු කරවනු ලැබේ.

## 11.5 නේපාලීය අත්දැකීම්:-

2009 වසරෙහි නේපාලයේ මහලු ජනතාව එනම් වයස අවුරුදු 60 සහ ඊට ඉහළ වයස්ගත වූවන් මුළු ජනගහනයෙන් 6.1% ක් විය. 2025 වන විට නේපාල මහලු ජනගහනය සමස්ත ජනගහනයෙන් 10% දක්වාත් 2050 වන විට 15.6% දක්වාත් වර්ධනය වේ යැයි බලාපොරොත්තුවේ. නේපාලයේ දළ වශයෙන් මිලියන 11 ක විධිමත් හා අවිධිමත් අංශ ශ්‍රමිකයන්ගෙන් 5% කට වඩා අඩු පිරිසක් විධිමත් විශ්‍රාම වැටුප් හෝ අර්ථ සාධක අරමුදල් ක්‍රමයක් මගින් ආවරණය කෙරේ. අනිවාර්යය පදනම මත සේවක අර්ථ සාධක අරමුදල මගින් ආවරණය කෙරෙන රාජ්‍ය සේවකයන් 330, 000 හා පෞද්ගලික හා රාජ්‍ය අංශයේ වැටුප් ලබන 130,000සේවකයන් මෙයට ඇතුළත්ය. ස්වේච්ඡා පදනමක් මත අර්ථ සාධක අරමුදල් විධිවිධානයන්ට සම්බන්ධ වීමට සේවකයන් 10 ක් හෝ ඊට වැඩි කුඩා පෞද්ගලික අංශයේ ආයතන වලට අවසර ලැබේ. ඊට අමතරව තම සේවකයන් සඳහා ස්වේච්ඡා අර්ථ සාධක අරමුදල් ක්‍රම ද සමහර විශාල ව්‍යවසායිකයින් දියත් කර තිබේ.

දකුණු ආසියාවේ අනෙකුත් රටවල මෙන් ආදායම් ප්‍රතිලාභ අර්ථ ගැන් වූ විශ්‍රාම වැටුපක් රජයේ සේවකයන්ට නේපාලය ලබා දෙයි. 2008-2009 තුළදී , 170511 ක් වූ විශ්‍රාමික රජයේ සේවකයන් වෙනුවෙන් විශ්‍රාම වැටුප් ගෙවීම් වියදම නේපාල රුපියල් බිලියන 10.37 ක් විය.( ඩොලර් මිලියන 144 ) නැතහොත් අනුරූප මුදල් වර්ෂයේ ආදායමෙන් 7.23% ක් සහ ආදායම් වියදමෙන් 4.75% කි. දැනට සිටින 82,000 සිවිල් සේවකයන් වෙනුවෙන් පමණක් දැරීමට සිදුවන නේපාල විශ්‍රාම වැටුප් බැරකම නේපාල රුපියල් බිලියන 26 කි. ( ඩොලර් මිලියන 361) නැතහොත් දළ දේශීය නිෂ්පාදනයෙන් 4.6% කි. ගුරුවරුන් සන්නද්ධ හමුදා හා පොලිස් සේවකයන් 175,511 විශ්‍රාමිකයින් වෙනුවෙන් වන විශ්‍රාම වැටුප් බැරකම් මීට ඇතුළත් නොවේ.පුද්ගල ගිණුම් මත පදනම් වූ නව දායකත්ව විශ්‍රාම වැටුප් ක්‍රමයක් 2005 ජූලි 15 වන දා සිට නේපාල රජය නම සිවිල් සේවකයන් සඳහා හඳුන්වා දෙන ලදී. මෙම දිනෙන් පසුව බඳවා ගත් සියලු සේවකයන් සඳහා ආදායම් ප්‍රතිලාභ විශ්‍රාම වැටුප් ක්‍රමය වෙනුවට අනිවාර්යය පදනමක් මත මෙම නව

දායකත්ව විශ්‍රාම වැටුප් ක්‍රමය ආදේශ කරන ලදී. 2006 සහ 2008 අතරතුර දී, රජය ජාතික විශ්‍රාම වැටුප් ප්‍රතිපත්තියක් සඳහා මූලික රෙගුලාසි සියල්ල ඇතුලත් නව ව්‍යවස්ථාවක් සකස් කළ අතර, මෙම ජාතික විශ්‍රාම වැටුප් ප්‍රතිපත්තිය අදියරගතව ක්‍රියාත්මක කරවීමේ සැලැස්මක්ද නිර්මාණය කළේය. පසුගිය කාලය තුළ නේපාල රජය මෙම නව විශ්‍රාම වැටුප් ක්‍රමය රජයේ නවක ගුරුවරුන්, රාජ්‍ය අංශයේ සේවකයන් සහ දැනට විශ්‍රාම වැටුප් ක්‍රමයට ඇතුළත් නොවූ අවිධිමත් අංශයේ සමස්ත ශ්‍රමිකයන් වෙත ස්වේච්ඡා පදනමින් ව්‍යාප්ත කරවීමට සැලැසුම් කළේය. කෙසේ නමුත් 2009 දී රජය මෙම පනත පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීමට සූදානම්ව සිටිය ද එය හකුලා ගැනීමට රජයට සිදුවිය. ඉහත ප්‍රතිලාභයන්ට ඇතුළත් නොවන නේපාල ශ්‍රමිකයන්ගේ ප්‍රමාණය මිලියන 10.5 ක් පමණ වේ. ඉන් ආදායමක් උපයන කිසියම් ඉතිරි කිරීම් නිපුණතාවයක් සහිත ප්‍රමාණය මිලියන 3 ට අයත්වේ. මහලු සමය සඳහා ඉතා සුළුවෙන් ඉතුරුම් කළ හැකි ප්‍රමාණය මිලියන 1.63 කි. මුළු ජීවිත කාලයම දුප්පත්කමින් පෙළෙන සංඛ්‍යාව මිලියන 3.98 කි. එමෙන්ම වයස අවු 75 ට වඩා අඩු මහලු පිරිස් ඇස්තමේන්තුව මිලියන 1.48 කි. ඇතුළත් නොවන ශ්‍රම බලකායත් නොසලකා හැරිය හැකි සුළු ප්‍රතිශතයත් තම විශ්‍රාම සමය සඳහා කිසියම් ඉතිරි කිරීමක් සඳහා කරනු ලැබීම දැකිය හැකි ය.

පොදුවේ ගත්විට දීර්ඝ කාලීන ඉතිරිකිරීම් ක්‍රම හෝ විශ්‍රාම වැටුප් ක්‍රම නොතිබීම නිසා රජය කිසියම් උත්සාහයක් ගත්තද නේපාලයේ විධිමත් මූල්‍ය සේවාවලට ප්‍රවේශ වීම පසුගාමී තත්වයට පත්ව තිබේ. මෑතකදී සිදු කළ සමීක්ෂණයක් හෙළි කරනුයේ නේපාලයේ සෑම නිවෙස් හතරකින් එක් නිවෙසක් පමණක් ඉතුරුම් සඳහා පෙළඹී ඇති බවත් නිවෙස් වලින් 95%ක්ම තම නිවෙස් තුළම ඉතිරි කිරීමට වැඩි කැමැත්තක් දක්වන බවත් ය. එමෙන්ම 50% වඩා නිවෙස් හිමියන් අවිධිමත් අංශයෙන් ණය ලබා ගැනීමට වැඩි කැමැත්ත දක්වන බවත්, ඉතිරි කිරීමට යම් කිසි නිපුණතාවයක් ඇති මිලියන 2.97 ක ශ්‍රමිකයන්ට තම ආදායමින් 10% ක විශ්‍රාම වැටුප් දායකත්වයක් ලබා දිය හැකි බවත්ය. ඒ අනුව පෙනී යන්නේ වාර්ෂිකව නේපාල බිලියන 17.4 ක් එනම් ඩොලර් මිලියන 2.47 ක වාර්ෂික විශ්‍රාම ඉතුරුම් කිරීමට හැකියාව ඇති බවයි. ඒ හා සමාන මුදල් ප්‍රමාණයක දායකත්වය ලබා දීම මගින් තවත් මිලියන 1.6 ක ශ්‍රමිකයන්ට නේපාල රුපියල් මිලියන 2575 ක් ( ඩොලර් මිලියන 36) ක දායකත්වයක් ලබා දීමටද පුළුවන.

බදු මුදල් යෙදවූ සමාන ආරක්ෂක ප්‍රතිලාභ වැඩ සටහන් 1995 දී රජය හඳුන්වා දුනි. මෙම වැඩසටහන යටතේ අවුරුදු 70 හෝ ඊට වැඩි වයසැති සියලු පුරවැසියන් වෙනුවෙන් රුපියල් 500 ක ( ඩොලර් 7 ක ) දීමනාවක් ගෙවනු ලැබේ. වැන්දඹුවන් හා සමාජයේ ඇතැම් විශේෂිත කොටස්වලට මෙම වයස අවුරුදු 60 ට වැඩි වේ. එමෙන්ම වයස අවු: 80 හෝ ඊට ඉහළ වයස්ගත පුද්ගලයින්ට තවත් 10% එකතුකොට මහලු වයස් දීමනාවක් ගෙවනු ලැබේ. පූර්ණ හෝ අර්ධ ආබාධිත සහිත පුද්ගලයකුට පිළිවලින් රුපියල් 1000 ක් (ඩොලර් 14) හා 300 ක් (ඩොලර් 4) මාසික ආධාර මුදල් ලබා දේ. ඩොලර් මිලියන 17 ක් හෙවත් නේපාල රුපියල් මිලියන 1209 ක වාර්ෂික වියදමක් දරන මෙම සමාජ සත්කාරක වැඩ සටහනෙහි 2008 වසරෙහි පුද්ගල ප්‍රතිලාභ ගත පුද්ගල කණ්ඩායම් 954410 ක් විය. නේපාලයෙහි මුළු ජීවිත කාලයට කිසිදු විශ්‍රාම වැටුප් ක්‍රමයකට සම්බන්ධ නොවන මිලියන 4.5 ක ජනගහනය නිසා මහලු වයසෙහි ඔවුන් ආදායම් සුරක්ෂිතතාවය පිළිබඳව බරපතල ගැටලුවලට මුහුණ පාති. කෙසේ වෙතත් නිපුනතාවය හා ඉතිරිකිරීම් සඳහා කැමැත්ත ඇති නේපාලයේ ශ්‍රම බලකායේ විශ්‍රාම වැටුප් ආවරණය වන 4.1% ක ප්‍රමාණය සියයට 35.4 දක්වා වර්ධනය කිරීමේ හැකියාව ප්‍රයෝජනයට ගත යුතුව ඇත.මීට අමතරව සැලකිය යුතු ප්‍රමාණයක සංක්‍රමණික ශ්‍රමික ජනතාවක්ද නේපාලයට ඇති අතර ඔවුන්ගෙන් සමහරෙක් දැනට ඉන්දියාවේ රැකියාවල නියුක්තව සිටී. නේපාල රජය ඉන්දියානු රජය සමග ද්විපාර්ශ්විකව සමාජ ආරක්ෂක ප්‍රතිලාභ ගිවිසුමක් පිළිබඳව සලකා බලමින් සිටින අතර මෙම ගිවිසුම යටතේ ඉන්දියාවේ වැඩ කෙරෙන ඉන්දිය විශ්‍රාම වැටුප් හා අර්ථ සාධක අරමුදල් මගින් ආවරණය වන නේපාල ජාතිකයන් හට සිය මව් රටට පැමිණීමේ දී තම ගිණුම්වල ඉතුරුම් නේපාල විශ්‍රාම වැටුප් වැඩසටහනකට මාරු කිරීමට පහසුකම් සලසා දී තිබේ.

## 11.6 ඉන්දියානු අත්දැකීම්

වර්තමාන ලෝකයේ සිටින සෑම මහල්ලන් අට දෙනෙක් අතුරින් එක් අයෙකු ඉන්දියාවේ ජීවත් වේ. නූතන මහලු ජනගහනය 2030 වන විට මිලියන 200 දක්වා එනම් දෙගුණයකට වඩා වැඩිවනු ඇත. එමෙන්ම වර්තමාන මුළු ජනගහනයෙන් 8% ක් පමණ වන මෙම ප්‍රතිශතය 2050 වන විට 19.6% දක්වා වර්ධනය වන බවට එක්සත් ජාතීන් ඇස්තමේන්තු කොට ඇත.

### ඉන්දියාවේ විශ්‍රාම වැටුප් ආවරණය

| | |
|---|---|
| ■ සිවිල් සේවා විශ්‍රාම වැටුප් ලාභීන් | මිලියන 30 |
| ■ නව විශ්‍රාම වැටුප් ක්‍රමය ආවරණය | මිලියන 02 |
| ■ සමාජ සේවා දීමනා | මිලියන 11 |
| ■ පෞද්ගලික අංශයෙන් වැටුප් ලාභීන් | මිලියන 20 |
| ■ ආවරණය නොවන සේවකයන් | මිලියන 284 |

*මූලාශ්‍රය :- ( ඉන්දියාවේ ඉතුරුම් හා විශ්‍රාම වැටුප් සමීක්ෂණය 2005 )*

ඉන්දියාවේ මිලියන 400ක ජනගහනයෙන් 14% කට වඩා අඩු පිරිසක් කිසියම් විශ්‍රාම හෝ අර්ථ සාධක අරමුදල් ප්‍රතිපාදනයක් මගින් ආවරණය වේ. අනෙකුත් කලාපීය රටවල මෙන්ම මිලියන 30 ක් පමණ වූ ඉන්දියානු සිවිල් සේවකයන් බදු අරමුදල් ප්‍රතිලාභ මත යැපෙන විශ්‍රාම වැටුප් ආවරණයකට හිමිකම් කියති. 1981 දී ඩොලර් බිලියන 0.5 ට වඩා අඩුව පැවති වාර්ෂික සිවිල් සේවා විශ්‍රාම වැටුප් පිරිවැය 2010 දී ඩොලර් බිලියන 25 ක ආසන්නය දක්වා වේගයෙන් වැඩිවී ඇත. 2005 වසරේදී ඉන්දියාවේ විශ්‍රාම වැටුප් බැරකම ( IPD) පිළිබඳව පළමු ඇස්තමේන්තුව අනුව සේවය කරන රාජ්‍ය සේවකයන් වෙනුවෙන් පමණක් දළ දේශීය නිෂ්පාදනයෙන් 64% ක බර තැබීමක් ඊට අයත් වේ. එය ඩොලර් බිලියන 600 ක් වැනි ඉහළ වටිනාකමක් ගනී. මෙම මූල්‍ය බර හා වැඩිවන සිවිල් විශ්‍රාම වැටුප් ප්‍රතිලාභ පදනම් කොට ගෙන අනිවාර්යය දායකත්ව විශ්‍රාම වැටුප් ක්‍රමයකට නිර්හිත අඩිතාලමක් 2004 වසරේදී ඉන්දියානු රජය ආරම්භ කළේය. නව විශ්‍රාම වැටුප් ක්‍රමයට පදනම් වන ආයතනික ව්‍යුහය වැඩිහිටි සමාජ හා ආදායම් සුරක්ෂිත ව්‍යාපෘති කමිටුව (Old Age Social and Income Security Project) (OASIS) විසින් පළමුවරට 2000 වසරේදී යෝජනා කරනු ලැබූ අතර එය විශ්‍රාම වැටුප් නියාමන හා සංවර්ධන අධිකාරිය (Pension Fund Regulatory and Development Authority) විසින් දැනට ක්‍රියාත්මක කරමින් සිටී. මධ්‍යම රජයට අමතරව තම ප්‍රාන්ත රාජ්‍ය සේවකයන් සඳහාද මෙම නව විශ්‍රාම වැටුප් ක්‍රමය හඳුන්වා දුන් අතර 2004 වසර සිට ප්‍රාන්ත රජයන් 5 ක එය ක්‍රියාත්මක වේ. මිලියන 2 ක මධ්‍යම හා ප්‍රාන්ත රාජ්‍ය සේවකයින් මේ වන විට නව විශ්‍රාම වැටුප් ක්‍රමය මගින් ආවරණය වේ.

මහා පරිමාණ පෞද්ගලික ආයතනවල හා ඇතැම් රාජ්‍ය ආයතනවල සේවකයන් සඳහා සේවක ප්‍රතිලාභ යෝජනා ක්‍රම රාශියක් ඉන්දියාවේ ඇත. සේව්‍යයා විසින් මෙහෙය වන විශ්‍රාම වැටුප් ක්‍රමය හා ඔවුන් විසින් ස්ථාපනය කරන ලද අනිවාර්යය ක්‍රම සහ ඇතැම් ස්වේච්ඡා යෝජනා ක්‍රමවලින් එය සමන්විත වේ. 500000 ආසන්න විශාල ආයතනයන්හි දළ වශයෙන් සේවයේ නියුතු මිලියන 20 පමණ වැටුප් ලබන සේවකයන් ඔවුන්ගේ වාර්ෂික වැටුපෙන් 1/4 කොටසකට ආසන්න ප්‍රමාණයක් රාජ්‍ය කළමනාකරණය කෙරෙන විශ්‍රාම අර්ථ සාධක අරමුදල ගෙවීමට නිත්‍යානුකූලව බැඳී සිටී. 1952 දී ස්ථාපිත සේවක අර්ථ සාධක අරමුදල මගින් මෙම ව්‍යස්ථාපිත විශ්‍රාම ඉතුරුම් විධිවිධානය පරිපාලනය හා කළමනාකරණය කෙරේ. මෙම අරමුදල වෙත ලැබෙන මුදල් වලින් 60%ක් සේවාන්තික ප්‍රතිලාභ මුදල හෙවත් එකවර සැපයෙන දායකත්ව අර්ථ සාධක අරමුදල් වෙත යැවෙන අතර ඉතිරියෙන් 50% ක් ප්‍රතිලාභ අර්ථ ගැන්වූ විශ්‍රාම වැටුප් ක්‍රමයකට යොමු කෙරේ. ප්‍රතිලාභ අර්ථ ගැන්වූ විශ්‍රාම ක්‍රමය ( Defined Benefit

Pension Scheme ) නම්වූ මෙම ක්‍රමය 1995 වසරේදී ආරම්භ කරන ලදී. අද එය දළ වශයෙන් ඩොලර් බිලියන 12 ක අරමුදල් නිධියකට මුහුණ පා ඇත.මහා පරිමාණ ව්‍යවසායකයන් ගණනාවක් ව්‍යවස්ථාපිත අවශ්‍යතාවයන්ට යටත් නොවන විශ්‍රාම පාරිතෝෂික , විශ්‍රාම වැටුප් හා අර්ථ සාධක අරමුදල් ක්‍රම රාශියක්ම ක්‍රියාත්මක කෙරේ. ඇතැම් යෝජනා ක්‍රම ඉහළ ආදායම් සහිත සේවකයන් අරමුණු කොට පිහිටුවා ඇත. විශාල ආයතනවලට ලැබෙන බදු නිදහස් සීමාව දක්වා ව්‍යවස්ථාපිත අවශ්‍යතාවයන්ට යටත් නොවනසේ මෙම යෝජනා ක්‍රම ක්‍රියාත්මක වුවද බදු සීමාව ඉක්මවන විට එකී නීතීන් යටතේ පනවා ඇති සමහර රෙගුලාසින් ක්‍රියාත්මක වේ. ඉහත දැක්වූ අනිවාර්යය හා ස්වේච්ඡා සේවක ප්‍රතිලාභ යෝජනා ක්‍රමවලට සේවකයන් 10 ක් හෝ ඊට වැඩි සංඛ්‍යාවක් ඇති ( මධ්‍යම හා ප්‍රාන්ත රාජ්‍ය රාජ්‍යයන් අතුරින් ) හාම්පුතුන් 1972 පාරිතෝෂික ගෙවීම් පනත යටතේ හිමිකම් ඇති සේවකයින් සඳහා පාරිතෝෂික ප්‍රතිලාභ ගෙවිය යුතුය. සමස්තයක් ලෙස සැලකූ විට ඉන්දියාවේ පුද්ගලික අංශයෙහි සේවක ප්‍රතිලාභ යෝජනා ක්‍රමවල ඩොලර් මිලියන 150 ට ආසන්න වත්කම් සේව්‍යය කළමනාකරණයක් පවතී. ලෝකයේ කාර්යක්ෂම මූල්‍ය වෙළඳ පොලක් ඉන්දියාව සතු වේ. විශාල ගෝලීය විශ්‍රාම වැටුප් අරමුදල් ගණනාවක් ඉන්දීය කොටස් වෙළඳ පොලෙහි ආයෝජනය කෙරේ. එසේ වුවද ඉන්දියාවේ විශ්‍රාමික හා අර්ථ සාධක අරමුදල් සතු වත්කම් සියල්ලම පාහේ රාජ්‍ය අංශයෙහි අණකර හෝ සමූහ බැඳුම්කරවල (Government Deb Corporate Bonds) ආයෝජනය කිරීමද සුවිශේෂී සිද්ධියකි. 2009 මැයි මාසයේදී අවිධිමත් අංශ සේවකයන්ද ඇතුලත් සියලු ඉන්දීය පුරවැසියන් වෙත නව විශ්‍රාම වැටුප් ක්‍රමය (NPS) ස්වේච්ඡා පදනම මත හඳුන්වා දෙන ලදී. දහස් ගනණක් වූ බැංකු හා තැපැල් කාර්යාල මගින් අවශ්‍ය සේවා සැපයීම සිදු කරන ලදී. තම ප්‍රතිලාභ රටින් රටට මාරු කළ හැකි වීම නව විශ්‍රාම වැටුප් ගිණුම් ක්‍රමයේ ලක්ෂණයකි.

රටේ සෑම කෙනෙකුටම ප්‍රවේශ විය හැකි , වෙන් වෙන් වශයෙන් වූ විනිවිදභාවයකින් යුත් අඩු වියදම් හා දීමනා ද මෙම නව විශ්‍රාම වැටුප් ක්‍රමය තුළ දැකිය හැකි විය. තත්ත්වය එසේ වුවද 2010 ජූලි 30 වන විටද නව විශ්‍රාම වැටුප් ගිණුම් විවෘතව තිබුනේ 11000 ක් වැනි අඩු ප්‍රමාණයකි. එමෙන්ම විශ්‍රාම යාමට ආසන්න සිටින හෝ ඵලදායි ඉතිරිකිරීම් සඳහා ප්‍රමාණවත් කාලයක් නොමැති සේවකයන් මීට සම්බන්ධව නොවූ අතර ඔවුන් මුළු ජීවිත කාලයටම දුප්පත්ව සිටීමේ ප්‍රවණතාවයක්ද විද්‍යාමාන කෙරේ. ඉතා වයස්ගත වූවන්ට සෙත සැලසෙන විශ්‍රාම වැටුප් වැඩසටහනක්ද ඉන්දියාවේ ඇත. ඉන්දිරා ගාන්ධි ජාතික වැඩිහිටි විශ්‍රාම වැටුප් ක්‍රමය නම් වූ එය රුපියල් බිලියන 25 ක හෙවත් ඩොලර් බිලියන 1.3 ක වාර්ෂික අයවැයකින් සමන්විත වේ. මිලියන 11 ක් පමණ වූ ඉන්දීය මහල්ලන්ට මසකට රුපියල් 400 ක් වැනි විශ්‍රාම වැටුපක් ලබාදේ. ආයු අපේක්ෂණය ඉහළ යාමද , ප්‍රමාණවත් ඉතිරි කිරීම් නොමැති වීමද පාදක කොට ගෙන මෙම සමාජ උපකාරක වැඩසටහනෙහි මූල්‍ය පිරිවැයද කැපී පෙනෙන ලෙස වර්ධනය වෙමින් පවතී.

විදේශ රටවල් 110 ක් පුරා මිලියන 25 ට අධික ඉන්දියානුවන් වාසය කෙරේ. එය දෙවන විශාලතම ඩයස්පෝරාවයි (diaspora). ඇස්තමේන්තුවට අනුව මිලියන 5 ක් ඉන්දීය ජාතිකයන් පිරිසක් ගල්ෆ් කලාපයෙහි තාවකාලික හෝ කොන්ත්‍රාත් පදනම මත සේවය කෙරේ. සංක්‍රමණික ඉන්දියානුවන් ඉලක්ක කර ගනිමින් ඉන්දීය රජය යලි සිය රටට පැමිණ නැවත පදිංචි වීමේ විශේෂ අරමුදලක් (Return and Resettlement Fund) ආරම්භ කිරීමට තීරණය කර ඇත. ඒ තුලින් ස්වේච්ඡා සහභාගිත්වය හා ඉතුරුම් වර්ධනය උනන්දු කරවීම මෙන්ම ඉලක්කගත ප්‍රතිලාභින් යලි මව්රට පදිංචි කරවීම තුලින් ඔවුන්ගේ මහලු වයස සුවදායි කිරීම අරමුණු කෙරේ. මෙම සංක්‍රමණිකයන්ගේ සැලකිය යුතු අදායම් ඉපදවීමේ ක්‍රමවේදයක්ද සකස් කර ඇත.

ඉන්දියාව තුළ ඉතා වැදගත් ජාතික මට්ටමේ සමීක්ෂණ දෙකක් පසුගිය කාලය තුල සිදුවිය. 2004 - 2005 වසරේදී ආසියානු සංවර්ධන බැංකුවෙහි තාක්ෂණික ආධාර යටතෙහි පැවැත්වූ ඉන්දීය විශ්‍රාම ඉතිරි කිරීම් හා ඉපයීම් සමීක්ෂණය සහ ඉන් අනතුරුව 2007 වසරෙහි ආයෝජනය සඳහා වූ ඉන්දීය ආර්ථික පදනම (Invest India Economic Function ) විසින් පවත්වන ලද ආදායම් හා ඉතිරිකිරීම් සමීක්ෂණය වැදගත් තොරතුරු ආවරණය කිරීමට හේතු විය . ඒ තුලින් ගෝලීය උනන්දුව හා ඉතිරිකිරීම් නිපුනතාවය

මත පෞද්ගලික විශ්‍රාම වැටුප් සඳහා වන වෙළඳ පොල පරිමාණය හඳුනාගැනීම හා වෙන්කර ගැනීමට උපකාරී විය. 2019-2020 වන විට ඩොලර් බිලියන 300 ක ඉතිරි කිරීම් සමස්ත ඉන්දියානුවන් පෞද්ගලික විශ්‍රාම වැටුප් වෙළඳපොලට අත්කර ගැනීමට හැකි බව මෙම සමීක්ෂණ මගින් ආවරණය කර ඇත.

මෑතකදී ඉන්දියානු රජය (SUAVLAMBAN) සවලම්බන් නමින් තවත් පියවරක් දියත් කළේය. මෙම ක්‍රමය යටතේ නව විශ්‍රාම වැටුප් පද්ධතියට (NPS) බැඳෙන සෑම අඩු ආදායම් ලාභී ශ්‍රමිකයෙක් වෙනුවෙන්ම රජය රු. 1000 ක වාර්ෂික දායකත්වයක් ලබා දුනි. 2010- 2011 වර්ෂය තුලදී ඉලක්කගත මිලියන 1 ක දිළිඳු ජනතාව සඳහා රුපියල් මිලියන 1. 0 ක (ඩොලර් මිලියන 25 ක) සමස්ත සම දායකත්වයක් රජය අයවැය තුලින් ලබා දී තිබේ. රාජස්ථාන , හර්යානා, කර්නාටක, අන්ද්‍රා හා මධ්‍යම යන ප්‍රාන්ත රාජ්‍ය 5 ක්ද මෙම නව විශ්‍රාම වැටුප් ක්‍රමයට හෝ ප්‍රාන්ක රාජ්‍යයන් මගින් ආරම්භ කර ඇති විශ්‍රාම වැටුප් ක්‍රමයන්ට බැඳෙන අවිධිමත් අංශ අඩු ආදායම් ශ්‍රමිකයන් වෙනුවෙන් සම විශ්‍රාම වැටුප් දායකත්වයක් ලබා දෙන බවට නිවේදනය කර ඇත. රාජස්ථාන් ප්‍රාන්තයේ සම දායකත්ව විශ්‍රාම වැටුප් ක්‍රමයට මේ වන විට අඩු ආදායම් ශ්‍රමිකයන් 50000 ක් ස්වෙච්ඡාවෙන් බැඳී ඇති විශ්‍රාම වැටුප් ආවරණය ලබා ඇත.

## 11.7 පාකිස්ථානීය අත්දැකීම්......

පාකිස්ථානයේ මුළු ජනගහනයෙන් 6% ක් මහල්ලන්ගෙන් සමන්විත වන අතර එය ශ්‍රම බලකායෙන් 18 % ට වැඩිය. 2050 වන විට මහලු ජනගහනය මුළු ජනගහනයෙන් 14.9 % දක්වා දෙගුණයකටත් වඩා වැඩිවන බව එක්සත් ජාතීන් ඇස්තමේන්තු කෙරේ. පාකිස්ථානයේ ශ්‍රම බලකායෙන් 1/4 ක් විධිමත් අංශයෙහි රැකියාවල නියුක්ත වේ. අනෙකුත් දකුණු ආසියානු රටවල මෙන්, මෙම ශ්‍රමිකයන්ගෙන් කොටසක් විධිමත් විශ්‍රාම වැටුප් වැඩසටහනක් මගින් ආවරණය කෙරේ. වයස අවු: 60 දී ප්‍රතිලාභ ගෙවීම ආරම්භ වන දායකත්ව ප්‍රතිලාභ අර්ථ ගැන්වූ , සිවිල් සේවා විශ්‍රාම වැටුප් ක්‍රමයක් මගින් සන්ධීය රජයේ සිවිල් සේවකයන් 350, 000 ක් හා විශ්‍රාමිකයින් 276, 212 ක් ආවරණය කෙරේ. සන්ධීය සේවා විශ්‍රාමිකයින් හා මිලියන 1.37 ක හමුදා විශ්‍රාමිකයන් හට විශ්‍රාම වැටුප් ගෙවීම සඳහා දැනට දරන වාර්ෂික වියදම පාකිස්ථානු රුපියල් බිලියන 82.16 කි. (ඩොලර් මිලියන 958) (2009-2010) පළාත් රාජ්‍යයන්හි 738, 183 ක් වූ විශ්‍රාමිකයින් වෙනුවෙන් වාර්ෂික විශ්‍රාම වැටුප් ගෙවීම් වියදම පාකිස්ථානු රුපියල් බිලියන 69.3 කි. ( ඩොලර් මිලියන 808 කි. (2009-2010) සමස්ථයක් වශයෙන් , වත්මන් මිලියන 2.38 ක විශ්‍රාමිකයන් වෙනුවෙන් විශ්‍රාම වැටුප් ගෙවීම සඳහා රජයේ බදු ආදායමින් 10.34% ක් පරිභෝජනය වේ. රජයේ සේවකයන් පොදු අර්ථ සාධක අරමුදලකට හා යහ සාධක අරමුදලකට දායකත්වය ලබා දෙන අතර , කණ්ඩායම් රක්ෂණ වැඩසටහනක් මගින් ඔවුන් ආවරණය කෙරේ. සන්ධීය හා පළාත් රාජ්‍ය සේවකයන් සඳහා අර්ථ ගැන්වූ ප්‍රතිලාභ මට්ටම තීරණය වන්නේ වයස, සුදුසුකම් ලබන සේවා වසර ගණන හා අවසන් මාස 12 තුලදී ලබා ගත් වැටුප් වල සාමාන්‍ය අගය මතය. මුදල් අරමුදල්ගත නොකරන ලද සිවිල් සේවා විශ්‍රාම වැටුප් වත්කම් වෙනුවෙන් පමණක් වන පාකිස්තානයේ විශ්‍රාම වැටුප් බැරකම සාමාන්‍ය වන නමුත් පාකිස්ථානයේ සමස්ත ශ්‍රම බලකායේ සුළු ප්‍රතිශතයකින් සමන්විත රජයේ සේවයකට පමණක් පිරිනැමෙන විශ්‍රාම වැටුප් ප්‍රතිලාභ මත පමණක් එම විශ්‍රාම වැටුප් රජයේ මූල්‍ය ප්‍රකාශනයෙහි පැහැදිලි ලෙස නොදැක්වේ. තවද , ආර්ථික සහයෝගිතාවය සහ සංවර්ධනය සඳහා වන සංවිධානයේ ( OECD) සමහර රටවල විශ්‍රාම වැටුප් බැරකම හා සැසඳීමේදි මෙම විශාල වැටුප් බැරකම පදනම්ගතව තිබීම කැපී පෙනෙන ලක්ෂණයකි. 2001 දී සේවයේ නියුතු රාජ්‍ය සේකයින් සඳහා වන සිවිල් සේවා විශ්‍රාම වැටුප් විධිවිධානයන් වලට පරාමිතික ප්‍රතිසංස්කරණ මාලාවක් රජය ක්‍රියාත්මක කළේය. ගණන් බැලීමේ සාධක අඩු කිරීමත් , දළ විශ්‍රාම වැටුප් මත ගණනය කළහැකි ප්‍රමාණය 40% දක්වාත් ඉන්පසු 2005 වසරේදි 35% දක්වා අඩු කිරීම , විශ්‍රාම වැටුප් ප්‍රතිලාභ යලි ප්‍රතිෂ්ඨාපනය අතහැර දැමීම සහ උපරිම විශ්‍රාම වැටුප 77% සිට 70% දක්වා අඩු කිරීම මෙයට ඇතුලත් විය. 50% සහ 60% අතර ප්‍රමාණයකින් වැටුප් පරිමාණයන් ඉහළ දැමීමේ සංශෝධනයක් සමගම ඉහත සංශෝධන ක්‍රියාත්මක කරන ලදී. දායකත්ව විශ්‍රාම වැටුප් විධිවිධානයන් තුලට නව රාජ්‍ය සේවකයන් ගෙන ඒම සඳහා වූ යෝජනාවක් පරීක්ෂා කිරීමට තීරණය කිරීමෙන් අනතුරුව , පාකිස්ථානු අමාත්‍ය මණ්ඩලය ආයු ගණක (Actuarial Office)

කාර්යාලයත් ස්ථාපනය කිරීමට 2002 ඔක්තෝබර් මසදී තීරණය කළේය. 2004 දී විශ්‍රාම වැටුප් ප්‍රතිසංශෝධන අන්තර් අමාත්‍යාංශ ක්‍රියාකාරි කණ්ඩායමක්ද පාකිස්ථානය පිහිටුවිය. ආයු ගණක කාර්යාලය සමග ඒකාබද්ධ සිවිල් සේවා විශ්‍රාම වැටුප් ප්‍රතිසංශෝධන සඳහා උපදෙස් මෙම කණ්ඩායම ලබා දුනි. මේ පිළිබඳව ගැඹුරු ලෙස සාකච්ඡා කර තිබියදීත් සහ යම් යම් මූලික කටයුතු මේ වන විටත් පවරා තිබියදීත්, යෝජිත මෙම ප්‍රතිශෝධනයන් ක්‍රියාත්මක වන දිනයක් රජය මෙකෙත් නිවේදනය කර නැත. පස්දෙනකු හෝ ඊට වැඩි සංඛ්‍යාවක් සහිත පෞද්ගලික අංශයේ ආයතනවල සේවකයන් මහලු සේවක ප්‍රතිලාභ ආයකනය මගින් (Employee Old Age Benefit Institution) පරිපාලනය වන ප්‍රතිලාභ අර්ථ ගැන්වූ දායකත්ව විශ්‍රාම වැටුප් ප්‍රතිලාභ වැඩසටහන මගින් ආවරණය කෙරේ. සේව්‍ය 5% ක දායකත්වයක් හා සේවක වැටුපෙන් 1% ක දායකත්වයත් හා මෙම විශ්‍රාම වැටුප් වැඩසටහන වෙත ලබාදිය යුතුවේ.

විශ්‍රාමිකයන් හට අවුරුදු 15 ක් බලගැන්වෙන කාල සීමාවක් සහිත පාකිස්ථානු රුපියල් 3,000 ක (ඩොලර් 35) අවම විශ්‍රාම වැටුපක් මහලු සේවක ප්‍රතිලාභ ආයතනය විසින් සහතික කෙරේ. මිලියන 4.1 ක තරම් ක්‍රියාකාරි ශ්‍රමිකයන් හෝ රාජ්‍ය සේවකයන් ඇතුලත් නොවන විධිමත් අංශයේ බලකායෙන් 35.9% ක පිරිසක් මෙම ප්‍රතිලාභ අර්ථ ගැන්වූ විශ්‍රාම ප්‍රතිලාභ මගින් ආවරණය වේ. මෙම ක්‍රමයට විශ්‍රාමිකයන් 365, 084 ක් ඇතුලත් විය. රාජ්‍ය හා රාජ්‍ය අංශයේ පිරිස්වලට මෙන්ම මහලු වයස් සේවක ප්‍රතිලාභ ආයතනය මගින් ආවරණය කෙරෙන පෞද්ගලික අංශයේ ශ්‍රමිකයන්ටද ප්‍රතිලාභ නියමයන් දැක්වූ කම ක්‍රමවලට වාර්ෂිකව එකතු වන පොලී ප්‍රමාණය දළ වශයෙන් 2% ප්‍රතිලාභ සැපයීමට රජය බලාපෙරොත්තු වේ. කෙසේ වෙකත් මෙම දායකත්වයත් ප්‍රතිලාභ අර්ථ ගැන්වූ වැඩසටහන ප්‍රමාණවත් ලෙස ආරක්ෂා කරන්නේදැයි යන්න පැහැදිලි නැත. දැනට පවතින දායකත්වය සහ ප්‍රතිලාභ මට්ටම් සහ 2008 දී කළ ව්‍යවස්ථාපිත ජීවගණක ඇගයීම් සමීක්ෂණය අනුව , 2028 -2029 වසරේදී මහලු වයස් සේවක ප්‍රතිලාභ ආයතනය (EOBI) බංකොලොත්භාවයට පත්වෙනු ඇතැයි අපේක්ෂා කෙරේ. ප්‍රතිලාභ හිමිකම හා ආවරණය ප්‍රසාරණය කිරීම සඳහා මහලු සේවක ප්‍රතිලාභ ඉන්දියාව , නේපාලය සහ ශ්‍රී ලංකාවේ ඇති එහි සෑම ප්‍රතිරූපක ගැන සලකා බැලීමේ දී , ව්‍යාපෘති පරිපාලනය හා ලේඛන තැබීම් මෙන්ම දායක මුදල් රැස් කිරීම හා ප්‍රතිලාභ ගෙවීම සඳහා නිත්‍යානුකුල භාවය බලගැන්වීම පිළිබඳ සැලකිය යුතු අභියෝග රැසකට මෙම මහලු වයස් සේවක ප්‍රතිලාභ ආයතන මුහුණ පාන්නේය. ඊට සමාන්තරව දැනට ඇතුලත් නැති ශ්‍රම බලකාය වෙත මහලු සේවක ප්‍රතිලාභ ආයතනයේ පරිපාලන වැඩිදියුණු කිරීම පිළිබඳ සංවාදයක් අවශ්‍යතාවය මතුවී ඇත. මහලු සේවක ප්‍රතිලාභ ආයකනයකට අනුව, සම්පූර්ණ වන සෑම සේවා වසරක් සඳහාම එක් මසක වැටුප් පාරිතෝෂිකයක් සැපයීමට 20 දෙනෙක් හෝ ඊට වැඩි සේවකයන් සහිත ආයතනවල සිදුවේ. විශ්‍රාම යන විටදී හෝ රැකියාව වෙනස් වන විටදී හෝ එකවර ගෙවන මුදලක් ලෙස මෙම ප්‍රතිලාභය ගෙවිය හැක. තම සේවකයන් වෙත අර්ථසාධක අරමුදල් ප්‍රතිලාභයක් සැපයීමට එවන් සේව්‍යයන්ට විකල්පයක් තිබේ.

මහලු සේවක ප්‍රතිලාභ ආයතනය ( EOBI) විසින් අර්ථ සාධක අරමුදල් දායකත්වය මිල ප්‍රමාණය නිශ්චිත ව නොදැක්වුවද එය සාමාන්‍යයෙන් වැටුපෙන් 9% කි. සේවකයන්ගේ දායකත්වයට ගැලපෙන දායකත්වයක් සේව්‍යන් විසින් මහලු වයස් ප්‍රතිලාභ ආයතනය වෙත සිදු කළ යුතු වේ. කෙසේ වෙතත්, විශ්‍රාමයට පෙර රැකියා වෙනස් වීම් තුළදී බොහොමයක් අර්ථ සාධක අරමුදල් ඉතිරි කිරීම් ආපසු ලබා ගැනේ.ඒවා පරිභෝජනය කෙරේ. ඉන්දියාවේ , නේපාලයේ හා ශ්‍රී ලංකාවේ මෙන් වෘත්තිම විශ්‍රාමික ප්‍රතිලාභ සඳහා නිශ්චිත නියාමනයක් පාකිස්ථානයට නැත. ප්‍රතිලාභ අරමුදල් ගැන්වීම හෝ ආයෝජන රෙගුලාසින් පිළිබඳ ප්‍රායෝගික සොයා බැලීම් රහිත බදු නීතිය හරහා විශාල ලෙස සේවක ප්‍රතිලාභ ලබා ගැනේ.

පාකිස්ථානයේ සෑම ශ්‍රමිකයන් හතර දෙනෙකුගෙන් එක් අයෙක් අසංවිධානාත්මක අංශයේ සේවයක නියුතු වන අතර මහලු වයස් දරිද්‍රතාවයෙන් ආරක්ෂා වීම සඳහා වන විධිමත් විශ්‍රාම වැටුප් ප්‍රතිපාදනවලින් බැහැරව සිටී. පාකිස්ථාන රජයේ මූල්‍ය වෙළඳ පොළ පාලන වැඩ සටහනට බද්ධ වූ ආසියානු සංවර්ධන බැංකුව මගින් අරමුදල් සැපයු තාක්ෂණික සහයෝගිතා ව්‍යාපෘතියක් යටතේ ප්‍රකාශිත

2007 වාර්තාවක් සියලු පුරවැසියන්ට පරිපූර්ණ විශ්‍රාම වැටුප් ප්‍රතිපාදනයන් සඳහා බහු අරමුදල්ගත විසඳුමක් යෝජනා කර ඇත. ( ADB 2008 ) රාජ්‍ය , පෞද්ගලික සහ අවිධිමත් අංශයේ සේවකයන් අතර මහලු වයස් ප්‍රතිලාභ සමානත්වය නිර්මාණය කෙරෙන , සාධාරණ හා ඒකීය ජාතික විශ්‍රාම වැටුප් ප්‍රතිපත්තියක් රජය ස්ථාපිත කළ යුතු යැයි මෙම ව්‍යාපෘතිය යෝජනා කළේය. මහළු සේවක ප්‍රතිලාභ ආයතනයට ( EOBI) දැනට දායකත්වය ලබා දෙන අයගේ වත්මන් පාරිතෝෂික හා අර්ථ සාධක අරමුදල් බලය ඇතුලත් පෞද්ගලික අංශ සේවකයන් සඳහා වන ප්‍රතිලාභ වැඩසටහනට පරාමිතික ප්‍රතිසංස්කරණයන් සහ පරිපාලන වැඩි දියුණු කිරීම් ගෙන ඒම සහ දැනට රාජ්‍ය ප්‍රතිලාභ ක්‍රම මගින් හෝ පෞද්ගලික අංශ ප්‍රතිලාභ ක්‍රම මගින් හෝ ආවරණය නොවන පාකිස්ථාන ශ්‍රම බලකායේ දළ වශයෙන් 90% ක පිරිස් සඳහා පුරවැසි විශ්‍රාම වැටුපක් නිර්මාණය කිරීම ඇතුලත් පළල් ක්ෂේත්‍ර තුනක යෝජිත මෙම ප්‍රතිසංස්කරණය ක්‍රියාත්මක කෙරේ.

මෙම පසුතලයට එරෙහිව , අනිවාර්යයෙන් හෝ ස්වේච්ඡා හෝ විය හැකි පළල්ව පදනම්ගත වූ ප්‍රතිලාභ අර්ථ ගැන්වූ සහ දායකත්වය අර්ථ ගැන්වූ ප්‍රතිලාභයක වටිනාකම 2002 සිට රාජ්‍ය තත්සේරු කරමින් සිටී. පාකිස්ථාන විශ්‍රාම වැටුප් ශාඛාවේ සුරැකුම්පත් හා විනිමය කොමිෂම මගින් අධීක්ෂණය හා පාලනය කෙරෙන ස්වේච්ඡා විශ්‍රාම වැටුප් ක්‍රමය නමින්ද හැඳින්වෙන අවසර ලත් විශ්‍රාම වැටුප් කළමණාකරුවෝ නැමැති ක්‍රමයක් රජය 2005 දී හඳුන්වා දුනි. එමෙන්ම ඇඟවෙන පරිදි , ස්වභාවයෙන්ම මෙය දායකත්ව ක්‍රමයකි. මේ යටතේ පුද්ගල දායකත්ව මුදල් අනුමත විශ්‍රාම අරමුදලක් වෙත ගෙවනු ලැබේ. මෙම ක්‍රමය 2005 සිට එවැනි අනුමත වත්කම කලමනාකරණ සමාගම් 4 ක් හරහා ජනතාවට අවස්ථාව සලසා දී තිබේ. විවිධ අවදානම් දැරීමේ පැතිකඩ සහිත ප්‍රතිලාභ මනාපයන් තුනක් සෑම වත්කම් කළමණාකරුවෙක්ම දායකයින්ට ඉදිරිපත් කෙරේ. මෙම ක්‍රමයට අවශ්‍ය වන්නේ අදායම් බදු කාර්යාලය මගින් නියම කෙරෙන උපරිම සීමාවෙන් අවම වශයෙන් 50% ක ව්‍යවසායකුගේ දායකත්වයයි. නියමිත සීමාව යටතේ වන ඉදිරි දායකත්වය සේවකයා විසින් ගෙවනු ලැබේ. ඉන්දියාවේ නව විශ්‍රාම වැටුප් ක්‍රමයේදී ( NPS) මෙන්ම පාකිස්ථානයේ ස්වේච්ඡා විශ්‍රාම වැටුප් ක්‍රමයද දුර්වල මහජන නොදැනුවත්කම හා දුර්වල මුල්‍ය සාක්ෂරතාවය ඇතුලත් විවිධ හේතුන් රාශියක් නිසා ඉලක්කගත ශ්‍රම බලකාය සඳහා මෙතෙක් ඵලදායි ස්වේච්ඡා ආවරණයක් ලබා දී නැත. ස්වේච්ඡා විශ්‍රාම වැටුප් ක්‍රමය යටතේ විශ්‍රාමික ප්‍රතිලාභ සඳහා බදු අය කිරීමේ පිළිවෙල එකවර ප්‍රතිලාභ මුදල ආපසු ගැනීම වෙත යොමුවී ඇති බැවින් දායකත්ව ලාභින්ගේ දිර්ඝායු අවදානම අවම කිරීම පිණිස එය නැවත සමාලෝචනය කිරීම අවශ්‍ය වේ. බෙනාසීර් අදායම් උපකාරක වැඩසටහන සියලු කරුණු කාරණා පරීක්ෂා කරන ලද හිමිකම් ලබන අන්ත දුප්පත් ජනතාවට මුදල්මය ආධාර ලබා දෙන ජාතික සමාජ සත්කාරය වැඩසටහනකි. දීර්ඝ කාලීන ණය වෘත්තිය පුහුණුව සහ සුදුසු පවුල් වල සමාජිකයන් සඳහා සෞඛ්‍ය රක්ෂණ ලබා දීම ඇතුලත් ප්‍රතිලාභ රැසක් මෙම සමාජ සත්කාරක වැඩ සටහනට ඇත. ජාත්‍යන්තර දානපතියන්ගේ පරිත්‍යාග මගින් මෙම ව්‍යාපෘතිය මුලින්ම අරමුදල් යෙදවුවද, දැනට පොදු බදු ආදායම් මගින් අරමුදල් සැපයේ. 2009 - 2010 තුළදී ඩොලර් මිලියන 19 ක් මෙම සමාජ සත්කාරක වැඩසටහනට වෙන් විය.

## 11.8 ශ්‍රී ලාංකේය අත්දැකීම්

වර්තමානයේදී මිලියන 20 ක් පමණ වන ශ්‍රී ලාංකීය මුළු ජනගහනයෙන් 12% ක් වයස්ගත වුවන් ලෙස පිළිගැනේ. එක්සත් ජාතීන්ගේ ඇස්තමේන්තුවට අනුව 2021 දී එය 18% දක්වාත් එමෙන්ම 2050 වන විට 27.8% දක්වාත් වර්ධනය වන බවට විශ්වාසය පළ කෙරේ. ජපානය හා කොරියාව හැරුණු විට ආසියාවෙහි වේගයෙන් වයස්ගත වීමේ ගැටලුවට මුහුණු පාන රට ශ්‍රී ලංකාව වශයෙන් හඳුනාගෙනද තිබේ. දළ වශයෙන් මිලියන 13 ට අධික ප්‍රමාණයක් නැතහොත් ශ්‍රී ලංකාවේ සමස්ත ජනගහනයෙන් තුනෙන් දෙකක් වයස අවුරුදු 18-65 අතර වේ.

ශ්‍රී ලංකාවේ විශ්‍රාම වැටුප් ආවරණය

(සමස්ත ශ්‍රම බලකායේ ප්‍රතිශතයක් ලෙස )

- සිවිල් විශ්‍රාම වැටුප - 08
- ගොවි විශ්‍රාම වැටුප - 14
- පෞද්ගලික වැටුප් ලබන සේවකයින් - 31
- ආවරණයක් නොමැති ප්‍රමාණය - 48

මූලාශ්‍රය :- Help Age International - 2008

ආසන්න වශයෙන් මිලියන 3 ක ගෙවීම් ලබන ශ්‍රමිකයින් රජයේ හා විශාල පෞද්ගලික අංශයේ ආයතන වල ඇතුලත් විධිමත් ශ්‍රම වෙළඳ පොළවල වැටුප් ලබන්නන් වෙති. මිලියන 4.7 පමණ ශ්‍රමිකයන් අවිධිමත් අංශයෙහි රැකියාවල නියුක්තව සිටින අතර මිලියන 2 කට වැඩි පිරිසක් ගෙවීම් නොලබන පවුල් සාමාජිකයන් වෙති. ශ්‍රම බලකායෙන් දළ වශයෙන් 10% ක් විධිමත් විශ්‍රාම වැටුප් වැඩසටහන් මගින් ආවරණය වෙන අතර ඉතිරි ශ්‍රම බලකායෙන් බහුතරය අවිධිමත් අංශයේ රැකියාවල නියුක්තවේ. මොවුන් විධිමත් විශ්‍රාම වැටුප් හෝ විශ්‍රාමික ප්‍රතිලාභ වැඩ සටහන්වලට ඇතුලත් නොවේ. සිවිල්, පළාත් සභා, පළාත් පාලන ආයතන මෙන්ම සන්නද්ධ හමුදා වැනි සියලුම විශ්‍රාම වැටුප් පරිපාලනය විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව මගින් සිදුවේ. දළ දේශීය වියදමින් 2% ක වත්මන් පිරිවැයක් දරන රජයේ ආදායමින් 11% ක් වැය කරන, මිලියන 0.47 ක විශ්‍රාමිකයන් සංඛ්‍යාවක් ප්‍රතිලාභ ලබන හා මිලියන 1.4 ක රාජ්‍ය සේවයක් ආවරණය කෙරෙන ශ්‍රී ලාංකික සිවිල් විශ්‍රාම වැටුප අදායම් බද්දෙන් නිදහස් මෙන්ම රජයේ බදු මුදලින් ප්‍රතිලාභ ගෙවන ව්‍යාපෘතියකි. එය දායකත්ව නොවන විශ්‍රාම වැටුප් ක්‍රමයකි. වසර 30 ක සේවා කාලයක් සපුරා ඇති රාජ්‍ය නිලධාරියෙකුට තම අවසාන වැටුපෙන් 85% ක විශ්‍රාම වැටුප් ප්‍රතිලාභයක් ලබා ගැනීමට ඉඩකඩ සැලසී ඇත. එය අනෙකුත් කලාපීය රටවල් හා සසඳා බලන විට ඉතා ඉහළ ප්‍රතිශතයකි.වයස අවු: 60 සපුරාලීමේදී අනිවාර්යෙන්ම විශ්‍රාම ගත යුතු අතර අවු : 55 සම්පූර්ණ වීමේදී ස්වකීය කැමැත්තෙන් විශ්‍රාම ගැනීමට රාජ්‍ය නිලධාරින්ට හැකිය. විශ්‍රාම වැටුප් පත්වීම්ලාභින් වෙනුවෙන් වැන්දඹු, වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප් හිමිකම ලැබෙන අතර ඒ සඳහා සෑම රජයේ සේවකයකුටම තම වැටුපෙන් 6% - 7% අතර දායක මුදල් ගෙවිය යුතුවේ. වාර්ෂිකව විශ්‍රාම වැටුප් වියදම වර්තමානයේදී රුපියල් බිලියන 100 ඉක්මවන ලද නමුත් ඒ තුල වැන්දඹු අනත්දරු විශ්‍රාම වැටුප් දායකත්වය රුපියල් මිලියන 13000 ක් හා සන්නද්ධ හමුදා ආබාධිත පුද්ගලයකුට වැටුප් ගෙවන තවත් මිලියන 16000 ක්ද ඇතුලත් වේ. එමෙන්ම විශ්‍රාම පාරිතෝෂික හා රාජ්‍ය සේවා විශේෂ වන්දි හා වන්දි විශ්‍රාම වැටුප්ද තව දුරටත් මෙහි අන්තර්ගත වේ. ශ්‍රී ලාංකික විශ්‍රාම වැටුප උද්ධමන දර්ශක ගත නොවේ. උද්ධමන පරිමාණයට ගැලපෙන විශ්‍රාම වැටුප් ක්‍රමයත් පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ට හා බැංකු සේවකයන්ට පමණක් හිමිවේ. රාජ්‍ය විශ්‍රාම වැටුප් විෂමතාවය ඉවත් කිරීමේ වැඩසටහනක් ක්‍රියාත්මක වූ අතර 1997 වසර පාදක කොට එය නැවතී තිබේ. එහි අදහස එම වසරට පෙර විශ්‍රාම ලැබූ සියලු දෙනාගේම විශ්‍රාම වැටුප 1997. 01. 01 දින වැටුප් පරිමාණයට ගැලපෙන පරිදි යළි සකස් කොට ඇති බවයි. 2006 වර්ෂයේ සිදුවූ වැටුප් පරිවර්තනය පාදක කොට ගෙන විශ්‍රාම වැටුප යළි සකසන ලෙස ලැබෙන විශ්‍රාමික ඉල්ලීම් ඉතා ඉහළ මට්ටමක ඇති අතර තවමත් රජය ඊට පිළිතුරුපත් සකස් කරමින් සිටී.

අර්ධ රාජ්‍ය අංශයේ හා විශාල පෞද්ගලික අංශයේ සේවකයන් පනතක් මගින් පාලනය වන 1958 දී ස්ථාපිත කරන ලද සේවක අර්ථ සාධක අරමුදල් විසින් දායකත්ව අර්ථ සාධක අරමුදල් විධිවිධානයන් ක්‍රියාත්මක කෙරේ. එය කම්කරු දෙපාර්තමේන්තුව පරිපාලනය කෙරේ. ඉහත විධිවිධානයන් යටතේ සේවකයන් ඔවුන්ගේ වැටුපෙන් 8% ක් අර්ථ සාධක අරමුදල වෙත දායක කළ යුතු අතර සේවකයන්ගේ

වැටුප් වලින් 12 % කට සමාන වන අනිවාර්යය දායකත්වය සේවායා විසින් සිදුකළ යුතුය. මෙම මුදල් සම්පූර්ණයෙන්ම රාජ්‍ය සුරකුම්පත්වල ආයෝජනය කෙරෙන කල් පවතින ගිණුමකට බැර කරනු ලැබේ. පිරිමින් සඳහා වයස අවුරුදු 55 දී සහ කාන්තාවන් සඳහා වයස අවු : 50 දී අර්ථ සාධක අරමුදල් ප්‍රතිලාභ සාමාජිකයන්ට ලබාගත හැකි වේ. 2006 දී මිලියන 11.3 ක් පමණ සාමාජිකත්ව ගිණුම් තිබුණ අතර ඒවායින් මිලියන 2 ක් පමණක් ක්‍රියාත්මක වූ බව Help Age International ආයතනය 2008 වසරේදී සිදුකළ සමීක්ෂණයකින් හෙළි වී ඇත. එකවර ප්‍රතිලාභ හිමිවන බැවින් ප්‍රතිලාභින් දීර්ඝායු අවදානම් හෙවත් මහළුවියෙහි ආරක්ෂාව කෙරෙහි ප්‍රමාණවත් අවධානයත් යොමු නොකෙරේ. අරමුදල පවත්වා ගැනීම හා පරිපාලනය පිළිබඳව. වගකීම ශ්‍රී ලංකා මහා බැංකුව විසින් උසුලනු ලැබේ.

අර්ථ සාධක අරමුදල් වත්කම් භාරකරු හා කළමනාකරු ශ්‍රී ලංකා මහා බැංකුව වේ. රටේ ඉකිරි කිරීම් සංචිතය එනම් මූල්‍ය ඉතිරිකිරීම් වලින් 13.7% ක් මෙම අරමුදල සතුවන අතර එය සාමාජිකයන්ට ප්‍රතිලාභ පිරිනමන අරමුදලක් පමණක් නොව රටේ මූල්‍ය පරතරය පියවන ප්‍රධාන මූල්‍ය සම්පාදක ලෙසද ක්‍රියා කෙරේ. බැංකු සේවකයන්ද ඇතුලත් වන පරිදි විශ්‍රාම වැටුප් රහිත වැටුප් ලබන ශ්‍රම බලකායට දායකත්ව පුද්ගලික විශ්‍රාම වැටුප් වැඩසටහන් හඳුන්වා දීමට රජය ක්‍රියා කරමින් පවතින අතර එළඹුන අභියෝග හමුවේ එය තාවකාලිකව නතර කර ඇත. සේවක අර්ථ සාධක අරමුදලට අමතරව සේවා නියුක්තිකයන්ගේ භාර අරමුදල වෙතද සේවායා 3% ක දායක මුදල් බැරකල යුතුවේ. ඊට අමතරව විවිධ පාරිතෝෂික හා අරමුදල් කීපයක්ද පෞද්ගලික අංශයේ සේවකයන් සඳහා ශ්‍රී ලංකාව තුල ක්‍රියාත්මක වේ. ශ්‍රී ලංකාවේ මිලියන 4.7 අවිධිමත් අංශයේ සේවකයන් සඳහා ස්වේච්ඡා දායකත්ව විශ්‍රාම වැටුප් ක්‍රම කිහිපයක්ද දක්නට ලැබේ. දළ වශයෙන් මිලියන 1 ක ගිණුම් සහිත ගොවි විශ්‍රාම වැටුප් ක්‍රමය 1971 ඇරඹුනි. 50000 ක් පමණ ගිණුම් සහිත 1990 දී ඇරඹුන ධීවර විශ්‍රාම වැටුප් ක්‍රමයද මීට අයත්වේ. මෙම ව්‍යාපෘතින් දෙකම පරිපාලනය කරනු ලැබුවේ කෘෂිකර්ම ගොවිජන සේවා මණ්ඩලය විසිනි. මෙම ව්‍යාපෘතින් සුළු දායකත්ව වටිනාකම් මත පදනම් වේ. සාමාජිකයන් හය මාසයකට වරක් දායකත්වය ලබා දෙන අතර වයස අවු 18 දී දායකත්වය අරඹන සාමාජිකයන් සඳහා මසකට රුපියල් 130 ( ඩොලර් 1 ) සිටද වයස අවුරුදු 55 දී බැඳෙන පුද්ගලයින් සඳහා මසකට රුපියල් 690 ක ( ඩොලර් 6.6 ) දක්වා දායකත්ව ක්‍රම රාශියක් ඇත. මෙම සාමාජිකයන්ට වයස අවුරුදු 60 දී විශ්‍රාම වැටුප් ගෙවීම ඇරඹේ.

1996 දී සමාජ ආරක්ෂණ විශ්‍රාම වැටුප් ක්‍රමය ශ්‍රී ලංකා සමාජ ආරක්ෂණ මණ්ඩලය විසින් ආරම්භ කරන ලදී. ස්වයං රැකියා සේවක පුද්ගල විශ්‍රාම වැටුප් ක්‍රමයකට බැඳීමට මනාපය පළ කිරීමට මේ යටතේ ස්වයං රැකියාවල නියුක්ත වූවන්ට හැකි විය. මෙම ක්‍රමයෙහි 300000 පමණ ගිණුම් හා විශ්‍රාමිකයන් 6000 පමණ සිටී. පසුගිය වසර පහ පුරා සමාජ ආරක්ෂණ මණ්ඩලය ස්වයං රැකියාවල නියුක්ත වන සමහර රැකියා සඳහා වෘත්තිය පදනම් කරගත් නව විශ්‍රාම වැටුප් ක්‍රම කීපයක් ආරම්භ කර ඇත. සංක්‍රමණික ශ්‍රමිකයන් සඳහා 2007 වසරේදී වෛද්‍ය නිලධාරින්ට 2005 වසරේ දී කුඩා හා මධ්‍යම ප්‍රමාණයේ ව්‍යවස්ථායකයින් සඳහා 2006 දීද ,කලාකරුවන් 2008 දී ද මාධ්‍යවේදීන් 2007 දීද , කුඩා පරිමාණ තේ නිෂ්පාදකයන් 2004 දීද, අත්යන්ත්‍ර රෙදි නිෂ්පාදකයන් 2004 දී හා නිරූපිකාවන්ද මෙයට ඇතුලත් වේ. ඉහත සඳහන් කළ රාජ්‍ය විශ්‍රාම වැටුප, අර්ථ සාධක අරමුදල හා අවිධිමත් විශ්‍රාම වැටුප් අංශ හැරුනු විට ශ්‍රී ලංකා රුපියල් 1500 ට (ඩොලර් 14) අඩු මාසික ආදායම් ඇති පවුල් වලට මූල්‍යමය ආධාර සපයෙන සමෘද්ධි වැඩසටහන හා පළාත් සභා මෙහෙයවන සමාජ සේවා ආධාර (පිංපඩි) වැඩසටහනක්ද දැනට සක්‍රීයව පවතී. ගෙවීම් ලබන ශ්‍රම බලකායෙන් ඉතා සුළු කොටසකට නිල විශ්‍රාම වැටුප් සීමාවන අතර පවතින නිල ප්‍රතිපාදනයන් අනුව ශ්‍රම බලකායේ දීර්ඝ වූ අවධානය කෙරෙහි ප්‍රමාණවත් ප්‍රතිඵල මෙතෙක් ලැබී නැත. බොහෝ දකුණු ආසියාතික රටවලදී මෙන් ශ්‍රී ලංකාවේදීද විධිමත් විශ්‍රාම වැටුප් විධිවිධාන වලට වැඩිහිටි වයසේ දරිද්‍රතාවයට කළහැකි බලපෑම ඉතා සීමිතය. මෙම තත්වය තුල ජාතික දරිද්‍රතා රේඛාවට (දැනට මසකට ඩොලර් 27 ක් පමණ) බද්ධ වූ ඒකීය විශ්‍රාම වැටුපක් හඳුන්වා දීම සඳහා වන යෝජනා රජය සළකා බලමින් සිටී.

## 11.9 ආසියානු කලාපීය විශ්‍රාම වැටුප් එකමුතුවක අවශ්‍යතාවය

කලාපීය රටවල් 2010 අග භාගයේ දී පිලිපීනයෙහි ආසියානු සංවර්ධන මූලස්ථානයේ දී එකමුතුවකට මූලික පදනම දමන ලදී. මෙවැනි එකමුතුවක මූලික අරමුණු කිපයකි.

1. විශ්‍රාම වැටුප් ප්‍රතිපත්ති සැකසීම , ඒවා ක්‍රියාත්මක කිරීම සහ මෙහෙයුම් ගැටලු පිළිබඳව කලාපීය සහයෝගීතාවය ප්‍රවර්ධනය කිරීම මෙන්ම දකුණු ආසියාවේ වගකීම් දරන්නන්, ප්‍රතිපත්ති සම්පාදකයින් , විශ්‍රාම වැටුප් නියාමකයින් සහ පරිපාලකයින්, ආර්ථික විද්‍යාඥයින් , පර්යේෂණ ආයතන මෙන්ම පෞද්ගලික අංශයද ඇතුලත් වන පරිදි සාකච්ඡා පැවැත්වීමට සහ ඊට අදාළ පහසුකම් සකස් කර දීම

2. දකුණු ආසියාවේ විශ්‍රාම වැටුප් ප්‍රතිසංස්කරණයන් සහ සමාජ ආරක්ෂණය පිළිබඳව තොරතුරු හා දැනුම ලබා දීම සඳහා පර්යේෂණ හා විශේෂඥතාවය මෙන්ම තාක්ෂණික සහයෝගිතාවයෙන් යුත් සම්පත් කේන්ද්‍රස්ථානයක් පිහිටුවීම හා ඉන් අදාළ සේවය සැපයීම .

3. කලාපීය විශ්‍රාම පද්ධති සැලසුම් සකස් කිරීම ප්‍රතිසංස්කරණය සහ ක්‍රියාත්මක කිරීම , අත්දැකීම් හා අදහස් හුවමාරුව සඳහා කලාපීය සභාවක් හෙවත් කලාපීය එකමුතුවක් පිහිටුවීම.

4. විශ්‍රාම වැටුප් හා සමාජ ආරක්ෂණ ක්ෂේත්‍රයන්හි සංවර්ධනය සහ දිරිගැන්වීම පිළිබඳ පර්යේෂණ ඒකාබද්ධව සිදු කිරීම.

5. කලාපයේ නිශ්චිත ගැටලු පිළිබඳව නව පර්යේෂණ ප්‍රකාශන සහ වාර්තා ප්‍රකාශන නිකුත් කිරීම සහ වගකීම් දරණ ආයතන සමග සහයෝගයෙන් ක්‍රියා කිරීම.

ඉහත අරමුණු ක්‍රියාත්මක කිරීමේදි ඊට අදාළ ක්‍රියාකාරකම් ගණනාවක්ද යෝජනා කෙරුණි. එමෙන්ම යෝජිත දකුණු ආසියානු විශ්‍රාම වැටුප් එකමුතුව සඳහා පහත සඳහන් යෝජනා වැඩිදුරටත් ඉදිරිපත් විය.

1. විශේෂිත සම්පත් ලේකම් කාර්යාලයක් පිහිටුවීම සහ මෙම ලේකම් කාර්යාලය පළමු වසර 3 සඳහා ශ්‍රී ලංකාවේ පිහිටුවීමට නිර්දේශ වීම. එය පූර්ණ කාලීන වූ උපදේශකයන් පර්යේෂකයන් හා පරිපාලන කාර්යය මණ්ඩලයකින් සමන්විත විය යුතු වීම . බංගලාදේශය , භූතානය, ඉන්දියාව, මාලදිවයින, නේපාලය හා පාකිස්ථානය යන රටවලින් විෂය පිළිබඳ විශේෂඥයින් කෙටි කාලීනව මෙම ලේකම් කාර්යාල සඳහා පත් කිරීම , කලාපීය රටවල රාජ්‍ය දෙපාර්තමේන්තුවල බුද්ධිමතුන් පරිපාලකයින් සහ විශේෂඥයින්ද මීට අනුබද්ධිතව සහයෝගිතාවයෙන් කටයුතු කිරීම . සියලු තොරතුරු විශ්ව විශ්‍රාම වැටුප් ප්‍රජාව සඳහා බෙදා හැරීම සඳහා විශේෂ වෙබ් අඩවියක් හා ආසියානු විශ්‍රාම වැටුප් " ෙ ' සඟරාවක් ප්‍රකාශයට පත් කිරීම.

2. බාහිර උපදේශන සේවා සහ තොරතුරු තාක්ෂණ සහයෝගිතාවය ඇති කිරීම හා ආයතනික හා පර්යේෂණ නිපුණතාවය අනුව කලාපයේ එක් එක් රටවල විශ්‍රාම වැටුප් ප්‍රතිපත්ති විශ්ලේෂණය හා පද්ධති සැලසුම්කරණය සිදු කිරීම. මෙසේ කිරීමේදි ආසියානු සංවර්ධන බැංකුව , ලෝක බැංකුව සහ අනෙකුත් බහුජාතික ආධාර සපයන ආයතන මගින් අරමුදල් යොදවා තාක්ෂණික ව්‍යාපෘතින් ක්‍රියාත්මක කිරීම. එවැනි ව්‍යාපෘතින් කාලානුරූපව තවදුරටත් පුළුල් කිරීම .

3. පර්යේෂණ ප්‍රතිපත්ති විශ්ලේෂණය සහ මහජන සේවා සැපයීම් පුළුල් කිරීම. ඒ අනුව දකුණු ආසියාවේ විශ්‍රාම වැටුප් ප්‍රතිසංස්කරණ පිළිබඳ වාර්ෂික ග්‍රන්ථයක් ලේකම් කාර්යාලය මගින්

ප්‍රකාශනයට පත් කිරීමට අපේක්ෂා කෙරේ. එමෙන්ම විශ්‍රාමික අර්ථ ශාස්ත්‍රය හා ප්‍රතිසංස්කරණය යන මැයෙන් ත්‍රෛමාසික ප්‍රවෘත්ති සඟරාවක්ද ප්‍රකාශයට පත් කිරීමට යෝජිතය.

4. සියලු දැනුම සාමාජික රටවල් අතර සුදුසු පරිදි බෙදා හැරීම.

5. වාර්ෂික හා කාලීනව සාකච්ඡා වට පැවැත්වීම. කලාපීය රටවල් නිරතුරුවම විෂය ක්ෂේත්‍රය පිළිබඳව කතිකාවතක් සිදු කිරීමට අපේක්ෂා කෙරේ. එක් එක් රටෙහි විශ්‍රාම වැටුප් හා මූල්‍ය ප්‍රතිපත්ති ජනමාධ්‍ය හා පර්යේෂණ ප්‍රජාවන්ද එක් වහලක් යටට ගෙන ඒමට අවස්ථාව සකස් කරනු ලැබේ.

6. පුහුණුව සහ ආයතනික නිපුණතා ගොඩනගා ගනු ලැබේ. මෙය ඉතා වැදගත් වේ. කලාපයෙන් පරිබාහිර අනෙකුත් රටවල්වල විශේෂඥයින්ගේ සේවය මීට ලබා ගනු ලැබේ. ප්‍රධාන පෙලේ විශ්‍රාම පර්යේෂණ ආයතන සමග සහයෝගිතාවය ඇතිකර ගනී.

7. කලාපයෙහි විශ්‍රාම වැටුප් හා සමාජ ආරක්ෂණ විශ්ව කෝෂයක් ඇති කිරීම. ඒ අනුව එක් එක් සාමාජීය රටක ප්‍රධාන පර්යේෂණ ආයතනයක් හෝ බුද්ධිමතුන් සමග කටයුතු කිරීමට අපේක්ෂා කෙරේ. විධිමත් සහ නොවිධිමත් අංශ ඉලක්ක කෙරෙන සමීක්ෂණ දියත් කෙරෙනු ඇත.

8. සමාජීය රටවල්හි වගකීම් දරන්නන්ගෙන් සහ කලාපයේ විශ්‍රාම වැටුප් විශේෂඥයින්ගෙන් සමන්විත ලේකම් කාර්යාලය පර්යේෂණ න්‍යාය පත්‍රයක් පිළියෙල කිරීම හා නිරතුරුවම සමාලෝචනයන්ට භාජනය කිරීම.

9. කලාපයේ ලේකම් කාර්යාල පිහිටුවීමේදී ආසියානු සංවර්ධන බැංකුව එහි ප්‍රධානත්වය දැරීම. එමෙන්ම ලේකම් කාර්යාල පිහිටුවීමේ මූලික පිරිවැයද, පළමු වසර තුන සඳහා වූ මෙහෙයුම් වියදම්ද ,ආසියානු සංවර්ධන බැංකුව අනුග්‍රහය යටතේ සැපයේ. පසුකාලීනව එකී නඩත්තුව ලේකම් කාර්යාලයට පවරා දෙනු ලැබේ. ඒ ඒ රටවල් ඊට අදාල දායකත්වය ලබා දිය යුතුය . පර්යේෂණ නියමු ව්‍යාපෘති වැඩමුළු පුහුණු පාඨමාලා සහ වාර්ෂික සඟරා අලෙවියෙන් ලැබෙන ආදායමෙන් එකී වියදම් පියවා ගත යුතුය. ඉහත ක්‍රියාකාරකම් සාර්ථකව ඉටු කිරීම සඳහා ලේකම් කාර්යාලයේ ආයතනික ව්‍යුහය කාර්යය මණ්ඩලය පත් කිරීම , ක්‍රියාකාරි කමිටුවක් පත් කිරීම සහ සාමාජිකත්වය පත් කිරීම පිළිබඳවද ලේකම් කාර්යාලය සුදුසු පරිදි ක්‍රියාකළ යුතුය.

## 11.10 ස්ථිර විශ්‍රාම වැටුප් සහිත සේවා නියුක්තිය පිළිබඳ සමීක්ෂණය - 2011

විශ්‍රාම වැටුප් හිමිවන්නේ රාජ්‍ය නිලධාරීන්ට පමණක් නොවේ. ස්ථිර විශ්‍රාම වැටුප් පත්වීම්ධාරීන් ඊට හිමිකම් කියති. ඒ අනුව මධ්‍යම රජය පළාත් රාජ්‍ය සේවාව අධිකරණ නිලධාරීන් මෙන්ම සන්නද්ධ හමුදා සාමාජිකයන් ද තම සේවා කාලය අවසානයේදී විශ්‍රාම වැටුප් ප්‍රතිලාභ සඳහා සුදුසුකම් ලබති. එපමණක් ද නොව පාර්ලිමේන්තු කාර්ය මණ්ඩල, ජනාධිපති ලේකම් කාර්යාලය හා ඇතැම් කොමිෂන් සභා කාර්ය මණ්ඩල වලට ද විශ්‍රාම වැටුප් හිමිකම ඇත. 2011 වසර තුළ විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව විසින් පවත්වන ලද සමීක්ෂණයකට අනුව ස්ථිර විශ්‍රාම වැටුප් සහිත සේවා නියුක්තිය පිළිබඳ පහත සඳහන් තොරතුරු හෙළි වී තිබේ.

1. 2011 වර්ෂය මැද භාගය වන විට ස්ථිර විශ්‍රාම වැටුප් සහිත නිලධාරීන්ගේ සංඛ්‍යාව 964,394 වේ. එය මධ්‍යම රජය ,සන්නද්ධ හමුදා ,පොලිස් , පළාත් රාජ්‍ය සේවය, අධිකරණ සේවාව හා වෙනත් යනුවෙන් වර්ග කොට තිබේ.

2. වැඩිම නිලධාරීන් සංඛ්‍යාවක් ආරක්ෂක අංශ නියෝජනය වේ. යුධ , ගුවන් හා නාවික හමුදා නිලධාරීන් / සාමාජික සංඛ්‍යාව 294,314 වන අතර පොලිස් නිලධාරීන් සංඛ්‍යාව 87,200 වේ.

3. පළාත් රාජ්‍ය සේවයෙහි විශාල සංඛ්‍යාවක් සේවා නියුක්තව සිටී. එම ප්‍රමාණය 330,349කි. බස්නාහිර පළාත් සභාවෙන් පමණක් කාර්ය මණ්ඩල 80,000 ඉක්මවා ඇත.

4. මධ්‍යම රජය අමාත්‍යාංශ 54 ක සේවය නියුතු විශ්‍රාම වැටුප් සහිත කාර්යය මණ්ඩලය 244,377 වේ. අමාත්‍යාංශ 13 ක මෙම කාර්යය මණ්ඩලය 100 වඩා අඩුය. කාර්යය මණ්ඩලය 10,000 ඉක්මවා ඇත්තේ අමාත්‍යාංශ 07 ක පමණි.

5. මෙම කාර්යය මණ්ඩලය වාර්ෂිකව රුපියල් මිලියන 14,000 ක් වැන්දඹු අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක මුදල් ගෙවනු ලැබේ. එමෙන්ම වාර්ෂිකව 12,000 ආසන්න ප්‍රමාණයක් රාජ්‍ය සේවයෙන් විශ්‍රාම ගන්වනු ලැබේ.

6 විශ්‍රාම ගැනීම් වලට සාපේක්ෂව පසුගිය කාල සීමාව තුළ රාජ්‍ය සේවයට බඳවාගක් ප්‍රමාණය ඉතා ඉහළ මට්ටමක නැත.

7. අධිකරණ සේවය හා අමාත්‍යාංශ යටතට නොගැනෙන කාර්යය මණ්ඩලය ඉතාම අඩු මට්ටමක ඇත.

### මධ්‍යම රජය, අධිකරණ, පළාත් රාජ්‍ය සේවය, සන්නද්ධ හමුදා හා වෙනත් රාජ්‍ය නිලධාරීන්

| | | | |
|---|---|---|---|
| 1. | මධ්‍යම රජය නිලධාරීන්<br>( සන්නද්ධ හමුදා හා පොලිස් නිලධාරීන් හැර) | - | 2 44,374 |
| 2. | සන්නද්ධ හමුදා සහ පොලිස් නිලධාරීන් | - | 381,514 |
| 3. | පළාත් සභා නිලධාරීන් | - | 330,349 |
| 4. | අධිකරණ සේවා | - | 4146 |
| 5. | වෙනත් | - | 4011 |

මේ අනුව ස්ථිර විශ්‍රාම වැටුප් සහිත නිලධාරීන් සංඛ්‍යාව 964394 වේ.

| | | | |
|---|---|---|---|
| • | මධ්‍යම රජයේ අමාත්‍යාංශ | - | 54 |
| 1. | සමුපකාර හා අභ්‍යන්තර වෙළඳ අමාත්‍යාංශය | - | 580 |
| 2. | විදුලි සංදේශ හා තොරතුරු තාක්ෂණ අමාත්‍යාංශය | - | 30 |
| 3. | පශු සම්පත් හා ග්‍රාමීය ප්‍රජා සංවර්ධන අමාත්‍යාංශය | - | 723 |
| 4. | ඉදි කිරීම් , ඉංජිනේරු සේවා , නිවාස හා පොදු පහසුකම් අමාත්‍යාංශය | - | 1333 |
| 5. | ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍යාංශය | - | 6703 |
| 6. | පුද්ගලික ප්‍රවාහන සේවා අමාත්‍යාංශය | - | 29 |
| 7. | කම්කරු හා කම්කරු සබඳතා අමාත්‍යාංශය | - | 2373 |
| 8. | ජාතික භාෂා හා සමාජ ඒකබද්ධතා අමාත්‍යාංශය | - | 387 |
| 9. | ජාතික උරුමයන් පිළිබඳ අමාත්‍යාංශය | - | 1622 |
| 10. | කර්මාන්ත හා වානිජ කටයුතු අමාත්‍යාංශය | - | 662 |
| 11. | සමාජ සේවා අමාත්‍යාංශය | - | 754 |
| 12. | කෘෂිකර්ම අමාත්‍යාංශය | - | 5435 |
| 13. | රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශය | - | 28125 |
| 14. | ගොවිජන සේවා හා වනජීවී අමාත්‍යාංශය | - | 12211 |

| | | | |
|---|---|---|---|
| 15. | තැපැල් සේවා අමාත්‍යාංශය | - | 20262 |
| 16. | වරාය හා මහාමාර්ග අමාත්‍යාංශය | - | 190 |
| 17. | යෞවන කටයුතු හා නිපුණතා සංවර්ධන අමාත්‍යාංශය | - | 2702 |
| 18. | රාජ්‍ය සම්පත් සහ ව්‍යවසාය සංවර්ධන අමාත්‍යාංශය | - | 81 |
| 19. | රාජ්‍ය කළමනාකරණ ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය | - | 31 |
| 20. | ජල සම්පාදන හා ජලාපවාහන අමාත්‍යාංශය | - | 85 |
| 21. | වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය | - | 392 |
| 22. | ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යාංශය | - | 683 |
| 23. | ජනමාධ්‍ය හා ප්‍රවෘත්ති අමාත්‍යාංශය | - | 1713 |
| 24. | පොල් සංවර්ධන හා ජනතා වතු සංවර්ධන අමාත්‍යාංශය | - | 20 |
| 25. | ආපදා කළමනාකරණ අමාත්‍යාංශය | - | 403 |
| 26. | විදේශ රැකියා ප්‍රවර්ධන හා සුභසාධන අමාත්‍යාංශය | - | 46 |
| 27. | ක්‍රීඩා අමාත්‍යාංශය | - | 288 |
| 28. | ඛණිජ තෙල් කර්මාන්ත අමාත්‍යාංශය | - | 67 |
| 29. | රාජ්‍ය ආරක්ෂක අමාත්‍යාංශය(යුධ, ගුවන්, නාවික සහ පොලිසිය හැර) | - | 10914 |
| 30 | සාම්ප්‍රදායික කර්මාන්ත හා කුඩා ව්‍යවසාය සංවර්ධන අමාත්‍යාංශය | - | 173 |
| 31. | අධිකරණ අමාත්‍යාංශය | - | 794 |
| 32. | තාක්ෂණ හා පර්යේෂණ අමාත්‍යාංශය | - | 842 |
| 33. | උසස් අධ්‍යාපන අමාත්‍යාංශය | - | 81 |
| 34. | විදුලිබල හා බලශක්ති අමාත්‍යාංශය | - | 92 |
| 35. | ඵලදායිතා ප්‍රවර්ධන අමාත්‍යාංශය | - | 550 |
| 36. | වාරිමාර්ග හා ජල සම්පත් කළමනාකරණ අමාත්‍යාංශය | - | 3373 |
| 37. | සිවිල් ගුවන් සේවා අමාත්‍යාංශය | - | 59 |
| 38. | මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යාංශය | - | 7982 |
| 39. | දේශීය වෛද්‍ය අමාත්‍යාංශය | - | 1977 |
| 40. | ළමා සංවර්ධන හා කාන්තා කටයුතු අමාත්‍යාංශය | - | 917 |
| 41. | නැවත පදිංචි කිරීමේ අමාත්‍යාංශය | - | 110 |
| 42. | සුළු අපනයන භෝග ප්‍රවර්ධන අමාත්‍යාංශය | - | 772 |
| 43. | බුද්ධශාසන හා ආගමික කටයුතු අමාත්‍යාංශය | - | 853 |
| 44. | ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය | - | 1841 |
| 45. | අධ්‍යාපන අමාත්‍යාංශය | - | 41826 |
| 46. | පුනරුත්ථාපන හා බන්ධනාගාර ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය | - | 5367 |
| 47. | සෞඛ්‍ය අමාත්‍යාංශය | - | 58036 |
| 48. | විදේශ කටයුතු අමාත්‍යාංශය | - | 1050 |
| 49. | පරිසර අමාත්‍යාංශය | - | 2559 |
| 50. | පාර්ලිමේන්තු කටයුතු අමාත්‍යාංශය | - | 50 |
| 51. | මහජන සම්බන්ධතා හා මහජන කටයුතු අමාත්‍යාංශය | - | 20 |
| 52. | පළාත් පාලන හා පළාත් සභා අමාත්‍යාංශය | - | 166 |
| 53. | ප්‍රවාහන අමාත්‍යාංශය | - | 14796 |
| 54. | සංස්කෘතික හා කලා කටයුතු අමාත්‍යාංශය | - | 124 |
| | එකතුව | - | 244374 |

### සන්නද්ධ හමුදා සහ පොලිස් සේවය

| | | |
|---|---|---|
| ශ්‍රී ලංකා යුධ හමුදාව | - | 200665 |
| ශ්‍රී ලංකා ගුවන් හමුදාව | - | 40185 |
| ශ්‍රී ලංකා නාවික හමුදාව | - | 53464 |
| ශ්‍රී ලංකා පොලිසිය | - | 87200 |
| එකතුව | - | 381514 |

### පළාත් සභාවන් හි කාර්යය මණ්ඩලය

| | | |
|---|---|---|
| වයඹ පළාත් සභාව | - | 41220 |
| නැගෙනහිර පළාත් සභාව | - | 28570 |
| දකුණ පළාත් සභාව | - | 38171 |
| මධ්‍යම පළාත් සභාව | - | 42132 |
| ඌව පළාත් සභාව | - | 26606 |
| සබරගමු පළාත් සභාව | - | 28513 |
| බස්නාහිර පළාත් සභාව | - | 80083 |
| උතුරු මැද පළාත් සභාව | - | 21201 |
| උතුරු පළාත් සභාව | - | 23853 |
| එකතුව | - | 330349 |

### අධිකරණ සේවා කොමිෂන් සභාව

| | | | |
|---|---|---|---|
| 1. | අධිකරණ සේවා කොමිෂන් සභා කාර්යාලය | - | 59 |
| 2. | කොමිෂන් සභා යටතේ ඇති ආයතනයන්හි කාර්යය මණ්ඩලය | - | 342 |
| | අගවිනිසුරුතුමා | - | 01 |
| | ශ්‍රේෂ්ඨාධිකරණ විනිශ්චයකාරවරුන් | - | 11 |
| | අභියාචනාධිකරණ විනිශ්චයකාරවරුන් | - | 12 |
| | මහාධිකරණ විනිසුරුවන් (සිවිල් අභියාචන මහාධිකරණ විනිසුරුවරුන් මහාධිකරණ කොමසාරිස්වරුන් දිසා විනිසුරුවරුන් ඇතුලුව) | - | 66 |
| | මහේස්ත්‍රාත්වරුන් ඇතුලු අධිකරණ නිලධාරීන් | - | 206 |
| | කම්කරු විනිශ්චය සභාපතිවරුන් | - | 36 |
| | කම්කරු වන්දි කොමසාරිස්වරුන් | - | 03 |
| 3. | උප ලේඛනගත නිලධාරීන් | - | 3745 |
| | එකතුව | - | 4146 |

### වෙනත්

| | | |
|---|---|---|
| ජනාධිපති කාර්යාලය | - | 1025 |
| අග්‍රාමාත්‍ය කාර්යාලය | - | 111 |
| ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව | - | 804 |
| මැතිවරණ දෙපාර්තමේන්තුව | - | 535 |
| විගණකාධිපති දෙපාර්තමේන්තුව | - | 1341 |



19 - H 039510

| | | |
|---|---|---|
| රාජ්‍ය සේවා කොමිෂන් සභාව | - | 120 |
| වෙනත් කොමිෂන් සභා | - | 75 |
| එකතුව | - | 4011 |

**දිස්ත්‍රික් ලේකම් කාර්යාල හා ප්‍රාදේශීය ලේකම් කාර්යාලයන්හි කාර්යය මණ්ඩලය**

| | | | | |
|---|---|---|---|---|
| 1. | දිස්ත්‍රික් ලේකම් කාර්යාලය | - | පුත්තලම | 1111 |
| 2. | දිස්ත්‍රික් ලේකම් කාර්යාලය | - | මහනුවර | 1866 |
| 3. | දිස්ත්‍රික් ලේකම් කාර්යාලය | - | මාතර | 1256 |
| 4. | දිස්ත්‍රික් ලේකම් කාර්යාලය | - | මඩකලපුව | 778 |
| 5. | දිස්ත්‍රික් ලේකම් කාර්යාලය | - | මොණරාගල | 700 |
| 6. | දිස්ත්‍රික් ලේකම් කාර්යාලය | - | කුරුණෑගල | 2608 |
| 7. | දිස්ත්‍රික් ලේකම් කාර්යාලය | - | හම්බන්තොට | 1088 |
| 8. | දිස්ත්‍රික් ලේකම් කාර්යාලය | - | ත්‍රිකුණාමලය | 538 |
| 9. | දිස්ත්‍රික් ලේකම් කාර්යාලය | - | ගම්පහ | 1744 |
| 10. | දිස්ත්‍රික් ලේකම් කාර්යාලය | - | කෑගල්ල | 951 |
| 11. | දිස්ත්‍රික් ලේකම් කාර්යාලය | - | බදුල්ල | 1058 |
| 12. | දිස්ත්‍රික් ලේකම් කාර්යාලය | - | වවුනියා | 246 |
| 13. | දිස්ත්‍රික් ලේකම් කාර්යාලය | - | අනුරාධපුරය | 1313 |
| 14. | දිස්ත්‍රික් ලේකම් කාර්යාලය | - | මාතලේ | 881 |
| 15. | දිස්ත්‍රික් ලේකම් කාර්යාලය | - | යාපනය | 934 |
| 16. | දිස්ත්‍රික් ලේකම් කාර්යාලය | - | කිළිනොච්චිය | 193 |
| 17. | දිස්ත්‍රික් ලේකම් කාර්යාලය | - | රත්නපුර | 675 |
| 18 | දිස්ත්‍රික් ලේකම් කාර්යාලය | - | කොළඹ | 1059 |
| 19. | දිස්ත්‍රික් ලේකම් කාර්යාලය | - | නුවරඑළිය | 735 |
| 20. | දිස්ත්‍රික් ලේකම් කාර්යාලය | - | ගාල්ල | 1862 |
| 21. | දිස්ත්‍රික් ලේකම් කාර්යාලය | - | කළුතර | 1320 |
| 22. | දිස්ත්‍රික් ලේකම් කාර්යාලය | - | අම්පාර | 1162 |
| 23. | දිස්ත්‍රික් ලේකම් කාර්යාලය | - | මුලතිවු | 236 |
| 24. | දිස්ත්‍රික් ලේකම් කාර්යාලය | - | පොළොන්නරුව | 512 |
| 25. | දිස්ත්‍රික් ලේකම් කාර්යාලය | - | මන්නාරම | 399 |

(දිස්ත්‍රික් ලේකම් කාර්යාල හා ප්‍රාදේශීය ලේකම් කාර්යය මණ්ඩලය අධ්‍යයන පහසුව සඳහා වෙනම දක්වා ඇත.)

# 12
# තිරසාර විශ්‍රාම වැටුප් ක්‍රමයක්

## 12.1 හැඳින්වීම

"කිසියම් රාජ්‍ය නිලධාරියකුට විශ්‍රාම වැටුපක් ඒකාන්තයෙන්ම ලැබීමට හිමිකම් නැත්තේය" යනුවෙන් විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා සංග්‍රහයේ ආරම්භය ලිය වී ඇත. කෙසේ වුව ද නියමිත සුදුසුකම් සපුරා ඇති විට රාජ්‍ය නිලධාරීන්ට විශ්‍රාම වැටුප් අයිතිවාසිකම වර්තමානයේ දී නියතින්ම හිමි වී ඇත.

- ස්ථිර විශ්‍රාම වැටුප් සහිත පත්වීමක් ලබා ගැනීම
- සේවය ස්ථිර කොට තිබීම
- අවම වශයෙන් වසර 10කට වඩා දළ සේවා කාලයක් සපුරා තිබීම
- විධිමත් පරිදි සේවය අවසන් කොට තිබීම විශ්‍රාම වැටුපක් ලබා ගැනීමට හේතු වේ. කෙසේ වෙතත් පොදුවේ ගත් විට රාජ්‍ය නිලධාරියෙකු අවු. 55 ඉක්මවන තෙක් රජයට සේවය කල යුතුය. ඊට පෙර ඉල්ලා අස්වීම, තනතුර අතහැර යාම හා සේවයෙන් පහ කිරීම මත විශ්‍රාම වැටුප් හිමිකම් අහෝසි වනු ඇත.

## 12.2 විශ්‍රාම ගැන්වීමේ ක්‍රියා පටිපාටිය

රාජ්‍ය නිලධාරීන්ගේ විශ්‍රාම ගැන්වීම පහත සඳහන් කවර ආකාරයෙන් හෝ සිදු විය හැක.

- *වෛකල්පිත විශ්‍රාම ගැන්වීම* - වයස අවු. 55 සම්පූර්ණ වීම මත ස්වකීය කැමැත්තෙන් විශ්‍රාම ලබා ගත හැකිය.
- *අනිවාර්ය විශ්‍රාම ගැන්වීම* - වයස අවු. 60 සම්පූර්ණ වූ විට සේවයෙන් විශ්‍රාම ගැන්විය යුතුමය.
- *වෛද්‍ය හේතුමත විශ්‍රාම ගැන්වීම* - යම් රාජ්‍ය සේවකයකු වෛද්‍ය මණ්ඩලයක නිර්දේශය මත තවදුරටත් සේවය කිරීම යෝග්‍ය නොවනවිට මෙවැනි විශ්‍රාම ගැන්වීම් කරනු ලැබේ.
- *තනතුර අහෝසිවීම මත විශ්‍රාම ගැන්වීම* - ධුරය අහෝසිවීම, තනතුර නැතිකිරීම දෙපාර්තමේන්තුව වසා දැමීම ලෙස ද මෙය හැඳින් වේ. වසර 05 ක අතිරේක සේවා කාලයක් එකතු කෙරේ.
- රාජ්‍ය භාෂා ප්‍රතිපත්ති මත විශ්‍රාම ගැන්වීම
- හෙදියන් හා ගුරුවරියන් වයස අවු. 50 එළඹෙන දිනයේ දී හෝ සේවා කාලය වසර 20ක් සම්පූර්ණ වීම යන දින 02 ක් පළමුව එළඹෙන දිනයේ දී විශ්‍රාම ගැන්වීම
- *අධිකරන නිලධාරීන් විශ්‍රාම ගැන්වීම* - ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරු වයස අවු. 65 දී / අභියාචනාධිකරණ විනිසුරු වයස අවු. 63 දී / මහාධිකරණ විනිසුරු වයස අවු. 61 දී / අනෙකුත් අධිකරණ නිලධාරීන් වයස අවු. 60 දී විශ්‍රාම ගැන්විය යුතුය.
- *විශ්‍රාම වැටුප් අවුරා තබා රාජ්‍ය සංස්ථාපිත මණ්ඩලයක සේවයට යාම මත විශ්‍රාම ගැන්වීම.* - විශ්‍රාම වැටුප් ගෙවනු ලබන්නේ සංස්ථාවෙන් විධිමත් පරිදි ඉවත් වූ දින සිටය.

- *විනය හේතුමත විශ්‍රාම ගැන්වීම* - විශ්‍රාම ගන්නා අවස්ථාවේ දී විනයානුකූලව කටයුතු කෙරෙන බවට සැහීමට පත්වන විට විනය බලධාරියා විසින් විශ්‍රාම වැටුප් විෂය භාර අමාත්‍යාංශයේ ලේකම්ගේ අනුමැතිය ලබා ගත යුතුය. මෙවැනි විශ්‍රාම ගැන්වීමක දී විශ්‍රාම පාරිතෝෂිකයක් හෝ මාසික විශ්‍රාම වැටුපක් පරීක්ෂණය අවසාන වන තෙක් ගෙවනු නොලැබේ.
- *අකාර්යක්ෂමතාවය මත විශ්‍රාම ගැන්වීම* - විශ්‍රාම ගන්වන අවස්ථාවේ දී හිමි වැටුප හා සේවා කාලය මත රාජ්‍ය පරිපාලන ලේකම් විසින් නියම කරන දිනක සිට විශ්‍රාම වැටුප් ගෙවනු ලැබේ.
- *රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 30/88 යටතේ විශ්‍රාම ගැන්වීම* - සේවා කාලය වසර 20 ක් සම්පූර්ණ කර ඇති. යම් රාජ්‍ය නිලධාරියෙකුට විශ්‍රාම යාම සඳහා මනාපය පළ කළ හැකිය. විශ්‍රාම වැටුප හෝ පාරිතෝෂිකය ලබාගත හැක්කේ වයස අවු. 55 සම්පූර්ණ වූ දින සිටය.
- *"ට" උප ලේඛනයේ සඳහන් ධූරයකින් විශ්‍රාම ගැන්වීම* - අමාත්‍ය පෞද්ගලික ලේකම් / සම්බන්ධීකරණ ලේකම්වරුන් අයත් වේ.

විශ්‍රාම වැටුප් හිමිකම ආරක්ෂා වීම සඳහා සේවා කාලය පහත සඳහන් පරිදි පැවතිය යුතු වේ.

- ස්ථිර විශ්‍රාම වැටුප් සහිත මධ්‍යම රජය / පළාත් රාජ්‍ය සේවයේ නිලධාරීන් - අවම වශයෙන් මාස 120 ක දළ සේවා කාලය.
- පිරිවෙන් හා පෞද්ගලික පාසැල් ගුරුවරුන් - අවම මාස 120ක දායකත්වය
- ශ්‍රේෂ්ඨාධිකරණ හා අභියාචනාධිකරණ ගරු විනිසුරුවරුන් - මාස 36ක දළ සේවය.
- මහාධිකරණ විනිසුරුවන් - අවම මාස 84ක දළ සේවය.
- අධිකරණ නිලධාරීන් - අවම මාස 84ක දළ සේවය
- රාජ්‍ය සේවයේ නොවන අමාත්‍යාංශ ලේකම්වරුන් - මාස 60ක දළ සේවය
- ගරු අමාත්‍යවරුන්ගේ පෞද්ගලික ලේකම්වරුන් - මාස 60ක දළ සේවය.

## 12.3 විශ්‍රාම වැටුප ආර්ථිකයට බලපෑම

විශ්‍රාම වැටුප ලංකාවේ විශාලතම ව්‍යාපෘතිය වී ඇත. එය ආරක්ෂක වියදම හෝ අධ්‍යාපන පිරිවැය අබිබවා යයි. ජනගහනයෙන් 40න් එක් අයෙකු රජයේ විශ්‍රාමිකයෙකි. ඉතා වැඩි විශ්‍රාමික ජ්‍යෙෂ්ඨ පුරවැසියන් සිටින කොළඹ දිස්ත්‍රික්කයේ සෑම 27කටම එක් අයෙක් විශ්‍රාමිකයෙක් වේ. මෑත කාලයේ විශ්‍රාම වැටුප් වියදම වේගයෙන් ඉහළ ගොස් ඇතත් විශ්‍රාම වැටුප ගෙවීම පිළිබඳව යම් යම් සාධාරණ තර්කයන් ද පවතින බව අමතක නොකළ යුතුය. සෑම රාජ්‍ය නිලධාරියෙකුට වැන්දඹු අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට දායකවීම, ඒ සඳහා රජය යම් දායකත්වයක් ලබා නොදීම අරමුදලක් පවත්වා නොගැනීම. නිරපේක්ෂ වශයෙන් වියදම් ඉහළ ගියත් රජයේ ආදායමේ ප්‍රතිශතයක් හෝ දල දේශීය නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් වශයෙන් විශ්‍රාම වැටුප ස්ථාවර වීම, රටක විශ්‍රාම වැටුප් නොගෙවන්නේ නම් රජය එම වැඩිහිටියන් වෙනුවෙන් වෙනත් ආකාරයක වියදම් දැරිය යුතුවීම, ආර්ථික අසමානතාවය අවම වීම සමාජ සාධාරණත්වය ඉටුවීම හා රටක හමුදාවක් පවත්වා ගැනීමට නම් විශ්‍රාම වැටුප් ක්‍රමයක් අත්‍යාවශ්‍ය වීම එම තර්කයක් වේ. එමෙන්ම රජයේ සමස්ත ආදායමින් වැටුප් හා විශ්‍රාම වැටුප් ගෙවීම සඳහා මුදල් වෙන් කළ විට සංවර්ධන අවශ්‍යතාවයට වැය කළ හැකි මුදල් සීමිත වීම ද සංවර්ධනයට බාධාවක් වශයෙන් පෙන්නුම් කළ හැකිය.

| වර්ෂය | මුළු විශ්‍රාමිකයින් ගණන | Total Exp. on on pension payments (Rs.billion) | Pension Exp. as % of Gov. revenue | Expenditure as a percentage of G.D.P. |
|---|---|---|---|---|
| 2000 | 371772 | 20.4 | 9.18 | 1.5 |
| 2001 | 383838 | 25.8 | 10.23 | 1.5 |
| 2002 | 394625 | 30.8 | 11.11 | 1.8 |
| 2003 | 400585 | 31.1 | 10.23 | 1.8 |
| 2004 | 414177 | 36.1 | 10.87 | 1.8 |
| 2005 | 418923 | 46.5 | 11.43 | 1.8 |
| 2006 | 430153 | 57.8 | 11.50 | 1.9 |
| 2007 | 438190 | 60.0 | 11.51 | 1.9 |
| 2008 | 445120 | 74 | 11.2 | 1.8 |
| 2009 | 449150 | 93 | 12.0 | 1.9 |
| 2010 | 473762 | 103 | 12.0 | 1.9 |

- විශ්‍රාම වැටුප, වැන්දඹු විශ්‍රාම වැටුප, අනත්දරු විශ්‍රාම වැටුප ආබාධිත අනත්දරු විශ්‍රාම වැටුප ආදී වශයෙන් ජීවිත කාලය සඳහාම ඇතැම් විට විශ්‍රාම වැටුප් ප්‍රතිලාභ හිමි වේ.
- සිවිල් විශ්‍රාම වැටුප්, සන්නද්ධ හමුදා විශ්‍රාම වැටුප්, වැන්දඹු අනත්දරු විශ්‍රාම වැටුප් හා රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදල විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව විසින් ක්‍රියාත්මක කරනු ලැබේ.
- වසර 10 ක් තුළ රු. බිලියන 20 සිට 103 දක්වා විශ්‍රාම වැටුප් වියදම වැඩි වී ඇත. ඒ සඳහා විවිධ හේතු බලපාන ලදී. ඒ සඳහා රාජ්‍ය සේවාව ව්‍යාප්ත වීම, විශ්‍රාම ගැන්වීමේ නව විධිවිධාන, විශ්‍රාමිකයනට ද ජීවන වියදම් දීමනා ගෙවීම, රාජ්‍ය සේවයේ වැටුප් වැඩිවීම, විශ්‍රාම වැටුප් ප්‍රතිලාභ වැඩිවීම, වැන්දඹුවන්ගේ සංඛ්‍යාව ඉහළ යාම, විශ්‍රාම වැටුප් විෂමතාවයන් ඉවත්කිරීම ඊට වැදගත් සාධකයෝය.

මෙහිදී විශ්‍රාම වැටුප් විෂමතාවය ඉවත් කිරීම වැදගත් සාධකයක් වේ. වැටුප හා සේවා කාලය මත විශ්‍රාම වැටුප තීරණය වන බැවින් ඒ ඒ කාලවල දී විශ්‍රාම ලැබූවන්ට හිමි විශ්‍රාම වැටුපෙන් විෂමතාවයක් පැන නැගුණි. රජය එම විෂමතාවය ඉවත් කිරීම ප්‍රතිපත්තිමය වශයෙන් පිළිගෙන තිබේ. 1997.01.01 දිනය පදනම් කොට විශ්‍රාම වැටුප් විෂමතාවය මේ වන විට ඉවත්කොට ඇත. එහි අදහස 1997ට පෙර විශ්‍රාම ලැබූ සියලු දෙනාගේම විශ්‍රාම වැටුප් 1997 වැටුපට සමාන කොට විශ්‍රාම වැටුප යළි සංශෝධනය කර ඇති බවයි..

විශ්‍රාමිකයන්ගේ ප්‍රමාණය හා එහි සමස්ත පිරිවැය ඉදිරියේ දී තවදුරටත් වර්ධනය වීමේ හැකියාව පවතී.

ඇස්තමේන්තුගත විශ්‍රාම වැටුප පිරිවැය

| වර්ෂය | මුළු විශ්‍රාමිකයින් ගණන | අපේක්ෂිත පිරිවැය ( බිලියන) |
|---|---|---|
| 2015 | 510000 | 125 |
| 2020 | 530000 | 160 |
| 2025 | 570000 | 200 |

මෙම වර්ධනයට හේතු ගණනාවකි.

- තවදුරටත් විශ්‍රාම වැටුප් විෂමතාවය ඉවත් කිරීමට රජය තීරණය කිරීම.
- 2006.01.01 දින හිමි වැටුප් පරිමාණය මත විශ්‍රාම වැටුප් විෂමතාවය ඉවත් කිරීමට සිදු වීම. මේ සඳහා රු. මි. 10000ක අතිරේක ප්‍රතිපාදන අවශ්‍ය වේ.
- සන්නද්ධ හමුදා සාමාජිකයන් සඳහා පූර්ණ විශ්‍රාම වැටුපක් (85%) ලබා දීම
- වැටුප ඉහළ නැංවීම හා එම වැටුප මත විශ්‍රාම වැටුප් ගණනය
- සිවිල් ආරක්ෂක සේවාව, සමෘද්ධි නිලධාරීන් වැනි විවිධ සේවාවන් විශ්‍රාම වැටුප් සහිත තත්ත්වයට කළ හැකි වීම.
- වැඩි ප්‍රතිලාභ හිමිවන පරිදි විශ්‍රාම වැටුප් / වැන්දඹු අනත්දරු විශ්‍රාම වැටුප් අණපනත් සංශෝධනය
- ජීවන වියදම් දීමනා ගෙවීම
- පෞද්ගලික අංශයට විශ්‍රාම වැටුප හිමිකම් ලබා දීම /වයස අවු. 65 වැඩි සැමට විශ්‍රාම වැටුප් හිමි ගැන්වීම වැනි සංකල්පයන්හි බලපෑම
- රාජ්‍ය සේවාව තවදුරටත් වර්ධනය වීම
- ජීවිත අපේක්ෂාව ඉහළ යාම

## 12.4 තිරසාර විශ්‍රාම වැටුප් ක්‍රමයක් සඳහා ප්‍රතිසංස්කරණ ක්‍රියාවලිය

විශ්‍රාම වැටුප් වියදම් ආර්ථිකයට දරා ගත නොහැකි වීම නුදුරු අනාගතයේ දී සිදු විය හැක. එබැවින් කඩිනම් ප්‍රතිසංස්කරණ ක්‍රියාවලියක් අවශ්‍ය වේ. එවැනි ප්‍රතිසංස්කරණ යෝජනා කිහිපයකි.

### 12.4.1 වැන්දඹු අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදල පිහිටුවීම

මෙවැනි අරමුදලක් 1898 සිට 1906 දක්වා ක්‍රියාත්මක විය. 1906 දී එම අරමුදල අහෝසි කොට විශ්‍රාම වැටුප් හා වැන්දඹු අනත්දරු විශ්‍රාම වැටුප රජයේ ඒකාබද්ධ අරමුදලට වැය බරක් විය. එමෙන්ම වැන්දඹු අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදලට අයකල අනිවාර්ය දායක මුදල් ද රජයේ ආදායමට එකතු විය. වැන්දඹු අනත්දරු දායක මුදල සියයට 2 සිට සියයට 7 පමණ වන තෙක් අවස්ථා කිහිපයක දී වැඩි වුවත් විශ්‍රාම වැටුප් වියදමට සාපේක්ෂව එය ඉතා අඩු අගයක් ගත්තා ලදී. මේ නිසා යලිත් අරමුදලක් ගොඩනැගීමේ අවශ්‍යතාවය මතු විය. ඒ අනුව 2003 වසරේ දී සේවක අර්ථ සාධක අරමුදල් (සංශෝධන) පනත මගින් දායකත්ව විශ්‍රාම වැටුප් ක්‍රමය නීතිගත කිරීමට උත්සහ ගැණිනා. මෙම ක්‍රමය

- 2003 සිට 2007 දක්වා ක්‍රියාත්මක විය.
- 8% දායකත්වය නිලධාරියා විසින් දරන ලදී.
- 12% රජයේ දායකත්වය ලැබුණි.
- දායකත්ව විශ්‍රාම වැටුප් අරමුදලක් ස්ථාපිත විය.
- මෙම අරමුදල ශ්‍රී ලංකා මහ බැංකුව විසින් ක්‍රියාත්මක කෙරුණි.
- විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ ජනරාල් එම විශ්‍රාම වැටුප් ක්‍රමයෙහි පරිපාලකයා විය.

2004 වසරේ දී අනපේක්ෂිත අයුරින් පාර්ලිමේන්තුව විසුරා හැරීමට සිදු විය. සේවක අර්ථ සාධක (සංශෝධන) පනත නීතිගතව තිබූ නමුත් පාර්ලිමේන්තුව විසුරුවා හරින විට ගරු කථානායකතුමා එම නීති කෙටුම්පතට අත්සන් කොට නොතිබුණි. එබැවින් එම නීති කෘතිය අහෝසි විය. මේ නිසා 2007 වසර ආරම්භයේ දී දායකත්ව විශ්‍රාම වැටුප් ක්‍රමය අහෝසි කෙරුණි. පැරණි, විශ්‍රාම වැටුප් හා වැන්දඹු අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමය යළි ක්‍රියාත්මක විය. ඒ නිසාම යම් තරමකට ක්‍රියාත්මකව පැවති දායකත්ව විශ්‍රාම වැටුප් අරමුදල ද අක්‍රිය විය. තව යොජිත වැන්දඹු අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදලත් පහත සඳහන් නිර්නායකයනට යටත්ව ස්ථාපිත කිරීම අත්‍යාවශ්‍ය විය.

- විශ්‍රාම වැටුප් හා වැන්දඹු අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමය කොටස් 02 කි. ප්‍රතිලාභීන් දෙකොටසකි.
- විශ්‍රාම වැටුප් තවදුරටත් රාජ්‍ය ඒකාබද්ධ අරමුදලින් දැරිය යුත්තේය.
- වැන්දඹු අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදලක් පිහිටු විය යුතුය. රාජ්‍ය නිලධාරීන්ගෙන් අය කරන දායක මුදල් මෙම අරමුදලට බැර කළ යුතුය.
- දැනටමත් පවතින දායකත්ව විශ්‍රාම වැටුප් අරමුදල, පළාත් පාලන වැන්දඹු හා වැන්දඹු පුරුෂ විශ්‍රාම වැටුප් අරමුදල්, ගුරු වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදල් වැනි වැන්දඹු අනත්දරු අරමුදල් ගිණුම් මෙම අරමුදලට එකතු කළ යුතුය.
- වැන්දඹු අනත්දරු විශ්‍රාම වැටුප් ගෙවීම මෙම අරමුදලත් රජයට ප්‍රතිපූර්ණ කළ යුතුය.
- රාජ්‍ය නිලධාරීන්ගෙන් අය කරන දායත මුදලට අඩු නොවන දායකත්වයත් රජය මෙම අරමුදලට සැපයිය යුතුය.
- අරමුදල සතු මුදල් දේශීය වශයෙන් හා විදේශීය වශයෙන් ආයෝජනය කළ යුතුය.
- වැන්දඹු අනත්දරු ප්‍රතිලාභ ගෙවීම යම් දුරකට සංශෝධනය විය යුතුය.

  උදා:- සිවිල් විශ්‍රාම වැටුපේ ප්‍රතිශතයක් වැන්දඹු විශ්‍රාම වැටුප් ලෙස ගෙවීම / ආබාධිත විශ්‍රාම වැටුප යම් ප්‍රතිශතයක් වශයෙන් ගෙවීම.
- අරමුදල පවත්වා ගත හැකි (තිරසාර) මට්ටමින් නඩත්තු කිරීම

### 12.4.2 විශ්‍රාම ගැන්වීමේ අනිවාර්ය වයස් සීමාව ඉහළ දැමීම

රාජ්‍ය නිලධාරීන්ගේ අනිවාර්ය විශ්‍රාම ගැන්වීමේ වයස අවු. 60ක් ලෙස නීතිගත වූයේ 1949 වර්ෂයේදීය. ඊට පෙර ඇතැම් රාජ්‍ය නිලධාරීන් එම වයස් සීමාව ද ඉක්මවා සේවයේ යෙදී සිටි බව අනාවරණය වේ. වයස් සීමාව අවු. 60ක් ලෙස නීතිගත කරන විට 1949 දී ශ්‍රී ලංකාවේ ජීවිත අපේක්ෂාව අවු. 57ක් විය. ගතවූ වසර 60ක කාලය තුළ අධ්‍යාපනය ප්‍රචලිත වීම, සෞඛ්‍ය සේවාවේ වර්ධනය, සමාජ සුබසාධක ආර්ථික ප්‍රතිපත්තිය හේතුවෙන් ජීවිත අපේක්ෂාව වර්තමානයේ අවු. 74ක් වූ ඉහළ අගයකට වර්ධනය වී ඇත. නමුත් අනිවාර්ය විශ්‍රාම ගැන්වීමේ වයස සංශෝධනය වී නොමැත. පහත සඳහන් නිර්නායකයනට අනුව විශ්‍රාම ගැන්වීමේ වයස සංශෝධනය විය යුතුය.

- අනිවාර්ය විශ්‍රාම ගැන්වීමේ වයස අවු. 65 දක්වා වැඩි කිරීම
- එය සියලු රාජ්‍ය නිලධාරීන්ට අදාළ වීම
- විශ්‍රාම වැටුප සමඟ වැටුප් ගෙවීම අත්හිටුවීම
- අනිවාර්ය විශ්‍රාම ගැන්වීමේ වයස වැඩි කරන අතරතුර රාජ්‍ය සේවාවේ කාන්තාවන්ට වසර 20ක සේවා කාලය අවසානයේ දී වෛද්‍ය සහතිකයක් නොමැතිව විශ්‍රාම ගැන්වීමට අවකාශ සැලසීම

වයස වැඩි කිරීම තුළින් ආසන්න වශයෙන් වසර 05ක කාලයක් තුළ රජයේ බදු ආදායම විශ්‍රාම වැටුප් ගෙවීමට යෙදා ගැනීම අඩුකර ගැනීම විශ්‍රාම පාරිතෝෂික ගෙවීම් පාලනය කිරීමට කටයුතු කළ හැක. එමෙන්ම අත්දැකීම් බහුල රාජ්‍ය නිලධාරීන්ගේ සේවය තව දුරටත් ආර්ථිකයට ලබා ගත හැකිය.

### 12.4.3 විශ්‍රාම වැටුප් ක්‍රියාවලිය ප්‍රතිනිර්මාණය

විශ්‍රාම වැටුප්, වැන්දඹු අනත්දරු විශ්‍රාම වැටුප් හා රාජ්‍ය සේවා අර්ථ සාධක අරමුදල් කටයුතු ක්‍රියාකාරකම් ප්‍රතිනිර්මාණයකට යොදා ගත යුතුය. ඒ තුළින්

- ප්‍රධාන ක්‍රියාවලීන් හඳුනා ගැනීම (ලියාපදිංචි/දායක මුදල්/එක්වරක් පමණක් සිදු කරන ගෙවීම්/ මාසික ගෙවීම් / විමසීම් කළමනාකරණය හා ලේඛන කළමනාකරණය ලෙස එම ක්‍රියාවලීන් වර්ග කළ හැක.)

- විශ්‍රාම වැටුප්, වැන්දඹු විශ්‍රාම වැටුප්, අනත්දරු විශ්‍රාම වැටුප, ආබාධිත විශ්‍රාම වැටුප් වැනි සියලු ප්‍රතිලාභ සඳහා එකම ලියාපදිංචි අංකයක් යොදා ගැනීම හා එකම ලිපි ගොනුවක් භාවිතා කිරීම.
- නවීන තාක්ෂණය යොදා ගැනීම වැදගත් කොට සැලකිය හැක.

මෙම ක්‍රියාවලිය තුළ තිරසාර විශ්‍රාම වැටුප් ක්‍රමවේදයක් සඳහා අවශ්‍ය පරිපාලන හා නීතිමය ප්‍රතිසංස්කර ක්‍රියාත්මක කිරීම ද වැදගත් වේ. එමෙන්ම

යෝජිත පරිපාලන හා නෛතික ප්‍රතිසංස්කරණ ආදර්ශයක් .......... තුළ

200000කට අධික විදේශ ගත විශ්‍රාමිකයන්ගේ විශ්‍රාම වැටුප් ගෙවීම ක්‍රමානුකූල කිරීම හා ඔවුන්ගේ ඉතුරුම් දේශීය වශයෙන් වර්ධනය කිරීම, ජීවන වියදම් දීමනා ගෙවීම ක්‍රමවක් කිරීම, විශ්‍රාම වැටුප ඍජුව බැංකු ගත කිරීම ක්‍රමානුකූල කිරීම, අවිධිමත් ගෙවීම් පරිපාලනය කිරීම ඉතා වැදගත් යැයි සැලකිය යුතුය.

## 12.5 සැමට විශ්‍රාම වැටුපක්

රාජ්‍ය විශ්‍රාම වැටුප් තුළින් රාජ්‍ය නිලධාරියා, කලත්‍රයා හා අනත්දරුවාගේ රැකවරණය ඇති කර තිබේ. ඇතැම් විට ආබාධිත අනත්දරුවන්ට ජීවිතය පුරාවටම එම විශ්‍රාම වැටුප් හිමිකම් ලැබේ. ඒ අනුව මිලියනයක් පමණ වන ස්ථිර විශ්‍රාම වැටුප් සහිත රාජ්‍ය නිලධාරීන්ගේ ආවරණය මිලියන 03ක් පමණ වන ශ්‍රී ලාංකීක පුරවැසියන්ට බලපැවැත් වේ. එමෙන්ම මිලියනයක් පමණ වන ගොවි ජනතාව වෙනුවෙන් වඩාත් සාර්ථක දායකත්ව විශ්‍රාම වැටුප් ක්‍රමයක් ක්‍රියාත්මක කිරීම, ස්වයං රැකියා ලාභීන්ට ඒ සමාන සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ ක්‍රමයක් ඇති කිරීම, විදේශ සේවා නියුක්තිකයන් වෙනුවෙන් විශ්‍රාම වැටුපක් හඳුන්වා දීම තුළින් තවත් මිලියන 05ක් පමණ වන ශ්‍රී ලාංකීක ජනතාව ආවරණය කර ගැනීමේ උපාය මාර්ග පවතී. දැනට අත්හිටුවා ඇති පෞද්ගලික අංශයෙහි විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය ක්‍රියාත්මක කිරීම පිළිබඳව යළි සිතා බැලිය යුතු වේ. විධිමත් වූ බැංකු හා රාජ්‍ය සංස්ථා ආශ්‍රිතව එය පළමුව ක්‍රියාත්මක කිරීම පහසු වේ. දැනටමත් බැංකු ක්ෂේත්‍රය, විශ්වවිද්‍යාල හා විදුලිබල මණ්ඩලය වැනි අයතනයන් ක්‍රියාත්මක කරන විශ්‍රාම වැටුප් ක්‍රම ඊට පදනම් වශයෙන් ගත හැක. අනිවාර්යය වෙනුවට පළමුව එය ස්වේච්ඡා පදනම මත ආරම්භ කිරීම වටී. අවසානයේ දී මෙය පෞද්ගලික ආයතනයන්හි සේවා නියුක්තිය දක්වා වර්ධනය කළ හැකිය. සේවක අර්ථ සාධක අරමුදල හෝ විශ්‍රාම වැටුප් අරමුදලකට දායක වීමේ මනාපය මත ප්‍රතිලාභ හිමි ගැන්විය හැක. වඩාත් වැදගත් වන්නේ ආකර්ෂණීය විශ්‍රාම වැටුප් ක්‍රමයක් හඳුන්වා දීමයි.
ශ්‍රී ලංකාව තුළ විවිධ ආකාරයෙහි සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ ලබා දේ. පළාත් සභා, පළාත් සමාජ සේවා අමාත්‍යාංශය විසින් ප්‍රාදේශිය ලේකම්වරුන් හරහා මහජන ආධාර වැඩසටහන් ක්‍රියාත්මක කෙරේ. ප්‍රතිලාභ වටිනාකම අඩු වුවත් මාසිකව මිලියනයකට ආසන්න ප්‍රමාණයක් මෙම මහජන ආධාර වැඩසටහන් ප්‍රයෝජනයට ගනී. එමෙන්ම මධ්‍යම රජයේ සමාජ සේවා අමාත්‍යාංශවල විවිධ ආධාර වැඩසටහන් ක්‍රියාත්මක කෙරේ. ආබාධිත ලේකම් කාර්යාලය ඇතැම් ආබාධිතයන්ට නිවාස ආධාර ස්වයං රැකියා ආධාර පමණක් නොව මාසිකව රු. 3000ක් පමණ වූ ආධාර ද සපයනු ලැබේ. එමෙන්ම ශ්‍රී ලංකාවේ ප්‍රධානතම දුගී දුප්පත්කම නැති කිරීමේ ජාතික ව්‍යාපාරය වූ සමෘද්ධි වැඩසටහන තුළ ද මිලියන 1.5ක් පමණ ප්‍රතිලාභින් ප්‍රමාණයක් මාසිකව එකී ප්‍රතිලාභ භුක්ති විඳිනු ලැබේ. සියලු පාසල් ළමුන්ට ලබා දෙන පාසල් නිල ඇඳුම් වෙනුවෙන් ද රජයේ පූර්ණ සත්කාරය පවතී.

ඉහත සඳහන් රාජ්‍යමය දායකත්වයට අමතරව රාජ්‍ය හා පෞද්ගලික බැංකු රක්ෂණ ආයතන හා විවිධ මූල්‍ය සමාගම් ද තැන්පතු මත පදනම් වන විවිධ සැලසුම් ක්‍රම හඳුන්වා දෙමින් පවතී. ඇතැම් සමූපකාර ආයතන හා ස්වේච්ඡා සංවිධාන ද සුළු වශයෙන් මෙම කටයුත්තට මැදිහත් වී තිබේ.

ශ්‍රී ලාංකික සැමට සමාජ ආරක්ෂණ වැඩසටහනක් අවශ්‍ය වෙතැයි කර්තෘ විශ්වාස කෙරේ. ඉතා ඉහළ ආදායම් හිමි පුද්ගලයන් හා ව්‍යාපාරික ප්‍රජාව වෙනුවෙන් රජය මැදිහත් වන විශ්‍රාම වැටුප් ක්‍රමයක

අවශ්‍යතාවය නැතත් මධ්‍යම හා අඩු ආදායම්ලාභීන් වෙනුවෙන් විශ්‍රාම වැටුපක් ක්‍රමයක් ක්‍රියාත්මක කිරීම අත්‍යාවශ්‍ය වේ. ඒ අනුව විශ්‍රාම වැටුප් ආවරණය පහත සඳහන් පරිදි සාරාංශ ගත කළ හැක.

i. රාජ්‍ය නිලධාරීන්ට රාජ්‍ය විශ්‍රාම වැටුප් ක්‍රමය.
ii. ගොවි, ධීවර, විදේශ සේවා නියුක්තිකයන්, ස්වයං රැකියා ලාභීන් වෙනුවෙන් ඒකාබද්ධ වූ දායකත්ව විශ්‍රාම වැටුප් ක්‍රමය.
iii. බැංකු, විදුලිබල මණ්ඩලය, විශ්වවිද්‍යාල මෙන් අනෙකුත් රාජ්‍ය ව්‍යවස්ථාපිත ආයතන වලට දායකත්ව විශ්‍රාම වැටුප් ක්‍රමය.
iv. පෞද්ගලික අංශයේ සේවා නියුක්තිකයන්ට සේවක අර්ථ සාධක අරමුදල් ප්‍රතිලාභ හෝ ස්වකීය කැමැත්ත මත විශ්‍රාම වැටුප අරමුදලකට දායක වීම.
v සමුපකාර, රක්ෂණ හා බැංකු අංශය තම සේවා නියුක්තිකයන්, සාමාජිකයන් හෝ තැන්පතු ලාභීන් සඳහා තැන්පතු මත පදනම් වූ විශ්‍රාම සැලසුම් ක්‍රම.
vi. වයස අවුරුදු 65ට වැඩි අඩු ආදායම්ලාභීන් වෙනුවෙන් විශ්ව විශ්‍රාම වැටුප් ක්‍රමය ක්‍රියාත්මක කිරීම. මෙම යෝජනාව සඳහා දැනට මහජන ආධාර, සමෘද්ධි මෙන්ම වෙනත් විවිධ සමාජ ආධාර වැඩ සටහන් ඒකාබද්ධ කළ යුතු වේ.

## 12.6 විශ්‍රාමික සංවිධාන

ශ්‍රී ලංකාව තුළ විශ්‍රාමික සංවිධාන රැසක් ක්‍රියාත්මක වේ. සුභසාධන සංගම්, මරණාධාර සමිති, ජ්‍යෙෂ්ඨ පුරවැසි සංවිධාන වැනි බොහෝ සමිති සමාගම්වල නිලතල දැරීමේ වගකීම රාජ්‍ය සේවා විශ්‍රාමිකයන් බහුලව සිදු කෙරේ. එමෙන්ම විශ්‍රාමික ප්‍රජාව සඳහා පමණක් කැප වූ විශ්‍රාමික සංවිධාන රාශියක් දැකිය හැක. මෙම සංවිධාන ප්‍රාදේශීය මට්ටම දිස්ත්‍රික් මට්ටම හා ජාතික මට්ටමින් ක්‍රියාත්මක වේ. මෙම සංවිධානවල දැකිය හැකි සුවිශේෂ ලක්ෂණ වන්නේ පහත සඳහන් අවශ්‍යතා සපුරා ගැනීමය.

(1) 2006. 01. 01 දින සිට ක්‍රියාත්මක වන වැටුප් පරිමාණය මත ඊට පෙර විශ්‍රාම ලැබූ සියලු රාජ්‍ය නිලධාරීන්ගේ විශ්‍රාම වැටුප සංශෝධනය කර ගැනීම.
(2) රාජ්‍ය නිලධාරීන්ට ලබා දෙන ජීවන වියදම් දීමනාව ඒ ආකාරයෙන්ම සියලු විශ්‍රාමිකයන්ට ලබා ගැනීම.
(3) ජාතික විශ්‍රාම වැටුප් ප්‍රතිපත්තියක් සකස් කර ගැනීම හා රජය එය ප්‍රකාශයට පත් කර ගැනීම.
(4) 1978 දී ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් ඉවත් කරන ලද, අනෙක් සෑම ව්‍යවස්ථාවකින්ම සහතික කොට තිබූ විශ්‍රාමිකයාගේ විශ්‍රාම වැටුප් අයිතිය පිළිබඳ වගන්තිය සංශෝධනයක් ලෙස නැවත ව්‍යවස්ථාවට එකතු කිරීම.
(5) විශ්‍රාමික ප්‍රජාව පිළිබඳව අභිමානය ඇති කරවීම - එනම් ජාතික විශ්‍රාම දිනයේදී සඳහා නිශ්චිත වැඩසටහනක් ක්‍රියාවට නැංවීම, වැඩිහිටි හැඳුනුම් පත, සහනාධාර මිලට බෙහෙත් වර්ග මිලට ගැනීම, රෝහල් පහසුකම් ඇති කිරීම.
(6) අග්‍රහාර රක්ෂණ ක්‍රමය සමස්ත විශ්‍රාමික ප්‍රජාව වෙත ද ලබා ගැනීම.

විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව තුළ ලියාපදිංචි වූ විශ්‍රාමික සංවිධාන සංඛ්‍යාව දහස ඉක්මවා ඇත. එමෙන්ම ජාතික මට්ටමින් පහත සඳහන් විශ්‍රාමික සංවිධාන ක්‍රියාත්මක වේ.

(1) විශ්‍රාමික භාර අරමුදල
(2) රාජ්‍ය හා පළාත් පාලන සේවා විශ්‍රාමිකයින්ගේ දීප ව්‍යාප්ත සමුළුව.
(3) ඌණ වැටුප් ලාභී විශ්‍රාමික ගුරු සංගමය
(4) සමස්ත ලංකා විශ්‍රාමික දුම්රිය ස්ථානාධිපති සංගමය
(5) පළාත් පාලන හා පළාත් රාජ්‍ය සේවා විශ්‍රාමිකයන්ගේ ජාතික සමුළුව.

(6) සමස්ත ලංකා යුධ හමුදා විශ්‍රාමික රණවිරු සංගමය.
(7) ශ්‍රී ලංකා සන්නද්ධ සේවා ( යුධ, නාවික, ගුවන්) විශ්‍රාමිකයන්ගේ සංගමය
(8) ශ්‍රී ලංකා විශ්‍රාමික දුම්රිය නියාමිකවරුන්ගේ සංගමය.
(9) රාජ්‍ය පළාත් පාලන හා පළාත් රාජ්‍ය සේවා විශ්‍රාමිකයන්ගේ සංගමය
(10) සමස්ත ලංකා රජයේ විශ්‍රාමිකයින්ගේ ඒකාබද්ධ ජාතික සංවිධානය
(11) විශ්‍රාමික සංගම් එකමුතුව

## 12.7 රාජ්‍ය සේවා විශ්‍රාමිකයන්ගේ භාර අරමුදල

රාජ්‍ය හා පළාත් රාජ්‍ය සේවා විශ්‍රාමිකයන්ගේ ගරුත්වය හා අභිමානය පවත්වා ගෙන යාමට ආධාර කිරීමෙන් ඔවුන්ගේ සාමාන්‍ය සුභසිද්ධිය ප්‍රවර්ධනය කිරීම පරමාර්ථ කර ගත් රාජ්‍ය සේවා විශ්‍රාමිකයන්ගේ භාර අරමුදල 1999 අංක 40 දරන පාර්ලිමේන්තු පනත යටතේ ස්ථාපිත කරන ලදී.

අරමුදලේ සංයුතිය දිස්ත්‍රික් ලේකම් කොට්ඨාස සංගම් හා ප්‍රාදේශිය ලේකම් කොට්ඨාස සංගම් වලින් සමන්විත වේ. ප්‍රාදේශිය ලේකම් කොට්ඨාස සංගම් හා දිස්ත්‍රික් ලේකම් කොට්ඨාස සංගම් මගින් ජාතික මහා සභාවට නියෝජිතයින් පත්කර ගන්නා ලද අතර දිස්ත්‍රික් සභාපති වරු හා මහා සභාවෙන් පත්වන නිලධාරීහු 8 දෙනකුගෙන් විධායක සභාව සමන්විත වේ. මෙහි නිලධාරි මණ්ඩලය ප්‍රධාන සභාපති, ප්‍රධාන ලේකම්, ප්‍රධාන භාණ්ඩාගාරික, උප සභාපතිවරුන් 3, උපලේකම් 1, උප භාණ්ඩාගාරික 1 න් යුක්ත වේ. විධායක සභාව විසින් අනුමත නීතිරීති හා විශ්‍රාමික භාර අරමුදල් පනත මගින් මෙම අරමුදල පවත්වා ගෙන යනු ලබන අතර මෙහි ප්‍රධානතම මූල්‍ය ප්‍රභවය වන්නේ විශ්‍රාමිකයින්ගෙන් අයකර ගන්නා සාමාජික ගාස්තුය.

සිවිල්, වැන්දඹු හා අනත්දරු, වැන්දඹු පුරුෂ, අනත්දරු, පළාත් පාලන, සන්නද්ධ සේවා, යැපෙන්නන් ආදී වශයෙන් රාජ්‍ය විශ්‍රාම වැටුපකට හෝ දීමනාවකට හිමිකම් ලබන ශ්‍රී ලාංකීක හැම දෙනාටම සමාජිකත්වය ලබා ගත හැකියි.

සාමාජිකත්වය ලබා ගැනීමේ ක්‍රමවේදය වනුයේ තමන් පදිංචි ප්‍රාදේශිය ලේකම් කොට්ඨාසයේ පිහිටුවා පවත්වා ගෙන යන කොට්ඨාස සංගමයේ ලේකම්වරයාගෙන් ලබා ගන්නා සාමාජික ඉල්ලුම් පත්‍රය හා මාසිකව සාමාජික මුදල් අයකර ගැනීම සඳහා ප්‍රාදේශිය ලේකම්වරයා වෙත මනාපය පල කරන මනාප පත්‍රය සම්පූර්ණ කර ප්‍රාදේශිය සංගමයේ ගරු ලේකම්වරයාට භාරදීමෙන් සාමාජිකත්වය ඉල්ලා සිටිය හැක. සුභ සාධක අරමුදලේ දායකත්වය ද ඇතුළත් ව මාසික සාමාජික මුදල රුපියල් විස්සකි. මුදල් කැපුන බව අවකරණය ලේඛනය තුළින් සනාථ වීමෙන් පසු සාමාජික අංකය හා බැදුණු දිනය සහිත සාමාජික කාඩ්පත නිකුත් කෙරේ.

රාජ්‍ය සේවා විශ්‍රාමික භාර අරමුදල මගින් සමාජිකයන්ට හිමි වන ප්‍රතිලාභ කීපයකි. සියලු ප්‍රතිලාභ හිමිවීම සඳහා සාමාජිකත්වයට වසරක් කල්පිරිය යුතුය.

මරණාධාර ප්‍රතිලාභ ( පාරිතෝෂිකය )

මෙය සාමාජිකයින් සියලු දෙනාම හිමිකම් ලබන ප්‍රතිලාභයකි. උපරිම වශයෙන් වසර පහක් පිරි සාමාජිකත්වය රු. 6000.00ක් ද රු. 100.00 බැගින් වන අතිරේක ප්‍රසාද දීමනාවක් ද ඊට එකතු කොට ගෙවනු ලැබේ. වසර පහක් ඉක්මවීමට පෙර මිය යන සාමාජිකයන්ට ද පහත ගෙවීම් වලට සාපේක්ෂව ප්‍රතිලාභ හිමිකම් ලැබේ. මෙම ප්‍රතිලාභය ලැබීමට නම් සාමාජිකයාගේ මරණය සිදුවී මාස 03ක් ඇතුළත පසු හිමිකරු එය ප්‍රාදේශිය සංගමය මගින් ඉල්ලා සිටිය යුතුය. සමාජිකයාගේ මරණ සහතිකයේ සහතික පිටපතක් අත්‍යවශ්‍ය වේ.

විශේෂ මරණාධාර ව්‍යාපෘතිය
මෙය සාමාජිකයන්ගේ කැමැත්ත මත හා තමන්ගේ අතින්ම සාමාජික මුදල් ගෙවීම මත ක්‍රියාත්මක වන විශේෂ ව්‍යාපෘතියකි. දැනට හත් අවුරුදු කාල පරාසයකට සීමාවන පරිදි සකස් කර ඇත්තකි. සාමාන්‍ය මරණාධාර ලබන අතරම වඩා ඉහළ ප්‍රතිලාභයක් අත් කර දෙන්නට හැකිවන සේ සකස් කර ඇති මෙය වාර්ෂිකව වාරික මුදල් ගෙවමින් පවත්වා ගත යුතු එකකි. අයඳුම් කිරීමේ වැඩි විස්තර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස සංගමයේ ගරු ලේකම් හමු වී ලබා ගත හැක.

සෞඛ්‍ය ප්‍රතිලාභ
මෙය අක්ෂිකාච ප්‍රතිලාභ හා රෝහල් ගතවීමේ ප්‍රතිලාභ වශයෙන් කොටස් දෙකකි.

අක්ෂිකාච ප්‍රතිලාභ
ඇසකට හෝ ඇස් දෙකටම කාච තැන්පත් කරගත් සාමාජිකයන්ට එම වෛද්‍ය සහතික සමග ඉල්ලා සිටි විට එකකට රුපියල් 2000.00 බැගින් ප්‍රතිලාභ ලබා ගත හැකිය.

රෝහල්ගත වීමේ ප්‍රතිලාභ
රෝහල් ගත වී දින ගණනාවක් නේවාසිකව සිටින සාමාජිකයන්ට හතරවන දින සිට දිනකට රු. 150.00 බැගින් දින 10 ක උපරිමයක් යටත්ව ප්‍රතිලාභ ලබා ගත හැකිය.
මෙම සෞඛ්‍ය ප්‍රතිලාභය වරක් ලබා ගත් කෙනෙකුට වසර දෙකක් යන තෙක් තවත් වරක් ඉල්ලා සිටිය නොහැක.

උසස් අධ්‍යාපන දූදරු ප්‍රතිලාභය
සාමාජිකයන්ගේ දරුවෙකු රජයේ විශ්වවිද්‍යාලයක ප්‍රථම උපාධි පාඨමාලාවක් සඳහා අභ්‍යන්තර ශිෂයෙකු වශයෙන් තෝරාගත් විට, එම පළමු වසර තුළ රුපියල් 3000.00 මුල්‍ය ප්‍රදානයක් පිරිනැමේ.

රුපියල් දස දහසේ ණය මුදල් ප්‍රදානය
ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස සංගමයේ නිර්දේශ මත සාමාජිකයෙකු මෙම ණය මුදල ප්‍රදානය කෙරේ. තැන්පත් ඉතුරුම් ව්‍යාපෘතියට දායක වූවන්ට ප්‍රමුඛත්වය පිරිනමන අතර දෙවැනි වර ඉල්ලුම් සඳහා මාස 06 ක විරාමයක් පසු කළ යුතුය. දෙවනවර ණය ඉල්ලා සිටීමට නම් තැන්පත් ව්‍යාපෘතියට දායක වී සිටිය යුතුමය.

ඉතුරුම් තැන්පත් ව්‍යාපෘතිය
අරමුදලේ මූල්‍යමය සුරක්ෂිත භාවය හා ණය ව්‍යාපෘතිය පුළුල් කිරීමේ අපේක්ෂාවෙන් ආරම්භ කළ එකකි. රුපියල් සියය, දෙසීය, තුන්සීය ආදී වශයෙන් ඕනෑම ප්‍රමාණයක් මාසිකව තැන්පත් කළ හැකිය. අවම තැන්පතුව රු. 100/- කි. මනාප පත්‍රයක් අත්සන් කර දීමෙන් පසුව එම මුදල මාසිකව වැටුපෙන් කපා ගනී. විශේෂ වාසියක් නම් ජාතික ඉතිරි කිරීමේ බැංකුවේ සාමාන්‍ය පොලියට වඩා සියයට දශම පහක පොලියක් ගෙවීමයි. එසේම ණය ලබා ගැනීමේ දී තැන්පත් හිමියන්ට ලැබෙන වරප්‍රසාද ද කීපයක්ම වේ.

දඹදිව වන්දනා ව්‍යාපෘතිය
ලාභ ලැබීමේ චේතනාවෙන් කෙරෙන දඹදිව වන්දනා චාරිකාවල දී වන හානි වලින් තම සාමාජික සාමාජිකාවන් මුදවාලීමේ අරමුණින් ලාභ අපේක්ෂාවකින් තොරව සැළසුම් කළ ව්‍යාපෘතියකි.

ගමන් පහසුව, නවාතැන් පහසුව, වැඩිම පුදබිම් සංඛ්‍යාවකට යාමට අවස්ථාව සැලසීම අතින් විශේෂත්වයක් ගනී. අය කිරීම් ද පහසුයි. ආරක්ෂාව හා සුවපහසුව සඳහා විශේෂ වැඩපිළිවෙලක් සහිතයි.

# ස්තූතිය ......................


- ගරු අමාත්‍ය ඩබ්. ඩී. ජේ. සෙනෙවිරත්න මැතිතුමා හා ගරු නියෝජ්‍ය අමාත්‍ය විජය දහනායක මැතිතුමාට
- ජනාධිපති ලේකම් ලලිත් වීරතුංග මැතිතුමාට හා අමාත්‍යාංශ ලේකම් ජී. බී. අබේකෝන් මැතිතුමාට මෙන්ම අතිරේක ලේකම් පත්මා සිරිවර්ධන මැතිණියට
- එන්. අබේවික්‍රම මහත්මිය, මහේෂිකා කොඩිප්පිලි ආරච්චි මෙනෙවිය යන විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂිකාවන්ට සහ මාණ්ඩලික නිලධාරීන් මෙන්ම සියලු කාර්ය මණ්ඩලයට
- ඉ - විශ්‍රාම වැටුප් ලිපිය සම්පාදනය කළ නියෝජ්‍ය විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ ඉමල් ගුණවර්ධන මහතාට, රාජ්‍ය සේවා අර්ථ සාධක අරමුදල ලිපිය සම්පාදනය කළ ලේකම් හා ගණකාධිකාරි සුරේකා හපුආරච්චි මහත්මිය හා පළාත් පාලන විශ්‍රාම වැටුප් ලිපිය ලියූ විශ්‍රාම වැටුප් නිලධාරිණී හර්ෂණී පුෂ්පමාලා ආරච්චිගේ මෙනවියට
- රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ ඇපල් පරිගණක අංශයේ ප්‍රධාන නියාමක චන්ද්‍රානි ගමගේ මහත්මිය, බහු මාධ්‍ය පරිගණක අංශයේ ප්‍රධාන නියාමක ප්‍රසන්න ජයරත්න මහතා ඇතුළු රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ සියලුම නිලධාරි මහත්ම, මහත්මීන්ට
- නන් අයුරින් සහාය වූ සියලු දෙනාට හා ශ්‍රී ලාංකේය විශ්‍රාමික ජ්‍යෙෂ්ඨ පුරවැසියනට
- පොත ලිවීමේදී එයට ප්‍රමුඛතාවය සැලසූ මා ප්‍රිය බිරිඳ මංගලිකා, පසිඳු හා සජිත් පුතුන් මෙන්ම දියණිය මදීසාට

## සහෘදාත්මක ප්‍රණාමය .................

"ශ්‍රී ලාංකේය විශ්‍රාම වැටුප්" ග්‍රන්ථය පමණක් නොව

විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුවෙහි ප්‍රකාශනයන් වූ

අභිනන්දන, හොර හරක් ඇල්ලූ උප දිසාපති හා

විශ්‍රාම වැටුප් ප්‍රතිලාභ යන කෘතීන් මුද්‍රණය කර දීමට

පූර්ණ දායකත්වය නොමසුරුව ලබා දුන්

රජයේ මුද්‍රණාලාධිපති තැන්පත්

**ලක්ෂ්මන් ගුණවර්ධන මැතිතුමාට** ගෞරවයෙනි .............

"ආර්ථික හා සමාජීය වශයෙන්
තෘප්තිමත් විශ්‍රාමික ප්‍රජාවක් බිහි කිරීම"

ISBN 978-955-0777-02-0
9 789550 777020 >